බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 2 (1)

## විනය පිටකයෙහි

02 වන ග්‍රන්ථය

(ප්‍රථම භාගය)

# පාචිත්තිය පාළි

ලංකා බෞද්ධ මණ්ඩලයේ ආරාධනයෙන්
ශ්‍රී ලංකා රාමඤ්ඤනිකායේ මහානායකධුරන්ධර
විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත
**ඉඳුරුවේ උත්තරානන්දාභිධාන**
මහාස්ථවිරයන්වහන්සේ විසින් කරන ලද
සිංහල පරිවර්තනය

---

ත්‍රිපිටක පරිවර්තන සම්පාදක මණ්ඩලය විසින්
සංශෝධිත වැ

---

ශ්‍රී බු. ව. 2549
රාජ්‍ය ව. 2005

Buddha Jayanti Tripitaka Series Volume 2 (i)

The second book in the

**Vinaya-Pitaka**

**2**

# PĀCITTIYAPĀLI (I)

With the Sinhala translation by

**Venerable Vidyāvisārada Pandita**
**Induruwe Uttarānanda**
Mahānāyaka Thera of
Sri Lanka Ramañña Nikāya

Revised and Edited by
**The Editorial Board of**
**The Tripitaka Translation Committee**

නමෙක්ස්ස භගවතෙසබ්බධම්මෙ අප්පටිහතඤාණචා ˢස දසබලධරස්ස චතුවේසාරජ්ජවිසාරදස්ස සබ්බසත්තුත් ˢස ධම්මිස්සරස්ස ධම්මරාජ ˢස ධම්ම ˢසාමිස්ස තථාගතස්ස සබ්බ ˢඤ්ඤුනෙ සම්මාස බුද්ධස්ස !!!

භාග්‍ය වූ සිය ධර්මය හි නොපැකි ඥානචාර සහි වූ දසබලධාරී වූ චතුර්වෛශාරද විශාර වූ සිය සත්ව න් උත්ත වූ ධර්මය ඊශ්වර වූ ධර්මරා වූ ධර්ම ˢවාමී වූ තථාගත වූ සර්ව වූ සම්ම සම්බුදුනට නමස්කාර කරමි !!!

කෙළලක්ෂ ක් සක්වලයන්හි සිය ආර්යයෙ ද සිය සත්පු යෙෙ මාගේ නමස්කාරය පිළිගනි !!!

**බුද්ධජ ති තිපි ග්‍රන්ථමාලා**
**පරිගණ ගත කර නොමිළෙ බෙදාහැරීමෙ**
**මහා ධර්ම දානමය පුණ්‍යක**

**"අපාරුත තේස අමතස්ස ද් ාරා**
**යේ සෙෝතවන්තෙපමු ˢචන් සද්ධං"**

"කන් ඇත්ත හු සැදැහැ මු ත්ව
ඔවුන අමා දෙොඨිවෘ කරන ලදී"

අප භාග්‍ය අර්හ සම්ම සම්බුදුර න් වහන්ෙ ගේ පථම අනුසාසන මෙහි ලා සි කිරීම තිපි ශ්‍රී සද්ධර්මය පරිශීල කරන්න වූ පින්වතුන්ෙ අභිව ද්ධිය පිණිස ම වන බව අපගේ හැඟී ය.

සැම කල් ඥාන සම්ප්‍රයුක්ත ව කිය කරන්න වූ සිය සම් ා සම්බුදුරජ වහන්ෙ ශ්‍රීගේ පලමු අනුශාසන , බුද්ධ රත්න කෙරෙහි ගෞරව කරන්න වූ බුදුරජා වහන්ෙ ගේ සම්ම සම්බුදු බෝධි අදහන්න වූ කවර නම් පු ලයෙකු නො සළකා හිදිත් ද ? චතු වෛශාරදත් සහිත වූ දශ බල සහි වූ අනාවරණ ඥාන සහිත වූ සවඥ වූ මහා කාරුණිකයන් වහන්ෙ ෙපිවා නිව අවබෝධ කර ගැනී පිණිස ධම්මානු ම පතිපදා ආරම් කරන පුද්ගල තු 'සද්ධ ' නම් වූ ගුණ අත්‍යාව ය යන් අවධාරනය කරන සෙ ක

මෙම තිපි ශ්‍රී සද්ධර් සැක නොකළයු ය. සැක කරමි හදාරන ලෞකි ශිල්ප ශාස්ත පවා පරිපූර්ණ ව නොපෙහි බව සි ඇති බැලීමෙ නුව ඇත්තා ට දැක ගත හැකි ය. පු ෂයා ශ්‍රේෂ්ඨ බවට පමු වන්න වූ සද්ධා ධනය සහි ව ("සද්ධීධ චිත් පුරි ˢස සෙට්ය ") මෙම ධර් රත්න පරිශීල කරන්නාභ සද්ධා අංගයෙන් ලැබි යු සියල්ල ලැබෙනු නොඅනුමා ය. එසෙමේ සි යෙන් ලැබි යු කොඛස ද වීර්යෙ ලැබි යු කොටෂ සමාධියෙ ලැබි යු කොටෂ ප්‍රඥාවෙන් ලැබි යු කොටෂ ලැබෙන පරි සද්ධ , සති, විරිය, සමාධි සහ පඤා යන පංච ධර්මය තමා තු ඇති කර ගෙන මහත් වූ ගෞරවයසහිත ව ධර්මා බෝධයපිණිස ම යොමු වූ දැඩි අධි ˢඨානයෙන් මෙම ධර් පු ˢතක පරිශීල කළ යු ය. අපගේ බුද්ධ ශාසනයෙහි

ධර් ශවනයෙන් මග ඵල ලැබුවෙ ම අධි ය. විමුක්තිය ලබන්න වූ කම වේදය පහක් වි ්තර කරන්න වූ අංගුත් පංචක නිපාතයෙ 'විමුත්තා ' සූ යෙහි නිව ලබන කම වේ සතරක් ම ධම් දේශණාම සහ ධම් සවනමය පුණ කර් ඇසුරින් සි වන බව පැහැදි කර ඇත. පස්වැනි කම වේද භාවනාමය පුණ කර්ම පගු කිරීෙ සාර්ථ වන බව ද එහි සඳහන් වේ.

මහත් වූ ගෞරවාදරයෙන් මහා සුගතය වහන්ෙ ගේ අනුශාසන පිළිපදි වූ අප්‍රමාදී ව ධම්මානු ම පතිපදා වඩන්න වූ සිය සත්න , තෙකාලි වූ සිය දුකින් මි ලබන්න වූ අජර වූ අමර වූ අමා මහ නිව අවබෙෝධී පිණිස මෙම මහඟු පුණ කර්ම උපනිශ වේව !

ආර්යය වහන්ෙ ලා් පහළවීමෙ සිරි බැබලේව !

බුද්ධ ශාසනය දියු චිර ්ථිතික වේව !

ලෙයේත්න සෙත් වේව !

**"අමතං දදෙතේ සෙණේහතේ, යෙථෙම් මනු ාසති"**

( *යමෙක් ධර්මානුශාස කරන්නේ ද, හෙඥ්මෘතය දෙන්ෙ ය* )

මෙම ධර් දානමය පුණ කර්ම

මෙෝහිමිර විධ්වංස කරන්න වූ ලොවෙළුතුම් ආලෙෝකය වූ මහා කාරුණික වූ සම්මාස බුදුරජාණන් වහන්ෙ ගේ සවඥතා ඥානයට ද මහා කරු ා ගුණය ද පූජෙෝපහාරය ම වේව !!!

කෙළලක්ෂ ක් සක්වලයන්හි සිය ආර්යයෙ ද සිය සත්පු යෙදේ අපගේ පුණ කර්ම අනුමෙෝද වෙත්ව !!!

ශාසනාභිව ද් කාමී,

සමින්ද රණසි හ.

2009.06.28

සැලකිය යුතුය : මෙම පොතෙහි පටුන, පිටු අංක 14 හි ඇතුලත් කර ඇත. එම පටුනෙහි මාතෘකාවන් හා පිටු අංක අදාළ පිටු සමඟ සම්බන්ධ කර ඇත. මෙහි කියවීමට ඇති ප්‍රදේශයට වම් පසින් ඇති 'පිටු යොමුව' භාවිතා කිරීමෙන් නැවත පටුනට පැමිණීමට පුලුවන. වම් පසින් පාළි පිටුව ද දකුණු පසින් අදාළ සිංහළ පිටුව ද කියවීම සඳහා VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS යන ක්‍රමය භාවිතා කරන්න.

Please note : The TABLE OF CONTENTS of this book is located in page no:14 and it is linked with associated pages in the book for your convenience. You can easily click on the page number or content description in the 'Table of Contents' and you will be directed to the relevant page. Bookmarks located to the left of reading area can be used to navigate back to 'Table of Contents' Page. If you would like to view Pali page on your left and the relevant Sinhala page on your right select the menu items as follows; VIEW menu PAGE DISPLAY option and select TWO-UP CONTINUOUS.

# විනයපිටකෙ

# පාචිත්තියපාළි

## භික්ඛුවිභඞ්ගො

# විනයපිටකයෙහි

# පාචිත්තියපාළි

## භික්ඛුවිභඞ්ගය

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නො පටිච්ඡන්නො."

"මහණෙනි, තථාගතයන් වහන්සේ විසින් දෙශනා කරන ලද ධර්මය හා විනය විවෘත වූයේ බබළයි. වැසුණේ නො ම බබළයි."

(අඞ්ගුත්තරනිකාය, තිකනිපාත - භරණ්ඩුවග්ග, 9 සූත්‍රය)

# පටුන
# CONTANTS


| | පිට |
|---|---|
| සංස්කාරක නිවේදනය ... ... ... | xi–xii |
| ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය ... ... | xiii |
| සංක්ෂිප්ත නිරූපණය ... ... ... | xv |
| පාළි හෝඩිය ... ... ... | xvii |
| පාචිත්තිය පාළි – භික්ඛුවිභඞ්ග විසය සූචිය ... | xix–xxiv |
| පෙළ හා පරිවර්තනය ... ... ... | 2–559 |
| ගාථාදිපාද – අනුක්කමණිකා ... ... | 561 |
| සංඥානාම – අනුක්කමණිකා ... ... | 563–564 |
| විසෙසපදනුක්කමණිකා ... ... ... | 565–575 |
| ශුද්ධාශුද්ධ නිරූපණය ... ... ... | 577–579 |

# සංස්කාරක නිවේදනය

මහාකාරුණික වූ තථාගත සම්මාසම්බුද්ධරජාණන්වහන්සේ විසින් පන්සාළිස්වසක් මුළුල්ලෙහි සදෙවක ලොකයාට ලොකනිස්සරණයෙන් අමාමහනිවන්සුව සාධාලනු සඳහා දේශනා කර වදාළ තෙවළා දහම්හි භික්ෂූන්ගේ කාය වාක් සංවරය පිණිස ප්‍රඥප්ත වූ ද අනුඥාත වූ ද ශික්ෂාසංග්‍රහ ලත් විනයසද්ධර්මය විනයපිටක නම් විය. විභඞ්ග ඛන්ධක පරිවාර විසින් ත්‍රිවිධ වූ විනයපිටකය ධර්මසංග්‍රාහක මහරහතුන් විසින් පරිජි, පචිත්ති, මහවග, සුළුවග, පරිවාර, යයි පාළි විසින් ග්‍රන්ථ පසෙක ලා සංගෘහීත වෙයි. මහාවිභඞ්ගයෙහි පාචිත්ත්‍ය කාණ්ඩය පටන් භික්ඛුවිභඞ්ගය හා භික්ඛුනීවිභඞ්ගය අවසන් කොට ප්‍රඥප්ත ශික්ෂාපද බැසගෙන සිටි පාළිප්‍රදේශය පාචිත්තියපාළි නම් වේ.

බුද්ධපරිනිර්වාණයෙන් දෙදහස්පන්සිය වසක් පිරුණු ජයන්ති අනුස්මරණ උත්සවය නිමිත්ත කොටගෙන ශ්‍රීලඞ්කා බෞද්ධමණ්ඩලය මගින් ප්‍රාරබ්ධ වූ ත්‍රිපිටක බුද්ධවචනය හෙළබසින් තබාලීමේ මහඟු කාර්‍ය්‍යය සිදුකිරීමෙහි ලා පාචිත්තියපාළිය සිංහලයෙන් පරිවර්තනය සඳහා ආරාධනා ලැබූවාහු ශ්‍රීලඞ්කාරාමඤ්ඤනිකායේ මහානායකපදප්‍රාප්ත විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත ඉඳුරුවේ උත්තරානන්දාභිධාන මහාස්ථවිරපාදයන් වහන්සේ යැ. ධර්මවිනයෙහි ආචරිත බුද්ධි ඇති, සිංහල ඡෙකව්‍යවහාරයෙහි ද නිපුණ වූ මහානායක ස්ථවිරයන් වහන්සේ ස්වාධිකාරය මැනවින් ඉටුකළහ. අවුරුදු එකුන්විස්සකට පමණ පෙර මුද්‍රණයට යොමු කොට තුබූ පාචිත්තියපාළිය තන්මුද්‍රණාලයෙහි අකර්මණ්‍යභාවයෙන් අතරමං වූයේ සංස්කෘතික අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සෝමපාල ජයවර්ධන මහතාණන්ගේ කාර්‍ය්‍යක්ෂම සැලසුම් හේතුයෙන් මෙසේ පළකරවන්නට හැකිවූ බව පවසම්හ.

ත්‍රිපිටක ග්‍රන්ථමාලායෙහි දෙවැනි ග්‍රන්ථය වශයෙන් සලකන ලද පාචිත්තියපාළිය අර්ථාවබෝධයට පහසු වන සේ යථාස්ථානයෙහි ඡේද වෙන්කරමින් සිංහල පරිවර්තනය සමග මුද්‍රණය කැරවීමේදී පරිහරණයට සුකර නො වන සේ ග්‍රන්ථය මහත් වැ යන බව පෙනුණු හෙයින් භික්ඛුවිභඞ්ගය තෙක් ප්‍රථම භාගය වශයෙන් ද භික්ඛුනීවිභඞ්ගය අවසාන කොට ඇති ශේෂය ද්විතීය භාගය වශයෙන් ද මුද්‍රණය කරවන්නට සිදුවූ බව ද පවසම්හ. වර්තමාන ත්‍රිපිටක සම්පාදක මණ්ඩලයේ බහුශ්‍රැත මහතෙරවරුන් විසින් ඌන වැ තුබූ තැන් සපුරාලමින් නව දුරටත් සංස්කරණය කොට

ආවශ්‍යක වූ ශබ්දසූචි ආදිය ද සම්පාදනය කොට අපගේ ද පරිශ්‍රමයෙන් පාඨශෝධනාදිය කොට පාචිත්තියපාළි ප්‍රථම භාගය මෙසේ පළකරවන්නට හැකි වූ බව පවසම්හ.

මෙ මැ උදරතර ධර්මදානමය කුශලහේතුයෙන් මෙ සඳහා පූර්ණ අනුග්‍රහය දෙන ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය ද, බෞද්ධමණ්ඩලයේ සුධීහු ද ගරු සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමතිතුමාණන් ප්‍රමුඛ සංස්කෘතික අධිකාරියෙහි පින්වත්හු ද මෙහිලා උපස්තම්භක වූ හැම සත්පුරුෂයෝ ද ලොව්ලොවුතුරු සුව ලබත්වා'යි ආශංසනය කරම්හ.

පරිවර්තක මහානායක ස්ථවිරයන් වහන්සේ ලියූ විනය පිළිබඳ දීඝ ප්‍රස්තාවනාව ද්විතීය භාගයෙහි ඇතුළත් කරනු ලැබෙ.

මෙවගට, ශාසනෝදයකාරී,
**ලබුගම ලඞ්කානන්ද ස්ථවිර**
ත්‍රිපිටකමණ්ඩලයේ ප්‍රධාන සම්පාදක

1981 ජූලි 10 දින
කොළඹ 7, විජේරාම මාවතේ
අං: 115 දරන, මහානායකවාරිකාරාමයේ
ත්‍රිපිටකමණ්ඩලය.

# ත්‍රිපිටක සම්පාදක මණ්ඩලය

**උපදේශක :**

අග්‍රමහාපණ්ඩිත, බළන්ගොඩ ආනන්දමෛත්‍රෙය මහානායක මහාස්ථවිරපාදයන් වහන්සේ.

**සභාපති :**

අහුංගම විද්‍යාචන්ද්‍රපරිවෙණාධිපති, ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය, කෝදාගොඩ ශ්‍රී ඥානාලෝක දක්ෂිණලඞ්කායෙහි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ.

**ප්‍රධාන සම්පාදක :**

මොල්ලිගොඩ ප්‍රවචනෝදය පරිවෙණාධිපති ත්‍රිපිටකවාගීශ්වර, ලබුගම ශ්‍රී ලඞ්කානන්ද—කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝ සභායෙහි මහානායක ස්ථවිරයන් වහන්සේ.

**සම්පාදක :**

කිරුළපන පූර්වාරාමාධිපති හා අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨාධිපති ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත, රද්දල්ලේ ශ්‍රී ප්‍රඥාලෝක—කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රීධර්ම මහාසඞ්ඝසභායෙහි අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හෙරලියාවල ශ්‍රී සුධර්මාරාමාධිපති, ශාස්ත්‍රපති, විද්‍යාවිශාරද, රාජකීය පණ්ඩිත වේඩරුවේ ශ්‍රී අනවමදර්ශී අනුනායක ස්ථවිරයන් වහන්සේ.

හිඟුලේ—මාකඩවරවිහාරාධිපති, රාජකීය පණ්ඩිත, කරගම්පිටිගොඩ සුමනසාර ස්ථවිරයන් වහන්සේ.

කොළඹ තිඹිරිගස්යායේ අශෝකාරාමාධිපති රාජකීය පණ්ඩිත කරදන ශ්‍රී ප්‍රඥාලඞ්කාර නායක ස්ථවිරයන් වහන්සේ.

අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්මපීඨයෙහි, ත්‍රිපිටක අංශයෙහි මහාචාර්ය, ශාස්ත්‍රාචාර්ය රාජකීය පණ්ඩිත උඩුවේ ජනානන්ද ස්ථවිරයන් වහන්සේ.

**ලේකම් :**

කොළඹ බෞද්ධාලෝක මාවතෙහි බෞද්ධාලෝක විහාරාධිපති, පණ්ඩිත, දෙරගමුවේ සිරි ධම්මපාල—කොළඹදිශායෙහි ප්‍රධාන සඞ්ඝ නායක ස්ථවිරයන් වහන්සේ.

# සංකේත නිරූපණය

සී: සිංහලාක්ෂර, පුස්කොල පොත්

සිමු. 1, 1910 මුද්‍රණය. බෙන්තර සද්ධාතිස්ස ස්ථවිර සංස්කරණය

සිමු. 2, බු: 2472 මුද්‍රණය. බෙරුවල මෙධාසිරි මහාස්ථවිර සංස්කරණය

මජසං: බුරුමරට ඡට්ඨසංගීති සංස්කරණය

සපා: තායාක්ෂර මුද්‍රිත පාචිත්තිය පාළි

# THE PALI ALPHABET

## IN SINHALA CHARACTERS

### VOWELS

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ a | ආ ā | ඉ i | ඊ ī | උ u | ඌ ū | එ ē | ඔ ō |

### CONSONANTS

| | | | | |
|---|---|---|---|---|
| ක ka | ඛ kha | ග ga | ඝ gha | ඞ ṅa |
| ච ca | ඡ cha | ජ ja | ඣ jha | ඤ ña |
| ට ṭa | ඨ ṭha | ඩ ḍa | ඪ ḍha | ණ ṇa |
| ත ta | ථ tha | ද da | ධ dha | න na |
| ප pa | ඵ pha | බ ba | භ bha | ම ma |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ය ya | ර ra | ල la | ව va | ස sa | හ ha | ළ ḷa | අං ṃ |
| ක ka | කා kā | කි ki | කී kī | කු ku | කූ kū | කෙ kē | කො kō |
| ඛ kha | ඛා khā | ඛි khi | ඛී khī | ඛු khu | ඛූ khū | ඛෙ khē | ඛො khō |
| ග ga | ගා gā | ගි gi | ගී gī | ගු gu | ගූ gū | ගෙ ge | ගො go |

### CONJUNCT-CONSONANTS

| | | | |
|---|---|---|---|
| ක්ක kka | ඤ්ඤ ñña | ත්‍ර tra | ම්ඵ mpha |
| ක්ඛ kkha | ඤ්හ ñha | ද්ද dda | ම්බ, ම්බ mba |
| ක්‍ය kya | ඤ්ච ñca | ද්ධ ddha | ම්භ mbha |
| ක්‍රි kri | ඤ්ඡ ඡ ñcha | ද්‍ර dra | ම්ම mma |
| ක්ව kva | ඤ්ජ ñja | ද්ව, ද්ව dva | ම්භ mbha |
| ඛ්‍ය khya | ඤ්ඣ ñjha | ධ්ව dhva | ය්‍ය, ය්ය yya |
| ඛ්ව khva | ට්ට ṭṭa | න්ත nta | ය්හ yha |
| ග්ග gga | ට්ඨ, ට්ඨ ṭṭha | න්ථ ntha | ල්ල lla |
| ග්ඝ ggha | ඩ්ඩ ḍḍa | න්ද nda | ල්‍ය lya |
| ඞ්ක ṅka | ඩ්ඪ ḍḍha | න්ධ ndha | ල්හ lha |
| ග්‍ර gra | ණ්ණ ṇṇa | න්න nna | ව්හ vha |
| ඞ්ඛ ṅkha | ණ්ට ṇṭa | න්හ nha | ස්ස ssa |
| ඞ්ග ṅga | ණ්ඨ ṇṭha | ප්ප ppa | ස්ම sma |
| ඞ්ඝ ṅgha | ණ්ඩ, ණ්ඩ ṇḍa | ප්ඵ ppha | ස්ව sva |
| ච්ච cca | ත්ත tta | බ්බ bba | හ්ම hma |
| ච්ඡ ccha | ත්ථ ttha | බ්භ bbha | හ්ව hva |
| ජ්ජ jja | ත්ව tva | බ්‍ර bra | ළ්හ ḷha |
| ජ්ඣ jjha | | ම්ප mpa | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ා ā | ි i | ී ī | ු ු u | ූ ූ ū | ෙ ē | ො ō |

# පාචිත්තියපාළි

## විසය සූචි


භික්ඛු විභඞ්ගො .. .. .. 2—559

### පාචිත්තියා 2—463

### 1. මුසාවාදවග්ගො 2—105

1. මුසාවාද සික්ඛාපදං .. .. .. .. 2—13
2. ඔමසවාද සික්ඛාපදං .. .. .. .. 14—41
3. පෙසුඤ්ඤ සික්ඛාපදං .. .. .. 42—51
4. පදසොධම්ම ,, .. .. .. .. 52—55
5. පඨමසහසෙය්‍ය ,, .. .. .. .. 56—59
6. දුතිය සහසෙය්‍ය ,, .. .. .. .. 60—65
7. ධම්මදෙසනා ,, .. .. .. .. 66—73
8. භූතාරොචන ,, .. .. .. .. 74—97
9. දුට්ඨුල්ලාරොචන ,, .. .. .. .. 98—103
10. පඨවිඛණන ,, .. .. .. .. 102—105

### 2. භූතගාමවග්ගො 106—145

1. භූතගාම සික්ඛාපදං .. .. .. .. 106—109
2. අඤ්ඤවාදක ,, .. .. .. .. 110—117
3. උජ්ඣාපනක ,, .. .. .. .. 116—121
4. පඨමසෙනාසන ,, .. .. .. .. 120—125
5. දුතියසෙනාසන ,, .. .. .. .. 124—129
6. අනුපඛජ්ජ ,, .. .. .. .. 128—131
7. නික්කඩ්ඪන ,, .. .. .. .. 132—135
8. වෙහාසකුටි ,, .. .. .. .. 136—139
9. මහල්ලක විහාර ,, .. .. .. .. 138—143
10. සප්පාණක ,, .. .. .. .. 142—145

### 3. භික්ඛුනොවාදවග්ගො 146—199

1. ඔවාද සික්ඛාපදං .. .. .. .. 146—159
2. අත්ථඞ්ගත ,, .. .. .. .. 158—163
3. භික්ඛුනූපස්සය ,, .. .. .. .. 162—167
4. ආමිස ,, .. .. .. .. 168—171
5. චීවරදාන ,, .. .. .. .. 172—175
6. චීවරසිබ්බන ,, .. .. .. .. 176—179
7. සංවිධාන ,, .. .. .. .. 180—185
8. නාවාභිරූහන ,, .. .. .. .. 184—189
9. පරිපාචිත ,, .. .. .. .. 190—195
10. රහොනිසජ්ජ ,, .. .. .. .. 194—199

## විසය සූචි

### 4. භොජනවග්ගො 200—251


| | | | |
|---|---|---|---|
| 1. | ආවසථපිණ්ඩ සික්ඛාපදං | .. .. .. | 200—205 |
| 2. | ගණභොජන ,, | .. .. .. | 204—213 |
| 3. | පරම්පරභොජන ,, | .. .. .. | 212—221 |
| 4. | කාණමාතු ,, | .. .. .. | 220—227 |
| 5. | පඨමපවාරණ ,, | .. .. .. | 228—233 |
| 6. | දුතියපවාරණ ,, | .. .. .. | 232—237 |
| 7. | විකාලභොජන ,, | .. .. .. | 238—241 |
| 8. | සන්නිධිකාර ,, | .. .. .. | 240—245 |
| 9. | පණීතභොජන ,, | .. .. .. | 244—249 |
| 10. | දන්තපොන ,, | .. .. .. | 248—251 |


### 5. අචෙලකවග්ගො 252—295


| | | | |
|---|---|---|---|
| 1. | අචෙලක සික්ඛාපදං | .. .. .. | 252—255 |
| 2. | උය්‍යොජන ,, | .. .. .. | 256—259 |
| 3. | සභොජන ,, | .. .. .. | 260—263 |
| 4. | පඨම රහොනිසජ්ජ සික්ඛාපදං | .. .. | 262—267 |
| 5. | දුතිය රහොනිසජ්ජ ,, | .. .. .. | 266—269 |
| 6. | චාරිත්ත ,, | .. .. .. | 270—277 |
| 7. | මහානාම ,, | .. .. .. | 276—283 |
| 8. | උය්‍යුත්තසෙනා ,, | .. .. .. | 284—289 |
| 9. | සෙනාවාස ,, | .. .. .. | 288—291 |
| 10. | උය්‍යොධික ,, | .. .. .. | 290—295 |


### 6. සුරාපානවග්ගො 296—335


| | | | |
|---|---|---|---|
| 1. | සුරාපාන සික්ඛාපදං | .. .. .. | 296—301 |
| 2. | අඞ්ගුලිපතොදක සික්ඛාපදං | .. .. .. | 302—303 |
| 3. | හස්සධම්ම ,, | .. .. .. | 304—307 |
| 4. | අනාදරිය ,, | .. .. .. | 306—309 |
| 5. | භිංසාපනක ,, | .. .. .. | 310—313 |
| 6. | ජොති ,, | .. .. .. | 312—317 |
| 7. | නහාන ,, | .. .. .. | 316—325 |
| 8. | දුබ්බණ්ණකරණ ,, | .. .. .. | 324—327 |
| 9. | විකප්පන ,, | .. .. .. | 328—331 |
| 10. | චීවරාපනිධාන ,, | .. .. .. | 330—335 |

## විසය සූචි

### 7. සප්පාණකවග්ගො 336—379


| | | |
|---|---|---|
| 1. | සඤ්චිච්ච පාණ සික්ඛාපදං | 336—337 |
| 2. | සප්පාණක ,, | 338—339 |
| 3. | උක්කොටන ,, | 340—343 |
| 4. | දුට්ඨුල්ල ,, | 342—345 |
| 5. | ඌනවීසතිවස්ස ,, | 346—351 |
| 6. | ථෙය්‍යසත්ථ ,, | 350—353 |
| 7. | සංවිධාන ,, | 354—357 |
| 8. | අරිට්ඨ ,, | 358—367 |
| 9. | උක්ඛිත්ත සම්භොග සික්ඛාපදං | 366—371 |
| 10. | කණ්ටක ,, | 370—379 |


### 8. සහධම්මිකවග්ගො 380—421


| | | |
|---|---|---|
| 1. | සහධම්මික සික්ඛාපදං | 380—383 |
| 2. | විලෙඛන ,, | 384—387 |
| 3. | මොහන ,, | 388—393 |
| 4. | පහාර ,, | 392—395 |
| 5. | තලසත්තික ,, | 394—397 |
| 6. | අමූලක ,, | 398—401 |
| 7. | සඤ්චිච්ච ,, | 400—403 |
| 8. | උපස්සුති ,, | 404—407 |
| 9. | කම්මපටිබාහන ,, | 406—409 |
| 10. | ඡන්දංඅදත්වාගමන ,, | 410—413 |
| 11. | දුබ්බල ,, | 412—417 |
| 12. | පරිණාමන ,, | 416—421 |


### 9. රාජවග්ගො 422—463


| | | |
|---|---|---|
| 1. | රාජන්තෙපුර ,, | 422—431 |
| 2. | රතන ,, | 432—437 |
| 3. | විකාලෙගාමප්පවෙසන සික්ඛාපදං | 438—443 |
| 4. | සූචිඝර ,, | 444—447 |
| 5. | මඤ්ච ,, | 446—449 |
| 6. | තූලොනද්ධ ,, | 448—451 |
| 7. | නිසීදන ,, | 452—455 |
| 8. | කණ්ඩුපටිච්ඡාදි ,, | 454—457 |
| 9. | වස්සිකසාටික ,, | 458—461 |
| 10. | නන්දත්ථෙර ,, | 460—463 |

## පාටිදෙසනීයකණ්ඩො 464—487


| | | |
|---|---|---|
| 1. | පඨම පාටිදෙසනීය සික්ඛාපදං | 464—469 |
| 2. | දුතිය පාටිදෙසනීය ,, | 468—471 |
| 3. | තතිය පාටිදෙසනීය ,, | 472—479 |
| 4. | චතුත්ථ පාටිදෙසනීය ,, | 480—487 |


### සෙඛියා—488—555

## පරිමණ්ඩලවග්ගො 488—495


| | | |
|---|---|---|
| 1. | පඨම සික්ඛාපදං | 488—489 |
| 2. | දුතිය ,, | 490—491 |
| 3. | තතිය ,, | 490—491 |
| 4. | චතුත්ථ ,, | 490—491 |
| 5. | පඤ්චම ,, | 492—493 |
| 6. | ඡට්ඨ ,, | 492—493 |
| 7. | සත්තම ,, | 492—493 |
| 8 | අට්ඨම ,, | 494—495 |
| 9. | නවම ,, | 494—495 |
| 10. | දසම ,, | 494—495 |


## උජ්ජග්ඝිකවග්ගො 496—503


| | | |
|---|---|---|
| 1. | පඨම සික්ඛාපදං | 496—497 |
| 2. | දුතිය ,, | 496—497 |
| 3. | තතිය ,, | 496—497 |
| 4. | චතුත්ථ ,, | 498—499 |
| 5. | පඤ්චම ,, | 498—499 |
| 6. | ඡට්ඨ ,, | 498—499 |
| 7. | සත්තම ,, | 500—501 |
| 8. | අට්ඨම ,, | 500—501 |
| 9. | නවම ,, | 500—501 |
| 10. | දසම ,, | 502—503 |


## ඛම්භකතවග්ගො 504—511


| | | |
|---|---|---|
| 1. | පඨම සික්ඛාපදං | 504—505 |
| 2. | දුතිය ,, | 504—505 |
| 3. | තතිය ,, | 504—505 |
| 4. | චතුත්ථ ,, | 506—507 |
| 5. | පඤ්චම ,, | 506—507 |
| 6. | ඡට්ඨ ,, | 506—507 |
| 7. | සත්තම ,, | 508—509 |
| 8. | අට්ඨම ,, | 508—509 |
| 9. | නවම ,, | 508—509 |
| 10. | දසම ,, | 510—511 |

# විෂය සූචි

## සක්කච්චවග්ගො 512—521


| | | | |
|---|---|---|---|
| 1. | පඨම සික්ඛාපදං | .. .. .. .. | 512—513 |
| 2. | දුතිය ,, | .. .. .. .. | 512—513 |
| 3. | තතිය ,, | .. .. .. .. | 512—513 |
| 4. | චතුත්ථ ,, | .. .. .. .. | 514—515 |
| 5. | පඤ්චම ,, | .. .. .. .. | 514—515 |
| 6. | ඡට්ඨ ,, | .. .. .. .. | 514—515 |
| 7. | සත්තම ,, | .. .. .. .. | 516—519 |
| 8. | අට්ඨම ,, | .. .. .. .. | 518—519 |
| 9. | නවම ,, | .. .. .. .. | 518—519 |
| 10. | දසම ,, | .. .. .. .. | 520—521 |


## කබළවග්ගො 522—529


| | | | |
|---|---|---|---|
| 1. | පඨම සික්ඛාපදං | .. .. .. .. | 522—523 |
| 2. | දුතිය ,, | .. .. .. .. | 522—523 |
| 3. | තතිය ,, | .. .. .. .. | 522—523 |
| 4. | චතුත්ථ ,, | .. .. .. .. | 524—525 |
| 5. | පඤ්චම ,, | .. .. .. .. | 524—525 |
| 6. | ඡට්ඨ ,, | .. .. .. .. | 524—525 |
| 7. | සත්තම ,, | .. .. .. .. | 526—527 |
| 8. | අට්ඨම ,, | .. .. .. .. | 526—527 |
| 9. | නවම ,, | .. .. .. .. | 526—527 |
| 10. | දසම ,, | .. .. .. .. | 528—529 |


## සුරුසුරුවග්ගො 530—541


| | | | |
|---|---|---|---|
| 1. | පඨම සික්ඛාපදං | .. .. .. .. | 530—531 |
| 2. | දුතිය ,, | .. .. .. .. | 530—531 |
| 3. | තතිය ,, | .. .. .. .. | 532—533 |
| 4. | චතුත්ථ ,, | .. .. .. .. | 532—533 |
| 5. | පඤ්චම ,, | .. .. .. .. | 534—535 |
| 6. | ඡට්ඨ ,, | .. .. .. .. | 534—537 |
| 7. | සත්තම ,, | .. .. .. .. | 536—539 |
| 8. | අට්ඨම ,, | .. .. .. .. | 538—539 |
| 9. | නවම ,, | .. .. .. .. | 540—541 |
| 10. | දසම ,, | .. .. .. .. | 540—541 |

# විසය සූචි

## පාදුකාවග්ගො 542—555


| | | |
|---|---|---|
| 1. | පඨම සික්ඛාපදං | 542—543 |
| 2. | දුතිය ,, | 542—543 |
| 3. | තතිය ,, | 542—543 |
| 4. | චතුත්ථ ,, | 544—545 |
| 5. | පඤ්චම ,, | 544—545 |
| 6. | ඡට්ඨ ,, | 544—545 |
| 7. | සත්තම ,, | 546—547 |
| 8. | අට්ඨම ,, | 546—547 |
| 9. | නවම ,, | 548—549 |
| 10. | දසම ,, | 550—551 |
| 11. | එකාදසම සික්ඛාපදං | 550—551 |
| 12. | ද්වාදසම ,, | 550—551 |
| 13. | තෙරසම ,, | 552—553 |
| 14. | චුද්දසම ,, | 552—553 |
| 15. | පණ්ණරසම ,, | 552—553 |

සෙඛියා උද්දානං — 556—557

අධිකරණසමථා 558—559

විනයපිටකෙ

# පාචිත්තියපාළි

## විනයපිටකෙ

# පාචිත්තියපාළි

## භික්ඛුවිභඞ්ගො

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

ඉමෙ ඛො පනායස්මන්තො ද්වෙනවුති පාචිත්තියා ධම්මා
උද්දෙසං ආගච්ඡන්ති.

### 6.1.1

### මුසාවාදසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන **හත්ථකො** සක්‍යපුත්තො වාදක්ඛිත්තො හොති. සො තිත්ථියෙහි සද්ධිං සල්ලපන්තො අවජානිත්වා පටිජානාති. පටිජානිත්වා අවජානාති. අඤ්ඤෙනඤ්ඤං පටිචරති. සම්පජානමුසා භාසති. සඞ්කෙතං කත්වා විසංවාදෙති. තිත්ථියා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: කථං හි නාම **හත්ථකො** සක්‍යපුත්තො අම්හෙහි සද්ධිං සල්ලපන්තො අවජානිත්වා පටිජානිස්සති පටිජානිත්වා අවජානිස්සති, අඤ්ඤෙනඤ්ඤං පටිචරිස්සති, සම්පජානමුසා භාසිස්සති, සඞ්කෙතං කත්වා විසංවාදෙස්සතී''ති.

2. අස්සොසුං ඛො භික්ඛූ තෙසං තිත්ථියානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං අථ ඛො තෙ භික්ඛූ යෙන **හත්ථකො** සක්‍යපුත්තො තෙනුපසංකමිංසු. උපසඞ්කමිත්වා හත්ථකං සක්‍යපුත්තං එතදවොචුං. ''සච්චං කිර ත්වං ආවුසො හත්ථක, තිත්ථියෙහි සද්ධිං සල්ලපන්තො අවජානිත්වා පටිජානාසි, පටිජානිත්වා අවජානාසි, අඤ්ඤෙනඤ්ඤං පටිචරසි, සම්පජානමුසා භාසසි, සඞ්කෙතං කත්වා විසංවාදෙසී''ති. එතෙ ඛො ආවුසො තිත්ථියා නාම යෙන කෙනචි ජෙතබ්බා, නෙව තෙසං ජයො දාතබ්බොති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛාකාමා,[1] තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති ''කථං හි නාම හත්ථකො සක්‍යපුත්තො තිත්ථියෙහි සද්ධිං සල්ලපන්තො අවජානිත්වා පටිජානිස්සති, පටිජානිත්වා අවජානිස්සති, අඤ්ඤෙනඤ්ඤං පටිචරිස්සති, සම්පජානමුසා භාසිස්සති, සඞ්කෙතං කත්වා විසංවාදෙස්සතී''ති.

---

1. සන්තුට්ඨා ලජ්ජිනො කුක්කුච්චකා සික්ඛා කාමා—මජසං නත්ථි

## විනයපිටකයෙහි

# පාචිත්තියපාළි

## භික්ඛුවිභඞ්ගය

### ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේට නමස්කාර වේවා

ආයුෂ්මත්නි, මේ දෙඅනූ පචිති ඇවැත්හු උදෙසීමට පැමිණෙත්.

### 6.1.1

### මුසාවාද ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සැවැත්නුවර ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩ වසන සේක. එසමයෙහි සැහැදරු වූ හත්ථක මහණ වාදයෙන් (පරවාදීන් වෙත) මෙහෙයන ලදුයේ වෙයි. හේ තොටුවන් සමඟ සල්ලාප කරනුයේ අවමන් කොට ගිවිසගනියි. ගිවිසගෙන අවමන් කරයි, අනෙකෙකින් අනෙකක් වසාදමයි. දැන දැන ම මුසා බෙණෙයි. සලකුණු කොට වරද්දපියයි. තොටුවෝ ලමු කොට සිතති. නුගුණ කියති. දෙස් පතුරුවත්: කෙසේ නම් සැහැදරු හත්ථක මහණ අප හා සමඟ සල්ලාප කරනුයේ අවමන් කොට ගිවිස ගත්තේ ද, ගිවිසගෙන අවමන් කෙළේ ද, අනෙකෙකින් අනෙකක් වසා දැම්මේ ද, දැන දැන බොරු කීවේ ද, සලකුණු කොට වරද්දපී දැ''යි.

2. භික්ෂූහු ලමු කොට සිතන්නා වූ නුගුණ කියන්නා වූ දෙස් පතුරුවන්නා වූ ඒ තොටුවන්ගේ (වචනය) ඇසූහ. එකල්හි ඒ භික්ෂූහු සැහැදරු හත්ථක මහණ තෙම යම්තැනෙක ද එතෙනට එළැඹියාහු යැ. එළැඹැ හත්ථක මහණහට මෙල වචනය කීහු: ''සැබැද ඇවැත්නි හත්ථකයෙනි, තෙපි තොටුවන් හා සමඟ කතාබහ කරනුවහු අවමන් කොට ගිවිසගනිවු ද, ගිවිසගෙන අවමන් කරවු ද අනෙකෙකින් අනෙකක් වසා දමවු ද, දන්නේ ම බොරු කියවු ද, සලකුණු කොට වරද්දපියවු දැ යි. ඇවැත්නි, මෙල තොටුවෝ වනාහි යම්කිසි අයුරෙකින් දිනිය යුතු වෙත්, ඔවුනට දිනුමෙක් නො දිය යුතු මැ යි යම් භික්ෂු කෙනෙක් අපිස්වූවාහු සතොස්ගුණ ඇත්තාහු ලජ්ජී වූවාහු කුකුස් ඇත්තාහු ශික්ෂාකාමීහු වෙද්ද, ඔවුහු ලමු කොට සිතති. නුගුණ කියති. දෙස් පතුරුවත්: ''කෙසේ නම් සැහැදරු හත්ථක මහණ තොටුවන් හා සමඟ සල්ලාප කරනුයේ අවමන් කොට ගිවිස ගත්තේ ද, ගිවිසගෙන අවමන් කෙළේ ද, අනෙකෙකින් අනෙකක් වසා දැම්මේ ද දැන දැන බොරු කීවේ ද, සලකුණු කොට වරද්දපී දැ''යි.

3. අථ ඛො තෙ භික්ඛූ හත්ථකං සක්‍යපුත්තං අනෙකපරියායෙන විගරහිත්වා[1] භගවතො එතමත්ථං ආරොචෙසුං, අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා හත්ථකං සක්‍යපුත්තං පටිපුච්ඡි. "සච්චං කිර ත්වං හත්ථක, තිත්ථියෙහි සද්ධිං සල්ලපන්තො අවජානිත්වා පටිජානාසි, පටිජානිත්වා අවජානාසි, අඤ්ඤෙනඤ්ඤං පටිචරසි, සම්පජානමුසා භාසසි, සඞ්කෙතං කත්වා විසංවාදෙසී"ති. සච්චං භගවාති. විගරහි බුද්ධො භගවා අනනුච්ඡවියං මොඝපුරිස, අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං කථං හි නාම ත්වං මොඝපුරිස, තිත්ථියෙහි සද්ධිං සල්ලපන්තො අවජානිත්වා පටිජානිස්සසි, පටිජානිත්වා අවජානිස්සසි, අඤ්ඤෙනඤ්ඤං පටිචරිස්සසි, සම්පජානමුසා භාසිස්සසි, සඞ්කෙතං කත්වා විසංවාදෙස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය පසන්නානං වා භිය්‍යොභාවාය අථ ඛ්වෙතං මොඝපුරිස, අප්පසන්නානං චෙව අප්පසාදාය පසන්නානං ච එකච්චානං අඤ්ඤථත්තායාති.

4. අථ ඛො භගවා තං භික්ඛුං අනෙකපරියායෙන විගරහිත්වා දුබ්භරතාය දුප්පොසතාය මහිච්ඡතාය අසන්තුට්ඨියා සඞ්ගණිකාය කොසජ්ජස්ස අවණ්ණං භාසිත්වා අනෙකපරියායෙන සුභරතාය සුපොසතාය අප්පිච්ඡස්ස සන්තුට්ඨස්ස සල්ලෙඛස්ස ධුතස්ස පාසාදිකස්ස අපචයස්ස විරියාරම්භස්ස වණ්ණං භාසිත්වා භික්ඛූනං තදනුච්ඡවිකං තදනුලොමිකං ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි, තෙන හි භික්ඛවෙ භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤපෙස්සාමි දස අත්ථවසෙ පටිච්ච: සඞ්ඝසුට්ඨුතාය සඞ්ඝඵාසුතාය, දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය, පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය, දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය, සම්පරායිකානං ආසවානං පටිඝාතාය, අප්පසන්නානං පසාදාය පසන්නානං භිය්‍යොභාවාය, සද්ධම්මට්ඨිතියා, විනයානුග්ගහාය. එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"සම්පජාන මුසාවාදෙ පාචිත්තිය"න්ති.**

5. **සම්පජානමුසාවාදෙ නාම:** විසංවාදනපුරෙක්ඛාරස්ස වාචා ගිරා ව්‍යප්පථො වචීභෙදො වාචසිකා විඤ්ඤත්ති, අට්ඨ අනරියවොහාරා: අදිට්ඨං දිට්ඨං මෙති, අසුතං සුතං මෙති, අමුතං මුතං මෙති, අවිඤ්ඤාතං විඤ්ඤාතං මෙති, දිට්ඨං අදිට්ඨං මෙති, සුතං අසුතං මෙති, මුතං අමුතං මෙති, විඤ්ඤාතං අවිඤ්ඤාතං මෙති.

---

1. "හත්ථකං සක්‍යපුත්තං අනෙකපරියායෙන විගරහිත්වා" ඉති පාඨො සීහළ මුද්දිත පොත්ථකෙ න දිස්සතෙ.

3. එකල්හි ඒ භික්ෂූහු සැහැදරු හත්ථක මහණහට නොයෙක් කරුණෙන් වෙසෙසින් ගරහා භාග්‍යවතුන්හට තෙල කරුණ සැලකළහ. **එකල්හි** භාග්‍යවතුන් වහන්සේ මේ කරුණෙහි ලා මේ අවසරයෙහි ලා **භික්ෂූන්** රැස් කරවා සැහැදරු හත්ථක මහණහු පුළුවුත්සේක: "සබෑද හත්ථකයෙනි, තෙපි තොටුවන් හා සමඟ සල්ලාප කරනුවහු අවමන් කොට ගිවිසගනිවු ද, ගිවිසගෙන අවමන් කරවු ද, අනෙකෙකින් අනෙකක් **වසාපියවු** ද, දන දන බොරු කියවු ද, සලකුණු කොට වරද්දපියවු ද"යි. සැබැවැ භාග්‍යවතුන් වහන්සැයි. භාග්‍යවත් බුදුහු (කුලුණු සිතින්) **වෙසෙසින්** ගැරහූහ: හිස් පුරුෂය, (තොප විසින් මේ කරන ලද්ද) නොනිසි යැ නො අනුලොම් යැ නුසුදුසු යැ, නොමහණකම් යැ නො කැප යැ නො කළයුතු මැ යි. "හිස්පුරුෂය, කෙසේ නම් තෙපි තොටුවන් හා සමඟ කතාබහ කරනුවහු අවමන් කොට ගිවිසගත්හු ද, ගිවිසපියා අවමන් කළහු ද, අනෙකකින් අනෙකෙක් වසාපියවු ද දන දන බොරු කිවූ ද, සලකුණු කොට වරද්දපීහු ද, හිස් පුරුෂය, තෙල කරුණ අප්‍රසන්නයන්ගේ ප්‍රසාදයට හෝ ප්‍රසන්නයන්ගේ අතිරෙක ප්‍රසාදයට හෝ නො වේ මැ යි. හිස් පුරුෂය, මෙකරුණු වැලිත් අප්‍රසන්නයන්ගේ අප්‍රසාදයටත් ප්‍රසන්නයන් අතුරෙහිදු ඇතැමුන්ගේ වෙනස් බවටත් වැටේ මැ යි.

4. එකල්හි භාග්‍යවතුන් වහන්සේ එමහණහට නොයෙක් කරුණෙන් වෙසෙසින් ගරහා දුබරබැව්හි දුපුස්නා බැව්හි මහිස් බැව්හි නොසතුටු බැව්හි මුළුබැඳගැනුම්හි අලසබැව්හි නුගුණ වදරා නොයෙක් කරුණෙන් සුබරබැව්හි සුපුස්නාබැව්හි අපිස්බැව්හි සතුටුබැව්හි සලේපැවැතුම්හි කෙලෙස් කැපුම්හි පැහැදුම්හි නිවනෙහි වැරඇරැඹුම්හි ගුණ වදරා මහණුන්හට එයට සරිලන එයට අනුලොම් වන දැහැමි බණ වදරා මහණුන් අමතා වදළසේක. එකරුණෙන් මහණෙනි, මහණුන්හට කරුණු දසයක් පිණිස සිකපද පනවන්නෙමි. (එනම්) සඟුන්ගේ මනා පිළිගැනුම, සඟුන්ගේ පහසු බව, දුසිල් පුඟුලනට නිගැන්ම, සුසිල් මහණුන් ගේ පහසු විසුම, මෙලෝ ගැහැට වැළකීම, පරලෝ ගැහැට වැනැසීම, නො පැහැදුණවුන්ගේ පැහැදීම, පැහැදුණවුන්ගේ අයිරා පැහැදීම, සසුන් පැවැත්ම, විනයට රැකුල්දීම පිණිස යැ. මෙසේත් මහණෙනි, මේ ශික්ෂාපදය උදෙසවු **"දන දන මුසා බිණීමෙහි පචිති ඇවැත් වේ"** යයි.

5. **සම්පජාන මුසාවාද නම්:** රැවටීම පෙරටු කොට ඇතියහුගේ වාචා යැ ගිරා යැ වාක්පථ යැ වාග්භෙද යැ වාග්විඥප්ති යැ. අදිට්ඨය මා විසින් දිට්ඨ (දක්නා ලද යැ) අසුතය මා විසින් සුත (අසන ලද) යැ, අමුතය මා විසින් මුත (විඳුනා ලද) යැ අවිඤ්ඤාත ය මා විසින් විඤ්ඤාත (දන්නා ලද) යැ දිට්ඨය මා විසින් අදිට්ඨ (නොදක්නා ලද) යැ සුතය මා විසින් අසුත (නො අසන ලද) යැ මුතය මා විසින් අමුත (නො විඳුනා ලද) යැ විඤ්ඤාතය මා විසින් අවිඤ්ඤාත (නොදන්නා ලද) ය යන අට අනරිය බැවහරනු යි.

අදිට්ඨං නාම: න චක්ඛුනා දිට්ඨං. අසුතං නාම: න සොතෙන සුතං. අමුතං නාම: න ඝානෙන ඝායිතං, න ජිව්හාය සායිතං, න කායෙන ඵුට්ඨං. අවිඤ්ඤාතං නාම: න මනසා විඤ්ඤාතං. දිට්ඨං නාම: චක්ඛුනා දිට්ඨං. සුතං නාම: සොතෙන සුතං. මුතං නාම: ඝානෙන ඝායිතං ජිව්හාය සායිතං කායෙන ඵුට්ඨං. විඤ්ඤාතං නාම: මනසා විඤ්ඤාතං

තීහාකාරෙහි අදිට්ඨං දිට්ඨං මෙති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස: පුබ්බෙවස්ස හොති මුසා භණිස්සන්ති, භණන්තස්ස හොති මුසා භණාමීති, භණිතස්ස හොති මුසා මයා භණිතන්ති.

චතූහාකාරෙහි අදිට්ඨං දිට්ඨං මෙති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස: පුබ්බෙවස්ස හොති මුසා භණිස්සන්ති, භණන්තස්ස හොති මුසා භණාමීති, භණිතස්ස හොති මුසා මයා භණිතන්ති, විනිධාය දිට්ඨිං.

පඤ්චහාකාරෙහි අදිට්ඨං දිට්ඨං මෙති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස, පුබ්බෙවස්ස හොති මුසා භණිස්සන්ති, භණන්තස්ස හොති මුසා භණාමීති, භණිතස්ස හොති මුසා මයා භණිතන්ති, විනිධාය දිට්ඨිං විනිධාය ඛන්තිං.

ඡහාකාරෙහි අදිට්ඨං දිට්ඨං මෙති සම්පජාන මුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස; පුබ්බෙවස්ස හොති මුසා භණිස්සන්ති භණන්තස්ස හොති මුසා භණාමීති, භණිතස්ස හොති මුසා මයා භණිතන්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං.

සත්තහාකාරෙහි අදිට්ඨං දිට්ඨං මෙති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස; පුබ්බෙවස්ස හොති මුසා භණිස්සන්ති, භණන්තස්ස හොති මුසා භණාමීති, භණිතස්ස හොති මුසා මයා භණිතන්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං විනිධාය භාවං.

තීහාකාරෙහි අසුතං සුතං මෙති –පෙ– අමුතං මුතං මෙති –පෙ– අවිඤ්ඤාතං විඤ්ඤාතං මෙති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස, පුබ්බෙවස්ස හොති මුසා භණිස්සන්ති, භණන්තස්ස හොති මුසා භණාමීති, භණිතස්ස හොති මුසා මයා භණිතන්ති,

**අදිට්ඨ නම්**: ඇසින් නො දක්නා ලද යැ. **අසුත නම්**: කනින් නො අසන ලද යැ. **අමුත නම්**; නැහැයෙන් ඉව කොට නො ගන්නා ලද යැ දිවෙන් රස නො විඳින ලද යැ කයින් නො පහස්නා ලද යැ. **අවිඤ්ඤාත නම්**: මනසින් නො දන්නා ලද යැ. **දිට්ඨ නම්**: ඇසින් දක්නා ලද යැ. **සුත නම්**: කනින් අසන ලද යැ. **මුත නම්**: නැහැයෙන් ඉව කොට ගන්නා ලද යැ දිවෙන් රසවිඳින ලද යැ කයින් පහස්නා ලද යැ. **විඤ්ඤාත නම්**: මනසින් දන්නාලද යැ.

අදෘෂ්ටය මා විසින් දෘෂ්ට යැ යි දැන දැන බොරු කියන්නාහට තුන් අයුරෙකින් පව්ති වෙයි; පළමු කොට ම ඒ පුහුල්හට බොරු කියන් නෙමැ යි සිත් වෙයි, කියන්නාහට බොරු කියමි යි සිත් වෙයි, කීවහුට මා විසින් බොරු කියන ලදූ යි සිත් වෙයි.

අදෘෂ්ටය මා විසින් දෘෂ්ට යැ යි දැන දැන බොරු කියන්නාහට සතර අයුරෙකින් පව්ති වෙයි: පළමු කොට ම ඒ පුහුල්හට ලබ්ධිය තබා බොරු කියන්නෙමැයි සිත් වෙයි, කියන්නාහට බොරු කියමි යි සිත් වෙයි, කීවහුට මා විසින් බොරු කියන ලදූ යි සිත් වෙයි.

දෘෂ්ටය මා විසින් දෘෂ්ට යැ යි දැන දැන බොරු කියන්නාහට පස් අයුරෙකින් පව්ති වෙයි: පළමු කොට ම ඒ පුහුල්හට ලබ්ධිය පිහිටුවා ඉවසීම තබා, බොරු කියන්නෙමැයි සිත් වෙයි, කියන්නාහට බොරු කියමියි සිත් වෙයි, කීවහුට මා විසින් බොරු කියන ලදූ යි සිත් වෙයි.

අදෘෂ්ටය මා විසින් දෘෂ්ටයැ යි දැන දැන බොරු කියන්නාහට සඅයුරෙකින් පව්ති වෙයි; පළමු කොට ම ඒ පුහුල්හට ලබ්ධිය තබා, ඉවසීම තබා, රුචිය තබා බොරු කියන්නෙමැයි සිත් වෙයි, කියන්නාහට බොරු කියමියි සිත් වෙයි, කීවහුට මා විසින් බොරු කියන ලදූ යි සිත් වෙයි.

අදෘෂ්ටය මා විසින් දෘෂ්ට යැ යි දැන දැන බොරු කියන්නාහට සත් අයුරෙකින් පව්ති වෙයි: පළමු කොට ම ඒ පුහුල්හට ලබ්ධිය පිහිටුවා ඉවසීම තබා රුචිය තබා, අදහස තබා බොරු කියන්නෙමැයි සිත් වෙයි, කියන්නාහට බොරු කියමියි සිත් වෙයි, කීවාහට මා විසින් බොරු කියන ලදූයි සිත් වෙයි.

අශ්‍රැතය මා විසින් ශ්‍රැත යැ යි... අමුතය මා විසින් මුත යැ යි ...අවිඥාතය මා විසින් විඥාත යැ යි දැන දැන බොරු කියන්නාහට තුන් අයුරෙකින් පව්ති වෙයි: පළමු කොට ම ඒ පුහුල්හට බොරු කියන් නෙමැයි සිත් වෙයි. කියන්නාහට බොරු කියමැයි සිත් වෙයි. කීවාහට මා විසින් බොරු කියන ලදූයි සිත් වෙයි.

චතුහාකාරෙහි -පෙ- පඤ්චහාකාරෙහි -පෙ- ඡහාකාරෙහි -පෙ- සත්තහාකාරෙහි අසුතං සුතං මෙති -පෙ- අමුතං මුතං මෙති -පෙ- අවිඤ්ඤාතං විඤ්ඤාතං මෙති සම්පජාන මුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස: පුබ්බෙවස්ස හොති මුසා භණිස්සන්ති, භණන්තස්ස හොති මුසා භණාමීති, භණිතස්ස හොති මුසා මයා භණිතන්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං විනිධාය භාවං.

තීහාකාරෙහි අදිට්ඨං දිට්ඨඤ්ච මෙ සුතඤ්චාති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස: -පෙ- තීහාකාරෙහි අදිට්ඨං දිට්ඨඤ්ච මෙ මුතඤ්චාති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස: -පෙ- තීහාකාරෙහි අදිට්ඨං දිට්ඨඤ්ච මෙ විඤ්ඤාතඤ්චාති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස; -පෙ- තීහාකාරෙහි අදිට්ඨං දිට්ඨඤ්ච මෙ සුතඤ්ච මුතඤ්චාති -පෙ- තීහාකාරෙහි අදිට්ඨං දිට්ඨඤ්ච මෙ සුතඤ්ච විඤ්ඤාතඤ්චාති -පෙ- තීහාකාරෙහි අදිට්ඨං දිට්ඨඤ්ච මෙ සුතඤ්ච මුතඤ්ච විඤ්ඤාතඤ්චාති සම්පජාන මුසාභණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස -පෙ-.

තීහාකාරෙහි අසුතං සුතඤ්ච මෙ මුතඤ්චාති -පෙ- තීහාකාරෙහි අසුතං සුතඤ්ච මෙ විඤ්ඤාතඤ්චාති -පෙ- තීහාකාරෙහි අසුතං සුතඤ්ච මෙ දිට්ඨඤ්චාති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස. -පෙ- තීහාකාරෙහි අසුතං සුතඤ්ච මෙ මුතඤ්ච විඤ්ඤාතඤ්චාති -පෙ-. තීහාකාරෙහි අසුතං සුතඤ්ච මෙ මුතඤ්ච දිට්ඨඤ්චාති -පෙ- තීහාකාරෙහි අසුතං සුතඤ්ච මෙ මුතඤ්ච විඤ්ඤාතඤ්ච දිට්ඨඤ්චාති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස -පෙ-.

තීහාකාරෙහි අමුතං මුතඤ්ච මෙ විඤ්ඤාතඤ්චාති -පෙ- තීහාකාරෙහි අමුතං මුතඤ්ච මෙ දිට්ඨඤ්චාති -පෙ- තීහාකාරෙහි අමුතං මුතඤ්ච මෙ සුතඤ්චාති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස -පෙ- තීහාකාරෙහි අමුතං මුතඤ්ච මෙ විඤ්ඤාතඤ්ච දිට්ඨඤ්චාති -පෙ- තීහාකාරෙහි අමුතං මුතඤ්ච මෙ විඤ්ඤාතඤ්ච සුතඤ්චාති -පෙ- තීහාකාරෙහි අමුතං මුතඤ්ච මෙ විඤ්ඤාතඤ්ච දිට්ඨඤ්ච සුතඤ්චාති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස -පෙ-

තීහාරෙහි අවිඤ්ඤාතං විඤ්ඤාතඤ්ච මෙ දිට්ඨඤ්චාති -පෙ- තීහාකාරෙහි අවිඤ්ඤාතං විඤ්ඤාතඤ්ච මෙ සුතඤ්චාති -පෙ- තීහාකාරෙහි අවිඤ්ඤාතං විඤ්ඤාතඤ්ච මෙ මුතඤ්චාති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස -පෙ- තීහාකාරෙහි අවිඤ්ඤාතං විඤ්ඤාතං ච මෙ දිට්ඨඤ්ච සුතඤ්චාති -පෙ- තීහාකාරෙහි අවිඤ්ඤාතං විඤ්ඤාතඤ්ච මෙ දිට්ඨඤ්ච මුතඤ්චාති -පෙ- තීහාකාරෙහි අවිඤ්ඤාතං විඤ්ඤාතඤ්ච මෙ දිට්ඨඤ්ච සුතඤ්ච මුතඤ්චාති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස; -පෙ-.

සතර අයුරෙකින්... පස් අයුරෙකින්... ස අයුරෙකින්... අශ්‍රැතය මා විසින් ශ්‍රැත යැ යි අමුතය මා විසින් මුත යැ යි... අවිඥාතය මා විසින් විඥාත යැ යි දැන දැන බොරු කියන්නාහට සත් අයුරෙකින් පව්ති වෙයි: පළමු කොට ම ඒ පුඟුල්හට ලබ්ධිය බහාතබා, ඉවසීම තබා, රුචිය පිහිටුවා අදහස තබා බොරු කියන්නෙමැයි සිත් වෙයි. කියන්නාහට බොරු කියමියි සිත් වෙයි, කීවා හට මා විසින් බොරු කියන ලදැයි සිත් වෙයි.

අදෘෂ්ටය මා විසින් දෘෂ්ට ද ශ්‍රැත ද යි දැන දැන බොරු කියන්නා හට තුන් අයුරෙකින් පව්ති වෙයි:...අදෘෂ්ටය මා විසින් දෘෂ්ට ද මුත ද යි දැන දැන බොරු කියන්නාහට තුන් අයුරෙකින් පව්ති වෙයි... අදෘෂ්ටය මා විසින් දෘෂ්ට ද විඥාත ද යි දැන දැන බොරු කියන්නා හට තුන් අයුරෙකින් පව්ති වෙයි... අදෘෂ්ටය මා විසින් දෘෂ්ට ද ශ්‍රැත ද මුත දැයි තුන් අයුරෙකින්... අදෘෂ්ටය මා විසින් දෘෂ්ට ද ශ්‍රැත ද විඥාත ද යි තුන් අයුරෙකින්... අදෘෂ්ටය මා විසින් දෘෂ්ට ද ශ්‍රැත ද මුත ද විඥාත දැයි දැන දැන බොරු කියන්නා හට තුන් අයුරෙකින් පව්ති වේ.

අශ්‍රැතය මා විසින් ශ්‍රැත ද මුත ද යි තුන් අයුරෙකින්... අශ්‍රැතය මා විසින් ශ්‍රැත ද විඥාත ද යි තුන් අයුරෙකින්...අශ්‍රැතය මා විසින් ශ්‍රැත ද දෘෂ්ට ද යි දැන දැන බොරු කියන්නාහට තුන් අයුරෙකින් පව්ති වෙයි. අශ්‍රැතය මා විසින් ශ්‍රැත ද මුත ද විඥාත ද යි තුන් අයුරෙකින්... අශ්‍රැතය මා විසින් ශ්‍රැත ද මුත ද දෘෂ්ට ද යි තුන් අයුරෙකින්... අශ්‍රැතය මා විසින් ශ්‍රැත ද මුත ද විඥාත ද දෘෂ්ට ද යි දැන දැන බොරු කියන්නාහට තුන් අයුරෙකින් පව්ති වේ...

අමුතය මා විසින් මුත ද විඥාත ද යි තුන් අයුරෙකින්... අමුතය මා විසින් මුත ද දෘෂ්ට ද යි තුන් අයුරෙකින්... අමුතය මා විසින් මුත ද ශ්‍රැත ද යි දැන දැන බොරු කියන්නාහට තුන් අයුරෙකින් පව්ති ඇවැත් වෙයි...අමුතය මා විසින් මුත ද විඥාත ද දෘෂ්ට ද යි තුන් අයුරෙකින්... අමුතය මා විසින් මුත ද විඥාත ද ශ්‍රැත ද යි තුන් අයුරෙකින්...අමුතය මා විසින් මුත ද විඥාත ද දෘෂ්ට ද ශ්‍රැත ද යි දැන දැන බොරු කියන්නාහට තුන් අයුරෙකින් පව්ති වේ...

අවිඥාතය මා විසින් විඥාත ද දෘෂ්ට ද යි තුන් අයුරෙකින්... අවිඥාතය මා විසින් විඥාත ද ශ්‍රැත ද යි තුන් අයුරෙකින්... අවිඥාතය මා විසින් විඥාත ද මුත ද යි දැන දැන බොරු කියන්නාහට තුන් අයුරෙකින් පව්ති වෙයි... අවිඥාතය මා විසින් විඥාත ද දෘෂ්ට ද ශ්‍රැත ද යි ... අවිඥාතය මා විසින් විඥාත ද දෘෂ්ට ද මුත ද යි තුන් අයුරෙකින්... අවිඥාතය මා විසින් විඥාත ද දෘෂ්ට ද ශ්‍රැත ද මුත ද යි දැන දැන බොරු කියන්නාහට තුන් අයුරෙකින් පව්ති වේ...

තිභාකාරෙහි දිට්ඨං අදිට්ඨං මෙති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස: පුබ්බෙවස්ස හොති මුසා භණිස්සන්ති, භණන්තස්ස හොති මුසා භණාමීති, භණිතස්ස හොති මුසා මයා භණිතන්ති. චතුභාකාරෙහි –පෙ– පඤ්චභාකාරෙහි –පෙ– ඡභාකාරෙහි –පෙ– සත්තභාකාරෙහි දිට්ඨං අදිට්ඨං මෙති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස: පුබ්බෙවස්ස හොති මුසා භණිස්සන්ති, භණන්තස්ස හොති මුසා භණාමීති, භණිතස්ස හොති මුසා මයා භණිතන්ති, විනිධාය දිට්ඨිං විනිධාය ඛන්තිං, විනිධාය රුචිං, විනිධාය භාවං.

තිභාකාරෙහි සුතං අසුතං මෙති –පෙ– මුතං අමුතං මෙති –පෙ– විඤ්ඤාතං අවිඤ්ඤාතං මෙති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස; පුබ්බෙවස්ස හොති මුසා භණිස්සන්ති, භණන්තස්ස හොති මුසා භණාමීති, භණිතස්ස හොති මුසා මයා භණිතන්ති. චතුභාකාරෙහි –පෙ– පඤ්චභාකාරෙහි –පෙ– ඡභාකාරෙහි –පෙ– සත්තභාකාරෙහි සුතං අසුතං මෙති –පෙ– මුතං අමුතං මෙති –පෙ– විඤ්ඤාතං අවිඤ්ඤාතං මෙති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස: පුබ්බෙවස්ස හොති මුසා භණිස්සන්ති, භණන්තස්ස හොති මුසා භණාමීති, භණිතස්ස හොති මුසා මයා භණිතන්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං, විනිධාය භාවං.

තිභාකාරෙහි දිට්ඨං සුතං මෙති –පෙ– තිභාකාරෙහි දිට්ඨං මුතං මෙති –පෙ– තිභාකාරෙහි දිට්ඨං විඤ්ඤාතං මෙති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස; –පෙ– තිභාකාරෙහි දිට්ඨං සුතඤ්ච මෙ මුතඤ්චාති –පෙ– තිභාකාරෙහි දිට්ඨං සුතඤ්ච මෙ විඤ්ඤාතඤ්චාති –පෙ– තිභාකාරෙහි දිට්ඨං සුතඤ්ච මෙ මුතඤ්ච විඤ්ඤාතඤ්චාති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස: –පෙ–

තිභාකාරෙහි සුතං මුතං මෙති –පෙ– තිභාකාරෙහි සුතං විඤ්ඤාතං මෙති –පෙ– තිභාකාරෙහි සුතං දිට්ඨං මෙති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස; –පෙ– තිභාකාරෙහි සුතං මුතඤ්ච මෙ විඤ්ඤාතඤ්චාති –පෙ– තිභාකාරෙහි සුතං මුතඤ්ච මෙ දිට්ඨඤ්චාති –පෙ– තිභාකාරෙහි සුතං මුතඤ්ච මෙ විඤ්ඤාතඤ්ච දිට්ඨඤ්චාති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස –පෙ–.

තිභාකාරෙහි මුතං විඤ්ඤාතං මෙති –පෙ– තිභාකාරෙහි මුතං දිට්ඨං මෙති–පෙ–තිභාකාරෙහි මුතං සුතං මෙති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස –පෙ– තිභාකාරෙහි මුතං විඤ්ඤාතඤ්ච මෙ දිට්ඨඤ්චාති –පෙ– තිභාකාරෙහි මුතං විඤ්ඤාතඤ්ච මෙ සුතඤ්චාති –පෙ– තිභාකාරෙහි මුතං විඤ්ඤාතඤ්ච මෙ දිට්ඨඤ්ච සුතඤ්චාති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස –පෙ–.

දෘෂ්ටය මා විසින් අදෘෂ්ට යැ යි දැන දැන බොරු කියන්නාහට තුන් අයුරෙකින් පචිති වේ: පළමුකොට ම ඒ පුහුල් හට බොරු කියන්නෙමැයි සිත් වෙයි. කියන්නාහට බොරු කියමැයි සිත් වෙයි. කීවාහට මා විසින් බොරු කියන ලදැයි සිත් වෙයි. සතර අයුරෙකින්... පස් අයුරෙකින්... ස අයුරෙකින්... දෘෂ්ටය මා විසින් අදෘෂ්ට යැ යි දැන දැන බොරු කියන්නාහට සත් අයුරෙකින් පචිති වෙයි. පළමුකොට ම ඒ පුහුල්හට ලබ්ධිය තබා, ඉවසීම තබා, රුචිය තබා, අදහස තබා බොරු කියන්නෙමැයි සිත් වෙයි. කියන්නාහට බොරු කියමැයි සිත් වෙයි. කීවාහට මා විසින් බොරු කියන ලදැයි සිත් වෙයි.

ශ්‍රැතය මා විසින් අශ්‍රැත යැ යි... මුතය මා විසින් අමුත යැ යි... විඥාතය මා විසින් අවිඥාත යැ යි දැන දැන බොරු කියන්නාහට තුන් අයුරෙකින් පචිති වේ. පළමු කොට ඒ පුහුල්හට බොරු කියන්නෙමැයි සිත් වෙයි. කියන්නාහට බොරු කියමැයි සිත් වෙයි. කීවාහට මා විසින් බොරු කියන ලදැයි සිත් වෙයි. සතර අයුරෙකින් ... පස් අයුරෙකින් ...සඅයුරෙකින් ...ශ්‍රැතය මා විසින් අශ්‍රැත යැ යි ...මුතය මා විසින් අමුත යැ යි ...විඥාතය මා විසින් අවිඥාත යැ යි දැන දැන බොරු කියන්නා හට සත් අයුරෙකින් පචිති ඇවැත් වෙයි: පළමුකොට ම ඒ පුහුල්හට ලබ්ධිය තබා, ඉවසීම තබා, රුචිය තබා අදහස තබා බොරු කියන්නෙ මැයි සිත් වෙයි. කියන්නාහට බොරු කියමැයි සිත් වෙයි. කීවාහට මා විසින් බොරු කියනලදැයි සිත් වෙයි.

දෘෂ්ටය මා විසින් ශ්‍රැත යැ යි තුන් අයුරෙකින් ...දෘෂ්ටය මා විසින් මුත යැ යි තුන් අයුරෙකින්... දෘෂ්ටය මා විසින් විඥාත යැ යි දැන දැන බොරු කියන්නාහට තුන් අයුරෙකින් පචිති ඇවැත් වෙයි... දෘෂ්ටය මා විසින් ශ්‍රැත ද මුත දැ යි තුන් අයුරෙකින්... දෘෂ්ටය මා විසින් ශ්‍රැත ද විඥාත දැ යි තුන් අයුරෙකින්... දෘෂ්ටය මා විසින් ශ්‍රැත ද මුත ද විඥාත දැ යි දැන දැන බොරු කියන්නාහට තුන් අයුරෙකින් පචිති ඇවැත් වේ:...

ශ්‍රැතය මා විසින් මුත යැ යි තුන් අයුරෙකින් ... ශ්‍රැතය මා විසින් විඥාත යැයි තුන් අයුරෙකින් ... ශ්‍රැතය මා විසින් දෘෂ්ට යැ යි දැන දැන බොරු කියන්නාහට තුන් අයුරකින් පචිති ඇවැත් වෙයි...ශ්‍රැතය මා විසින් මුත ද විඥාත දැ යි තුන් අයුරෙකින් ...ශ්‍රැතය මා විසින් මුත ද දෘෂ්ට දැ යි තුන් අයුරෙකින්... ශ්‍රැතය මා විසින් මුත ද විඥාත ද දෘෂ්ට දැ යි දැන දැන බොරු කියන්නාහට තුන් අයුරෙකින් පචිති ඇවැත් වේ...

මුතය මා විසින් විඥාත යැ යි තුන් අයුරෙකින් ... මුතය මා විසින් දෘෂ්ට යැ යි තුන් අයුරෙකින් ... මුතය මා විසින් ශ්‍රැත යැ යි දැන දැන බොරු කියන්නාහට තුන් අයුරෙකින් පචිති ඇවැත් වෙයි. ... මුතය මා විසින් විඥාත ද දෘෂ්ට දැ යි තුන් අයුරෙකින් ... මුතය මා විසින් විඥාත ද ශ්‍රැත දැ යි තුන් අයුරෙකින්... මුතය මා විසින් විඥාත ද දෘෂ්ට ද ශ්‍රැත දැ යි දැන දැන බොරු කියන්නාහට තුන් අයුරෙකින් පචිති ඇවැත් වේ...

තීහාකාරෙහි විඤ්ඤාතං දිට්ඨං මෙති -පෙ- තීහාකාරෙහි විඤ්ඤාතං සුතං මෙති -පෙ- තීහාකාරෙහි විඤ්ඤාතං මුතං මෙති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස -පෙ- තීහාකාරෙහි විඤ්ඤාතං දිට්ඨඤ්ච මෙ සුතඤ්චාති -පෙ- තීහාකාරෙහි විඤ්ඤාතං දිට්ඨඤ්ච මෙ මුතඤ්චාති -පෙ- තීහාකාරෙහි විඤ්ඤාතං දිට්ඨඤ්ච මෙ සුතඤ්ච මුතඤ්චාති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස -පෙ-

තීහාකාරෙහි දිට්ඨෙ වෙමතිකො දිට්ඨං නො කප්පෙති දිට්ඨං නස්සරති දිට්ඨං පමුට්ඨො[1] හොති දිට්ඨං මෙ සුතඤ්චාති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස -පෙ- දිට්ඨං මෙ සුතඤ්ච මුතඤ්ච විඤ්ඤාතඤ්චාති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස -පෙ- සුතෙ වෙමතිකො සුතං නො කප්පෙති සුතං නස්සරති සුතං පමුට්ඨො හොති -පෙ- මුතෙ වෙමතිකො මුතං නො කප්පෙති මුතං නස්සරති මුතං පමුට්ඨො[1] හොති -පෙ- තීහාකාරෙහි විඤ්ඤාතෙ වෙමතිකො විඤ්ඤාතං නො කප්පෙති විඤ්ඤාතං නස්සරති විඤ්ඤාතං පමුට්ඨො හොති විඤ්ඤාතඤ්ච මෙ දිට්ඨඤ්චාති -පෙ- විඤ්ඤාතං පමුට්ඨො හොති විඤ්ඤාතඤ්ච මෙ සුතඤ්චාති -පෙ- විඤ්ඤාතං පමුට්ඨො හොති විඤ්ඤාතඤ්ච මෙ මුතඤ්චාති -පෙ- විඤ්ඤාතං පමුට්ඨො හොති විඤ්ඤාතඤ්ච මෙ දිට්ඨඤ්ච සුතඤ්චාති -පෙ- විඤ්ඤාතං පමුට්ඨො[1] හොති විඤ්ඤාතඤ්ච මෙ දිට්ඨඤ්ච සුතඤ්ච මුතඤ්චාති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස, පුබ්බෙවස්ස හොති මුසා භණිස්සන්ති, භණන්තස්ස හොති මුසා භණාමීති, භණිතස්ස හොති මුසා මයා භණිතන්ති.

චතුහාකාරෙහි -පෙ- පඤ්චහාකාරෙහි -පෙ- ඡහාකාරෙහි -පෙ- සත්තහාකාරෙහි -පෙ- විඤ්ඤාතං පමුට්ඨො හොති විඤ්ඤාතඤ්ච මෙ දිට්ඨඤ්ච සුතඤ්ච මුතඤ්චාති සම්පජානමුසා භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස, පුබ්බෙවස්ස හොති මුසා භණිස්සන්ති, භණන්තස්ස හොති මුසා භණාමීති, භණිතස්ස හොති මුසා මයා භණිතන්ති, විනිධාය දිට්ඨිං, විනිධාය ඛන්තිං, විනිධාය රුචිං විනිධාය භාවං.

**අනාපත්ති:** දවා භණති, රවා භණති. දවා භණති නාම: සහසා භණති. රවා භණති නාම: අඤ්ඤං භණිස්සාමීති අඤ්ඤං භණති, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

මුසාවාදසික්ඛාපදං පඨමං

1. පම්මුට්ඨො-සිමු.

විඥාතය මා විසින් දෘෂ්ට යැ යි තුන් අයුරෙකින්... විඥාතය මා විසින් ශ්‍රැත යැ යි තුන් අයුරෙකින්... විඥාතය මා විසින් මුත යැ යි දූන දූන බොරු කියන්නාහට තුන් අයුරෙකින් පචිති ඇවැත් වෙයි... විඥාතය මා විසින් දෘෂ්ට ද ශ්‍රැත ද යි තුන් අයුරෙකින්... විඥාතය මා විසින් දෘෂ්ට ද මුත ද යි තුන් අයුරෙකින් ... විඥාතය මා විසින් දෘෂ්ට ද ශ්‍රැත ද මුත ද යි දූන දූන බොරු කියන්නාහට තුන් අයුරෙකින් පචිති ඇවැත් වේ:...

දෘෂ්ටයෙහි විමති ඇතියේ දෘෂ්ටය නො ද අදහයි. දෘෂ්ටය නො සිහි කරයි. දෘෂ්ටයෙහි ප්‍රමෘෂ්ට වෙයි. දෘෂ්ටය මා විසින් ශ්‍රැත ද යි දූන දූන බොරු කියන්නාහට තුන් අයුරෙකින් පචිති වේ... දෘෂ්ටය මා විසින් ශ්‍රැත ද මුත ද විඥාත ද යි දූන දූන බොරු කියන්නාහට තුන් අයුරෙකින් පචිති ඇවැත් වේ.... ශ්‍රැතයෙහි විමති ඇතියේ ශ්‍රැතය නො ද අදහයි. ශ්‍රැතය නො සිහි කරයි. ශ්‍රැතයෙහි ප්‍රමෘෂ්ට වෙයි.... මුතයෙහි විමති ඇතියේ මුතය නො ද අදහයි. මුතය නො සිහි කරයි. මුතයෙහි ප්‍රමෘෂ්ට වෙයි.... තුන් අයුරෙකින් විඥාතයෙහි විමති ඇතියේ විඥාතය නො ද අදහයි. විඥාතය නො සිහි කරයි. විඥාතයෙහි ප්‍රමෘෂ්ට වෙයි. මා විසින් විඥාත ද දෘෂ්ට ද යි... විඥාතයෙහි ප්‍රමෘෂ්ට වෙයි. මා විසින් විඥාත ද ශ්‍රැත ද යි ... විඥාතයෙහි ප්‍රමෘෂ්ට වෙයි. මා විසින් විඥාත ද මුත දයි... විඥාතයෙහි ප්‍රමෘෂ්ට වෙයි. මා විසින් විඥාත ද දෘෂ්ට ද ශ්‍රැත ද යි... විඥාතයෙහි ප්‍රමෘෂ්ට වෙයි. මා විසින් විඥාත ද දෘෂ්ට ද ශ්‍රැත ද මුත ද යි දූන දූන බොරු කියන්නාහට පචිති ඇවැත් වේ: කැලම ඔහුට බොරු කියන්නෙමැයි සිත් වෙයි. කියන්නාහට බොරු කියමැයි සිත් වෙයි. කීවාහට මා විසින් බොරු කියන ලදැ යි සිත් වෙයි.

සතර අයුරෙකින් ... පස් අයුරෙකින්... සඅයුරෙකින්... සත් අයුරෙකින්... විඥාතයෙහි ප්‍රමෘෂ්ට වෙයි. මා විසින් විඥාත ද දෘෂ්ට ද ශ්‍රැත ද මුත ද යි දූන දූන බොරු කියන්නාහට පචිති ඇවැත් වේ: කැල ම ඔහුට ලබ්ධිය තබා, ඉවසීම තබා, රුචිය පිහිටුවා අදහස තබා බොරු කියන්නෙමැයි සිත්වෙයි. කියන්නා හට බොරු කියමැයි සිත් වෙයි, කීවාහට මා විසින් බොරු කියන ලදැයි සිත් වෙයි.

ලාහෙළා බෙණේ නම්, පැකිල බෙණේ නම්, ඇවැත් නැති: **ලාහෙළා බිණීම** නම් යුහුවැ කීම යි. **පැකිලැ බිණීම** නම් අනෙකක් කියන්නෙමැයි අනෙකක් කීම යි. උන්මත්තකයහුට ද, ආදිකාර්මික-යහුට ද ඇවැත් නැති.

**පළමුවැනි මුසාවාද ශික්ෂාපද යි.**

# 6. 1. 2

## ඔමසවාදසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ පෙසලෙහි භික්ඛූහි සද්ධිං භණ්ඩෙන්ති,[1] පෙසලෙ භික්ඛූ ඔමසන්ති; ජාතියාපි නාමෙනපි ගොත්තෙනපි කම්මෙනපි සිප්පෙනපි ආබාධෙනපි ලිඞ්ගෙනපි කිලෙසෙනපි ආපත්තියාපි හීනෙනපි අක්කොසෙන ඛුංසෙන්ති වම්භෙන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති; ''කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ පෙසලෙහි භික්ඛූහි සද්ධිං භණ්ඩන්තා පෙසලෙ භික්ඛූ ඔමසිස්සන්ති; ජාතියාපි නාමෙනපි ගොත්තෙනපි කම්මෙනපි සිප්පෙනපි ආබාධෙනපි ලිඞ්ගෙනපි කිලෙසෙනපි ආපත්තියාපි හීනෙනපි අක්කොසෙන ඛුංසෙස්සන්ති වම්භෙස්සන්ති''ති

2. අථ ඛො තෙ භික්ඛූ ඡබ්බග්ගියෙ භික්ඛූ අනෙකපරියායෙන විගරහිත්වා භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ පෙසලෙහි භික්ඛූහි සද්ධිං භණ්ඩන්තා පෙසලෙ භික්ඛූ ඔමසථ: ජාතියාපි -පෙ- හීනෙනපි අක්කොසෙන ඛුංසෙථ වම්භෙථාති.

සච්චං භගවාති.

විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා පෙසලෙහි භික්ඛූහි සද්ධිං භණ්ඩන්තා පෙසලෙ භික්ඛූ ඔමසිස්සථ: ජාති-යාපි -පෙ- හීනෙනපි අක්කොසෙන ඛුංසෙස්සථ වම්භෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි.

3. භූතපුබ්බං භික්ඛවෙ, තක්කසිලායං අඤ්ඤතරස්ස බ්‍රාහ්මණස්ස නන්දිවිසාලො නාම බලිවද්දො[2] අහොසි. අථ ඛො භික්ඛවෙ නන්දිවිසාලො බලිවද්දො තං බ්‍රාහ්මණං එතදවොච: ''ගච්ඡ ත්වං බ්‍රාහ්මණ සෙට්ඨිනා සද්ධිං සහස්සෙන අබ්භුතං කරොහි, මය්හං බලිවද්දො සකටසතං අතිබද්ධං පවට්ටෙස්සතී''ති. අථ ඛො භික්ඛවෙ සො බ්‍රාහ්මණො සෙට්ඨිනා සද්ධිං සහස්සෙන අබ්භුතං අකාසි, ''මය්හං බලිවද්දො සකටසතං අතිබද්ධං පවට්ටෙස්සතී''ති. අථ ඛො භික්ඛවෙ සො බ්‍රාහ්මණො සකටසතං අතිබන්ධිත්වා නන්දිවිසාලං බලිවද්දං යොජෙත්වා එතදවොච: ''අඤ්ඡ[3] කූට, වහස්සු කූටා''ති. අථ ඛො භික්ඛවෙ නන්දිවිසාලො බලිවද්දො තත්ථෙව අට්ඨාසි. අථ ඛො භික්ඛවෙ සො බ්‍රාහ්මණො සහස්සෙන පරාජිතො පජ්ඣායි.

1. භණ්ඩන්තා - මජසං
2. බලිවද්දො - මජසං
3. ගච්ඡ - මජසං

## 6. 1. 2

## ඔමසවාද ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් වූ, අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩ වෙසෙති. එකල්හි සවග මහණහු ප්‍රියශීල භික්ෂූන් සමග ඩබර කරමින් ප්‍රියශීල භික්ෂූන් (රළුබස් නැමැති හුල් වලින් විනි විදිත්) විද බෙණෙත්: ජාතියෙනුදු නාමයෙනුදු ගොත්‍රයෙනුදු කර්මයෙනුදු ශිල්පයෙනුදු ආබාධයෙනුදු ලිඞ්ගයෙනුදු ක්ලේශයෙනුදු ආපත්තියෙනුදු හීන වූ ආක්‍රෝශයෙනුදු ආක්‍රෝශ කෙරෙත් ගරහත්. යම් භික්ෂු කෙනෙක් අපිස්වූවෝ...ඔවුහු ලමු කොට සිතති. නුගුණ පවසති දෙස් පතුරුවත්: ''කෙසේ නම් සවග මහණහු ප්‍රියශීල භික්ෂූන් සමග ඩබර කරමින් ප්‍රියශීල භික්ෂූන්හට සටා බෙණෙත් ද, ජාතියෙනුදු නාමයෙනුදු ගොත්‍රයෙනුදු කර්මයෙනුදු ශිල්පයෙනුදු ආබාධයෙනුදු ලිඞ්ග-යෙනුදු ක්ලේශයෙනුදු ආපත්තියෙනුදු හීන වූ ආක්‍රොශයෙනුදු ආක්‍රොශ කෙරෙත් ද, ගරහත් දැ''යි.

2. එකල්හි ඒ භික්ෂූහු සවග මහණුන්හට නොයෙක් කරුණෙන් වෙසෙසින් ගරහා භාග්‍යවතුන්හට තෙල කරුණ සැලකළහ...සැබෑද මහණෙනි, තෙපි ප්‍රියශීල භික්ෂූන් සමග ඩබර කරමින් ප්‍රියශීල භික්ෂූන්හට සටාබණනහු ද, ජාතියෙනුදු... හීන වූ ආක්‍රෝශයෙනුදු ආක්‍රෝශ කරවු ද, ගරහවු දැ යි.

සැබැව භාග්‍යවතුන් වහන්ස,

භාග්‍යවත් බුදුහු වෙසෙසින් ගැරහූහ..., ''හිස් පුරුෂයෙනි, කෙසේ නම් තෙපි ප්‍රියශීල භික්ෂූන් සමග ඩබර කරමින් ප්‍රියශීල භික්ෂූන්හට සටා බෙණෙවු ද, ජාතියෙනුදු...හීන වූ ආක්‍රොශයෙනුදු ආක්‍රොශ කරවු ද, ගරහවු දැ''යි හිස්පුරුෂයෙනි, තෙල කරුණ අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ... නො වේ යැ යි වෙසෙසින් ගරහා දැහැමි කථා කොට මහණුන් ඇමැතූහ.

3. මහණෙනි, මේ පෙර වූ දෑයෙකි: තක්සලායෙහි එක්තරා බමුණකුට නන්දිවිසාල නම් වෘෂභයෙක් විය. එකල්හි මහණෙනි, නන්දිවිශාල වෘෂභ එබමුණුහට තෙල බස කී ය. බමුණ, තෝ යා, සිටුහු සමහ දහසෙකින් පරදු තබව, ''මාගේ වෘෂභ තෙමේ එකට බැඳි ගැල් සියයක් (පෙරගැල තුබූ තැනට පසුගැල) අදනේ යැ''යි. ඉක්බිති මහණෙනි, එබමුණු සිටුහු සමහ දහසෙකින් පරදු තැබී ය. ''මාගේ වෘෂභ එකට බැඳි ගැල් සියයක් අදනේ යැ යි'' ඉක්බිති මහණෙනි, එ බමුණු ගැල්සියයක් එකට බැඳ නන්දිවිසාල ගවයා යොදලා අදු කුළ, උසුල කුළැ යි කී ය. එකල්හි මහණෙනි, නන්දිවිශාල බලීවර්ද තෙමේ එහි ම සිටියේ ය. එකල්හි මහණෙනි, එබමුණු දහසෙකින් පැරදුණේ (දෙම්නසින්) සිතමින් සිටියේ ය.

4. අථ ඛො භික්ඛවෙ නන්දිවිසාලො බලිවද්දො තං බ්‍රාහ්මණං එතදවොච: ''කිස්ස ත්වං බ්‍රාහ්මණ පජ්ඣායසී''ති. තථාහි පනාහං භො තයා සහස්සෙන පරාජිතොති. කිස්ස පන මං ත්වං බ්‍රාහ්මණ අකූටං කූටවාදෙන පාපෙසි. ගච්ඡ ත්වං බ්‍රාහ්මණ සෙට්ඨිනා සද්ධිං ද්වීහි සහස්සෙහි අබ්භුතං කරොහි, ''මය්හං බලිවද්දො සකටසතං අතිබද්ධං පවට්ටෙස්සතී''ති. මා ච මං අකූටං කූටවාදෙන පාපෙසී''ති. අථ ඛො භික්ඛවෙ සො බ්‍රාහ්මණො සෙට්ඨිනා සද්ධිං ද්වීහි සහස්සෙහි අබ්භුතං අකාසි. ''මය්හං බලිවද්දො සකටසතං අතිබද්ධං පවට්ටෙස්සතී''ති.

5. අථ ඛො භික්ඛවෙ සො බ්‍රාහ්මණො සකටසතං අතිබන්ධිත්වා නන්දිවිසාලං බලිවද්දං යොජෙත්වා[1] එතදවොච: ''අඤ්ඡ භද්ද වහස්සු භද්දා''ති. අථ ඛො භික්ඛවෙ නන්දිවිසාලො බලිවද්දො සකටසතං අතිබද්ධං පවට්ටෙසි.

6. ''මනාපමෙව භාසෙය්‍ය නාමනාපං කුදචනං
මනාපං භාසමානස්ස ගරුම්භාරං උදබ්බහී,
ධනඤ්ච නං අලබ්භෙසි තෙන වත්තමනො අහූ''ති

තදපි මෙ භික්ඛවෙ අමනාපා ඛුංසනා වම්භනා, කිමඞ්ග පන එතරහි මනාපා භවිස්සති ඛුංසනා වම්භනා නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය –පෙ– එවඤ්ච පන භික්ඛවෙ, ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

''ඔමසවාදෙ පාචිත්තිය''න්ති

7. ඔමසවාදෙ නාම: දසහි ආකාරෙහි ඔමසති: ජාතියාපි නාමෙනපි ගොත්තෙනපි කම්මෙනපි සිප්පෙනපි ආබාධෙනපි ලිඞ්ගෙනපි කිලෙසෙනපි ආපත්තියාපි අක්කොසෙනපි.

**ජාති** නාම: ද්වෙ ජාතියො, හීනා ච ජාති උක්කට්ඨා ච ජාති, **හීනා** නාම ජාති: චණ්ඩාලජාති වෙණජාති නෙසාදජාති රථකාරජාති, පුක්කුසජාති, එසා හීනා නාම ජාති. **උක්කට්ඨා** නාම ජාති: ඛත්තිය ජාති බ්‍රාහ්මණජාති, එසා උක්කට්ඨා නාම ජාති.

**නාමං** නාම: ද්වෙ නාමානි, හීනඤ්ච නාමං උක්කට්ඨඤ්ච නාමං. **හීනං** නාම නාමං: අවකණ්ණකං ජවකණ්ණකං ධනිට්ඨකං සවිට්ඨකං කුලවඩ්ඪකං, තෙසු තෙසු වා පන ජනපදෙසු ඔඤ්ඤාතං අවඤ්ඤාතං හීළිතං පරිභූතං අචිත්තීකතං, එතං හීනං නාම නාමං. **උක්කට්ඨං** නාම නාමං: බුද්ධපටිසඤ්ඤුත්තං ධම්මපටිසඤ්ඤුත්තං සඞ්ඝපටිසඤ්ඤුත්තං, තෙසු තෙසු වා පන ජනපදෙසු අනොඤ්ඤාතං අනවඤ්ඤාතං අහීළිතං අපරිභූතං චිත්තීකතං, එතං උක්කට්ඨං නාම නාමං.

---

1. යුඤ්ජිත්වා – මජසං

4. එකල්හි නන්දිවිසාල වෘෂභ තෙමේ එබමුණුහට බමුණ, තෙපි කුමකට සිත්විලිපර වැ සිටියාව යි. තෙල කී ය. භවත, මම තා විසින් දහසෙකින් පරදවන ලදුයෙම් ද එහෙයිනැයි කී ය. බමුණ, කුමකට තෙපි නො කුළු මා කුළෙහි යන බසින් (අවමනට) පමුණුවාලූහු ද, යව බමුණ, තෙපි සිටුහු සමඟ දෙදහසෙකින් පරදු තබව, "මාගේ වෘෂභ එකට බැඳි ගැල් සියයක් අදනේ යැ"යි. නො කුළු මා කුළෙහි යන බසින් නො ද (අවමනට) පමුණුවාලව යි කී ය. එකල්හි මහණෙනි ඒ බමුණු සිටුහු සමඟ දෙදහසෙකින් පරදු තැබී ය; 'මාගේ වෘෂභ එකට බැඳි ගැල් සියයක් අදනේ යැ'යි

5. ඉක්බිති මහණෙනි, ඒ බමුණු ගැල් සියයක් එකට බැඳ නන්දිවිසාල ගවයා යොදලා "අදු භද්‍රය, උසුල භද්‍රය"යි මෙසේ කී ය. එකල්හි ම මහණෙනි, නන්දිවිසාල වෘෂභ එකට බැඳි ගැල් සියය ඇදලී ය.

6. මනවඩන බස් ම කියන්නේ ය, කිසි කලෙක අමනාපබස් නො කියන්නේ ය, මනාප බස් බණන්නහුගේ මහත් බර ඉසිලී ය, ඔහු ලවා ධනය ද ලබවාලී ය, එයින් සතුටු සිතැත්තේ ද වී"යැයි. එදවස් මහණෙනි, හෙළා දැකීම ගැරහීම මට අමනාප වී යැ. දැන් හෙළාදැකීම ගැරහීම මනාප වෙතියි කියනු කිම? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ ...නො වේ. මහණෙනි, මෙසේ මේ සිකපදය ද උදෙසවු:

**ඔමසවාදයෙහි පචිති වෙයයි.**

7. ඔමසවාද නම්: දස අයුරෙකින් සටා බෙණෙයි: ජාතියෙනුදු නාමයෙනුදු ගෝත්‍රයෙනුදු කර්මයෙනුදු ශිල්පයෙනුදු ආබාධයෙනුදු ලිඞගයෙනුදු ක්ලේශයෙනුදු ආපත්තියෙනුදු ආක්‍රොශයෙන ද යි.

ජාති නම්: හීන ජාති ද උත්කෘෂ්ට ජාති දු යි ජාති දෙකෙකි. හීන ජාති නම්; සැඩොල් ජාති යැ කුළුපොතු ජාති යැ වැදි ජාති යැ සොම්මර ජාති යැ පුප්සඩු ජාති යි. තෙල හීන ජාති වෙයි. උත්කෘෂ්ට ජාති නම්: ක්ෂත්‍රිය ජාති යැ බ්‍රාහ්මණ ජාති යි. තෙල උත්කෘෂ්ට ජාති නම.

නාම නම්: හීන නාම හා උත්කෘෂ්ටනාම හා නාම දෙකෙකි. හීන නාම නම්: අවකණ්ණක යැ ජවකණ්ණක යැ, ධනිට්ඨක යැ, සවිට්ඨක යැ, කුලවඩ්ඪක යි. ඒ ඒ දනවු හි පහත් කොට දන්නා ලද අවමන් කොට දන්නා ලද පිළිකුල් කරන ලද පරිභව කරන ලද ගරු නො කරන ලද හෝ නාම යි. තෙල හීන නාම වෙ යි. උත්කෘෂ්ට නාම නම්: බුද්ධ ප්‍රතිසංයුක්ත වූ ධර්මප්‍රතිසංයුක්ත වූ සඞ්ඝප්‍රතිසංයුක්ත වූ නාම හෝ ඒ ඒ දනවුහි පහත් කොට නොදන්නාලද අවමන් කොට නොදන්නා ලද පිළිකුල් නො කරනලද පරිභව නො කරන ලද ගරු කරන ලද හෝ නාම යි. තෙල උත්කෘෂ්ටනාම නම.

10. **ගොත්තං** නාම: ද්වෙ ගොත්තානි, හීනඤ්ච ගොත්තං උක්කට්ඨඤ්ච ගොත්තං. **හීනං** නාම ගොත්තං: කොසියගොත්තං භාරද්වාජගොත්තං, තෙසු තෙසු වා පන ජනපදෙසු ඔඤ්ඤාතං අවඤ්ඤාතං හීළිතං පරිභූතං අචිත්තීකතං, එතං හීනං නාම ගොත්තං. **උක්කට්ඨං** නාම ගොත්තං: ගොතමගොත්තං මොග්ගල්ලානගොත්තං කච්චානගොත්තං වාසෙට්ඨගොත්තං, තෙසු තෙසු වා පන ජනපදෙසු අනොඤ්ඤාතං අනවඤ්ඤාතං අහීළිතං අපරිභූතං චිත්තීකතං, එතං උක්කට්ඨං නාම ගොත්තං.

11. **කම්මං** නාම: ද්වෙ කම්මානි, හීනඤ්ච කම්මං උක්කට්ඨඤ්ච-කම්මං. **හීනං** නාම කම්මං: කොට්ඨකකම්මං පුප්ඵඡඩ්ඩකකම්මං, තෙසු තෙසු වා පන ජනපදෙසු ඔඤ්ඤාතං අවඤ්ඤාතං හීළිතං පරිභූතං අචිත්තීකතං, එතං හීනං නාම කම්මං. **උක්කට්ඨං** නාම කම්මං: කසි වණිජ්ජා ගොරක්ඛා, තෙසු තෙසු වා පන ජනපදෙසු අනොඤ්ඤාතං අනවඤ්ඤාතං අහීළිතං අපරිභූතං චිත්තීකතං, එතං උක්කට්ඨං නාම කම්මං.

12. **සිප්පං** නාම: ද්වෙ සිප්පානි, හීනඤ්ච සිප්පං උක්කට්ඨඤ්ච සිප්පං. **හීනං** නාම සිප්පං: නළකාරසිප්පං කුම්භකාරසිප්පං පෙසකාරසිප්පං චම්මකාරසිප්පං නහාපිතසිප්පං, තෙසු තෙසු වා ජනපදෙසු ඔඤ්ඤාතං අවඤ්ඤාතං හීළිතං පරිභූතං අචිත්තීකතං, එතං හීනං නාම සිප්පං. **උක්කට්ඨං** නාම සිප්පං: මුද්දා ගණනා ලෙඛා, තෙසු තෙසු වා පන ජනපදෙසු අනොඤ්ඤාතං අනවඤ්ඤාතං අහීළිතං අපරිභූතං චිත්තීකතං, එතං උක්කට්ඨං නාම සිප්පං.

13. සබ්බෙපි **ආබාධා** හීනා, අපි ච මධුමෙහො ආබාධො උක්කට්ඨො.

14. **ලිඞ්ගං** නාම: ද්වෙ ලිඞ්ගානි, හීනඤ්ච ලිඞ්ගං උක්කට්ඨඤ්ච ලිඞ්ගං. **හීනං** නාම ලිඞ්ගං: අතිදීඝං අතිරස්සං අතිකණ්හං අච්චොදාතං, එතං හීනං නාම ලිඞ්ගං. **උක්කට්ඨං** නාම ලිඞ්ගං: නාතිදීඝං නාතිරස්සං නාතිකණ්හං නාච්චොදාතං, එතං උක්කට්ඨං නාම ලිඞ්ගං.

15. සබ්බෙපි **කිලෙසා** හීනා.

16. සබ්බාපි **ආපත්තියො** හීනා. අපි ච සොතාපත්තිසමාපත්ති උක්කට්ඨා.

10. ගොත්ත නම්: හීන ගෝත්‍රය හා උත්කෘෂ්ට ගෝත්‍රය හා ගෝත්‍ර දෙකෙකි. හීන ගෝත්‍ර නම්: කොසිය ගෝත්‍ර යැ භාරද්වාජ ගෝත්‍ර යැ හෝ ඒ ඒ දනවුහි පහත් කොට දන්නා ලද අවමන් කොට දන්නා ලද පිළිකුල් කරන ලද පරිභව කරන ලද ගරු නොකරන ලද හෝ ගෝත්‍ර යි, තෙල හීන ගෝත්‍ර නම් වෙයි. උත්කෘෂ්ට ගෝත්‍ර නම්: ගොතම ගෝත්‍ර යැ මොග්ගල්ලාන ගෝත්‍ර යැ කච්චාන ගෝත්‍ර යැ වාසෙට්ඨ ගෝත්‍ර යැ හෝ ඒ ඒ දනවුහි පහත් කොට නොදන්නා ලද අවමන් කොට නොදන්නා ලද පිළිකුල් නො කරන ලද පරිභව නො කරන ලද ගරු කරන ලද හෝ ගෝත්‍ර යි. තෙල උත්කෘෂ්ට ගෝත්‍ර නම් වෙයි.

11. කම්ම නම්: හීන කර්මය හා උත්කෘෂ්ට කර්මය හා කර්ම දෙකෙකි. හීන කර්ම නම්: තක්ෂක කර්ම යැ, පුප්ඵඡඩ්ඩ කර්ම යැ හෝ ඒ ඒ දනවුහි පහත් කොට දන්නා ලද අවමන් කොට දන්නා ලද පිළිකුල් කරන ලද පරිභව කරන ලද ගරු නො කරන ලද හෝ කර්ම යි. තෙල හීන කර්ම නම් වෙයි. උත්කෘෂ්ට කර්ම නම්; කෘෂි වණික් ගොරක්ෂ යැ හෝ ඒ ඒ දනවුහි පහත් කොට නො දන්නා ලද අවමන් කොට නොදන්නා ලද පිළිකුල් නොකරන ලද පරිභව නොකරන ලද ගරුකරන ලද හෝ කර්ම යි. තෙල උත්කෘෂ්ට කර්ම නම් වෙයි.

12. සිප්ප නම්: හීන ශිල්ප හා උත්කෘෂ්ට ශිල්ප හා ශිල්ප දෙකෙකි. හීනශිල්ප නම්: නළකාර ශිල්ප යැ, කුම්භකාර ශිල්ප යැ පෙෂකාර ශිල්ප යැ, චම්මකාර ශිල්ප යැ, නහාපිත ශිල්ප යැ හෝ ඒ ඒ දනවුහි පහත් කොට දන්නාලද අවමන් කොට දන්නා ලද පිළිකුල් කරන ලද පරිභව කරන ලද, ගරු නොකරන ලද හෝ ශිල්ප යි. තෙල හීන ශිල්ප වෙයි. උත්කෘෂ්ට ශිල්ප නම්: මුද්‍රා යැ ගණනා යැ ලෙඛා යැ හෝ ඒ ඒ දනවුහි පහත් කොට නොදන්නා ලද අවමන් කොට නොදන්නා ලද පිළිකුල් නො කරන ලද පරිභව නො කරන ලද ගරු කරන ලද හෝ ශිල්ප යි. තෙල උත්කෘෂ්ට ශිල්ප වෙයි.

13. සියලු ම ආබාධයෝ හීනයහ. එහෙත් මධුමෙහාබාධය උත්කෘෂ්ට යි.

14. ලිඞ්ග නම්: හීනලිඞ්ගය හා උත්කෘෂ්ට ලිඞ්ගය හා ලිඞ්ග දෙකෙකි. හීන ලිඞ්ග නම්: ඉතා දිඟු යැ ඉතා මිටි යැ ඉතා කළු යැ ඉතා සුදු යැ තෙල හීන ලිඞ්ග වෙයි. උත්කෘෂ්ට ලිඞ්ග නම්: ඉතා නොදිඟු යැ ඉතා නොමිටි යැ ඉතා නොකළු යැ ඉතා නොසුදු යැ. තෙල උත්කෘෂ්ට ලිඞ්ග වෙයි.

15. සියලු ම ක්ලේශයෝ හීනයහ.

සියලු ම ආපත්තිහු හීනයහ. එහෙත් සෝතාපත්ති සමාපත්ති උත්කෘෂ්ට යි.

17. **අක්කොසො** නාම: ද්වෙ අක්කොසා, හීනො ච අක්කොසො උක්කට්ඨො ච අක්කොසො. **හීනො** නාම අක්කොසො: ඔට්ඨොසි මෙණ්ඩොසි ගොණොසි ගද්‍රභොසි තිරච්ඡානගතොසි නෙරයිකොසි; නත්‍ථි තුය්හං සුගති, දුග්ගතියෙව තුය්හං පාටිකඞ්ඛාති, යකාරෙන වා භකාරෙන වා, කාටකොටචිකාය වා, එසො හීනො නාම අක්කොසො. **උක්කට්ඨො** නාම අක්කොසො: පණ්ඩිතොසි ව්‍යත්තොසි මෙධාවීසි බහුස්සුතොසි, ධම්මකථිකොසි, නත්‍ථි තුය්හං දුග්ගති, සුගතියෙව තුය්හං පාටිකඞ්ඛාති, එසො උක්කට්ඨො නාම අක්කොසො.

18. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො හීනෙන හීනං වදෙති චණ්ඩාලං වෙණං නෙසාදං රථකාරං පුක්කුසං "චණ්ඩාලොසි වෙණොසි නෙසාදොසි රථකාරොසි පුක්කුසොසී"ති භණති, ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

19. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො හීනෙන උක්කට්ඨං වදෙති ඛත්තියං බ්‍රාහ්මණං, "චණ්ඩාලොසි වෙණොසි නෙසාදොසි රථකාරොසි පුක්කුසොසී" ති භණති, ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

20. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො උක්කට්ඨෙන හීනං වදෙති, චණ්ඩාලං වෙණං නෙසාදං රථකාරං පුක්කුසං, "ඛත්තියොසි බ්‍රාහ්මණොසී"ති භණති, ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

21. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො උක්කට්ඨෙන උක්කට්ඨං වදෙති, ඛත්තියං බ්‍රාහ්මණං "ඛත්තියොසි බ්‍රාහ්මණොසී"ති භණති, ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

22. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො හීනෙන හීනං වදෙති, අවකණ්ණකං ජවකණ්ණකං ධනිට්ඨකං සවිට්ඨකං කුලවඩ්ඪකං, "අවකණ්ණකොසි ජවකණ්ණකොසි ධනිට්ඨකොසි සවිට්ඨකොසි කුලවඩ්ඪකොසී"ති භණති, ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

17. අක්කොස නම්: හීනාක්‍රෝශය හා උත්කෘෂ්ටාක්‍රෝශය හා ආක්‍රෝශ දෙකෙකි. හීනාක්‍රෝශ නම්: ඔටුයෙහි, මැඩයෙහි, ගොන්හි, ගදුබු යෙහි තිරිසන්ගියෙහි, නිරිසත්හි තට සුගතියෙක් නැත, තා විසින් දුගතිය ම කැමැති විය යුතු, යකාරයෙන් ද භකාරයෙන් ද යුතු කොට කරන ආක්‍රෝශ යැ. කාටකොටචිකායෙන් (ස්ත්‍රී පුරුෂ නිමිති සූචක වචනයෙන්) කරන ආක්‍රෝශ යි. තෙල හීනාක්‍රෝශ වෙයි. උත්කෘෂ්ටාක්‍රෝශ නම්: පණ්ඩිතයෙහි, ව්‍යක්තයෙහි, මෙධාවියෙහි, බහුශ්‍රැතයෙහි, ධර්ම කථිකයෙහි, තට දුගතියෙක් නැති. තා විසින් සුගතිය ම කැමැති විය යුතු, තෙල උත්කෘෂ්ටාක්‍රෝශ වෙයි.

18. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ හීනජාතියෙන් හීනජාතිකයකුහට (මෙසේ) කියයි. සැඩොලකුට, කුළුපොත්තකුට වැද්දකුට සොම්මරයකුට, පුප්සඩුවකුට 'සැඩොලෙහි, කුළුපොත්තෙහි, වැද්දෙහි, සොම්මරයෙහි, පුප්සඩුවෙහි' යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති වෙයි.

19. උපසපනෙක්, උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ හීන ජාතියෙන් උත්කෘෂ්ට ජාතිකයකුට (මෙසේ) කියයි: ක්ෂත්‍රියකුට, බ්‍රාහ්මණයකුට, සැඩොලෙහි, කුළුපොත්තෙහි, වැද්දෙහි, සොම්වරයෙහි, පුප්සඩුයෙහි'යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

20. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ උත්කෘෂ්ට ජාතියෙන් හීන ජාතිකයකුහට (මෙසේ) කියයි; සැඩොලකුට, කුළුපොත්තකුට, වැද්දකුට, සොම්මරයකුට පුස්සඩුවකුට 'ක්ෂත්‍රියෙහි බ්‍රාහමණයෙහි' යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

21. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ තෙද රහිත කරනු කැමැත්තේ උත්කෘෂ්ට ජාතියෙන් උත්කෘෂ්ට ජාතිකයකුට (මෙසේ) කියයි: ක්ෂත්‍රියකුට බ්‍රාහ්මණයකුට 'ක්ෂත්‍රියෙහි බ්‍රාහ්මණයෙහි' යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති වෙයි.

22. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ, ගරහනු කැමැත්තේ, මකු කරනු කැමැත්තේ, හීන නාමයෙන් හීනනාමිකයකුට (මෙසේ) කියයි. අවකනකුට ජවකනකුට දනිටුවකුට සවිටුවකුට, කුලවඩුවකුට 'අවකනහි, ජවකනහි, දනිටුහි, සවිටුයෙහි, කුලවඩුයෙහි'යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි,

23. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො හීනෙන උක්කට්ඨං වදෙති බුද්ධරක්ඛිතං ධම්මරක්ඛිතං සඞ්ඝරක්ඛිතං "අවකණ්ණකොසි ජවකණ්ණකොසි ධනිට්ඨකොසි සවිට්ඨකොසි කුලවඩ්ඪකොසී"ති භණති, ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

24. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො උක්කට්ඨෙන හීනං වදෙති අවකණ්ණකං ජවකණ්ණකං ධනිට්ඨකං සවිට්ඨකං කුලවඩ්ඪකං, "බුද්ධරක්ඛිතොසි ධම්මරක්ඛිතොසි සඞ්ඝරක්ඛිතොසී"ති භණති, ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

25. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො උක්කට්ඨෙන උක්කට්ඨං වදෙති බුද්ධරක්ඛිතං ධම්මරක්ඛිතං සඞ්ඝරක්ඛිතං, "බුද්ධරක්ඛිතොසි ධම්මරක්ඛිතොසි සඞ්ඝරක්ඛිතොසී"ති භණති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

26. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො හීනෙන හීනං වදෙති කොසියං භාරද්වාජං, "කොසියොසි භාරද්වාජොසී"ති භණති, ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

27. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො හීනෙන උක්කට්ඨං වදෙති ගොතමං මොග්ගල්ලානං කච්චානං වාසෙට්ඨං "කොසියොසි භාරද්වාජොසී"ති භණති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

28. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො උක්කට්ඨෙන හීනං වදෙති, කොසියං භාරද්වාජං "ගොතමොසි මොග්ගල්ලානොසි කච්චානොසි වාසෙට්ඨොසී"ති[1] භණති, ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

29. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො උක්කට්ඨෙන උක්කට්ඨං වදෙති, ගොතමං මොග්ගල්ලානං කච්චානං වාසෙට්ඨං "ගොතමොසි මොග්ගල්ලානොසි කච්චානොසි වාසෙට්ඨොසී"ති භණති, ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

1. වාසිට්ඨොසීති - මජසං

23. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ, හීන නාමයෙන් උත්කෘෂ්ට නාමික යකුට (මෙසේ) කියයි: බුදුරක්ඛියකුට, දම්රක්ඛියකුට, සඟරක්ඛියකුට 'අවකනහි, ජවකනහි දනිට්ඨුයෙහි, සවිට්ඨුයෙහි, කුලවඩ්ඪුයෙහි' යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

24. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකුකරනු කැමැත්තේ උත්කෘෂ්ට නාමයෙන් හීනනාමික-යකුට (මෙසේ) කියයි: අවකනකුට, ජවකනකුට දනිට්ඨුවකුට සවිට්ඨුවකුට කුලවඩ්ඪුවකුට 'බුදුරක්ඛියෙහි, දම්රක්ඛියෙහි, සඟරක්ඛියෙහි' යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

25. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ උත්කෘෂ්ට නාමයෙන් උත්කෘෂ්ට නාමිකයකුහට (මෙසේ) කියයි: බුදුරක්ඛියකුට, දම්රක්ඛියකුට සඟරක්ඛියකුට 'බුදුරක්ඛියෙහි, දම්රක්ඛියෙහි, සඟරක්ඛියෙහි' යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

26. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ හීන ගෝත්‍රයෙන් හීනගෝත්‍රික යකුට (මෙසේ) කියයි: කෝසියකුට භාරද්වාජයකුට කෝසියයෙහි භාරද්වාජයෙහි'යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති වෙයි.

27. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ හීන ගෝත්‍රයෙන් උත්කෘෂ්ට ගෝත්‍රිකයකුට (මෙසේ) කියයි: ගෝතමයකුට මොග්ගල්ලානයකුට කච්චානයකුට වාසෙට්ඨයකුට 'කෝසියයෙහි භාරද්වාජයෙහි' යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

28. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ උත්කෘෂ්ට ගෝත්‍රයෙන් හීන ගෝත්‍රික-යකුට (මෙසේ) කියයි: කෝසියකුට භාරද්වාජයකුට 'ගෝතමයෙහි මොග්ගල්ලානයෙහි කච්චානයෙහි වාසෙට්ඨයෙහි' යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

29. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ උත්කෘෂ්ට ගෝත්‍රයෙන් උත්කෘෂ්ට ගෝත්‍රිකයකුට (මෙසේ) කියයි: ගෝතමයකුට, මොග්ගල්ලානයකුට කච්චානයකුට වාසෙට්ඨයකුට 'ගෝතමයෙහි මොග්ගල්ලානයෙහි කච්චානයෙහි වාසෙට්ඨයෙහි' යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

30. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො හීනෙන හීනං වදෙති කොට්ඨකං පුප්ඵඡඩ්ඩකං ''කොට්ඨකොසි පුප්ඵඡඩ්ඩකොසී''ති භණති, ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

31. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො හීනෙන උක්කට්ඨං වදෙති, කස්සකං වාණිජං ගොරක්ඛං ''කොට්ඨකොසි පුප්ඵඡඩ්ඩකොසී''ති භණති, ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

32. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො උක්කට්ඨෙන හීනං වදෙති කොට්ඨකං පුප්ඵඡඩ්ඩකං ''කස්සකොසි වාණිජොසි ගොරක්ඛොසී''ති භණති, ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

33. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො උක්කට්ඨෙන උක්කට්ඨං වදෙති කස්සකං වාණිජං ගොරක්ඛං ''කස්සකොසි වාණිජොසි ගොරක්ඛොසී''ති භණති, ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

34. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො හීනෙන හීනං වදෙති නළකාරං කුම්භකාරං පෙසකාරං චම්මකාරං නහාපිතං ''නළකාරොසි කුම්භකාරොසි පෙසකාරොසි චම්මකාරොසි නහාපිතොසී''ති භණති, ආපත්ති වාචාය වාච ය පාචිත්තියස්ස.

35. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො හීනෙන උක්කට්ඨං වදෙති මුද්දිකං ගණකං ලෙඛකං ''නළකාරොසි කුම්භකාරොසි පෙසකාරොසි චම්මකාරොසි නහාපිතොසී''ති භණති, ආපත්ති වාචාය වාචාය පාචියත්තිස්ස.

36. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො උක්කට්ඨෙන හීනං වදෙති නළකාරං කුම්භකාරං පෙසකාරං චම්මකාරං නහාපිතං ''මුද්දිකොසී ගණකොසි ලෙඛකොසී''ති භණති, ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

30. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ හීනකර්මයෙන් හීනකාර්මිකයකුහට (මෙසේ) කියයි: තක්ෂකයකුට, පුප්සඩුවකුට තක්ෂකයෙහි පුප්සඩුයෙහි'යී බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

31. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ හීනකර්මයෙන් උත්කෘෂ්ට කාර්මික-යකුහට (මෙසේ) කියයි: ගොවියකුට, වෙළෙඳකුට, ගෙරිරක්නකුට 'තක්ෂකයෙහි පුප්සඩුවෙහි' යී බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

32. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ උත්කෘෂ්ට කර්මයෙන් හීන කාර්මික-යකුහට (මෙසේ) කියයි: තක්ෂකයකුට පුප්සඩුවකුට 'ගොවියෙහි, වෙළෙඳෙහි, ගෙරිරක්නෙහි'යී බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

33. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ උත්කෘෂ්ට කර්මයෙන් උත්කෘෂ්ට කාර්මිකයකුහට -(මෙසේ) කියයි: ගොවියකුට වෙළෙඳකුට ගෙරි-රක්නකුට 'ගොවියෙහි වෙළෙඳෙහි ගෙරිරකිනෙහි' යී බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

34. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ හීන ශිල්පයෙන් හීන ශිල්පියකුහට (මෙසේ) කියයි: කුළුපොතුවකුට කුඹලකුට පෙහෙරකුට සොම්මරකුට කරනැවැමියකුට 'කුළුපොත්තෙහි කුඹලෙහි පෙහෙරෙහි සොම්මරෙහි කරනැවැමියෙහි' යී බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

35. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ හීන ශිල්පයෙන් උත්කෘෂ්ට ශිල්පියකු හට (මෙසේ) කියයි: මුද්‍රිකයකුට ගණකයකුට ලේඛකයකුට 'කුළු-පොත්තෙහි, කුඹලෙහි පෙහෙරෙහි සොම්මරෙහි කරනැවැමියෙහි'යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

36. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ උත්කෘෂ්ට ශිල්පයෙන් හීන ශිල්-පියකුහට (මෙසේ) කියයි: කුළුපොත්තකුට, කුඹලකුට, පෙහෙරකුට සොම්මරකුට කරනැවැමියකුට 'මුද්‍රිකයෙහි ගණකයෙහි ලේඛකයෙහි' යී බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

37. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො උක්කට්ඨෙන උක්කට්ඨං වදෙති: මුද්දිකං ගණකං ලෙඛකං "මුද්දිකොසි ගණකොසි ලෙඛකොසී"ති භණති, ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

38. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො හීනෙන හීනං වදෙති කුට්ඨිකං ගණ්ඩිකං කිලාසිකං සොසිකං අපමාරිකං "කුට්ඨිකොසි ගණ්ඩිකොසි කිලාසිකොසි සොසිකොසි අපමාරිකොසී"ති භණති, ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

39. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො හීනෙන උක්කට්ඨං වදෙති මධුමෙහිකං "කුට්ඨිකොසි ගණ්ඩිකොසි කිලාසිකොසි සොසිකොසි අපමාරිකොසී"ති භණති, ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

40. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො උක්කට්ඨෙන හීනං වදෙති කුට්ඨිකං ගණ්ඩිකං කිලාසිකං සොසිකං අපමාරිකං "මධුමෙහිකොසී"ති භණති, ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

41. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො උක්කට්ඨෙන උක්කට්ඨං වදෙති මධුමෙහිකං "මධුමෙහිකොසී"ති භණති, ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

42. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො හීනෙන හීනං වදෙති අතිදීඝං අතිරස්සං අතිකණ්හං අච්චොදාතං "අතිදීඝොසි අතිරස්සොසි අතිකණ්හොසි අච්චොදාතොසී"ති භණති, ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

43. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො හීනෙන උක්කට්ඨං වදෙති නාතිදීඝං නාතිරස්සං නාතිකණ්හං නාච්චොදාතං "අතිදීඝොසි අතිරස්සොසි අතිකණ්හොසි අච්චොදාතොසී"ති භණති, ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

37. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ උත්කෘෂ්ට ශිල්පයෙන් උත්කෘෂ්ට ශිල්පියකුහට (මෙසේ) කියයි: මුද්‍රිකයකුට ගණකයකුට ලේඛකයකුට 'මුද්‍රිකයෙහි ගණකයෙහි ලේඛකයෙහි' යී බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

38. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ හීනාබාධයෙන් හීනා බාධිකයකුහට (මෙසේ) කියයි: කුෂ්ඨිකයකුට ගණ්ඩිකයකුට කිලාසිකයකුට ශ්වාසිකයකුට අපස්මාරිකයකුට ''කුෂ්ඨිකයෙහි ගණ්ඩිකයෙහි කිලාසිකයෙහි ශ්වාසිකයෙහි අපස්මාරිකයෙහි' යී බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

39. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ හීනාබාධයෙන් උත්කෘෂ්ටාබාධිකයකුහට (මෙසේ) කියයි: මධුමෙහිකයකුට 'කුෂ්ඨිකයෙහි, ගණ්ඩිකයෙහි, කිලාසිකයෙහි ශ්වාසිකයෙහි අපස්මාරිකයෙහි' යී බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

40. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ උත්කෘෂ්ටාබාධයෙන් හීනාබාධිකයකුහට (මෙසේ) කියයි: කුෂ්ඨිකයකුට ගණ්ඩිකයකුට කිලාසිකයකුට ශ්වාසිකයකුට අපස්මාරිකයකුට 'මධුමෙහිකයෙහි'යී බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

41. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකුකරනු කැමැත්තේ උත්කෘෂ්ටාබාධයෙන් උත්කෘෂ්ටාබාධිකයකුහට (මෙසේ) කියයි: මධුමෙහිකයකුට 'මධුමෙහිකයෙහි' යී බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

42. උපසපනෙක් උපසපනක්හු හෙළාදකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ හීනලිඞ්ගයෙන් හීනලිඞ්ගිකයකුහට (මෙසේ) කියයි: ඉතාදිගුවකුට, ඉතා මිට්ටකුට, ඉතා කළුවකුට ඉතා සුද්දකුට 'ඉතා දිගුයෙහි ඉතා මිට්යෙහි ඉතා කළුයෙහි ඉතා සුදුයෙහි'යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

43. උපසපනෙක් උපසපනක්හු හෙළාදකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ හීනලිඞ්ගයෙන් උත්කෘෂ්ටලිඞ්ගිකයකුහට (මෙසේ) කියයි: ඉතා නොදිගුවකුට ඉතා නොමිට්යකුට ඉතා නොකළුවකුට ඉතා නොසුදුවකුට 'ඉතා දිගුයෙහි ඉතා මිට්යෙහි ඉතා කළුයෙහි ඉතා සුදුයෙහි' යී බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

44. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො උක්කට්ඨෙන හීනං වදෙති අතිදීඝං අතිරස්සං අතිකණ්හං අවොදාතං "නාතිදීඝොසි නාතිරස්සොසි නාතිකණ්හොසි නාවොදාතොසී"ති භණති, ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

45. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො උක්කට්ඨෙන උක්කට්ඨං වදෙති නාතිදීඝං නාතිරස්සං නාතිකණ්හං නාවොදාතං "නාතිදීඝොසි නාතිරස්සොසි නාතිකණ්හොසි නාවොදාතොසී"ති භණති, ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

46. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො හීනෙන හීනං වදෙති රාගපරියුට්ඨිතං දොසපරියුට්ඨිතං මොහපරියුට්ඨිතං "රාගපරියුට්ඨිතොසි දොසපරියුට්ඨිතොසි මොහපරියුට්ඨිතොසී"ති භණති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

47. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො හීනෙන උක්කට්ඨං වදෙති වීතරාගං වීතදොසං වීතමොහං "රාගපරියුට්ඨිතොසි දොසපරියුට්ඨිතොසි මොහපරියුට්ඨිතොසී"ති භණති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

48. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො උක්කට්ඨෙන හීනං වදෙති රාගපරියුට්ඨිතං දොසපරියුට්ඨිතං මොහපරියුට්ඨිතං "වීතරාගොසි වීතදොසොසි වීතමොහොසී"ති භණති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

49. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො උක්කට්ඨෙන උක්කට්ඨං වදෙති වීතරාගං වීතදොසං වීතමොහං, "වීතරාගොසි වීතදොසොසි වීතමොහොසී"ති භණති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

44. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ උත්කෘෂ්ට ලිඞ්ගයෙන් හීනලිඞ්ගිකයකුහට (මෙසේ) කියයි: ඉතා දිගුවකුට ඉතා මිටියකුට ඉතා කළුවකුට ඉතා සුදුවකුට 'ඉතා නොදිගුයෙහි ඉතා නොමිටියෙහි ඉතා නොකළුයෙහි ඉතා නොසුදුයෙහි' යී බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති වෙයි.

45. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ උත්කෘෂ්ට ලිඞ්ගයෙන් උත්කෘෂ්ට ලිඞ්ගිකයකුහට (මෙසේ) කියයි: ඉතා නොදිගුවකුට ඉතා නොමිටියකුට ඉතා නො කළුවකුට ඉතා නොසුදුවකුට 'ඉතා නොදිගුයෙහි ඉතා නොමිටියෙහි ඉතා නොකළුයෙහි ඉතා නොසුදුයෙහි' යී බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

46. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ හීන ක්ලේශයෙන් හීන ක්ලේශිකයකුහට (මෙසේ) කියයි: රාගයෙන් මඩනා ලද්දකුට ද්වේෂයෙන් මඩනා ලද්දකුට මෝහයෙන් මඩනා ලද්දකුට 'රාගයෙන් මඩනාලද්දෙහි ද්වේෂයෙන් මඩනා ලද්දෙහි මෝහයෙන් මඩනා ලද්දෙහි 'යී බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

47. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ හීන ක්ලේශයෙන් උත්කෘෂ්ට නික්ලේශිකයකුහට (මෙසේ) කියයි: වීතරාගියකුට වීතද්වේෂිකයකුට වීතමෝහිකයකුට 'රාගයෙන් මඩනාලද්දෙහි ද්වේෂයෙන් මඩනා ලද්දෙහි, මෝහයෙන් මඩනා ලද්දෙහි' යී බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

48. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ උත්කෘෂ්ට නික්ලේශ භාවයෙන් හීන ක්ලෙශිකයකුහට (මෙසේ) කියයි: රාගයෙන් මඩනා ලද්දකුට ද්වේෂයෙන් මඩනා ලද්දකුට මෝහයෙන් මඩනා ලද්දකුට 'වීතරාගියෙහි වීතද්වේෂියෙහි වීතමෝහයෙහි'යී බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

49. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ උත්කෘෂ්ටභාවයෙන් උත්කෘෂ්ටයකුහට (මෙසේ) කියයි: වීතරාගියකුට වීතද්වේෂියකුට වීතමෝහියකුට 'වීතරාගියෙහි වීතද්වේෂියෙහි වීතමෝහියෙහි' යී බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

50. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො හීනෙන හීනං වදෙති පාරාජිකං අජ්ඣාපන්නං සඞ්ඝාදිසෙසං අජ්ඣාපන්නං ථුල්ලච්චයං අජ්ඣාපන්නං පාචිත්තියං අජ්ඣාපන්නං පාටිදෙසනීයං අජ්ඣාපන්නං දුක්කටං අජ්ඣාපන්නං දුබ්භාසිතං අජ්ඣාපන්නං ‘‘පාරාජිකං අජ්ඣාපන්නොසි සඞ්ඝාදිසෙසං අජ්ඣාපන්නොසි ථුල්ලච්චයං අජ්ඣාපන්නොසි පාචිත්තියං අජ්ඣාපන්නොසි පාටිදෙසනීයං අජ්ඣාපන්නොසි දුක්කටං අජ්ඣාපන්නොසි දුබ්භාසිතං අජ්ඣාපන්නොසී’’ති භණති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

51. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො හීනෙන උක්කට්ඨං වදෙති සොතාපන්නං ‘‘පාරාජිකං අජ්ඣාපන්නොසි –පෙ– දුබ්භාසිතං අජ්ඣාපන්නොසී’’ති භණති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

52. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො උක්කට්ඨෙන හීනං වදෙති පාරාජිකං අජ්ඣාපන්නං –පෙ– දුබ්භාසිතං අජ්ඣාපන්නං, ‘‘සොතාපන්නොසී’’ති භණති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

53. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො උක්කට්ඨෙන උක්කට්ඨං වදෙති සොතාපන්නං ‘‘සොතාපන්නොසී’’ති භණති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

54. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො හීනෙන හීනං වදෙති ඔට්ඨං මෙණ්ඩං ගොණං ගද්‍රභං තිරච්ඡානගතං නෙරයිකං ‘‘ඔට්ඨොසි මෙණ්ඩොසි ගොණොසි ගද්‍රභොසි තිරච්ඡානගතොසි නෙරයිකොසි නත්ථි තුය්හං සුගති දුග්ගතියෙව තුය්හං පාටිකඞ්ඛා’’ති භණති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

55. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො හීනෙන උක්කට්ඨං වදෙති පණ්ඩිතං ව්‍යත්තං මෙධාවිං බහුස්සුතං ධම්මකථිකං ‘‘ඔට්ඨොසි මෙණ්ඩොසි ගොණොසි ගද්‍රභොසි තිරච්ඡානගතොසි නෙරයිකොසි, නත්ථි තුය්හං සුගති දුග්ගතියෙව තුය්හං පාටිකඞ්ඛා’’ති භණති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

**50.** උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ හීනාපත්තියෙන් හීනාපත්තිකයකුහට (මෙසේ) කියයි: පරිජී අවනකුට සහවෙසෙස් අවනකුට තුලැසි අවනකුට පචිති අවනකුට පිළිදෙස්නී අවනකුට දුකුළා අවනකුට දුබැසි අවනකුට 'පරිජී අවන්හි සහ වෙසෙස් අවන්හි තුලැසි අවන්හි පචිති අවන්හි පිළිදෙස්නී අවන්හි දුකුළා අවන්හි දුබැසි අවන්හි' යී බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

51. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ හීනාපත්තියෙන් උත්කෘෂ්ටාපත්තිකයකුහට (මෙසේ) කියයි. සෝවන් වූවකුට 'පරිජී අවන්හි ... දුබැසි අවන්හි' යී බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

52. උපස්පනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ උත්කෘෂ්ට සෝතාපත්තියෙන් හීනාපත්තිකයකුහට (මෙසේ) කියයි: පරිජී අවනකුට ... දුබැසි අවනකුට 'සෝවන් වෙහි'යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

53. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ උත්කෘෂ්ට ආපත්තියෙන් උත්කෘෂ්ට ආපත්තිකයකුහට (මෙසේ) කියයි: සෝවන් වූවකුට 'සෝවන් වෙහි' යී බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

54. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ තෙද රහිත කරනු කැමැත්තේ හීනාක්‍රෝශයෙන් හීන වූවකුහට (මෙසේ) කියයි: ඔටුවකුට බැටළුවකුට ගොනකුට ගදුබුවකුට තිරිසන්ගියකුට තිරිසනකුට 'ඔටුයෙහි බැටළුයෙහි ගොන්හි ගදුබුයෙහි තිරිසන්ගියහි තිරිසන්හි තට සුගති නැති තට දුගතිය මැ කැමැති විය යුතු' යැයි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

55. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ හීන වූ ආක්‍රෝශයෙන් උත්කෘෂ්ටයකුහට (මෙසේ) කියයි: පණ්ඩිතයකුට ව්‍යක්තයකුට නැණැතියකුට බහුශ්‍රුතයකුට ධර්මකථිකයකුට ''ඔටුයෙහි බැටළුයෙහි ගොන්හි ගදුබුයෙහි තිරිසන්ගියහි තිරිසන්හි තට සුගති නැති තට දුගතිය මැ කැමැති විය යුතු''යැයි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

56. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො උක්කට්ඨෙන හීනං වදෙති ඔට්ඨං මෙණ්ඩං ගොණං ගද්‍රභං තිරච්ඡානගතං නෙරයිකං "පණ්ඩිතොසි ව්‍යත්තොසි මෙධාවීසි බහුස්සුතොසි ධම්මකථිකොසි නත්ථි තුය්හං දුග්ගති සුගතියෙව තුය්හං පාටිකඞ්ඛා"ති භණති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

57. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො උක්කට්ඨෙන උක්කට්ඨං වදෙති පණ්ඩිතං ව්‍යත්තං මෙධාවිං බහුස්සුතං ධම්මකථිකං "පණ්ඩිතොසි ව්‍යත්තොසි මෙධාවීසි බහුස්සුතොසි ධම්මකථිකොසි, නත්ථි තුය්හං දුග්ගති සුගතියෙව තුය්හං පාටිකඞ්ඛා"ති භණති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

58. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො එවං වදෙති "සන්ති ඉධෙකච්චෙ චණ්ඩාලා වෙණා නෙසාද රථකාරා පුක්කුසා"ති භණති ආපත්ති වාචාය වාචාය දුක්කටස්ස.

59. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො එවං වදෙති "සන්ති ඉධෙකච්චෙ ඛත්තියා බ්‍රාහ්මණා"ති භණති ආපත්ති වාචාය වාචාය දුක්කටස්ස.

60. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො එවං වදෙති: "සන්ති ඉධෙකච්චෙ අවකණ්ණකා ජවකණ්ණකා ධනිට්ඨකා සවිට්ඨකා කුලවඩ්ඪකා"ති භණති –පෙ– "සන්ති ඉධෙකච්චෙ බුද්ධරක්ඛිතා ධම්මරක්ඛිතා සඞ්ඝරක්ඛිතා"ති භණති –පෙ– "සන්ති ඉධෙකච්චෙ කොසියා භාරද්වාජා"ති භණති –පෙ– "සන්ති ඉධෙකච්චෙ ගොතමා මොග්ගල්ලානා කච්චානා වාසෙට්ඨා"ති භණති –පෙ–
"සන්ති ඉධෙකච්චෙ කොට්ඨකා පුප්ඵඡඩ්ඩකා"ති භණති –පෙ– "සන්ති ඉධෙකච්චෙ කස්සකා වාණිජා ගොරක්ඛා"ති භණති –පෙ– "සන්ති ඉධෙකච්චෙ නළකාරා කුම්භකාරා පෙසකාරා චම්මකාරා නහාපිතා"ති භණති –පෙ– "සන්ති ඉධෙකච්චෙ මුද්දිකා ගණකා ලෙඛකා"ති භණති –පෙ– "සන්ති ඉධෙකච්චෙ කුට්ඨිකා ගණ්ඩිකා කිලාසිකා සොසිකා අපමාරිකා"ති භණති –පෙ– "සන්ති ඉධෙකච්චෙ මධුමෙහිකා"ති භණති –පෙ– "සන්ති

56. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ උත්කෘෂ්ට වූ ආක්‍රෝශයෙන් හීනයකු හට, (මෙසේ) කියයි: ඔටුවකුට මැඩකුට ගොනකුට ගදුබුවකුට තිරිසන්ගියකුට නිරිසතකුට ''පණ්ඩිතයෙහි ව්‍යක්තයෙහි නැණැතියෙහි බහුශ්‍රැතයෙහි ධර්මකථිකයෙහි, තට දුගති නැති තට සුගති මැ කැමැති විය යුතු යැ යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

57. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ උත්කෘෂ්ට වූ ආක්‍රෝශයෙන් උත්කෘෂ්ටයකුහට (මෙසේ) කියයි: පණ්ඩිතයකුට ව්‍යක්තයකුට නැණැතියකුට බහුශ්‍රැතයකුට ධර්මකථිකයකුට ''පණ්ඩිතයෙහි ව්‍යක්තයෙහි නැණැතියෙහි බහුශ්‍රැතයෙහි ධර්මකථිකයෙහි, තට දුගති නැති. තට සුගතිය මැ කැමැති විය යුතු''යැයි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

58. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ (මෙසේ) කියයි: ''මෙහි ඇතැම් කෙනෙක් සැඩොල්හු කුළුපොත්තෝ වැද්දෝ සොම්මරහු පුප්සඩුවෝ වෙති' යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි දුකුළා ඇවැත් වෙයි.

59. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ (මෙසේ) කියයි: ''මෙහි ඇතැම් කෙනෙක් ක්ෂත්‍රියයෝ බ්‍රාහ්මණයෝ වෙති''යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි දුකුළා ඇවැත් වෙයි.

60. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ (මෙසේ) කියයි: ''මෙහි ඇතැම් කෙනෙක් අවකණ්ණ ජවකණ්ණ දනිටු සවිටු කුලවඩු වෙති''යි බෙණේ නම් ... ''මෙහි ඇතැම් කෙනෙක් බුදුරැකි දම්රැකි සඟරැකි වෙති''යි බෙණේ නම් ... ''මෙහි ඇතැම් කෙනෙක් කොසිය භාරද්වාජ වෙති''යි බෙණේ නම් ... ''මෙහි ඇතැම් කෙනෙක් ගෞතම මෞද්ගල්‍යායන කාත්‍යායන වාශිටඨ වෙති''යි බෙණේ නම් ... ''මෙහි ඇතැම් කෙනෙක් තක්ෂක පුප්සඩු වෙති''යි බෙණේ නම් ... ''මෙහි ඇතැම් කෙනෙක් ගොවියෝ වෙළෙඳෝ ගෙරිරක්නෝ වෙති''යි බෙණේ නම් ... ''මෙහි ඇතැම් කෙනෙක් කුළුපොතු කුඹල් පෙහෙර සොම්මරු නැහැවි වෙති''යි බෙණේ නම් ... ''මෙහි ඇතැම් කෙනෙක් මුද්‍රික ගණක ලේඛක වෙති''යි බෙණේ නම් ... ''මෙහි ඇතැම් කෙනෙක් කුෂ්ට ගණ්ඩ කිලාස ශ්වාස අපස්මාර ඇත්තෝ වෙති''යි බෙණේ නම් ... ''මෙහි ඇතැම් කෙනෙක් මධුමෙහික වෙති''යි

ඉධෙකච්චෙ අතිදීඝා අතිරස්සා අතික්ඛණා අච්චොදාතා''ති භණති -පෙ- සන්ති ඉධෙකච්චෙ නාතිදීඝා නාතිරස්සා නාතිකණ්හා නාච්චොදාතා''ති භණති -පෙ- ''සන්ති ඉධෙකච්චෙ රාගපරියුට්ඨිතා දොසපරියුට්ඨිතා මොහපරියුට්ඨිතා''ති භණති -පෙ- ''සන්ති ඉධෙකච්චෙ වීතරාගා වීතදොසා වීතමොහා''ති භණති -පෙ- සන්ති ඉධෙකච්චෙ පාරාජිකං අජ්ඣාපන්නාති භණති -පෙ- දුබ්භාසිතං අජ්ඣාපන්නා''ති භණති -පෙ- ''සන්ති ඉධෙකච්චෙ සොතාපන්නා''ති භණති -පෙ- ''සන්ති ඉධෙකච්චෙ ඔට්ඨා මෙණ්ඩා ගොණා ගද්‍රභා තිරච්ඡානගතා නෙරයිකා නත්ථි තෙසං සුගති දුග්ගතියෙව තෙසං පාටිකඞ්ඛා''ති භණති ආපත්ති වාචාය වාචාය දුක්කටස්ස.

61. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො එවං වදෙති ''සන්ති ඉධෙකච්චෙ පණ්ඩිතා ව්‍යත්තා මෙධාවිනො[1] බහුස්සුතා ධම්මකථිකා, නත්ථි තෙසං දුග්ගති, සුගතියෙව තෙසං පාටිකඞ්ඛා''ති භණති ආපත්ති වාචාය වාචාය දුක්කටස්ස.

62. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො එවං වදෙති ''යෙ නූන චණ්ඩාලා වෙණා නෙසාද රථකාරා පුක්කුසා''ති භණති ආපත්ති වාචාය වාචාය දුක්කටස්ස.

63. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො එවං වදෙති, ''යෙ නූන පණ්ඩිතා ව්‍යත්තා මෙධාවිනො බහුස්සුතා ධම්මකථිකා''ති භණති ආපත්ති වාචාය වාචාය දුක්කටස්ස.

64. උපසම්පන්නො උපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො එවං වදෙති, ''න මයං චණ්ඩාලා වෙණා නෙසාද රථකාරා පුක්කුසා''ති භණති -පෙ- ''න මයං පණ්ඩිතා ව්‍යත්තා මෙධාවිනො බහුස්සුතා ධම්මකථිකා නත්ථම්හාකං දුග්ගති සුගතියෙව අම්හාකං පාටිකඞ්ඛා''ති භණති ආපත්ති වාචාය වාචාය දුක්කටස්ස.

65. උපසම්පන්නො අනුපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො හීනෙන හීනං වදෙති -පෙ- හීනෙන උක්කට්ඨං වදෙති -පෙ- උක්කට්ඨෙන හීනං වදෙති -පෙ- උක්කට්ඨෙන උක්කට්ඨං වදෙති පණ්ඩිතං ව්‍යත්තං මෙධාවිං බහුස්සුතං ධම්මකථිකං, පණ්ඩිතොසි, ව්‍යත්තොසි මෙධාවීසි බහුස්සුතොසි ධම්මකථිකොසි, නත්ථි තුය්හං දුග්ගති සුගතියෙව තුය්හං පාටිකඞ්ඛා''ති භණති ආපත්ති වාචාය වාචාය දුක්කටස්ස.

---

1. මෙධාවී – මජසං;

බෙණේ නම් ... ''මෙහි ඇතැම් කෙනෙක් ඉතා උස් ඉතා මිටි ඉතා කළු ඉතා සුදු වෙති''යි බෙණේ නම් ... ''මෙහි ඇතැම් කෙනෙක් ඉතා නො උස් ඉතා නො මිටි ඉතා නො කළු ඉතා නො සුදු වෙති''යි බෙණේ නම් ... ''මෙහි ඇතැම් කෙනෙක් රාගයෙන් මැඩුණෝ ද්වේෂයෙන් මැඩුණෝ මෝහයෙන් මැඩුණෝ වෙති''යි බෙණේ නම් ... ''මෙහි ඇතැම් කෙනෙක් වීතරාගී වීතද්වේෂී වීතමෝහී වෙති''යි බෙණේ නම් ... ''මෙහි ඇතැම් කෙනෙක් පරිජි අවන්හු ... දුබැසි අවන්හු වෙති''යි බෙණේ නම් ... ''මෙහි ඇතැම් කෙනෙක් සෝවන් වූවෝ වෙති''යි බෙණේ නම් ... ''මෙහි ඇතැම් කෙනෙක් ඔටු බැටළු ගොන් ගදුබු තිරිසන් තිරිසත් වෙති. ඔවුනට සුගති නැති ඔවුනට දුගති මැ කැමැති විය යුතු''යැයි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි දුකුළා ඇවැත් වෙයි.

61. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ (මෙසේ) කියයි: ''මෙහි ඇතැම් කෙනෙක් පණ්ඩිත ව්‍යක්ත නැණැති බහුශ්‍රැත ධම්කථික වෙති, ඔවුනට දුගති නැති ඔවුනට සුගති මැ කැමැති විය යුතු යැයි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි දුකුළා ඇවැත් වෙයි.

62. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ (මෙසේ) කියයි: ''යම් කෙනෙක් එකැතින් සැඩොල් කුළුපොතු වැදි සොම්මර පුප්සඩු වෙති' යි බෙණේ නම් දුකුළා ඇවැත් වෙයි.

63. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ (මෙසේ) කියයි: ''යම් කෙනෙක් එකැතින් පණ්ඩිත ව්‍යක්ත නැණැති බහුශ්‍රැත ධම්කථික වෙති''යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි දුකුළා ඇවැත් වෙයි.

64. උපසපනෙක් උපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ මෙසේ කියයි. ''ඇපි සැඩොල්හු කුළුපොත්තෝ වැද්දෝ සොම්මරහු පුප්සඩුවෝ නො වම්හ''යි බෙණේ නම් ... ''ඇපි පණ්ඩිතයෝ ව්‍යක්තයෝ නැණැතියෝ බහුශ්‍රැතයෝ ධම්කථිකයෝ නො වම්හ. අපට දුගති නැති අපට සුගති මැ කැමැති විය යුතු ''යැයි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි දුකුළා ඇවැත් වෙයි.

65. උපසපනෙක් අනුපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ හීනභාවයෙන් හීනයකුහට කියයි ... හීනභාවයෙන් උත්කෘෂ්ටයකුහට කියයි ... උත්කෘෂ්ටභාවයෙන් හීනයකුහට කියයි ... උත්කෘෂ්ටභාවයෙන් උත්කෘෂ්ටයකුහට (මෙසේ) කියයි: පණ්ඩිතයකුට ව්‍යක්තයකුට නැණැතියකුට බහුශ්‍රැතයකුට ධම්කථිකයකුට 'පණ්ඩිතයෙහි ව්‍යක්තයෙහි නැණැතියෙහි බහුශ්‍රැතයෙහි ධම්කථිකයෙහි, තට දුගති නැති, තට සුගති මැ කැමැති විය යුතු''යැ යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි දුකුළා ඇවැත් වෙයි.

66. උපසම්පන්නො අනුපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො එවං වදෙති "සන්ති ඉධෙකච්චෙ චණ්ඩාලා වෙණා නෙසාද රථකාරා පුක්කුසා"ති භණති -පෙ- සන්ති ඉධෙකච්චෙ පණ්ඩිතා ව්‍යත්තා මෙධාවිනො බහුස්සුතා ධම්මකථිකා, නත්ථි තෙසං දුග්ගති සුගතියෙව තෙසං පාටිකඞ්ඛා"ති භණති ආපත්ති වාචාය වාචාය දුක්කටස්ස.

67. උපසම්පන්නො අනුපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො එවං වදෙති "යෙ නූන චණ්ඩාලා වෙණා නෙසාද රථකාරා පුක්කුසා"ති භණති -පෙ- "යෙ නූන පණ්ඩිතා ව්‍යත්තා මෙධාවිනො බහුස්සුතා ධම්මකථිකා"ති භණති ආපත්ති වාචාය වාචාය දුක්කටස්ස.

68. උපසම්පන්නො අනුපසම්පන්නං ඛුංසෙතුකාමො වම්භෙතුකාමො මඞ්කුකත්තුකාමො එවං වදෙති, "න මයං චණ්ඩාලා වෙණා නෙසාද රථකාරා පුක්කුසා"ති භණති -පෙ- "න මයං පණ්ඩිතා ව්‍යත්තා මෙධාවිනො බහුස්සුතා ධම්මකථිකා, නාම්හාකං දුග්ගති සුගතියෙව අම්හාකං පාටිකඞ්ඛා"ති භණති ආපත්ති වාචාය වාචාය දුක්කටස්ස.

69. උපසම්පන්නො උපසම්පන්නං න ඛුංසෙතුකාමො න වම්භෙතුකාමො න මඞ්කුකත්තුකාමො දවකම්‍යතා හීනෙන හීනං වදෙති චණ්ඩාලං වෙණං නෙසාදං රථකාරං පුක්කුසං, "චණ්ඩාලොසි වෙණොසි නෙසාදෙසි රථකාරොසි පුක්කුසොසී"ති භණති ආපත්ති වාචාය වාචාය දුබ්භාසිතස්ස.

70. උපසම්පන්නො උපසම්පන්නං න ඛුංසෙතුකාමො න වම්භෙතුකාමො න මඞ්කුකත්තුකාමො දවකම්‍යතා හීනෙන උක්කට්ඨං වදෙති ඛත්තියං බ්‍රාහ්මණං, "චණ්ඩාලොසි වෙණොසි නෙසාදෙසි රථකාරොසි පුක්කුසොසී"ති භණති ආපත්ති වාචාය වාචාය දුබ්භාසිතස්ස.

71. උපසම්පන්නො උපසම්පන්නං න ඛුංසෙතුකාමො න වම්භෙතුකාමො න මඞ්කුකත්තුකාමො දවකම්‍යතා උක්කට්ඨෙන හීනං වදෙති චණ්ඩාලං වෙණං නෙසාදං රථකාරං පුක්කුසං "ඛත්තියොසි බ්‍රාහ්මණොසී"ති භණති ආපත්ති වාචාය වාචාය දුබ්භාසිතස්ස.

66. උපසපනෙක් අනුපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ මෙසේ කියයි: ''මෙහි ඇතැම් කෙනෙක් සැඩොල් කුළුපොතු වැදි සොම්මර පුප්සඩු වෙති''යි බෙණේ නම් ... ''මෙහි ඇතැම් කෙනෙක් පණ්ඩිත ව්‍යක්ත නැණැති බහුශ්‍රුත ධර්මකථික වෙති, ඔවුනට දුගති නැති, ඔවුනට සුගති මැ කැමැති විය යුතු''යැ යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි දුකුළා ඇවැත් වෙයි.

67. උපසපනෙක් අනුපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ මෙසේ කියයි: ''යම් කෙනෙක් එකැතින් සැඩොල් කුළුපොතු වැදි සොම්මර පුප්සඩු වෙති''යි බෙණේ නම් ... යම් කෙනෙක් එකැතින් පණ්ඩිත ව්‍යක්ත නැණැති බහුශ්‍රුත ධර්මකථික වෙති''යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි දුකුළා ඇවැත් වෙයි.

68. උපසපනෙක් අනුපසපනක්හු හෙළා දකිනු කැමැත්තේ ගරහනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ මෙසේ කියයි: ''අපි සැඩොල්හු කුළුපොත්තෝ වැද්දෝ සොම්මරු පුප්සඩුවෝ නො වම්හ'යි බෙණේ නම් ... ඇපි පණ්ඩිතයෝ ව්‍යක්තයෝ නැණැතියෝ බහුශ්‍රුතයෝ ධර්මකථිකයෝ නො වම්හ, අපට දුගති නැති අපට සුගති මැ කැමැති විය යුතු''යැ යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි දුකුළා ඇවැත් වෙයි.

69. උපසපනෙක් උපසපනක්හු නො හෙළා දකිනු කැමැත්තේ නො ගරහනු කැමැත්තේ නො මකු කරනු කැමැත්තේ කෙළි රිසියෙන් හීනජාතිවචනයෙන් හීනයකුහට (මෙසේ) කියයි: සැඩොලකුට කුළු-පොත්තකුට වැද්දකුට සොම්මරකුට පුප්සඩුවකුට 'සැඩොලෙහි කුළු-පොත්තෙහි වැද්දෙහි සොම්මරයෙහි පුප්සඩුයෙහි'යී බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි දුබැසි ඇවැත් වෙයි.

70. උපසපනෙක් උපසපනක්හු නො හෙළා දකිනු කැමැත්තේ නො ගරහනු කැමැත්තේ නො මකු කරනු කැමැත්තේ කෙළි රිසියෙන් හීනජාතිවචනයෙන් උත්කෘෂ්ට ජාතිකයකුහට මෙසේ කියයි: ක්ෂත්‍රියය-කුට බ්‍රාහ්මණයකුට 'සැඩොලෙහි කුළුපොත්තෙහි වැද්දෙහි සොම්මරයෙහි පුප්සඩුයෙහි'යී බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි දුබැසි ඇවැත් වෙයි.

71. උපසපනෙක් උපසපනක්හු නො හෙළා දකිනු කැමැත්තේ නො ගරහනු කැමැත්තේ නො මකු කරනු කැමැත්තේ කෙළි රිසියෙන් උත්කෘෂ්ට ජාතිවචනයෙන් හීන ජාතිකයකුහට මෙසේ කියයි: සැඩොලකුට කුළුපොත්තකුට වැද්දකුට සොම්මරකුට පුප්සඩුවකුට 'ක්ෂත්‍රියයෙහි බ්‍රාහ්මණයෙහි' යී බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි දුබැසි ඇවැත් වෙයි.

72. උපසම්පන්නො උපසම්පන්නං න ඛුංසෙතුකාමො න වම්භෙතුකාමො න මඞ්කුකත්තුකාමො දවකම්‍යතා උක්කට්ඨෙන උක්කට්ඨං වදෙති ඛත්තියං බ්‍රාහ්මණං "ඛත්තියොසි බ්‍රාහ්මණොසී"ති භණති. ආපත්ති වාචාය වාචාය දුබ්භාසිතස්ස.

73. උපසම්පන්නො උපසම්පන්නං න ඛුංසෙතුකාමො න වම්භෙතුකාමො න මඞ්කුකත්තුකාමො දවකම්‍යතා හීනෙන හීනං වදෙති -පෙ- හීනෙන උක්කට්ඨං වදෙති -පෙ- උක්කට්ඨෙන හීනං වදෙති -පෙ- උක්කට්ඨෙන උක්කට්ඨං වදෙති පණ්ඩිතං ව්‍යත්තං මෙධාවිං බහුස්සුතං ධම්මකථිකං, "පණ්ඩිතොසි ව්‍යත්තොසි මෙධාවීසි බහුස්සුතොසි ධම්මකථිකොසි නත්ථි තුය්හං දුග්ගති, සුගතියෙව තුය්හං පාටිකඞ්ඛා"ති භණති ආපත්ති වාචාය වාචාය දුබ්භාසිතස්ස.

74. උපසම්පන්නො උපසම්පන්නං න ඛුංසෙතුකාමො න වම්භෙතුකාමො නමඞ්කුකත්තුකාමො දවකම්‍යතා එවං වදෙති, "සන්ති ඉධෙකච්චෙ චණ්ඩාලා වෙණා නෙසාද රථකාරා පුක්කුසා"ති භණති -පෙ- සන්ති ඉධෙකච්චෙ පණ්ඩිතා ව්‍යත්තා මෙධාවිනො බහුස්සුතා ධම්මකථිකා, නත්ථි තෙසං දුග්ගති සුගතියෙව තෙසං පාටිකඞ්ඛා"ති භණති ආපත්ති වාචාය වාචාය දුබ්භාසිතස්ස.

75. උපසම්පන්නො උපසම්පන්නං න ඛුංසෙතුකාමො න වම්භෙතුකාමො න මඞ්කුකත්තුකාමො දවකම්‍යතා එවං වදෙති, "යෙ නූන චණ්ඩාලා වෙණා නෙසාද රථකාරා පුක්කුසා"ති භණති -පෙ- "යෙ නූන පණ්ඩිතා ව්‍යත්තා මෙධාවිනො බහුස්සුතා ධම්මකථිකා"ති භණති ආපත්ති වාචාය වාචාය දුබ්භාසිතස්ස.

76. උපසම්පන්නො උපසම්පන්නං න ඛුංසෙතුකාමො න වම්භෙතුකාමො න මඞ්කුකත්තුකාමො දවකම්‍යතා එවං වදෙති, "න මයං චණ්ඩාලා වෙණා නෙසාද රථකාරා පුක්කුසා"ති භණති -පෙ- "න මයං පණ්ඩිතා ව්‍යත්තා මෙධාවිනො බහුස්සුතා ධම්මකථිකා, නත්ථම්හාකං දුග්ගති, සුගතියෙව අම්හාකං පාටිකඞ්ඛා"ති භණති ආපත්ති වාචාය වාචාය දුබ්භාසිතස්ස.

72. උපසපනෙක් උපසපනක්හු නො හෙළා දකිනු කැමැත්තේ නො ගරහනු කැමැත්තේ නො මකු කරනු කැමැත්තේ කෙලි රිසියෙන් උත්කෘෂ්ටජාතිවචනයෙන් උත්කෘෂ්ටජාතියකුහට මෙසේ කියයි; ක්ෂත්‍රියකුට බ්‍රාහ්මණයකුට 'ක්ෂත්‍රියෙහි බ්‍රාහ්මණයෙහි' යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි දුබැසි ඇවැත් වේ.

73. උපසපනෙක් උපසපනක්හු නො හෙළා දකිනු කැමැත්තේ නො ගරහනු කැමැත්තේ නො මකු කරනු කැමැත්තේ කෙලි රිසියෙන් හීනත්වයෙන් හීනයකුහට මෙසේ කියයි ...හීනත්වයෙන් උත්කෘෂ්ටයකුහට (මෙසේ) කියයි; ...උත්කෘෂ්ටත්වයෙන් හීනයකුහට (මෙසේ) කියයි; ...උත්කෘෂ්ටත්වයෙන් උත්කෘෂ්ටයකුහට මෙසේ කියයි; පණ්ඩිතයකුට ව්‍යක්තයකුට නැණැතියකුට බහුශ්‍රුතයකුට ධර්මකථිකයකුට ''පණ්ඩිතයෙහි ව්‍යක්තයෙහි නැණැතියෙහි බහුශ්‍රුතයෙහි ධර්මකථිකයෙහි තට දුගති නැති තට සුගති මැ කැමැති විය යුතු''යැ යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි දුබැසි ඇවැත් වෙයි.

74. උපසපනෙක් උපසපනක්හු නො හෙළා දකිනු කැමැත්තේ නො ගරහනු කැමැත්තේ නො මකු කරනු කැමැත්තේ කෙලි රිසියෙන් මෙසේ කියයි: ''මෙහි ඇතැම් කෙනෙක් සැඬොල්හු කුළුපොත්තෝ වැද්දෝ සොම්මරහු පුප්සඩුවෝ වෙති''යි බෙණේ නම් ...''මෙහි ඇතැම් කෙනෙක් පණ්ඩිතයෝ ව්‍යක්තයෝ නැණැතියෝ බහුශ්‍රුතයෝ ධර්මකථිකයෝ වෙති. ඔවුනට දුගති නැති, ඔවුනට සුගති මැ කැමැති විය යුතු යැ''යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි දුබැසි ඇවැත් වෙයි.

75. උපසපනෙක් උපසපනක්හු නො හෙළා දකිනු කැමැත්තේ නො ගරහනු කැමැත්තේ නො මකු කරනු කැමැත්තේ කෙලි රිසියෙන් මෙසේ කියයි: ''යම් කෙනෙක් එකැතින් සැඬොල්හු කුළුපොත්තෝ වැද්දෝ සොම්මරහු පුප්සඩුවෝ වෙති''යි බෙණේ නම්...යම් කෙනෙක් එකැතින් පණ්ඩිතයෝ ව්‍යක්තයෝ නැණැතියෝ බහුශ්‍රුතයෝ ධර්මකථිකයෝ වෙති'' යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි දුබැසි ඇවැත් වෙයි.

76. උපසපනෙක් උපසපනක්හු නො හෙළා දකිනු කැමැත්තේ නො ගරහනු කැමැත්තේ නො මකු කරනු කැමැත්තේ කෙලි රිසියෙන් මෙසේ කියයි: ''ඇපි සැඬොල්හු කුළුපොත්තෝ වැද්දෝ සොම්මරහු පුප්සඩුවෝ නො වම්හ''යි බෙණේ නම්...ඇපි පණ්ඩිතයෝ ව්‍යක්තයෝ නැණැතියෝ බහුශ්‍රුතයෝ ධර්මකථිකයෝ නො වම්හ. අපට දුගති නැති, අපට සුගති මැ කැමැති විය යුතු ''යැ යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි දුබැසි ඇවැත් වෙයි.

77. උපසම්පන්නො අනුපසම්පන්නං න ඛුංසෙතුකාමො න වම්භෙතුකාමො න මඞ්කුකත්තුකාමො දවකම්‍යතා හීනෙන හීනං වදෙති -පෙ- හීනෙන උක්කට්ඨං වදෙති -පෙ- උක්කට්ඨෙන හීනං වදෙති -පෙ- උක්කට්ඨෙන උක්කට්ඨං වදෙති පණ්ඩිතං ව්‍යත්තං මෙධාවිං බහුස්සුතං ධම්මකථිකං, 'පණ්ඩිතොසි ව්‍යත්තොසි මෙධාවීසි බහුස්සුතොසි ධම්මකථිකොසි, නත්‍ථි තුය්හං දුග්ගති. සුගතියෙව තුය්හං පාටිකඞ්ඛා''ති භණති ආපත්ති වාචාය වාචාය දුබ්භාසිතස්ස.

78. උපසම්පන්නො අනුපසම්පන්නං න ඛුංසෙතුකාමො න වම්භෙතුකාමො න මඞ්කුකත්තුකාමො දවකම්‍යතා එවං වදෙති, ''සන්ති ඉධෙකච්චෙ චණ්ඩාලා වෙණා නෙසාද රථකාරා පුක්කුසා''ති භණති -පෙ- සන්ති ඉධෙකච්චෙ පණ්ඩිතා ව්‍යත්තා මෙධාවිනො බහුස්සුතා ධම්මකථිකා, නත්‍ථි තෙසං දුග්ගති සුගතියෙව තෙසං පාටිකඞ්ඛා''ති භණති ආපත්ති වාචාය වාචාය දුබ්භාසිතස්ස.

79. උපසම්පන්නො අනුපසම්පන්නං න ඛුංසෙතුකාමො න වම්භෙතුකාමො න මඞ්කුකත්තුකාමො දවකම්‍යතා එවං වදෙති, ''යෙ නූන චණ්ඩාලා වෙණා නෙසාද රථකාරා පුක්කුසා'' ති භණති -පෙ- ''යෙ නූන පණ්ඩිතා ව්‍යත්තා මෙධාවිනො බහුස්සුතා ධම්මකථිකා''ති භණති ආපත්ති වාචාය වාචාය දුබ්භාසිතස්ස.

80. උපසම්පන්නො අනුපසම්පන්නං න ඛුංසෙතුකාමො න වම්භෙතුකාමො න මඞ්කුකත්තුකාමො දවකම්‍යතා එවං වදෙති, ''න මයං චණ්ඩාලා වෙණා නෙසාද රථකාරා පුක්කුසා''ති භණති -පෙ- ''න මයං පණ්ඩිතා ව්‍යත්තා මෙධාවිනො බහුස්සුතා ධම්මකථිකා නත්‍ථම්හාකං දුග්ගති සුගතියෙව අම්හාකං පාටිකඞ්ඛා''ති භණති ආපත්ති වාචාය වාචාය දුබ්භාසිතස්ස.

81. අනාපත්ති: අත්‍ථපුරෙක්ඛාරස්ස ධම්මපුරෙක්ඛාරස්ස අනුසාසනීපුරෙක්ඛාරස්ස උම්මත්තකස්ස ඛිත්තචිත්තස්ස වෙදනට්ටස්ස[1] ආදිකම්මිකස්සාති.

ඔමසවාදසික්ඛාපදං දුතියං

1. වෙදනාට්ටස්ස - මජසං,

77. උපසපනෙක් අනුපසපනක්හු නො හෙළා දකිනු කැමැත්තේ නො ගරහනු කැමැත්තේ නො මකු කරනු කැමැත්තේ කෙලි රිසියෙන් හීනයකුහට හීනත්වයෙන් (මෙසේ) කියයි: ...උත්කෘෂ්ටයකුහට හීනත්වයෙන් (මෙසේ) කියයි ...හීනයකුහට උත්කෘෂ්ටත්වයෙන් (මෙසේ) කියයි ...උත්කෘෂ්ටයකුහට උත්කෘෂ්ටත්වයෙන් (මෙසේ) කියයි: පණ්ඩිතයකුට ව්‍යක්තයකුට නැණැතියකුට බහුශ්‍රැතයකුට ධර්මකථිකයකුට ''පණ්ඩිතයෙහි ව්‍යක්තයෙහි නැණැතියෙහි බහුශ්‍රැතයෙහි ධර්මකථිකයෙහි තට දුගති නැති, තට සුගති මැ කැමැති විය යුතු යැ යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි දුබැසි ඇවැත් වෙයි.

78. උපසපනෙක් අනුපසපනක්හු නො හෙළා දකිනු කැමැත්තේ නො ගරහනු කැමැත්තේ නො මකු කරනු කැමැත්තේ කෙලි රිසියෙන් මෙසේ කියයි: ''මෙහි ඇතැම් කෙනෙක් සැඩොල් කුළුපොතු වැදි සොම්මර පුප්සඩු වෙති''යි බෙණේ නම් ...''මෙහි ඇතැම් කෙනෙක් පණ්ඩිත ව්‍යක්ත නැණැති බහුශ්‍රැත ධර්මකථික වෙති. ඔවුනට දුගති නැති. ඔවුනට සුගති මැ කැමැති විය යුතු ''යැ යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි දුබැසි ඇවැත් වෙයි.

79. උපසපනෙක් අනුපසපනක්හු නො හෙළා දකිනු කැමැත්තේ නො ගරහනු කැමැත්තේ නො මකුකරනු කැමැත්තේ කෙලි රිසියෙන් මෙසේ කියයි: ''යම් කෙනෙක් එකැතින් සැඩොල් කුළුපොතු වැදි සොම්මර පුප්සඩු වෙති''යි බෙණේ නම්...''යම් කෙනෙක් එකැතින් පණ්ඩිත ව්‍යක්ත නැණැති බහුශ්‍රැත ධර්මකථික වෙති''යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි දුබැසි ඇවැත් වෙයි.

80. උපසපනෙක් අනුපසපනක්හු නො හෙළා දකිනු කැමැත්තේ නො ගරහනු කැමැත්තේ නො මකු කරනු කැමැත්තේ කෙලි රිසියෙන් මෙසේ කියයි: ''ඇපි සැඩොල්හු කුළුපොත්තෝ වැද්දෝ සොම්මරහු පුප්සඩුවෝ නො වම්හ''යි බෙණේ නම් ...ඇපි පණ්ඩිතයෝ ව්‍යක්තයෝ නැණැතියෝ බහුශ්‍රැතයෝ ධර්මකථිකයෝ නො වම්හ, අපට දුගති නැති. අපට සුගති මැ කැමැති විය යුතු යැ''යි බෙණේ නම් තෙපුලෙහි තෙපුලෙහි දුබැසි ඇවැත් වෙ.

81. අර්ථය පෙරටු කොට කියන්නහුට, ධර්මය පෙරටු කොට කියන්නහුට, අනුශාසනය පෙරටු කොට කියන්නහුට, උම්මත්තකහට වික්ෂිප්තචිත්තහට වේදනාර්ත්තහට ආදිකාර්මිකහට ඇවැත් නැති.

**දෙවෙනි ඕමසවාද ශික්ෂාපද යි**

## 6 . 1 . 3

### පෙසුඤ්ඤසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජේතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛු භික්ඛූනං භණ්ඩනජාතානං කලහජාතානං විවාදපන්නානං පෙසුඤ්ඤං උපසංහරන්ති. ඉමස්ස සුත්වා අමුස්ස අක්ඛායන්ති ඉමස්ස භෙදය. අමුස්ස සුත්වා ඉමස්ස අක්ඛායන්ති අමුස්ස භෙදය තෙන අනුප්පන්නානි චෙව භණ්ඩනානි උප්පජ්ජන්ති. උප්පන්නානි ච භණ්ඩනානි භියොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති. යෙ තෙ භික්ඛු අප්පිච්ඡා–පෙ–තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛු භික්ඛූනං භණ්ඩන ජාතානං කලහජාතානං විවාදපන්නානං පෙසුඤ්ඤං උපසංහරිස්සන්ති ඉමස්ස සුත්වා අමුස්ස අක්ඛායිස්සන්ති ඉමස්ස භෙදය, අමුස්ස සුත්වා ඉමස්ස අක්ඛායිස්සන්ති අමුස්ස භෙදය. තෙන අනුප්පන්නානි චෙව භණ්ඩනානි උප්පජ්ජන්ති උප්පන්නානි ච භණ්ඩනානි භියොභාවාය වෙපුල්ලාය සංවත්තන්තීති.

2. අථ ඛො තෙ භික්ඛු භගවතො එතමත්ථං ආරොචෙසුං–පෙ–සච්චං කිර තුම්හෙ භික්ඛවෙ භික්ඛූනං භණ්ඩනජාතානං කලහජාතානං විවාදපන්නානං පෙසුඤ්ඤං උපසංහරථ ඉමස්ස සුත්වා අමුස්ස අක්ඛායථ ඉමස්ස භෙදය, අමුස්ස සුත්වා ඉමස්ස අක්ඛායථ අමුස්ස භෙදය. තෙන අනුප්පන්නානි චෙව භණ්ඩනානි උප්පජ්ජන්ති උප්පන්නානි ච භණ්ඩනානි භියොභාවාය වෙපුල්ලාය සංවත්තන්තීති. සච්චං භගවා, විගරහි බුද්ධො භගවා–පෙ–කථං හි නාම තුම්හෙ මොඝපුරිසා භික්ඛූනං භණ්ඩනජාතානං කලහජාතානං විවාදපන්නානං පෙසුඤ්ඤං උපසංහරිස්සථ ඉමස්ස සුත්වා අමුස්ස අක්ඛායිස්සථ ඉමස්ස භෙදය, අමුස්ස සුත්වා ඉමස්ස අක්ඛායිස්සථ අමුස්ස භෙදය, තෙන අනුප්පන්නානි චෙව භණ්ඩනානි උප්පජ්ජන්ති. උප්පන්නානි ච භණ්ඩනානි භියොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය පසන්නානං වා භියොභාවාය–පෙ–එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

"භික්ඛු පෙසුඤ්ඤෙ පාචිත්තිය"න්ති

3. පෙසුඤ්ඤං නාම: ද්වීහාකාරෙහි පෙසුඤ්ඤං හොති. පියකම්‍යස්ස වා භෙදධිප්පායස්ස වාති. දසහාකාරෙහි පෙසුඤ්ඤං උපසංහරති ජාතිතොපි නාමතොපි ගොත්තතොපි කම්මතොපි සිප්පතොපි ආබාධතොපි ලිඞ්ගතොපි කිලෙසතොපි ආපත්තිතොපි අක්කොසතොපි.

## 6.1.3

### පෙසුඤ්ඤ ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්හි ජේතවන නම් අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩැ වෙසෙති. එසමයෙහි ඡබ්බග්ගිය මහණහු උපන් භණ්ඩන (කලහ පෙරටු බිණුම්) ඇති උපන් කලහ ඇති විවාදයට පැමිණි මහණුන්හට පෙහෙසුන් බස් එළවත්. මොහුගෙන් අසා මොහුගේ බිඳීමට ඔහුට කියත්. ඔහුගෙන් අසා ඔහුගේ බිඳීමට මොහුට කියත්. එයින් නූපන් භණ්ඩනයෝ ද උපදිත්. උපන් භණ්ඩනයෝ ද බහුලබවට විපුලබවට වැටෙත්. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවාහු ...ඔහු ලමු කොට සිතති. නුගුණ කියති. දෙස් පතුරුවත්: "කෙසේ නම් ඡබ්බග්ගිය මහණහු උපන් භණ්ඩන කලහ ඇති විවාදයට පැමිණි මහණුන්හට පෙහෙසුන්බස් එළවූහු ද, මොහුගෙන් අසා මොහුගේ බිඳීමට ඔහුට කීහු ද, ඔහුගෙන් අසා ඔහුගේ බිඳීමට මොහුට කීහු ද, එයින් නූපන් භණ්ඩනයෝ ද උපදිත්. උපන් භණ්ඩනයෝ ද බහුල බවට විපුල බවට වැටෙත්"යැයි.

2. එකල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන්හට මෙ කරුණ දැන්වූහ... සැබෑ ද මහණෙනි, තෙපි උපන් භණ්ඩන කලහ ඇති විවාදයට පැමිණි මහණුන්හට පෙහෙසුන් බස් එළවවු ද? මොහුගෙන් අසා මොහුගේ බිඳීමට ඔහුට කියවු ද? ඔහුගෙන් අසා ඔහුගේ බිඳීමට මොහුට කියවු ද? එයින් නූපන් භණ්ඩනයෝ ද උපදිත්. උපන් භණ්ඩනයෝ ද බහුල බවට විපුල බවට වැටෙත් යැ යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ...කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි උපන් භණ්ඩන කලහ ඇති විවාදයට පැමිණි මහණුන්හට පෙහෙසුන් බස් එළවූවහු ද? මොහුගෙන් අසා මොහුගේ බිඳීමට ඔහුට කීවහු ද? ඔහුගෙන් අසා ඔහුගේ බිඳීමට මොහුට කීවහු ද, එයින් නූපන් භණ්ඩනයෝ ද උපදිත්. උපන් භණ්ඩනයෝත් බහුල බවට විපුල බවට වැටෙත්. හිස්පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදයට හෝ ප්‍රසන්නයන්ගේ අතිරෙක ප්‍රසාදයට හෝ නො වේ... මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු;

**මහණුන්ගේ පෙහෙසුන් බස්හි පචිති ඇවැත් වෙ යයි.**

3. **පෙසුඤ්ඤ** නම්: දෙ අයුරෙකින් පෙහෙසුන් වෙයි. ප්‍රිය භාවය කැමැත්තාහට හෝ බිඳුවන අදහස ඇතියාහට හෝ යි. දස අයුරෙකින් පෙහෙසුන් බස් එළවයි. ජාතියෙනුදු නාමයෙනුදු ගෝත්‍රයෙනුදු කර්මයෙනුදු ශිල්පයෙනුදු ආබාධයෙනුදු ලිඞ්ගයෙනුදු ක්ලේශයෙනුදු ආපත්තියෙනුදු ආක්‍රොශයෙනුදු යි.

4. **ජාති** නාම: ද්වෙ ජාතියො හීනා ච ජාති උක්කට්ඨා ච ජාති හීනා නාම ජාති: චණ්ඩාලජාති වෙණජාති නෙසාදජාති රථකාරජාති පුක්කුසජාති, එසා හීනා නාම ජාති. **උක්කට්ඨා නාම ජාති:** ඛත්තියජාති බ්‍රාහ්මණජාති එසා උක්කට්ඨා නාම ජාති – පෙ –

5. **අක්කොසො** නාම; ද්වෙ අක්කොසා හීනො ච අක්කොසො උක්කට්ඨො ච අක්කොසො. **හීනො නාම අක්කොසො:** ඔට්ඨොසි මෙණ්ඩොසි ගොණොසි ගද්‍රභොසි තිරච්ඡානගතොසි නෙරයිකොසි නත්ථි තුය්හං සුගති දුග්ගතියෙව තුය්හං පාටිකඞ්ඛාති. යකාරෙන වා භකාරෙන වා කාටකොටචිකාය වා, එසො හීනො නාම අක්කොසො, **උක්කට්ඨො නාම අක්කොසො:** පණ්ඩිතොසි ව්‍යත්තොසි මෙධාවීසි බහුස්සුතොසි ධම්මකථිකොසි නත්ථි තුය්හං දුග්ගති සුගතියෙව තුය්හං පාටිකඞ්ඛාති, එසො උක්කට්ඨො නාම අක්කොසො.

6. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො තං චණ්ඩාලො වෙණො නෙසාදො රථකාරො පුක්කුසොති භණතී"ති. ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

7. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති. "ඉත්ථන්නාමො තං ඛත්තියො බ්‍රාහ්මණොති භණතී"ති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

8. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො තං අවකණ්ණකො ජවකණ්ණකො ධනිට්ඨකො සවිට්ඨකො කුලවඩ්ඪකොති භණතී"ති. ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

9. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො තං බුද්ධරක්ඛිතො ධම්මරක්ඛිතො සඞ්ඝරක්ඛිතොති භණතී"ති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

10. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො තං කොසියො භාරද්වාජොති භණතී"ති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

11. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො තං ගොතමො මොග්ගල්ලානො කච්චානො වාසෙට්ඨොති භණතී"ති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

4. **ජාති** නම්: ජාති දෙකෙකි, හීන ජාති ද උත්කෘෂ්ට ජාති ද යි. **හීන ජාති** නම්: සැඬොල්ජාති යැ කුළුපොතුජාති යැ වැදිජාති යැ සොම්මරජාති යැ පුප්සඩුජාති යි. මෙතල හීනජාති නම. **උත්කෘෂ්ට** ජාති නම්: ක්ෂත්‍රිය ජාති යැ බ්‍රාහ්මණ ජාති යි. මෙතල උත්කෘෂ්ට ජාති නමු....

5. **ආක්‍රෝශ** නම්: ආක්‍රෝශ දෙකෙකි හීනආක්‍රෝශ ද උත්කෘෂ්ට ආක්‍රෝශ ද යි. **හීනාක්‍රෝශ** නම්: ඔටුයෙහි මැඩයෙහි ගොන්හි ගදුබුයෙහි තිරිසන්ගියෙහි නිරිසත්හි තට සුගති නැති, තට දුගති මැ කැමැති වියයුතු යි, යකාරහකාරයන් යොද කරන ආක්‍රෝශ යැ කාටකොටවිකායෙන් (ස්ත්‍රී පුරුෂ නිමිත්ත කරුණු කොට) කරන ආක්‍රෝශ යි. මෙතෙලෙ හීනාක්‍රෝශ නම. **උත්කෘෂ්ටාක්‍රෝශ** නම්: පණ්ඩිතයෙහි ව්‍යක්තයෙහි නැණැතියෙහි බහුශ්‍රැතයෙහි ධර්මකථිකයෙහි තට දුගති නැති තට සුගති මැ කැමැති වියයුතු යි. මෙතෙලෙ උත්කෘෂ්ටාක්‍රෝශ නම්.

6. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනකුට "මෙ නම් ඇතියේ තට සැඬොල් යැ කුළුපොතු යැ වැදි යැ සොම්මර යැ පුප්සඩු යැ යී බෙණේ"යි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

7. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනකුට "මෙ නම් ඇතියේ තට ක්ෂත්‍රිය යැ බ්‍රාහ්මණ යැ යී බෙණේ"යි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

8. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනකුට මෙ නම් ඇතියේ තට අවකණ්ණක යැ ජවකණ්ණක යැ ධනිට්ඨක යැ සවිට්ඨක යැ කුලවඩ්ඪක යැ යී බෙණේ"යි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

9. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනකුට "මෙ නම් ඇතියේ තට බුද්ධරක්ෂිත යැ ධර්මරක්ෂිත යැ සඞ්ඝරක්ෂිත යැ යී බෙණේ"යි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

10. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනකුට මෙ නම් ඇතියේ තට කොසිය යැ භාරද්වාජ යැ යී බෙණේ" යි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

11. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනකුට මෙ නම් ඇතියේ තට ගෞතම යැ මොග්ගල්ලාන යැ කච්චාන යැ වාසෙට්ඨ යැ යී බෙණේ"යි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

12. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො තං කොට්ඨකො පුප්ඵඡඩ්ඩකොති භණතී"ති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

13. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො තං කස්සකො වාණිජො ගොරක්ඛොති භණතී"ති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

14. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො තං නළකාරො කුම්භකාරො පෙසකාරො චම්මකාරො නහාපිතොති භණතී"ති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

15. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො තං මුද්දිකො ගණකො ලෙඛකොති භණතී"ති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

16. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො තං කුට්ඨිකො ගණ්ඩිකො කිලාසිකො සොසිකො අපමාරිකොති භණතී"ති. ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

17. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො තං මධුමෙහිකොති භණතී"ති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

18. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො තං අතිදීඝො අතිරස්සො අතිකණ්හො අච්චොදාතොති භණතී"ති. ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

19. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො තං නාතිදීඝො නාතිරස්සො නාතිකණ්හො නාච්චොදාතොති භණතී"ති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

20. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො තං රාගපරියුට්ඨිතො දොසපරියුට්ඨිතො මොහපරියුට්ඨිතොති භණතී"ති ආපත්ති වාචාය වාචාය පාචියත්තිස්ස.

12. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනකුට මෙ නම් ඇතියේ තට කොට්ඨක යැ පුප්ඵඡඩ්ඨක යැ යි බෙණේ''යි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

13. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනකුහට ''මෙ නම් ඇතියෙ තට කර්ෂක යැ වාණිජ යැ ගොරක්ෂක යැ යි බෙණේ''යි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

14. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනකුහට ''මෙ නම් ඇතියේ තට නළකාර යැ කුම්භකාර යැ පේසකාර යැ චම්මකාර යැ නුහාපිත යැ යි බෙණේ''යි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

15. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනක්හට ''මෙ නම් ඇතියේ තට මුද්දික යැ ගණක යැ ලේඛක යැ යි බෙණේ''යි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

16. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනක්හට මෙනම් ඇතියේ තට කුට්ඨික යැ ගණ්ඩික යැ කිලාසික යැ සොසික යැ අපමාරික යැ යි බෙණේ''යි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

17. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනක්හට ''මෙ නම් ඇතියේ තට මධුමෙහික යැ යි බෙණේ''යි පෙහෙසුන් එළවා නම් තෙපු-ලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

18. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනක්හට ''මෙ නම් ඇතියේ තට අතිදීර්ඝ යැ අතිහ්‍රස්ව යැ අතිකෘෂ්ණ යැ අත්‍යවදත යැ යි බෙණේ'' යි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

19. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනක්හට මෙ නම් ඇතියේ තට නාතිදීර්ඝ යැ නාතිහ්‍රස්ව යැ නාතිකෘෂ්ණ යැ නාත්‍යවදත යැ යි බෙණේ''යි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

20. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනකුට ''මෙ නම් ඇතියේ තට රාගපර්යුත්ථිත යැ ද්වේෂපර්යුත්ථිත යැ මෝහපර්යුත්ථිත යැයි බෙණේ'' යි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

21. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො තං වීතරාගො වීතදොසො වීතමොහොති භණතී"ති. ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

22. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො තං පාරාජිකං අජ්ඣාපන්නො සඞ්ඝාදිසෙසං අජ්ඣාපන්නො ථුල්ලච්චයං අජ්ඣාපන්නො පාචිත්තියං අජ්ඣාපන්නො පාටිදෙසනීයං අජ්ඣාපන්නො දුක්කටං අජ්ඣාපන්නො දුබ්භාසිතං අජ්ඣාපන්නොති භණතී"ති. ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

23. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො තං සොතාපන්නොති භණතී"ති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

24. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො තං ඔට්ඨො මෙණ්ඩො ගොණො ගද්‍රභො තිරච්ඡානගතො නෙරයිකො නත්ථි තුය්හං සුගති දුග්ගතියෙව තුය්හං පාටිකඞ්ඛාති භණතී"ති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

25. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො තං පණ්ඩිතො ව්‍යත්තො මෙධාවී බහුස්සුතො ධම්මකථිකො නත්ථි තුය්හං දුග්ගති සුගතියෙව තුය්හං පාටිකඞ්ඛාති භණතී"ති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

26. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො සන්ති ඉධෙකච්චෙ චණ්ඩාලා වෙණා නෙසාද රථකාරා පුක්කුසාති භණති න සො අඤ්ඤං භණති තඤ්ඤෙව භණතී"ති ආපත්ති වාචාය වාචාය දුක්කටස්ස.

27. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො සන්ති ඉධෙකච්චෙ ඛත්තියා බ්‍රාහ්මණාති භණති න සො අඤ්ඤං භණති තඤ්ඤෙව භණතී"ති. ආපත්ති වාචාය වාචාය දුක්කටස්ස.

28. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො සන්ති ඉධෙකච්චෙ පණ්ඩිතා ව්‍යත්තා මෙධාවිනො බහුස්සුතා ධම්මකථිකා නත්ථි තෙසං දුග්ගති සුගතියෙව තෙසං පාටිකඞ්ඛාති භණති න සො අඤ්ඤං භණති තඤ්ඤෙව භණතී"ති. ආපත්ති වාචාය වාචාය දුක්කටස්ස.

21. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනක්හට ''මෙ නම් ඇතියේ තට වීතරාග යැ වීතද්වේෂ යැ වීතමෝහ යැ යි බෙණේ'' යි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

22. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනක්හට ''මෙ නම් ඇතියේ තට පරිජි අවනැ සඟවෙසෙස් අවනැ තුලසි අවනැ පචිති අවනැ පිළිදෙස්නී අවනැ දුකුළා අවනැ දුබැසි අවනැ යි බෙණේ''යි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

23. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනක්හට ''මෙ නම් ඇතියේ තට සෝතාපන්නයෙකැ යි බෙණේ''යි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

24. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනක්හට ''මෙ නම් ඇතියේ තට ඔටු යැ මැඩ යැ ගොන් යැ ගදුබු යැ තිරිසන්ගියෙ යැ තිරිසත් යැ තට සුගති නැත, තට දුගති මැ කැමැති වියයුතු යැයි බෙණේ'' යි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

25. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනක්හට ''මෙ නම් ඇතියේ තට පණ්ඩිත යැ ව්‍යක්ත යැ මේධාවී යැ බහුශ්‍රැත යැ ධම්කථික යැ තට දුගති නැති තට සුගති මැ කැමැති විය යුතු යැයි බෙණේ යි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

26. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනක්හට ''මෙ නම් ඇතියේ ''මෙහි ඇතැම් සැඩොල් කෙනෙක් කුළුපොතු කෙනෙක් වැදි කෙනෙක් සොම්මර කෙනෙක් පුප්සඩු කෙනෙක් වෙතියි බෙණේ නම් හේ අනෙකකුට නො බෙණේ තට මැ බෙණේ''යි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි දුකුළා ඇවැත් වෙයි.

27. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනක්හට ''මෙ නම් ඇතියේ මෙහි ඇතැම් ක්ෂත්‍රිය කෙනෙක් බ්‍රාහ්මණ කෙනෙක් වෙති යි බෙණේ නම් හේ අනෙකකුට නො බෙණේ, තට මැ බෙණේ''යි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි දුකුළා ඇවැත් වෙයි.

28. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනක්හට ''මෙ නම් ඇතියේ මෙහි ඇතැම් පණ්ඩිත කෙනෙක් ව්‍යක්ත කෙනෙක් මේධාවී කෙනෙක් බහුශ්‍රැත කෙනෙක් ධම්කථික කෙනෙක් වෙති ඔවුනට දුගති නැති ඔවුනට සුගති මැ කැමැති වියයුතු යැ යි බෙණේ නම් හේ අනෙකකුට නො බෙණේ තට මැ බෙණේ'' යි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි දුකුළා ඇවැත් වෙයි.

29. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො යෙ නූන චණ්ඩාලා වෙණා නෙසාද රථකාරා පුක්කුසාති භණති න සො අඤ්ඤං භණති තඤ්ඤෙව භණතී"ති. ආපත්ති වාචාය වාචාය දුක්කටස්ස.

30. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො -පෙ- යෙ නූන පණ්ඩිතා ව්‍යත්තා මෙධාවිනො බහුස්සුතා ධම්මකථිකා නත්ථි තෙසං දුග්ගති සුගතියෙව තෙසං පාටිකඞ්ඛාති[1] භණති න සො අඤ්ඤං භණති තඤ්ඤෙව භණතී"ති ආපත්ති වාචාය වාචාය දුක්කටස්ස.

31. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො න මයං චණ්ඩාලා වෙණා නෙසාද රථකාරා පුක්කුසාති භණති න සො අඤ්ඤං භණති තඤ්ඤෙව භණතී"ති ආපත්ති වාචාය වාචාය දුක්කටස්ස.

32. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති "ඉත්ථන්නාමො න මයං පණ්ඩිතා ව්‍යත්තා මෙධාවිනො බහුස්සුතා ධම්මකථිකා නත්ථම්හාකං දුග්ගති සුගතියෙව අම්හාකං පාටිකඞ්ඛාති භණති න සො අඤ්ඤං භණති තඤ්ඤෙව භණතී"ති ආපත්ති වාචාය වාචාය දුක්කටස්ස.

33. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති ආපත්ති වාචාය වාචාය පාචිත්තියස්ස.

34. උපසම්පන්නො උපසම්පන්නස්ස සුත්වා අනුපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති ආපත්ති දුක්කටස්ස.

35. උපසම්පන්නො අනුපසම්පන්නස්ස සුත්වා උපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති ආපත්ති දුක්කටස්ස.

36. උපසම්පන්නො අනුපසම්පන්නස්ස සුත්වා අනුපසම්පන්නස්ස පෙසුඤ්ඤං උපසංහරති ආපත්ති දුක්කටස්ස.

37. අනාපත්ති න පියකම්‍යස්ස න භෙදාධිප්පායස්ස උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

### පෙසුඤ්ඤසික්ඛාපදං තතියං

1. 'නත්ථි තෙසං දුග්ගති සුගතියෙව තෙසං පාටිකඞ්ඛාති' පාඨොයං න දිස්සතෙ මරම්මඡට්ඨසඞ්ගීති පිටකෙ.

29. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනකුහට ''මෙ නම් ඇතියේ යම් කෙනෙක් ඒකාන්තයෙන් සැඩොල්හු කුළුපොත්තෝ වැද්දෝ සොම්මරහු පුප්සඩුහු යැ යි බෙණේ නම් හේ අනෙකකුට නො බෙණේ තට මැ බෙණේ''යයි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි දුකුළා ඇවැත් වෙයි.

30. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනකුහට ''මෙ නම් ඇතියේ...යම් කෙනෙක් ඒකාන්තයෙන් පණ්ඩිතයෝ ව්‍යක්තයෝ මේධාවීහු බහුශ්‍රැතයෝ ධර්මකථිකයෝ වෙද්ද, ඔවුනට දුගති නැති, ඔවුනට සුගති මැ කැමැති වියයුතු යැයි බෙණේ නම් හේ අනෙකකුට නො බෙණේ තට මැ බෙණේ''යයි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි දුකුළා ඇවැත් වෙයි.

31. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනකුහට ''මෙ නම් ඇතියේ ඇපි සැඩොල්හු කුළුපොත්තෝ වැද්දෝ සොම්මරහු පුප්සඩුහු නො වම්හ යි බෙණේ ද හේ අනෙකකුට නො බෙණේ, තට මැ බෙණේ'' යයි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි දුකුළා ඇවැත් වෙයි.

32. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනකුහට ''මෙ නම් ඇතියෙ ඇපි පණ්ඩිතයෝ ව්‍යක්තයෝ මේධාවීහු බහුශ්‍රැතයෝ ධර්මකථිකයෝ නො වම්හ අපට දුගති නැති, අපට සුගති මැ කැමැති වියයුතු යැයි බෙණේ ද, හේ අනෙකකුට නො බෙණේ. තට මැ බෙණේ''යයි පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි දුකුළා ඇවැත් වෙයි.

33. උපසපනෙක් උපසපනකුගෙන් අසා උපසපනකුහට පෙහෙසුන් එළවා නම් තෙපුලෙහි තෙපුලෙහි පචිති ඇවැත් වෙයි.

34. උපසපනෙක් උපසපනකුගෙන් අසා අනුපසපනකුහට පෙහෙසුන් එළවා නම් දුකුළා ඇවැත් වෙයි.

35. උපසපනෙක් අනුපසපනකුගෙන් අසා උපසපනකුහට පෙහෙසුන් එළවා නම් දුකුළා ඇවැත් වෙයි.

36. උපසපනෙක් අනුපසපනකුගෙන් අසා අනුපසපනකුහට පෙහෙසුන් එළවා නම් දුකුළා ඇවැත් වෙයි.

37. ප්‍රියභාවය නොකැමැතියාහට ද බිඳුවන අදහස නැතියාහට ද උම්මත්තකයාහට ද ආදිකම්මිකයාහට ද ඇවැත් නැති.

**තෙවැනි පෙසුඤ්ඤශික්ෂාපද යි**

## 6. 1. 4

### පදසොධම්මසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන **ඡබ්බග්ගියා** භික්ඛූ උපාසකෙ පදසොධම්මං වාචෙන්ති. උපාසකා භික්ඛූසු අගාරවා අප්පතිස්සා අසභාගවුත්තිකා විහරන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ උපාසකෙ පදසොධම්මං වාචෙස්සන්ති, උපාසකා භික්ඛූසු අගාරවා අප්පතිස්සා අසභාගවුත්තිකා විහරිස්සන්තීති.[1]

2. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං-පෙ-සච්චං කිර තුම්හෙ භික්ඛවෙ උපාසකෙ පදසොධම්මං වාචෙථ, උපාසකා භික්ඛූසු අගාරවා අප්පතිස්සා අසභාගවුත්තිකා විහරන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා-පෙ-කථං හි නාම තුම්හෙ මොඝපුරිසා උපාසකෙ පදසොධම්මං වාචෙස්සථ, උපාසකා භික්ඛූසු අගාරවා අප්පතිස්සා අසභාගවුත්තිකා විහරිස්සන්ති. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය පසන්නානං වා භීය්‍යොභාවාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු අනුපසම්පන්නං පදසො ධම්මං වාචෙය්‍ය පාචිත්තිය"න්ති.**

3. **යො පනාති**: යො යාදිසො -පෙ- **භික්ඛූති**: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති. **අනුපසම්පන්නො** නාම : භික්ඛුඤ්ච භික්ඛුනිඤ්ච ඨපෙත්වා අවසෙසො අනුපසම්පන්නො නාම.

**පදසො** නාම: පදං අනුපදං අන්වක්ඛරං අනුබ්‍යඤ්ජනං. **පදං** නාම: එකතො පට්ඨපෙත්වා එකතො ඔසාපෙන්ති. **අනුපදං** නාම: පාටෙක්කං පට්ඨපෙත්වා එකතො ඔසාපෙන්ති. **අන්වක්ඛරං** නාම: රූපං අනිච්චන්ති වුච්චමානො රූති[2] ඔපාතෙති. **අනුබ්‍යඤ්ජනං** නාම: රූපං අනිච්චන්ති වුච්චමානො වෙදනා අනිච්චාති සද්දං නිච්ඡාරෙති. යඤ්ච පදං යඤ්ච අනුපදං යඤ්ච අන්වක්ඛරං යඤ්ච අනුබ්‍යඤ්ජනං සබ්බමෙතං පදසො[3] නාම.

**ධම්මො** නාම: බුද්ධභාසිතො සාවකභාසිතො ඉසිභාසිතො දෙවභාසිතො[4] අත්ථූපසංහිතො ධම්මූපසංහිතො.

---

1. විහරන්තීති- මජසං.
2. රූපන්ති- සිමු i රූන්ති- මජසං,
3. පදසො ධම්මො- සී i
4. දෙවතාභාසිතො- මජසං, ස්‍යා,

## 6. 1. 4

## පදසොධම්මශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්හි ජේතවන නම් අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩවෙසෙති. එසමයෙහි ෂඩ්වග මහණහු උවසුවනට පද විසින් එක් වැ ධර්මය කියවති. උවසුවෝ භික්ෂූන් කෙරෙහි ගරු නැති වැ බුහුමන් නැති වැ විසම පැවැතුම් ඇති වැ වෙසෙති. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවාහූ ද ඔහු ලමු කොට සිතති. නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ෂඩ්වග මහණහු උවසුවනට පද විසින් ධර්මය කියැවූහු ද, උවසුවෝ භික්ෂූන් කෙරෙහි ගරු නැති වැ බුහුමන් නැති වැ විසම පැවතුම් ඇති වැ වෙසෙත්නාහ''යි.

2. එකල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන්හට මෙකරුණ දැන්වූහ... සැබෑ ද මහණෙනි, තෙපි උවසුවනට පද විසින් එක් වැ ධර්මය කියවහු ද උවසුවෝ භික්ෂූන් කෙරෙහි ගරු නැති වැ බුහුමන් නැති වැ විසම පැවතුම් ඇති වැ වෙසෙත්නාහයි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූහ... ''කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි උවසුවනට පද විසින් ධර්මය කියවූහු ද උවසුවෝ භික්ෂූන් කෙරෙහි ගරු නැති වැ බුහුමන් නැති වැ විසම පැවැතුම් ඇති වැ වෙසෙත්නාහ. හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදයට හෝ ප්‍රසන්නයන්ගේ අතිරේක ප්‍රසාදයට හෝ නොවේ... මහණෙනි, මෙසේ මේ සිකපදය උදෙසවු:

**''යම් මහණෙක් අනුපසපන්නක්හට පද විසින් ධර්මය කියවා නම් පචිති වේ''** යයි.

3. **යොපන:** යම් යම්බඳු... භික්වු... මෙතෙම මෙ අරුතෙහි ලා අදහස් කරනලද භික්ෂු යි. **අනුපසම්පන්න** නම්: මහණ ද මෙහෙණ ද නබා අවශෙෂ වූයේ අනුපසම්පන්න නම් වේ.

**පදසො** නම්: පද යැ අනුපද යැ අන්වක්ෂර යැ අනුව්‍යඤ්ජන යි. **පද** නම්: එක් වැ පටන් ගෙනැ එක් වැ නිමවති. **අනුපද** නම්: වෙන වෙන පටන් ගෙනැ එක් වැ නිමවති. **අන්වක්ඛර** නම්: ''රූපං අනිච්චං''යි කියනු ලබන්නේ 'රූ' යි එක් වැ කියා නිමව යි. **අනුබ්‍යඤ්ජන** නම්: ''රූපං අනිච්චං'' යි කියනු ලබන්නේ 'වෙදනා අනිච්චා''යි ශබ්දය නිකුත් කෙරෙයි, යම් පදයෙකුදු යම් අනුපදයෙකුදු යම් අන්වක්ෂරයෙකුදු යම් අනුව්‍යඤ්ජනයෙකුදු වේ ද මේ හැම **පදසො** නම් වේ.

ධම්ම නම්: බුද්ධභාෂිත යැ ශ්‍රාවකභාෂිත යැ ඍෂිභාෂිත යැ දේවභාෂිත යැ අර්ථොපසංහිත යැ ධර්මොපසංහිත යි.

වාචෙය්‍යාති පදෙන වාචෙති, පදෙ පදෙ ආපත්ති පාචිත්තියස්ස. අක්ඛරාය වාචෙති, අක්ඛරක්ඛරාය ආපත්ති පාචිත්තියස්ස.

අනුපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී පදසොධම්මං වාචෙති ආපත්ති පාචිත්තියස්ස. අනුපසම්පන්නෙ වෙමතිකො පදසොධම්මං වාචෙති ආපත්ති පාචිත්තියස්ස. අනුපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී පදසොධම්මං වාචෙති ආපත්ති පාචිත්තියස්ස.

උපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස, උපසම්පන්නෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස, උපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** එකතො උද්දිසාපෙන්තො, එකතො සජ්ඣායං කරොන්තො, යෙභුය්‍යෙන පගුණං ගන්ථං භණන්තං ඔපාතෙති, ඔසාරෙන්තං ඔපාතෙති, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

පදසොධම්මසික්ඛාපදං චතුත්ථං.

**වාචෙයා** නම්: පදයෙන් කියවා නම් පෙදෙහි පෙදෙහි පචිති ඇවැත් වෙයි. අක්ෂරයෙන් කියවා නම් අකුරෙහි අකුරෙහි පචිති ඇවැත් වේ.

අනුපසපනක්හු කෙරෙහි අනුපසපනැ යි සත් ඇතියේ පද විසින් ධර්‍මය කියවා නම් පචිති ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි විමති ඇතියේ පද විසින් ධර්‍මය කියවා නම් පචිති ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි උපසපනැ යි සත් ඇතියේ පද විසින් ධර්‍මය කියවා නම් පචිති ඇවැත් වේ.

උපසපනක්හු කෙරෙහි අනුපසපනැ යි සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. උපසපනක්හු කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. උපසපනක්හු කෙරෙහි උපසපනැ යි සත් ඇතියේ නම් ඇවැත් නැති.

එක් වැ උදෙසවා ගනුයේ නම්, එක් වැ හදරනුයේ නම්, බෙහෙවින් පුහුණු ග්‍රන්ථයක් කියන්නහු අනු වැ කියා නම්, උසුරුවන්නහු අනු වැ කියා නම්, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**සිවවැනි පදසොධම්මශික්ෂාපද යි.**

## 6. 1. 5

## සහසෙය්‍යසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා ආළවියං විහරති අග්ගාළවෙ චෙතියෙ. තෙන ඛො පන සමයෙන උපාසකා ආරාමං ආගච්ඡන්ති ධම්මසවණාය.[1] ධම්මෙ භාසිතෙ ථෙරා භික්ඛූ යථාවිහාරං ගච්ඡන්ති. නවකා භික්ඛූ තත්ථෙව උපට්ඨානසාලායං උපාසකෙහි සද්ධිං මුට්ඨස්සතී අසම්පජානා නග්ගා විකූජමානා කාකච්ඡමානා සෙය්‍යං කප්පෙන්ති. උපාසකා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, කථං හි නාම භදන්තා මුට්ඨස්සතී අසම්පජානා නග්ගා විකූජමානා කාකච්ඡමානා සෙය්‍යං කප්පෙස්සන්තීති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං උපාසකානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා - පෙ - තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති කථං හි නාම භික්ඛූ අනුපසම්පන්නෙන සහසෙය්‍යං කප්පෙස්සන්තීති.

2. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං - පෙ - සච්චං කිර භික්ඛවෙ භික්ඛූ අනුපසම්පන්නෙන සහසෙය්‍යං කප්පෙන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා - පෙ - කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා අනුපසම්පන්නෙන සහසෙය්‍යං කප්පෙස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු අනුපසම්පන්නෙන සහසෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තිය"න්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

3. අථ ඛො භගවා ආළවියං යථාභිරන්තං විහරිත්වා යෙන කොසම්බි තෙන චාරිකං පක්කාමි. අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන කොසම්බි තදවසරි. තත්‍ර සුදං භගවා කොසම්බියං විහරති බදරිකාරාමෙ. භික්ඛූ ආයස්මන්තං රාහුලං එතදවොචුං ආවුසො රාහුල සික්ඛාපදං පඤ්ඤත්තං න අනුපසම්පන්නෙන සහසෙය්‍යා කප්පෙතබ්බාති, සෙය්‍යං ආවුසො රාහුල ජානාහීති. අථ ඛො ආයස්මා රාහුලො සෙය්‍යං අලභමානො වච්චකුටියං[2] සෙය්‍යංකප්පෙසි. අථ ඛො භගවා රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය යෙන වච්චකුටි තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා උක්කාසි. ආයස්මාපි රාහුලො උක්කාසි. කො එත්ථාති. අහං භගවා රාහුලොති. කිස්ස ත්වං රාහුල ඉධ නිසින්නොසීති. අථ ඛො ආයස්මා රාහුලො භගවතො එතමත්ථං ආරොචෙසි.

---

1. ධම්මස්සවනාය- මජ්ඣං

2. වච්චකුටියා- මජ්ඣං, සිමු

## 6. 1. 5

## සහසෙයාශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු අළවුපුර අග්ගාළව සෑයෙහි වැඩැ වෙසෙති. එසමයෙහි උවසුවෝ බණ ඇසීමට ආරාමයට පැමිණෙති. බණ දෙසූ කල්හි ස්ථවිර භික්ෂූහු තමන්තමන්ගේ විහාරයට යෙති. නවක භික්ෂූහු එහි මැ උවටන්හල්හි උවසුවන් හා සමග මුළාසිහි ඇති වැ මනා නුවණ නැති වැ නග්න වැ නන් දෙඩමින් නැහැ හඩවමින් ශයනය කෙරෙත්. උවසුවෝ ලමු කොට සිතති. නුගුණ පවසති දෙස් පතුරුවත්: "කෙසේ නම් වහන්දෑ මුළාසිහි ඇති වැ මනා නුවණ නැති වැ නග්න වැ නන් දෙඩමින් නැහැ හඩවමින් ශයනය කොළෝ"දෑ යි. භික්ෂූහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ උවසුවන්ගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු යැ. යම් භික්ෂු කෙනෙක් අපිස් වූවෝ... ඔහු ලමු කොට සිතති. නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් භික්ෂූහු අනුපසපනක්හු සමග එක් වැ ශයනය කොළෝදෑ"යි.

2. එකල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ දන්වූහ... සැබෑ ද මහණෙනි, භික්ෂූහු අනුපසපනක්හු සමග එක් වැ ශයනය කෙරෙද්දෑ යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ... කෙසේ නම් මහණෙනි, ඒ හිස් පුරුෂයෝ අනුපසපනක්හු සමඟ එක් වැ ශයනය කොළෝ ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදයට හෝ නො වෙ යි...මහණෙනි, මෙසේ මේ සිකපදය උදෙසවු:

**"යම් මහණෙක් අනුපසපනක්හු සමඟ එක් වැ ශයනය කරන්නේ නම් පචිති වේ" යැයි.**

මෙසේත් භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට මේ සිකපදය පනවනු ලද්දේ වෙයි.

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ අළවුපුර කැමැති තාක් කල් වැස කොසඹෑ නුවරට චාරිකාවෙහි නික්මුණු සේක. පිළිවෙළින් සැරි සරනුවෝ කොසඹෑ නුවර යම් තැනෙක ද එතනට පැමිණි සේක. භාග්‍ය-වතුන් වහන්සේ ඒ කොසඹෑපුර බෙබර අරමෙහි වසන සේක. භික්ෂූහු ආයුෂ්මත් රාහුලයනට මේ කීහු: 'ඇවැත්නි, රාහුලයෙනි, භාග්‍යවතුන් වහන්සේ විසින් අනුපසපනක්හු සමඟ එක් වැ ශයනය නො කළයුතු යැ යි සිකපද පනවන ලද. ඇවැත්නි, රාහුලයෙනි, හෝනා තැනක් දනුව යි. එකල්හි ආයුෂ්මත් රාහුල හෝනා තැනක් නොලබන්නේ වැසිකිළියෙහි ශයනය කෙළේ ය. එකල්හි භාග්‍යවතුන් වහන්සේ රෑ පසොස්සල්හි නැඟී සිට වැසිකිළියට එළැඹි සේක. එළැඹැ උකැසිසේක. ආයුෂ්මත් රාහුල ද උකැසී ය. මෙහි කවරෙක් දෑ යි? භාග්‍යවතුන් වහන්ස, මම රහල්මි. රාහුල කුමකට තෙපි මෙහි හුන්නවු ද? එකල්හි ආයුෂ්මත් රාහුල භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ දන්වී ය.

4. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. "අනුජානාමි භික්ඛවෙ අනුපසම්පන්නෙන දිරත්තතිරත්තං සහසෙය්‍යං කප්පෙතුං", එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු අනුපසම්පන්නෙන උත්තරිං[1] දිරත්තතිරත්තං සහසෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තිය"න්ති.**

5. **යො පනාති:** යො යාදිසො – පෙ – **භික්ඛූති:** –පෙ– අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති. **අනුපසම්පන්නො නාම:** භික්ඛුං ඨපෙත්වා අවසෙසො අනුපසම්පන්නො නාම. **උත්තරිං දිරත්තතිරත්තන්ති:** අතිරෙකදිරත්තතිරත්තං. **සහාති:** එකතො. **සෙය්‍යා නාම:** සබ්බච්ඡන්නා සබ්බපරිච්ඡන්නා යෙභුය්‍යෙනච්ඡන්නා යෙභුය්‍යෙනපරිච්ඡන්නා. **සෙය්‍යං කප්පෙය්‍යාති** චතුත්ථෙ දිවසෙ අත්ථඞ්ගතෙ සූරියෙ අනුපසම්පන්නෙ නිපන්නෙ භික්ඛු නිපජ්ජති ආපත්ති පාචිත්තියස්ස. භික්ඛු නිපන්නෙ අනුපසම්පන්නො නිපජ්ජති ආපත්ති පාචිත්තියස්ස. උභො වා නිපජ්ජන්ති ආපත්ති පාචිත්තියස්ස. උට්ඨහිත්වා පුනප්පුනං නිපජ්ජන්ති ආපත්ති පාචිත්තියස්ස.

අනුපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී උත්තරිං දිරත්තතිරත්තං සහසෙය්‍යං කප්පෙති ආපත්ති පාචිත්තියස්ස. අනුපසම්පන්නෙ වෙමතිකො උත්තරිං දිරත්තතිරත්තං සහසෙය්‍යං කප්පෙති ආපත්ති පාචිත්තියස්ස. අනුපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී උත්තරිං දිරත්තතිරත්තං සහසෙය්‍යං කප්පෙති ආපත්ති පාචිත්තියස්ස.

උපඩ්ඪච්ඡන්නෙ උපඩ්ඪපරිච්ඡන්නෙ ආපත්ති දුක්කටස්ස. උපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. උපසම්පන්නෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. උපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** ද්වෙ තිස්සො රත්තියො වසති, ඌනකද්වෙතිස්සො රත්තියො වසති, ද්වෙ රත්තියො වසිත්වා තතියාය රත්තියා පුරාරුණා නික්ඛමිත්වා පුන වසති, සබ්බඅච්ඡන්නෙ සබ්බඅපරිච්ඡන්නෙ[2] යෙභුය්‍යෙන අච්ඡන්නෙ යෙභුය්‍යෙන අපරිච්ඡන්නෙ අනුපසම්පන්නෙ නිපන්නෙ භික්ඛු නිසීදති, භික්ඛු නිපන්නෙ අනුපසම්පන්නො නිසීදති උභො වා නිසීදන්ති. උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**පඨමසහසෙය්‍යසික්ඛාපදං පඤ්චමං**

---

1. උත්තරි- මජසං,
3. සබ්බච්ඡන්නෙ සබ්බඅපරිච්ඡන්නෙ, සබ්බපරිච්ඡන්නෙ සබ්බ අච්ඡන්නෙ මජසං

4. එකල්හි භාග්‍යවතුන් වහන්සේ තෙල කරුණෙහි ලා තෙල අවසරයෙහි ලා දැහැමි බණ වදරා මහණුන් ඇමතූසේක. මහණෙනි, අනුපසපනක්හු සමග දෙතුන් රැයක් එක් වැ ශයනය කරන්නට අනුදනිමි. මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවූ.

**යම් මහණෙක් අනුපසපනක්හු සමග දෙතුන් රැයකින් මත්තෙහි එක්වැ ශයනය කරන්නේ නම් පචිති වෙ.**

5. **යොපන:** යම් යම්බඳු ......භික්ඛු ........... මෙතෙම මෙ අරුතෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි. **අනුපසම්පන්න** නම්: භික්ෂුහු තබා අවශේෂ වූයේ අනුපසපන් නම් වේ. **උත්තරිං දිරත්තතිරත්තං** යනු: අයිරා දෙතුන් රැයක්. **සහ** යනු: එක් වැ. **සෙය්‍යා** නම්: හැම පිළිසත් යැ, හැම පසින් පිළිසත් යැ, බෙහෙවින් පිළිසත් යැ, බෙහෙවින් හැම පසින් පිළිසත් යැ. **සෙය්‍යං කප්පෙය්‍ය** යනු: සතර වන දිනයෙහි හිරු අස්තයට ගිය කල්හි අනුපසපනක්හු හොත් කල්හි මහණ නිදා නම් පචිති ඇවැත් වෙයි. මහණහු හොත් කල්හි අනුපසපන නිදා නම් පචිති ඇවැත් වෙයි. දෙදෙනා මැ හෝ හොවිත් නම් පචිති ඇවැත් වෙයි. නැඟිට පුන පුනා හොවිත් නම් පචිති ඇවැත් වෙ.

අනුපසපනක්හු කෙරෙහි අනුපසපනැයි සත් ඇතියේ දෙතුන් රැයකින් මත්තෙහි එක් වැ ශයනය කෙරේ නම් පචිති ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි විමති ඇතියේ දෙතුන් රැයකින් මත්තෙහි එක්වැ ශයනය කෙරේ නම් පචිති ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි උපසපනැයි සත් ඇතියේ දෙතුන් රැයකින් මත්තෙහි එක් වැ ශයනය කෙරේ නම් පචිති ඇවැත් වෙ.

අඩක් පිළිසත් වූයෙහි, අඩක් අවටින් පිළිසත් වූයෙහි, දුකුළා ඇවැත් වෙයි. උපසපනක්හු කෙරෙහි අනුපසපනැයි සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. උපසපනක්හු කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙ. උපසපනක්හු කෙරෙහි උපසපනැයි සත් ඇතියේ නම් ඇවැත් නැති.

දෙතුන් රැයක් වෙසේ නම්, ඌනු දෙතුන් රැයක් වෙසේ නම්, දෙරැයක් වැස තෙවන රැයෙහි අරුණට පෙර නික්ම නැවත වෙසේ නම්, හැම නොසත් වූයෙහි, හැම නො පිළිසත් වූයෙහි, බෙහෙවින් නො සත් වූයෙහි, බෙහෙවින් නොපිළිසත් වූයෙහි නම්, අනුපසපනක්හු හොත් කල්හි භික්ෂුතෙමෙ හිඳී නම්, භික්ෂුහු හොත් කල්හි අනුපසපන් වූයේ හිඳී නම්, දෙදෙනාම හෝ හිඳිත් නම්, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**පස්වැනි පඨමසහසෙය්‍යශික්ෂාපද යි.**

# 6. 1. 6

## දුතියසහසෙය්‍යසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා අනුරුද්ධො කොසලෙසු ජනපදෙසු[1] සාවත්ථිං ගච්ඡන්තො සායං අඤ්ඤතරං ගාමං උපගඤ්ඡි.[2] තෙන ඛො පන සමයෙන තස්මිං ගාමකෙ[3] අඤ්ඤතරිස්සා ඉත්ථියා ආවසථාගාරං පඤ්ඤත්තං හොති. අථ ඛො ආයස්මා අනුරුද්ධො යෙන සා ඉත්ථි තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තං ඉත්ථිං එතදවොච: "සචෙ තෙ භගිනි අගරු වසෙය්‍යාම එකරත්තං ආවසථාගාරෙති". වසෙය්‍යාථ භන්තෙති. අඤ්ඤෙපි අද්ධිකා යෙන සා ඉත්ථි තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා තං ඉත්ථිං එතදවොචුං: "සචෙ තෙ අය්‍යෙ අගරු වසෙය්‍යාම එකරත්තං ආවසථාගාරෙති". එසො ඛො අය්‍යො සමණො පඨමං උපගතො, සචෙ සො අනුජානාති වසෙය්‍යාථාති. අථ ඛො තෙ අද්ධිකා යෙනායස්මා අනුරුද්ධො තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා ආයස්මන්තං අනුරුද්ධං එතදවොචුං: "සචෙ තෙ භන්තෙ අගරු වසෙය්‍යාම එකරත්තං ආවසථාගාරෙ"ති. වසෙය්‍යාථ ආවුසොති.

2. අථ ඛො සා ඉත්ථි ආයස්මන්තෙ අනුරුද්ධෙ සහදස්සනෙන පටිබද්ධචිත්තා අහොසි. අථ ඛො සා ඉත්ථි යෙනායස්මා අනුරුද්ධො තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා ආයස්මන්තං අනුරුද්ධං එතදවොච: "අය්‍යො භන්තෙ ඉමෙහි මනුස්සෙහි ආකිණ්ණො න ඵාසු විහරිස්සති. සාධාහං භන්තෙ අය්‍යස්ස මඤ්චකං අබ්භන්තරං පඤ්ඤපෙය්‍යන්ති.[4] අධිවාසෙසි ඛො ආයස්මා අනුරුද්ධො තුණ්හීභාවෙන. අථ ඛො සා ඉත්ථි ආයස්මතො අනුරුද්ධස්ස මඤ්චකං අබ්භන්තරං පඤ්ඤපෙත්වා[5] අලඞ්කතපටියත්තා ගන්ධගන්ධිනී යෙනායස්මා අනුරුද්ධො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා ආයස්මන්තං අනුරුද්ධං එතදවොච: "අය්‍යො භන්තෙ අභිරූපො දස්සනීයො පාසාදිකො අහඤ්චම්හි අභිරූපා දස්සනීයා පාසාදිකා, සාධාහං භන්තෙ අය්‍යස්ස පජාපති භවෙය්‍ය"න්ති. එවං වුත්තෙ ආයස්මා අනුරුද්ධො තුණ්හී අහොසි. දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො සා ඉත්ථි ආයස්මන්තං අනුරුද්ධං එතදවොච: "අය්‍යො භන්තෙ අභිරූපො දස්සනීයො පාසාදිකො, අහඤ්චම්හි අභිරූපා දස්සනීයා පාසාදිකා, සාධු භන්තෙ අය්‍යො මඤ්චෙව පටිච්ඡතු, සබ්බඤ්ච සාපතෙය්‍ය"න්ති. තතියම්පි ඛො ආයස්මා අනුරුද්ධො තුණ්හී අහොසි.

---

1. ජනපදෙ, මජසං,
2. උපගච්ඡි මජසං,
3. ගාමෙ, මජසං,
4. පඤ්ඤපෙය්‍යන්ති, මජසං
5. පඤ්ඤපෙත්වා, මජසං
6. සම්පටිච්ඡතු, සතා,

## 6. 1. 6

## දුතියසහසෙය්‍යාශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවත්හි ජේතවන නම් අනේ පිඬු සිටුහුගේ අරම්හි වැඩ වෙසෙති. එසමයෙහි ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ කොසොල් දනව්හි සිට සැවැතට යන්නාහු සවසැ එක්තරා ගමකට එළැඹියහ. එසමයෙහි ඒ ගම්හි එක්තරා ස්ත්‍රියක විසින් විසුම්-හලෙක් පිහිටුවන ලද්දේ වෙයි. එකල්හි ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ ඒ ස්ත්‍රිය වෙතැ එළැඹැ ඇයට මෙය කීහ: 'ඉදින් බුහුන, තොපට බරෙක් නො වේ නම් එක් රැයක් විසුම්හල්හි වසන්නම්හ'යි. වසනු මැනැවැ වහන්ස. අන්‍ය වූ ද මගියෝ ඇය වෙතැ එළැඹියහ. එළැඹැ ඒ ස්ත්‍රියට මෙය කීහු. 'ඉදින් ආය්‍යාවෙනි, තොපට බරෙක් නො වේ නම් එක් රැයක් විසුම්හල්හි වසන්නම් හ'යි. තෙල ආය්‍ය වූ ශ්‍රමණයෝ පළමු කොට එළැඹියහ. 'ඉදින් ඔබ අනුදනිත් නම් වසන්නහු යැයි කිවු යැ. එකල්හි ඒ මගියෝ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් වෙතැ එළැඹියහ. එළැඹැ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්හට මෙය කීහු. 'ඉදින් වහන්ස, තොපට බරෙක් නො වේ නම් එක් රැයක් විසුම්හල්හි වසන්නම්හ'යි. ඇවැත්නි, වසන්නහු යැ.

2. එකල්හි ඒ ස්ත්‍රී තොමෝ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් කෙරෙහි දක්නා හා මැ පිළිබඳ සිත් ඇත්තී වූ යැ. එකල්හි ඒ ස්ත්‍රී ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් වෙත එළැඹියා ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන්හට මෙය කිවු යැ. ස්වාමීනි, ආය්‍යයෝ මේ මිනිසුන් හා ගැවසුණහු පහසු සේ නො වසන්නාහ. මැනැවැ ස්වාමීනි, මම ආය්‍යයනට ඇතුළුගබැ හැඳක් පනවම් දැයි. ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ තුෂ්ණීම්භාවයෙන් ඉවසූහ. එකල්හි ඒ ස්ත්‍රී ආයුෂ්මත් අනුරුද්ධ තෙරුනට ඇතුළුගබැ හැඳක් පනවා අබරණ ලා සැරසුණී සුවඳින් සුවඳවත් වූවා ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් වෙත එළැඹියා යැ. එළැඹැ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් හට ''ස්වාමීනි, ආය්‍යයෝ අභිරූපයහ, දර්ශනීයයහ, ප්‍රාසාදිකයහ, මම ද අභිරූප වෙමි දර්ශනීය වෙමි ප්‍රාසාදිකා වෙමි, ස්වාමීනි, මම ආය්‍ය-යනට ප්‍රජාපතිවූම් නම් මැනැවැ''යි කිවු යැ. මෙසේ කී කල්හි ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ නිහඬ වූහ. දෙවන වට ද...තෙවනවට ද ඒ ස්ත්‍රී ආයුෂ්මත් අනුරුද්ධ තෙරුනට ''ස්වාමීනි, ආය්‍යයෝ අභිරූපයහ, දර්ශනීයයහ, ප්‍රාසාදිකයහ, මම ද අභිරූප වෙමි දර්ශනීය වෙමි ප්‍රාසාදික වෙමි, ස්වාමීනි, ආය්‍යයෝ මා ද මුළු සම්පත්තිය ද පිළිගනිත්ව''යි කිවු යැ. තෙවන වට ද ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ නිහඬ වූහ.

3. අථ ඛො සා ඉත්ථී සාටකං නික්ඛිපිත්වා ආයස්මතො අනුරුද්ධස්ස පුරතො චඞ්කමතිපි තිට්ඨතිපි නිසීදතිපි සෙය්‍යම්පි කප්පෙති. අථ ඛො ආයස්මා අනුරුද්ධො ඉන්ද්‍රියානි ඔක්ඛිපිත්වා තං ඉත්ථිං නෙව ඔලොකෙසි නපි ආලපි. අථ ඛො සා ඉත්ථී “අච්ඡරියං වත භො, අබ්භුතං වත භො, බහූ මෙ මනුස්සා සතෙනපි සහස්සෙනපි පහිණන්ති. අයං පන සමණො මයා සාමං යාචියමානො න ඉච්ඡති මමඤ්චෙව පටිච්ඡිතුං සබ්බඤ්ච සාපතෙය්‍ය”න්ති, සාටකං නිවාසෙත්වා ආයස්මතො අනුරුද්ධස්ස පාදෙසු සිරසා නිපතිත්වා ආයස්මන්තං අනුරුද්ධං එතදවොච : “අච්චයො මං භන්තෙ අච්චගමා යථාබාලං යථාමූළ්හං යථාඅකුසලං යාහං එවමකාසිං, තස්සා මෙ භන්තෙ අය්‍යො අච්චයං අච්චයතො පතිගණ්හාතු[1] ආයතිං සංවරායා”ති. තග්ඝ තං[2] භගිනි අච්චයො අච්චගමා යථාබාලං යථාමූළ්හං යථාඅකුසලං යා ත්වං එවමකාසි, යතො ච ඛො ත්වං භගිනි අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොසි, තං තෙ මයං පතිගණ්හාම. වුද්ධි හෙසා භගිනි අරියස්ස විනයෙ යො අච්චයං අච්චයතො දිස්වා යථාධම්මං පටිකරොති ආයතිං[3] සංවරං ආපජ්ජතීති.

4. අථ ඛො සා ඉත්ථී තස්සා රත්තියා අච්චයෙන ආයස්මන්තං අනුරුද්ධං පණීතෙන ඛාදනීයෙන භොජනීයෙන සහත්ථා සන්තප්පෙත්වා සම්පවාරෙත්වා ආයස්මන්තං අනුරුද්ධං භුත්තාවිං ඔනීතපත්තපාණිං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො තං ඉත්ථිං ආයස්මා අනුරුද්ධො ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. අථ ඛො සා ඉත්ථී ආයස්මතා අනුරුද්ධෙන ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා ආයස්මන්තං අනුරුද්ධං එතදවොච. අභික්කන්තං භන්තෙ අභික්කන්තං භන්තෙ සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති එවමෙවං අය්‍යෙන අනුරුද්ධෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ තං භගවන්තං[4] සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසංඝඤ්ච. උපාසිකං මං අය්‍යො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

5. අථ ඛො ආයස්මා අනුරුද්ධො සාවත්ථිං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති “කථං හි නාම ආයස්මා අනුරුද්ධො මාතුගාමෙන සහසෙය්‍යං කප්පෙස්සතී”ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

1. පටිග්ගණ්හාතු,- මජසං, 2. ත්වං -මජසං, සිමු.
3. ආයතිඤ්ච - මජසං, සිමු. 4. එසාහං භන්තෙ භගවන්තං-සිමු.

3. එකල්හි ඒ ස්ත්‍රී සළුව බහා තබා ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් පෙරටුයෙහි සක්මන් කරයි. සිටීයි, හිඳියි, ශයනය ද කරයි. එකල්හි ආයුෂ්මත් අනුරුද්ධ තෙරණුවෝ ඉඳුරන් පහතට හෙළා ඒ මාගම නො මැ බැලූහ. නො ද බිණූහ. එකල්හි ඒ ස්ත්‍රී "භවත්නි, ඒකාන්තයෙන් ආශ්චය෴යෙකැ, භවත්නි, ඒකාන්තයෙන් අද්භූතයෙකැ, බොහෝ වූ මේ මිනිස්සු මට සියයෙනුදු දහසිනුදු පඬුරු එවත්: මේ ශ්‍රමණයෝ කලි මා විසින් තමා මැ යදිනු ලබන්නාහු මා ද මුළු සම්පත්තියද පිළිගන්නට නො කැමැති වෙති"යි සළුව හැඳ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් පා මුල්හි හිසින් වැටී ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් හට මෙය කිවු යැ. "ස්වාමීනි. යම්බඳු මම් මෙසේ කළම් ද බාලබවට අනුරූප වැ මූඪබවට අනුරූප වැ අදක්ෂබවට අනුරූප වැ වරද ඒ මා ඉක්ම ගියේ වන. ස්වාමීනි, ඒ මාගේ වරද වරද විසින් මතු සංවරය පිණිස ආය෴යෝ පිළිගනිත්ව'යි. බුහුන, යම්බඳු තෙපි මෙසේ කළවුද, එකැතින් බාලබවට අනුරූප වැ මූඪබවට අනුරූප වැ අදක්ෂබවට අනුරූප වැ වරද ඒ තොප ඉක්ම ගියේ වන. යම් හෙයකින් බුහුන, තෙපි වරද වරද විසින් දක ධර්ම වූ පරිද්දෙන් පිළියම් කරවු ද, තොප ගේ ඒ වරද ඇපි පිළිගනුම්හ. බුහුන, යමෙක් වරද වරද විසින් දක ධම් වූ පරිද්දෙන් පිළියම් කෙරේ ද, මතු සංවරයට පැමිණේ ද, මේ වනාහි ශාසනයෙහි වැඩීමෙක් මැ යි.

4. එකල්හි ඒ ස්ත්‍රී තොමෝ එරය ඉක්මීමෙන් පසු ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් ප්‍රණීත වූ කැයුතු දෙයින් බිදිය යුතු දෙයින් සියතින් සතප්වා මොනවට පවරා වළඳා නිමවූ පාත්‍රයෙන් බැහැර කළ අත් ඇති ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් සකසා වැඳ එකත්පස් වැ හින. ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයෝ එකත්පස් වැ හුන් ඒ මාගමට දැහැමි බණින් මොනවට කරුණු දක්වූහ. මොනවට කරුණු ගැන්වූහ. මොනවට තෙද ගැන්වූහ. මොනවට සතුටු කැරැවූහ. එකල්හි ඒ ස්ත්‍රී තොමෝ ආයුෂ්මත් අනුරුද්ධ තෙරුන් විසින් දැහැමි බණින් මොනවට කරුණු දක්වන ලද්දී මොනවට කරුණු ගන්වන ලද්දී මොනවට තෙද ගන්වන ලද්දී මොනවට සතුටු කරවන ලද්දී ආයුෂ්මත් අනුරුද්ධ තෙරුනට මෙය කිවු යැ, "ඉතා මැනැවැ ස්වාමීනි, ඉතා මැනැවැ ස්වාමීනි. යම්සේ යටිහුරු කරන ලද්දක් උඩුහුරු කරන්නේ හෝ වේද, පිළිසන්වූවක් විවෘත කරන්නේ හෝ වේ ද, මං මුළා වූවකුට මඟ කියාපාන්නේ හෝ වේ ද, ඇස් ඇතියෝ රූප දකිත්ව යි අඳුරෙහි තෙල්පහනක් දරන්නේ හෝ වේ ද, එසේ මැ ආය෴ අනුරුද්ධයන් විසින් නොයෙක් කරුණෙන් ධර්මය ප්‍රකාශ කරන ලද්දේ වෙයි. ස්වාමීනි, මම බුදුන් ද දහම් ද බික්සඟන ද සරණ කොට යමි. ආය෴ තෙමේ අද පටන් දිවිහිම් කොට සරණ ගිය උවැසියක කොට මා දරාව"යි කිවු යැ.

5. ඉක්බිති ආයුෂ්මත් අනුරුද්ධ තෙරනුවෝ සැවැතට ගොස් මෙ කරුණ භික්ෂූන්හට දැන්වූහ. යම් ඒ භික්ෂූ කෙනෙක් අපිස් වූවෝ ...ඔහු ලමු කොට සිතති. නුගුණ පවසති, දෙස් පැතුරුවත්. "කෙසේ නම් ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයෝ මාගමක හා සමඟ ශයනය කළෝ ද"යි. එකල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන්හට තෙල කරුණ දැන්වූහු...

–පෙ– සච්චං කිර ත්වං අනුරුද්ධ මාතුගාමෙන සහසෙය්‍යං කප්පෙසීති, සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. –පෙ– කථං හි නාම ත්වං අනුරුද්ධ මාතුගාමෙන සහසෙය්‍යං කප්පෙස්සසි. නෙතං අනුරුද්ධ අප්පසන්නානං වා පසාදය –පෙ– එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු මාතුගාමෙන සහසෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තිය"න්ති.**

6. **යො පනාති:** යො යාදිසො – පෙ – **භික්ඛූති:** – පෙ – අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති. **මාතුගාමො** නාම: මනුස්සිත්ථී, න යක්ඛී[1] න පෙතී, න තිරච්ඡානගතා, අන්තමසො තදහුජාතාපි දාරිකා පගෙව මහත්තරී. **සහාති:** එකතො, **සෙය්‍යා** නාම: සබ්බච්ඡන්නා සබ්බපරිච්ඡන්නා යෙභුය්‍යෙනච්ඡන්නා යෙභුය්‍යෙන පරිච්ඡන්නා.

**සෙය්‍යං කප්පෙය්‍යාති:** අත්ථංගතෙ සූරියෙ මාතුගාමෙ නිපන්නෙ භික්ඛු නිපජ්ජති ආපත්ති පාචිත්තියස්ස. භික්ඛු නිපන්නෙ මාතුගාමො නිපජ්ජති ආපත්ති පාචිත්තියස්ස. උභො වා නිපජ්ජන්ති ආපත්ති පාචිත්තියස්ස. උට්ඨහිත්වා පුනප්පුනං නිපජ්ජන්ති ආපත්ති පාචිත්තියස්ස.

මාතුගාමෙ මාතුගාමසඤ්ඤී සහසෙය්‍යං කප්පෙති ආපත්ති පාචිත්තියස්ස. මාතුගාමෙ වෙමතිකො සහසෙය්‍යං කප්පෙති ආපත්ති පාචිත්තියස්ස. මාතුගාමෙ අමාතුගාමසඤ්ඤී සහසෙය්‍යං කප්පෙති ආපත්ති පාචිත්තියස්ස.

උපඩ්ඪච්ඡන්නෙ උපඩ්ඪපරිච්ඡන්නෙ ආපත්ති දුක්කටස්ස. යක්ඛියා වා පෙතියා වා පණ්ඩකෙන වා තිරච්ඡානගතිත්ථියා වා සහසෙය්‍යං කප්පෙති ආපත්ති දුක්කටස්ස. අමාතුගාමෙ මාතුගාමසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අමාතුගාමෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අමාතුගාමෙ අමාතුගාමසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** සබ්බඅච්ඡන්නෙ සබ්බඅපරිච්ඡන්නෙ, යෙභුය්‍යෙන අච්ඡන්නෙ යෙභුය්‍යෙන අපරිච්ඡන්නෙ, මාතුගාමෙ නිපන්නෙ භික්ඛු නිසීදති, භික්ඛු නිපන්නෙ මාතුගාමො නිසීදති. උභො වා නිසීදන්ති, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**දුතියසහසෙය්‍යසික්ඛාපදං ඡට්ඨං**

1. යක්ඛිනී– මජසං

සැබෑ ද අනුරුද්ධයෙනි, තෙපි මාගමක හා සමඟ ශයනය කළවු ද? සැබෑවෑ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ... "කෙසේ නම් අනුරුද්ධයෙනි, තෙපි මාගමක හා සමග ශයනය කළවු ද? අනුරුද්ධයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මෙසේ ද වනාහි මහණෙනි, මේ සිකපදය උදෙසවු.

**යම් මහණෙක් මාගමක හා සමග සයනය කරන්නේ නම් පචිති වේ යයි.**

6. **යොපන:** යම් යම්බදු ... භික්ෂු ... මෙතෙම මේ අරුතෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**මාතුගාම නම්:** මිනිස් ඉතිරියකැ, යකින්නක් නොවෙයි. ප්‍රේතියක් නො වෙයි, තිරිසන්ගිය මාගමක් නොවෙයි. යටත් පිරිසෙයින් එදවස උපන්නා වූ ද දැරිය කැ. මහත් වූවක කියනුම කවරේද. **සහ:** එක් වැ **සෙය්‍යා** නම්: හැම පිරියත් හැමපසින් පිරිසත් බෙහෙවින් පිරිසත් බෙහෙවින් හැම පසින් පිරිසත් වූ ශයනය යි.

**සෙය්‍යං කප්පෙය්‍ය:** හිරු අවරට යත් මාගම හොත් කල්හි මහණ තෙමේ නිද නම් පචිති ඇවැත් වෙයි. මහණහු හොත් කල්හි මාගම නිද නම් පචිති ඇවැත් වෙයි. දෙදෙනාම හෝ හොවිත් නම් පචිති ඇවැත් වෙයි. නැඟිට පුන පුනා හොවිත් නම් පචිති ඇවැත් වේ.

මාගම කෙරෙහි මාගමකැයි සත් ඇතියේ සමහ ශයනය කෙරේ නම් පචිති ඇවැත් වෙයි. මාගම කෙරෙහි විමති ඇතියේ සමහ ශයනය කෙරේ නම් පචිති ඇවැත් වෙයි. මාගම කෙරෙහි නොමාගම්සත් ඇතියේ සමහ ශයනය කෙරේ නම් පචිති ඇවැත් වේ.

අඩක් පිරිසත් වූ අඩක් අවටින් පිරිසත් වූ ශයනයෙහි දුකුළා ඇවැත් වෙයි. යකින්නක හෝ ප්‍රේතියක හෝ පණ්ඩකයකු හෝ තිරිසන්ගිය මාගමක හෝ සමග ශයනය කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. නො මාගම කෙරෙහි මාගම්සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො මාගම කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. නොමාගම කෙරෙහි නො මාගම්සත් ඇතියේ නම් ඇවැත් නැති.

හැම නොපිරිසත් වූයෙහි, හැමපසින් නො පිරිසත් වූයෙහි, බෙහෙවින් නොපිරිසත් වූයෙහි, බෙහෙවින් හැමපසින් නොපිරිසත් වූයෙහි, මාගම හොත් කල්හි මහණ තෙමේ හිදී නම්, මහණ හොත් කල්හි මාගම හිදී නම්, දෙදෙනාම හෝ හිදිත් නම්, උම්මත්තකය හට, ආදිකම්මිකය හට ඇවැත් නැති.

**සවැනි දුතියසහසෙය්‍යාශික්‍ෂාපද යි**

## 6.1.7

## ධම්මදෙසනාසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා උදායී සාවත්ථියං කුලූපගො හොති. බහුකානි කුලානි උපසඞ්කමති. අථ ඛො ආයස්මා උදායී පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය යෙනඤ්ඤතරං කුලං තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන ඝරණී නිවෙසනද්වාරෙ නිසින්නා හොති. ඝරසුණ්හා ආවසථද්වාරෙ නිසින්නා හොති. අථ ඛො ආයස්මා උදායී යෙන ඝරණී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ඝරණියා උපකණ්ණකෙ ධම්මං දෙසෙති.[1] අථ ඛො ඝරසුණ්හාය එතදහොසි කින්නු ඛො සො සමණො සස්සුයා ජාරො උදාහු ඔභාසතීති.

2. අථ ඛො ආයස්මා උදායී ඝරණියා උපකණ්ණකෙ ධම්මං දෙසෙත්වා යෙන ඝරසුණ්හා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ඝරසුණ්හාය උපකණ්ණකෙ ධම්මං දෙසෙති. අථ ඛො ඝරණියා එතදහොසි. කින්නු ඛො සො සමණො ඝරසුණ්හාය ජාරො උදාහු ඔභාසතීති.

3. අථ ඛො ආයස්මා උදායී ඝරසුණ්හාය උපකණ්ණකෙ ධම්මං දෙසෙත්වා පක්කාමි. අථ ඛො ඝරණී ඝරසුණ්හං එතදවොච: "හෙ ජෙ, කිං තෙ සො[2] සමණො අවොචා"ති. ධම්මං මෙ අය්‍යෙ දෙසෙසි. අය්‍යාය පන කිං අවොචාති. මය්හම්පි ධම්මං දෙසෙසීති. තා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති; කථං හි නාම අය්‍යො උදායී උපකණ්ණකෙ ධම්මං දෙසෙස්සති, නනු නාම විස්සට්ඨෙන විවටෙන[3] ධම්මො දෙසෙතබ්බොති.

4. අස්සොසුං ඛො භික්ඛූ තාසං ඉත්ථීනං උජ්ඣායන්තීනං ඛීයන්තීනං විපාචෙන්තීනං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා –පෙ– තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: කථං හි නාම ආයස්මා උදායී මාතුගාමස්ස ධම්මං දෙසෙස්සතීති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං –පෙ–

සච්චං කිර ත්වං උදායි මාතුගාමස්ස ධම්මං දෙසෙසීති. සච්චං භගවා.

---

1. දෙසෙසි – මජසං
2. එසො – මජසං
3. විවටෙන අසංවුණෙන – සිමු

## 6.1.7

## ධම්මදේසනාශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්හි ජේතවන නම් අනේපිඩු සිටුහුගේ අරමහි වැඩවෙසෙති. එසමයෙහි ආයුෂ්මත් උදයි තෙරණුවෝ සැවැතෙහි කුලයන් කරා එළැඹෙනු වෙති. බොහෝ කුලවලට එළැඹෙති. එකල්හි ආයුෂ්මත් උදයි තෙරණුවෝ පෙරවරුයෙහි හැඳ පෙරවැ පා සිවුරු ගෙන එක්තරා කුලයකට එළැඹියහ. එසමයෙහි ගෙඅඹුව ගෙහි මහදෙර හුන්නී වෙයි. ගෙහි ලෙහෙළිය ගබඩා දෙර හුන්නී වෙයි. එකල්හි ආයුෂ්මත් උදයි තෙරණුවෝ ගෙඅඹුව වෙත එළැඹියහ. එළැඹැ ගෙඅඹුවගේ කන්මුලැ දහම් දෙසති. එකල්හි ගෙහි ලෙහෙළියට මෙසිත විය. කිමෙක් ද තෙල මහණ නැඳියගේ සොරසැමියෙක් ද නැතහොත් නොමනා බසක් බෙණේ දැ යි.

2. ඉක්බිති ආයුෂ්මත් උදයි තෙරණුවෝ ගෙඅඹුවගේ කන්මුලැ දහම් දෙසා ගෙහි ලෙහෙළිය වෙත එළැඹියහ. එළැඹ ගෙහි ලෙහෙළියගේ කන්මුලැ දම් දෙසති. එකල්හි ගෙඅඹුවට මෙසිත විය. කිමෙක් ද තෙල මහණ ගෙහි ලෙහෙළියගේ සොරසැමියෙක් ද නැතහොත් නො මනා බසක් බෙණේ දැ යි.

3. එකල්හි ආයුෂ්මත් උදයි තෙරණුවෝ ගෙහි ලෙහෙළියගේ කන්මුලැ දම් දෙසා නික්මගියහ. එකල්හි ගෙඅඹුව ගෙහි ලෙහෙළියට මෙය කිවු යැ. එම්බල කෙල්ල, තෙල මහණ තිට කුමක් කීයේ දැ යි. ආයසීාවෙනි, මට දහම් දෙසී ය. ආයසීාවට වැළිත් කුමක් කීයේ ද? මට ද දහම් දෙසී ය. එව්හු ලමු කොට සිතති, නුගුණ පවසති දෙස් පතුරුවත්: ''කෙසේ නම් ආයසී උදයි තෙරණුවෝ කන්මුලැ දහම් දෙසූ දැයි මොනවට නික්මුණු හඬින් විවෘත හඬින් යුතු වැ දහම් දෙසියයුතු නො වේ දැ'' යි.

4. භික්ෂූහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ ස්ත්‍රීන්ගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු. යම් භික්ෂූ කෙනෙක් අපිස් වූවාහු ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ආයුෂ්මත් උදයි මාගමකට දහම් දෙසා''දැ යි. එකල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැලකළහ:...

සැබෑ ද උදයි, තෝ මාගමකට දහම් දෙසහි දැ යි?

සැබැවැ භාග්‍යවතුන් වහන්ස,

විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම ත්වං මොඝපුරිස මාතුගාමස්ස ධම්මං දෙසෙස්සසි, නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**යො පන භික්ඛු මාතුගාමස්ස ධම්මං දෙසෙය්‍ය පාචිත්තියන්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

5. තෙන ඛො පන සමයෙන උපාසිකා භික්ඛූ පස්සිත්වා එතදවොචුං: "ඉඞ්ඝය්‍යා[1] ධම්මං දෙසෙථා"ති. න භගිනි කප්පති මාතුගාමස්ස ධම්මං දෙසෙතුන්ති. ඉඞ්ඝය්‍යා ඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙථ, සක්කා එත්තකෙනපි අඤ්ඤාතුන්ති.[2] න භගිනි කප්පති මාතුගාමස්ස ධම්මං දෙසෙතුන්ති කුක්කුච්චායන්තා න දෙසෙසුං. උපාසිකායො[3] උජ්ඣායන්ති ඛිය්‍යන්ති විපාචෙන්ති "කථං හි නාම අය්‍යා අම්හෙහි යාචියමානා ධම්මං න දෙසෙස්සන්තී"ති. අස්සොසුං ඛො භික්ඛූ තාසං උපාසිකානං උජ්ඣායන්තීනං ඛිය්‍යන්තීනං විපාචෙන්තීනං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. "අනුජානාමි භික්ඛවෙ මාතුගාමස්ස ඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙතුං". එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**යො පන භික්ඛු මාතුගාමස්ස උත්තරිං ඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙය්‍ය පාචිත්තියන්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

6. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ භගවතා අනුඤ්ඤාතං මාතුගාමස්ස ඡප්පඤ්චවාචාහි[4] ධම්මං දෙසෙතුන්ති, තෙ අවිඤ්ඤූං පුරිසවිග්ගහං උපනිසීදපෙත්වා මාතුගාමස්ස උත්තරිං ඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛිය්‍යන්ති විපාචෙන්ති කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ අවිඤ්ඤූං පුරිසවිග්ගහං උපනිසීදපෙත්වා මාතුගාමස්ස උත්තරිං ඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙස්සන්තීති.

1. ඉඞ්ඝාය්‍යා- මජ්ඣං
2. සක්කා එත්තකෙනපි ධම්මො අඤ්ඤාතුන්ති- මජ්ඣං
3. උපාසිකා- මජ්ඣං
4. මාතුගාමස්ස උත්තරිං ඡප්පඤ්චවාචාහි- සීමු i සීමු ii

භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් හිස් පුරුෂය, තෝ මාගමකට දහම් දෙසහි ද? හිස් පුරුෂය, තෙල කරුණ අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙ යි... තවද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**''යම් මහණෙක් මාගමකට දහම් දෙසන්නේ නම් පචිති ඇවැත් වෙ'' යි.**

මෙසේ භාග්‍යවතුන් විසින් භික්ෂූන්හට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

5. එසමයෙහි උවැසියෝ භික්ෂූන් දැක වහන්ස, දහම් දෙසන්නාහු නම් මැනැවැයි කීහු. නැහණියනි, මාගමට දහම් දෙසන්නට නො වටී. එසේ නම් වහන්ස, සපෙදෙකින් පස්පෙදෙකින් දහම් දෙසන්නාහු නම් එතෙකිනුදු අවබෝධ කරන්නට හැක්ක, නැහණියනි, මාගමට දහම් දෙසන්නට නො කැප යැ යි කුකුස් කරනුවෝ (දහම්) නො දෙසූහු. උවැසියෝ ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ආර්‍යයන් වහන්සේ අප විසින් යදිනු ලබන්නාහු දහම් නො දෙසත් ද''යි. භික්ෂූහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ උවැසියන්ගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු. එකල්හි ඒ භික්ෂූහු තෙල කරුණ භාග්‍යවතුන්හට දැන්වූහු. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ තෙල කරුණෙහි ලා මෙඅවසරයෙහි ලා දැහැමි බණ වදරා මහණුන් ඇමැතූසේක: ''මහණෙනි, මාගමට සපෙදෙකින් පස් පෙදෙකින් දහම් දෙසන්නට අනුදනිමි. තවද මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**''යම් මහණෙක් මාගමකට සපෙදෙකින් පස්පෙදෙකින් මත්තෙහි දෙසන්නේ නම් පචිති වෙ'' යයි.**

මෙසෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්හට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

6. එසමයෙහි ඡවග මහණහු මාගමට සපෙදෙකින් පස් පෙදෙකින් ධම් දෙසන්නට භාග්‍යවතුන් වහන්සේ විසින් අනුදන්නා ලද යි දනුම් නැති පිරිමිනියක්හු වෙතැ හිඳුවාගෙනැ මාගමට සපෙදෙකින් පස් පෙදෙකින් මත්තෙහි ධම් දෙසත්. යම් භික්ෂූ කෙනෙක් අපිස් වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ඡවග මහණහු දනුම් නැති පිරිමිනියක්හු වෙතැ හිඳුවාගෙනැ මාගමට සපෙදෙකින් පස් පෙදෙකින් මත්තෙහි ධම් දෙසූහු ද''යි.

7. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ අවිඤ්ඤුං පුරිසවිග්ගහං උපනිසීදපෙත්වා මාතුගාමස්ස උත්තරිං ඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙථාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා අවිඤ්ඤුං පුරිසවිග්ගහං උපනිසීදපෙත්වා මාතුගාමස්ස උත්තරිං ඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

**"යො පන භික්ඛු මාතුගාමස්ස උත්තරිං ඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙය්‍ය අඤ්ඤත්‍ර විඤ්ඤුනා පුරිසවිග්ගහෙන පාචිත්තිය"න්ති.**

8. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති. **මාතුගාමො** නාම: මනුස්සිත්ථී න යක්ඛී න පෙතී න තිරච්ඡානගතා විඤ්ඤූ පටිබලා හොති සුභාසිතදුබ්භාසිතං දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආජානිතුං. **උත්තරිං ඡප්පඤ්චවාචාහීති:** අතිරෙකඡප්පඤ්චවාචාහි. **ධම්මො** නාම: බුද්ධභාසිතො සාවකභාසිතො ඉසිභාසිතො දෙවභාසිතො අත්ථූපසංහිතො ධම්මූපසංහිතො. **දෙසෙය්‍යාති:** පදෙන දෙසෙති පදෙ පදෙ ආපත්ති පාචිත්තියස්ස. අක්ඛරාය දෙසෙති අක්ඛරක්ඛරාය ආපත්ති පාචිත්තියස්ස. **අඤ්ඤත්‍ර විඤ්ඤුනා පුරිසවිග්ගහෙනාති:** ඨපෙත්වා විඤ්ඤුං පුරිසවිග්ගහං. **විඤ්ඤූ** නාම: පුරිසවිග්ගහො පටිබලො හොති සුභාසිතදුබ්භාසිතං දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආජානිතුං.

මාතුගාමෙ මාතුගාමසඤ්ඤී උත්තරිං ඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙති අඤ්ඤත්‍ර විඤ්ඤුනා පුරිසවිග්ගහෙන ආපත්ති පාචිත්තියස්ස. මාතුගාමෙ වෙමතිකො උත්තරිං ඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙති අඤ්ඤත්‍ර විඤ්ඤුනා පුරිසවිග්ගහෙන ආපත්ති පාචිත්තියස්ස. මාතුගාමෙ අමාතුගාමසඤ්ඤී උත්තරිං ඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙති අඤ්ඤත්‍ර විඤ්ඤුනා පුරිසවිග්ගහෙන ආපත්ති පාචිත්තියස්ස.

7. ඉක්බිති ඒ භික්ෂූහු තෙල කරුණ භාග්‍යවතුන් වහන්සේට සැලකළහ ... සැබෑ ද මහණෙනි, තෙපි දනුම් නැති පිරිමියකු හු වෙතැ හිඳුවාගෙනැ මාගමට සපෙදෙකින් පස්පෙදෙකින් මත්තෙහි ධම් දෙසවු ද යි. සැබෑව භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූසේක... කෙසේ නම් සිස් පුරුෂයෙනි, තෙපි දනුම් නැති පිරිමියකු හු වෙතැ හිඳුවාගෙනැ මාගමට සපෙදෙකින් පස්පෙදෙකින් මත්තෙහි ධම් දෙසුවහු ද? මොසපුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මෙසේ ද වනාහි මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**"යම් මහණෙක් මාගමට සපෙදෙකින් පස්පෙදෙකින් මත්තෙහි දනුමැති පිරිමියක්හු නැති වැ දම් දෙසන්නේ නම් පචිති වේ" යයි.**

8. **යොපන**—යම්, යම්බඳු ... **භික්ඛු**... මෙතෙම මෙ අරුතෙහි ලා අදහස් කළ භික්ෂු යි. **මාතුගාම** නම් මිනිස් ඉතිරි යැ. යකිනි නො වෙයි, ප්‍රේතිය නො වෙයි, තිරිසන්ගිය මාගම නො වේ. සුබැසි දුබැසි දුළුල් නොදුළුල් තෙපුල් දන්නට සමත් නුවණැති මාගම යි. **උත්තරිං ඡප්පඤ්චවාචාහි:** අයිරා සපෙදෙකින් පස්පෙදෙකින්. **ධම්ම** නම් බුද්ධභාෂිත යැ ශ්‍රාවකභාෂිත යැ ඍෂිභාෂිත යැ දේවභාෂිත යැ අර්ථොපසංහිත යැ ධර්මොපසංහිත යි. **දෙසෙය්‍ය:** පදයෙන් දෙසා නම් පෙදෙහි පෙදෙහි පචිති ඇවැත් වෙයි. අක්ෂරයෙන් දෙසා නම් අකුරෙහි අකුරෙහි පචිති ඇවැත් වේ. **අඤ්ඤත්‍ර විඤ්ඤුනා පුරිසවිග්ගහෙන:** දනුමැති මිනිස් පිරිමියක්හු හැරැපියා. සුබැසි දුබැසි දුළුල් නොදුළුල් තෙපුල් දැනගන්නට ප්‍රතිබලයා දනුමැති පිරිමි නම් වේ.

මාගම කෙරෙහි මාගම් සන් ඇතියේ දනුමැති මිනිස් පිරිමියක්හු නැති වැ සපෙදෙකින් පස්පෙදෙකින් වැඩියක් ධම් දෙසා නම් පචිති ඇවැත් වෙයි. මාගම කෙරෙහි විමති ඇතියේ දනුමැති මිනිස් පිරිමියක්හු නැති වැ සපෙදෙකින් පස්පෙදෙකින් වැඩියක් ධම් දෙසා නම් පචිති ඇවැත් වෙයි. මාගම කෙරෙහි නොමාගම් සන් ඇතියේ දනුමැති මිනිස් පිරිමියක් හු නැති වැ සපෙදෙකින් පස්පෙදෙකින් මත්තෙහි ධම් දෙසා නම් පචිති ඇවැත් වේ.

යක්ඛියා වා පෙතියා වා පණ්ඩකස්ස වා තිරච්ඡානගතමනුස්ස-විග්ගහිත්ථියා වා උත්තරිං ඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙති අඤ්ඤත්‍ර විඤ්ඤුනා පුරිසවිග්ගහෙන ආපත්ති දුක්කටස්ස. අමාතුගාමෙ මාතුගාමසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අමාතුගාමෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස, අමාතුගාමෙ අමාතුගාමසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** විඤ්ඤුනා පුරිසවිග්ගහෙන ඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙති, ඌනකඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙති, උට්ඨහිත්වා පුන නිසීදිත්වා දෙසෙති, මාතුගාමො උට්ඨහිත්වා පුන නිසීදති තස්මිං දෙසෙති, අඤ්ඤස්ස මාතුගාමස්ස දෙසෙති, පඤ්හං පුච්ඡති, පඤ්හං පුට්ඨො කථෙති, අඤ්ඤස්සත්ථාය භණන්තං මාතුගාමො සුණාති, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

ධම්මදෙසනාසික්ඛාපදං සත්තමං.

දනුමැති මිනිස් පිරිමියකු නැති වැ යකින්නකට හෝ ප්‍රේතියකට හෝ පණ්ඩකයකුට හෝ තිරිසන්ගිය මිනිස් සිරිරි ඇති ඉතිරියකට හෝ සපෙදෙකින් පස් පෙදෙකින් මතුයෙහි ධම් දෙසා නම් දුකුළා ඇවැත් වෙයි. නොමාගම් කෙරෙහි මාගම්සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නොමාගම් කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. නොමාගම් කෙරෙහි නොමාගම්සන් ඇතියේ ඇවැත් නැති.

දනුමැති මිනිස් පිරිමියකු ඇති වැ සපෙදෙකින් පස්පෙදෙකින් ධම් දෙසා නම්, උනු සපෙදෙකින් පස්පෙදෙකින් ධම් දෙසා නම් නැඟිට යළි හිඳ දෙසා නම්, මාගම නැඟිට යළි හිඳී ද, ඇයට දෙසා නම් අන් මාගමකට දෙසා නම්, පැන විචාරා නම්, පැන විචාරන ලද්දේ කියා නම් අනෙකකු සඳහා කියන්නහුගෙන් මාගම අසා නම් ඇවැත් නැති. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**සත්වැනි ධම්මදේසනාශික්ෂාපද යි**

## 6.1.8

## භූතාරොචනසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන සම්බහුලා සන්දිට්ඨා සම්භත්තා භික්ඛූ වග්ගුමුදය නදියා තීරෙ වස්සං උපගච්ඡිංසු. තෙන ඛො පන සමයෙන වජ්ජී දුබ්භික්ඛා හොති ද්වීහිතිකා සෙතට්ඨිකා සලාකාවුත්තා න සුකරා උඤ්ඡෙන පග්ගහෙන යාපෙතුං.

2. අථ ඛො තෙසං භික්ඛූනං එතදහොසි. ''එතරහි ඛො වජ්ජී දුබ්භික්ඛා ද්වීහිතිකා සෙතට්ඨිකා සලාකාවුත්තා න සුකරා උඤ්ඡෙන පග්ගහෙන යාපෙතුං. කෙන නු ඛො මයං උපායෙන සමග්ගා සම්මොදමානා අවිවදමානා ඵාසුකං වස්සං වසෙය්‍යාම න ච පිණ්ඩකෙන කිලමෙය්‍යාමා''ති.

3. එකච්චෙ එවමාහංසු. ''හන්ද මයං ආවුසො ගිහීනං කම්මන්තං අධිට්ඨෙම. එවං තෙ අම්හාකං දාතුං මඤ්ඤිස්සන්ති. එවං මයං සමග්ගා සම්මොදමානා අවිවදමානා ඵාසුකං වස්සං වසිස්සාම, න ච පිණ්ඩකෙන කිලමිස්සාමා''ති.

4. එකච්චෙ එවමාහංසු: ''අලං ආවුසො කිං ගිහීනං කම්මන්තං අධිට්ඨිතෙන, හන්ද මයං ආවුසො ගිහීනං දූතෙය්‍යං හරාම. එවං තෙ අම්හාකං දාතුං මඤ්ඤිස්සන්ති, එවං මයං සමග්ගා සම්මොදමානා අවිවදමානා ඵාසුකං වස්සං වසිස්සාම, න ච පිණ්ඩකෙන කිලමිස්සාමා''ති.

5. එකච්චෙ එවමාහංසු: ''අලං ආවුසො කිං ගිහීනං කම්මන්තං අධිට්ඨිතෙන, කිං ගිහීනං දූතෙය්‍යං හටෙන, හන්ද මයං ආවුසො ගිහීනං අඤ්ඤමඤ්ඤස්ස උත්තරිමනුස්සධම්මස්ස වණ්ණං භාසිස්සාම. 'අසුකො භික්ඛු පඨමස්ස ඣානස්ස ලාභී, අසුකො භික්ඛු දුතියස්ස ඣානස්ස ලාභී, අසුකො භික්ඛු තතියස්ස ඣානස්ස ලාභී, අසුකො භික්ඛු චතුත්ථස්ස ඣානස්ස ලාභී

## 6.1.8

## භූතාරොචනශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු විසල්පුර මහවෙනේ කූටාගාරශාලාහි වැඩ වෙසෙති. එකල්හි වනාහි දුටුපමණින් මිතුරු වූ දුටු වැ මිතුරු වූ බොහෝ භික්ෂූහු වග්ගුමුදු නදීතීරය සමීපයෙහි වස් එළැඹියහ. එසමයෙහි වැදැරට දුර්භික්ෂ ඇතියේ වෙයි. දෙපරිද්දෙකින් පැවැත්විය යුතු ඉරියව් ඇතියේ නොහොත් දුකසේ පැවැත්විය යුතු දිවෙල් ඇතියේ වෙයි. (තන්හි තන්හි විසිරිගිය) සුදුවන් ඇට ඇත්තේ නොහොත් සෙතට්ඨිකා නම් ගොයම්ලෙඩින් නැසුණු ශස්‍ය ශීර්ෂ ඇත්තේ වෙයි. වපුළ ගොයම්හි ලහ පමණක් ඉතිරිවූයේ නොහොත් කුසපතින් පැවැත්විය යුතු දිවෙල් ඇත්තේ වෙයි. පාත්‍රයෙන් සිඟායැමෙන් යැපෙන්නට පහසු නො වෙයි.

2. එකල්හි ඒ මහණුන්හට මෙසිත විය. මෙකල්හි වනාහි වැදැරට හටගත් දුබික් ඇතියේ වෙයි. දෙපරිද්දෙකින් පැවැත්විය යුතු ඉරියව් ඇතියේ නොහොත් දුකසේ පැවැත්විය යුතු දිවෙල් ඇතියේ වෙයි. සුදුවන් ඇට ඇතියේ නොහොත් සෙතට්ඨිකා නම් ගොයම්ලෙඩින් නැසුණු ශස්‍ය ශීර්ෂ ඇතියේ වෙයි. වපුළ ගොයම්හි ලහ පමණක් ඉතිරි වූයේ නොහොත් කුසපතින් පැවැත්විය යුතු දිවෙල් ඇතියේ වෙයි. පාත්‍රයෙන් සිඟායැමෙන් යැපෙන්නට පහසු වූයේ නො වෙයි. ඇපි කවර නම් උපායෙකින් සමගි සතුටු වැ විවාද නොකරත්තමෝ පහසුවෙන් වස් වසන්නමු ද, අහරින් නො ද මිරිකෙන්නමු දැ යි?

3. ඇතැම් කෙනෙක් මෙසේ කීහු: දන් ඇපි ඇවැත්නි, ගිහියන්ගේ කර්මාන්තයෙහි යෙදී සිටින්නමු නම් මැනැව්, එසේ ඇති කල්හි ඔහු අපට දෙන්නට සිතන්නාහ. මෙසේ ඇපි සමගි සතුටු වැ විවාද නැති වැ පහසුවෙන් වස් වසන්නමු, අහරින් නො ද මිරිකෙන්නෙමු යි.

4. ඇතැම් කෙනෙක් මෙසේ කීහු: ඇවැත්නි, කම් නැත. ගිහියන්ගේ කර්මාන්තයෙහි යෙදී සිටීමෙන් කවර වැඩෙක් ද? එසේ නම් ඇවැත්නි, ඇපි ගිහියන්ගේ පණිවුඩ ගෙනැ යමු. මෙසේ ඔහු අපට දෙනු කොට සිතන්නාහ. මෙසේ ඇපි සමගි සතුටු වැ විවාද නැති වැ පහසුවෙන් වස් වසන්නම්හ, අහරින් නො ද මිරිකෙන්නම්හ.

5. ඇතැම් කෙනෙක් මෙසේ කීහු: ඇවැත්නි, ගිහියන්ගේ කර්මාන්තයෙහි යෙදී සිටීමෙන් කවර වැඩෙක් ද? ගිහියන්ගේ පණිවුඩ ගෙන යැමෙන් කවර වැඩෙක් ද? එසේ නම් ඇවැත්නි, අපි ගිහියනට උනුන්ගේ උතුරු මිනිස් ධර්ම ගුණ කියම්හ. අසෝ මහණ පළමු දැහැන ලැබුවෙකි. අසෝ මහණ දෙවන දැහැන ලැබුවෙකි. අසෝ මහණ තෙවන දැහැන ලැබුවෙකි. අසෝ මහණ සතරවන දැහැන ලැබුවෙකි.

අසුකො භික්ඛු සොතාපන්නො, අසුකො භික්ඛු සකදාගාමී, අසුකො භික්ඛු අනාගාමී, අසුකො භික්ඛු අරහා, අසුකො භික්ඛු තෙවිජ්ජො, අසුකො භික්ඛු ඡළභිඤ්ඤො'ති. එවං තෙ අම්හාකං දාතුං මඤ්ඤිස්සන්ති, එවං මයං සමග්ගා සම්මොදමානා අවිවදමානා ඵාසුකං වස්සං වසිස්සාම, න ච පිණ්ඩකෙන කිලමිස්සාමා''ති.

6. එසොයෙව ඛො ආවුසො සෙය්‍යො යො අම්හාකං ගිහීනං අඤ්ඤමඤ්ඤස්ස උත්තරිමනුස්සධම්මස්ස වණ්ණො භාසිතොති. අථ ඛො තෙ භික්ඛු ගිහීනං අඤ්ඤමඤ්ඤස්ස උත්තරිමනුස්සධම්මස්ස වණ්ණං භාසිංසු: ''අසුකො භික්ඛු පඨමස්ස ඣානස්ස ලාභී -පෙ- අසුකො භික්ඛු ඡළභිඤ්ඤො''ති.

7. අථ ඛො තෙ මනුස්සා ''ලාභා වත නො සුලද්ධං වත නො යෙසං නො එවරූපා භික්ඛූ වස්සං උපගතා, න වත නො ඉතො පුබ්බෙ එවරූපා භික්ඛූ වස්සං උපගතා යථයිමෙ භික්ඛූ සීලවන්තො කල්‍යාණධම්මා''ති. තෙ න තාදිසානි භොජනානි අත්තනා භුඤ්ජන්ති. මාතාපිතූනන්තං[1] දෙන්ති පුත්තදාරස්ස දෙන්ති, දාසකම්මකරපොරිසස්ස දෙන්ති. මිත්තාමච්චානං දෙන්ති. ඤාතිසාලොහිතානං දෙන්ති, යාදිසානි භික්ඛූනං දෙන්ති, න තාදිසානි ඛාදනීයානි සායනීයානි පානානි අත්තනා පිවන්ති.[2] මාතාපිතූනන්තං දෙන්ති. පුත්තදාරස්ස දෙන්ති. දාසකම්මකරපොරිසස්ස දෙන්ති. මිත්තාමච්චානං දෙන්ති. ඤාතිසාලොහිතානං දෙන්ති, යාදිසානි භික්ඛූනං දෙන්ති.

8. අථ ඛො තෙ භික්ඛූ වණ්ණවා අහෙසුං. පීණින්ද්‍රියා පසන්නමුඛවණ්ණා විප්පසන්නඡවිවණ්ණා. ආචිණ්ණං ඛො පනෙතං වස්සං වුත්ථානං[3] භික්ඛූනං භගවන්තං දස්සනාය උපසඞ්කමිතුං. අථ ඛො තෙ භික්ඛූ වස්සං වුත්ථා තෙමාසච්චයෙන සෙනාසනං සංසාමෙත්වා පත්තචීවරං ආදාය යෙන වෙසාලි තෙන පක්කමිංසු. අනුපුබ්බෙන යෙන වෙසාලී මහාවනං කූටාගාරසාලා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු.

9. තෙන ඛො පන සමයෙන දිසාසු වස්සං වුත්ථා භික්ඛූ කිසා හොන්ති ලූඛා දුබ්බණ්ණා උප්පණ්ඩුප්පණ්ඩුකජාතා ධමනිසන්ථතගත්තා. වග්ගුමුදාතීරියා පන භික්ඛූ වණ්ණවා හොන්ති පීණින්ද්‍රියා පසන්නමුඛවණ්ණා විප්පසන්නඡවිවණ්ණා. ආචිණ්ණං ඛො පනෙතං බුද්ධානං භගවන්තානං ආගන්තුකෙහි භික්ඛූහි සද්ධිං පටිසම්මොදිතුං.

1. මාතාපිතූනං - මජසං.
2. ඛාදන්ති සායන්ති පිවන්ති ([illegible])
3. වස්සං වුට්ඨානං - මජසං.

අසෝ මහණ සෝවාන් වෙයි. අසෝ මහණ සෙදගැමි යැ. අසෝ මහණ අනාගාමි යැ. අසෝ මහණ රහත් යැ. අසෝ මහණ ත්‍රිවිද්‍යා ඇතියෙකැ. අසෝ මහණ ෂඩභිඥා ඇතියෙකැ යි. එසේ ඇති කල්හි ඔහු අපට දෙනු කොට සිතන්නාහු ය. මෙසේ ඇපි සමගි සතුටු වැ විවාද නැති වැ පහසු වෙන් වස් වසන්නම්හ. අහරින් නො ද මිරිකෙන්නම්හ.

6. ඇවැත්නි, ගිහියනට අප විසින් උතුන්ගේ උතුරුමිනිස්ධම්හි යම් ගුණ කීමෙක් වේ නම් මෙයැ මැ ශ්‍රේෂ්ඨ යැ. එකල්හි ඒ භික්ෂූහු අසෝ මහණ පළමු දහැන ලැබුවෙකැ.....අසෝ මහණ ෂඩභිඥා ඇතියෙකැ යි ගිහියනට අනන්මන උතුරුමිනිස්ධම්හි ගුණ කීහු.

7. එකල්හි ඒ මිනිස්සු ''අපට එකාන්තයෙන් ලාභයෙකි. අපට එකාන්තයෙන් මනා ලැබීමෙකි. යම්බඳු අපට මෙබඳු භික්ෂූහු වස් එළඹියාහු ද මෙයින් පෙර අපට කලණසැහැවි ඇති සිල්වත් මේ මහණුන් වැනි භික්ෂූහු වස් නො එළඹියාහු යැ''යි කීහු. එව්හු යම්බඳු බොජුන් භික්ෂූනට දෙත් ද එබඳු බොජුන් තුමූ නො වළඳිති, මාපියනට නො දෙති, අඹු-දරුවනට නො දෙති, දස් කම්කරු පුරිස්නට නො දෙති, මිත්‍රාමාත්‍යයනට නො දෙති, නෑසහලේ නෑයනට නො දෙත්. යම්බඳු දෑ භික්ෂූනට දෙත් ද එබඳු කෑ යුතු දෑ රස විඳිය යුතු දෑ පිය යුතු දෑ තුමූ නො බොති. මාපියනට නොදෙති, අඹුදරුවනට නො දෙති, දස්කම්කරු පුරිස්නට නො දෙති, මිත්‍රාමාත්‍යයනට නො දෙති, නෑ සහලේ නෑයනට නොදෙත්.

8. එකල්හි ඒ භික්ෂූහු සිරිරිපැහැ ඇතියෝ පිරුණු ඉඳුරන් ඇතියෝ පසන් මුවපැහැ ඇතියෝ වෙසෙසින් පහන් සිවිපැහැ ඇතියෝ වූහු. වස් වැස නිම වූ භික්ෂූන් භාග්‍යවතුන් දක්නට යෑම යැ යන තෙල සිරිත පුරුද්දෙක් මැ යි. එකල්හි ඒ භික්ෂූහු වස් වැස නිමවූවාහු වස් තෙමස ඇවෑමෙන් සෙනසුන් තැන්පත් කොට පා සිවුරු ගෙන විසල්පුර යම් තැනෙක ද එහි ගියහ. පිළිවෙළින් විසල්පුර මහවන කූළාරහල බුදුහු යම් තැනෙක ද එහි එළැඹියහ. එළැඹ බුදුන් වැඳ එකත් පසෙකැ හුන්හ.

9. එසමයෙහි වනාහි දිශාවන්හි වස් වුසූ භික්ෂූහු කෘශ වූවාහු රළු සිරිරි ඇතියාහු දුර්වර්ණ වූවාහු හටගත්පඬුවන් පැහැ ඇතියාහු ඉල්පිගිය නහරින් යුතු සිරිරි ඇතියාහු වෙති. වග්ගුමුදාතීරිය භික්ෂූහු වනාහි පැහැපත් සිරිරි ඇතියාහු පිරුණු ඉඳුරන් ඇතියාහු පසන් මුවපැහැ ඇතියාහු වෙසෙසින් පහන් සිවිපැහැඇතියාහු වෙති. ආගන්තුක භික්ෂූන් සමඟ පිළිසඳර කිරීම යැ යන තෙල සිරිත භාග්‍යවත් බුදුවරුන්ගේ පුරුද්දෙක් මැ යි.

10. අථ ඛො භගවා වග්ගුමුදාතීරියෙ භික්ඛු එතදවොච: "කච්චි භික්ඛවෙ ඛමනීයං කච්චි යාපනීයං කච්චි සමග්ගා සම්මොදමානා අවිවදමානා ඵාසුකං වස්සං වසිත්ථ, න ච පිණ්ඩකෙන කිලමිත්ථා''ති. ඛමනීයං භගවා යාපනීයං භගවා සමග්ගා ච මයං භන්තෙ සම්මොදමානා අවිවදමානා ඵාසුකං වස්සං වසිම්හා න ච පිණ්ඩකෙන කිලමිම්හාති. ජානන්තාපි තථාගතා පුච්ඡන්ති. ජානන්තාපි න පුච්ඡන්ති. කාලං විදිත්වා පුච්ඡන්ති කාලං විදිත්වා න පුච්ඡන්ති. අත්ථසංහිතං තථාගතා පුච්ඡන්ති, නො අනත්ථසංහිතං, අනත්ථසංහිතෙ සෙතුඝාතො තථාගතානං, ද්වීහාකාරෙහි බුද්ධා භගවන්තො භික්ඛු පටිපුච්ඡන්ති. ධම්මං වා දෙසිස්සාම සාවකානං වා සික්ඛාපදං පඤ්ඤපෙස්සාමා''ති.

11. අථ ඛො භගවා වග්ගුමුදාතීරියෙ භික්ඛු එතදවොච: "යථා කථං පන තුම්හෙ භික්ඛවෙ සමග්ගා සම්මොදමානා අවිවදමානා ඵාසුකං වස්සං වසිත්ථ, න ච පිණ්ඩකෙන කිලමිත්ථා''ති. අථ ඛො තෙ භික්ඛු භගවතො එතමත්ථං ආරොචෙසුං, කච්චි පන වො භික්ඛවෙ භූතන්ති. භූතං භගවාති. විගරහි බුද්ධො භගවා – පෙ – කථං හි නාම තුම්හෙ භික්ඛවෙ උදරස්ස කාරණා ගිහීනං අඤ්ඤමඤ්ඤස්ස උත්තරිමනුස්සධම්මස්ස වණ්ණං භාසිස්සථ. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය – පෙ – එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

"යො පන භික්ඛු අනුපසම්පන්නස්ස උත්තරිමනුස්සධම්මං ආරොචෙය්‍ය භූතස්මිං පාචිත්තිය''න්ති.

12. යොපනාති: යො යාදිසො –පෙ– භික්ඛූති –පෙ– අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති. අනුපසම්පන්නො නාම භික්ඛුඤ්ච භික්ඛුනිඤ්ච ඨපෙත්වා අවසෙසො අනුපසම්පන්නො නාම.

13. උත්තරිමනුස්සධම්මො නාම: ඣානං විමොක්ඛො සමාධි සමාපත්ති ඤාණදස්සනං මග්ගභාවනා ඵලසච්ඡිකිරියා කිලෙසප්පහානං විනීවරණතා චිත්තස්ස සුඤ්ඤාගාරෙ අභිරති. ඣානන්ති පඨමං ඣානං දුතියං ඣානං තතියං ඣානං චතුත්ථං ඣානං. විමොක්ඛොති සුඤ්ඤතො විමොක්ඛො අනිමිත්තො විමොක්ඛො අප්පණිහිතො විමොක්ඛො. සමාධීති සුඤ්ඤතො සමාධි අනිමිත්තො සමාධි අප්පණිහිතො සමාධි. සමාපත්තීති සුඤ්ඤතා සමාපත්ති අනිමිත්තා සමාපත්ති අප්පණිහිතා සමාපත්ති. ඤාණදස්සනන්ති

10. එකල්හි භාග්‍යවතුන් වහන්සේ වග්ගුමුදතීරිය භික්ෂූන්ට මෙය වදාළ සේක. කිමෙක් ද මහණෙනි, ඉවසිය හැකි ද? කිම යැපිය හැකි ද? කිම සමගි වැ සතුටු සිතැති වැ විවාද නැති වැ පහසුවෙන් වස් වුසුවහු ද? පිණ්ඩයෙන් නො ද ක්ලාන්ත වූවහු ද යි. ඉවසිය හැකි ය භාග්‍යවතුන් වහන්ස, යැපිය හැකි යැ භාග්‍යවතුන් වහන්ස. වහන්ස, ඇපි වනාහි සමගි වැ සතුටු සිතැති වැ විවාද නැති වැ පාසුවෙන් වස් වුසුම්හ. පිණ්ඩයෙන් නො ද මිරිකුණෙම්හ. තථාගතයෝ දනිමිනුත් විචාරති. දනිමිනුත් නො විචාරති, කල් දැන විචාරති, කල් දැන නො විචාරති. තථාගතයෝ අර්ථසහිතයක් විචාරති, අනර්ථසහිතය නො විචාරත්. අනර්ථ සහිතයෙහි තථාගතයන්ගේ සෙතුඝාතය වෙයි. භාග්‍යවත් බුද්ධවරු 'ධර්මය හෝ දෙසම්හ, ශ්‍රාවකයනට සිකපද හෝ පනවම්හ''යි දෙ අයුරෙකින් මහණුන් විචාරත්.

11. එකල්හි භාග්‍යවතුන් වහන්සේ වග්ගුමුදතීරිය භික්ෂූන්ට මෙය වදාළ සේක. කෙසේ නම් මහණෙනි, තෙපි සමගි වැ සතුටු සිතැති වැ විවාද නැති වැ පහසුවෙන් වස් වුසුවහු ද? අහරින් නො ද ක්ලාන්ත වූවහු ද යි. එකල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන්ට මෙකරුණ සැලකළහ. කිමෙක් ද මහණෙනි, (එය) තොප පිළිබැඳි වූවෙක් ද? භාග්‍යවතුන් වහන්ස, වූවෙකි. භාග්‍යවත් බුදුහු ගැරහූහ...කෙසේ නම් මහණෙනි, තෙපි උදරය කරණ කොට ගෙන ගිහියනට උනුන්ගේ උතුරුමිනිස්දහම්හි ගුණ කීවහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි.... මහණෙනි, මෙසේ මේ සිකපදය උදෙසවු:

**''යම් මහණෙක් අනුපසපන්හට උතුරුමිනිස්දම් ඇරොජන්නේ නම් විද්‍යමානයෙහි පචිති වේ'' යයි.**

12. **යොපන:** යම්, යම්බඳු...භික්ෂු... මෙතෙම මේ අරුතෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි. **අනුපසම්පන්න නම්:** මහණ ද මෙහෙණ ද හබා අවශෙෂ වූයේ අනුපසම්පන්න නම් වේ.

13. **උත්තරිමනුස්සධම්ම නම්:** ධ්‍යාන යැ විමොක්ෂ යැ සමාධි යැ සමාපත්ති යැ ඥානදර්ශන යැ මාර්ගභාවනා යැ ඵලප්‍රත්‍යක්ෂකරණ යැ ක්ලෙශප්‍රහාණ යැ චිත්තයාගේ විනිවරණතා යැ ශූන්‍යාගාරයෙහි අභිරති යි. **ධ්‍යාන යනු:** ප්‍රථමධ්‍යාන යැ ද්විතීයධ්‍යාන යැ තෘතීයධ්‍යාන යැ චතුර්ථ ධ්‍යානය යි. **විමොක්ෂ යනු:** ශූන්‍යතවිමොක්ෂ යැ අනිමිත්තවිමොක්ෂ යැ අප්‍රණිහිත විමොක්ෂ යි **සමාධි යනු:** ශූන්‍යත සමාධි යැ අනිමිත්ත සමාධි යැ අප්‍රණිහිත සමාධි යි. **සමාපත්ති යනු:** ශූන්‍යතසමාපත්ති යැ අනිමිත්ත සමාපත්ති යැ අප්‍රණිහිතසමාපත්ති යි **ඥානදර්ශන යනු:** ත්‍රිවිද්‍යා යි.

තිස්සො විජ්ජා. **මග්ගභාවනාති** චත්තාරො සතිපට්ඨානා චත්තාරො සම්මප්පධානා චත්තාරො ඉද්ධිපාද පඤ්චින්ද්‍රියානි පඤ්ච බලානි සත්ත බොජ්ඣඞ්ගා අරියො අට්ඨඞ්ගිකො මග්ගො. **ඵලසච්ඡිකිරියාති** සොතාපත්තිඵලස්ස සච්ඡිකිරියා සකදාගාමිඵලස්ස සච්ඡිකිරියා අනාගාමිඵලස්ස සච්ඡිකිරියා අරහත්තස්ස[1] සච්ඡිකිරියා. **කිලෙසප්පහානන්ති** රාගස්ස පහානං දොසස්ස පහානං මොහස්ස පහානං. **විනීවරණතා චිත්තස්සාති** රාගා චිත්තං විනීවරණතා දොසා චිත්තං විනීවරණතා මොහා චිත්තං විනීවරණතා **සුඤ්ඤාගාරෙ අභිරතීති** පඨමෙන ඣානෙන සුඤ්ඤාගාරෙ අභිරති, දුතියෙන ඣානෙන සුඤ්ඤාගාරෙ අභිරති, තතියෙන ඣානෙන සුඤ්ඤාගාරෙ අභිරති. චතුත්ථෙන ඣානෙන සුඤ්ඤාගාරෙ අභිරති.

14. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස පඨමං ඣානං සමාපජ්ජින්ති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස පඨමං ඣානං සමාපජ්ජාමීති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස පඨමං ඣානං සමාපන්නොති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස පඨමස්ස ඣානස්ස ලාභිම්හීති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස පඨමස්ස ඣානස්ස වසිම්හීති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස පඨමං ඣානං සච්ඡිකතං මයාති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

15. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස දුතියං ඣානං – පෙ – තතියං ඣානං – පෙ – චතුත්ථං ඣානං සමාපජ්ජිං – පෙ – සමාපජ්ජාමි – පෙ – සමාපන්නො – පෙ – චතුත්ථස්ස ඣානස්ස ලාභිම්හි – පෙ – වසිම්හි – පෙ – චතුත්ථං ඣානං සච්ඡිකතං මයාති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

16. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස සුඤ්ඤතං විමොක්ඛං – පෙ – අනිමිත්තං විමොක්ඛං – පෙ – අප්පණිහිතං විමොක්ඛං – පෙ – සුඤ්ඤතං සමාධිං – පෙ – අනිමිත්තං සමාධිං – පෙ – අප්පණිහිතං සමාධිං සමාපජ්ජිං – පෙ – සමාපජ්ජාමි – පෙ – සමාපන්නො – පෙ – අප්පණිහිතස්ස සමාධිස්ස ලාභිම්හි – පෙ – වසිම්හි – පෙ – අප්පණිහිතො සමාධි සච්ඡිකතො මයාති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

---

1. අරහත්තඵලස්ස - මජසං

මාර්ගභාවනා යනු: සතරසතිපට්ඨාන යැ සතර සම්‍යක්ප්‍රධාන යැ සතර ඍද්ධිපාද යැ පඤ්චෙන්ද්‍රිය යැ පඤ්චබල යැ සප්තබොධ්‍යඞ්ග යැ ආර්‍යඅෂ්ටාඞ්ගික මාර්ග යි. **ඵලප්‍රත්‍යක්ෂකරණ** යනු: ස්‍රොතාපත්තිඵලය ප්‍රත්‍යක්ෂ කිරීම යැ සකෘදගාමිඵලය ප්‍රත්‍යක්ෂ කිරීම යැ අනාගාමිඵලය ප්‍රත්‍යක්ෂ කිරීම යැ අර්හත්ඵලය ප්‍රත්‍යක්ෂ කිරීම යි. **ක්ලෙශප්‍රහාණ** යනු: රාගයාගේ ප්‍රහාණ යැ ද්වෙෂයාගේ ප්‍රහාණ යැ මොහයාගේ ප්‍රහාණ යි. **චිත්තයාගේ විනීවරණතා** යනු: රාගයෙන් සිත වෙසෙසින් වැළකුණු බව යැ ද්වෙෂයෙන් සිත වෙසෙසින් වැළකුණු බව යැ මොහයෙන් සිත වෙසෙසින් වැළකුණු බව යි, **ශූන්‍යාගාරයෙහි අභිරති** යනු: පළමුවන ධ්‍යානයෙන් ශූන්‍යාගාරයෙහි ඇලීම යැ දෙවන ධ්‍යානයෙන් ශූන්‍යාගාරයෙහි ඇලීම යැ තෙවන ධ්‍යානයෙන් ශූන්‍යාගාරයෙහි ඇලීම යැ සතරවන ධ්‍යානයෙන් ශූන්‍යාගාරයෙහි ඇලීම යි.

14. **ආරොචෙය්‍ය** යනු: ප්‍රථමධ්‍යානයට සමවැදීම් යි අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ. **ආරොචෙය්‍ය** යනු: ප්‍රථමධ්‍යානයට සමවදිමි යි අනුපසපනක්හට කියන්නහුට පචිති ඇවැත් වේ. **ආරොචෙය්‍ය** යනු: ප්‍රථමධ්‍යානයට සමවදින්නෙම් වෙමැ යි අනුපසපනක්හට කියන්නහුට පචිති ඇවැත් වේ. **ආරොචෙය්‍ය** යනු: ප්‍රථමධ්‍යානය ලැබුවෙම් වෙමැ යි අනුපසපනක්හට කියන්නහුට පචිති ඇවැත් වේ. **ආරොචෙය්‍ය** යනු: ප්‍රථමධ්‍යානය වශීකෘතයෙම් වෙමැ යි අනුපසපනක්හට කියන්නහුට පචිති ඇවැත් වේ. **ආරොචෙය්‍ය** යනු: මා විසින් ප්‍රථමධ්‍යානය පසක් කරන ලදැයි අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ.

15. **ආරොචෙය්‍ය** යනු: ද්විතීයධ්‍යානයට ... තෘතීයධ්‍යානයට ... චතුර්ථධ්‍යානයට සමවැදීමි ... සමවදිමි ... සමවදින්නෙම් වෙමි ... චතුර්ථධ්‍යානය ලැබුවෙම් වෙමි ... වශීකෘතයෙම් වෙමි ... මා විසින් චතුර්ථධ්‍යානය පසක් කරන ලද යි අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ.

16. **ආරොචෙය්‍ය** යනු: ශූන්‍යතවිමොක්ෂයට ... අනිමිත්ත විමොක්ෂයට ... අප්‍රණිහිතවිමොක්ෂයට ... ශූන්‍යතසමාධියට ... අනිමිත්තසමාධියට ... අප්‍රණිහිතසමාධියට සමවැදීමි ... සමවදිමි ... සමවදින්නෙම වෙමි .... අප්‍රණිහිතසමාධිය ලැබුවෙම් වෙමි ... වශීකෘතයෙම් වෙමි ... මා විසින් අප්‍රණිහිතසමාධිය ප්‍රත්‍යක්ෂ කරන ලද යි අනුපසපනක්හට කියන්නහුට පචිති ඇවැත් වේ.

17. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස සුඤ්ඤතං සමාපත්තිං – පෙ – අනිමිත්තං සමාපත්තිං – පෙ – අප්පණිහිතං සමාපත්තිං සමාපජ්ජිං – පෙ – සමාපජ්ජාමි – පෙ – සමාපන්නො – පෙ – අප්පණිහිතාය සමාපත්තියා ලාභීමහි – පෙ – වසීමහි – පෙ – අප්පණිහිතා සමාපත්ති සච්ඡිකතා මයාති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

18. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස තිස්සො විජ්ජා සමාපජ්ජිං – පෙ – සමාපජ්ජාමි – පෙ – සමාපන්නො – පෙ – තිස්සන්නං විජ්ජානං ලාභීමහි – පෙ – වසීමහි – පෙ – තිස්සො විජ්ජා සච්ඡිකතා මයාති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

19. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස චත්තාරො සතිපට්ඨානෙ – පෙ – චත්තාරො සම්මප්පධානෙ – පෙ – චත්තාරො ඉද්ධිපාදෙ සමාපජ්ජිං – පෙ – සමාපජ්ජාමි – පෙ – සමාපන්නො – පෙ – චතුන්නං ඉද්ධිපාදනං ලාභීමහි – පෙ – වසීමහි – පෙ – චත්තාරො ඉද්ධිපාද සච්ඡිකතා මයාති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

20. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස පඤ්චින්ද්‍රියානි –පෙ– පඤ්ච-බලානි සමාපජ්ජිං –පෙ– සමාපජ්ජාමි –පෙ– සම පන්නො –පෙ– පඤ්චන්නං බලානං ලාභීමහි –පෙ– වසීමහි –පෙ– පඤ්චබලානි සච්ඡිකතානි මයාති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

21. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස සත්ත බොජ්ඣඞ්ගෙ සමා-පජ්ජිං -පෙ- සාමපජ්ජාමි -පෙ- සමාපන්නො -පෙ- සත්තන්නං බොජ්ඣඞ්ගානං ලාභීමහි –පෙ– වසීමහි පෙ – සත්තබොජ්ඣඞ්ගා සච්ඡිකතා මයාති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

22. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස අරියං අට්ඨඞ්ගිකං මග්ගං සමාපජ්ජිං –පෙ– සමාපජ්ජාමි –පෙ– සමාපන්නො –පෙ– අරියස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස ලාභීමහි –පෙ– වසීමහි –පෙ– අරියො අට්ඨඞ්ගිකො මග්ගො සච්ඡිකතො මයාති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

23. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස සොතාපත්තිඵලං –පෙ– සකදාගාමිඵලං –පෙ– අනාගාමිඵලං –පෙ– අරහත්තං සමාපජ්ජිං –පෙ– සමාපජ්ජාමි –පෙ– සමාපන්නො –පෙ– අරහත්තස්ස ලාභීමහි –පෙ– වසීමහි –පෙ– අරහත්තං සච්ඡිකතං මයාති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

17. **ආරොචෙය්‍යා** යනු: ශූන්‍යතසමාපත්තියට ... අනිමිත්ත-සමාපත්තියට ... අප්‍රණිහිතසමාපත්තියට සමවැදිමි ... සමවදිමි ... සමවදින්නෙම් වෙමි ... අප්‍රණිහිතසමාපත්තිය ලැබුවෙම් වෙමි ... වශීකෘතයෙම් වෙමි ... මා විසින් අප්‍රණිහිතසමාපත්තිය පසක් කරන ලද යි අනුපසපනක්හට කියන්නහුට පචිති ඇවැත් වේ.

18. **ආරොචෙය්‍යා** යනු: ත්‍රිවිද්‍යාවනට සමවැදිමි ... සමවදිමි ... සමවදින්නෙම් වෙමි ... ත්‍රිවිද්‍යාවන් ලැබුවෙම් වෙමි ... වශීකෘතයෙම් වෙමි ... මා විසින් ත්‍රිවිද්‍යාවෝ පසක් කරන ලදහ යි අනුපසපනක්හට කියන්නහුට පචිති ඇවැත් වේ.

19. **ආරොචෙය්‍යා** යනු: සතර සතිපට්ඨානයනට ... සතර සම්‍යක් ප්‍රධානයනට ... සතර ඍද්ධිපාදයනට සමවැදිමි ... සමවදිමි ... සමවදින්නෙම් වෙමි ... සතර ඍද්ධිපාදයන් ලැබුවෙම් වෙමි ... වශීකෘතයෙම් වෙමි ... මා විසින් සතර ඍද්ධිපාදයෝ පසක් කරන ලදහ'යි අනුපසපනක්හට කියන්නහුට පචිති ඇවැත් වේ.

20. **ආරොචෙය්‍යා** යනු: පඤ්චෙන්ද්‍රියනට ... පඤ්චබලයනට සමවැදිමි ... සමවදිමි ... සමවදින්නෙම් වෙමි ... පඤ්චබලයන් ලැබුවෙම් වෙමි ... වශීකෘතයෙම් වෙමි ... මා විසින් පඤ්චබලයෝ ප්‍රත්‍යක්‍ෂ කරන ලදහයි අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ.

21. **ආරොචෙය්‍යා** යනු: සප්තබොධ්‍යඞ්ගයනට සමවැදිමි ... සමවදිමි ... සමවදින්නෙම් වෙමි ... සපතබොධ්‍යඞ්ගයන් ලැබුවෙම් වෙමි ... වශිකෘතයෙම් වෙමි ... මා විසින් සප්තබොධ්‍යඞ්ගයෝ ප්‍රත්‍යක්‍ෂ කරන ලදහ යි අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ.

22. **ආරොචෙය්‍යා** යනු: ආය්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ගයට සමවැදිමි ... සමවදිමි ... සමවදින්නෙම් වෙමි ... ආය්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය ලැබුවෙම් වෙමි ... වශීකෘතයෙම් වෙමි ... මා විසින් ආය්‍ය්‍ය අෂ්ටාඞ්ගිකමාර්ගය පසක් කරන ලද්දේ යැ යි අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ.

23. **ආරොචෙය්‍යා** යනු: සොවත්පලයට ... සෙදගැමිපලයට ... අනාගැමිපලයට ... රාත්පලයට සමවැදිමි ... සමවදිමි ... සමවදින්නෙම් වෙමි ... රාත්පල ලැබුවෙම් වෙමි ... වසහ කෙළෙම් වෙමි ... මා විසින් රාත්පල පසක් කරන ලද'යි අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ.

**24.** ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස රාගො මෙ චත්තො -පෙ- දොසො මෙ චත්තො -පෙ- මොහො මෙ චත්තො වන්තො මුත්තො පහීනො පටිනිස්සට්ඨො උක්ඛෙටිතො සමුක්ඛෙටිතොති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

**25.** ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස රාගා මෙ චිත්තං විනීවරණං -පෙ- දොසා මෙ චිත්තං විනීවරණං -පෙ- මොහා මෙ චිත්තං විනීවරණන්ති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

**26.** ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස සුඤ්ඤාගාරෙ පඨමං ඣානං -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං සමාපජ්ජිං -පෙ- සමාපජ්ජාමි -පෙ- සමාපන්නො -පෙ- සුඤ්ඤාගාරෙ චතුත්ථස්ස ඣානස්ස ලාභිම්හි -පෙ- වසිම්හි -පෙ- සුඤ්ඤාගාරෙ චතුත්ථං ඣානං සච්ඡිකතං මයාති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

**27.** ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස පඨමඤ්ච ඣානං දුතියඤ්ච ඣානං සමාපජ්ජිං -පෙ- සමාපජ්ජාමි -පෙ- සමාපන්නො -පෙ- පඨමස්ස ච ඣානස්ස දුතියස්ස ච ඣානස්ස ලාභිම්හි -පෙ- වසිම්හි -පෙ- පඨමඤ්ච ඣානං දුතියඤ්ච ඣානං සච්ඡිකතං මයාති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

**28.** ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස පඨමඤ්ච ඣානං තතියඤ්ච ඣානං -පෙ- පඨමඤ්ච ඣානං චතුත්ථඤ්ච ඣානං සමාපජ්ජිං -පෙ- සමාපජ්ජාමි -පෙ- සමාපන්නො -පෙ- පඨමස්ස ච ඣානස්ස චතුත්ථස්ස ච ඣානස්ස ලාභිම්හි -පෙ- වසිම්හි -පෙ- පඨමඤ්ච ඣානං චතුත්ථඤ්ච ඣානං සච්ඡිකතං මයාති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

**29.** ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස පඨමඤ්ච ඣානං සුඤ්ඤතඤ්ච විමොක්ඛං -පෙ- අනිමිත්තඤ්ච විමොක්ඛං -පෙ- අප්පණිහිතඤ්ච විමොක්ඛං -පෙ- සුඤ්ඤතඤ්ච සමාධිං -පෙ- අනිමිත්තඤ්ච සමාධිං -පෙ- අප්පණිහිතඤ්ච සමාධිං සමාපජ්ජිං -පෙ- සමාපජ්ජාමි -පෙ- සමාපන්නො -පෙ- පඨමස්ස ච ඣානස්ස අප්පණිහිතස්ස ච සමාධිස්ස ලාභිම්හි -පෙ- වසිම්හි -පෙ- පඨමඤ්ච ඣානං අප්පණිහිතො ච සමාධි සච්ඡිකතො මයාති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

24. ආරොචෙය්‍ය යනු: මා විසින් රාගය ත්‍යක්ත යැ ... මා විසින් ද්වේෂය ත්‍යක්ත යැ ... මා විසින් මොහය ත්‍යක්ත යැ වාන්ත යැ මුක්ත යැ ප්‍රහීණ යැ බැහැර කරන ලද්දේ යැ තැති ගන්වා පලවා හරින ලද්දේ යැ මොනොවට තැති ගන්වා පලවා හරින ලද්දේ යැ යි අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ.

25. ආරොචෙය්‍ය යනු: මාගේ සිත රාගයෙන් වෙසෙසින් වැළැකිණ ...මාගේ සිත ද්වේෂයෙන් වෙසෙසින් වැළැකිණ... මාගේ සිත මොහයෙන් වෙසෙසින් වැළැකිණ යි අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ.

26. ආරොචෙය්‍ය යනු: ශූන්‍යාගාරයෙහි ප්‍රථමධ්‍යානයට ... ද්විතීය ධ්‍යානයට ...තෘතීයධ්‍යානයට ...චතුර්ත්ථධ්‍යානයට සමවැදීමි ...සමවදිමි ...සමවදින්නෙම් වෙමි ...ශූන්‍යාගාරයෙහි චතුර්ථධ්‍යානය ලැබුවෙම් වෙමි ...වසඟ කෙළෙම් වෙමි ...ශූන්‍යාගාරයෙහි මා විසින් චතුර්ත්ථධ්‍යානය පසක් කරන ලද්දේ යැ යි අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ.

27. ආරොචෙය්‍ය යනු: ප්‍රථමධ්‍යානයට ද ද්විතීයධ්‍යානයට ද සම වැදීමි ...සමවදිමි ...සමවදින්නෙම් වෙමි ...ප්‍රථමධ්‍යානය ද ද්විතීය-ධ්‍යානය ද ලැබුවෙම් වෙමි ... වශීකෘතයෙමි වෙමි ... මා විසින් ප්‍රථමධ්‍යානය ද ද්විතීයධ්‍යානය ද පසක් කරන ලද යි අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ.

28. ආරොචෙය්‍ය යනු: ප්‍රථමධ්‍යානයට ද තෘතීයධ්‍යානයට ද ... ප්‍රථමධ්‍යානයට ද චතුර්ත්ථධ්‍යානයට ද සමවැදීමි ... සමවදිමි ... සම වදින්නෙම් වෙමි ...ප්‍රථමධ්‍යානය ද චතුර්ථධ්‍යානය ද ලැබුවෙම් වෙමි ...වසඟ කෙළෙම් වෙමි ...මා විසින් ප්‍රථමධ්‍යානය ද චතුර්ථධ්‍යානය ද පසක් කරන ලද යි අනුපසපනක්හට කියන්නහුට පචිති ඇවැත් වේ.

29. ආරොචෙය්‍ය යනු: ප්‍රථමධ්‍යානයට ද ශූන්‍යතවිමොක්ෂයට ද ...අනිමිත්තවිමොක්ෂයට ද ...අප්‍රණිහිතවිමොක්ෂයට ද ...ශූන්‍යත සමා-ධියට ද ...අනිමිත්තසමාධියට ද ...අප්‍රණිහිතසමාධියට ද සමවැදීමි ...සමවදිමි ... සමවදින්නෙම් වෙමි ... ප්‍රථම ධ්‍යානය ද ... අප්‍රණිහිත සමාධිය ද ලැබුවෙම් වෙමි ... වසඟ කෙළෙම් වෙමි ... මා විසින් ප්‍රථමධ්‍යානය ද ...අප්‍රණිහිතසමාධිය ද පසක් කරන ලද්දේ යැ යි අනුපසපනක්හට කියන්නහුට පචිති ඇවැත් වේ.

30. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස පඨමඤ්ච ඣානං සුඤ්ඤතඤ්ච සමාපත්තිං -පෙ- අනිමිත්තඤ්ච සමාපත්තිං -පෙ- අප්පණිහිතඤ්ච සමාපත්තිං සමාපජ්ජිං -පෙ- සමාපජ්ජාමි -පෙ- සමාපන්නො -පෙ- පඨමස්ස ච ඣානස්ස අප්පණිහිතාය ච සමාපත්තියා ලාභීම්හි -පෙ- වසීම්හි -පෙ- පඨමඤ්ච ඣානං අප්පණිහිතා ච සමාපත්ති සච්ඡිකතා මයාති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

31. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස පඨමඤ්ච ඣානං තිස්සො ච විජ්ජා සමාපජ්ජිං -පෙ- සමාපජ්ජාමි -පෙ- සමාපන්නො -පෙ- පඨමස්ස ච ඣානස්ස තිස්සන්නඤ්ච විජ්ජානං ලාභීම්හි -පෙ- වසීම්හි -පෙ- පඨමඤ්ච ඣානං තිස්සො ච විජ්ජා සච්ඡිකතා මයාති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

32. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස පඨමඤ්ච ඣානං චත්තාරො ච සතිපට්ඨානෙ -පෙ- චත්තාරො ච සම්මප්පධානෙ -පෙ- චත්තාරො ච ඉද්ධිපාදෙ සමාපජ්ජිං -පෙ- සමාපජ්ජාමි -පෙ- සමාපන්නො -පෙ- පඨමස්ස ච ඣානස්ස චතුන්නඤ්ච ඉද්ධිපාදානං ලාභීම්හි -පෙ- වසීම්හි -පෙ- පඨමඤ්ච ඣානං චත්තාරො ච ඉද්ධිපාද සච්ඡිකතා මයාති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

33. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස පඨමඤ්ච ඣානං පඤ්ච ච ඉන්ද්‍රියානි -පෙ- පඤ්ච ච බලානි සමාපජ්ජිං -පෙ- සමාපජ්ජාමි -පෙ- සමාපන්නො -පෙ- පඨමස්ස ච ඣානස්ස පඤ්චන්නඤ්ච බලානං ලාභීම්හි -පෙ- වසීම්හි -පෙ- පඨමඤ්ච ඣානං පඤ්ච ච බලානි සච්ඡිකතානි මයාති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

34. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස පඨමඤ්ච ඣානං සත්ත ච බොජ්ඣඞ්ගෙ සමාපජ්ජිං -පෙ- සමාපජ්ජාමි -පෙ- සමාපන්නො -පෙ- පඨමස්ස ච ඣානස්ස සත්තන්නඤ්ච බොජ්ඣඞ්ගානං ලාභීම්හි -පෙ- වසීම්හි -පෙ- පඨමඤ්ච ඣානං සත්ත ච බොජ්ඣඞ්ගා සච්ඡිකතා මයාති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

35. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස පඨමඤ්ච ඣානං අරියඤ්ච අට්ඨඞ්ගිකං මග්ගං සමාපජ්ජිං -පෙ- සමාපජ්ජාමි -පෙ- සමාපන්නො -පෙ- පඨමස්ස ච ඣානස්ස අරියස්ස ච අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස ලාභීම්හි -පෙ- වසීම්හි -පෙ- පඨමඤ්ච ඣානං අරියො ච අට්ඨඞ්ගිකො මග්ගො සච්ඡිකතො මයාති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

30. ආරොචෙය්‍ය යනු: ප්‍රථමධ්‍යානයට ද ශූන්‍යතසමාපත්තියට ද ...අනිමිත්තසමාපත්තියට ද ...අප්‍රණිහිතසමාපත්තියට ද සමවැදීමි ...සමවදිමි ...සමවදින්නෙමි වෙමි ...ප්‍රථමධ්‍යානය ද ...අප්‍රණිහිත සමාපත්තිය ද ලැබුවෙමි වෙමි ... වසඟ කෙළෙමි වෙමි ... මා විසින් ප්‍රථමධ්‍යානය ද ...අප්‍රණිහිතසමාපත්තිය ද පසක් කරන ලද යි අනුප සපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ.

31. ආරොචෙය්‍ය යනු: ප්‍රථමධ්‍යානයට ද ත්‍රිවිද්‍යාවනට ද සමවැදීමි ...සමවදිමි ...සමවදින්නෙමි වෙමි ...ප්‍රථමධ්‍යානය ද ත්‍රිවිද්‍යාවන් ද ලැබුවෙමි වෙමි ... වසඟ කෙළෙමි වෙමි ... මා විසින් ප්‍රථම ධ්‍යානය ද ත්‍රිවිද්‍යාවෝ ද පසක් කරන ලදහ යි අනුපසපනක්හට කියන්නහුට පචිති ඇවැත් වේ.

32. ආරොචෙය්‍ය යනු: ප්‍රථමධ්‍යානයට ද සතර සතිපට්ඨානයනට ද ...සතර සම්‍යක් ප්‍රධානයනට ද ... සතර ඍද්ධිපාදයනට ද සමවැදීමි ...සමවදිමි ... සමවදින්නෙමි වෙමි ... ප්‍රථමධ්‍යානය ද ... සතර ඍද්ධිපාදයන් ද ලැබුවෙමි වෙමි ... වසඟ කෙළෙමි වෙමි ... මා විසින් ප්‍රථමධ්‍යානය ... සතර ඍද්ධිපාදයෝ ද පසක් කරන ලදහ යි අනුපසපනක්හට කියන්නහුට පචිති ඇවැත් වේ.

33. ආරොචෙය්‍ය යනු: ප්‍රථමධ්‍යානයට ද පඤ්චෙන්ද්‍රියනට ද ... පඤ්චබලයනට ද සමවැදීමි ... සමවදිමි සමවදින්නෙමි වෙමි ... ප්‍රථම ධ්‍යානය ද ... පඤ්චබලයන් ද ලැබුවෙමි වෙමි ... වසඟ කෙළෙමි වෙමි ... මා විසින් ප්‍රථමධ්‍යානය ද පඤ්චබලයෝ ද පසක් කරන ලදහ යි අනුපසපනක්හට කියන්නහුට පචිති ඇවැත් වේ.

34. ආරොචෙය්‍ය යනු: ප්‍රථමධ්‍යානයට ද සප්තබොධ්‍යඞ්ගයනට ද සමවැදීමි ... සමවදිමි ... සමවදින්නෙමි වෙමි ... ප්‍රථමධ්‍යානය ද සප්ත බොධ්‍යඞ්ගයන් ද ලැබුවෙමි වෙමි ... වසඟ කෙළෙමි වෙමි ... මා විසින් ප්‍රථමධ්‍යානය ද සප්තබොධ්‍යඞ්ගයෝ ද පසක් කරන ලදහ යි අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ.

35. ආරොචෙය්‍ය යනු: ප්‍රථමධ්‍යානයට ද ආය්‍ය්‍යීඅෂ්ටාඞ්ගික මාර්ගයට ද සමවැදීමි ... සමවදිමි ... සමවදින්නෙමි වෙමි .. ප්‍රථමධ්‍යානය ද ආය්‍ය්‍යීඅෂ්ටාඞ්ගික මාර්ගය ද ලැබුවෙමි වෙමි ... වසඟ කෙළෙමි වෙමි ... මා විසින් ප්‍රථමධ්‍යානයද ආය්‍ය්‍යී අෂ්ටාඞ්ගික මාර්ගය ද පසක් කරන ලද්දේ යැ යි අනුපසපනක්හට කියන්නහුට පචිති ඇවැත් වේ.

36. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස පඨමඤ්ච ඣානං සොතා-පත්තිඵලඤ්ච -පෙ- සකදාගාමිඵලඤ්ච -පෙ- අනාගාමිඵලඤ්ච -පෙ- අරහත්තඤ්ච සමාපජ්ජිං -පෙ- සමාපජ්ජාමි -පෙ- සමාපන්නො -පෙ- පඨමස්ස ච ඣානස්ස අරහත්තස්ස ච ලාභිම්හි -පෙ- වසිම්හි -පෙ- පඨමඤ්ච ඣානං අරහත්තඤ්ච සච්ඡිකතං මයාති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

37. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස පඨමඤ්ච ඣානං සමාපජ්ජිං -පෙ- සමාපජ්ජාමි -පෙ- සමාපන්නො -පෙ- රාගො ච මෙ වන්තො -පෙ- දොසො ච මෙ වන්තො -පෙ- මොහො ච මෙ වන්තො වන්තො මුත්තො පහීනො පටිනිස්සට්ඨො උක්ඛෙටිතො සමුක්ඛෙටිතොති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

38. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස පඨමඤ්ච ඣානං සමාපජ්ජිං -පෙ- සමාපජ්ජාමි -පෙ- සමාපන්නො -පෙ- රාගා ච මෙ චිත්තං විනීවරණං -පෙ- දොසා ච මෙ චිත්තං විනීවරණං -පෙ- මොහා ච මෙ චිත්තං විනීවරණන්ති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

39. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස දුතියඤ්ච ඣානං තතියඤ්ච ඣානං -පෙ- දුතියඤ්ච ඣානං චතුත්ථඤ්ච ඣානං සමාපජ්ජිං -පෙ- සමාපජ්ජාමි -පෙ- සමාපන්නො -පෙ- දුතියස්ස ච ඣානස්ස චතුත්ථස්ස ච ඣානස්ස ලාභිම්හි -පෙ- වසිම්හි -පෙ- දුතියඤ්ච ඣානං චතුත්ථඤ්ච ඣානං සච්ඡිකතං මයාති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

40. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස දුතියඤ්ච ඣානං[1] -පෙ- මොහා ච මෙ චිත්තං විනීවරණන්ති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස. -පෙ-

41. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස දුතියඤ්ච ඣානං පඨමඤ්ච ඣානං සමාපජ්ජිං -පෙ- සමාපජ්ජාමි -පෙ- සමාපන්නො -පෙ- දුතියස්ස ච ඣානස්ස පඨමස්ස ච ඣානස්ස ලාභිම්හි -පෙ- වසිම්හි -පෙ- දුතියඤ්ච ඣානං පඨමඤ්ච ඣානං සච්ඡිකතං මයාති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස -පෙ-

**(මූලං සඞ්ඛිත්තං)**

1. දුතියඤ්ච ඣානං සුඤ්ඤතඤ්ච විමොක්ඛං - පෙ - මජසං.

36. **ආරොචෙය්‍ය** යනු : ප්‍රථමධ්‍යානයට ද සොතාපත්තිඵලයට ද ... සකෘදගාමිඵලයට ද ... අනාගාමිඵලයට ද ... අර්හත්ත්වයට ද සමවැදීමි ... සමවදිමි ... සමවදින්නෙම් වෙමි ... ප්‍රථම ධ්‍යානය ද ... අර්හත්ත්වය ද ලැබුවෙම් වෙමි ... වසඟ කෙළෙම් වෙමි ... මා විසින් ප්‍රථම ධ්‍යානය ද ... අර්හත්ත්වය ද පසක් කරන ලද යි අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ.

37. **ආරොචෙය්‍ය** යනු : ප්‍රථමධ්‍යානයට ද සමවැදීමි ... සමවදිමි ... සමවදින්නෙම් වෙමි ... මා විසින් රාගය ද ත්‍යක්ත යැ ... මා විසින් ද්වෙෂ ය ද ත්‍යක්ත යැ ... මා විසින් මොහය ද ත්‍යක්ත යැ වාන්ත යැ මුක්ත යැ ප්‍රහීණ යැ බැහැර කරන ලද්දේ යැ කැති ගන්වා පලවා හරින ලද්දේ යැ මොනවට කැති ගන්වා පලවා හරින ලද්දේ යැ යි අනුපසපනක්හට කියන්නහුට පචිති ඇවැත් වේ.

38. **ආරොචෙය්‍ය** යනු : ප්‍රථමධ්‍යානයට ද සමවැදීමි ... සමවදිමි ... සමවදින්නෙම් වෙමි ... රාගයෙනුදු මාගේ සිත වෙසෙසින් වැළැකිණ ... ද්වෙෂයෙනුදු මාගේ සිත වෙසෙසින් වැළැකිණ ... මොහයෙනුදු මාගේ සිත වෙසෙසින් වැළැකිණැ යි අනුපසපනක්හට කියන්නහුට පචිති ඇවැත් වේ.

39. **ආරොචෙය්‍ය** යනු : ද්විතීයධ්‍යානයට ද තෘතීයධ්‍යානයට ද ... ද්විතීයධ්‍යානයට ද චතුර්ථධ්‍යානයට ද සමවැදීමි ... සමවදිමි ... සමවදින්නෙම් වෙමි ... ද්විතීයධ්‍යානය ද චතුර්ත්ථධ්‍යානය ද ලැබුවෙම් වෙමි ... වසග කෙළෙම් වෙමි ... මා විසින් ද්විතීයධ්‍යානය ද චතුර්ත්ථධ්‍යානය ද පසක් කරන ලද යි අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ.

40. **ආරොචෙය්‍ය** යනු : ද්විතීයධ්‍යානයට ද ... මොහයෙනුදු මාගේ සිත වෙසෙසින් වැළැකිණැ යි අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ ...

41. **ආරොචෙය්‍ය** යනු: ද්විතීයධ්‍යානයට ද ප්‍රථම ධ්‍යානයට ද සමවැදීමි ... සමවදිමි ... සමවදින්නෙම් වෙමි ... ද්විතීයධ්‍යානය ද ප්‍රථමධ්‍යානය ද ලැබුවෙම් වෙමි ... වසඟ කෙළෙම් වෙමි ... මා විසින් ද්විතීයධ්‍යානය ද ප්‍රථමධ්‍යානය ද පසක් කරන ලද යි අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ ...

**(මූලය සංක්ෂිප්ත යි)**

42. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස මොහා ච මෙ චිත්තං විනීවරණං පඨමඤ්ච ඣානං සමාපජ්ජිං -පෙ- සමාපජ්ජාමි -පෙ- සමාපන්නො -පෙ- මොහා ච මෙ චිත්තං විනීවරණං පඨමස්ස ච ඣානස්ස ලාභීම්හි -පෙ- වසීම්හි -පෙ- මොහා ච මෙ චිත්තං විනීවරණං පඨමඤ්ච ඣානං සච්ඡිකතං මයාති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස -පෙ-

43. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස මොහා ච මෙ චිත්තං විනීවරණං, දොසා ච මෙ චිත්තං විනීවරණන්ති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස -පෙ-

44. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස පඨමඤ්ච ඣානං දුතියඤ්ච ඣානං තතියඤ්ච ඣානං චතුත්ථඤ්ච ඣානං සුඤ්ඤතඤ්ච විමොක්ඛං අනිමිත්තඤ්ච විමොක්ඛං අප්පණිහිතඤ්ච විමොක්ඛං සුඤ්ඤතඤ්ච සමාධිං අනිමිත්තඤ්ච සමාධිං අප්පණිහිතඤ්ච සමාධිං සුඤ්ඤතඤ්ච සමාපත්තිං අනිමිත්තඤ්ච සමාපත්තිං අප්පණිහිතඤ්ච සමාපත්තිං තිස්සො ච විජ්ජා චත්තාරො ච සතිපට්ඨානෙ චත්තාරො ච සම්මප්පධානෙ චත්තාරො ච ඉද්ධිපාදෙ පඤ්ච ච ඉන්ද්‍රියානි පඤ්ච ච බලානි සත්ත ච බොජ්ඣඞ්ගෙ අරියඤ්ච අට්ඨඞ්ගිකං මග්ගං සොතාපත්තිඵලඤ්ච සකදාගාමිඵලඤ්ච අනාගාමිඵලඤ්ච අරහත්තඤ්ච සමාපජ්ජිං -පෙ- සමාපජ්ජාමි -පෙ- සමාපන්නො -පෙ-[1] රාගො ච මෙ වන්තො -පෙ- දොසො ච මෙ වන්තො -පෙ- මොහො ච මෙ වන්තො වන්තො මුත්තො පහීනො පටිනිස්සට්ඨො උක්ඛෙටිතො සමුක්ඛෙටිතො, රාගා ච මෙ චිත්තං විනීවරණං දොසා ච මෙ චිත්තං විනීවරණං මොහා ච මෙ චිත්තං විනීවරණන්ති භණන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

45. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස පඨමං ඣානං සමාපජ්ජින්ති වත්තුකාමො දුතියං ඣානං සමාපජ්ජින්ති භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති පාචිත්තියස්ස න පටිවිජානන්තස්ස ආපත්ති දුක්කටස්ස.

46. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස පඨමං ඣානං සමාපජ්ජින්ති වත්තුකාමො තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං -පෙ- සුඤ්ඤතං විමොක්ඛං -පෙ- අනිමිත්තං විමොක්ඛං -පෙ- අප්පණිහිතං විමොක්ඛං -පෙ- සුඤ්ඤතං සමාධිං -පෙ- අනිමිත්තං සමාධිං -පෙ- අප්පණිහිතං සමාධිං -පෙ- සුඤ්ඤතං සමාපත්තිං -පෙ- අනිමිත්තං සමාපත්තිං -පෙ- අප්පණිහිතං සමාපත්තිං -පෙ- තිස්සො විජ්ජා -පෙ- චත්තාරො සතිපට්ඨානෙ -පෙ-

1. සමාපන්නො ති පදං නත්ථි මරම්ම ඡට්ඨසඞ්ගීති පිටකෙ,

42. **ආරෝචෙය්‍ය** යනු: මොහයෙනුදු මසිත වෙසෙසින් වැළැකිණ, ප්‍රථමධ්‍යානයට ද සමවැදීමි ... සමවදිමි ... සමවදින්නෙම් වෙමි ... මොහයෙනුදු මසිත වෙසෙසින් වැළැකිණ, ප්‍රථමධ්‍යානය ද ලැබුවෙම් වෙමි ... වසඟ කෙළෙම් වෙමි ... මොහයෙනුදු මසිත වෙසෙසින් වැළැකිණ, ප්‍රථමධ්‍යානය ද මා විසින් පසක් කරන ලදූ යි අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ.

43. **ආරෝචෙය්‍ය** යනු: මොහයෙනුදු මසිත වෙසෙසින් වැළැකිණ, ද්වෙෂයෙනුදු මසිත වෙසෙසින් වැළැකිණැ යි අනුපසපනක්හට කියන්නහුට පචිති ඇවැත් වේ ...

44. **ආරෝචෙය්‍ය** යනු: ප්‍රථමධ්‍යානයට ද ද්විතීයධ්‍යානයට ද තෘතීයධ්‍යානයට ද චතුර්ත්ථධ්‍යානයට ද ශූන්‍යත විමොක්ෂයට ද අනිමිත්ත විමොක්ෂයට ද අප්‍රණිහිතවිමොක්ෂයට ද ශූන්‍යතසමාධියට ද අනිමිත්ත සමාධියට ද අප්‍රණිහිත සමාධියට ද ශූන්‍යත සමාපත්තියට ද අනිමිත්ත සමාපත්තියට ද අප්‍රණිහිතසමාපත්තියට ද ත්‍රිවිද්‍යාවනට ද සතර සතිපට්ඨානයනට ද සතර සම්‍යක්ප්‍රධානයනට ද සතර ඍද්ධිපාදයනට ද පඤ්චෙන්ද්‍රියනට ද පඤ්චබලයනට ද සප්ත බොධ්‍යඞ්ගයනට ද ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයට ද සොතාපත්තිඵලයට ද සකදගාමිඵලයටද අනාගාමි ඵලයට ද අරහත්ඵලයට ද සමවැදීමි ... සමවදිමි ... සමවදින්නෙම් වෙමි ... රාගය ද මා විසින් ත්‍යක්ත යැ ... ද්වෙෂය ද මා විසින් ත්‍යක්ත යැ ...........මොහය ද මා විසින් ත්‍යක්ත යැ වාන්ත යැ මුක්ත යැ ප්‍රහීණ යැ බැහැර කරන ලද්දේ යැ තැති ගන්වා පලවා හරින ලද්දේ යැ මොනවට තැති ගන්වා පලවා හරින ලද්දේ යැ රාගයෙනුදු මසිත වෙසෙසින් වැළැකිණ, ද්වෙෂයෙනුදු මසිත වෙසෙසින් වැළැකිණ, මොහයෙනුදු මසිත වෙසෙසින් වැළැකිණැ යි අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ.

45. **ආරෝචෙය්‍ය** යනු: ප්‍රථමධ්‍යානයට සමවැදීමි යි කියනු කැමැත්තේ ද්විතීයධ්‍යානයට සමවැදීමි යි කී කෙණෙහි මැ දන්නා වූ අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ. කී කෙණෙහි මැ නො දත දුකුළා ඇවැත් වේ.

46. **ආරෝචෙය්‍ය** යනු: ප්‍රථමධ්‍යානයට සමවැදීමි යි කියනු කැමැත්තේ තෘතීයධ්‍යානයට ... චතුර්ත්ථධ්‍යානයට ... ශූන්‍යත විමොක්ෂයට ... අනිමිත්තවිමොක්ෂයට ... අප්‍රණිහිතවිමොක්ෂයට ... ශූන්‍යතසමාධියට ... අනිමිත්තසමාධියට ... අප්‍රණිහිත-සමාධියට ... ශූන්‍යතසමාපත්තියට ... අනිමිත්තසමාපත්තියට ... අප්‍රණිහිතසමාපත්තියට ... ත්‍රිවිද්‍යාවනට ... සතර සතිපට්ඨානයනට ...

චත්තාරො සම්මප්පධානෙ -පෙ- චත්තාරො ඉද්ධිපාදෙ -පෙ- පඤ්චින්ද්‍රියානි -පෙ- පඤ්චබලානි -පෙ- සත්තබොජ්ඣඞ්ගෙ -පෙ- අරියං අට්ඨඞ්ගිකං මග්ගං -පෙ- සොතාපත්තිඵලං -පෙ- සකදාගාමිඵලං -පෙ- අනාගාමිඵලං -පෙ- අරහත්තං සමාපජ්ජිං -පෙ- රාගො ච මෙ වන්තො -පෙ- දොසො ච මෙ වන්තො -පෙ- මොහො ච මෙ වන්තො වන්තො මුත්තො පහීනො පටිනිස්සට්ඨො උක්ඛෙටිතො සමුක්ඛෙටිතො, රාගා මෙ චිත්තං විනීවරණං -පෙ- දොසා මෙ චිත්තං විනීවරණං -පෙ- මොහා මෙ චිත්තං විනීවරණන්ති භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති පාචිත්තියස්ස, න පටිවිජානන්තස්ස ආපත්ති දුක්කටස්ස.

47. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස දුතියං ඣානං සමාපජ්ජින්ති වත්තුකාමො -පෙ- මොහා මෙ චිත්තං විනීවරණන්ති භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති පාචිත්තියස්ස, න පටිවිජානන්තස්ස ආපත්ති දුක්කටස්ස.

48. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස දුතියං ඣානං සමාපජ්ජින්ති වත්තුකාමො පඨමං ඣානං සමාපජ්ජින්ති භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති පාචිත්තියස්ස, න පටිවිජානන්තස්ස ආපත්ති දුක්කටස්ස -පෙ-.

(මූලං සඞ්ඛිත්තං)

49. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස මොහා මෙ චිත්තං විනීවරණන්ති වත්තුකාමො පඨමං ඣානං සමාපජ්ජින්ති භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති පාචිත්තියස්ස, න පටිවිජානන්තස්ස ආපත්ති දුක්කටස්ස -පෙ-

50. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස මොහා මෙ චිත්තං විනීවරණන්ති වත්තුකාමො දොසා මෙ චිත්තං විනීවරණන්ති භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති පාචිත්තියස්ස, න පටිවිජානන්තස්ස ආපත්ති දුක්කටස්ස -පෙ-.

51. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස පඨමඤ්ච ඣානං දුතියඤ්ච ඣානං තතියඤ්ච ඣානං චතුත්ථඤ්ච ඣානං -පෙ- දොසා ච මෙ චිත්තං විනීවරණන්ති වත්තුකාමො මොහා මෙ චිත්තං විනීවරණන්ති භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති පාචිත්තියස්ස, න පටිවිජානන්තස්ස ආපත්ති දුක්කටස්ස -පෙ-

සතර සම්‍යක්ප්‍රධානයනට ... සතරඍද්ධිපාදයනට ... පඤ්චෙන්ද්‍රියනට ... පඤ්චබලයනට ... සප්ත බොධ්‍යඞ්ගයනට ... ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයට ... සොතාපත්තිඵලයට ... සකදාගාමිඵලයට ... අනාගාමි ඵලයට ... අරහත්තඵලයට සමවැදීමි ... රාගය ද මා විසින් ත්‍යක්ත යැ ... ද්වෙෂය ද මා විසින් ත්‍යක්ත යැ ... මොහය ද මා විසින් ත්‍යක්ත යැ වාන්ත යැ මුක්ත යැ ප්‍රහීණ යැ බැහැර කරන ලද්දේ යැ තැති ගන්වා පලවා හරින ලද්දේ යැ මොනවට තැති ගන්වා පලවා හරින ලද්දේ යැ, රාගයෙන් මසිත වෙසෙසින් වැළැකිණ ... ද්වෙෂයෙන් මසිත වෙසෙසින් වැළැකිණ ... මොහයෙන් මසිත වෙසෙසින් වැළැකිණ යි කී කෙණෙහි මැ දන්නා වූ අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ. කී කෙණෙහි මැ නො දත දුකුළා ඇවැත් වේ.

47. **ආරොචෙය්‍ය** යනු: ද්විතීයධ්‍යානයට සමවැදීමි යි කියනු කැමැත්තේ ... මොහයෙන් මසිත වෙසෙසින් වැළැකිණැ යි කී කෙණෙහි මැ දන්නා වූ අනුසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ. කී කෙණෙහි මැ නො දත දුකුළා ඇවැත් වේ.

48. **ආරොචෙය්‍ය** යනු: දවිතීයධ්‍යානයට සමවැදීමි යි කියනු කැමැත්තේ ප්‍රථමධ්‍යානයට සමවැදීමි යි කී කෙණෙහි මැ දන්නා වූ අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ. කී කෙණෙහි මැ නො දත දුකුළා ඇවැත් වේ.

**(මූලය සංක්ෂිප්ත යි)**

49. **ආරොචෙය්‍ය** යනු: මොහයෙන් මසිත වෙසෙසින් වැළැකිණැයි කියනු කැමැත්තේ ප්‍රථමධ්‍යානයට සමවැදීමි යි කී කෙණෙහි මැ දන්නා වූ අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ. කී කෙණෙහි මැ නො දත දුකුළා ඇවැත් වේ ...

50. **ආරොචෙය්‍ය** යනු: මොහයෙන් මසිත වෙසෙසින් වැළැකිණැ යි කියනු කැමැත්තේ ද්වෙෂයෙන් මසිත වෙසෙසින් වැළැකිණැ යි කී කෙණෙහි මැ දන්නා වූ අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ. කී කෙණෙහි මැ නො දත දුකුළා ඇවැත් වේ.

51. **ආරොචෙය්‍ය** යනු: ප්‍රථමධ්‍යානයට ද ද්විතීයධ්‍යානයට ද තෘතීයධ්‍යානයට ද චතුර්ත්ථධ්‍යානයට ද ... ද්වෙෂයෙනුදු මසිත වෙසෙසින් වැළැකිණැ යි කියනු කැමැත්තේ මොහයෙන් මසිත වෙසෙසින් වැළැකිණැ යි කී කෙණෙහි මැ දන්නා වූ අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ. කී කෙණෙහි මැ නො දත දුකුළා ඇවැත් වේ.

52. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස දුතියඤ්ච ඣානං තතියඤ්ච ඣානං චතුත්ථඤ්ච ඣානං -පෙ- මොහා ච මෙ චිත්තං විනීවරණන්ති වත්තුකාමො පඨමං ඣානං සමාපජ්ජින්ති භණන්තස්ස පටිවිජානන්තස්ස ආපත්ති පාචිත්තියස්ස. න පටිවිජානන්තස්ස ආපත්ති දුක්කටස්ස -පෙ-

53. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස යො තෙ විහාරෙ වසි සො භික්ඛු පඨමං ඣානං සමාපජ්ජි -පෙ- සමාපජ්ජති -පෙ- සමාපන්නො සො භික්ඛු පඨමස්ස ඣානස්ස ලාභී -පෙ- වසී තෙන භික්ඛුනා පඨමං ඣානං සච්ඡිකතන්ති භණන්තස්ස ආපත්ති දුක්කටස්ස.

54. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස යො තෙ විහාරෙ වසි සො භික්ඛු දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං සමාපජ්ජි -පෙ- සමාපජ්ජති -පෙ- සමාපන්නො සො භික්ඛු චතුත්ථස්ස ඣානස්ස ලාභී -පෙ- වසී තෙන භික්ඛුනා චතුත්ථං ඣානං සච්ඡිකතන්ති භණන්තස්ස ආපත්ති දුක්කටස්ස -පෙ-

55. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස යො තෙ විහාරෙ වසි සො භික්ඛු සුඤ්ඤතං විමොක්ඛං -පෙ- අනිමිත්තං විමොක්ඛං -පෙ- අප්පණිහිතං විමොක්ඛං -පෙ- සුඤ්ඤතං සමාධිං -පෙ- අනිමිත්තං සමාධිං -පෙ- අප්පණිහිතං සමාධිං සමාපජ්ජි -පෙ- සමාපජ්ජති -පෙ- සමාපන්නො සො භික්ඛු අප්පණිහිතස්ස සමාධිස්ස ලාභී -පෙ- වසී තෙන භික්ඛුනා අප්පණිහිතො සමාධි සච්ඡිකතොති භණන්තස්ස ආපත්ති දුක්කටස්ස.

56. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස යො තෙ විහාරෙ වසි සො භික්ඛු සුඤ්ඤතං සමාපත්තිං -පෙ- අනිමිත්තං සමාපත්තිං -පෙ- අප්පණිහිතං සමාපත්තිං සමාපජ්ජි -පෙ- සමාපජ්ජති -පෙ- සමාපන්නො, සො භික්ඛු[1] අප්පණිහිතාය සමාපත්තියා ලාභී -පෙ- වසී තෙන භික්ඛුනා අප්පණිහිතා සමාපත්ති සච්ඡිකතාති භණන්තස්ස ආපත්ති දුක්කටස්ස -පෙ-

57. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස යො තෙ විහාරෙ වසි, සො භික්ඛු තිස්සො විජ්ජා -පෙ- චත්තාරො සතිපට්ඨානෙ -පෙ- චත්තාරො සම්මප්පධානෙ -පෙ- චත්තාරො ඉද්ධිපාදෙ -පෙ- පඤ්චින්ද්‍රියානි -පෙ- පඤ්චබලානි -පෙ- සත්තබොජ්ඣඞ්ගෙ -ඞ්ගෙ අරියං අට්ඨඞ්ගිකං මග්ගං -පෙ- සොතාපත්තිඵලං -පෙ- සකදාගාමිඵලං -පෙ- අනාගාමිඵලං -පෙ- අරහත්තං සමාපජ්ජි -පෙ- සමාපජ්ජති -පෙ- සමාපන්නො තස්ස භික්ඛුනො රාගො වන්තො -පෙ- දොසො වන්තො -පෙ- මොහො වන්තො වන්තො මුත්තො පහීනො පටිනිස්සට්ඨො උක්ඛෙටිතො සමුක්ඛෙටිතො තස්ස භික්ඛුනො රාගා චිත්තං විනීවරණං දොසා චිත්තං විනීවරණං මොහා චිත්තං විනීවරණන්ති භණන්තස්ස ආපත්ති දුක්කටස්ස.

1. සො භික්ඛු ඉති මරම්මඡට්ඨසඞ්ගීති පිටකෙ නදිස්සතෙ.

52. **ආරෝචෙය්‍ය** යනු: ද්විතීයධ්‍යානයට ද තෘතීයධ්‍යානයට ද චතුර්ත්ථධ්‍යානය ට ද ... මොහයෙනුදු මසිත වෙසෙසින් වැළැකිණැ යි කියනු කැමැත්තේ ප්‍රථමධ්‍යානයට සමවැදීමි යි කී කෙණෙහි මැ දන්නා වූ අනුපසපනක්හට බණන්නහුට පචිති ඇවැත් වේ. කී කෙණෙහි මැ නො දත දුකුළා ඇවැත් වේ.

53. **ආරෝචෙය්‍ය** යනු: යමෙක් තොපගේ වෙහෙරෙහි විසී ද ඒ මහණ ප්‍රථමධ්‍යානයට සමවැදී යැ ... සමවදියි ... සමවදින්නේ යැ ... ඒ මහණ ප්‍රථමධ්‍යානය ලැබුවේ වෙයි ... වසඟ කෙළේ වෙයි, ඒ මහණහු විසින් ප්‍රථමධ්‍යානය පසක් කරන ලදූ යි අනුපසපනක්හට බණන්නහුට දුකුළා ඇවැත් වේ.

54. **ආරෝචෙය්‍ය** යනු: යමෙක් තොපගේ වෙහෙරෙහි විසී ද ඒ මහණ ද්විතීයධ්‍යානයට ... තෘතීයධ්‍යානයට ... චතුර්ත්ථධ්‍යානයට සමවැදී ය ... සමවදියි ... සමවදින්නේ වෙයි ... ඒ මහණ චතුර්ත්ථධ්‍යානය ලැබුවේ වෙයි. ... වසඟ කෙළේ වෙයි ඒ මහණහු විසින් චතුර්ත්ථධ්‍යානය පසක් කරන ලදූ යි අනුපසපනක්හට බණන්නහුට දුකුළා ඇවැත් වේ.

55. **ආරෝචෙය්‍ය** යනු: යමෙක් තොපගේ වෙහෙරෙහි විසී ද ඒ මහණ ශූන්‍යතවිමොක්ෂයට ... අනිමිත්තවිමොක්ෂයට ... අප්‍රණිහිත විමොක්ෂයට ... ශූන්‍යත සමාධියට ... අනිමිත්තසමාධියට ... අප්‍රණිහිත සමාධියට සමවැදී යැ ... සමවදියි ... සමවදින්නේ වෙයි. ... ඒ මහණ අප්‍රණිහිතසමාධිය ලැබුවේ වෙයි ... වසඟ කෙළේ වෙයි. ඒ මහණහු විසින් අප්‍රණිහිතසමාධිය පසක් කරන ලද්දේ යැ යි අනුපසපනක්හට බණන්නහුට දුකුළා වේ.

56. **ආරෝචෙය්‍ය** යනු: යමෙක් තොපගේ වෙහෙරෙහි විසී ද ඒ මහණ ශූන්‍යතසමාපත්තියට ... අනිමිත්තසමාපත්තියට ... අප්‍රණිහිත සමාපත්තියට සමවැදී යැ ... සමවදියි ... සමවදින්නේ වෙයි. ඒ මහණ අප්‍රණිහිතසමාපත්තිය ලැබුවේ වෙයි ... වසඟ කෙළේ වෙයි, ඒ මහණහු විසින් අප්‍රණිහිතසමාපත්තිය පසක් කරන ලදූ යි අනුපසපනක්හට බණන්නහුට දුකුළා ඇවැත් වේ.

57. **ආරෝචෙය්‍ය** යනු: යමෙක් තොපගේ වෙහෙරෙහි විසී ද ඒ මහණ ත්‍රිවිද්‍යාවනට සතර සතිපට්ඨානයනට සතර සම්‍යක්ප්‍රධානයනට සතර සෘද්ධිපාදයනට පඤ්චේන්ද්‍රියනට පඤ්චබලයනට සප්තබොධ්‍යඞ්ග-යනට ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ගයට සොතාපත්තිඵලයට සකෘදගාමිඵලයට අනාගාමිඵලයට අරහත්තඵලයට සමවැදී ය ... සමවදියි ... සමවදින්නේ වෙයි. ඒ මහණහු විසින් රාගය ත්‍යක්ත යැ ... ද්වෙෂය ත්‍යක්ත යැ ... මොහය ත්‍යක්ත යැ වාන්ත යැ මුක්ත යැ ප්‍රහීණ යැ බැහැර කරන ලද්දේ යැ නැති ගන්වා පළවා හරින ලද්දේ යැ මොනවට නැති ගන්වා පළවා හරින ලද්දේ යැ ඒ මහණහුගේ සිත රාගයෙන් වෙසෙසින් වැළැකිණ, ද්වෙෂයෙන් සිත වෙසෙසින් වැළැකිණ, මොහයෙන් සිත වෙසෙසින් වැළැකිණැ යි අනුපසපනක්හට බණන්නහුට දුකුළා ඇවැත් වේ.

58. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස යො තෙ විහාරෙ වසි, සො භික්ඛු සුඤ්ඤාගාරෙ පඨමං ඣානං -පෙ- දුතියං ඣානං -පෙ- තතියං ඣානං -පෙ- චතුත්ථං ඣානං සමාපජ්ජි -පෙ- සමාපජ්ජති -පෙ- සමාපන්නො, සො භික්ඛු සුඤ්ඤාගාරෙ චතුත්ථස්ස ඣානස්ස ලාභී -පෙ- වසී තෙන භික්ඛුනා සුඤ්ඤාගාරෙ චතුත්ථං ඣානං සච්ඡිකතන්ති භණන්තස්ස ආපත්ති දුක්කටස්ස.

59. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස යො තෙ විහාරං පරිභුඤ්ජි[1] -පෙ- යො තෙ චීවරං පරිභුඤ්ජි -පෙ- යො තෙ පිණ්ඩපාතං පරිභුඤ්ජි -පෙ- යො තෙ සෙනාසනං පරිභුඤ්ජි -පෙ- යො තෙ ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පරිභුඤ්ජි, සො භික්ඛු සුඤ්ඤාගාරෙ චතුත්ථං ඣානං සමාපජ්ජි -පෙ- සමාපජ්ජති -පෙ- සමාපන්නො, සො භික්ඛු සුඤ්ඤාගාරෙ චතුත්ථස්ස ඣානස්ස ලාභී -පෙ- වසී තෙන භික්ඛුනා සුඤ්ඤාගාරෙ චතුත්ථං ඣානං සච්ඡිකතන්ති භණන්තස්ස ආපත්ති දුක්කටස්ස.

60. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස යෙන තෙ විහාරො පරිභුත්තො -පෙ- යෙන තෙ චීවරං පරිභුත්තං -පෙ- යෙන තෙ පිණ්ඩපාතො පරිභුත්තො -පෙ- යෙන තෙ සෙනාසනං පරිභුත්තං -පෙ- යෙන තෙ ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරො පරිභුත්තො, සො භික්ඛු සුඤ්ඤාගාරෙ චතුත්ථං ඣානං සමාපජ්ජි -පෙ- සමාපජ්ජති -පෙ- සමාපන්නො, සො භික්ඛු සුඤ්ඤාගාරෙ චතුත්ථස්ස ඣානස්ස ලාභී -පෙ- වසී තෙන භික්ඛුනා සුඤ්ඤාගාරෙ චතුත්ථං ඣානං සච්ඡිකතන්ති භණන්තස්ස ආපත්ති දුක්කටස්ස.

61. ආරොචෙය්‍යාති අනුපසම්පන්නස්ස යං ත්වං ආගම්ම විහාරං අදසි -පෙ- චීවරං අදසි -පෙ- පිණ්ඩපාතං අදසි -පෙ- සෙනාසනං අදසි -පෙ- ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං අදසි, සො භික්ඛු සුඤ්ඤාගාරෙ චතුත්ථං ඣානං සමාපජ්ජි -පෙ- සමාපජ්ජති -පෙ- සමාපන්නො, සො භික්ඛු සුඤ්ඤාගාරෙ චතුත්ථස්ස ඣානස්ස ලාභී -පෙ- වසී තෙන භික්ඛුනා සුඤ්ඤාගාරෙ චතුත්ථං ඣානං සච්ඡිකතන්ති භණන්තස්ස ආපත්ති දුක්කටස්ස.

62. අනාපත්ති: උපසම්පන්නස්ස භූතං ආරොචෙති, ආදිකම්මිකස්සාති.

භූතාරොචනසික්ඛාපදං අට්ඨමං.

1. යො තෙ විහාරං පරිභුඤ්ජි, මරම්මඡට්ඨසඞ්ගීතිපිටකෙ න දිස්සතෙ.

58. **ආරොචෙය්‍ය** යනු: යමෙක් තොපගේ වෙහෙරෙහි විසී ද ඒ මහණ ශූන්‍යාගාරයෙහි ප්‍රථමධ්‍යානයට ... ද්විතීයධ්‍යානයට ... තෘතීයධ්‍යානයට ... චතුර්ත්ථධ්‍යානයට සමවැදීයැ ... සමවදියි ... සමවදින්නේ වෙයි. ඒ මහණ ශූන්‍යාගාරයෙහි චතුර්ථධ්‍යානය ලැබුවේ වෙයි ... වසග කෙළේ වෙයි. ඒ මහණහු විසින් ශූන්‍යාගාරයෙහි චතුර්ත්ථධ්‍යානය පසක් කරන ලද යි අනුපසපනක් හට කියන්නහුට දුකුළා ඇවැත් වේ.

59. **ආරොචෙය්‍ය** යනු: යමෙක් තොපගේ වෙහෙර පරිභොග කෙළේ ද ... යමෙක් තොපගේ සිවුරු පරිභොග කෙළේ ද ... යමෙක් තොපගේ පිණ්ඩපාතය වැළඳී ද ... යමෙක් තොපගේ සෙනසුන පරිභොග කෙළේ ද ... යමෙක් තොපගේ ගිලන්පස බෙහෙත් පිරිකර වැළඳී ද ඒ මහණ ශූන්‍යාගාරයෙහි චතුර්ථධ්‍යානයට සම වැදී යැ ... සමවදියි ... සමවදින්නේ වෙයි. ඒ මහණ ශූන්‍යාගාරයෙහි චතුර්ථධ්‍යානය ලැබුවේ වෙයි ... වසග කෙළේ වෙයි. ඒ මහණහු විසින් ශූන්‍යාගාරයෙහි චතුර්ථධ්‍යානය පසක් කරන ලද යි අනුපසපනක්හට බණන්නහුට දුකුළා ඇවැත් වේ.

60. **ආරොචෙය්‍ය** යනු : යමකු විසින් තොපගේ විහාරය පරිභොග කරන ලද්දේ වේ ද ... යමකු විසින් තොපගේ සිවුර පරිභොග කරන ලද්දේ වේ ද ... යමකු විසින් තොපගේ පිණ්ඩපාතය වළඳන ලද්දේ වේ ද ... යමකු විසින් තොපගේ සෙනසුන පරිභොග කරන ලද්දේ වේ ද ... යමකු විසින් තොපගේ ගිලන්පස බෙහෙත් පිරිකර වළඳන ලද ද ඒ මහණ ශූන්‍යාගාරයෙහි චතුර්ත්ථධ්‍යානයට සමවැදී යැ ... සමවදියි ... සමවදින්නේ වෙයි. ඒ මහණ ශූන්‍යාගාරයෙහි චතුර්ත්ථධ්‍යානය ලැබුවේ වෙයි ... වසග කෙළේ වෙයි. ඒ මහණහු විසින් ශූන්‍යගාරයෙහි චතුර්ත්ථධ්‍යානය පසක් කරන ලද යි අනුපසපනක්හට බණන්නහුට දුකුළා ඇවැත් වේ.

61. **ආරොචෙය්‍ය** යනු: තෙපි යමකු කරා පැමිණ විහාරයක් දුන්නහු ද ... සිවුරක් දුන්නහු ද ... පිණ්ඩපාතයක් දුන්නහු ද ... සෙනසුනක් දුන්නහු ද ... ගිලන්පස බෙහෙත් පිරිකර දුන්නහු ද ... ඒ මහණ ශූන්‍යාගාරයෙහි චතුර්ත්ථධ්‍යානයට සමවැදී යැ ... සමවදියි ... සමවදින්නේ වෙයි. ඒ මහණ ශූන්‍යාගාරයෙහි චතුර්ථධ්‍යානය ලැබුවේ වෙයි. ... වසග කෙළේ වෙයි. ඒ මහණහු විසින් ශූන්‍යාගාරයෙහි චතුර්ථධ්‍යානය පසක් කරන ලද යි අනුපසපනක්හට බණන්නහුට දුකුළා ඇවැත් වේ.

62. උපසපනක්හට ඇති උතුරුමිනිස්දහමක් ඇරොජා නම් ඇවැත් නැත, ආදිකම්මිකහට ඇවැත් නැති.

**අටවැනි භූතාරොචන ශික්ෂාපද යි.**

# 6 . 1 . 9

## දුට්ඨුල්ලාරොචනසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා උපනන්දො සක්‍යපුත්තො ඡබ්බග්ගියෙහි භික්ඛූහි සද්ධිං භණ්ඩනකතො හොති. සො සඤ්චෙතනිකං සුක්කවිස්සට්ඨිං ආපත්තිං ආපජ්ජිත්වා සඞ්ඝං තස්සා ආපත්තියා පරිවාසං යාචි. තස්ස සඞ්ඝො තස්සා ආපත්තියා පරිවාසං අදාසි.

2. තෙන ඛො පන සමයෙන සාවත්ථියං අඤ්ඤතරස්ස පූගස්ස සඞ්ඝභත්තං හොති. සො පරිවසන්තො භත්තග්ගෙ ආසනපරියන්තෙ නිසීදි. ඡබ්බග්ගියා භික්ඛූ තෙ උපාසකෙ එතදවොචුං: "එසො ආවුසො ආයස්මා උපනන්දො සක්‍යපුත්තො තුම්හාකං සම්භාවිතො කුලූපගො[1] යෙනෙව හත්ථෙන සද්ධාදෙය්‍යං භුඤ්ජති තෙනෙව හත්ථෙන උපක්කමිත්වා අසුචිං මොචෙසි. සො සඤ්චෙතනිකං සුක්කවිස්සට්ඨිං ආපත්තිං ආපජ්ජිත්වා සඞ්ඝං තස්සා ආපත්තියා පරිවාසං යාචි. තස්ස සඞ්ඝො තස්සා ආපත්තියා පරිවාසං අදාසි. සො පරිවසන්තො ආසනපරියන්තෙ නිසින්නො"ති.

3. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුස්ස දුට්ඨුල්ලං ආපත්තිං අනුපසම්පන්නස්ස ආරොචෙස්සන්තී"ති -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ භික්ඛුස්ස දුට්ඨුල්ලං ආපත්තිං අනුපසම්පන්නස්ස ආරොචෙථාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා භික්ඛුස්ස දුට්ඨුල්ලං ආපත්තිං අනුපසම්පන්නස්ස ආරොචෙස්සථ, නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු භික්ඛුස්ස දුට්ඨුල්ලං ආපත්තිං අනුපසම්පන්නස්ස ආරොචෙය්‍ය අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා[2] පාචිත්තිය"න්ති.**

4. **යොපනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති. **භික්ඛුස්සාති** අඤ්ඤස්ස භික්ඛුස්ස. **දුට්ඨුල්ලා** නාම ආපත්ති චත්තාරි ච පාරාජිකානි තෙරස ච සඞ්ඝාදිසෙසා. **අනුපසම්පන්නො** නාම භික්ඛුඤ්ච භික්ඛුනිඤ්ච ඨපෙත්වා අවසෙසො අනුපසම්පන්නො නාම. **ආරොචෙය්‍යාති** ආරොචෙති[3] ඉත්ථියා වා පුරිසස්ස වා ගහට්ඨස්ස වා පබ්බජිතස්ස වා.

1. කුලූපකො - මජසං  2. භික්ඛුසම්මතියා - ස්‍යා  3. ආරොචෙය්‍ය - මජසං

## 6. 1. 9

## දුට්ඨුල්ලාරොචන ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජේතවන නම් අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩවෙසෙති. එසමයෙහි වනාහි ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර තෙමේ සවග මහණුන් සමඟ කලහ කළේ වෙයි. හෙතෙම දැන දැන සුකුරුම්දීම් ඇවතකට පැමිණ සඟුන් ගෙන් ඒ ඇවතට පිරිවෙස් යැදී. සඞ්ඝ තෙමේ ඔහුට ඒ ඇවතට පිරිවෙස් දුන්නේ යි.

2. එසමයෙහි සැවැතෙහි එක්තරා සමූහයකගේ සඟබතෙක් වෙයි. හෙ පිරිවසමින් භක්තාග්‍රයෙහි අසුන් පිරියත්හි හුන්නේ යැ. සවග මහණුහු ඒ උවසුවනට මෙය කීහු: ඇවැත්නි, තෙල ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍ර තෙමේ තොප විසින් සම්භාවනා කරන ලද කුලූපගයෙකි. යම්බඳු මැ අතෙකින් සැදැහැයෙන් දුන් දෙය වළඳා ද, එබඳු මැ අතින් උපක්‍රම කොට අශුචි මිදුවේ යැ. හේ සංචෙතනික සුක්කවිස්සට්ඨි ඇවැතකට පැමිණ සඟුන්ගෙන් ඒ ඇවැතට පිරිවෙස් යැදී. සඞ්ඝ තෙමේ ඔහුට ඒ ඇවැතට පිරිවෙස් දුන්නේ යැ. හේ පිරිවසමින් අසුන් පිරියත්හි හුන්නේ යි.

3. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලාමක කොට යිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් සවග මහණුහු මහණක්හුගේ දුළුල් ඇවැතක් අනුපසපනක්හට දැන්වූහු ද යි ... සැබෑද මහණෙනි, තෙපි මහණක්හුගේ දුළුල් ඇවැතක් අනුපසපනක්හට දන්වහු ද ? සැබැව භාග්‍යවතුනි, භාග්‍යවත් බුදුහු ගැරහූහ .. කෙසේ නම් හිස්පුරුෂයෙනි, තෙපි මහණක්හුගේ දුළුල් ඇවැතක් අනුපස-පනක්හට දැන්වූවහු ද? හිස්පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදයට හෝ නො වෙයි ... මෙසේ ද වනාහි මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**"යම් මහණෙක් මහණක්හුගේ දුළුල් ඇවැතක් අනුපසපනක්හට භික්ෂුසම්මුතියෙන් තොර වැ ඇරොජා නම් පචිති වේ"** යයි.

4. **යො පන:** යම්, යම්බඳු ... **භික්ඛු:** ... මෙතෙම මේ අරුතෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි. **භික්ඛුස්ස:** අන් මහණක්හුගේ. **දුට්ඨුල්ලා නාම ආපත්ති :** සතර පරිජි ද තෙළෙස් සඟ වෙසෙස් ද. **අනුපසම්පන්න** නම්: භික්ෂුහු ද භික්ෂුණිය ද තබා අවශේෂ වූයේ අනුප සම්පන්න නම්. **ආරොචෙය්‍ය:** ස්ත්‍රියකට හෝ පුරුෂයකුට හෝ ගෘහස්ථ යකුට හෝ පැවිද්දකුට හෝ දන්වයි.

**අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියාති** ඨපෙත්වා භික්ඛුසම්මුතිං. අත්ථි භික්ඛුසම්මුති ආපත්තිපරියන්තා න කුලපරියන්තා, අත්ථි භික්ඛුසම්මුති කුලපරියන්තා න ආපත්තිපරියන්තා, අත්ථි භික්ඛුසම්මුති ආපත්තිපරියන්තා ච කුලපරියන්තා ච, අත්ථි භික්ඛු සම්මුති නෙව ආපත්තිපරියන්තා න කුලපරියන්තා.

**ආපත්තිපරියන්තා** නාම ආපත්තියො පරිග්ගහිතායො හොන්ති එත්තකාහි ආපත්තීහි ආරොචෙතබ්බාති.[1] **කුලපරියන්තා** නාම කුලානි පරිග්ගහිතානි හොන්ති එත්තකෙසු කුලෙසු ආරොචෙතබ්බාති. **ආපත්තිපරියන්තා ච කුලපරියන්තා ච** නාම ආපත්තියො ච පරිග්ගහිතායො හොන්ති කුලානි ච පරිග්ගහිතානි හොන්ති එත්තකාහි ආපත්තීහි එත්තකෙසු කුලෙසු ආරොචෙතබ්බාති. **නෙව ආපත්තිපරියන්තා න කුලපරියන්තා** නාම ආපත්තියො ච අපරිග්ගහිතායො හොන්ති කුලානි ච අපරිග්ගහිතානි හොන්ති එත්තකාහි ආපත්තීහි එත්තකෙසු කුලෙසු ආරොචෙතබ්බාති.

ආපත්තිපරියන්තෙ යා ආපත්තියො පරිග්ගහිතායො හොන්ති තා ආපත්තියො ඨපෙත්වා අඤ්ඤාහි ආපත්තීහි ආරොචෙති ආපත්ති පාචිත්තියස්ස.

කුලපරියන්තෙ යානි කුලානි පරිග්ගහිතානි හොන්ති තානි කුලානි ඨපෙත්වා අඤ්ඤෙසු කුලෙසු ආරොචෙති ආපත්ති පාචිත්තියස්ස.

ආපත්තිපරියන්තෙ ච කුලපරියන්තෙ ච යා ආපත්තියො පරිග්ගහිතායො හොන්ති තා ආපත්තියො ඨපෙත්වා යානි කුලානි පරිග්ගහිතානි හොන්ති තානි කුලානි ඨපෙත්වා අඤ්ඤාහි ආපත්තීහි අඤ්ඤෙසු කුලෙසු ආරොචෙති ආපත්ති පාචිත්තියස්ස.

නෙව ආපත්තිපරියන්තෙ න කුලපරියන්තෙ අනාපත්ති.

දුට්ඨුල්ලාය ආපත්තියා දුට්ඨුල්ලාපත්තිසඤ්ඤී අනුපසම්පන්නස්ස ආරොචෙති අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා ආපත්ති පාචිත්තියස්ස. දුට්ඨුල්ලාය ආපත්තියා වෙමතිකො අනුපසම්පන්නස්ස ආරොචෙති අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා ආපත්ති පාචිත්තියස්ස. දුට්ඨුල්ලාය ආපත්තියා අදුට්ඨුල්ලාපත්තිසඤ්ඤී අනුපසම්පන්නස්ස ආරොචෙති අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා ආපත්ති පාචිත්තියස්ස.

---

1. ආරොචෙතබ්බාති – මජසං

**අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා:** භික්ෂු සම්මුතිය හැර. පියා ඇවැත් පිරියත් කොට ඇති කුලපිරියත් කොට නැති භික්ෂු සම්මුතියෙක් ඇත, කුලපිරියත් කොට ඇති ඇවැත් පිරියත් කොට නැති භික්ෂු සම්මුතියෙක් ඇත, ඇවැත් පිරියත් කොට ද කුල පිරියත් කොට ද ඇති භික්ෂු සම්මුති-යෙක් ඇත. ඇවැත් පිරියත් කොට නොමැති කුලපිරියත් කොට නැති භික්ෂුසම්මුතියෙක් ඇති.

**ආපත්තිපරියන්ත** නම්: මෙතෙක් ඇවැතින් ඇරොජිය යුතු යැ යි ආපත්තිහු සලකා ගන්නා ලද්දහු වෙති. **කුලපරියන්ත** නම්: මෙතෙක් කුලයන්හි ඇරොජියයුතු යැ යි කුලයෝ සලකා ගන්නා ලද්දහු වෙති. **ආපත්ති පරියන්ත හා කුලපරියන්ත** නම්: මෙතෙක් ඇවැතින් මෙතෙක් කුලයන්හි ඇරොජිය යුතු යැ යි ආපත්තිහු ද කුලයෝ ද සලකාගන්නා ලද්දහු වෙති. **නොම ආපත්ති පරියන්ත හා නො ද කුලපරියන්ත** නම්: මෙතෙක් ඇවැතින් මෙතෙක් කුලයන්හි ඇරොජිය යුතු යැ යි ආපත්තිහු ද කුලයෝ ද නො ද සලකාගන්නා ලද්දහු වෙති.

ආපත්තිපර්යන්තයෙහි යම් ඇවැත් කෙනෙක් සලකාගන්නා ලද්දහු වෙද් ද ඒ ඇවැත් තබා අනෙක් ඇවැත්වලින් ඇරොජා නම් පචිති ඇවැත් වේ.

කුලපර්යන්තයෙහි යම් බඳු කුල කෙනෙක් සලකාගන්නා ලද්දහු වෙද්ද, ඒ කුලයන් තබා අන්‍ය කුලයන්හි ඇරොජා නම් පචිති ඇවැත් වේ.

ආපත්තිපර්යන්තයෙහි ද කුලපර්යන්තයෙහි ද යම් ඇවැත් කෙනෙක් සලකාගන්නා ලද්දහු වෙද්ද, ඒ ඇවැත් තබා යම් කුල කෙනෙක් සලකා ගන්නා ලද්දහු වෙද්ද, ඒ කුලයන් තබා අනෙක් ඇවැත්වලින් අන්‍ය-කුලයන්හි ඇරොජා නම් පචිති ඇවැත් වේ.

ආපත්තිපර්යන්තයක් නොමැති කල්හි කුලපර්යන්තයක් නැති කල්හි ඇවැත් නැති.

දුළුල් ඇවැතෙහි දුළුල් ඇවැත්සත් ඇතියේ භික්ෂු සම්මුතියෙන් තොර වැ අනුපසපනක්හට ඇරොජා නම් පචිති ඇවැත් වේ. දුළුල් ඇවැතෙහි විමති ඇතියේ භික්ෂු සම්මුතියෙන් තොර වැ අනුපසපනක්හට ඇරොජා නම් පචිති ඇවැත් වේ. දුළුල් ඇවැතෙහි නොදුළුල් ඇවැත්සත් ඇතියේ භික්ෂුසම්මුතියෙන් තොර වැ අනුපසපනක්හට ඇරොජා නම් පචිති ඇවැත් වේ.

අදුට්ඨුල්ලං ආපත්තිං ආරොචෙති ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නස්ස දුට්ඨුල්ලං වා අදුට්ඨුල්ලං වා අජ්ඣාචාරං ආරොචෙති ආපත්ති දුක්කටස්ස.

අදුට්ඨුල්ලාය ආපත්තියා දුට්ඨුල්ලාපත්තිසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අදුට්ඨුල්ලාය ආපත්තියා වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අදුට්ඨුල්ලාය ආපත්තියා අදුට්ඨුල්ලාපත්තිසඤ්ඤී ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති** වත්ථුං ආරොචෙති නො ආපත්තිං, ආපත්තිං ආරොචෙති නො වත්ථුං, භික්ඛුසම්මුතියා, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

නවමං දුට්ඨුල්ලාරොචනසික්ඛාපදං

## 6. 1. 10

## පඨවිඛණනසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා ආළවියං විහරති අග්ගාළවෙ චෙතියෙ. තෙන ඛො පන සමයෙන ආළවකා[1] භික්ඛූ නවකම්මං කරොන්තා පඨවිං[2] ඛණන්තිපි ඛණාපෙන්තිපි. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා පඨවිං ඛණිස්සන්තිපි ඛණාපෙස්සන්ති පි, එකින්ද්‍රියං සමණා සක්‍යපුත්තියා ජීවං විහෙඨෙස්සන්තී"ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං.

2. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: කථං හි නාම ආළවකා භික්ඛූ පඨවිං ඛණිස්සන්ති පි ඛණාපෙස්සන්තිපීති -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ පඨවිං ඛණථාපි ඛණාපෙථාපීති[4]. සච්චං භගවා, විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා පඨවිං ඛණිස්සථාපි ඛණාපෙස්සථාපි[5]. ජීවසඤ්ඤිනො හි මොඝපුරිසා මනුස්සා පඨවියා. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු පඨවිං ඛණෙය්‍ය වා ඛණාපෙය්‍ය වා පාචිත්තිය"න්ති.**

---

1. ආළවිකා - ස්‍යා,
2. පථවිං, - මජසං,
3. විහෙඨෙන්තීති - මජසං
4. ඛණථපි ඛණාපෙථපීති - මජසං,
5. ඛණිස්සථපි ඛණාපෙස්සථපි - මජසං

නොදුළුල් ඇවැතක් ඇරොජා නම් දුකුළා ඇවැත් වේ. අනුපසම්පන්නයාගේ දුළුල් හෝ නොදුළුල් හෝ අධ්‍යාචාරයක් ඇරොජා නම් දුකුළා ඇවැත් වේ.

නොදුළුල් ඇවැතෙහි නොදුළුල් ඇවැත්සඤ් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො දුළුල් ඇවැතෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නොදුළුල් ඇවැතෙහි නොදුළුල් ඇවැත්සඤ් ඇතියේ නම් දුකුළා ඇවැත් වේ.

ආපත්තිය නො වැ වස්තුව ඇරොජා නම්, වස්තුව නොවැ ආපත්තිය ඇරොජා නම්, භික්ෂුසම්මුතියෙන් ඇරොජා නම්, ඇවැත් නැත. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

නවවැනි දුට්ඨුල්ලාරොචන ශික්ෂාපද යි

## 6. 1. 10
## පඨවිඛණනශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු අළවු පුර අග්ගාළව සෑයෙහි වැඩැ වෙසෙති. එසමයෙහි අළවු පුර නිවැසි භික්ෂූහු නවාම් කරනුවෝ පොළොව කැණීම ද කෙරෙති, කැණවීම ද කෙරෙත්, මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ පොළොව කැණූහු ද? කැණවූහු ද? ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ් එකින්ද්‍රිය ජීවය පෙළූහු"ද යි ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ත්ති ශබ්දය) භික්ෂූහු ඇසූහු.

2. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති දෙස් පතුරුවත්: "කෙසේ නම් අළවුපුර නිවැසි භික්ෂූහු පොළොව කැණූහු ද? කැණවූහු"ද යි ... සැබෑ ද මහණෙනි, තෙපි පොළොව කණිවු ද? කණවවු ද? සැබෑවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි පොළොව කැණූහු ද? කැණවූහු ද? හිස් පුරුෂයෙනි, මිනිස්සු පොළොවෙහි ජීවසංඥා ඇතියෝ යැ. හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි. ... මෙසේ ද වනාහි මහණෙනි මේ සිකපදය උදෙසවු:

**"යම් මහණෙක් පොළොව කණින්නේ නම් හෝ කණවන්නේ නම් හෝ පචිති වේ" ය යි.**

3. **යො පනාති** යො යාදිසො – පෙ – **භික්ඛූති** – පෙ – අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**පඨවී** නාම ද්වෙ පඨවියො ජාතා ච පඨවී අජාතා ච පඨවී, **ජාතා** නාම පඨවී සුද්ධපංසු සුද්ධමත්තිකා අප්පපාසාණා අප්පසක්ඛරා අප්පකඨලා අප්පමරුම්බා අප්පවාලිකා යෙභුය්‍යෙන පංසු[1] යෙභුය්‍යෙන මත්තිකා අදඩ්ඪාපි වුච්චති ජාතා පඨවී, යොපි පංසුපුඤ්ජො වා මත්තිකාපුඤ්ජො වා අතිරෙකචාතුමාසං ඔවට්ඨො සොපි[2] වුච්චති ජාතා පඨවී. **අජාතා** නාම පඨවී සුද්ධපාසාණා සුද්ධසක්ඛරා සුද්ධකඨලා සුද්ධමරුම්බා සුද්ධවාලිකා අප්පපංසු අප්පමත්තිකා යෙභුය්‍යෙන පාසාණා යෙභුය්‍යෙන සක්ඛරා යෙභුය්‍යෙන කඨලා යෙභුය්‍යෙන මරුම්බා යෙභුය්‍යෙන වාලිකා දඩ්ඪාපි වුච්චති අජාතා පඨවී. යොපි පංසුපුඤ්ජො වා මත්තිකා පුඤ්ජො වා ඔමකචාතුමාසං ඔවට්ඨො සොපි වුච්චති අජාතා පඨවී.

**ඛණෙය්‍යාති** සයං ඛණති ආපත්ති පාචිත්තියස්ස. **ඛණාපෙය්‍යාති** අඤ්ඤං ආණාපෙති ආපත්ති පාචිත්තියස්ස. සකිං ආණත්තො බහුකම්පි ඛණති ආපත්ති පාචිත්තියස්ස.

පඨවියා පඨවිසඤ්ඤී ඛණති වා ඛණාපෙති වා භින්දති වා භෙදාපෙති වා දහති වා දහාපෙති වා ආපත්ති පාචිත්තියස්ස. පඨවියා වෙමතිකො ඛණති වා ඛණාපෙති වා භින්දති වා භෙදාපෙති වා දහති වා දහාපෙති වා ආපත්ති දුක්කටස්ස. පඨවියා අපඨවිසඤ්ඤී ඛණති වා ඛණාපෙති වා භින්දති වා භෙදාපෙති වා දහති වා දහාපෙති වා අනාපත්ති.

අපඨවියා පඨවිසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අපඨවියා වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අපඨවියා අපඨවිසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති**: ඉමං ජාන, ඉමං දෙහි, ඉමං ආහර, ඉමිනා අත්ථො, ඉමං කප්පියං කරොහීති භණති, අසඤ්චිච්ච අසතියා, අජානන්තස්ස උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

පඨවිඛණනසික්ඛාපදං.

මුසාවාදවග්ගො පඨමො.

තස්සුද්දානං

මුසා ඔමස පෙසුඤ්ඤං පදසෙය්‍යා ච තෙ දුවෙ,[3]
අඤ්ඤත්‍ර විඤ්ඤුනා භූතා දුට්ඨුල්ලාපත්ති ඛණෙනවා'ති[4]

1. යෙභුය්‍යෙන පංසුකා – මජසං.
2. අයංපි – මජසං.
3. පදසෙය්‍යාය චෙව දුවෙ – මජසං.
4. ඛණනාචාති – මජසං.

3. **යො පන:** යම්, යම්බඳු ... **භික්ඛු** ... මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**පඨවි** නම් ජාත පෘථිවිය ද අජාත පෘථිවිය ද යි පෘථිවිහු දෙදෙනෙකි. **ජාතපෘථිවි නම්:** හුදු පස් ඇති හුදු මැටි ඇති මද පහණැති මද හකුරැති මදකැබිලිති ඇති මද කැටහකුරැති මද වැලි ඇති බෙහෙවින් පස් ඇති බෙහෙවින් මැටි ඇති නොදවුණු ද පොළොව ජාතපඨවි යයි කියනු ලැබේ. යම් පස් රැසෙක් හෝ මැටිරැසෙක් හෝ අයිරා සිවුමසක් මුළුල්ලෙහි වැස්සෙන් තෙමීගියේ වේ ද, හෙද ජාතපෘථිවි යයි කියනු ලැබේ. **අජාතපෘථිවි නම්:** හුදුපහණැති හුදුහකුරැති හුදුකැබිලිති ඇති හුදු කැටහකුරැති හුදුවැලි ඇති මදපස් ඇති මද මැටි ඇති බෙහෙවින් පහණැති බෙහෙවින් හකුරැති බෙහෙවින් කැබිලිති ඇති බෙහෙවින් කැටහකුරැති බෙහෙවින් වැලි ඇති දවුණුදු පොළොව අජාතපඨවි යයි කියනු ලැබේ. යම් පස් රැසෙක් හෝ මැටි රැසෙක් හෝ අඩු සිවුමසක් වැස්සෙන් තෙමීගියේ වේ ද, හෙ ද අජාතපෘථිවි යයි කියනු ලැබේ.

**ඛණෙය්‍ය:** තෙමේ කණී ද, පචිති ඇවැත් වේ. **ඛණාපෙය්‍ය:** අනෙකකු අණවා ද පචිති ඇවැත් වේ. වරක් ඇණවූයේ බොහෝ වරක් කණී ද පචිති ඇවැත් වේ.

පොළොවෙහි පොළෝ සත් ඇතියේ කණී ද කණවා ද බිඳී ද බිඳුවා ද දවා ද දවවා ද, පචිති ඇවැත් වේ. පොළොවෙහි විමති ඇතියේ කණී ද කණවා ද බිඳී ද බිඳුවා ද දවා ද දවවා ද, දුකුළා ඇවැත් වේ. පොළොවෙහි නො පොළෝ සත් ඇතියේ කණී ද කණවා ද බිඳී ද බිඳුවා ද දවා ද දවවා ද, ඇවැත් නැති.

නො පොළොවෙහි පොළෝසත් ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. නො පොළොවෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. නො පොළොවෙහි නො පොළෝසත් ඇති යේ නම් ඇවැත් නැති.

මෙය දනු ව, මෙය දෙව, මෙය ගෙනෙව, මෙයින් වැඩෙකි, මෙය කැප කරවයි බෙණේ ද, නො සිතා (බිඳින්නහුට) නො සිහියෙන් (අනෙකක් කරන්නාහට), නො දන්නාහට උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**දසවැනි පඨවිඛණන ශික්ෂාපද යි**

**ප්‍රථම මුසාවාද වර්ගය යි**

එහි උද්දානය:

මුසාවාද යැ ඔමසවාද යැ පෙසුණද යැ පදසොධම්ම යැ සහසෙය්‍ය දෙක යැ විඥයක්හු නැති වැ ධම්ම දෙසනා යැ භූතාරොචන යැ දුට්ඨුල්ලාරොචන යැ පඨවිඛණන යි.

## 6. 2. 1

## භූතගාමසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා ආළවියං විහරති අග්ගාළවෙ චෙතියෙ. තෙන ඛො පන සමයෙන ආළවකා භික්ඛූ නවකම්මං කරොන්තා රුක්ඛං ඡින්දන්තිපි ඡෙදාපෙන්තිපි. අඤ්ඤතරොපි ආළවකො භික්ඛු රුක්ඛං ඡින්දති. තස්මිං රුක්ඛෙ අධිවත්ථා දෙවතා තං භික්ඛුං එතදවොච. 'මා භන්තෙ අත්තනො භවනං කත්තුකාමො මය්හං භවනං ඡින්දී'ති. සො භික්ඛු අනාදියන්තො ඡින්දියෙව තස්සා ච දෙවතාය දරකස්ස බාහුං ආකොටෙසි. අථ ඛො තස්ස, දෙවතාය එතදහොසි. 'යන්නූනාහං ඉමං භික්ඛුං ඉධෙව ජීවිතා වොරොපෙය්‍ය'න්ති. අථ ඛො තස්සා දෙවතාය එතදහොසි. න ඛො මෙතං පතිරූපං යාහං ඉමං භික්ඛුං ඉධෙව ජීවිතා වොරොපෙය්‍යං, යන්නූනාහං භගවතො එතමත්ථං ආරොචෙය්‍ය'න්ති. අථ ඛො සා දෙවතා යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවතො එතමත්ථං ආරොචෙසි.

"සාධු සාධු දෙවතෙ සාධු ඛො ත්වං දෙවතෙ තං භික්ඛුං ජීවිතා න වොරොපෙසි. සචජ්ජ ත්වං දෙවතෙ තං භික්ඛුං ජීවිතා වොරොපෙය්‍යාසි බහුඤ්ච ත්වං දෙවතෙ අපුඤ්ඤං පසවෙය්‍යාසි. ගච්ඡ ත්වං දෙවතෙ අමුකස්මිං ඔකාසෙ රුක්ඛො විවිත්තො තස්මිං උපගච්ඡාති."

2. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම සමණා සක්‍යපුත්තියා රුක්ඛං ඡින්දිස්සන්ති පි ඡෙදාපෙස්සන්ති පි එකින්ද්‍රියං සමණා සක්‍යපුත්තියා ජීවං විහෙඨෙස්සන්ති"ති[1]. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා – පෙ – තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති කථං හි නාම ආළවකා භික්ඛූ රුක්ඛං ඡින්දිස්සන්ති පි ඡෙදාපෙස්සන්තිපීති – පෙ –

අථ ඛො භගවා – පෙ – සච්චං කිර තුම්හෙ භික්ඛවෙ රුක්ඛං ඡින්දථාපි ඡෙදාපෙථාපීති'. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා –පෙ– කථං හි නාම තුම්හෙ මොසපුරිසා රුක්ඛං ඡින්දිස්සථාපි ඡෙදාපෙස්සථාපි, ජීවසඤ්ඤිනො හි මොසපුරිසා මනුස්සා රුක්ඛස්මිං. නෙතං මොසපුරිසා අප්පසන්නානං වා පසාදය · පෙ – එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"භූතගාම පාතව්‍යතාය පාචිත්තිය"න්ති.**

1. විහෙඨෙස්සන්ති – මජසං,

# 6. 2. 1

## භූතගාමශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු අළවුපුර අග්ගාළව සෑයෙහි වැඩ වෙසෙති. එසමයෙහි අළවු රට වැසි භික්ෂූහු නවාම් කරනුවෝ රුක් සිඳීම ද සිඳුවීම ද කෙරෙති. එක්තරා අළවු වැසි මහණෙක් ද රුකක් සිඳියි. එරුක්හි අරක්ගත් දෙවතා තොමෝ එමහණහට මෙය කිවුය: වහන්ස, තමාට නිවෙස්නක් කරනු කැමැති වැ මාගේ නිවෙස්න නහමක් සිඳිනු මැනැවැ යි. එ මහණ (ඇයගේ බස) නො ගත්තේ සින්දේ යැ. එදෙව්දූගේ දරුවාගේ බාහුව ද සින්දේ යි. එකල්හි ඒ දෙව්දූවට තෙල සිත විය: "යම් හෙයෙකින් මම මෙ මහණහු මෙහි දී මැ දිවියෙන් තොර කරන්නෙම් නම් යෙහෙකැ යි" එකෙණෙහි ම ඇයට තෙල සිත වී: "යම් හෙයෙකින් මම මේ මහණහු මෙහි දී මැ දිවියෙන් තොර කරන්නෙම් නම් තෙල කරුණ මට නුසුදුසු මැ යි. මම තෙල කරුණ භාග්‍යවතුන්හට දන්වන්නෙම් නම් යෙහෙකැ යි. එකල්හි ඒ දෙව්දූ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක ද එතැනට එළැඹියා ය. එළැඹ භාග්‍යවතුන්හට තෙල කරුණ දැන්වූ ය.

මැනැවි මැනැවි දෙව්දූව, තෙපි එමහණහු දිවියෙන් තොර නො කළහු මනා මැ යි. ඉදින් දෙව්දූව, තෙපි අද එමහණහු දිවියෙන් තොර කරවු නම් බොහෝ පව් උපදවා ගන්නහු ය. යා දෙව්දූව, තෙපි අසුවල් පෙදෙසෙහි හිස් රුකෙක් වෙයි එහි එළැඹෙව යි.

2. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් ශ්‍රමණශාක්‍යපුත්‍රයෝ රුක් සිඳීමත් සිඳවීමත් කරන්නාහු ද, ශ්‍රමණශාක්‍යපුත්‍රයෝ එකින්ද්‍රියජීවය පෙළන්නාහු ද යි. ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ත්ති ශබ්දය) භික්ෂූහු ඇසූහු ය. යම් භික්ෂු කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමුකොට සිතති නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් අළවු වැසි භික්ෂූහු රුක් සිඳීමත් සිඳවීමත් කොළෝ ද, ...

එකල්හි භාග්‍යවතුන් වහන්සේ "සැබෑ ද මහණෙනි, තෙපි රුක් සිඳීමත් සිඳවීමත් කරවු ද ?- සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූසේක ... කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි රුක් සිඳීමත් සිඳවීමත් කළහු ද, හිස් පුරුෂයෙනි, මිනිස්සු රුක්හි ජීවය ඇතැ යි යන හැඟීම් ඇතියෝ යි. එහෙයින් හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදයට හෝ නො වෙයි ... මහණෙනි, මෙසේ මේ සිකපදය උදෙසවු:

**"භූතගාමපාතව්‍යතායෙහි පචිති වේ" යයි**

3. **භූතගාමො** නාම: පඤ්ච බීජජාතානි- මූලබීජං ඛන්ධබීජං ඵළුබීජං අග්ගබීජං බීජබීජමෙව[1] පඤ්චමං.

**මූලබීජං** නාම: හලිද්දි සිඞ්ගිවෙරං වචං[2] වචත්තං අතිවිසං[3] කටුකරොහිණී උසීරං භද්දමුත්තකං යානි වා පනඤ්ඤානි පි අත්ථි මූලෙ ජායන්ති මූලෙ සඤ්ජායන්ති එතං මූලබීජං නාම.

**ඛන්ධබීජං** නාම: අස්සත්ථො නිග්‍රොධො පිලක්ඛො උදුම්බරො කච්ඡකො කපිත්ථනො, යානි වා පනඤ්ඤානි පි අත්ථි ඛන්ධෙ ජායන්ති ඛන්ධෙ සඤ්ජායන්ති එතං ඛන්ධබීජං නාම.

**ඵළුබීජං** නාම: උච්ඡු වෙළු නළො යානි වා පනඤ්ඤානිපි අත්ථි පබ්බෙ ජායන්ති පබ්බෙ සඤ්ජායන්ති එතං ඵළුබීජං නාම.

**අග්ගබීජං** නාම: අජ්ජකං[4] ඵණිජ්ජකං[5] හිරිවෙරං යානි වා පනඤ්ඤානිපි අත්ථි අග්ගෙ ජායන්ති අග්ගෙ සඤ්ජායන්ති එතං අග්ගබීජං නාම.

**බීජබීජං** නාම: පුබ්බණ්ණං අපරණ්ණං යානි වා පනඤ්ඤානිපි අත්ථි බීජෙ ජායන්ති බීජෙ සඤ්ජායන්ති එතං බීජබීජං නාම.

බීජෙ බීජසඤ්ඤී ඡින්දති වා ඡෙදාපෙති වා භින්දති වා භෙදාපෙති වා පචති වා පචාපෙති වා ආපත්ති පාචිත්තියස්ස. බීජෙ වෙමතිකො ඡින්දති වා ඡෙදාපෙති වා භින්දති වා භෙදාපෙති වා පචති වා පචාපෙති වා ආපත්ති දුක්කටස්ස. බීජෙ අබීජසඤ්ඤී ඡින්දති වා ඡෙදාපෙති වා භින්දති වා භෙදාපෙති වා පචති වා පචාපෙති වා අනාපත්ති.

අබීජෙ බීජසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අබීජෙ වෙමතිකො ආපත්තිදුක්කටස්ස. අබීජෙ අබීජසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** ඉමං ජාන ඉමං දෙහි ඉමං ආහර ඉමිනා අත්ථො ඉමං කප්පියං කරොහීති භණති, අසඤ්චිච්ච අසතියා අජානන්තස්ස උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

භූතගාමසික්ඛාපදං පඨමං

1. බීජ බීජඤ්ඤෙව - කත්ථචි,
2. වචා - මජ්ඣං,
3. අතිවිසා මජ්ඣං.
4. අජ්ජුකං - මජ්ඣං,
5. ඵණිජ්ජකං - සී i

3. **භූතගාම නම්**: පඤ්චබීජජාතයෝ යි. මූලබීජ යැ ඛන්ධබීජ යැ ඵළුබීජ යැ අග්ගබීජ යැ හා පස්වැනි බීජබීජ යි.

**මූලබීජ නම්**: කහ යැ ඉඟුරු යැ වදකසා යැ හෙළවදකසා යැ ඉවද යැ කුළුරැණ යැ සුවඳහොට යැ වම්මුතු යැ, තව ද අන්‍ය වූ ද යම්බඳු බීජජාතයෙක් මුලෙහි උපදී ද මුලෙහි හටගනී ද මේ (හැම) මූලබීජ නම් වෙයි.

**ඛන්ධබීජ නම්**: ඇහැටු යැ නුග යැ පුලිළ යැ දිඹුල් යැ කලහ යැ ගිවුළු යැ, තවද අන්‍ය වූ ද යම්බඳු බීජජාතයෙක් කඳෙහි උපදී ද කඳෙහි හටගනී ද මේ (හැම) ඛන්ධබීජ නම් වෙයි.

**ඵළුබීජ නම්**: උක යැ හුණ යැ බට යැ, තව ද අන්‍ය වූ ද යම්බඳු බීජජාතයෙක් පුරුකෙහි උපදී ද පුරුකෙහි හටගනී ද මේ (හැම) ඵළුබීජ නම් වෙයි.

**අග්ගබීජ නම්**: අඳුතලා යැ මුරුවා යැ හිරිවේරි යැ තවද අන්‍ය වූ ද යම්බඳු බීජජාතයෙක් අගෙහි (කරටියෙහි) උපදී ද අගෙහි හටගනී ද මේ (හැම) අග්ගබීජ නම් වෙයි.

**බීජබීජ නම්**: හැල් වී ඈ පුබ්බන්න යැ මුඟු උඳු ඈ අපරන්න යැ තවද අන්‍ය වූ ද යම්බඳු බීජජාතයෙක් ඇටයෙහි උපදී ද ඇටයෙහි හටගනී ද මේ (හැම) බීජබීජ නම් වේ.

බීජයෙහි බීජසංඥා ඇතියේ සිඳුනේ හෝ සිඳුවන්නේ හෝ බිඳුනේ හෝ බිඳුවන්නේ හෝ පිසන්නේ හෝ පිසවන්නේ හෝ පචිති ඇවැත් වෙයි. බීජයෙහි විමති ඇතියේ සිඳුනේ හෝ සිඳුවන්නේ හෝ බිඳුනේ හෝ බිඳුවන්නේ හෝ පිසන්නේ හෝ පිසවන්නේ හෝ දුකුළා ඇවැත් වේ. බීජයෙහි නො බීජුසඟ් ඇතියේ සිඳුනේ හෝ සිඳුවන්නේ හෝ බිඳුනේ හෝ බිඳුවන්නේ හෝ පිසන්නේ හෝ පිසවන්නේ හෝ ඇවැත් නැති.

බීජ නොවූයෙහි බීජසංඥා ඇතියේ දුකුළා ඇවැත් වේ. බීජ නොවූයෙහි විමති ඇතියේ දුකුළා ඇවැත් වේ. බීජ නොවූයෙහි අබීජසංඥා ඇතියේ ඇවැත් නැති.

මෙය දනුව, මෙය දෙව, මෙය ගෙනෙව, මෙයින් වැඩෙකි, මෙය කැපකරව යි බෙණේ නම් ඔහට ද නො සිතා කරන්නහුට ද නො සිහියෙන් කරන්නහුට ද නො දන්නහුට ද උම්මත්තකයහට ද ආදි කම්මිකයාහට ද ඇවැත් නැති.

**පළමුවැනි භූතගාමශික්ෂාපද යි.**

## 6. 2. 2

## අඤ්ඤවාදකසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා කොසම්බියං විහරති ඝොසිතාරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා ඡන්නො අනාචාරං ආචරිත්වා සඞ්ඝමජ්ඣෙ ආපත්තියා අනුයුඤ්ජියමානො අඤ්ඤෙනඤ්ඤං පටිචරති කො ආපන්නො කිං ආපන්නො කිස්මිං ආපන්නො කථං ආපන්නො කං භණථ කිං භණථාති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති කථං හි නාම ආයස්මා ඡන්නො සඞ්ඝමජ්ඣෙ ආපත්තියා අනුයුඤ්ජියමානො අඤ්ඤෙනඤ්ඤං පටිචරිස්සති කො ආපන්නො කිං ආපන්නො කිස්මිං ආපන්නො කථං ආපන්නො කං භණථ කිං භණථාති -පෙ- සච්චං කිර ත්වං ඡන්න සඞ්ඝමජ්ඣෙ ආපත්තියා අනුයුඤ්ජියමානො අඤ්ඤෙනඤ්ඤං පටිචරසි, කො ආපන්නො කිං ආපන්නො කිස්මිං ආපන්නො කථං ආපන්නො කං භණථ කිං භණථාති. සච්චං භගවා, විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම ත්වං මොඝපුරිස සඞ්ඝමජ්ඣෙ ආපත්තියා අනුයුඤ්ජියමානො අඤ්ඤෙනඤ්ඤං පටිචරිස්සසි කො ආපන්නො කිං ආපන්නො කිස්මිං ආපන්නො කථං ආපන්නො කං භණථ කිං භණථාති. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. තෙන හි භික්ඛවෙ සඞ්ඝො ඡන්නස්ස භික්ඛුනො අඤ්ඤවාදකං රොපෙතු. එවඤ්ච පන භික්ඛවෙ රොපෙතබ්බං. බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො.

2. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අයං ඡන්නො භික්ඛු සඞ්ඝමජ්ඣෙ ආපත්තියා අනුයුඤ්ජියමානො අඤ්ඤෙනඤ්ඤං පටිචරති යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඡන්නස්ස භික්ඛුනො අඤ්ඤවාදකං රොපෙය්‍ය එසා ඤත්ති,

3. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අයං ඡන්නො භික්ඛු සඞ්ඝමජ්ඣෙ ආපත්තියා අනුයුඤ්ජියමානො අඤ්ඤෙනඤ්ඤං පටිචරති සඞ්ඝො ඡන්නස්ස භික්ඛුනො අඤ්ඤවාදකං රොපෙති, යස්සායස්මතො ඛමති ඡන්නස්ස භික්ඛුනො අඤ්ඤවාදකස්ස රොපනා සො තුණ්හස්ස යස්ස නක්ඛමති සො භාසෙය්‍ය. රොපිතං සඞ්ඝෙන ඡන්නස්ස භික්ඛුනො අඤ්ඤවාදකං, ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමීති.

## 6. 2. 2

## අඤ්ඤවාදකශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු **කොසඹෑ** නුවර **ඝෝෂිතාරාමයෙහි** වැඩවෙසෙති. එසමයෙහි ආයුෂ්මත් ඡන්න තෙමේ අනාචාරයෙහි හැසිර සඟමැද ඇවැතින් අනුයොගවතට නංවනු ලබන්නේ 'කවරෙක් අවන්නේ ද? කවර ඇවතට පැමිණියෙම් ද? කිනම් වස්තුවෙක්හි ඇවතට පැමිණියෙම් ද? කෙසේ ඇවැතට පැමිණියෙම් ද? කවරක්හට බෙණෙවු ද? කුමක් බෙණෙවු දැ'යි අනෙකකින් අනෙකක් වසාලයි. යම් ඒ භික්ෂූ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු දෙස් නඟති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් ආයුෂ්මත් ඡන්න සඟමැද ඇවතින් අනුයොගවතට නංවනු ලබන්නේ 'කවරෙක් අවන්නේ ද? කවර ඇවතට පැමිණියෙම් ද? කිනම් වස්තුවෙක්හි ඇවතට පැමිණියෙම් ද? කෙසේ ඇවතට පැමිණියෙම් ද? කවරක්හට බෙණෙවු ද? කුමක් බෙණෙවු දැ'යි අනෙකකින් අනෙකක් වසාලී ද ... කිම සැබෑ ද, ඡන්න තෙපි සඟමැද ඇවතින් අනුයොගවතට නංවනු ලබන්නහු 'කවරෙක් අවන්නේ ද? කවර ඇවතට පැමිණියෙම් ද? කිනම් වස්තුවෙක්හි ඇවතට පැමිණියෙම් ද? කෙසේ පැමිණියෙම් ද? කවරක්හට බෙණෙහු ද? කුමක් බෙණෙවු දැ'යි අනෙකකින් අනෙකක් වසාලවූ ද. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරැහූහ ... කෙසේ නම් හිස්පුරුෂය, තෙපි සඟමැදහි ඇවතින් අනුයොගවතට නංවනු ලබන්නහු 'කවරෙක් අවන්නේ ද? කවර ඇවතට පැමිණියෙම් ද? කිනම් වස්තුවෙක්හි පැමිණියෙම් ද? කෙසේ පැමිණියෙම් ද? කවරක්හට බෙණෙවු ද? කුමක් බෙණෙවු දැ'යි. අනෙකකින් අනෙකක් වසාලූවහු ද, හිස්පුරුෂය, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදයට හෝ නො වෙයි... ගරහා දැහැමි කථා කොට මහණුන් ඇමැතූහ. ඒ කරුණෙන් ම මහණෙනි, සඞ්ඝ තෙමේ ඡන්න භික්ෂුහට අඤ්ඤවාදක සම්මුතිය පිහිටුවාවා. මෙසේ ද මහණෙනි, පිහිටුවාලිය යුත්තී ය, ප්‍රතිබල වූ ව්‍යක්ත වූ මහණක්හු විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ යි.

2. වහන්ස, සඞ්ඝයා මාගේ වචනය අසාවා, මේ ඡන්න මහණ සඟමැද ඇවතින් අනුයොග වතට නංවනු ලබන්නේ අනෙකකින් අනෙකක් වසාලයි. ඉදින් සඞ්ඝයාට පැමිණි කල් ඇත්තේ නම් සංඝයා ඡන්න මහණහට අඤ්ඤවාදක සම්මුතිය පිහිටුවන්නේ යැ. මේ ඤත්තිය යි.

3. වහන්ස, සඞ්ඝයා මාගේ (වචනය) අසාවා, මේ ඡන්න මහණ සඟමැද ඇවැතින් අනුයොගවතට නංවනු ලබන්නේ අනෙකකින් අනෙකක් වසාලයි. සඞ්ඝයා ඡන්න මහණහට අඤ්ඤවාදක සම්මුතිය පිහිටුවාල යි. යම් ආයුෂ්මත් කෙනකුන්ට ඡන්න භික්ෂුහට අඤ්ඤවාදකාරොපණය රුස්නේ නම් හේ නිහඬ වන්නේ යැ, යමක්හට නො රුස්නේ නම් හේ කියන්නේ යැ, සංඝයා විසින් ඡන්න මහණහුට අඤ්ඤවාදකය පිහිටුවන ලදි. සඞ්ඝයාට රුස්නේ යැ. එහෙයින් නිහඬ වී මෙසේ මෙය දරමි යි.

4. අථ ඛො භගවා ආයස්මන්තං ඡන්නං අනෙකපරියායෙන විගරහිත්වා දුභරතාය[1] – පෙ – එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ :

"අඤ්ඤවාදකෙ පාචිත්තිය"න්ති.

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

5. තෙන ඛො පන සමයෙන ආයස්මා ඡන්නො සඞ්ඝමජ්ඣෙ ආපත්තියා අනුයුඤ්ජියමානො අඤ්ඤෙනඤ්ඤං පටිචරන්තො ආපත්තිං ආපජ්ජිස්සාමීති තුණ්හීභූතො සඞ්ඝං විහෙසෙති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා – පෙ – තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති කථං හි නාම ආයස්මා ඡන්නො සඞ්ඝමජ්ඣෙ ආපත්තියා අනුයුඤ්ජියමානො තුණ්හීභූතො සඞ්ඝං විහෙසෙස්සතීති. – පෙ – සච්චං කිර ත්වං ඡන්න සඞ්ඝමජ්ඣෙ ආපත්තියා අනුයුඤ්ජියමානො තුණ්හීභූතො සඞ්ඝං විහෙසෙසීති. සච්චං භගවා, විගරහි බුද්ධො භගවා – පෙ – කථං හි නාම ත්වං මොඝපුරිස සඞ්ඝමජ්ඣෙ ආපත්තියා අනුයුඤ්ජියමානො තුණ්හීභූතො සඞ්ඝං විහෙසෙස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදය – පෙ – විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. තෙන හි භික්ඛවෙ සඞ්ඝො ඡන්නස්ස භික්ඛුනො විහෙසකං රොපෙතු. එවඤ්ච පන භික්ඛවෙ රොපෙතබ්බං. බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො.

6. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අයං ඡන්නො භික්ඛු සඞ්ඝමජ්ඣෙ ආපත්තියා අනුයුඤ්ජියමානො තුණ්හීභූතො සඞ්ඝං විහෙසෙති, යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඡන්නස්ස භික්ඛුනො විහෙසකං රොපෙය්‍ය එසා ඤත්ති.

7. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො අයං ඡන්නො භික්ඛු සඞ්ඝමජ්ඣෙ ආපත්තියා අනුයුඤ්ජියමානො තුණ්හීභූතො සඞ්ඝං විහෙසෙති, සඞ්ඝො ඡන්නස්ස භික්ඛුනො විහෙසකං රොපෙති, යස්සායස්මතො ඛමති ඡන්නස්ස භික්ඛුනො විහෙසකස්ස රොපනා සො තුණ්හස්ස යස්ස නක්ඛමති සො භාසෙය්‍ය. රොපිතං සඞ්ඝෙන ඡන්නස්ස භික්ඛුනො විහෙසකං, ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී එවමෙතං ධාරයාමීති.

8. අථ ඛො භගවා ආයස්මන්තං ඡන්නං අනෙකපරියායෙන විගරහිත්වා දුභරතාය ...... එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ :

"අඤ්ඤවාදකෙ විහෙසකෙ පාචිත්තිය"න්ති.

1. දුබ්භරතාය – මජසං.

4. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ඡන්න මහණහු නොයෙක් කරුණෙන් ගරහා දුබර බැව්හි ... මෙසේ ද වනාහි මහණෙනි මේ සිකපදය උදෙසවු:

"අන්‍යවාදයෙහි පචිති වේ" යයි.

භාග්‍යවතුන් වහන්සේ විසින් මේ සිකපදය භික්ෂූන්හට මෙසේත් පනවන ලද්දේ වෙයි.

5. එසමයෙහි වනාහි ආයුෂ්මත් ඡන්න මහණ සඟමැද ඇවැතින් අනුයොගවතට නංවනු ලබන්නේ අනෙකෙකින් අනෙකක් වසාලමින් ඇවැතට පැමිණෙන්නෙම් යි නිහඬ වැ සඞ්ඝයා වෙහෙසයි. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් ආයුෂ්මත් ඡන්න තෙමේ සඟමැද ඇවැතින් අනුයොගවතට නවංනු ලබන්නේ නිහඬ වැ සඞ්ඝයා වෙහෙසී ද ... සැබෑ ද ඡන්නයෙනි, තෙපි සඟමැද ඇවැතින් අනුයොගවතට නංවනු ලබන්නහු නිහඬ වැ සඞ්ඝයා වෙහෙසවු ද? සැබැව භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ. ... කෙසේ නම් හිස් පුරුෂය, තෙපි සඟමැද ඇවැතින් අනුයොගවතට නංවනු ලබන්නහු නිහඬ වැ සඞ්ඝයා වෙහෙසු-වහු ද? හිස්පුරුෂය, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... ගරහා දැහැමි කථා කොට මහණුන් ඇමැතූහු. එසේ නම් මහණෙනි, සඞ්ඝයා ඡන්න මහණහට විහෙසකය පිහිටුවාවා. මෙසේ ද මහණෙනි, පිහිටුවිය යුතු යි. ව්‍යක්ත ප්‍රතිබල මහණක්හු විසින් සංඝයා දැන්විය යුත්තේ යි.

6. ස්වාමීනි, සඞ්ඝයා මාගේ වචනය අසාවා. මේ ඡන්න මහණ සඟමැද ඇවැතින් අනුයොග වතට නංවනු ලබන්නේ නිහඬ වැ සඞ්ඝයා වෙහෙසයි. ඉදින් සඞ්ඝයාට පැමිණිකල් ඇත්තේ නම් සඞ්ඝයා ඡන්න මහණහට විහෙසකය පිහිටුවන්නේ යැ මේ ඥප්තිය යි.

7. ස්වාමීනි, සඞ්ඝයා මාගේ වචනය අසාවා. මේ ඡන්න මහණ සඟමැද ඇවැතින් අනුයොග වතට නංවනු ලබන්නේ නිහඬ වැ සඞ්ඝයා වෙහෙසයි. සඞ්ඝයා ඡන්න මහණහට විහෙසකය පිහිටුවාලයි. ඡන්න භික්ෂුහට විහෙසකාරොපණය යම් ආයුෂ්මත් කෙනකුන්ට රුස්නේ නම් හේ නිහඬ වන්නේ යැ. යමක්හට නො රුස්නේ නම් හේ කියන්නේ යැ සඞ්ඝයා විසින් ඡන්න මහණහට විහෙසකය පිහිටුවන ලදී. සඞ්ඝයාට රුස්නේ යැ. එහෙයින් නිහඬ වී. මෙල මෙසේ දරම් යි.

8. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ඡන්නහට නොයෙක් කරුණෙන් ගරහා දුබරබැව්හි ... මෙසේ ද මහණෙනි මේ සිකපදය උදෙසවු:

"අනෙකක් කීමෙහි ද වෙහෙසීමෙහි ද පචිති වේ" යයි.

9. **අඤ්ඤවාදකො** නාම: සඞ්ඝමජ්ඣෙ වත්ථුස්මිං වා ආපත්තියා වා අනුයුඤ්ජියමානො තං න කථෙතුකාමො තං උග්ඝාටෙතුකාමො[1] අඤ්ඤෙනඤ්ඤං පටිචරති, කො ආපන්නො කිං ආපන්නො කිස්මිං ආපන්නො කථං ආපන්නො කං භණථ කිං භණථාති, එසො අඤ්ඤවාදකො නාම.

**විහෙසකො** නාම: සඞ්ඝමජ්ඣෙ වත්ථුස්මිං වා ආපත්තියා වා අනුයුඤ්ජියමානො තං න කථෙතුකාමො තං උග්ඝාටෙතුකාමො[1] තුණ්හීභූතො සඞ්ඝං විහෙසෙති එසො විහෙසකො නාම.

ආරොපිතෙ අඤ්ඤවාදකෙ සඞ්ඝමජ්ඣෙ වත්ථුස්මිං වා ආපත්තියා වා අනුයුඤ්ජියමානො තං න කථෙතුකාමො තං උග්ඝාටෙතුකාමො අඤ්ඤෙනඤ්ඤං පටිචරති කො ආපන්නො කිං ආපන්නො කිස්මිං ආපන්නො කථං ආපන්නො කං භණථ කිං භණථාති ආපත්ති දුක්කටස්ස.

ආරොපිතෙ විහෙසකෙ සඞ්ඝමජ්ඣෙ වත්ථුස්මිං වා ආපත්තියා වා අනුයුඤ්ජියමානො තං න කථෙතුකාමො තං උග්ඝාටෙතුකාමො තුණ්හීභූතො සඞ්ඝං විහෙසෙති ආපත්ති දුක්කටස්ස.

රොපිතෙ අඤ්ඤවාදකෙ සඞ්ඝමජ්ඣෙ වත්ථුස්මිං වා ආපත්තියා වා අනුයුඤ්ජියමානො තං න කථෙතුකාමො තං උග්ඝාටෙතුකාමො අඤ්ඤෙනඤ්ඤං පටිචරති, කො ආපන්නො කිං ආපන්නො කිස්මිං ආපන්නො කථං ආපන්නො කං භණථ කිං භණථාති ආපත්ති පාචිත්තියස්ස.

රොපිතෙ විහෙසකෙ සඞ්ඝමජ්ඣෙ වත්ථුස්මිං වා ආපත්තියා වා අනුයුඤ්ජියමානො තං න කථෙතුකාමො තං උග්ඝාටෙතුකාමො තුණ්හීභූතො සඞ්ඝං විහෙසෙති ආපත්ති පාචිත්තියස්ස.

ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී අඤ්ඤවාදකෙ විහෙසකෙ ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ වෙමතිකො අඤ්ඤවාදකෙ විහෙසකෙ ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී අඤ්ඤවාදකෙ විහෙසකෙ ආපත්ති පාචිත්තියස්ස.

---

1. න උග්ඝාටෙතුකාමො - මජසං,

9. අඤ්ඤවාදක නම්: සඟමැද වස්තුවෙකින් හෝ ඇවැතෙකින් හෝ අනුයොගවතට නංවනු ලබන්නේ එය නො කියනු කැමැත්තේ එය නො හෙළි කරනු කැමැත්තේ "කවරෙක් අවන්නේ ද? කවර ඇවැතට පැමිණියෙම් ද? කිනම් වස්තුවෙක්හි අවන්නෙම් ද? කෙසේ අවන්නෙම් ද? කවරක්හට බෙණෙවු ද? කුමක් බෙණෙවු ද යි අනෙකෙකින් අනෙකක් වසාලයි. මේ යැ අඤ්ඤවාදක නම්.

විහෙසක නම්: සඟමැද වස්තුවෙකින් හෝ ඇවැතෙකින් හෝ අනුයොගවතට නංවනු ලබන්නේ එය නො කියනු කැමැත්තේ එය නො හෙළි කරනු කැමැත්තේ නිහඬ වැ සඞසයා වෙහෙසයි. මේ යැ විහෙසක නම්.

අන්‍යවාදක කර්මය නො නැඟු කල්හි සඟමැද වස්තුවකින් හෝ ඇවැතෙකින් හෝ අනුයොගවතට නංවනු ලබන්නේ එය නො කියනු කැමැත්තේ එය නො හෙළිකරනු කැමැත්තේ "කවරෙක් අවන්නේ ද? කවර ඇවතට පැමිණියෙම් ද? කිනම් වස්තුවෙක්හි පැමිණියෙම් ද? කෙසේ පැමිණියෙම් ද? කවරක්හට බෙණෙවු ද? කුමක් බෙණෙවු ද යි අනෙකෙකින් අනෙකක් වසාලයි නම් දුකුළා ඇවැත් වේ.

විහෙසක කර්‍මය නො නැඟු කල්හි සඟමැද වස්තුවෙකින් හෝ ඇවැතෙකින් හෝ අනුයොගවතට නංවනු ලබන්නේ එය නො කියනු කැමැත්තේ එය නො හෙළි කරනු කැමැත්තේ නිහඬ වැ සඞසයා වෙහෙසා නම් දුකුළා ඇවැත් වේ.

අන්‍යවාදකකර්‍මය නැඟු කල්හි සඟමැද වස්තුවෙකින් හෝ ඇවැතෙකින් හෝ අනුයොගවතට නංවනු ලබන්නේ එය නො කියනු කැමැත්තේ එය නො හෙළි කරනු කැමැත්තේ "කවරෙක් අවන්නේ ද? කවර ඇවැත් අවන්නෙම ද? කිනම් වස්තුවෙක්හි අවන්නෙම් ද? කෙසේ අවන්නෙම් ද? කවරක්හට බෙණෙවු ද? කුමක් බෙණෙවු ද"යි අනෙකෙකින් අනෙකක් වසාලයි නම් පචිති ඇවැත් වේ.

විහෙසක කර්‍මය නැඟු කල්හි සඟමැද වස්තුවෙකින් හෝ ඇවැතෙකින් හෝ අනුයොගවතට නංවනු ලබන්නේ එය නො කියනු කැමැත්තේ එය නො හෙළි කරනු කැමැත්තේ නිහඬ වැ සංඝයා වෙහෙසා නම් පචිති ඇවැත් වේ.

ධර්‍මකර්‍මයෙහි ධර්‍මකර්‍මසංඥා ඇතියේ අනෙකක් කීමෙහි වෙහෙස-කිරීමෙහි පචිති ඇවැත් වේ. ධර්‍මකර්‍මයෙහි විමති ඇතියේ අනෙකක් කීමෙහි වෙහෙසකිරීමෙහි පචිති ඇවැත් වේ. ධර්‍මකර්‍මයෙහි අධර්‍මකර්‍මසංඥා ඇතියේ අනෙකක් කීමෙහි වෙහෙසකිරීමෙහි පචිති ඇවැත් වේ.

අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අජානන්තො පුච්ඡති, ගිලානො වා න කරොති, සඞ්ඝස්ස භණ්ඩනං වා කලහො වා විග්ගහො වා විවාදො වා භවිස්සතීති න කරොති, සඞ්ඝභෙදො වා සඞ්ඝරාජි[1] වා භවිස්සතීති න කරොති, අධම්මෙන වා වග්ගෙන වා න කම්මාරහස්ස වා කම්මං කරිස්සන්තීති න කරොති, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

අඤ්ඤවාදකසික්ඛාපදං දුතියං.

## 6. 2. 3

## උජ්ඣාපනසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා රාජගහෙ විහරති වෙළුවනෙ **කලන්දකනිවාපෙ.** තෙන ඛො පන සමයෙන ආයස්මා දබ්බො මල්ලපුත්තො සඞ්ඝස්ස සෙනාසනඤ්ච පඤ්ඤපෙති[2] භත්තානි ච උද්දිසති. තෙන ඛො පන සමයෙන මෙත්තියභුම්මජකා[3] භික්ඛූ නවකා චෙව හොන්ති අප්පපුඤ්ඤා ච යානි සඞ්ඝස්ස ලාමකානි සෙනාසනානි තානි තෙසං පාපුණන්ති. ලාමකානි ච භත්තානි. තෙ ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං භික්ඛූ උජ්ඣාපෙන්ති, ඡන්දාය දබ්බො මල්ලපුත්තො සෙනාසනං පඤ්ඤපෙති ඡන්දාය ච භත්තානි උද්දිසතීති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති කථං හි නාම මෙත්තියභුම්මජකා භික්ඛූ ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං භික්ඛූ උජ්ඣාපෙස්සන්තීති -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ දබ්බං මල්ලපුත්තං භික්ඛූ උජ්ඣාපෙථාති. සච්චං භගවා, විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා දබ්බං මල්ලපුත්තං භික්ඛූ උජ්ඣාපෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං **සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:**

"උජ්ඣාපනකෙ පාචිත්තිය"න්ති.

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

---

1. සඞ්ඝරාජීවා - මජ්සං,
2. පඤ්ඤපෙති - මජ්සං,
3. මෙත්තියභුම්මජකා - මජ්සං,

16. අධර්මකර්මයෙහි ධර්මකර්මසංඥා ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. අධර්මකර්මයෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. අධර්මකර්මයෙහි අධර්මකර්මසංඥා ඇතියේ නම් දුකුළා ඇවැත් වේ.

17. නො දන්නේ විචාරා නම්, ගිලන් වැ හෝ නො කියා නම්, සඞ්ඝයාගේ භණ්ඩනයෙක් හෝ කලහයෙක් හෝ විග්‍රහයෙක් හෝ විවාදයෙක් හෝ වන්නේ යැ යි නො කියා නම්, සඞ්ඝභෙදය හෝ සඞ්ඝරාජිය හෝ වන්නේ යැ යි නො කියා නම්, අධර්මයෙන් හෝ ව්‍යග්‍රයෙන් හෝ අකර්මාර්හයාට හෝ කර්මය කරන්නේ යැ යි නො කියා නම්, ඇවැත් නැත. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

දෙවැනි අඤ්ඤවාදකශික්ෂාපද යි

## 6. 2. 3

## උජ්ඣාපන ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු රජගහ නුවර කලන්දක නිවාප නම් වූ වේළුවනයෙහි වැඩැවෙසෙති. එසමයෙහි ඇයුෂ්මත් දබ්බමල්ලපුත්‍ර තෙරණුවෝ සඞ්ඝයාට සෙනසුන් ද පනවති. බත් උදෙසීම ද කරති. එකල්හි මෙත්තිය භුම්මජක භික්ෂූහු නවක ද මඳපිනැති ද වෙති. සඞ්ඝයාගේ යම්බඳු ලමුසෙනසුන් වෙත් නම් ඒ සෙනසුන් ද ලමුබත් ද ඔවුනට පැමිණෙත්. එව්හු ආයුෂ්මත් දබ්බමල්ල පුත්‍ර තෙරණුවනට 'ඡන්දගතියෙන් දබ්බමල්ල පුත්‍ර තෙරණුවෝ සෙනසුන් පනවති. ඡන්දගතියෙන් බත් ද උදෙසති' යි භික්ෂූන් ලවා ලමු කොට සිතවත්. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් මෙත්තිය භුම්මජක භික්ෂූහු ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍ර තෙරණුවන් භික්ෂූන් ලවා ලමු කොට සිතවූහු දූ යි .... සැබෑ ද මහණෙනි, තෙපි දබ්බමල්ල පුත්‍රයහට භික්ෂූන් ලවා ලමු කොට සිතවහු ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ...කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි දබ්බමල්ල පුත්‍රයහට භික්ෂූන් ලවා ලාමක කොට සිතවූවහු ද, හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවූ:

**"ලමු කොට සිතැවීමෙහි පචිති වේ" යයි.**

**මෙසේත් මේ සිකපදය භාග්‍යවතුන් විසින් භික්ෂූනට පනවන ලද්දේ වෙයි.**

2. තෙන ඛො පන සමයෙන මෙත්තියභුම්මජකා භික්ඛූ භගවතා උජ්ඣාපනකං පටික්ඛිත්තන්ති. එත්තාවතා භික්ඛූ සොස්සන්තීති භික්ඛූනං සාමන්තා ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං ඛීයන්ති 'ඡන්දාය දබ්බො මල්ලපුත්තො සෙනාසනං පඤ්ඤපෙති, ඡන්දාය ච භත්තානි උද්දිසතී'ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා –පෙ– තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: කථං හි නාම මෙත්තියභුම්මජකා භික්ඛූ ආයස්මන්තං දබ්බං මල්ලපුත්තං ඛීයිස්සන්තීති –පෙ– සච්චං කිර තුම්හෙ භික්ඛවෙ දබ්බං මල්ලපුත්තං ඛීයථාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා –පෙ– කථං හි නාම තුම්හෙ මොඝපුරිසා දබ්බං මල්ලපුත්තං ඛීයිස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය –පෙ– එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

"උජ්ඣාපනකෙ ඛීයනකෙ පාචිත්තිය" න්ති.

3. උජ්ඣාපනකං නාම: උපසම්පන්නං සඞ්ඝෙන සම්මතං සෙනාසනපඤ්ඤාපකං වා භත්තුද්දෙසකං වා යාගුභාජකං වා ඵලභාජකං වා ඛජ්ජභාජකං වා අප්පමත්තකවිස්සජ්ජකං වා අවණ්ණං කත්තුකාමො අයසං කත්තුකාමො මඞ්කුකත්තුකාමො උපසම්පන්නං උජ්ඣාපෙති වා ඛීයති වා ආපත්ති පාචිත්තියස්ස.

ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී උජ්ඣාපනකෙ ඛීයනකෙ ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ වෙමතිකො උජ්ඣාපනකෙ ඛීයනකෙ ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී උජ්ඣාපනකෙ ඛීයනකෙ ආපත්ති පාචිත්තියස්ස.

අනුපසම්පන්නං උජ්ඣාපෙති වා ඛීයති වා ආපත්ති දුක්කටස්ස. උපසම්පන්නං සඞ්ඝෙන අසම්මතං සෙනාසනපඤ්ඤාපකං වා භත්තුද්දෙසකං වා යාගුභාජකං වා ඵලභාජකං වා ඛජ්ජභාජකං වා අප්පමත්තකවිස්සජ්ජකං වා අවණ්ණං කත්තුකාමො අයසං කත්තුකාමො මඞ්කුකත්තුකාමො උපසම්පන්නං වා අනුපසම්පන්නං වා උජ්ඣාපෙති වා ඛීයති වා ආපත්ති දුක්කටස්ස.

2. එසමයෙහි මෙත්තියභුම්මජක භික්ෂූහු 'භාග්‍යවතුන් වහන්සේ විසින් ලමු කොට සිතැවීම පිළිකෙව් කරන ලද යි මෙපමණකින් භික්ෂූහු අසන්නාහ'යි භික්ෂූන්ගේ වැළැතෙහි ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍ර තෙරණුවන්ට 'ඡන්දගතියෙන් දබ්බමල්ලපුත්‍ර තෙමේ සෙනසුන් පැනවීම ද බත් උදෙසීම ද කෙරේ'යයි නුගුණ පවසති. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් මෙත්තිය භුම්මජක භික්ෂූහු ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍ර තෙරණුවන්ට නුගුණ පැවසූහු ද යි ... සැබෑ ද මහණෙනි, තෙපි දබ්බමල්ල-පුත්‍රයහට නුගුණ පවසහු ද යි, සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූහ ... කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි දබ්බමල්ලපුත්‍රයහට නුගුණ පැවැසූවහු ද ? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

"ලමු කොට සිතැවීමෙහි නුගුණ පැවැසීමෙහි පචිති වේ" යයි.

3. **උජ්ඣාපනක** නම්: සෙනසුන් පනවන්නකු කොට හෝ බත් උදෙසන්නකු කොට හෝ හඹු බෙදන්නකු කොට හෝ පලතුරු බෙදන්නකු කොට හෝ කැවිලි බෙදන්නකු කොට හෝ මඳදූයක් බෙදලන්නකු කොට හෝ සඟහු විසින් සම්මත කරන ලද උපසපනක්හු යැ. ගරහනු කැමැතියේ අයස දනවනු කැමැතියේ මකුකරනු කැමැතියේ උපසපනක්හු ලමු කොට සිතවා නම් හෝ නුගුණ පවසා නම් හෝ පචිති ඇවැත් වේ.

දැහැමිකම්හි ධම්කම්සංඥා ඇති යේ ලමු කොට සිතවාලීමෙහි නුගුණ පැවැසීමෙහි පචිති ඇවැත් වේ. දැහැමිකම්හි විමති ඇතියේ ලමු කොට සිතැවීමෙහි නුගුණ පැවසීමෙහි පචිති ඇවැත් වේ. දැහැමිකම්හි අධම්කම් සංඥා ඇතියේ ලමුකොට සිතැවීමෙහි නුගුණ පැවසීමෙහි පචිති ඇවැත් වේ.

අනුපසපනක්හු ලමු කොට සිතවා නම් හෝ නුගුණ පවසා නම් හෝ දුකුළා ඇවැත් වෙයි. සෙනසුන් පනවන්නකු කොට හෝ බත් උදෙසන්නකු කොට හෝ හඹු බෙදන්නකු කොට හෝ පලතුරු බෙදන්නකු කොට හෝ කැවිලි බෙදන්නකු කොට හෝ මඳදූයක් බෙදලන්නකු කොට හෝ සඟහු විසින් සම්මත නො කරන ලද උපසපනක්හු ගරහනු කැමැතියේ අයස දනවනු කැමැතියේ මකු කරනු කැමැතියේ උපසපනක්හු ලවා හෝ අනුපසපනක්හු ලවා හෝ ලමු කොට සිතවා නම් හෝ නුගුණ පවසා නම් හෝ දුකුළා ඇවැත් වේ.

අනුපසම්පන්නං සඞ්ඝෙන සම්මතං වා අසම්මතං වා සෙනාසන පඤ්ඤාපකං වා භත්තුද්දෙසකං වා යාගුභාජකං වා ඵලභාජකං වා ඛජ්ජ භාජකං වා අප්පමත්තකවිස්සජ්ජකං වා අවණ්ණං කත්තුකාමො අයසං කත්තුකාමො මඞ්කුකත්තුකාමො උපසම්පන්නං වා අනුපසම්පන්නං වා උජ්ඣාපෙති වා ඛියති වා ආපත්ති දුක්කටස්ස.

අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අධම්ම-කම්මෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** පකතියා ඡන්දා දොසා මොහා භයා කරොන්තං උජ්ඣා-පෙති වා ඛියති වා උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**උජ්ඣාපනසික්ඛාපදං තතියං.**

## 6. 2. 4

## පඨමසෙනාසනසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන භික්ඛූ හෙමන්තිකෙ කාලෙ අජ්ඣොකාසෙ සෙනාසනං පඤ්ඤපෙත්වා කායං ඔතාපෙන්තා කාලෙ ආරොචිතෙ තං පක්කමන්තා නෙව උද්ධරිංසු, න උද්ධරාපෙසුං. අනාපුච්ඡා පක්කමිංසු, සෙනාසනං ඔවට්ඨං හොති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛියන්ති විපාචෙන්ති, කථං හි නාම භික්ඛූ අජ්ඣොකාසෙ සෙනාසනං පඤ්ඤාපෙත්වා තං පක්කමන්තා නෙව උද්ධරිස්සන්ති න උද්ධරාපෙස්සන්ති අනාපුච්ඡා පක්කමිස්සන්ති සෙනාසනං ඔවට්ඨං හොති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛූ අජ්ඣොකාසෙ -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

> **"යො පන භික්ඛු සඞ්ඝිකං මඤ්චං වා පීඨං වා භිසිං වා කොච්ඡං වා අජ්ඣොකාසෙ සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා තං පක්කමන්තො නෙව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය අනාපුච්ඡං වා ගච්ඡෙය්‍ය පාචිත්තිය" න්ති.**

**එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.**

සෙනසුන් පනවන්නකු කොට හෝ බත් උදෙසන්නකු කොට හෝ හඹු බෙදන්නකු කොට හෝ පලතුරු බෙදන්නකු කොට හෝ කැවිලි බෙදන්නකු කොට හෝ මදදුයක් බෙදලන්නකු කොට හෝ සඟහු විසින් සම්මත කරන ලද්දවූ හෝ සම්මත නො කරන ලද්දවූ හෝ අනුපසසම්පන්නකු ගරහනු කැමැතියේ අයස දනවනු කැමැතියේ මකු කරනු කැමැතියේ උපසපනක්හු ලවා හෝ අනුපසපනක්හු ලවා හෝ ලමු කොට සිතවා නම් හෝ නුගුණ පවසා නම් හෝ දුකුළා ඇවැත් වේ.

නො දහැමිකම්හි දහැමිකමෙක යන සංඥා ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො දහැමිකම්හි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නොදහැමිකම්හි නොදහැමිකමෙක යන සංඥා ඇතියේ නම් දුකුළා ඇවැත් වේ.

ප්‍රකෘතියෙන් ඡන්දයෙන් ද්වේෂයෙන් භයෙන් මෝහයෙන් කරන්නහු ලමු කොට සිතවා නම් හෝ (ඔහුගේ) නුගුණ පවසා නම් හෝ (ඇවැත් නැති) උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**තෙවැනි උජ්ඣාපනක ශික්ෂාපදයි**

## 6. 2. 4.

## පඨමසේනාසනශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩවෙසෙති. එසමයෙහි භික්ෂූහු හිමත් කල්හි එළිමහන්හි සෙනසුන් පනවා සිරිර තවන්නෝ කල් දන්වූ කල්හි බැහැර යන්නාහු ඒ සෙනසුන් නොමැ ගෝපන කළහ, නොද ගෝපන කැරැවූහ, නොවිචාරා බැහැර ගියහ. සෙනසුන (හිමවැස්සෙන්) තෙත් වූයේ වෙයි. යම් ඒ භික්ෂූ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් භික්ෂූහු එළිමහන්හි සෙනසුන් පනවා බැහැර යන්නාහු එය නොම ගෝපන කළෝ ද නො ද ගෝපන කැරැවූවෝ ද, නොවිචාරා බැහැර ගියෝ ද සෙනසුන (හිම වැස්සෙන්) තෙමිණැ යි. එකල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැලකළහ ... සැබැද? මහණෙනි, භික්ෂූහු එළිමහනෙහි ... මෙසේ ද මහණෙනි; මේ සිකපදය උදෙසවු:-

**"යම් මහණෙක් සඟසතු ඇඳක් හෝ පුටුවක් හෝ බිස්සක් හෝ බඳවෙළුවක් හෝ එළිමහනෙහි අතුරා හෝ අතුරුවා හෝ බැහැර යන්නේ එය නොමැ තැන්පත් කරන්නේ නම් හෝ නොද තැන්පත් කරවන්නේ නම් හෝ නොවිචාරා යන්නේ නම් හෝ පචිති වේ"** යයි.

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේ මේ සිකපදය ද භික්ෂූනට පනවන ලද්දේ වේ.

2. තෙන ඛො පන සමයෙන භික්ඛූ අජ්ඣොකාසෙ වසිත්වා කාලසෙසව සෙනාසනං අතිහරන්ති. අද්දසා ඛො භගවා තෙ භික්ඛූ කාලසෙසව සෙනාසනං අතිහරන්තෙ. දිස්වා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. අනුජානාමි භික්ඛවෙ අට්ඨමාසෙ අවස්සිකසඞ්කෙතෙ මණ්ඩපෙ වා රුක්ඛමූලෙ වා යත්ථ කාකා වා කුලලා වා න ඌහදන්ති තත්ථ සෙනාසනං නික්ඛිපිතුන්ති.

3. **යො පනාති:** යො යාදිසො......භික්ඛූති......අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**සඞ්ඝිකං** නාම: සඞ්ඝස්ස දින්නං හොති පරිච්චත්තං.

**මඤ්චො** නාම: චත්තාරො මඤ්චා මසාරකො, බුන්දිකාබද්ධො, කුළීරපාදකො, ආහච්චපාදකො.

**පීඨං** නාම: චත්තාරි පීඨානි මසාරකං බුන්දිකාබද්ධං කුළීරපාදකං ආහච්චපාදකං.

**භිසි** නාම: පඤ්චභිසියො උණ්ණභිසි[1] චොළභිසි වාකභිසි තිණභිසි පණ්ණභිසි.

**කොච්ඡං** නාම: වාකමයං වා උසීරමයං වා මුඤ්ජමයං වා බබ්බජමයං[2] වා අන්තො සංවෙඨෙත්වා බද්ධං හොති.

**සන්ථරිත්වාති:** සයං සන්ථරිත්වා. **සන්ථරාපෙත්වාති:** අඤ්ඤං සන්ථරාපෙත්වා අනුපසම්පන්නං සන්ථරාපෙති තස්ස පළිබොධො; උපසම්පන්නං සන්ථරාපෙති සන්ථතස්ස[3] පළිබොධො.

**තං පක්කමන්තො නෙව උද්ධරෙය්‍යාති:** න සයං උද්ධරෙය්‍ය. **න උද්ධරාපෙය්‍යාති:** න අඤ්ඤං උද්ධරාපෙය්‍ය. **අනාපුච්ඡං වා ගච්ඡෙය්‍යාති:** භික්ඛුං වා සාමණෙරං වා ආරාමිකං වා අනාපුච්ඡා මජ්ඣිමස්ස පුරිසස්ස ලෙඩ්ඩුපාතං අතික්කමන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

සඞ්ඝිකෙ සඞ්ඝිකසඤ්ඤී අජ්ඣොකාසෙ සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා තං පක්කමන්තො නෙව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය අනාපුච්ඡං වා ගච්ඡෙය්‍ය ආපත්ති පාචිත්තියස්ස. සඞ්ඝිකෙ වෙමතිකො -පෙ- සඞ්ඝිකෙ පුග්ගලිකසඤ්ඤී අජ්ඣොකාසෙ සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා තං පක්කමන්තො නෙව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය අනාපුච්ඡං වා ගච්ඡෙය්‍ය ආපත්ති පාචිත්තියස්ස.

---

1. උණ්ණභිසි - සිමු I, මජසං 2. පබ්බජමයං - මජසං. 3. සන්ථාරකස්ස - මජසං.

2. එසමයෙහි වනාහි භික්ෂූහු එළිමහනෙහි වැස කල්හබා මැ සෙනසුන ගෙන යති. භාග්‍යවතුන් වහන්සේ කල්හබා මැ සෙනසුන ගෙන යන ඒ භික්ෂූන් දුටු සේක. දැක මෙකරුණෙහි ලා මෙ ප්‍රකරණයෙහි ලා දැහැමි කථා කොට මහණුන් ඇමතූ සේක: **"මහණෙනි, හිමත් ගිමන් නොවසින ලකුණු ඇති අටමස්හි යම් තෙනෙකැ කවුඩුවෝ හෝ උකුස්සෝ හෝ මල පහ නො කෙරෙත් නම් එවන් මඩුවෙකැ හෝ රුප්පයෙකැ හෝ සෙනසුන බහා තබන්නට අනුදනිමි"යි.**

3. **යො පන:** යම්, යම්බඳු ... භිකබු ... මෙතෙම මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**සඞ්ඝික** නම්: සඟනට දෙන ලද්දෙක් පරිත්‍යක්තයෙක් වෙයි.

**මඤ්ච** නම්: මසාරක යැ බුන්දිකාබද්ධ යැ කුලීරපාදක යැ ආහච්චපාදක යැ යි සිවු ඇඳෙකි.

**පීඨ** නම්: මසාරක යැ බුන්දිකාබද්ධ යැ කුලීරපාදක යැ ආහච්ච-පාදක යැ යි සිවු පුටුවෙකි.

**භිසි** නම්: **උණ්ණාභිසි** යැ චොලභිසි යැ වාකභිසි යැ **තිණභිසි** යැ **පණ්ණභිසි** යැ යි පස් බිස්සෙකි.

**කොච්ඡ** නම්: වැහැරිමුවා හෝ සුවඳහොටමුවා හෝ මුදුතණමුවා හෝ බබුස්තණමුවා හෝ ඇතුළතැ මොනවට වෙළා බඳනා ලද්දෙක් වෙයි.

**සන්ථරිත්වා:** තෙමේ අතුරා. **සන්ථරාපෙත්වා:** අනෙකක්හු ලවා අතුරුවා අනුපසපනක්හු ලවා අතුරුවා නම් ඔහුට පළිබොධ වෙයි. උපසපනක්හු ලවා අතුරුවා නම් අතුරනලද්දහුට පළිබොධ වෙයි.

**තං පක්කමන්තො නෙව උද්ධරෙය්‍ය:** තෙමේ නො මැ ගොපන කරන්නේ නම්. **න උද්ධරාපෙය්‍ය:** අනෙකක්හු ලවා නො ද ගොපන කරවන්නේ නම්. **අනාපුච්ඡං වා ගච්ඡෙය්‍ය:** මහණක්හු හෝ හෙරණක්හු හෝ ආරාමිකයක්හු හෝ නො විචාරා මැදුම් පිරිමිතියක්හු කැටක් දමා ලන තන් ඉක්මවන්නාහට පචිති ඇවැත් වේ.

4. සඟසතුයෙහි සඟසතුසන් ඇතියේ එළිමහනෙහි අතුරා හෝ අතුරුවා හෝ බැහැර යන්නේ එය නො මැ ගෝපන කරන්නේ නම් නො ද ගෝපන කරවන්නේ නම් නො විචාරා හෝ යන්නේ නම් පචිති ඇවැත් වේ. සඟසතුයෙහි විමති ඇතියේ ... සඟසතුයෙහි පුඟුල්සන් ඇතියේ එළිමහනෙහි අතුරා හෝ අතුරුවා හෝ බැහැර යන්නේ එය නො මැ ගෝපන කරන්නේ නම් නො ද ගෝපන කරවන්නේ නම් නො විචාරා හෝ යන්නේ නම් පචිති ඇවැත් වේ.

චිලිමිකං[1] වා උත්තරත්ථරණං වා භූමත්ථරණං[2] වා තට්ටිකං වා චම්මඛණ්ඩං වා පාදපුඤ්ඡනිං වා ඵලකපීඨං වා අජ්ඣොකාසෙ සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා තං පක්කමන්තො නෙව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය අනාපුච්ඡං වා ගච්ඡෙය්‍ය ආපත්ති දුක්කටස්ස.

පුග්ගලිකෙ සඞ්ඝිකසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. පුග්ගලිකෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. පුග්ගලිකෙ පුග්ගලිකසඤ්ඤී අඤ්ඤස්ස පුග්ගලිකෙ ආපත්ති දුක්කටස්ස. අත්තනො පුග්ගලිකෙ අනාපත්ති.

**අනාපත්ති:** උද්ධරිත්වා ගච්ඡති, උද්ධරාපෙත්වා ගච්ඡති, ආපුච්ඡිත්වා[3] ගච්ඡති, ඔතාපෙන්තො ගච්ඡති, කෙනචි පලිබුද්ධං හොති, ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**පඨමසෙනාසනසික්ඛාපදං චතුත්ථං.**

## 6. 2. 5

## දුතියසෙනාසනසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන **සත්තරසවග්ගියා** භික්ඛූ සහායකා හොන්ති. තෙ වසන්තාපි එකතො වසන්ති, පක්කමන්තාපි එකතො පක්කමන්ති. තෙ අඤ්ඤතරස්මිං සඞ්ඝිකෙ විහාරෙ සෙය්‍යං සන්ථරිත්වා තං පක්කමන්තා නෙව උද්ධරිංසු. න උද්ධරාපෙසුං. අනාපුච්ඡා පක්කමිංසු. සෙනාසනං උපචිකාහි ඛායිතං හොති.

2. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා……තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති කථං හි නාම සත්තරසවග්ගියා භික්ඛූ සඞ්ඝිකෙ විහාරෙ සෙය්‍යං සන්ථරිත්වා තං පක්කමන්තා නෙව උද්ධරිස්සන්ති න උද්ධරාපෙස්සන්ති අනාපුච්ඡා පක්කමිස්සන්ති සෙනාසනං උපචිකාහි ඛායිතන්ති …… සච්චං කිර භික්ඛවෙ සත්තරසවග්ගියා භික්ඛූ සඞ්ඝිකෙ විහාරෙ සෙය්‍යං සන්ථරිත්වා තං පක්කමන්තා නෙව උද්ධරිංසු, න උද්ධරාපෙසුං, අනාපුච්ඡා පක්කමිංසු, සෙනාසනං උපචිකාහි ඛායිතන්ති. සච්චං භගවා විගරහි බුද්ධො භගවා……කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා සඞ්ඝිකෙ විහාරෙ සෙය්‍යං සන්ථරිත්වා තං පක්කමන්තා නෙව උද්ධරිස්සන්ති න උද්ධරාපෙස්සන්ති අනාපුච්ඡා පක්කමිස්සන්ති සෙනාසනං උපචිකාහි ඛායිතං. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය……එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

> **"යො පන භික්ඛු සඞ්ඝිකෙ විහාරෙ සෙය්‍යං සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා තං පක්කමන්තො නෙව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය අනාපුච්ඡං වා ගච්ඡෙය්‍ය පාචිත්තිය"න්ති.**

---

1. චිමිලිකං - සිමු i, මජ්ඣං
2. භූමත්ථරණං - මජ්ඣං.
3. ආපුච්ඡං - මජ්ඣං, ස්‍යා.

චිලිම්කාවක් හෝ උතුරතුරුණක් හෝ බුමුතුරුණක් හෝ තට්ටිකාවක් හෝ සම්කඩක් හෝ පාපිස්නක් හෝ පුවරුපුටුවක් හෝ එළිමහනෙහි අතුරා හෝ අතුරුවා හෝ බැහැර යන්නේ එය නො මැ ගෝපන කරන්නේ නම් නො ද ගෝපන කරවන්නේ නම් නො විචාරා හෝ යන්නේ නම් දුකුළා ඇවැත් වේ.

පුඟුල් සතුයෙහි සඟසතුසන් ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. පුඟුල්සතුයෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. පුඟුල්සතුයෙහි පුඟුල්සතුසන් ඇතියේ නම් අනෙකක්හුගේ පුඟුල්සතුයෙහි දුකුළා ඇවැත් වේ. තමාගේ පුඟුල් සතුයෙහි ඇවැත් නැති.

උදුරා යේ නම් උදුරුවා යේ නම් විචාරා යේ නම් වියැළෙන්නට තබමින් යේ නම් කිසිවකිනුදු ගැහැටෙක් වේ නම් ඔහට ඇවැත් නැත, ආපදුවෙහි ද උම්මත්තකයහට ද ආදිකම්මිකයහට ද ඇවැත් නැති.

**සිවුවැනි පඨම සේනාසනශික්ෂාපද යි.**

## 6. 2. 5

## දුතිය සේනාසනශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු **සැවැත් නුවර ජේතවන නම් අනේපිඬු** සිටුහුගේ අරම්හි වැඩවෙසෙති. එසමයෙහි වනාහි **සතළොස්වගැ මහණහු** යහළුවෝ වෙති. ඔහු වසන්නෝ ද එකට වෙසෙති. බැහැර යන්නෝ ද එකට බැහැර යෙත්. ඔහු එක්තරා සඟසතු වෙහෙරෙක්හි සෙනසුන් අතුරා බැහැර යන්නාහු එය නො මැ ගොපන කළහ. නො ද ගොපන කැරැවූහ. නොවිචාරා බැහැර ගියහ. සෙනසුන වෙයන් විසින් කන ලද්දේ වෙයි.

2. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් සතළෙ ස්වග මහණහු සඟසතු වෙහෙරෙහි සෙනසුන් අතුරා බැහැර යන්නාහු එය නො මැ තැන්පත් කළෝ ද, නොද තැන්පත් කැරැවූවෝ ද, නො පිළිවිසැ ගියෝ ද, සෙනසුන වෙයන් විසින් කන ලද්දේ යැ යි ... සැබෑ ද මහණෙනි, සතළොස් වග මහණහු සඟසතු වෙහෙරෙහි සෙනසුන් අතුරා බැහැර යන්නාහු එය නො මැ තැන්පත් කළෝ ද, නොද තැන්පත් කැරැවූවෝ ද, නො පිළිවිසැ ගියෝ ද, සෙනසුන වෙයන් විසින් කන ලද්දේ දැ යි. සැබෑ වැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, ඒ හිස්පුරුෂයෝ සඟසතු වෙහෙරෙහි සෙනසුන් අතුරා බැහැර යන්නාහු නො මැ තැන්පත් කළෝ ද, නොද තැන්පත් කැරවූවෝ ද, නො පිළිවිසැ ගියෝ ද, සෙනසුන වෙයන් විසින් කන ලද්දේ දැ යි. මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**''යම් මහණෙක් සඟසතු වෙහෙරෙක්හි සෙනසුන් අතුරා හෝ අතුරුවා හෝ බැහැර යන්නේ එය නො මැ තැන්පත් කරන්නේ නම් නො තැන්පත් කරවන්නේ නම් නො පිළිවිසැ හෝ යන්නේ නම් පචිති වේ'' යයි.**

3. **යො පනාති:** යො යාදිසො.........**භික්ඛූති**......අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**සඞ්ඝිකො** නාම: විහාරො සඞ්ඝස්ස දින්නො හොති පරිච්චත්තො.

**සෙය්‍යං** නාම: භිසි චිලිමිකා උත්තරත්ථරණං භුම්මත්ථරණං තට්ටිකා චම්මඛණ්ඩො නිසීදනං පච්චත්ථරණං තිණසන්ථාරො පණ්ණසන්ථාරො.

**සන්ථරිත්වාති:** සයං සන්ථරිත්වා. **සන්ථරාපෙත්වාති:** අඤ්ඤං සන්ථරාපෙත්වා.

**තං පක්කමන්තො නෙව උද්ධරෙය්‍යාති:** න සයං උද්ධරෙය්‍ය **න උද්ධරාපෙය්‍යාති:** න අඤ්ඤං උද්ධරාපෙය්‍ය.

**අනාපුච්ඡං වා ගච්ඡෙය්‍යාති:** භික්ඛුං වා සාමණෙරං වා ආරාමිකං වා අනාපුච්ඡා පරික්ඛිත්තස්ස ආරාමස්ස පරික්ඛෙපං අතික්කමන්තස්ස ආපත්ති පාචිත්තියස්ස. අපරික්ඛිත්තස්ස ආරාමස්ස උපචාරං අතික්කමන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

සඞ්ඝිකෙ සඞ්ඝිකසඤ්ඤී සෙය්‍යං සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා තං පක්කමන්තො නෙව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය අනාපුච්ඡං වා ගච්ඡෙය්‍ය ආපත්ති පාචිත්තියස්ස. සඞ්ඝිකෙ වෙමතිකො සෙය්‍යං සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා තං පක්කමන්තො නෙව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය අනාපුච්ඡං වා ගච්ඡෙය්‍ය ආපත්ති පාචිත්තියස්ස. සඞ්ඝිකෙ පුග්ගලිකසඤ්ඤී සෙය්‍යං සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා තං පක්කමන්තො නෙව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය අනාපුච්ඡං වා ගච්ඡෙය්‍ය ආපත්ති පාචිත්තියස්ස.

විහාරස්ස උපචාරෙ වා උපට්ඨානසාලායං වා මණ්ඩපෙ වා රුක්ඛමූලෙ වා සෙය්‍යං සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා තං පක්කමන්තො නෙව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය අනාපුච්ඡං වා ගච්ඡෙය්‍ය ආපත්ති දුක්කටස්ස. මඤ්චං වා පීඨං වා විහාරෙ වා විහාරස්ස උපචාරෙ වා උපට්ඨාන සාලායං වා මණ්ඩපෙ වා රුක්ඛමූලෙ වා සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා තං පක්කමන්තො නෙව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය අනාපුච්ඡං වා ගච්ඡෙය්‍ය ආපත්ති දුක්කටස්ස.

3. **යො පන:** යම්, යම්බඳු ... **භිකබු:** මෙතෙම මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**සඞ්ඝික** නම්: විහාරය සඟහට දෙන ලද්දෙක් පරිත්‍යක්තයෙක් වෙයි.

**සෙය්‍ය** නම්: බිසි යැ විලිම්කා යැ උතුරතුරුණු යැ බුමුතුරුණු යැ තට්ටිකා යැ සම්කඩ යැ නිසීදන යැ පසතුරුණු යැ තණඇතිරි යැ පත් ඇතිරි යි.

**සන්ථරිත්වා:** තෙමේ අතුරා. **සන්ථරාපෙත්වා:** අනෙකක්හු ලවා අතුරුවා.

**තං පකකමනෙතා නෙව උද්ධරෙය්‍ය:** තෙමේ නො මැ තැන්පත් කරන්නේ නම්.

**න උද්ධරෙය්‍ය:** අනෙකක්හු ලවා නො තැන්පත් කරවන්නේ නම්.

**අනාපුච්ඡං වා ගච්ඡෙය්‍ය:** මහණක්හු හෝ හෙරණක්හු හෝ ආරාමිකයක්හු හෝ නො පිළිවිසැ පිරිකෙව් කරන ලද අරම්හි පිරිකෙව්ව ඉක්මවන්නාහට පචිති ඇවැත් වේ. නො පිරිකෙව් කරන ලද අරම්හි උවසර ඉක්මවන්නාහට පචිති ඇවැත් වේ.

සඟසතුයෙහි සඟසතුසන් ඇතියේ සෙනසුන් අතුරා හෝ අතුරුවා හෝ බැහැර යන්නේ එය නො මැ තැන්පත් කරන්නේ නම් නො තැන්පත් කරවන්නේ නම් නො පිළිවිසැ හෝ යන්නේ නම් පචිති ඇවැත් වේ. සඟසතුයෙහි විමති ඇතියේ සෙනසුන් අතුරා හෝ අතුරුවා හෝ බැහැර යන්නේ එය නො මැ තැන්පත් කරන්නේ නම් නො තැන්පත් කරවන්නේ නම් නො පිළිවිසැ හෝ යන්නේ නම් පචිති ඇවැත් වේ. සඟසතුයෙහි පුඟුල්සන් ඇතියේ සෙනසුන් අතුරා හෝ අතුරුවා හෝ බැහැර යන්නේ එය නො මැ තැන්පත් කරන්නේ නම් නො තැන්පත් කරවන්නේ නම් නො පිළිවිසැ හෝ යන්නේ නම් පචිති ඇවැත් වේ.

වෙහෙර උවසරෙහි හෝ උවටැන්හල්හි හෝ මඩුවෙහි හෝ රුක්මුලැ හෝ සෙනසුන් අතුරා හෝ අතුරුවා හෝ බැහැර යන්නේ එය නො මැ තැන්පත් කරන්නේ නම් නො තැන්පත් කරවන්නේ නම් නො පිළිවිසැ හෝ යන්නේ නම් දුකුළා ඇවැත් වේ. ඇඳක් හෝ පුටුවක් හෝ වෙහෙරෙහි හෝ වෙහෙරුවසරෙහි හෝ උවටැන්හල්හි හෝ මඩුවෙහි හෝ රුක්මුලැ හෝ අතුරා හෝ අතුරුවා හෝ බැහැර යන්නේ එය නො මැ තැන්පත් කරන්නේ නම් නො තැන්පත් කරවන්නේ නම් නො පිළිවිසැ හෝ යන්නේ නම් දුකුළා ඇවැත් වේ.

පුග්ගලිකෙ සඞ්ඝිකසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. පුග්ගලිකෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. පුග්ගලිකෙ පුග්ගලිකසඤ්ඤී අඤ්ඤස්ස පුග්ගලිකෙ ආපත්ති දුක්කටස්ස. අත්තනො පුග්ගලිකෙ අනාපත්ති.

**අනාපත්ති:** උද්ධරිත්වා ගච්ඡති, උද්ධරාපෙත්වා ගච්ඡති, ආපුච්ඡිත්වා ගච්ඡති, කෙනචි පළිබුද්ධං හොති. සාපෙක්ඛො ගන්ත්වා තත්ථ ඨිතො ආපුච්ඡති. කෙනචි පළිබුද්ධො හොති, ආපදාසු, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

දුතියසෙනාසනසික්ඛාපදං පඤ්චමං.

## 6. 2. 6

## අනුපඛජ්ජසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ වරසෙය්‍යායො පළිබුද්ධන්ති.[1] ථෙරා[2] භික්ඛූ වුට්ඨාපෙන්ති. අථ ඛො ඡබ්බග්ගියානං භික්ඛූනං එතදහොසි, කෙන නු ඛො මයං උපායෙන ඉධෙව වසෙය්‍යාමාති.[3] අථ ඛො ඡබ්බග්ගියා භික්ඛූ ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ සෙය්‍යං කප්පෙන්ති, යස්ස සම්බාධො භවිස්සති සො පක්කමිස්සතීති.

2. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති 'කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ සෙය්‍යං කප්පෙස්සන්තී'ති. -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ සෙය්‍යං කප්පෙථාති. සච්චං භගවා, විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ සෙය්‍යං කප්පෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු සඞ්ඝිකෙ විහාරෙ ජානං පුබ්බුපගතං භික්ඛුං අනුපඛජ්ජ සෙය්‍යං කප්පෙය්‍ය යස්ස සම්බාධො භවිස්සති සො පක්කමිස්සතීති එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං පාචිත්තිය"න්ති.**

---

1. පළිබුන්ධෙන්ති - මජසං. 2. ථෙරෙ - (අට්ඨකථායං) 3. වසෙය්‍යාමාති - මජසං.

පුඟුල් සතුයෙහි සඟසතුසත් ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. පුඟුල්සතුයෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. පුඟුල්සතුයෙහි පුඟුල්සතුසත් ඇතියේ අනෙකක්හුගේ පුඟුල්සතුයෙහි නම් දුකුළා ඇවැත් වේ. තමාගේ පුඟුල්සතුයෙහි නම් ඇවැත් නැති.

තැන්පත් කොට යේ නම් තැන්පත් කරවා යේ නම් පිළිවිසැ යේ නම් කිසිවකිනුදු (සෙනසුනට) ගැහැටෙක් වේ නම් අපෙක්ෂා සහිත වැ ගොස් එහි සිටියේ පිළිවිසී නම් කිසිවකිනිදු ගැහැට ඇතියෙක් වේ නම් ආපදවෙහි ද, උම්මත්තකයහට ද ආදිකම්මිකයාහට ද ඇවැත් නැති.

**පස්වැනි දුතියසේනාසන ශික්ෂාපද යි**

## 6. 2. 6

## අනුපඛජ්ජශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු **සැවැතැ ජේතවන** නම් **අනේපිඩු** සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි සවගමහණුහු පෙරටු වැ ගොස් උතුම් සෙනසුන් වළහා සිටීත්. තෙරහු භික්ෂූන් (වසගින්) නැගිටුවාලති. එකල්හි සවගමහණුන්හට ''කවර උපායෙකින් ඇපි මෙහි මැ වසන්නෙමු දෝ හෝ යි' මෙ සිත විය. එකල්හි සවගමහණුහු 'යමක්හට ගැහැට වන්නේ නම් හේ බැහැර යන්නේ' යැ යි ස්ථවිර භික්ෂූන් අතුරෙහි පිවිස ශයනය කෙරෙත්.

2. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් සවගමහණුහු ස්ථවිර භික්ෂූන් අතුරෙහි පිවිස ශයනය කළාහු දැ යි ... සැබෑ ද මහණෙනි, තෙපි ස්ථවිර භික්ෂූන් අතුරෙහි පිවිස ශයනය කරන්නාහු දැ යි සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් හිස්පුරුෂයෙනි, තෙපි ස්ථවිර භික්ෂූන් අතුරෙහි පිවිස ශයනය කළාහු දැ යි. හිස් පුරුෂයෙනි; මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි. ... මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

> **''යම් මහණෙක් සඟසතු වෙහෙරෙක්හි දැනැ දැනැ පළමු පැමිණි මහණුහු අතුරෙහි පිවිස 'යමක්හට ගැහැට වන්නේ නම් හේ බැහැර යන්නේ' යැ යි අනෙකක් නො වැ මෙය මැ කරුණු කොට ගෙන ශයනය කරන්නේ නම් පචිති වේ''** යයි.

3. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**සඞ්ඝිකො** නාම: විහාරො සඞ්ඝස්ස දින්නො හොති පරිච්චත්තො.

**ජානාති** නාම: වුඩ්ඪොති ජානාති ගිලානොති ජානාති සඞ්ඝෙන දින්නොති ජානාති.

**අනුපඛජ්ජාති:** අනුපවිසිත්වා. **සෙය්‍යං කප්පෙය්‍යාති:** මඤ්චස්ස වා පීඨස්ස වා පවිසන්තස්ස වා නික්ඛමන්තස්ස වා උපචාරෙ සෙය්‍යං සන්ථරති වා සන්ථරාපෙති වා ආපත්ති දුක්කටස්ස. අභිනිසීදති වා අභිනිපජ්ජති වා ආපත්ති පාචිත්තියස්ස.

**එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤන්ති:** න අඤ්ඤො කොචි පච්චයො හොති අනුපඛජ්ජ සෙය්‍යං කප්පෙතුං.

සඞ්ඝිකෙ සඞ්ඝිකසඤ්ඤී අනුපඛජ්ජ සෙය්‍යං කප්පෙති ආපත්ති පාචිත්තියස්ස. සඞ්ඝිකෙ වෙමතිකො අනුපඛජ්ජ සෙය්‍යං කප්පෙති ආපත්ති පාචිත්තියස්ස. සඞ්ඝිකෙ පුග්ගලිකසඤ්ඤී අනුපඛජ්ජ සෙය්‍යං කප්පෙති ආපත්ති පාචිත්තියස්ස.

මඤ්චස්ස වා පීඨස්ස වා පවිසන්තස්ස වා නික්ඛමන්තස්ස වා උපචාරං ඨපෙත්වා සෙය්‍යං සන්ථරති වා සන්ථරාපෙති වා ආපත්ති දුක්කටස්ස. අභිනිසීදති වා අභිනිපජ්ජති වා ආපත්ති දුක්කටස්ස. විහාරස්ස උපචාරෙ වා උපට්ඨානසාලායං වා මණ්ඩපෙ වා රුක්ඛමූලෙ වා අජ්ඣොකාසෙ වා සෙය්‍යං සන්ථරති වා සන්ථරාපෙති වා ආපත්ති දුක්කටස්ස. අභිනිසීදති වා අභිනිපජ්ජති වා ආපත්ති දුක්කටස්ස.

පුග්ගලිකෙ සඞ්ඝිකසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. පුග්ගලිකෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. පුග්ගලිකෙ පුග්ගලිකසඤ්ඤී අඤ්ඤස්ස පුග්ගලිකෙ ආපත්ති දුක්කටස්ස. අත්තනො පුග්ගලිකෙ අනාපත්ති.

**අනාපත්ති:** ගිලානො පවිසති සීතෙන වා උණ්හෙන වා පීළිතො පවිසති ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සා'ති.

අනුපඛජ්ජසික්ඛාපදං ඡට්ඨං.

3. **යො පන:** යම්, යම්බඳු...භික්ඛු:...මෙතෙම මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**සඞ්ඝික** විහාර නම්: සඟනට දෙන ලද්දෙක් පරිත්‍යක්තයෙක් වෙයි.

**ජානාති** නම්: වැඩිසිටියෙකැයි දනී, ගිලනෙකැයි දනී, සඟහු විසින් දෙන ලද්දෙකැ යි දනී.

**අනුපඛජ්ජ:** අතුරෙහි පිවිස. **සෙය්‍යං කප්පෙය්‍ය:** ඇඳෙක හෝ පුටුවෙකැ හෝ පිවිසෙන්නහුගේ හෝ නික්මෙන්නහුගේ හෝ උවසර සෙනසුනක් අතුරා නම් හෝ අතුරුවා නම් හෝ දුකුළා ඇවැත් වේ. අතුරෙහි හිඳී නම් හෝ අතුරෙහි නිදා නම් හෝ පචිති ඇවැත් වේ.

**එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං:** අතුරෙහි පිවිස හොවින්නට අන් කිසිදු කරුණෙක් නැති.

සඟසතුයෙහි සඟසතුසන් ඇතියේ අතුරෙහි පිවිස ශයනය කෙරේ නම් පචිති ඇවැත් වේ. සඟසතුයෙහි විමති ඇතියේ අතුරෙහි පිවිස ශයනය කෙරේ නම් පචිති ඇවැත් වේ. සඟසතුයෙහි පුඟුල්සතුසන් ඇතියේ අතුරෙහි පිවිස ශයනය කෙරේ නම් පචිති ඇවැත් වේ.

ඇඳෙකැ හෝ පුටුවෙකැ හෝ පිවිසෙන්නහුගේ හෝ නික්මෙන්න හුගේ හෝ උවසර තබා සෙනසුනක් අතුරා නම් හෝ අතුරුවා නම් හෝ දුකුළා ඇවැත් වේ. අතුරෙහි හිඳී නම් හෝ අතුරෙහි නිදා නම් හෝ දුකුළා ඇවැත් වේ. වෙහෙර උවසරෙහි හෝ උවටන්හල්හි හෝ මඩුවෙක්හි හෝ රුක්මුලෙකැ හෝ එළිමහනෙකැ හෝ සෙනසුනක් අතුරා නම් හෝ අතුරුවා නම් හෝ දුකුළා ඇවැත් වේ. අතුරෙහි හිඳී නම් හෝ අතුරෙහි නිදා නම් හෝ දුකුළා ඇවැත් වේ.

පුඟුල්සතුයෙහි සඟසතුසන් ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. පුඟුල්සතුයෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. පුඟුල්සතුයෙහි පුඟුල්සතුසන් ඇතියේ අනෙකක්හුගේ පුඟුල්සතුයෙහි නම් දුකුළා ඇවැත් වේ. තමාගේ පුඟුල්සතුයෙහි නම් ඇවැත් නැති.

ගිලන් වැ පිවිසේ නම්, ශීතයෙන් හෝ උෂ්ණයෙන් හෝ පීඩිත වැ පිවිසේ නම්, ඇවැත් නැත. ආපදවෙහි ද උම්මත්තකයහට ද ආදිකම්මික-යාහට ද ඇවැත් නැති.

**සවැනි අනුපඛජ්ජශික්ෂාපද යි.**

## 6. 2. 7

## නික්කඩ්ඪනසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන සත්තරසවග්ගියා භික්ඛූ අඤ්ඤතරං පච්චන්තිමං මහාවිහාරං පටිසංඛරොන්ති ඉධ මයං වස්සං වසිස්සාමාති. අද්දසංසු ඛො ඡබ්බග්ගියා භික්ඛූ සත්තරසවග්ගියෙ භික්ඛූ විහාරං පටිසඞ්ඛරොන්තෙ, දිස්වාන එවමාහංසු: "ඉමෙ ආවුසො සත්තරසවග්ගියා භික්ඛූ විහාරං පටිසඞ්ඛරොන්ති, හන්ද නෙ වුට්ඨාපෙස්සාමා"ති. එකච්චෙ එවමාහංසු: ආගමෙථාවුසො යාව පටිසඞ්ඛරොන්ති පටිසඞ්ඛතෙ වුට්ඨාපෙස්සාමාති. අථ ඛො ඡබ්බග්ගියා භික්ඛූ සත්තරසවග්ගියෙ භික්ඛූ එතදවොචුං: "උට්ඨෙථාවුසො අම්හාකං විහාරො පාපුණාතී"ති. නනු ආවුසො පටිගච්චෙව[1] ආචික්ඛිතබ්බං, මයඤ්චඤ්ඤං පටිසඞ්ඛරෙය්‍යාමාති, නනු ආවුසො සඞ්ඝිකො විහාරොති. ආමාවුසො සඞ්ඝිකො විහාරොති. උට්ඨෙථාවුසො අම්හාකං විහාරො පාපුණාතී'ති. මහල්ලකො ආවුසො විහාරො. තුම්හෙපි වසථ මයම්පි වසිස්සාමාති. උට්ඨෙථාවුසො අම්හාකං විහාරො පාපුණාතී'ති කුපිතා අනත්තමනා ගීවාය ගහෙත්වා නික්කඩ්ඪන්ති. තෙ නික්කඩ්ඪියමානා රොදන්ති. භික්ඛූ එවමාහංසු: "කිස්ස තුම්හෙ ආවුසො රොදථා"ති. ඉමෙ ආවුසො ඡබ්බග්ගියා භික්ඛූ කුපිතා අනත්තමනා අම්හෙ සඞ්ඝිකා විහාරා නික්කඩ්ඪන්තීති.

2. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා...තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති 'කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ කුපිතා අනත්තමනා භික්ඛූ සඞ්ඝිකා විහාරා නික්කඩ්ඪිස්සන්තීති ... සච්චං කිර තුම්හෙ භික්ඛවෙ කුපිතා අනත්තමනා භික්ඛූ සඞ්ඝිකා විහාරා නික්කඩ්ඪථාති. සච්චං භගවා, විගරහි බුද්ධො භගවා ... කථං හි නාම තුම්හෙ මොඝපුරිසා කුපිතා අනත්තමනා භික්ඛූ සඞ්ඝිකා විහාරා නික්කඩ්ඪිස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය ... එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු භික්ඛුං කුපිතො අනත්තමනො සඞ්ඝිකා විහාරා නික්කඩ්ඪෙය්‍ය වා නික්කඩ්ඪාපෙය්‍ය වා පාචිත්තිය"න්ති.**

1. පටිකච්චෙව-මජ්ඣං

## 6. 2. 7

## නිසීදනශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි සතළොස්වගැ මහණහු මෙහි ඇපි වස් වසන්නම්හ යි එක්තරා පිටිසර මහවෙහෙරක් පිළිසකර කෙරෙති. සවග මහණහු වෙහෙර පිළිසකර කරන සතළොස් වගැ මහණුන් දුටුහු, දක මෙසේ කීහු: ඇවැත්නි, මේ සතළොස්වගැ මහණහු වෙහෙරක් පිළිසකර කෙරෙති. එකැහින් ඔවුන් නඟා යවම්හ යි. ඇතැම් කෙනෙක් මෙසේ කීහු; ඇවැත්නි, යම්තාක් පිළිසකර කෙරෙත් නම් ඒතාක් බලාපොරොත්තු වවූ. පිළිසකර කළ කල්හි නඟා යවම්හ යි. එකල්හි සවගමහණහු සතළොස්වගැ මහණුන්හට මෙය කීහු: "ඇවැත්නි, නැඟිටිවූ වෙහෙර අපට පැමිණේය"යි ඇවැත්නි, කැල මැ කියයුතු නො වේ ද, එසේ වී නම් අපිදු අනෙකක් පිළිසකර කරන් නම්හ යි. ඇවැත්නි, සඟසතු වෙහෙරක් නො වේ ද? එසේ යැ ඇවැත්නි, සඟසතු වෙහෙරකි. නැඟිටිවූ ඇවැත්නි, වෙහෙර අපට පැමිණෙයි. ඇවැත්නි, වෙහෙර විශාල ය. තෙපි ද වසවූ ඇපිදු වසම්හ. නැඟිටිවූ ඇවැත්නි, වෙහෙර අපට පැමිණේ යැ යි කිපියෝ නො සියමන් වූවෝ ග්‍රීවයෙන් ගෙන ඇද දමත්. ඔහු අදිනු ලබන්නෝ හඬති. භික්ෂූහු මෙසේ කීහු: කුමකට තෙපි ඇවැත්නි, හඬවූ ද යි. ඇවැත්නි, මේ සවග මහණහු කිපියෝ නො සියමන් වූවෝ අප සඟසතු වෙහෙරින් ඇද දමති.

2. යම් ඒ භික්ෂූ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් සවග මහණහු කිපියෝ නො සියමන් වූවෝ මහණුන් සඟසතු වෙහෙරකින් ඇද දමූහු ද යි ... සැබෑ ද මහණෙනි, තෙපි කිපියෝ නො සියමන් වූවෝ මහණුන් සඟසතු වෙහෙරින් ඇද දමවු ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් හිස්පුරුෂයෙනි, තෙපි කිපියෝ නො සියමන් වූවෝ මහණුන් සඟසතු වෙහෙරෙකින් ඇද දමූවහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද වනාහි මහණෙනි, මේ සිකපදය උදෙසවූ:

**"යම් මහණෙක් කිපියේ නොසියමන් වූයේ මහණක්හු සඟසතු වෙහෙරකින් ඇද දමන්නේ නම් හෝ ඇද දමවන්නේ නම් හෝ පචිති වේ" යයි.**

3. **යො පනාති:** යො යාදිසො ... භික්ඛූති: ... අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති. **භික්ඛුන්ති:** අඤ්ඤං භික්ඛුං. **කුපිතො අනත්තමනොති:** අනභිරද්ධො ආහතචිත්තො ඛිලජාතො.

**සඞ්ඝිකො** නාම: විහාරො සඞ්ඝස්ස දින්නො හොති පරිච්චත්තො.

**නික්කඩ්ඪෙය්‍යාති:** ගබ්භෙ ගහෙත්වා පමුඛං නික්කඩ්ඪති ආපත්ති පාචිත්තියස්ස. පමුඛෙ ගහෙත්වා බහි නික්කඩ්ඪති ආපත්ති පාචිත්තියස්ස. එකෙන පයොගෙන බහුකෙපි ද්වාරෙ අතික්කාමෙති ආපත්ති පාචිත්තියස්ස. **නික්කඩ්ඪාපෙය්‍යාති:** අඤ්ඤං ආණාපෙති ආපත්ති දුක්කටස්ස[1]. සකිං ආණත්තො බහුකෙපි ද්වාරෙ අතික්කාමෙති ආපත්ති පාචිත්තියස්ස.

සඞ්ඝිකෙ සඞ්ඝිකසඤ්ඤී කුපිතො අනත්තමනො නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා ආපත්ති පාචිත්තියස්ස. සඞ්ඝිකෙ වෙමතිකො කුපිතො අනත්තමනො නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා ආපත්ති පාචිත්තියස්ස. සඞ්ඝිකෙ පුග්ගලිකසඤ්ඤී කුපිතො අනත්තමනො නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා ආපත්ති පාචිත්තියස්ස.

තස්ස පරික්ඛාරං නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා ආපත්ති දුක්කටස්ස. විහාරස්ස උපචාරා වා උපට්ඨානසාලාය වා මණ්ඩපා වා රුක්ඛමූලා වා අජ්ඣොකාසා වා නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා ආපත්ති දුක්කටස්ස. තස්ස පරික්ඛාරං නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා ආපත්ති දුක්කටස්ස.

අනුපසම්පන්නං විහාරා වා විහාරස්ස උපචාරා වා උපට්ඨානසාලාය වා මණ්ඩපා වා රුක්ඛමූලා වා අජ්ඣොකාසා වා නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා ආපත්ති දුක්කටස්ස. තස්ස පරික්ඛාරං නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා ආපත්ති දුක්කටස්ස.

පුග්ගලිකෙ සඞ්ඝිකසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. පුග්ගලිකෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. පුග්ගලිකෙ පුග්ගලිකසඤ්ඤී අඤ්ඤස්ස පුග්ගලිකෙ ආපත්ති දුක්කටස්ස. අත්තනො පුග්ගලිකෙ අනාපත්ති.

**අනාපත්ති:** අලජ්ජිං නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා, තස්ස පරික්ඛාරං නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා, උම්මත්තකං නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා, තස්ස පරික්ඛාරං නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා භණ්ඩනකාරකං ... කලහකාරකං ... විවාදකාරකං ... භස්සකාරකං ... සඞ්ඝෙ අධිකරණකාරකං නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා, තස්ස පරික්ඛාරං නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා අන්තෙවාසිකං වා සද්ධිවිහාරිකං වා න සම්මාවත්තන්තං නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා තස්ස පරික්ඛාරං නික්කඩ්ඪති වා නික්කඩ්ඪාපෙති වා උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

නික්කඩ්ඪනසික්ඛාපදං සත්තමං.

---

1. පාචිත්තියස්ස-මජසං,

3\. යො පන: යම්, යම්බඳු...භික්ඛු...මෙතෙම මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි. භික්ඛුං: අන් මහණක්හු. **කුපිතො අනත්තමනො**: නො ඇලුණේ හැපුණු සිත් ඇතියේ හටගත් (පිළිසු) හුල් ඇතියේ.

**සඞ්ඝිකවිහාර** නම්: සඟනට දෙන ලද්දෙක් පරිත්‍යක්තයෙක් වෙයි.

**නික්කඩ්ඪෙය්‍ය**: ගබ්යෙන් ගෙන අගුදෙරට ඇද දමා නම් පචිති ඇවැත් වේ. අගුදෙර ගෙන පිටතට ඇද දමා නම් පචිති ඇවැත් වේ. එක් පියොවෙකින් බොහෝ වූ ද දෙරටු ඉක්මවා නම් පචිති ඇවැත් වේ. **නික්කඩ්ඪාපෙය්‍ය**: මෙරමා අණවා නම් දුකුළා ඇවැත් වේ. වරක් ඇණවුම් ලදුයේ බොහෝ වූ ද දෙරටු ඉක්මවා නම් පචිති ඇවැත් වේ.

සඟසතුයෙහි සඟසතුසන් ඇතියේ කුපිත වැ නො සතුටු වැ ඇද දමා නම් හෝ ඇද දමවා නම් හෝ පචිති ඇවැත් වේ. සඟසතුයෙහි විමති ඇතියේ කුපිත වැ නො සතුටු වැ ඇද දමා නම් හෝ ඇද දමවා නම් හෝ පචිති ඇවැත් වේ. සඟසතුයෙහි පුඟුල්සතුසන් ඇතියේ කුපිත වැ නො සතුටු වැ ඇද දමා නම් හෝ ඇද දමවා නම් හෝ පචිති ඇවැත් වේ.

ඔහුගේ පිරිකර ඇද දමා නම් හෝ ඇද දමවා නම් හෝ දුකුළා ඇවැත් වේ. වෙහෙරෙහි උවසරින් හෝ උවටන්හලින් හෝ මඩුවෙකින් හෝ රුක්මුලෙකින් හෝ එළිමහනෙකින් හෝ ඇද දමා නම් හෝ ඇද දමවා නම් හෝ දුකුළා ඇවැත් වේ. ඔහුගේ පිරිකර ඇද දමා නම් හෝ ඇද දමවා නම් දුකුළා ඇවැත් වේ.

අනුසපහක්හු වෙහෙරින් හෝ වෙහෙර උවසරින් හෝ උවටන් හලින් හෝ මඩුවෙකින් හෝ රුක්මුලකින් හෝ එළිමහනෙකින් හෝ ඇද දමා නම් හෝ ඇද දමවා නම් හෝ දුකුළා ඇවැත් වේ. ඔහුගේ පිරිකර ඇද දමා නම් හෝ ඇද දමවා නම් හෝ දුකුළා ඇවැත් වේ.

පුඟුල්සතුයෙහි සඟසතුසන් ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. පුඟුල්සතුයෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. පුඟුල්සතුයෙහි පුඟුල්සතුසන් ඇතියේ අනෙකක්හුගේ පුඟුල්සතුයෙහි නම් දුකුළා ඇවැත් වේ. තමාගේ පුඟුල්සතුයෙහි නම් ඇවැත් නැති.

අලජ්ජියකු ඇද දමා නම් හෝ ඇද දමවා නම් හෝ ඔහුගේ පිරිකර ඇද දමා නම් හෝ ඇද දමවා නම් හෝ උමතුවක්හු ඇද දමා නම් හෝ ඇද දමවා නම් හෝ ඔහුගේ පිරිකර ඇද දමා නම් හෝ ඇදදමවා නම් හෝ ඩබර කරන්නක්හු... කලහ කරන්නක්හු ... විවාද කරන්නක්හු... බහින් බස් වන්නක්හු... සඟහු කෙරෙහි අධිකරණ කරන්නක්හු ඇද දමා නම් හෝ ඇද දමවා නම් හෝ ඔහුගේ පිරිකර ඇද දමා නම් හෝ ඇද දමවා නම් හෝ මැනැවින් නො පවත්නා වූ අතැවැස්සක්හු හෝ සද්ධි විහාරිකයක්හු හෝ ඇද දමා නම් හෝ ඇද දමවා නම් හෝ ඔහුගේ පිරිකර ඇද දමා නම් හෝ ඇද දමවා නම් හෝ (ඇවැත් නැති) උම්මත්තකයහට ද ආදිකම්මිකයහට ද ඇවැත් නැති.

සත්වැනි නික්කඩ්ඪනශික්ෂාපද යි.

## 6. 2. 8

## වෙහාසකුටිසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති ජෙතවනෙ **අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ද්වෙ භික්ඛූ සඞ්ඝිකෙ විහාරෙ උපරි වෙහාසකුටියා එකො හෙට්ඨා විහරති, එකො උපරි. උපරිමො භික්ඛු ආහච්චපාදකං මඤ්චං සහසා අභිනිසීදි. මඤ්චපාදො නිපතිත්වා[1] හෙට්ඨිමස්ස භික්ඛුනො මත්ථකෙ අවත්ථාසි. සො භික්ඛු විස්සරමකාසි. භික්ඛූ උපධාවිත්වා තං භික්ඛුං එතදවොචුං: "කිස්ස ත්වං ආවුසො විස්සරමකාසී"ති. අථ ඛො සො භික්ඛු භික්ඛූනං එතමත්ථං ආරොචෙසි.

2. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම භික්ඛු සඞ්ඝිකෙ විහාරෙ උපරි වෙහාසකුටියා ආහච්චපාදකං මඤ්චං සහසා අභිනිසීදිස්සතීති -පෙ- සච්චං කිර ත්වං භික්ඛු සඞ්ඝිකෙ විහාරෙ උපරි වෙහාසකුටියා ආහච්චපාදකං මඤ්චං සහසා අභිනිසීදසීති. සච්චං භගවා, විගරහි බුද්ධො භගවා -පෙ-" කථං හි නාම ත්වං මොඝපුරිස සඞ්ඝිකෙ විහාරෙ උපරි වෙහාස කුටියා ආහච්චපාදකං මඤ්චං සහසා අභිනිසීදිස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු සඞ්ඝිකෙ විහාරෙ උපරි වෙහාසකුටියා ආහච්චපාදකං මඤ්චං වා පීඨං වා සහසා අභිනිසීදෙය්‍ය වා අභිනිපජ්ජෙය්‍ය වා පාචිත්තිය" න්ති.**

3. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**සඞ්ඝිකො** නාම: විහාරො සඞ්ඝස්ස දින්නො හොති පරිච්චත්තො.

**වෙහාසකුටි** නාම: මජ්ඣිමස්ස පුරිසස්ස අසීසඝට්ටා.

**ආහච්චපාදකො** නාම: මඤ්චො අඞ්ගෙ විජ්ඣිත්වා ඨිතො හොති. **ආහච්චපාදකං** නාම: පීඨං අඞ්ගෙ විජ්ඣිත්වා ඨිතං හොති.

**අභිනිසීදෙය්‍යාති:** තස්මිං අභිනිසීදති ආපත්ති පාචිත්තියස්ස. **අභිනිපජ්ජෙය්‍යාති:** තස්මිං අභිනිපජ්ජති ආපත්ති පාචිත්තියස්ස.

1. නිපතිත්වා - මජ්ඣ, පතිත්වා - ස්‍යා.

# 6. 2. 8

## වෙහාසකුටිශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි සඟසතු වෙහෙරෙක්හි මතුමහලින් යුත් කිළියෙකැ දෙමහණ කෙනෙකි. එක් නමෙක් යටැ වෙසෙයි. එක් නමෙක් මතුයෙහි වෙසේ. මතුයෙහි වූ මහණ අටනියෙහි (ඇඳවත) සවිකළ පා ඇති ඇඳෙකැ යුහුසුලු වැ හුන්නෝ යි. ඇඳපා වැටී යටැ හුන් මහණහුගේ මත්තෙහි වැතිරිණි. ඒ මහණ හඬ නැඟීය. භික්ෂූහු දිව අවුත් "ඇවැත්නි, තෙපි කුමට හඬ නැඟුවයි එ මහණහට කීහු. එකල්හි ඒ මහණ මහණුන්හට තෙල කරුණු සැලකෙළේ යි.

2. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් මහණ සඟසතු වෙහෙරෙක්හි මතුමහලින් යුත් කිළියෙකැ අටනියෙහි සවිකළ පා ඇති ඇඳෙකැ යුහුසුලු වැ හුන්නේ ද යි ... සැබෑ ද මහණ තෝ සඟසතු වෙහෙරෙක්හි මතුමහලින් යුත් කිළියෙකැ අටනියෙහි සවිකළ පා ඇති ඇඳෙකැ යුහුසුලු වැ හිඳිහි ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ...කෙසේ නම් හිස්පුරුෂය, තෝ සඟසතු වෙහෙරෙක්හි මතුමහලින් යුත් කිළියෙකැ අටනියෙහි සවිකළ පා ඇති ඇඳෙකැ යුහුසුලු වැ හුන්නෙහි ද? හිස් පුරුෂය, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි. ...මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

> **"යම් මහණෙක් සඟසතු වෙහෙරෙකැ මතුමහල් කිළියෙක්හි අටනියෙහි සවිකළ පා ඇති ඇඳෙකැ හෝ පුටුවෙකැ හෝ හිඳින්නේ නම් හෝ නිදන්නේ නම් හෝ පචිති වේ"** යයි.

3. **යො පන:** යමෙක්, යම් බඳුයෙක් ... **භික්ඛු:**... මෙතෙම මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**සඞ්ඝික** විහාර නම්: සඟනට දෙන ලද්දෙක් පරිත්‍යක්තයෙක් වෙයි.

**වෙහාසකුටි** නම්: මැදුම් පිරිමිනියක්හුගේ හිස නො ගැටෙන තැනි.

**ආහච්චපාදක** නම්: ඇඳ අටනියෙහි විද සවිකොට තබන ලද්දේ වෙයි.

**ආහච්චපාදක** නම්: පුටුව අටනියෙහි විද සවිකොට තබන ලද්දේ වෙයි.

**අභිනිසීදෙය්‍ය;** එහි වැද හිඳිනේ නම් පචිති ඇවැත් වේ.

**අභිනිපජ්ජෙය්‍ය;** එහි වැදහෝනේ නම් පචිති ඇවැත් වේ.

සඞ්ඝිකෙ සඞ්ඝිකසඤ්ඤී උපරි වෙහාස කුටියා ආහච්චපාදකං මඤ්චං වා පීඨං වා අභිනිසීදති වා අභිනිපජ්ජති වා ආපත්ති පාචිත්තියස්ස. සඞ්ඝිකෙ වෙමතිකො -පෙ- සඞ්ඝිකෙ පුග්ගලිකසඤ්ඤී උපරිවෙහාසකුටියා ආහච්චපාදකං මඤ්චං වා පීඨං වා අභිනිසීදති වා අභිනිපජ්ජති වා ආපත්ති පාචිත්තියස්ස.

පුග්ගලිකෙ සඞ්ඝිකසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. පුග්ගලිකෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. පුග්ගලිකෙ පුග්ගලිකසඤ්ඤී අඤ්ඤස්ස පුග්ගලිකෙ ආපත්ති දුක්කටස්ස. අත්තනො පුග්ගලිකෙ අනාපත්ති.

**අනාපත්ති:** වෙහාසකුටියා සීසඝට්ටාය[1] හෙට්ඨා අපරිභොගං හොති පදරසඤ්චිතං හොති පටාණි දින්නා හොති, තස්මිං ඨිතො ගණ්හාති[2] වා ලග්ගෙති වා උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

වෙහාසකුටිසික්ඛාපදං අට්ඨමං.

## 6. 2. 9

## මහල්ලකවිහාරසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **කොසම්බියං** විහරති **ඝොසිතාරාමෙ** තෙන ඛො පන සමයෙන ආයස්මතො **ඡන්නස්ස** උපට්ඨාකො මහාමත්තො ආයස්මතො **ඡන්නස්ස** විහාරං කාරාපෙති. අථ ඛො ආයස්මා **ඡන්නො** කතපරියොසිතං විහාරං පුනප්පුනං ඡාදපෙසි.[3] පුනප්පුනං ලෙපාපෙසි.[4] අතිභාරිතො විහාරො පරිපති. අථ ඛො ආයස්මා ඡන්නො තිණඤ්ච කට්ඨඤ්ච සංකඩ්ඪන්තො අඤ්ඤතරස්ස බ්‍රාහ්මණස්ස යවඛෙත්තං දූසෙසි. අථ ඛො සො බ්‍රාහ්මණො උජ්ඣායති ඛීයති විපාචෙති: "කථං හි නාම භදන්තා අම්හාකං යවඛෙත්තං දූසෙස්සන්තී"ති. අස්සොසුං ඛො භික්ඛූ තස්ස බ්‍රාහ්මණස්ස උජ්ඣායන්තස්ස ඛීයන්තස්ස විපාචෙන්තස්ස.

---

1. සීසඝට්ටාය-මජසං,
2. ගණ්හාති-මජසං
3. ඡාදපෙති-මජසං,
4. ලෙපාපෙති-මජසං,

සඟසතුයෙහි සඟසතු සත් ඇතියේ මතුමහල් කිළියෙහි අටනියෙහි සවිකළ පා ඇති ඇඳෙකැ හෝ පුටුවෙකැ හෝ වැදහිඳී නම් හෝ වැදහොවී නම් හෝ පචිති ඇවැත් වේ. සඟසතුයෙහි විමති ඇතියේ... සඟසතුයෙහි පුඟුල්සතුසත් ඇතියේ මතුමහල් කිළියෙහි අටනියෙහි සවිකළ පා ඇති ඇඳෙකැ හෝ පුටුවෙකැ හෝ වැදහිඳී නම් හෝ වැදහොවී නම් හෝ පචිති ඇවැත් වේ.

පුඟුල්සතුයෙහි පුඟුල්සතුසත් ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. පුඟුල්සතුයෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. පුඟුල්සතුයෙහි පුඟුල්සතුසත් ඇතියේ අනෙකක්හුගේ පුඟුල්සතුයෙහි නම් දුකුළා ඇවැත් වේ. තමාගේ පුඟුල්සතුයෙහි නම් ඇවැත් නැති.

මතුමහලක් නැති කිළියෙහි හිසගැටෙන කිළියෙහි යටැ පරිභොග නො වේ නම් පුවරුවලින් තැනුණෙක් වේ නම් (ඇඳපුටුහි) පාමුදුන ඇණ ලන ලද වේ නම් එහි සිටියේ ගනී නම් හෝ (අනෙකක්) එල්වන්නේ නම් හෝ (ඇවැත් නැති) උම්මත්තකයහට ද ආදිකම්මිකයහට ද ඇවැත් නැති.

අටවැනි වෙහාසකුටිශික්ෂාපද යි.

## මහලුක විහාරශික්ෂාපදය

## 2. 8. 9

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු කොසඹෑ නුවර **ඝෝෂිතාරාමයෙහි** වැඩැවෙසෙති. එසමයෙහි ආයුෂ්මත් **ඡන්නයන්ගේ** උපස්ථායක වූ මහාමාත්‍රයෙක් ආයුෂ්මත් ඡන්නහට වෙහෙරක් කරවයි. එකල්හි ආයුෂ්මත් ඡන්න කළ නිමාම ඇති වෙහෙර පුන පුනා සෙවෙනි කැරැවී, පුන පුනා අලෙව් දෙවී. ඉතා බර වූ වෙහෙර ඇද වැටිණ. එකල්හි ඡන්න තෙමේ තණ ද දර ද ඇද රැස් කරනුයේ එක්තරා බමුණක්හුගේ යව කෙත වැනැසී ය. එකල්හි ඒ බමුණු ලමු කොට සිතයි, නුගුණ පවසයි, දෙස් පතුරුවයි: කෙසේ නම් පින්වත්හු අපගේ යව කෙත වැනැසූ ද යි භික්ෂූහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරු වන ඒ බමුණුහුගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු.

2. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා ඡන්නො කතපරියොසිතං විහාරං පුනප්පුනං ඡාදාපෙස්සති පුනප්පුනං ලෙපාපෙස්සති අතිභාරිතො විහාරො පරිපතීති -පෙ- සච්චං කිර ත්වං ඡන්න කතපරියොසිතං විහාරං පුනප්පුනං ඡාදාපෙසි පුනප්පුනං ලෙපාපෙසි අතිභාරිතො විහාරො පරිපතීති. සච්චං භගවා, විගරහි බුද්ධො භගවා -පෙ-" කථං හි නාම ත්වං මොඝපුරිස කතපරියොසිතං විහාරං පුනප්පුනං ඡාදාපෙස්සසි පුනප්පුනං ලෙපාපෙස්සසි අතිභාරිතො විහාරො පරිපති. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"මහල්ලකං පන භික්ඛුනා විහාරං කාරයමානෙන යාව ද්වාරකොසා අග්ගලට්ඨපනාය ආලොකසන්ධිපරිකම්මාය ද්වත්තිච්ඡදනස්ස පරියායං අප්පහරිතෙ ඨිතෙන අධිට්ඨාතබ්බං, තතො චෙ උත්තරිං අප්පහරිතෙ පි ඨිතො අධිට්ඨහෙය්‍ය පාචිත්තිය"න්ති.**

3. **මහල්ලකො** නාම: විහාරො සස්සාමිකො වුච්චති. **විහාරො** නාම: උල්ලිත්තො වා හොති අවලිත්තො වා උල්ලිත්තාවලිත්තො වා.

**කාරයමානෙනාති:** කරොන්තො වා කාරාපෙන්තො වා.

**යාවද්වාරකොසාති:** පිට්ඨසඞ්ඝාටස්ස[1] සමන්තා හත්ථපාසා.

**අග්ගලට්ඨපනායාති:** ද්වාරට්ඨපනාය.

**ආලොකසන්ධිපරිකම්මායාති:** වාතපානපරිකම්මාය. සෙතවණ්ණං කාළවණ්ණං ගෙරුකපරිකම්මං මාලාකම්මං ලතාකම්මං මකරදන්තකං පඤ්චපටිකං.

**ද්වත්තිච්ඡදනස්ස පරියායං අප්පහරිතෙ ඨිතෙන අධිට්ඨාතබ්බන්ති:** හරිතං නාම: පුබ්බණ්ණං අපරණ්ණං සචෙ හරිතෙ ඨිතො අධිට්ඨාති ආපත්ති දුක්කටස්ස. මග්ගෙන ඡාදෙන්තස්ස ද්වෙ මග්ගෙ අධිට්ඨහිත්වා තතියං මග්ගං ආණාපෙත්වා පක්කමිතබ්බං. පරියායෙන ඡාදෙන්තස්ස ද්වෙ පරියායෙ අධිට්ඨහිත්වා තතියං පරියායං ආණාපෙත්වා පක්කමිතබ්බං.

1. පිට්ඨිසඞ්ඝාටස්ස- සයා,

2. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ...ඔහු ලාමක කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් ආයුෂ්මත් ඡන්න කළ නිමාම් ඇති වෙහෙර පුනපුනා සෙවෙනි කැරැවී ද? පුනපුනා ලෙපනය කැරැවී ද? ඉතා බර වූ වෙහෙර ඇද වැටිණැ යි ... සැබෑ ද? ඡන්න, තෝ කළ නිමාම් ඇති වෙහෙර පුනපුනා සෙවෙනි කරවූයෙහි ද? පුනපුනා ලෙපනය කරවූයෙහි ද? ඉතා බර වූ වෙහෙර ඇද වැටිණැ යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ... කෙසේ නම් හිස් පුරුෂය, තෝ කළ නිමාම් ඇති වෙහෙරක් පුනපුනා සෙවෙනි කැරවූයෙහි ද? පුනපුනා ලෙපනය කැරවූයෙහි ද? ඉතා බර වූ වෙහෙර ඇද වැටිණ. හිස් පුරුෂය, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදයට හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවූ:

''මහත් වෙහෙරක් කරවන මහණහු විසින් ද්වාරකොසය දක්වා අගුළු තරවන පිණිස ද, වාකවුළු පිරියම් පිණිස ද (පුනපුනා ලිම්පනය කළ යුතු යි) සෙවින්න පිළිබැඳි දෙතුන් පරික්ෂෙපයක් තෘණ නැති තන්හි සිටියහු විසින් විධාන කළ යුතු යැ. ඉදින් ඒ දෙතුන් පරික්ෂෙපයෙකින් මත්තෙහි තෘණ නැති තන්හිදු සිටියේ විධාන කරන්නේ නම් පචිති වේ'' යයි.

3. මහල්ලක නම්: (කරවා දෙන) හිමියකු ඇති 'වෙහෙරැ'යි කියනු ලැබේ. විහාර නම්: ඇතුළතැ අලෙව් දුන්නේ හෝ බැහැරැ අලෙව් දුන්නේ හෝ ඇතුළතැ බැහැරැ අලෙව් දුන්නේ හෝ වෙයි.

**කාරයමානෙන:** කරන්නේ හෝ කරවන්නේ හෝ යි.

**යාවද්වාරකොසා:** දෙරබා අවට අත්පස තෙක්

**අගගලට්ඨපනාය:** දෙරගුළු තහවුරු වැ පැවැත්ම පිණිස.

**ආලොකසන්ධිපරිකම්මාය:** වාකවුළුහි පිරියම පිණිස, ශ්වෙතවර්ණ යැ කාලවණී යැ ගෛරික පරිකම් යැ මාලාකම් යැ ලතාකම් යැ මකරදන්තක යැ පඤ්චපටික යැ (කරන්නට වටී).

**ද්වත්තිච්ඡදනස්ස පරියායං අප්පහරිතෙ ඨිතෙන අධිට්ඨාතබ්බං:** මෙහි **හරිත** නම්: පූර්වාන්න යැ අපරාන්න යි. ඉදින් හරිතයෙහි (තණබිම්හි) සිටියේ විධාන කෙරේ නම් දුකුළා ඇවැත් වේ. ඍජු මාර්ගයෙන් සොයන්නහුට (සෙවිලි කරන්නහුට) දෙමගක් විධාන කොට තෙවන මග අණවා බැහැර යා යුතු යි. පරික්ෂේපයෙන් සොයන්නහුට දෙ පරියායක් විධාන කොට තෙවන පරියාය අණවා බැහැර යා යුතු යි.

**තතො චෙ උත්තරිං අප්පහරිතෙපි ඨිතො අධිට්ඨහෙය්‍යාති:** ඉට්ඨකාය ඡාදෙන්තස්ස ඉට්ඨකායිට්ඨකාය[1] ආපත්ති පාචිත්තියස්ස. සිලාය ඡාදෙන්තස්ස සිලාය සිලාය ආපත්ති පාචිත්තියස්ස. සුධාය ඡාදෙන්තස්ස පිණ්ඩෙ පිණ්ඩෙ ආපත්ති පාචිත්තියස්ස. තිණෙන ඡාදෙන්තස්ස කරළෙ කරළෙ ආපත්ති පාචිත්තියස්ස. පණ්ණෙන ඡාදෙන්තස්ස පණ්ණෙ පණ්ණෙ ආපත්ති පාචිත්තියස්ස.

අතිරෙකද්වත්තිපරියායෙ අතිරෙකසඤ්ඤී අධිට්ඨාති ආපත්ති පාචිත්තියස්ස. අතිරෙකද්වත්තිපරියායෙ වෙමතිකො අධිට්ඨාති ආපත්ති පාචිත්තියස්ස. අතිරෙකද්වත්තිපරියායෙ ඌනකසඤ්ඤී අධිට්ඨාති ආපත්ති පාචිත්තියස්ස.

ඌනකද්වත්තිපරියායෙ අතිරෙකසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. ඌනකද්වත්තිපරියායෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. ඌනකද්වත්තිපරියායෙ ඌනකසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** ද්වත්තිපරියායෙ, ඌනකද්වත්තිපරියායෙ[2], ලෙණෙ ගුහාය, තිණකුටිකාය අඤ්ඤස්සත්ථාය, අත්තනො ධනෙන වාසාගාරං ඨපෙත්වා සබ්බත්ථ අනාපත්ති උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**මහල්ලකවිහාරසික්ඛාපදං නවමං.**

## 6.2.10

## සප්පාණකසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා ආළවියං විහරති අග්ගාළවෙ චෙතියෙ. තෙන ඛො පන සමයෙන ආළවකා භික්ඛූ නවකම්මං කරොන්තා ජානං සප්පාණකං උදකං තිණම්පි මත්තිකම්පි සිඤ්චන්තිපි සිඤ්චාපෙන්තිපි.

2. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආළවකා භික්ඛූ ජානං සප්පාණකං උදකං තිණම්පි මත්තිකම්පි සිඤ්චිස්සන්තිපි සිඤ්චාපෙස්සන්තිපී"ති -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ ජානං සප්පාණකං උදකං තිණම්පි මත්තිකම්පි සිඤ්චථා'පි සිඤ්චාපෙථාපීති. සච්චං භගවා, විගරහි බුද්ධො භගවා -පෙ- "කථං හි නාම තුම්හෙ මොඝපුරිසා ජානං සප්පාණකං උදකං තිණම්පි මත්තිකම්පි සිඤ්චිස්සථාපි සිඤ්චාපෙස්සථාපි. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු ජානං සප්පාණකං උදකං තිණං වා මත්තිකං වා සිඤ්චෙය්‍ය වා සිඤ්චාපෙය්‍ය වා පාචිත්තිය"න්ති.**

---

1, ඉට්ඨකිට්ඨකාය - මජසං, 2, ඌනකපරියායෙ - සීI, සීමුii

**තතො වෙ උත්තරිං අප්පහරිතෙපි ඨිතො අධිට්ඨාහෙය්‍ය:** උළුයෙන් සොයන්නා (සෙවිලි කරන්නා) හට උළුයෙහි උළුයෙහි පචිති ඇවැත් වේ. ගලින් සොයන්නාහට ගලෙහි ගලෙහි පචිති ඇවැත් වේ. සුන්නෙන් සොයන්නාහට පිඩෙහි පිඩෙහි පචිති ඇවැත් වේ. තෘණයෙන් සොයන්නා හට කැරලියෙහි කැරලියෙහි පචිති ඇවැත් වේ. පර්ණයෙන් සොයන්නා හට පර්ණයෙහි පර්ණයෙහි පචිති ඇවැත් වේ.

අයිරා දෙතුන් පරියාහි අයිරාසන් ඇතියේ විධාන කෙරේ නම් පචිති ඇවැත් වේ. අයිරා දෙතුන් පරියාහි විමති ඇතියේ විධාන කෙරේ නම් පචිති ඇවැත් වේ. අයිරා දෙතුන් පරියාහි ඌනසන් ඇතියේ විධාන කෙරේ නම් පචිති ඇවැත් වේ.

ඌනු දෙතුන් පරියාහි අයිරාසන් ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. ඌනු දෙතුන් පරියාහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. ඌනු දෙතුන් පරියාහි ඌනසන් ඇතියේ නම් ඇවැත් නැති.

දෙතුන් පරියාහි, ඌනු දෙතුන් පරියාහි, ලෙනෙහි, ගුහායෙහි, තණකිළියෙහි මෙරමා සඳහා නම්, සිය ධනයෙන් නම් වසන ගෙය තබා හැම තන්හි ඇවැත් නැති. උම්මත්තකයහට ද ආදිකම්මිකයහට ද ඇවැත් නැති.

නවවැනි මහල්ලකවිහාරශික්ෂාපද යි.

## 6.2.10

## සප්පාණකශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු අළවු නුවර අග්ගාලව චෛත්‍යයෙහි වැඩවෙසෙති. එසමයෙහි අළවු නුවර වැසි භික්ෂූහු නවාම් කරනුවෝ දැන දැන පණුවන් සහිත ජලය තණකොළ වලට ද මැටිවලට ද ඉසීම කෙරෙත් ඉස්වීම ද කරවත්.

2. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් අළවු නුවර වැසි භික්ෂූහු දැන දැන පණුවන් සහිත ජලය තණකොළවලට ද මැටිවලට ද ඉසීම කළාහු ද? ඉසීම කැරවූහු ද යි...සැබෑ ද? මහණෙනි, තෙපි දැන දැන පණුවන් සහිත ජලය තණකොළවලට ද මැටිවලට ද ඉසීම කරවු ද? ඉසීම කරවවු ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරැහූ... කෙසේ නම් හිස් පුරුෂයෙනි තෙපි දැනැ දැනැ පණුවන් සහිත ජලය තණකොළවලට ද මැටිවලට ද ඉසීම කළහු ද? ඉසීම කැරවූවහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදයට හෝ නො වෙයි... මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**"යම් මහණෙක් දැනැ දැනැ පණුවන් සහිත ජලය තණකොළවලට හෝ මැටිවලට හෝ ඉසින්නේ නම් හෝ ඉස්වන්නේ නම් හෝ පචිති වේ" යයි.**

3. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති;** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**ජානාති** නාම[1]; සාමං වා ජානාති අඤ්ඤෙ වා තස්ස ආරොචෙන්ති.

**සිඤ්චෙය්‍යාති;** සයං සිඤ්චති ආපත්ති පාචිත්තියස්ස. **සිඤ්චාපෙය්‍යාති:** අඤ්ඤං ආණාපෙති ආපත්ති පාචිත්තියස්ස. සකිං ආණත්තො බහුකම්පි සිඤ්චති ආපත්ති පාචිත්තියස්ස.

සප්පාණකෙ සප්පාණකසඤ්ඤී තිණං වා මත්තිකං වා සිඤ්චති වා සිඤ්චාපෙති වා ආපත්ති පාචිත්තියස්ස. සප්පාණකෙ වෙමතිකො තිණං වා මත්තිකං වා සිඤ්චති වා සිඤ්චාපෙති වා ආපත්ති දුක්කටස්ස. සප්පාණකෙ අප්පාණකසඤ්ඤී තිණං වා මත්තිකං වා සිඤ්චති වා සිඤ්චාපෙති වා අනාපත්ති.

අප්පාණකෙ සප්පාණකසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අප්පාණකෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අප්පාණකෙ අප්පාණකසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති;** අසඤ්චිච්ච අසතියා අජානන්තස්ස. උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**සප්පාණකසික්ඛාපදං දසමං**

## භූතගාමවග්ගො[2] දුතියො.

**තස්සුද්දානං:**

භූතං අඤ්ඤාය උජ්ඣායං පක්කමන්තෙන තෙ දුවෙ
පුබ්බෙ නික්කඩ්ඪනා'හච්චද්වාරං සප්පාණකෙනචා'ති.

1. ජානං නාම—සයා.
2. සෙනාසනවග්ගො - සිමු ii

3. යොපන: යම්, යම් බඳු...භික්ඛු...මෙතෙම මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි. ජානාති නම්: තෙමේ හෝ දනී. අන්හු හෝ ඔහුට ඇරොජත්.

සිඤ්චෙයා; තෙමේ ඉසී නම් පචිති ඇවැත් වේ.

සිඤ්චාපෙයා: අනෙකක්හට අණවා නම් පචිති ඇවැත් වේ. වරක් අණවන ලද්දේ බොහෝ කොට ද ඉසී නම් පචිති ඇවැත් වේ.

පණුවන් ඇති ජලයෙහි පණුවන් ඇති සත් ඇතියේ තණකොළ වලට ද මැටිවලට ද ඉසී නම් හෝ ඉස්වා නම් හෝ පචිති ඇවැත් වේ. පණුවන් ඇතියෙහි විමති ඇතියේ තණකොළවලට ද මැටිවලට ද ඉසී නම් හෝ ඉස්වා නම් හෝ දුකුළා ඇවැත් වේ. පණුවන් ඇතියෙහි පණුවන් නැති සත් ඇතියේ තණකොළවලට ද මැටිවලට ද ඉසී නම් හෝ ඉස්වා නම් හෝ ඇවැත් නැති.

පණුවන් නැතියෙහි පණුවන් නැති සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. පණුවන් නැතියෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. පණුවන් නැතියෙහි පණුවන් නැති සත් ඇතියේ නම් ඇවැත් නැති.

නො සිතා කරන්නහුට ද නො සිහියෙන් කරන්නහුට ද නො දන්නහුට ද උම්මත්තකයහට ද ආදිකම්මිකයහට ද ඇවැත් නැති.

දසවැනි සප්පාණකසික්ඛාපද යි.

## ද්විතීය භූතගාම වර්ග යි.

එහි උද්දානය;

භූතගාම යැ අඤ්ඤවාදකය සමඟ උජ්ඣාපනක යැ බැහැර යන්නහු කරණකොට ගෙන පැනවූ ඒ පඨම-දුතිය සෙනාසන දෙක යැ (පුර්වොපගත) අනුපඛජ්ජ යැ නික්කඩ්ඪන යැ (ආහච්චපාදක) වෙහාස කුටි යැ (ද්වාරකොස) මහල්ලකවිහාර යැ සප්පාණක යි.

## 6. 3. 1

### ඔවාදසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ථෙරා භික්ඛූ භික්ඛුනියො ඔවදන්තා ලාභිනො හොන්ති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. අථ ඛො ඡබ්බග්ගියානං භික්ඛූනං එතදහොසි: එතරහි ඛො ආවුසො ථෙරා භික්ඛූ භික්ඛුනියො ඔවදන්තා ලාභිනො හොන්ති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං, හන්දාවුසො මයම්පි භික්ඛුනියො ඔවදමාති.

2. අථ ඛො ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුනියො උපසඞ්කමිත්වා එතදවොචුං: "අම්හෙපි භගිනියො උපසඞ්කමථ මයම්පි ඔවදිස්සාමා"ති. අථ ඛො තා භික්ඛුනියො යෙන ඡබ්බග්ගියා භික්ඛූ තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ඡබ්බග්ගියෙ භික්ඛූ අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. අථ ඛො ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුනීනං පරිත්තඤ්ඤෙව ධම්මිං කථං කත්වා දිවසං තිරච්ඡානකථාය වීතිනාමෙත්වා උය්යොජෙසුං 'ගච්ඡථ භගිනියො'ති.

3. අථ ඛො තා භික්ඛුනියො යෙන භගවා තෙනුපසඞ්කමිංසු උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො තා භික්ඛුනියො භගවා එතදවොච: කච්චි භික්ඛුනියො ඔවාදෙ ඉද්ධො අහොසී'ති. කුතො භන්තෙ ඔවාදෙ ඉද්ධො භවිස්සති අය්‍යා ඡබ්බග්ගියා පරිත්තඤ්ඤෙව ධම්මිං කථං කත්වා දිවසං තිරච්ඡානකථාය වීතිනාමෙත්වා උය්යොජෙසුන්ති.

4. අථ ඛො භගවා තා භික්ඛුනියො ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. අථ ඛො තා භික්ඛුනියො භගවතා ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කමිංසු.

5. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා ඡබ්බග්ගියෙ භික්ඛූ පටිපුච්ඡි: "සච්චං කිර තුම්හෙ භික්ඛවෙ භික්ඛුනීනං පරිත්තඤ්ඤෙව ධම්මිං කථං කත්වා දිවසං තිරච්ඡානකථාය වීතිනාමෙත්වා උය්යොජෙථා"ති.

සච්චං භගවා.

# 6.3.1

## ඔවාද ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරමහි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි ස්ථවිර භික්ෂූහු මෙහෙණන්හට ඔවා දෙන්නාහු චීවර යැ පිණ්ඩපාත යැ ශයනාසන යැ ග්ලාන ප්‍රත්‍යය භෛෂජ්‍ය යැ යන පරිෂ්කාරයන් ලබන්නාහු වෙති. එකල්හි සවග මහණුන්හට මෙසිත විය: ඇවැත්නි, මෙකල ස්ථවිර භික්ෂූහු මෙහෙණන්හට ඔවා දෙන්නාහු චීවර යැ පිණ්ඩපාත යැ ශයනාසන යැ ග්ලානප්‍රත්‍යයභෛෂජ්‍ය යැ යන පරිෂ්කාරයන් ලබන්නාහු වෙති. එහෙයින් ඇවැත්නි, ඇපිදු මෙහෙණන්හට ඔවා දෙම්හ යි.

2. එකල්හි සවග මහණහු මෙහෙණන් වෙත එළැඹැ මෙය කීහු: නැගණියනි, අප වෙත ද එළඹෙවු. ඇපිදු ඔවා දෙම්හ යි. එකල්හි ඒ මෙහෙණහු සවග මහණුන් වෙත එළැඹියහ. එළැඹැ සවග මහණුන් සකසා වැඳ එකත් පසෙකැ හුන්හු . එකල්හි සවග මහණහු මෙහෙණන් හට මඳ වූ මැ දැහැමි කථා කොට තිරශ්චීන කථායෙන් දවස ගෙවා "යව නැගණියනි" යි නහා යැවූහු.

3. එකල්හි ඒ භික්ෂුණීහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියහ. එළැඹැ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ එකත්පසෙකැ සිටියාහු යැ. එකත්පසෙකැ සිටියා වූ ඒ භික්ෂුණීන්හට භාග්‍යවතුන් වහන්සේ තෙල වදළසේක: කිමෙක් ද මෙහෙණනි, අවවාදය සමෘද්ධ වී දූ යි? වහන්ස, කිසෙයින් ඔවා සමෘද්ධ වන්නේ ද සවග වහන්දැ මඳ වූ මැ දැහැමි කථා කොට තිරශ්චීන කථායෙන් දවස ගෙවා නහා යැවූහු යයි.

4. එකල්හි භාග්‍යවතුන් වහන්සේ දැහැමි කථායෙන් එ මෙහෙණන්හට මොනොවට කරුණු දක්වූසේක. මොනොවට කරුණු ගැන්වූසේක. මොනොවට තෙද ගැන්වූසේක. මොනොවට සතුටු කරවූසේක. එකල්හි එ මෙහෙණහු භාග්‍යවතුන් විසින් දැහැමි කථායෙන් මොනොවට කරුණු දක්වන ලද්දහු මොනොවට කරුණු ගන්වන ලද්දහු මොනොවට තෙද ගන්වන ලද්දහු මොනොවට සතුටු කරවන ලද්දහු භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට නික්මැ ගියහ.

5. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණෙහි ලා මෙ ප්‍රකරණයෙහි ලා බික්සඟන රැස් කරවා සවග මහණුන් පුළුවුත්සේක: සැබැ ද මහණෙනි, තෙපි මෙහෙණන්හට මඳ වූ මැ දැහැමි කථා කොට තිරශ්චීන කථායෙන් දවස ගෙවා නහා යවහු දූ යි.

සැබැව භාග්‍යවතුන් වහන්ස,

විගරහි බුද්ධො භගවා—පෙ—

"කථං හි නාම තුම්හෙ මොඝපුරිසා භික්ඛුනීනං පරිත්තකෙඤ්ඤෙව ධම්මිං කථං කත්වා දිවසං තිරච්ඡානකථාය වීතිනාමෙත්වා උය්‍යොජෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය—පෙ—විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. අනුජානාමි භික්ඛවෙ භික්ඛුනොවාදකං සම්මන්නිතුං. එවඤ්ච පන භික්ඛවෙ සම්මන්නිතබ්බො. පඨමං භික්ඛු යාචිතබ්බො. යාචිත්වා ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො.

6. "සුණාතු මෙ භන්තෙ සඞ්ඝො යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං භික්ඛුනොවාදකං සම්මන්නෙය්‍ය එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං භික්ඛුනොවාදකං සම්මන්නති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො භික්ඛුනොවාදකස්ස සම්මති. සො තුණ්හස්ස. යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය දුතියම්පි එතමත්ථං වදාමි—පෙ—තතියම්පි එතමත්ථං වදාමි.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං භික්ඛුනොවාදකං සම්මන්නති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො භික්ඛුනොවාදකස්ස සම්මති.[1] සො තුණ්හස්ස යස්ස නක්ඛමති, සො භාසෙය්‍ය.

සම්මතො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු භික්ඛුනොවාදකො ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමී"ති.

7. අථ ඛො භගවා ඡබ්බග්ගියෙ භික්ඛූ අනෙකපරියායෙන විගරහිත්වා දුබ්භරතාය—පෙ—එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

"යො පන භික්ඛු අසම්මතො භික්ඛුනියො ඔවදෙය්‍ය පාචිත්තිය"න්ති.

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

---
1. සම්මුති - සිමු

භාග්‍යවත් බුදුහු ගැරහූහ ... කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි මෙහෙණන්හට මඳ වූ මැ දැහැමි කථා කොට තිරශ්චීන කථායෙන් දවස ගෙවා නහා යැවූහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... ගරහා දැහැමි කථා කොට මහණුන් ඇමතූසේක. "මහණෙනි, භික්ඛුනොවාදක සම්මුතිය කරන්නට අනුදනිමි. මහණෙනි, මෙසෙයින් සම්මත කටයුතු: පළමු වැ මහණ අයැදියැ යුතු. අයැදූ ව්‍යක්ත වූ ප්‍රතිබල වූ භික්ෂුනමක් විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ යි.

6. "වහන්ස, සඞ්ඝ තෙමේ මවදන් අසාවා. ඉදින් සඞ්ඝයාහට පැමිණිකල් ඇතියේ නම් සඞ්ඝ තෙමේ මෙනම් මහණහු භික්ඛුනොවාදක කොට සම්මත කරන්නේ යැ තෙල ඥප්ති යි.

වහන්ස, සඞ්ඝ තෙමේ මවදන් අසාවා, සඞ්ඝ තෙමේ මෙනම් මහණහු භික්ඛුනොවාදක කොට සම්මත කරයි. මෙනම් මහණහට භික්ඛුනොවා-දක සම්මුතිය යම් ආයුෂ්මත් කෙනකුන් රුස්නේ නම් හෙ තිහඬ වන්නේ යැ. යමක්හට නො රුස්නේ නම් හෙ කියන්නේ යැ. දෙවනවට ද තෙල කරුණ කියමි...තෙවනවට ද තෙල කරුණ කියමි.

වහන්ස, සඞ්ඝ තෙමේ මවදන් අසාවා, සඞ්ඝ තෙමේ මෙනම් මහණහු භික්ඛුනොවාදක කොට සම්මත කරයි. මෙනම් මහණහට භික්ඛු-නොවාදක සම්මුතිය යම් ආයුෂ්මත් කෙනකුන් රුස්නේ නම් හෙ තිහඬ වන්නේ යැ. යමක්හට නො රුස්නේ නම් හෙ කියන්නේ යි.

සඞ්ඝයා විසින් මෙනම් මහණ භික්ඛුනොවාදකයෙකැ යි සම්මත කරන ලද්දේ යැ. සඞ්ඝයාහට රුස්නේ යැ. එහෙයින් තුෂ්ණිම්භාවය වේ. මෙසේ මෙය දරමි" යි.

7. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සවග මහණුන්හට නොයෙක් කරුණෙන් ගරහා දුභරතායෙහි ... තවද මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවූ:

**"යම් මහණෙක් අසම්මත වූයේ මෙහෙණන්හට ඕවා දෙන්නේ නම් පචිති වේ" යයි.**

**මෙසේ භාග්‍යවතුන් විසින් මේ සිකපදය භික්ෂූන්හට පණවන ලද්දේ වෙයි.**

8. තෙන ඛො පන සමයෙන ථෙරා භික්ඛු සම්මතා භික්ඛුනියො ඔවදන්තා තථෙව ලාභිනො හොන්ති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. අථ ඛො ඡබ්බග්ගියානං භික්ඛූනං එතදහොසි: එතරහි ඛො ආවුසො ථෙරා භික්ඛු සම්මතා භික්ඛුනියො ඔවදන්තා තථෙව ලාභිනො හොන්ති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං. හන්දාවුසො මයම්පි නිස්සීමං ගන්ත්වා අඤ්ඤමඤ්ඤං භික්ඛුනොවාදකං සම්මන්නිත්වා භික්ඛුනියො ඔවදමාති.

9. අථ ඛො ඡබ්බග්ගියා භික්ඛු නිස්සීමං ගන්ත්වා අඤ්ඤමඤ්ඤං භික්ඛුනොවාදකං සම්මන්නිත්වා භික්ඛුනියො උපසඞ්කමිත්වා එතදවොචුං: ''මයම්පි භගිනියො සම්මතා අම්හෙපි උපසඞ්කමථ මයම්පි ඔවදිස්සාමා''ති. අථ ඛො තා භික්ඛුනියො යෙන ඡබ්බග්ගියා භික්ඛූ තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ඡබ්බග්ගියෙ භික්ඛූ අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. අථ ඛො ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුනීනං පරිත්තඤ්ඤෙව ධම්මිං කථං කත්වා දිවසං තිරච්ඡානකථාය වීතිනාමෙත්වා උය්‍යොජෙසුං: 'ගච්ඡථ භගිනියො'ති.

10. අථ ඛො තා භික්ඛුනියො යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො තා භික්ඛුනියො භගවා එතදවොච: ''කච්චි භික්ඛුනියො ඔවාදො ඉද්ධො අහොසී''ති. කුතො භන්තෙ ඔවාදො ඉද්ධො භවිස්සති, අය්‍යා ඡබ්බග්ගියා පරිත්තඤ්ඤෙව ධම්මිං කථං කත්වා දිවසං තිරච්ඡානකථාය වීතිනාමෙත්වා උය්‍යොජෙසුන්ති. අථ ඛො භගවා තා භික්ඛුනියො ධම්මියා කථාය සන්දස්සෙසි –පෙ– පදක්ඛිණං කත්වා පක්කමිංසු.

11. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතාපෙත්වා ඡබ්බග්ගියෙ භික්ඛූ පටිපුච්ඡි: සච්චං කිර තුම්හෙ භික්ඛවෙ භික්ඛුනීනං පරිත්තඤ්ඤෙව ධම්මිං කථං කත්වා දිවසං තිරච්ඡානකථාය වීතිනාමෙත්වා උය්‍යොජෙථා''ති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා—පෙ—කථං හි නාම තුම්හෙ මොඝපුරිසා භික්ඛුනීනං පරිත්තඤ්ඤෙව ධම්මිං කථං කත්වා දිවසං තිරච්ඡානකථාය වීතිනාමෙත්වා උය්‍යොජෙස්සථ නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය—පෙ—විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි:

8. එසමයෙහි වනාහි සම්මත වූ ස්ථවිර භික්ෂූහු මෙහෙණන්හට ඔවා දෙන්නාහු එපරිද්දෙන් මැ චීවර යැ පිණ්ඩපාත යැ ශයනාසන යැ ග්ලානප්‍රත්‍යයභෛෂජ්‍ය යැ යන පරිෂ්කාරයන් ලබන්නාහු වෙති. එකල්හි සවග මහණුන්හට මෙසිත විය: ඇවැත්නි, මෙකල්හි සම්මත වූ ස්ථවිරභික්ෂූහු මෙහෙණන්හට ඔවා දෙන්නාහු එපරිද්දෙන් මැ චීවර යැ පිණ්ඩපාත යැ ශයනාසන යැ ග්ලානප්‍රත්‍යයභෛෂජ්‍ය යැ යන පරිෂ්කාරයන් ලබන්නෝ වෙති. ''එහෙයින් ඇවැත්නි, ඇපිදු සීමාවෙන් බැහැරට ගොස් එකිනෙකා මෙහෙණ ඔවා දෙන්නකු සම්මත කොට මෙහෙණන්හට ඔවා දෙම්හ''යි.

9. එකල්හි සවග මහණහු සීමාවෙන් බැහැරට ගොස් එකිනෙකා මෙහෙණ ඔවා දෙන්නකු සම්මත කොට මෙහෙණන් වෙත එළැඹැ මෙය කීහු: නැහණියනි, ඇපිදු සම්මතයම්හ. අප වෙත ද එළැඹෙවු, ඇපිදු ඔවා දෙම්හ යි. එකල්හි ඒ මෙහෙණහු සවග මහණුන් වෙත එළැඹියහ. එළැඹැ සවග මහණුන් සකසා වැඳ එකත්පසෙකැ හුන්හු. එකල්හි සවග මහණහු මෙහෙණන්හට මඳ වූ මැ දැහැමි කථා කොට තිරශ්චීනකථායෙන් දවස ගෙවා 'යව නැහණියනැ''යි නහා යැවූහු.

10. එකල්හි ඒ මෙහෙණහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියහ. එළැඹැ භාග්‍යවතුන් සකසා වැඳ එකත්පසෙකැ සිටියාහු ය, එකත් පසෙකැ සිටියා වූ එමෙහෙණන්හට භාග්‍යවතුන් වහන්සේ කිමෙක් ද මෙහෙණනි, අවවාදය සමෘද්ධ වී දැ යි වදළසේක. ස්වාමීනි, කොයින් අවවාදය සමෘද්ධ වන්නේ ද? සවග හිමිවරු මඳ වූ මැ දැහැමි කථා කියා තිරශ්චීනකථායෙන් දවස ගෙවා නහා යැවූහු යැ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ඒ මෙහෙණන්හට දැහැමි කථායෙන් මොනවට කරුණු දැක්වූසේක... පැදකුණු කොට නික්ම ගියහ.

11. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙහි ලා මෙඅවසරයෙහි ලා බික්සඟන රැස්කරවා සවග මහණුන් පුළුවුත් සේක: ''සැබෑ ද මහණෙනි, තෙපි මෙහෙණන්හට මඳ වූ මැ දැහැමි කථා කොට තිරශ්චීනකථායෙන් දවස ගෙවා නහා යවහුදැ යි. සැබැවෑ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූහ...කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි මෙහෙණන් හට මඳ වූ මැ දැහැමි කථා කොට තිරශ්චීනකථායෙන් දවස ගෙවා නහා යැවූහු ද, හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...ගරහා දැහැමි කථා කොට මහණුන් ඇමතූසේක.

12. අනුජානාමි භික්ඛවෙ අට්ඨහඞ්ගෙහි සමන්නාගතං භික්ඛුං භික්ඛුනොවාදකං සම්මන්නිතුං. සීලවා හොති පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො යෙ තෙ ධම්මා ආදිකල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසානකල්‍යාණා සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා[1] වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා. උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති සුවිභත්තානි සුප්පවත්තීනි සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො. කල්‍යාණවාචො හොති කල්‍යාණවාක්කරණො. යෙභුය්‍යෙන භික්ඛුනීනං පියො හොති මනාපො. පටිබලො හොති භික්ඛුනියො ඔවදිතුං. න ඛො පනෙතං භගවන්තං උද්දිස්ස පබ්බජිතාය කාසායවත්ථවසනාය ගරුධම්මං අජ්ඣාපන්නපුබ්බො හොති. වීසතිවස්සො වා හොති අතිරෙකවීසතිවස්සො වා. අනුජානාමි භික්ඛවෙ ඉමෙහි අට්ඨහඞ්ගෙහි සමන්නාගතං භික්ඛුං භික්ඛුනොවාදකං සම්මන්නිතුන්ති.

13. **යො පනාති:** යො යාදිසො—පෙ—භික්ඛූති:—පෙ—අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**අසම්මතො නාම:** ඤත්තිචතුත්ථෙන කම්මෙන අසම්මතො.

**භික්ඛුනියො නාම:** උභතො සඞ්ඝෙ උපසම්පන්නා.

**ඔවදෙය්‍යාති:** අට්ඨහි ගරුධම්මෙහි ඔවදති ආපත්ති පාචිත්තියස්ස. අඤ්ඤෙන ධම්මෙන ඔවදති ආපත්ති දුක්කටස්ස. එකතො උපසම්පන්නාය ඔවදති ආපත්ති දුක්කටස්ස.

14. තෙන සම්මතෙන භික්ඛුනා පරිවෙණං සම්මජ්ජිත්වා පානීයං පරිභොජනීයං උපට්ඨාපෙත්වා ආසනං පඤ්ඤපෙත්වා දුතියං ගහෙත්වා නිසීදිතබ්බං. භික්ඛුනීහි තත්ථ ගන්ත්වා තං භික්ඛුං අභිවාදෙත්වා එකමන්තං නිසීදිතබ්බං. තෙන භික්ඛුනා පුච්ඡිතබ්බා සමග්ගත්ථ[2] භගිනියොති. සචෙ සමග්ගම්හය්‍යාති.[3] භණන්ති. වත්තන්ති භගිනියො අට්ඨගරුධම්මාති. සචෙ වත්තන්තය්‍යාති[4] භණන්ති එසො භගිනියො ඔවාදොති නීය්‍යාදෙතබ්බො[5] සචෙ න වත්තන්තය්‍යාති භණන්ති ඔසාරෙතබ්බා.

---

1. ධාතා– මජසං,
2. සමග්ගාත්ථ – මජසං
3. සමග්ගාම්හාය්‍යාති – මජසං
4. වත්තන්තාය්‍යාති – මජසං
5. නීය්‍යාතෙතබ්බො – කථවී

12. මහණෙනි, අටඟින් යුතු මහණක්හු භික්ඛුනොවාදක කොට සම්මත කරන්නට අනුදනිමි. සිල් ඇතියේ වේ ද, ප්‍රාතිමොක්ෂසංවරයෙන් සංවෘත වැ ආචාරගොචරසම්පන්න වැ අල්පමාත්‍ර වූ වරදෙහි බියදක්නා සුලු වැ වෙසේ ද, (ඒ ඒ සිකපද) සමාදන් වැ ශික්ෂාපදයන්හි හික්මේ ද, පෙළදහම දරන (ළෙහි) පෙළදහම රැස් කොට තබා ගත් බහුශ්‍රැතයෙක් වේ ද මුල යහපත් වූ මැද යහපත් වූ අග යහපත් වූ යම් ධර්ම කෙනෙක් (අර්ථසම්පත්තියෙන්) සාර්ථක වූ (ව්‍යඤ්ජන සම්පත්තියෙන්) සව්‍යඤ්ජන වූ සර්වපරිපූර්ණ වූ පරිශුද්ධ වූ ශාසනබ්‍රහ්මචර්‍ය්‍යය මොනවට පවසත් නම් එබඳු ධර්මයෝ ඔහු විසින් බොහෝ කොට අසනලද්දහු වෙති. දරන ලද්දහු වෙති. වචනයෙන් පුහුණු කරන ලද්දහු සිතින් කොටස් විසින් සිතන ලද්දහු නුවණින් මොනවට පිළිවිදින ලද්දහු වෙති. තවද ඔහු විසින් උභයප්‍රාතිමොක්ෂයෝ විස්තර විසින් (උභතො විභඞ්ග විසින්) මෙනවට බෙදන ලදු වැ මොනවට පුහුණු කරන ලදු වැ (ඛන්ධකපරිවාර) සූත්‍ර විසින් අනුව්‍යඤ්ජන විසින් (අටුවා විසින්) මොනවට විනිශ්චය කරන ලදු වැ මැනැවින් දන්නා ලද්දහු වෙති. කලණබස් ඇතියේ මිහිරි හඬ ඇතියේ වේ ද බෙහෙවින් මෙහෙණන්හට ප්‍රිය වූ මන වඩන්නෙක් වේ ද මෙහෙණන් හට ඔවා දෙන්නට ප්‍රතිබලයෙක් වේ ද, තෙල භාග්‍යවතුන් උදෙසා පැවිදි වූ කහවත් දරන්නියක කෙරෙහි ගරුධර්මයකට නො අවන් විරුයෙක් වේ ද විසිවස් ඇතියෙක් හෝ අයිරා විසිවස් ඇතියෙක් හෝ වේ ද මහණෙනි, මේ අටඟින් යුතු මහණහු මෙහෙණ ඔවා දෙන්නකු කොට සම්මත කරන් නට අනුදනිමි යි.

13. යො පන යනු: යම්, යම් බඳු...භික්ඛු යනු... මෙතෙම මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**අසම්මත** නම්: ඥප්තිචතුර්ථකර්මයෙන් සම්මත නො වූයේ යි.

**භික්ඛුනීහු** නම්: දෙසඟුන් කෙරෙහි උපසපන් වූවාහු යි.

**ඔවදෙය්‍ය** යනු: අෂ්ට ගරුධර්මයෙන අවවාද කෙරේ නම් පචිති ඇවැත් වෙයි. අන්‍ය ධර්මයෙකින් අවවාද කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි, එක් පසෙකැ (භික්ෂුණී සඞ්ඝයා කෙරෙහි) උපසපන් මෙහෙණකට ඔවා දේ නම් දුකුළා ඇවැත් වේ.

14. සම්මත වූ ඒ මහණහු විසින් පිරිවෙන හැමද, පියයුතු වූ ද පිරිබෝ කළයුතු වූ ද දිය එළවා තබා අසුනක් පනවා දෙවැන්නකු ගෙන හිඳිය යුතු. මෙහෙණන් විසින් එහි ගොස් එමහණහු සකසා වැඳ එකත්-පසෙකැ හිඳිය යුතු. එ මහණහු විසින් නැඟණියනි, හැම දෙන මැ අවු දෑ යි පිළිවිසිය යුත්තාහ. ඉදින් ආර්‍ය්‍යයෙනි, ඈපි හැම දෙනමෝ පැමිණියම්හ යි බෙණෙත් නම් නැඟණියනි, අෂ්ටගරුධර්මයෝ පුහුණු වැ පවතිද්දෑ යි පිළිවිසියයුත්තාහ. ඉදින් ආර්‍ය්‍යයෙනි, පුහුණු වැ පවතිත් යයි බෙණෙත් නම් නැඟණියනි, තෙලෙ අවවාද යැ යි පවරා දිය යුතු යැ. ආර්‍ය්‍යයෙනි, පුහුණු වැ නො පවතිත් යයි බෙණෙත් නම් පෙළ කියා දියයුතු යැ.

15. වස්සසතූපසම්පන්නාය භික්ඛුනියා තදහුපසම්පන්නස්ස භික්ඛුනො අභිවාදනං පච්චුට්ඨානං අඤ්ජලිකම්මං සාමීචිකම්මං කාතබ්බං අයම්පි ධම්මො සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා යාවජීවං අනතික්කමනීයො. න භික්ඛුනියා අභික්ඛුකෙ ආවාසෙ වස්සං වසිතබ්බං අයම්පි ධම්මො සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා යාවජීවං අනතික්කමනීයො. අන්වඩ්ඪමාසං භික්ඛුනියා භික්ඛුසඞ්ඝතො ද්වෙ ධම්මා පච්චාසිංසිතබ්බා උපොසථපුච්ඡකඤ්ච ඔවාදූපසඞ්කමනඤ්ච අයම්පි ධම්මො -පෙ- වස්සං වුත්ථාය භික්ඛුනියා උභතො සඞ්ඝෙ තීහි ඨානෙහි පවාරෙතබ්බං දිට්ඨෙන වා සුතෙන වා පරිසඞ්කාය වා අයම්පි ධම්මො -පෙ- ගරු ධම්මං අජ්ඣාපන්නාය භික්ඛුනියා උභතො සඞ්ඝෙ පක්ඛමානත්තං චරිතබ්බං අයම්පි ධම්මො -පෙ- ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛාය සික්ඛමානාය උභතො සඞ්ඝෙ උපසම්පදා පරියෙසිතබ්බා අයම්පි ධම්මො -පෙ- න භික්ඛුනියා කෙනචි පරියායෙන භික්ඛු අක්කොසිතබ්බො පරිභාසිතබ්බො අයම්පි ධම්මො -පෙ- අජ්ජතග්ගෙ ඔවටො භික්ඛුනීනං භික්ඛූසු වචනපථො අනොවටො භික්ඛූනං භික්ඛුනීසු වචනපථො අයම්පි ධම්මො සක්කත්වා ගරුකත්වා මානෙත්වා පූජෙත්වා යාවජීවං අනතික්කමනීයොති.

16. සචෙ සමග්ගම්හයාති භණන්තිං අඤ්ඤං ධම්මං භණති ආපත්ති දුක්කටස්ස. සචෙ වග්ගම්හයාති භණන්තිං අට්ඨ ගරුධම්මෙ භණති ආපත්ති දුක්කටස්ස. ඔවාදං අනියාදෙත්වා අඤ්ඤං ධම්මං භණති ආපත්ති දුක්කටස්ස.

17. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී වග්ගං භික්ඛුනීසඞ්ඝං වග්ගසඤ්ඤී ඔවදති ආපත්ති පාචිත්තියස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී වග්ගං භික්ඛුනීසඞ්ඝං වෙමතිකො ඔවදති ආපත්ති පාචිත්තියස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී වග්ගං භික්ඛුනීසඞ්ඝං සමග්ගසඤ්ඤී ඔවදති ආපත්ති පාචිත්තියස්ස.

18. අධම්මකම්මෙ වෙමතිකො වග්ගං භික්ඛුනීසඞ්ඝං වග්ගසඤ්ඤී ඔවදති ආපත්ති පාචිත්තියස්ස. අධම්මකම්මෙ වෙමතිකො වග්ගං භික්ඛුනීසඞ්ඝං වෙමතිකො ඔවදති ආපත්ති පාචිත්තියස්ස. අධම්මකම්මෙ වෙමතිකො වග්ගං භික්ඛුනීසඞ්ඝං සමග්ගසඤ්ඤී ඔවදති ආපත්ති පාචිත්තියස්ස.

15. උපසපන් සියවස් ඇති මෙහෙණ විසින් එදවසැ උපසපන් මහණහට සකසා වැඳීම දක හුනස්නෙන් නැගීසිටීම ඇඳිලි බැඳීම සාමීචිකම් කළයුතු යැ, මේ ධර්මය ද සත්කාර ගරුකාර මානන පූජා කොට යවදිව් නො ඉක්ම වියැ යුත්තේ යි. මෙහෙණ විසින් (මෙහෙණවරින් අඩ යොදුනක් ඇතුළත ඔවා දෙන) මහණුන් නැති වෙහෙරෙහි වස් නො විසියයුතු ය. මේ ධර්මය ද සත්කාර ගරුකාර මානන පූජා කොට යවදිව් නො ඉක්ම වියැයුත්තේ ය. මෙහෙණ විසින් අඩමසක් පාසා භික්ෂුසඞ්ඝයා වෙතින් පොහෝ පිළිවිසුම ද අවවාදයට එළඹීම දූ යි යන දෙදහම් කැමැතිවිය යුතු යැ. මේ ධර්මය ද ... වස් වැස නිම වූ මෙහෙණ විසින් දෙසඟුන් කෙරෙහි දෘෂ්ට විසින් හෝ ශ්‍රැත විසින් හෝ පරිසඞ්කා විසින් හෝ යන තුන් කරුණෙන් පැවැරියයුතු යැ. මේ ධර්මය ද... ගරුධර්මයකට (සඟවෙසෙස් ඇවතකට) පැමිණි මෙහෙණ විසින් දෙසඟුන් කෙරෙහි පක්ෂමානත පිරියයුතු යැ. මේ ධර්මය ද...දෙවසක් සවැදූරුම් දහම්හි හික්මුණු සික ඇති ශික්ෂමානාවක විසින් දෙසඟුන් කෙරෙහි උපසපුව කැමැති විය යුතු යැ. මේ ධර්මය ද ...මෙහෙණ විසින් මහණහට කිසිදු කරුණෙකින් ආක්‍රොශ නො කළ යුතු යැ. අවමන් නො කළ යුතු යැ, මේ ධර්මය ද...අද පටන් කොට මහණුන් කෙරෙහි (ඔවා අනුසස් විසින්) මෙහෙණන්ගේ වචනපථය වාරිත යැ මෙහෙණන් කෙරෙහි මහණුන්ගේ වචනපථය අවාරිත යැ. මේ ධර්මය ද සත්කාර ගරුකාර මානන පූජා කොට යවදිව් නො ඉක්ම විය යුත්තේ යි.

16. ඉදින් ආයර්‍යයෙනි, ඇපි සමගි වූම්හ යි කියන්නියට අන්‍ය ධර්මයක් බෙණේ නම් දුකුළා ඇවැත් වෙයි. ඉදින් ආයර්‍යයෙනි, ඇපි ව්‍යග්‍ර වූම්හ යි කියන්නියට අෂ්ටගරුධර්මයන් බෙණේ නම් දුකුළා ඇවැත් වෙයි. (නැඟණියනි, මේ ඔවා යැ යි) අවවාදය නො කියා අන්‍ය ධර්මයක් බෙණේ නම් දුකුළා ඇවැත් වේ.

17. අධර්මකර්මයෙහි අධර්මකර්ම සංඥා ඇතියේ ව්‍යග්‍ර වූ භික්ෂුණී සඞ්ඝයාට ව්‍යග්‍රසංඥා ඇති වැ ඔවා දේ නම් පචිති ඇවැත් වෙයි. අධර්ම කර්මයෙහි අධර්මකර්මසංඥා ඇතියේ ව්‍යග්‍ර වූ භික්ෂුණීසඞ්ඝයාට විමති ඇති වැ ඔවා දේ නම් පචිති ඇවැත් වෙයි. අධර්මකර්මයෙහි අධර්මකර්මසංඥා ඇතියේ ව්‍යග්‍ර වූ භික්ෂුණීසඞ්ඝයාට සමග්‍රසංඥා ඇති වැ ඔවා දේ නම් පචිති ඇවැත් වේ.

18. අධර්මකර්මයෙහි විමති ඇතියේ ව්‍යග්‍ර වූ භික්ෂුණීසඞ්ඝයාට ව්‍යග්‍ර සංඥා ඇති වැ ඔවා දේ නම් පචිති ඇවැත් වෙයි. අධර්මකර්මයෙහි විමති ඇතියේ ව්‍යග්‍ර වූ භික්ෂුණීසඞ්ඝයාට විමති ඇති වැ ඔවා දේ නම් පචිති ඇවැත් වෙයි. අධර්මකර්මයෙහි විමති ඇතියේ ව්‍යග්‍ර වූ භික්ෂුණීසඞ්ඝයාට සමග්‍රසංඥා ඇති වැ ඔවා දේ නම් පචිති ඇවැත් වේ.

19. අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී වග්ගං භික්ඛුනිසඞ්ඝං වග්ගසඤ්ඤී ඔවදති ආපත්ති පාචිත්තියස්ස. අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී වග්ගං භික්ඛුනිසඞ්ඝං වෙමතිකො ඔවදති ආපත්ති පාචිත්තියස්ස. අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී වග්ගං භික්ඛුනිසඞ්ඝං සමග්ගසඤ්ඤී ඔවදති ආපත්ති පාචිත්තියස්ස.

20. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී සමග්ගං භික්ඛුනිසඞ්ඝං වග්ගසඤ්ඤී ඔවදති ආපත්ති පාචිත්තියස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී සමග්ගං භික්ඛුනිසඞ්ඝං වෙමතිකො ඔවදති ආපත්ති පාචිත්තියස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී සමග්ගං භික්ඛුනිසඞ්ඝං සමග්ගසඤ්ඤී ඔවදති ආපත්ති පාචිත්තියස්ස.

21. අධම්මකම්මෙ වෙමතිකො සමග්ගං භික්ඛුනිසඞ්ඝං වග්ගසඤ්ඤී ඔවදති ආපත්ති පාචිත්තියස්ස. අධම්මකම්මෙ වෙමතිකො සමග්ගං භික්ඛුනිසඞ්ඝං වෙමතිකො ඔවදති ආපත්ති පාචිත්තියස්ස. අධම්මකම්මෙ වෙමතිකො සමග්ගං භික්ඛුනිසඞ්ඝං සමග්ගසඤ්ඤී ඔවදති ආපත්ති පාචිත්තියස්ස.

22. අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී සමග්ගං භික්ඛුනිසඞ්ඝං වග්ගසඤ්ඤී ඔවදති ආපත්ති පාචිත්තියස්ස. අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී සමග්ගං භික්ඛුනිසඞ්ඝං වෙමතිකො ඔවදති ආපත්ති පාචිත්තියස්ස අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී සමග්ගං භික්ඛුනිසඞ්ඝං සමග්ගසඤ්ඤී ඔවදති ආපත්ති පාචිත්තියස්ස.

23. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී වග්ගං භික්ඛුනිසඞ්ඝං වග්ගසඤ්ඤී ඔවදති ආපත්ති දුක්කටස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී වග්ගං භික්ඛුනිසඞ්ඝං වෙමතිකො ඔවදති -පෙ- සමග්ගසඤ්ඤී ඔවදති ආපත්ති දුක්කටස්ස.

24. ධම්මකම්මෙ වෙමතිකො වග්ගං භික්ඛුනිසඞ්ඝං වග්ගසඤ්ඤී ඔවදති -පෙ- වෙමතිකො ඔවදති -පෙ- සමග්ගසඤ්ඤී ඔවදති ආපත්ති දුක්කටස්ස.

25. ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී වග්ගං භික්ඛුනිසඞ්ඝං වග්ගසඤ්ඤී ඔවදති -පෙ- වෙමතිකො ඔවදති -පෙ- සමග්ගසඤ්ඤී ඔවදති ආපත්ති දුක්කටස්ස.

26 ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී සමග්ගං භික්ඛුනිසඞ්ඝං වග්ගසඤ්ඤී ඔවදති -පෙ- වෙමතිකො ඔවදති -පෙ- සමග්ගසඤ්ඤී ඔවදති ආපත්ති දුක්කටස්ස.

19. අධම්මකම්මයෙහි ධම්මකම්මසංඥා ඇතියේ ව්‍යග්‍ර වූ භික්ෂුණීසඞ්ඝයාට ව්‍යග්‍රසංඥා ඇති වැ ඔවා දේ නම් පචිති ඇවැත් වෙයි. අධම්මකම්මයෙහි ධම්මකම්මසංඥා ඇතියේ ව්‍යග්‍ර වූ භික්ෂුණීසඞ්ඝයාට විමති ඇති වැ ඔවා දේ නම් පචිති ඇවැත් වෙයි. අධම්මකම්මයෙහි ධම්මකම්මසංඥා ඇතියේ ව්‍යග්‍ර වූ භික්ෂුණීසඞ්ඝයාට සමග්‍රසංඥා ඇති වැ ඔවා දේ නම් පචිති ඇවැත් වේ.

20. අධම්මකම්මයෙහි අධම්මකම්මසංඥා ඇතියේ සමග්‍ර වූ භික්ෂුණී-සඞ්ඝයාට ව්‍යග්‍රසංඥා ඇති වැ ඔවා දේ නම් පචිති ඇවැත් වෙයි. අධම්ම-කම්මයෙහි අධම්මකම්මසංඥා ඇතියේ සමග්‍ර වූ භික්ෂුණීසඞ්ඝයාට විමති ඇති වැ ඔවා දේ නම් පචිති ඇවැත් වෙයි. අධම්මකම්මයෙහි අධම්මකම්මසංඥා ඇතියේ සමග්‍ර වූ භික්ෂුණීසඞ්ඝයාට සමග්‍රසංඥා ඇති වැ ඔවා දේ නම් පචිති ඇවැත් වේ.

21. අධම්මකම්මයෙහි විමති ඇතියේ සමග්‍ර වූ භික්ෂුණීසඞ්ඝයාට ව්‍යග්‍රසංඥා ඇති වැ ඔවා දේ නම් පචිති ඇවැත් වෙයි. අධම්මකම්මයෙහි විමති ඇතියේ සමග්‍ර වූ භික්ෂුණීසඞ්ඝයාට විමති ඇති වැ ඔවා දේ නම් පචිති ඇවැත් වෙයි. අධම්මකම්මයෙහි විමති ඇතියේ සමග්‍ර වූ භික්ෂුණී-සඞ්ඝයාට සමග්‍රසංඥා ඇති වැ ඔවා දේ නම් පචිති ඇවැත් වේ.

22. අධම්මකම්මයෙහි ධම්මකම්මසංඥා ඇතියේ සමග්‍ර වූ භික්ෂුණීසඞ්ඝයාට ව්‍යග්‍රසංඥා ඇති වැ ඔවා දේ නම් පචිති ඇවැත් වෙයි. අධම්මකම්මයෙහි ධම්මකම්මසංඥා ඇතියේ සමග්‍ර වූ භික්ෂුණීසඞ්ඝයාට විමති ඇති වැ ඔවා දේ නම් පචිති ඇවැත් වෙයි. අධම්මකම්මයෙහි ධම්මකම්මසංඥා ඇතියේ සමග්‍ර වූ භික්ෂුණීසඞ්ඝයාට සමග්‍රසංඥා ඇති වැ ඔවා දේ නම් පචිති ඇවැත් වේ.

23. ධම්මකම්මයෙහි අධම්මකම්මසංඥා ඇතියේ ව්‍යග්‍ර වූ භික්ෂුණීසඞ්ඝයාට ව්‍යග්‍රසංඥා ඇති වැ ඔවා දේ නම් දුකුළා ඇවැත් වෙයි. ධම්මකම්මයෙහි අධම්මකම්මසංඥා ඇතියේ ව්‍යග්‍ර වූ භික්ෂුණීසඞ්ඝයාට විමති ඇති වැ ඔවා දේ නම්...සමග්‍රසංඥා ඇති වැ ඔවා දේ නම් දුකුළා ඇවැත් වේ.

24. ධම්මකම්මයෙහි විමති ඇතියේ ව්‍යග්‍ර වූ භික්ෂුණීසඞ්ඝයාට ව්‍යග්‍ර-සංඥා ඇති වැ ඔවා දේ නම්...විමති ඇති වැ ඔවා දේ නම්...සමග්‍රසංඥා ඇති වැ ඔවා දේ නම් දුකුළා ඇවැත් වේ.

25. ධම්මකම්මයෙහි ධම්මකම්මසංඥා ඇතියේ ව්‍යග්‍ර වූ භික්ෂුණීසඞ්ඝයාට ව්‍යග්‍ර සංඥා ඇති වැ ඔවා දේ නම්...විමති ඇති වැ ඔවා දේ නම්...සමග්‍ර-සංඥා ඇති වැ ඔවා දේ නම් දුකුළා ඇවැත් වේ.

26. ධම්මකම්මයෙහි අධම්මකම්මසංඥා ඇතියේ සමග්‍ර වූ භික්ෂුණීසඞ්ඝයාට ව්‍යග්‍රසංඥා ඇති වැ ඔවා දේ නම්...විමති ඇති වැ ඔවා දේ නම්...සමග්‍ර සංඥා ඇති වැ ඔවා දේ නම් දුකුළා ඇවැත් වේ.

27. ධම්මකම්මෙ වෙමතිකො සමග්ගං භික්ඛුනීසඞ්ඝං වග්ගසඤ්ඤී ඔවදති -පෙ- වෙමතිකො ඔවදති -පෙ- සමග්ගසඤ්ඤී ඔවදති ආපත්ති දුක්කටස්ස.

28. ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී සමග්ගං භික්ඛුනීසඞ්ඝං වග්ගසඤ්ඤී ඔවදති ආපත්ති දුක්කටස්ස. ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී සමග්ගං භික්ඛුනීසඞ්ඝං වෙමතිකො ඔවදති ආපත්ති දුක්කටස්ස. ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී සමග්ගං භික්ඛුනී සඞ්ඝං සමග්ගසඤ්ඤී ඔවදති අනාපත්ති.

29. **අනාපත්ති:** උද්දෙසං දෙන්තො පරිපුච්ඡං දෙන්තො ඔසාරෙහි අය්‍යාති වුච්චමානො ඔසාරෙති පඤ්හං පුච්ඡති පඤ්හං පුට්ඨො කථෙති අඤ්ඤස්සත්ථාය භණන්තං භික්ඛුනියො සුණන්ති සික්ඛමානාය සාමණෙරාය[1] උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

ඔවාදසික්ඛාපදං පඨමං.

## 6.3.2

## අත්ථඞ්ගතසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ථෙරා භික්ඛූ භික්ඛුනියො ඔවදන්ති පරියායෙන. තෙන ඛො පන සමයෙන ආයස්මතො **චූළපන්ථකස්ස** පරියායො හොති භික්ඛුනියො ඔවදිතුං. භික්ඛුනියො එවමාහංසු: "න දානි අජ්ජ ඔවාදො ඉද්ධො භවිස්සති තඤ්ඤෙව දානි උදානං අය්‍යො චූළපන්ථකො පුනප්පුනං භණිස්සතීති.

2. අථ ඛො තා භික්ඛුනියො යෙනායස්මා චූළපන්ථකො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං චූළපන්ථකං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තා භික්ඛුනියො ආයස්මා චූළපන්ථකො එතදවොච:

'සමග්ගත්ථ භගිනියො'ති.
සමග්ගම්හ අය්‍යාති.
වත්තන්ති භගිනියො අට්ඨ ගරුධම්මාති.
වත්තන්ත අය්‍යාති.

එසො භගිනියො ඔවාදොති නියාදෙත්වා ඉමං උදානං පුනප්පුනං අභාසි.

"අධිචෙතසො අප්පමජ්ජතො මුනිනො මොනපථෙසු සික්ඛතො
සොකා න භවන්ති තාදිනො උපසන්තස්ස සදා සතීමතො"ති

1. සාමණෙරියා- මජසං,

27. ධර්මකර්මයෙහි විමති ඇතියේ සමග්‍ර වූ භික්ෂුණීසඞ්ඝයාට ව්‍යග්‍රසංඥා ඇති වැ ඔවා දේ නම්...විමති ඇති වැ ඔවා දේ නම්...සමග්‍රසංඥා ඇති වැ ඔවා දේ නම් දුකුළා ඇවැත් වේ.

28. ධර්මකර්මයෙහි ධර්මකර්මසංඥා ඇතියේ සමග්‍ර වූ භික්ෂුණීසඞ්ඝයාට ව්‍යග්‍රසංඥා ඇති වැ ඔවා දේ නම් දුකුළා ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි ධර්මකර්මසංඥා ඇතියේ සමග්‍ර වූ භික්ෂුණීසඞ්ඝයාට විමති ඇති වැ ඔවා දේ නම් දුකුළා ඇවැත් වෙයි. ධර්මකර්මයෙහි ධර්මකර්මසංඥා ඇතියේ සමග්‍ර වූ භික්ෂුණීසඞ්ඝයාට සමග්‍රසංඥා ඇති වැ ඔවා දේ නම් ඇවැත් නැති.

29. (අටගුරුදම්පෙළ) උදෙසන්නේ නම් (ගුරුදම්පෙළෙහි) අටුවා බණන්නේ නම්, ආයර්‍යයෙනි, බණන්නැ යි කියනු ලබන්නේ බෙණේ නම්, පිළිවිසී නම්, පැන පුළුවුස්නා ලදුයේ කියා නම්, මෙරමා සඳහා බණ දෙසන්නහුගෙන් මෙහෙණෝ අසත් නම්, සික්මනුවකට හෙරණියකට නම් ඇවැත් නැති. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

## පළමුවැනි ඔවාද ශික්ෂාපද යි

## 6.3.2

## අත්ථඞ්ගත ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩවෙසෙති. එසමයෙහි ස්ථවිර භික්ෂූහු පිළිවෙළින් මෙහෙණන්හට ඔවා දෙති. එසමයෙහි මෙහෙණන්හට ඔවා දෙන්නට ආයුෂ්මත් චූල්ලපන්ථක තෙරුන්ගේ වාරය වෙයි. භික්ෂුණීහු මෙසේ කීහු: ''අද නම් අවවාදය සමෘද්ධ නො වන්නේ යැ. ආයර්‍ය චූල්ලපන්ථක තෙරණුවෝ ඒ උදනය මැ දතුදු පුනපුනා කියන්නාහ''යි.

2. එකල්හි ඒ භික්ෂුණීහු ආයුෂ්මත් චූල්ලපන්ථක තෙරුන් වෙත එළැඹියහ. එළැඹැ ආයුෂ්මත් චූල්ලපන්ථක තෙරුන් සකසා වැඳ එකත් පසෙකැ හුන්හු. එකත්පසෙකැ හුන්නා වූ ඒ මෙහෙණන්හට ආයුෂ්මත් චූල්ලපන්ථක තෙරණුවෝ තෙල කීහ:

නැඟණියනි, (තෙපි) හැම දෙන මැ මෙහි අවු දැ යි.

ආයර්‍යයන් වහන්ස, හැම දෙනමෝ මෙහි ආම්හ යි.

නැඟණියනි, අෂ්ටගරුධර්මයෝ (තොප කෙරෙහි) පවතිත් දැ යි.

ආයර්‍යයන් වහන්ස, (අප කෙරෙහි) පවතිත් යයි.

නැඟණියනි, ''තෙල අවවාද ය''යි පවසා මේ උදනය පුන පුනා කීහ: ' රාත්පලසිතින් යුතු නො පමා වූ මොනසංඛ්‍යාතඥානයෙන් හික්මුණු තාදී වූ (රාගාදි ව්‍යපශමයෙන්) උපශාන්ත වූ ස්මෘතිමත් වූ ක්ෂීණාස්‍රව මුනිහට ශෝකයෝ හැම කල්හි නො වන්නාහ''යි.

3. භික්ඛුනියො එවමාහංසු: "නනු අවොචුම්හා න දානි අජ්ජ ඔවාදො ඉද්ධො භවිස්සති තඤ්ඤෙවදානි උද්දානං අය්‍යො චූළපන්ථකො පුනප්පුනං භණිස්සතී"ති[1]. අස්සොසි ඛො ආයස්මා චූළපන්ථකො තාසං භික්ඛුනීනං ඉමං කථාසල්ලාපං. අථ ඛො ආයස්මා චූළපන්ථකො වෙහාසං අබ්භුග්ගන්ත්වා ආකාසෙ අන්තලික්ඛෙ චඞ්කමති'පි තිට්ඨති'පි නිසීදති'පි සෙය්‍යම්පි කප්පෙති ධූමායතිපි පජ්ජලතිපි අන්තරධායතිපි තඤ්ඤෙව[2] උද්දානං භණති අඤ්ඤඤ්ච බහුං බුද්ධවචනං.

භික්ඛුනියො එවමාහංසු "අච්ඡරියං වත භො අබ්භුතං වත භො න වත නො ඉතො පුබ්බෙ ඔවාදො එවං ඉද්ධො භූතපුබ්බො යථා අය්‍යස්ස චූළපන්ථකස්සා"ති.

4. අථ ඛො ආයස්මා චූළපන්ථකො තා භික්ඛුනියො යාව සමන්ධකාරා ඔවදිත්වා උය්‍යොජෙසි: "ගච්ඡථ භගිනියො"ති. අථ ඛො තා භික්ඛුනියො නගරද්වාරෙ ථකිතෙ[3] බහිනගරෙ වසිත්වා කාලස්සෙව නගරං පවිසන්ති මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති; "අබ්‍රහ්මචාරිනියො ඉමා භික්ඛුනියො ආරාමෙ භික්ඛූහි සද්ධිං වසිත්වා ඉදානි නගරං පවිසන්තී"ති.

5. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති කථං හි නාම ආයස්මා චූළපන්ථකො අත්ථඞ්ගතෙ සූරියෙ භික්ඛුනියො ඔවදිස්සතීති -පෙ- සච්චං කිර ත්වං චූළපන්ථක අත්ථඞ්ගතෙ සූරියෙ භික්ඛුනියො ඔවදසීති.

සච්චං භගවා.

විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම ත්වං චූළපන්ථක අත්ථඞ්ගතෙ සූරියෙ භික්ඛුනියො ඔවදිස්සසි, නෙතං චූළපන්ථක අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"සම්මතොපි චෙ භික්ඛු අත්ථඞ්ගතෙ සූරියෙ භික්ඛුනියො ඔවදෙය්‍ය පාචිත්තිය"න්ති.**

6. **සම්මතො** නාම; **ඤත්තිචතුත්ථෙන** කම්මෙන **සම්මතො**.
**අත්ථඞ්ගතෙ සූරියෙති:** ඔග්ගතෙ සූරියෙ.
**භික්ඛුනී** නාම: උභතො සඞ්ඝෙ උපසම්පන්නා.

**ඔවදෙය්‍යාති:** අට්ඨහි වා ගරුධම්මෙහි අඤ්ඤෙන වා ධම්මෙන ඔවදති ආපත්ති පාචිත්තියස්ස.

1. භණිස්සති - සිමු
2. තඤ්ඤෙවච - මජ්සං
3. ථකිතෙ - සිමු

3. මෙහෙණහු මෙසේ කීහු: ''අද නම් අවවාදය සමෘද්ධ නො වන්නේ යැ. දූන් ඒ උදනය මැ ආයර්‍ය චූල්ලපන්ථක තෙරණුවෝ පුන පුනා බෙණෙනැ යි (ඇපි) නො කීවමෝ ද?'' ආයුෂ්මත් චූල්ලපන්ථක තෙරණුවෝ ඒ මෙහෙණන්ගේ මේ කථා සල්ලාපය ඇසූහ. එකල්හි ආයුෂ්මත් චූල්ලපන්ථක තෙරණුවෝ අහසට පැන අන්තරික්ෂාවකාශයෙහි සක්මන් ද කෙරෙති, සිටීම ද කෙරෙති, හිඳීම ද කෙරෙති, ශයනය ද කෙරෙති, දුමාලීම ද කෙරෙති, දිලිහීම ද කෙරෙති, අදර්ශනයට ද යෙති. එම උදනයත් සෙසු බොහෝ බුද්ධවචනත් බෙණෙත්.

මෙහෙණහු මෙසේ කීහු; ''භවත්ති, එකාන්තයෙන් ආශ්චර්‍ය ය. භවත්ති, එකාන්තයෙන් අද්භූත යි. ආයර්‍ය චූල්ලපන්ථක තෙරණුවන්ගේ මෙන් මෙබඳු අවවාදයෙක් අපහට මෙයින් පෙර නොවී යැ මෙබඳු සමෘද්ධියක් නොවූ විරි යැ යි.

4. එකල්හි ආයුෂ්මත් චූල්ලපන්ථක තෙරණුවෝ ඒ මෙහෙණන් අඳුරු වැටෙන තාක් ඔවා දී 'යවු නැඟණියනි'යි නහා යැවූහ. එකල්හි ඒ මෙහෙණහු නුවර දෙර වැසූ කල්හි බිහිනුවර වැස උදෑසන මැ නුවරට පිවිසෙති. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ කියති, දෙස් පතුරුවත්: ''මේ මෙහෙණහු අබ්‍රහ්මචාරිණීහ, අරමහි මහණුන් හා සමඟ වැස දූන් නුවරට පිවිසෙත්''යයි

5. ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ත්ති ශබ්දය) භික්ෂූහු ඇසූහු. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් ආයුෂ්මත් චූල්ලපන්ථකයෝ හිරු අත්ගල (බැස) ගියකල්හි මෙහෙ-ණන්හට ඔවා දෙත් ද යි...සැබෑද චූල්ලපන්ථක, තෙපි හිරු බැස ගිය කල්හි මෙහෙණන්හට ඔවා දෙවු ද යි.

සැබැවැ භාග්‍යවතුන් වහන්ස,

භාග්‍යවත් බුදුහු ගැරහූ...කෙසේ නම් චූල්ලපන්ථක, තෙපි හිරු අවරගිරට ගිය කල්හි මෙහෙණන්හට ඔවා දෙවූ ද? චූල්ලපන්ථක, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**''ඉදින් සම්මත වූ ද මහණ හිරු අස්තයට ගිය කල්හි මෙහෙණන්හට ඔවා දෙන්නේ නම් පචිති වේ'' යයි.**

6. **සම්මත** නම්: ඥප්තිචතුර්ථකර්මයෙන් සම්මත යැ.

**අත්ථඞ්ගතෙ සූරියෙ:** හිරු බට කල්හි.

**භික්ඛුනී** නම්: දෙ සඟුන් කෙරෙහි උපසපන් වූවා.

**ඔවදෙය්‍ය:** ගරුදම් අටින් හෝ අන් දහමෙකින් හෝ ඔවා දේ නම් පචිති ඇවැත් වේ.

අත්ථඞ්ගතෙ අත්ථඞ්ගතසඤ්ඤී ඔවදති ආපත්ති පාචිත්තියස්ස. අත්ථඞ්ගතෙ වෙමතිකො ඔවදති ආපත්ති පාචිත්තියස්ස. අත්ථඞ්ගතෙ අනත්ථඞ්ගතසඤ්ඤී ඔවදති ආපත්ති පාචිත්තියස්ස.

එකතො උපසම්පන්නාය ඔවදති ආපත්ති දුක්කටස්ස. අනත්ථඞ්ගතෙ අත්ථඞ්ගතසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අනත්ථඞ්ගතෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අනත්ථඞ්ගතෙ අනත්ථඞ්ගතසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** උද්දෙසං දෙන්තො පරිපුච්ඡං දෙන්තො ඔසාරෙහි අය්‍යාති වුච්චමානො ඔසාරෙති පඤ්හං පුච්ඡති පඤ්හං පුට්ඨො කථෙති අඤ්ඤස්සත්ථාය භණන්තං භික්ඛුනියො සුණන්ති සික්ඛමානාය සාමණෙරාය උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

අත්ථඞ්ගත සික්ඛාපදං දුතියං

## 6. 3. 3

## භික්ඛුනූපස්සයසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුනූපස්සයං උපසඞ්කමිත්වා ඡබ්බග්ගියා භික්ඛුනියො ඔවදන්ති. භික්ඛුනියො ඡබ්බග්ගියා භික්ඛුනියො එතදවොචුං: එථය්‍යො[1] ඔවාදං ගමිස්සාමාති.

යම්පි මයං අය්‍යො ගච්ඡෙය්‍යාම ඔවාදස්ස කාරණා අය්‍යා ඡබ්බග්ගියා ඉධෙව අම්හෙ ඔවදන්තීති.

භික්ඛුනියො උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛුනියො ඔවාදං න ගච්ඡිස්සන්ති"ති.[2]

2. අථ ඛො තා භික්ඛුනියො භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං: යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුනූපස්සයං උපසඞ්කමිත්වා භික්ඛුනියො ඔවදිස්සන්තීති -පෙ-

සච්චං කිර තුම්හෙ භික්ඛවෙ භික්ඛුනූපස්සයං උපසඞ්කමිත්වා භික්ඛුනියො ඔවදථාති.

සච්චං භගවා.

---

1. එථායො-මජසං,
2. "කථංහි නාම ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුනූපස්සයං උපසඞ්කමිත්වා භික්ඛුනියො ඔවදිස්සන්තී"ති, මජසං,

හිරු අස්තයට ගිය කල්හි අස්තඞ්ගතසංඥා ඇතියේ ඔවා දේ නම් පචිති ඇවැත් වෙයි. අස්තඞ්ගතයෙහි විමති ඇතියේ ඔවා දේ නම් පචිති ඇවැත් වෙයි, අස්තඞ්ගතයෙහි අස්තඞ්ගතසංඥ නැතියේ ඔවා දේ නම් පචිති ඇවැත් වෙ.

එක්පසෙකැ (මෙහෙණසඟුන් කෙරෙහි) උපසපන් වූවකට ඔවා දේ නම් දුකුළා ඇවැත් වෙයි. අනස්තඞ්ගතයෙහි අස්තඞ්ගතසංඥා ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි, අනස්තඞ්ගතයෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙ. අනස්තඞ්ගතයෙහි අනස්තඞ්ගතසංඥා ඇතියේ නම් ඇවැත් නැති.

(අට ගරු දම් පෙළ) උදෙසන්නේ නම්, (ගරුදම්පෙළෙහි) අටුවා බණන්නේ නම්; ආයසීයෙනි, බණන්නැ'යි කියනු ලබන්නේ කියා නම් පැන පිළිවිසී නම්, පැන පුළුවුස්නා ලදුයේ කියා නම්, මෙරමා සඳහා දෙසන්නහුගෙන් මෙහෙණිහු අසත් නම්, භික්මනුවකට හෙරණියකට කියා නම් ඇවැත් නැති. උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

දෙවැනි අත්ථඞ්ගත ශික්ෂාපද යි

## 6.3.3

## භික්ඛුනූපස්සය ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු ශාක්‍යජනපදයෙහි කිඹුල්වත් නුවර නිග්‍රෝධාරාමයෙහි වැඩැවෙසෙති. එසමයෙහි ඡබ්බග්ගිය මහණහු මෙහෙණවරට එළැඹැ සවග මෙහෙණන්හට ඔවා දෙති. භික්ෂුණිහු සවග මෙහෙණන්හට තෙල කීහු: ආයසීාවෙනි, එවු අවවාදයට යම්හ යි.

ආයසීාවෙනි, යම් තෙනකට ඔවා කරුණෙන් ඇපි යන්නෙමු ද සවග මහණහු මෙහි ම අපට ඔවා දෙති යි කිවු ය.

භික්ෂුණිහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් සවග මෙහෙණහු අවවාදයට නො යන්නාහු දෑ''යි.

2. එකල්හි ඒ මෙහෙණහු මහණුන්හට තෙල කරුණ දන්වූහ. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් සවග මහණහු මෙහෙණවරට එළැඹැ මෙහෙණන්හට ඔවා දුන්නු ද යි...

සැබැ ද මහණෙනි, තෙපි මෙහෙණවරට එළැඹැ මෙහෙණන්හට ඔවා දෙවු දෑ යි.

සැබැවැ භාග්‍යවතුන් වහන්ස.

විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා භික්ඛුනුපස්සයං උපසඞ්කමිත්වා භික්ඛුනියො ඔවදිස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු භික්ඛුනුපස්සයං උපසඞ්කමිත්වා භික්ඛුනියො ඔවදෙය්‍ය පාචිත්තිය"න්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

3. තෙන ඛො පන සමයෙන **මහාපජාපති ගොතමී** ගිලානා හොති. ථෙරා භික්ඛූ යෙන මහාපජාපතී ගොතමී තෙනුපසඞ්කමිංසු උපසඞ්කමිත්වා මහාපජාපතිං ගොතමිං එතදවොචුං: "කච්චි තෙ ගොතමි,[1] ඛමනීයං කච්චි යාපනීයන්ති.

න මෙ අය්‍යා, ඛමනීයං න යාපනීයං ඉඞ්ඝය්‍යා, ධම්මං දෙසෙථාති.

න භගිනි කප්පති භික්ඛුනුපස්සයං උපසඞ්කමිත්වා භික්ඛුනියො ධම්මං දෙසෙතුන්ති කුක්කුච්චායන්තා න දෙසෙසුං.

4. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන මහාපජාපතී ගොතමී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා මහාපජාපතිං ගොතමිං එතදවොච: "කච්චි තෙ ගොතමි ඛමනීයං කච්චි යාපනීයන්ති"?

පුබ්බෙ මෙ භන්තෙ ථෙරා භික්ඛූ ආගන්ත්වා ධම්මං දෙසෙන්ති. තෙන මෙ ඵාසු හොති. ඉදානි පන භගවතා පටික්ඛිත්තන්ති කුක්කුච්චායන්තා න දෙසෙන්ති, තෙන මෙ න ඵාසු හොතීති.

5. අථ ඛො භගවා මහාපජාපතිං ගොතමිං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: අනුජානාමි භික්ඛවෙ භික්ඛුනුපස්සයං උපසඞ්කමිත්වා ගිලානං භික්ඛුනිං ඔවදිතුං. එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු භික්ඛුනුපස්සයං උපසඞ්කමිත්වා භික්ඛුනියො ඔවදෙය්‍ය අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං, තත්ථායං සමයො ගිලානා හොති භික්ඛුනී, අයං තත්ථ සමයො"ති.**

1. කච්චි ගොතමි - මජසං.

භාග්‍යවත් බුදුහු ගැරහූ...කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි මෙහෙණ-වරට එළැඹ මෙහෙණන්හට ඔවා දුන්නහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවූ:

**"යම් මහණෙක් මෙහෙණවරට එළැඹ මෙහෙණන්හට ඔවා දෙන්නේ නම් පචිති වේ" යයි.**

භාග්‍යවතුන් විසින් භික්ෂූන්හට මේ සිකපදය මෙසේ පනවන ලද්දේ වෙයි.

3. එසමයෙහි වනාහි මහාප්‍රජාපතී ගෞතමී ගිලන් වූවා වෙයි. ස්ථවිරභික්ෂූහු මහාප්‍රජාපති ගෞතමිය වෙත එළැඹියාහු ය. එළැඹ "කිම ගෞතමිය, කිම තොපට ඉවැසිය හැකි ද? කිම යැපිය හැකි"ද යි තෙල කීහු.

ආයර්‍යවරුනි මට ඉවැසිය නො හැකි යැ. යැපිය නො හැකි යි, ආයර්‍යවරු දහම් දෙසන්නාහු නම් මැනැවැ යි කිවු ය.

"නැඟණියනි, මෙහෙණවරට එළැඹ මෙහෙණන්හට දහම් දෙසන්නට නො කැපැ යි" කුකුස් කරනුවෝ (දහම්) නො දෙසූහු.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පෙරවැ පාසිවුරු ගෙන මහාප්‍රජාපති ගෞතමිය වෙත එළැඹ පැනවූ අස්නෙහි වැඩහුන්සේක. වැඩ හිඳ භාග්‍යවතුන් වහන්සේ කිම ගෞතමිය, තොපට ඉවසිය හැකි ද? යැපිය හැකි ද යි තෙල වදළසේක.

ස්වාමීනි, පෙර ස්ථවිරභික්ෂූහු අවුත් මට දහම් දෙසති. එයින් මට පහසු වෙයි. දැන් වූ කලි භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රතික්ෂිප්ත යැ යි කුකුස් කරනුවෝ නො දෙසත්. එයින් මට පහසු නො වේ යැ යි කිවු ය.

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මහාප්‍රජාපති ගෞතමියට දැහැමි කථායෙන් මොනවට කරුණු දක්වා මොනවට කරුණු ගන්වා මොනවට තෙද ගන්වා මොනවට සතුටු කරවා හුනස්නෙන් නැඟිට වැඩිසේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙහි ලා මෙ අවසරයෙහි ලා දැහැමි කථා කොට මහණුන් ඇමතූසේක. "මහණෙනි, මෙහෙණවරට එළැඹ ගිලන් මෙහෙණට ඔවා දෙන්නට අනුදනිමි"මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවූ:

**"යම් මහණෙක් සුදුසු සමය තබා මෙහෙණවරට එළැඹ මෙහෙණන්හට ඔවා දෙන්නේ නම් පචිති වේ. එහි මේ සුදුසු සමය යි. මෙහෙණක් ගිලන් වූවා වේ නම් මේ එහි සුදුසු සමය යි.**

6. යො පනාති: යො යාදිසො -පෙ- භික්ඛූති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

භික්ඛුනුපස්සයො නාම: යත්ථ භික්ඛුනියො එකරත්තම්පි වසන්ති:

උපසඞ්කමිත්වාති: තත්ථ ගන්ත්වා.

භික්ඛුනී නාම: උභතො සඞ්ඝෙ උපසම්පන්නා.

ඔවදෙය්‍යාති: අට්ඨහි ගරුධම්මෙහි ඔවදති ආපත්ති පාචිත්තියස්ස.

අඤ්ඤත්‍ර සමයාති: ඨපෙත්වා සමයං.

ගිලානා නාම: භික්ඛුනී න සක්කොති ඔවාදය වා සංවාසාය වා ගන්තුං.

උපසම්පන්නාය උපසම්පන්නසඤ්ඤී භික්ඛුනුපස්සයං උපසඞ්කමිත්වා අඤ්ඤත්‍ර සමයා ඔවදති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නාය වෙමතිකො භික්ඛුනුපස්සයං උපසඞ්කමිත්වා අඤ්ඤත්‍ර සමයා ඔවදති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නාය අනුපසම්පන්නසඤ්ඤී භික්ඛුනුපස්සයං උපසඞ්කමිත්වා අඤ්ඤත්‍ර සමයා ඔවදති ආපත්ති පාචිත්තියස්ස.

අඤ්ඤෙන ධම්මෙන ඔවදති ආපත්ති දුක්කටස්ස. එකතො උපසම්පන්නාය ඔවදති ආපත්ති දුක්කටස්ස.

අනුපසම්පන්නාය උපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය අනුපසම්පන්නසඤ්ඤී අනාපත්ති.

අනාපත්ති: සමයෙ උද්දෙසං දෙන්තො පරිපුච්ඡං දෙන්තො ඔසාරෙහීති වුච්චමානො ඔසාරෙති පඤ්හං පුච්ඡති පඤ්හං පුට්ඨො කථෙති අඤ්ඤස්සත්ථාය භණන්තං භික්ඛුනියො සුණන්ති සික්ඛමානාය සාමණෙරාය උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**භික්ඛුනුපස්සයසික්ඛාපදං තතියං**

6. යොපන; යම්, යම් බඳු...භික්ඛු...මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**භික්ඛුනුපස්සය**: යම් තෙනෙකැ මෙහෙණහු එක් රැයකුදු වසද්ද එතෙන යි.

**උපසඞ්කමිත්වා**: එහි ගොස්.

**භික්ඛුනී නාම**: දෙසඟුන් කෙරෙහි උපසපන් වූවා.

**ඔවදෙය්‍ය**: අෂ්ට ගරුධර්මයෙන් ඔවා දේ නම් පචිති ඇවැත් වේ.

**අඤ්ඤත්‍රසමයා**: සුදුසු සමය තබා.

ගිලානා නාම: මෙහෙණක් අවවාදයට හෝ සහවාසයට හෝ යන්නට නො හැකි වූවා යි.

උපසපනක කෙරෙහි උපසපන්සන් ඇතියේ සුදුසු සමය තබා මෙහෙණවරට එළැඹැ ඔවා දේ නම් පචිති ඇවැත් වෙයි, උපසපනක කෙරෙහි විමති ඇතියේ සුදුසු සමය තබා මෙහෙණවරට එළැඹැ ඔවා දේ නම් පචිති ඇවැත් වෙයි, උපසපනක කෙරෙහි අනුපසපන්යන් ඇතියේ සුදුසු සමය තබා මෙහෙණවරට එළැඹැ ඔවා දේ නම් පචිති ඇවැත් වේ.

අන්‍යධර්මයෙකින් ඔවා දේ නම් දුකුළා ඇවැත් වෙයි, මෙහෙණ සඟුන් කෙරෙහි උපසපන්වූවකට ඔවා දේ නම් දුකුළා ඇවැත් වේ.

අනුපසපනක කෙරෙහි උපසපන්සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. අනුපසපනක කෙරෙහි අනුපසපන්සන් ඇතියේ නම් ඇවැත් නැති.

සුදුසු සමයෙහි (අටගරු දම්පෙළ) උදෙසන්නේ නම්, (ගරුදම් පෙළෙහි) අවුවා බණන්නේ නම් ආයසීයෙනි, බණන්නැ'යි කියනු ලබන්නේ බණනේ නම් පැන විචාරණු නම් පැන පුළුවුස්නා ලදුයේ කියා නම් මෙරමා සඳහා දෙසන්නහුගෙන් මෙහෙණහු අසත් නම් ඇවැත් නැති, සික්මනුවකට හෙරණියකට උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

**තෙවැනි භික්ඛුනුපස්සය ශික්ෂාපද යි**

## 6.3.4

## ආමිසසික්ඛාපදං

1\. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ථෙරා භික්ඛූ භික්ඛුනියො ඔවදන්තා ලාභිනො හොන්ති චීවරපිණ්ඩපාතසෙනාසනගිලානප්පච්චයභෙසජ්ජපරික්ඛාරානං. ඡබ්බග්ගියා භික්ඛූ එවං වදෙන්ති. "න බහුකතා ථෙරා භික්ඛූ භික්ඛුනියො ඔවදන්ති[1], ආමිසහෙතු ථෙරා භික්ඛූ භික්ඛුනියො ඔවදන්තීති.

2\. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ එවං වක්ඛන්ති: න බහුකතා ථෙරා භික්ඛූ භික්ඛුනියො ඔවදන්ති, ආමිසහෙතු ථෙරා භික්ඛූ භික්ඛුනියො ඔවදන්තීති -පෙ-

සච්චං කිර තුම්හෙ භික්ඛවෙ එවං වදෙථ න බහුකතා ථෙරා භික්ඛූ භික්ඛුනියො ඔවදන්ති, ආමිසහෙතු ථෙරා භික්ඛූ භික්ඛුනියො ඔවදන්තීති.

සච්චං භගවා.

විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා එවං වක්ඛථ: න බහුකතා ථෙරා භික්ඛූ භික්ඛුනියො ඔවදන්ති ආමිසහෙතු ථෙරා භික්ඛූ භික්ඛුනියො ඔවදන්තීති. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු එවං වදෙය්‍ය ආමිසහෙතු භික්ඛූ[2] භික්ඛුනියො ඔවදන්තීති පාචිත්තිය"න්ති.**

3\. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**ආමිසහෙතූති: චීවරහෙතු පිණ්ඩපාතහෙතු සෙනාසනහෙතු ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරහෙතු සක්කාරහෙතු ගරුකාරහෙතු මානනහෙතු වන්දනහෙතු පූජනහෙතු.**

1\. ඔවදිතුං — මජසං 2. ථෙරෙ භික්ඛූ — මජසං,

## 6.3.4

## ආමිසසික්ඛාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර අනේපිඬු සිටුහුගේ දෙව්රම් වෙහෙර වැඩැවෙසෙති. එකල්හි ස්ථවිරභික්ෂුහු මෙහෙණන්හට ඕවා දෙන්නාහු සිවුරු–පිඩුවා–සෙනසුන්-ගිලන්පසබෙහෙත් පිරිකර ලබන්නාහු වෙති. සවග මහණහු මෙසේ කියති: ස්ථවිර භික්ෂුහු මෙහෙණන් හට කළ දහම් බුහුමන් ඇති වැ ඕවා නො දෙති. ආමිසහෙතුයෙන් ස්ථවිර භික්ෂුහු මෙහෙණන්හට ඕවා දෙති යි.

2. යම් ඒ භික්ෂූ කෙනෙක් අපිස් වූවෝ ...ඔහු ලජු කොව සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් සවග මහණහු ස්ථවිර භික්ෂුහු මෙහෙණන්හට කළ දහම් බුහුමන් ඇති වැ ඕවා නො දෙති යි, ආමිසහෙතුයෙන් ස්ථවිර භික්ෂුහු මෙහෙණන්හට ඕවා දෙති යි මෙසේ කියත් ද යි...

සැබෑ ද මහණෙනි, තෙපි ස්ථවිර භික්ෂුහු මෙහෙණන්හට කළ දහම් බුහුමන් ඇති වැ ඕවා නො දෙති, ආමිසහෙතුයෙන් ස්ථවිර භික්ෂුහු මෙහෙණන්හට ඕවා දෙති යි මෙසේ කියවු ද?

සැබැවැ භාග්‍යවතුන් වහන්ස,

භාග්‍යවත් බුදුහු ගැරහූ...කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි ස්ථවිර භික්ෂුහු මෙහෙණන්හට කළ දහම් බුහුමන් ඇති වැ ඕවා නො දෙති, ආමිසහෙතුයෙන් ස්ථවිර භික්ෂුහු මෙහෙණන්හට ඕවා දෙති යි මෙසේ කියන්නාහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... නවද මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"යම් මහණෙක් ආමිසයක් හේතු කොට ගෙන භික්ෂුහු මෙහෙණන් හට ඕවා දෙති යි මෙසේ කියන්නේ නම් පචිති වේ" යයි.**

3. යො පන: යම්, යම් බඳු... භික්ඛු... මෙ තෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**ආමිසහෙතු:** චීවරහේතුයෙන් පිණ්ඩපාත හේතුයෙන් ශයනාසන හේතුයෙන් ග්ලානප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාර හේතුයෙන් සත්කාර හේතුයෙන් ගරුකාරහේතුයෙන් මානනහේතුයෙන් වන්දන හේතුයෙන් පූජනහේතුයෙන්.

**එවං වදෙය්‍යාති:** උපසම්පන්නං සඞ්ඝෙන සම්මතං භික්ඛුනොවාදකං අවණ්ණං කත්තුකාමො අයසං කත්තුකාමො මඞ්කුකත්තුකාමො එවං වදෙති. චීවරහෙතු පිණ්ඩපාතහෙතු සෙනාසනහෙතු ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරහෙතු සක්කාරහෙතු ගරුකාරහෙතු මානනහෙතු වන්දනහෙතු පූජනහෙතු ඔවදතීති භණති ආපත්ති පාචිත්තියස්ස.

ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී එවං වදෙති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ වෙමතිකො එවං වදෙති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී එවං වදෙති ආපත්ති පාචිත්තියස්ස.

උපසම්පන්නං සඞ්ඝෙන අසම්මතං භික්ඛුනොවාදකං අවණ්ණං කත්තුකාමො අයසං කත්තුකාමො මඞ්කුකත්තුකාමො එවං වදෙති චීවරහෙතු -පෙ- පූජනහෙතු ඔවදතීති භණති ආපත්ති දුක්කටස්ස.

අනුපසම්පන්නං සඞ්ඝෙන සම්මතං වා අසම්මතං වා භික්ඛුනොවාදකං අවණ්ණං කත්තුකාමො අයසං කත්තුකාමො මඞ්කුකත්තුකාමො එවං වදෙති චීවරහෙතු පිණ්ඩපාතහෙතු සෙනාසනහෙතු ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරහෙතු සක්කාරහෙතු ගරුකාරහෙතු මානනහෙතු වන්දනහෙතු පූජනහෙතු ඔවදතීති භණති ආපත්ති දුක්කටස්ස.

අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී ආපත්ති දුක්කටස්ස.[1]

**අනාපත්ති:** පකතියා චීවරහෙතු පිණ්ඩපාතහෙතු සෙනාසනහෙතු ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරහෙතු සක්කාරහෙතු ගරුකාරහෙතු මානනහෙතු වන්දනහෙතු පූජනහෙතු ඔවදන්තං භණති. උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

ආමිසසික්ඛාපදං චතුත්ථං.

---

1. ආපත්ති - සිමු, ii

එවං වදෙය්‍ය; යනු සඞ්ඝයා විසින් සම්මත වූ මෙහෙණ ඔවා දෙන උපසපනක්හුහට ගරහනු කැමැත්තේ අයස දනවනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ මෙසේ කියයි: චීවරහේතුයෙන් පිණ්ඩපාතහේතුයෙන් ශයනාසනහේතුයෙන් ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍යපරිෂ්කාරහේතුයෙන් සත්කාරහේතුයෙන් ගරුකාරහේතුයෙන් මානනහේතුයෙන් වන්දනහේතුයෙන් පූජනහේතුයෙන් ඔවා දේ යැ යි බෙණේ නම් පචිති ඇවැත් වේ.

ධර්මකර්මයෙහි ධර්මකර්මසංඥා ඇතියේ මෙසේ කියා නම් පචිති ඇවැත් වෙයි, ධර්මකර්මයෙහි විමති ඇතියේ මෙසේ කියා නම් පචිති ඇවැත් වෙයි, ධර්මකර්මයෙහි අධර්මකර්මසංඥා ඇතියේ මෙසේ කියා නම් පචිති ඇවැත් වේ.

සඞ්ඝයා විසින් අසම්මත වූ භික්ඛුනොවාදක උපසපනක්හට ගරහනු කැමැත්තේ අයස දනවනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ මෙසේ කියයි. චීවරහේතුයෙන්...පූජනහේතුයෙන් ඔවා දේ යයි බෙණේ නම් දුකුළා ඇවැත් වේ.

සඞ්ඝයා විසින් සම්මත වූ හෝ අසම්මත වූ හෝ භික්ඛුනොවාදක අනුපසපනක්හට ගරහනු කැමැත්තේ අයස දනවනු කැමැත්තේ මකු කරනු කැමැත්තේ මෙසේ කියයි: චීවරහේතුයෙන් පිණ්ඩපාතහේතුයෙන් ශයනාසනහේතුයෙන් ග්ලානප්‍රත්‍යයභෛසජ්‍යපරිෂ්කාරහේතුයෙන් සත්කාරහේතුයෙන් ගරුකාරහේතුයෙන් මානනහේතුයෙන් වන්දනහේතුයෙන් පූජනහේතුයෙන් ඔවා දේ ය යි බෙණේ නම් දුකුළා ඇවැත් වේ.

අධර්මකර්මයෙහි ධර්මකර්මසංඥා ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අධර්මකර්මයෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. අධර්මකර්මයෙහි අධර්මකර්මසංඥා ඇතියේ නම් ඇවැත් නැති.

චීවරහේතුයෙන් පිණ්ඩපාතහේතුයෙන් ශයනාසනහේතුයෙන් ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍යපරිෂ්කාරහේතුයෙන් සත්කාරහේතුයෙන් ගරුකාරහේතුයෙන් මානනහේතුයෙන් වන්දනහේතුයෙන් පූජනහේතුයෙන් ප්‍රකෘති විසින් ඔවා දෙන්නක්හට බේණේ නම්, ඇවැත් නැති. උම්මත්තකයහට ආදිකර්මිකයහට ඇවැත් නැති.

**සිවුවැනි ආමිසශික්ෂාපද යි**

## චීවරදානසික්ඛාපදං

### 6.3.5

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සාවත්ථියං අඤ්ඤතරිස්සා විසිඛාය පිණ්ඩාය චරති අඤ්ඤතරාපි භික්ඛුනී තස්සා විසිඛාය පිණ්ඩාය චරති. අථ ඛො සො භික්ඛු තං භික්ඛුනිං එතදවොච: "ගච්ඡ භගිනි, අමුකස්මිං ඔකාසෙ භික්ඛා දීයතී"ති. සාපි ඛො එවමාහ: "ගච්ඡය්‍ය, අමුකස්මිං ඔකාසෙ භික්ඛා දීයතී"ති. තෙ අභිණ්හ දස්සනෙන සන්දිට්ඨා අහෙසුං.

2. තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස චීවරං භාජීයති. අථ ඛො සා භික්ඛුනී ඔවාදං ගන්ත්වා යෙන සො භික්ඛු තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං භික්ඛුං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතං ඛො තං භික්ඛුනිං සො භික්ඛු එතදවොච: "අයං මෙ භගිනි චීවර පටිවිංසො[1] සාදියිස්සසී"ති. ආමය්‍ය[2], දුබ්බලචීවරාම්හීති.[3] අථ ඛො සො භික්ඛු තස්සා භික්ඛුනියා චීවරං අදාසි. සොපි ඛො භික්ඛු දුබ්බලචීවරො හොති. භික්ඛූ තං භික්ඛුං එතදවොචුං: "කරොහිදනි තෙ ආවුසො චීවර"න්ති. අථ ඛො සො භික්ඛු භික්ඛූනං එතමත්ථං ආරොචෙසි.

3. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛු භික්ඛුනියා චීවරං දස්සතීති -පෙ-

සච්චං කිර ත්වං භික්ඛු භික්ඛුනියා චීවරං අදාසීති.

සච්චං භගවා.

ඤාතිකා තෙ භික්ඛු අඤ්ඤාතිකාති.

අඤ්ඤාතිකා භගවාති.

අඤ්ඤාතකො මොඝපුරිස අඤ්ඤාතිකාය න ජානාති පතිරූපං වා අප්පතිරූපං වා සන්තං වා අසන්තං වා. කථං හි නාම ත්වං මොඝපුරිස අඤ්ඤාතිකාය භික්ඛුනියා චීවරං දස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා චීවරං දදෙය්‍ය පාචිත්තිය"න්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

---

1. චීවරපටිවිංසො- ම ජසං,
2. ආමය්‍යා - මජසං, ආමය්‍යා-සිමු
3. දුබ්බලචීවරම්හීති - සිමු

# 6.3.5

## චීවරදානශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඩු සිටුහුගේ අරමෙහි වැඩැවෙසෙති. එසමයෙහි එක්තරා මහණෙක් සැවැතෙහි එක්තරා වීථියෙකැ පිඩු පිණිස හැසිරෙයි. එක්තරා මෙහෙණක් ද ඒ වීථියෙහි පිඩු පිණිස හැසිරෙයි. එකල්හි එමහණ එමෙහෙණහට මෙසේ කීය: "යා නැඟණිය, අසුවල් තෙනැ භික්ෂාව දෙනු ලැබේ"යයි ඕ ද මෙසේ කිවූ: "යා ඈයමියෙනි, අසුවල් තෙනැ භික්ෂාව දෙනු ලැබේ" යයි. ඔහු නිරතුරු දක්මෙන් දුටුමිතුරු වූහ.

2. එසමයෙහි වනාහි සඞසයාගේ සිවුරු බෙදනු ලැබෙයි. එකල්හි එමෙහෙණ අවවාදයට ගොස් එමහණ වෙත එළැඹියා ය. එළැඹැ සකසා වැඳ එකත්පසෙකැ සිටියා ය. එකත්පසෙකැ සිටි එමෙහෙණහට එමහණ මෙසේ කීය: 'නැඟණිය, මේ මගේ සිවුරු කොටස යැ. (එය) ඉවසන්නෙහි දැ යි. එසේ යැ ආයමියෙනි, දුබල සිවුරු ඇත්තියකිම් වෙමි යි. එකල්හි එමහණ එමෙහෙණහට සිවුර දුන්නේ ය. එමහණ තෙමේත් දුබල සිවුරු ඇතියේ වෙයි. භික්ෂූහු එමහණහට මෙසේ කීහු: "ඇවැත්නි, තොපගේ සිවුර දූන් කරව යි. එකල්හි ඒ මහණ මෙසේ කරුණ භික්ෂූන්හට දැන්වී ය.

3. යම් ඒ භික්ෂු කෙනෙක් අපිය් වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් මහණෙක් මෙහෙණකට සිවුරක් දෙන්නෝ දැ යි...

සැබෑ ද මහණ තෝ මෙහෙණකට සිවුරක් දුන්නෙහි දැ? යි.

සැබැවැ භාග්‍යවතුන් වහන්ස,

මහණ (එමෙහෙණ) තාගේ නෑ වූවා ද? නො නෑ වූවා දැ? යි.

භාග්‍යවතුන් වහන්ස, නො නෑ වූවා යැ.

හිස් පුරුෂය, නො නෑයෙක් නො නෑයක ගේ සුදුසු දැය නුසුදුසු දැය හෝ ඇති දැය හෝ නැති දැය හෝ නො දනී. කෙසේ නම් හිස්පුරුෂය, තෝ නොනෑ මෙහෙණකට සිවුරක් දුන්නෙහි ද? හිස් පුරුෂය, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...තව ද මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"යම් මහණෙක් නොනෑ මෙහෙණකට සිවුරක් දෙන්නේ නම් පචිති වේ" යයි.**

භාග්‍යවතුන් විසින් භික්ෂූන්හට මේ සිකපදය මෙසේ පනවන ලද්දේ වෙයි.

4. තෙන ඛො පන සමයෙන භික්ඛූ කුක්කුච්චායන්තා භික්ඛුනීනං පාරිවට්ටකං[1] චීවරං න දෙන්ති, භික්ඛුනියො උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම අය්‍යා අම්හාකං පාරිවට්ටකං චීවරං න දස්සන්ති"ති. අස්සොසුං ඛො භික්ඛූ තාසං භික්ඛුනීනං උජ්ඣායන්තීනං ඛීයන්තීනං විපාචෙන්තීනං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. "අනුජානාමි භික්ඛවෙ පඤ්චන්නං පාරිවට්ටකං දාතුං භික්ඛුස්ස භික්ඛුනියා සික්ඛමානාය සාමණෙරස්ස සාමණෙරියා. අනුජානාමි භික්ඛවෙ ඉමෙසං පඤ්චන්නං පාරිවට්ටකං දාතුං" එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

**"යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා චීවරං දදෙය්‍ය අඤ්ඤත්‍ර පාරිවට්ටකා පාචිත්තිය"න්ති.**

5. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**අඤ්ඤාතිකා** නාම: මාතිතො වා පිතිතො වා යාව සත්තමා පිතාමහයුගා අසම්බද්ධා.

**භික්ඛුනී** නාම: උභතො සඞ්ඝෙ උපසම්පන්නා.

**චීවරං** නාම: ඡන්නං චීවරානං අඤ්ඤතරං චීවරං විකප්පනූපගං පච්ඡිමං.

**අඤ්ඤත්‍ර පාරිවට්ටකාති:** ඨපෙත්වා පාරිවට්ටකං දෙති ආපත්ති පාචිත්තියස්ස.

අඤ්ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී චීවරං දෙති අඤ්ඤත්‍ර පාරිවට්ටකා ආපත්ති පාචිත්තියස්ස. අඤ්ඤාතිකාය වෙමතිකො චීවරං දෙති අඤ්ඤත්‍ර පාරිවට්ටකා ආපත්ති පාචිත්තියස්ස. අඤ්ඤාතිකාය ඤාතිකසඤ්ඤී චීවරං දෙති අඤ්ඤත්‍ර පාරිවට්ටකා ආපත්ති පාචිත්තියස්ස.

එකතො උපසම්පන්නාය චීවරං දෙති අඤ්ඤත්‍ර පාරිවට්ටකා ආපත්ති දුක්කටස්ස. ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. ඤාතිකාය වෙමතිකො ආපත්ති දුක්කටස්ස. ඤාතිකාය ඤාතිකසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** ඤාතිකාය පාරිවට්ටකං පරිත්තෙන වා විපුලං විපුලෙන වා පරිත්තං භික්ඛුනී විස්සාසං ගණ්හාති තාවකාලිකං ගණ්හාති චීවරං ඨපෙත්වා අඤ්ඤං පරික්ඛාරං දෙති සික්ඛමානාය සාමණෙරාය උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**චීවරදානසික්ඛාපදං පඤ්චමං.**

1. පාරිවත්තකං - මජසං

4. එසමයෙහි චනාහි භික්ෂූහු කුකුස්කරන්නාහු මෙහෙණන්හට පිරුළ කොට සිවුරු නො දෙති. මෙහෙණහු ලමු කොට සිතති, නුගුණ පවසති දෙස් පතුරුවත්: කෙසේ නම් ආයඨියෝ අපට පිරුළ කොට සිවුරු නොදෙන්නාහු ද යි. භික්ෂූහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මෙහෙණනගේ (අකීර්ත්තිශබ්දය) ඇසූහු. එකල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන්හට තෙල කරුණ දැන්වූහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙහි ලා මෙ අවසරයෙහි ලා දැහැමි කථා වදරා මහණුන් ඇමතූසේක: "මහණෙනි, මහණහට මෙහෙණහට සික්මනුවහට හෙරණකුහට හෙරණකහට යන පස් දෙනහට පිරුළ කොට දෙන්නට අනුදනිමි. මහණෙනි, මේ පස්දෙනහට පිරුළ කොට දෙන්නට අනුදනිමි" තව ද මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"යම් මහණෙක් නොනෑ මෙහෙණකට පිරුළ හැර සිවුරු දෙන්නේ නම් පචිති වේ"** යයි.

5. **යො පන:** යම්, යම්බඳු...**භික්ඛු**...මෙතෙමේ මේ අර්ත්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**අඤ්ඤාතිකා** නම්: මවුපසින් හෝ පියපසින් හෝ සත්වන කුලපරම්පරාව දක්වා නො සබඳ වූවා.

**භික්ඛුනී** නම්: දෙසඟුන් කෙරෙහි උපසපන් වූවා.

**චීවර** නම්: සවැදෑරුම් සිවුරු අතුරෙන් විකල්පනයට සුදුසු එක්තරා පැසුළු සිවුරෙකි.

**අඤ්ඤත්‍ර පාරිවට්ටකා:** පිරුළ හැර දේ නම් පචිති ඇවැත් වේ.

නොනෑ මෙහෙණකට නොනෑ මෙහෙණක යන සත් ඇතියේ පිරුළ හැර සිවුරු දේ නම් පචිති ඇවැත් වේ. නොනෑ මෙහෙණකට විමති ඇතියේ පිරුළ හැර සිවුරු දේ නම් පචිති ඇවැත් වේ. නොනෑ මෙහෙණකට නෑමෙහෙණකැ යි සත් ඇතියේ පිරුළ හැර සිවුරු දේ නම් පචිති ඇවැත් වේ.

මෙහෙණ සඟුන් කෙරෙහි උපසපන් වූවකට පිරුළ හැර සිවුරු දේ නම් දුකුළ ඇවැත් වේ. නෑමෙහෙණකට නොනෑ සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. නෑමෙහෙණකට විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. නෑමෙහෙණකට නෑමෙහෙණකැ යි සත් ඇතියේ නම් ඇවැත් නැති.

නෑමෙහෙණකට, මඳ අගය ඇතියෙකින් මහ ඇඟි පිරුළවක් හෝ මහ ඇඟියෙකින් මඳ අගය ඇති පිරුළවක් හෝ මෙහෙණක් විස්වස් වැ ගනී නම්, තවුකැලි වැ ගනී නම්, සිවුරු තබා අන් පිරිකරක් දේ නම් සික්මනුවහට, හෙරණිහට දේ නම් ඇවැත් නැති උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**පස් වැනි චීවරදානශික්ෂාපද යි**

## 6.3.6

## චීවරසිබ්බනසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ **අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **උදායී** පට්ටො[1] හොති චීවරකම්මං කාතුං. අඤ්ඤතරා භික්ඛුනී යෙනායස්මා උදායී තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා ආයස්මන්තං උදායිං එතදවොච: "සාධු මෙ භන්තෙ, අය්‍යො චීවරං සිබ්බතූ"ති. අථ ඛො ආයස්මා උදායී තස්සා භික්ඛුනියා චීවරං සිබ්බිත්වා සුරත්තං සුපරිකම්මකතං කත්වා මජ්ඣෙ පටිභානචිත්තං වුට්ඨාපෙත්වා සංහරිත්වා නික්ඛිපි.

2. අථ ඛො සා භික්ඛුනී යෙනායස්මා උදායී තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං උදායිං එතදවොච: "කතං තං භන්තෙ, චීවර"න්ති "හන්ද භගිනි, ඉමං චීවරං යථාසංහටං හරිත්වා නික්ඛිපිත්වා යද භික්ඛුනි සඞ්ඝො ඔවාදං ආගච්ඡති තද ඉමං චීවරං පාරුපිත්වා භික්ඛුනීසඞ්ඝස්ස පිට්ඨිතො පිට්ඨිතො ආගච්ඡා"ති.

3. අථ ඛො සා භික්ඛුනී තං චීවරං යථාසංහටං හරිත්වා නික්ඛිපිත්වා යද භික්ඛුනීසඞ්ඝො ඔවාදං ආගච්ඡති, තද තං චීවරං පාරුපිත්වා භික්ඛුනී සඞ්ඝස්ස පිට්ඨිතො පිට්ඨිතො ආගච්ඡති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "යාව ඡින්නිකා ඉමා භික්ඛුනියො ධුත්තිකා අහිරිකායො යත්‍ර හි නාම චීවරෙ පටිභානචිත්තං වුට්ඨාපෙස්සන්තී"ති. භික්ඛුනියො එවමාහංසු: "කස්සිදං කම්ම"න්ති. අය්‍යස්ස උදායිස්සාති, යෙපි තෙ ඡින්නකා ධුත්තකා[2] අහිරිකා තෙසම්පි එවරූපං න සොභෙය්‍ය කිං පන අය්‍යස්ස උදායිස්සාති.

4. අථ ඛො තා භික්ඛුනියො භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං: යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම ආයස්මා උදායි භික්ඛුනියා චීවරං සිබ්බිස්සතී"ති -පෙ-

"සච්චං කිර ත්වං උදායි භික්ඛුනියා චීවරං සිබ්බසී"ති

සච්චං භගවාති.

ඤාතිකා තෙ උදායි අඤ්ඤාතිකාති.

අඤ්ඤාතිකා භගවාති.

---

1. පට්ඨො - මජසං

2. ඡින්නිකා ධුත්තිකා - සිමු

## 6.3.6

## චීවරසිබ්බනශික්‍ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර අනේපිඬු සිටුහුගේ දෙව්රම් වෙහෙරෙහි වැඩැ වෙසෙති. එසමයෙහි ආයුෂ්මත් උදයී තෙරණුවෝ සිවුරුකම් කිරීමට සමත් වෙති. එක්තරා මෙහෙණක් ආයුෂ්මත් උදයී තෙරුන් වෙත එළැඹියා යැ. එළැඹැ ආයුෂ්මත් උදයී තෙරුන්හට තෙල කිවු යැ වහන්ස, ආයඝියන් වහන්සේ මට සිවුරක් මසන්නාහු මැනැවැ යි. එකල්හි ආයුෂ්මත් උදයී තෙරණුවෝ එමෙහෙණහට සිවුරක් මසා මොනවට රජන් කොට මොනවට පිරියම් කොට මැද ප්‍රතිභානචිත්‍රයක් නංවා හකුළවා තැබූහ.

2. එකල්හි එමෙහෙණ ආයුෂ්මත් උදයී තෙරුන් වෙත එළැඹියා යැ. එළැඹැ ආයුෂ්මත් උදයී තෙරුන්හට තෙල කිවු ය. වහන්ස, ඒ සිවුරු කරන ලද ද යි. ''නැහණිය, මේ සිවුර හැකුළු වන මැ ගෙන ගොස් මෙහෙණසඟ යම් දිනෙකැ අවවාදයට යේ නම් එදින මේ සිවුර පෙරෙව මෙහෙණ සඟහු පිටුපසින් එව''යි.

3. එකල්හි ඒ මෙහෙණ ඒ සිවුර හැකුළු වන මැ ගෙන ගොස් බහා තබා යම් දිනෙකැ මෙහෙණසඟ අවවාදයට යේ නම් එදින ඒ සිවුර පෙරෙව මෙහෙණසඟහු පිටුපසින් පිටුපසින් යෙයි. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: මේ මෙහෙණහු සුන්ඹතප් ඇතියහ, ධූර්තයහ, විළි නැතියහ. යම්බඳු සිවුරෙක්හි ප්‍රතිභාන චිත්‍රයක් නංවාලූහු ද යි. මෙහෙණහු මේ කවරක්හුගේ කර්මයෙක් ද යි මෙසේ කීහු. ආයඝී උදයීහුගේ යි. යම්බඳු කෙනෙක් සුන්ඹතප් ඇතියාහු ධූර්ත වූවාහු විළි නැතියාහු වෙද්ද ඔවුනට ද මෙබන්දක් නො හොබනේ යැ. ආයඝී උදයීතෙරුන්හට කිම හොබනේ ද යි.

4. එකල්හි ඒ භික්ෂුණීහු මහණුන්හට තෙල කරුණ දන්වූහ. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් ආයුෂ්මත් උදයී මෙහෙණකට සිවුරක් හිවී ද යි...

සැබැ ද උදයී, තෝ මෙහෙණකට සිවුරක් හිවීයෙහි ද යි.

සැබැවැ භාග්‍යවතුන් වහන්ස,

උදයී, (එ මෙහෙණ) තාගේ නෑ වූවා ද නොනෑ වූවා ද යි.

භාග්‍යවතුන් වහන්ස, නොනෑ වූවා යැ.

අඤ්ඤාතකො මොඝපුරිස අඤ්ඤාතිකාය න ජානාති පතිරූපං වා අප්පතිරූපං වා පාසාදිකං වා අපාසාදිකං වා. කථං හි නාම ත්වං මොඝපුරිස අඤ්ඤාතිකාය භික්ඛුනියා චීවරං සිබ්බිස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**''යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා චීවරං සිබ්බෙය්‍ය වා සිබ්බාපෙය්‍ය වා පාචිත්තිය''න්ති.**

5. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**අඤ්ඤාතිකා** නාම: මාතිතො වා පිතිතො වා යාව සත්තමා පිතාමහයුගා අසම්බද්ධා.

**භික්ඛුනී** නාම: උභතො සඞ්ඝෙ උපසම්පන්නා.

**චීවරං** නාම: ඡන්නං චීවරානං අඤ්ඤතරං චීවරං.

**සිබ්බෙය්‍යාති:** සයං සිබ්බති ආරග්ගෙ ආරග්ගෙ ආපත්ති පාචිත්තියස්ස.

**සිබ්බාපෙය්‍යාති:** අඤ්ඤං ආණාපෙති. ආපත්ති පාචිත්තියස්ස. සකිං ආණත්තො බහුකම්පි සිබ්බති ආපත්ති පාචිත්තියස්ස.

අඤ්ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී චීවරං සිබ්බති වා සිබ්බාපෙති වා ආපත්ති පාචිත්තියස්ස. අඤ්ඤාතිකාය වෙමතිකො චීවරං සිබ්බති වා සිබ්බාපෙති වා ආපත්ති පාචිත්තියස්ස. අඤ්ඤාතිකාය ඤාතිකසඤ්ඤී චීවරං සිබ්බති වා සිබ්බාපෙති වා ආපත්ති පාචිත්තියස්ස.

එකතො උපසම්පන්නාය චීවරං සිබ්බති වා සිබ්බාපෙති වා ආපත්ති දුක්කටස්ස. ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. ඤාතිකාය වෙමතිකො ආපත්ති දුක්කටස්ස. ඤාතිකාය ඤාතිකසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** ඤාතිකාය චීවරං ඨපෙත්වා අඤ්ඤං පරික්ඛාරං සිබ්බති වා සිබ්බාපෙති වා සික්ඛමානාය සාමණෙරියා උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**චීවරසිබ්බනසික්ඛාපදං ඡට්ඨං**

හිස් පුරුෂය, නොනැයෙක් නොනැ මෙහෙණකට සුදුසු දය හෝ නුසුදුසු දය හෝ මනාපය හෝ අමනාපය හෝ නොදනී. හිස් පුරුෂය, කෙසේ නම් තෝ නොනැ මෙහෙණකට සිවුරක් මැසූයෙහි ද යි. හිස් පුරුෂය මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...තව ද මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"යම් මහණෙක් නො නෑ මෙහෙණකට සිවුරක් මසන්නේ නම් හෝ මස්වන්නේ නම් හෝ පචිති වේ"** යයි.

5. **යො පන** යනු: යම්, යම්බඳු ... **භික්ෂු** ... මේ තෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**අඤ්ඤාතිකා** නම්: මවුපසින් හෝ පියපසින් හෝ සත්වන කුලපරවිට්ය දක්වා නො සබඳ වූවා.

**භික්ඛුනී** නම්: දෙසඟුන් කෙරෙහි උපසපන් වූවා.

**චීවර** නම්: සවැදෑරුම් සිවුරු අතුරෙන් එක්තරා සිවුරෙකි.

**සිබ්බෙය්‍ය:** තෙමේ මසා නම් හිදි මගක් පාසා පචිති ඇවැත් වේ.

**සිබ්බාපෙය්‍ය:** අනෙකක්හු අණවා නම් පචිති ඇවැත් වේ. වරක් අණවන ලදුයේ බොහෝවරකුදු මසා නම් පචිති ඇවැත් වේ.

නොනැ මෙහෙණක කෙරෙහි නොනැ සත් ඇතියේ සිවුරක් හිවා නම් හෝ හිවවා නම් හෝ පචිති ඇවැත් වෙයි. නොනැ මෙහෙණක කෙරෙහි විමති ඇතියේ සිවුරක් හිවා නම් හෝ හිවවා නම් හෝ පචිති ඇවැත් වෙයි. නොනැ මෙහෙණක කෙරෙහි නැමෙහෙණකැ යි සත් ඇතියේ සිවුරක් හිවා නම් හෝ හිවවා නම් හෝ පචිති ඇවැත් වේ.

මෙහෙණ සඟුන් කෙරෙහි උපසපන් වූවකට සිවුරක් මසා නම් හෝ මස්වා නම් හෝ දුකුළා ඇවැත් වේ. නැමෙහෙණක කෙරෙහි නොනැ සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. නැමෙහෙණක කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. නැමෙහෙණක කෙරෙහි නැමෙහෙණකැ යි සත් ඇතියේ නම් ඇවැත් නැති.

නැමෙහෙණකට සිවුරක් හැර අන් පිරිකරක් හිවා නම් හෝ හිවවා නම් හෝ, ඇවැත් නැත. සික්මනුවට, හෙරණියට, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**සවැනි චීවරසිබ්බනශික්ෂාපද යි**

## 6.3.7

## සංවිධානසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුනීහි සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: " යථෙව මයං සපජාපතිකා ආහිණ්ඩාම එවමෙවිමෙ සමණා සක්‍යපුත්තියා භික්ඛුනීහි සද්ධිං ආහිණ්ඩන්ති'' ති.

2. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුනීහි සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජිස්සන්ති''ති -පෙ-

සච්චං කිර තුම්හෙ භික්ඛවෙ භික්ඛුනීහි සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජථාති.

සච්චං භගවා.

විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා භික්ඛුනීහි සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජිස්සථ,නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු භික්ඛුනියා සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය අන්තමසො ගාමන්තරම්පි පාචිත්තිය''න්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

3. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ ච භික්ඛුනියො ච සාකෙතා සාවත්ථිං[1]. අද්ධානමග්ගං පටිපන්නා හොන්ති. අථ ඛො තා භික්ඛුනියො තෙ භික්ඛූ එතදවොචුං: මයම්පි අය්‍යෙහි සද්ධිං ගමිස්සාමා''ති. න භගිනී කප්පති භික්ඛුනියා සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජිතුං තුම්හෙ වා පඨමං ගච්ඡථ මයං වා ගමිස්සාමාති. අය්‍යා භන්තෙ අග්ගපුරිසා අය්‍යාව පඨමං ගච්ඡන්තූති.

1. සාවත්ථියං - සී.මු.

## 6.3.7

## සංවිධානශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩැවෙසෙති. එසමයෙහි සවග මහණහු මෙහෙණන් සමඟ කථා කොටගෙන එක් වැ අදන්මඟට පිළිපදිත්. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ කියති, දෙස් පතුරුවත්: යම්සේ ඇපි අඹුන් සහිත වැ ඇවිදිමු නම් එසේ මැ මේ ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ ද මෙහෙණන් සමඟ ඇවිදුනාහ යි.

2. භික්ෂූහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ කියති, දෙස් පතුරුවත්: "කෙසේ නම් සවග මහණහු මෙහෙණන් සමඟ කථා කොටගෙන එක් වැ අදන්මගට පිළිපන්නාහු ද යි...

සැබෑ ද මහණෙනි, තෙපි මෙහෙණන් සමඟ සංවිධානය කොට ගෙන එක් වැ අදන්මගට පිළිපදිවූ ද යි.

සැබැවැ භාග්‍යවතුන් වහන්ස,

භාග්‍යවත් බුදුහු ගැරහූ...කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි මෙහෙණන් සමඟ නියම කොටගෙන එක් වැ අදන්මගට පිළිපන්නු ද යි. හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... තව ද මහණෙනි, මෙසේත් මේ සිකපදය උදෙසවු:

**"යම් මහණෙක් මෙහෙණක හා සමඟ කථා කොටගෙන යටත් පිරිසෙයින් අන්ගමකටදු (යනුවට) එක් වැ අදන් මඟට පිළිපන්නේ නම් පචිති වේ" යයි.**

මෙසේ භාග්‍යවතුන් විසින් භික්ෂූන්ට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

3. එසමයෙහි බොහෝ භික්ෂූහු ද භික්ෂුණීහු ද සාකෙතයෙන් සැවැතට යන අදන්මගට පිළිපන්නාහු වෙති. එකල්හි ඒ භික්ෂුණීහු ඒ භික්ෂූන්ට මෙය කීහු: "ඇපිදු ආයර්‍යයන් සමඟ යම්හ" යි. නැඟණියනි, මෙහෙණක හා සමඟ කථාකොට ගෙන එක් වැ අදන් මඟට පිළිපදින්නට නො කැප යැ. තෙපි හෝ පෙරාතු වැ යවු. ඇපි හෝ යම්හ යි. වහන්ස, ආයර්‍යයෝ අග්‍රපුරුෂයෝ යැ. ආයර්‍යයෝ මැ පෙරාතු වැ යෙත්වා යි.

4. අථ ඛො තාසං භික්ඛුනීනං පච්ඡා ගච්ඡන්තීනං අන්තරාමග්ගෙ චොරා අච්ඡින්දිංසු චෙව[1] දූසෙසුඤ්ච. අථ ඛො තා භික්ඛුනියො සාවත්ථිං ගන්ත්වා භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසුං. භික්ඛුනියො භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. අනුජානාමි භික්ඛවෙ සත්ථගමනීයෙ මග්ගෙ සාසඞ්කසම්මතෙ සප්පටිභයෙ භික්ඛුනියා සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජිතුං'' එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**''යො පන භික්ඛු භික්ඛුනියා සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය අන්තමසො ගාමන්තරම්පි අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං. තත්ථායං සමයො සත්ථගමනීයො හොති මග්ගො, සාසඞ්කසම්මතො, සප්පටිභයො අයං තත්ථ සමයො''ති.**

5. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**භික්ඛුනී** නාම: උභතො සඞ්ඝෙ උපසම්පන්නා.

**සද්ධින්ති:** එකතො.

**සංවිධායාති:** ගච්ඡාම භගිනි ගච්ඡාමය්‍ය, ගච්ඡාමය්‍ය ගච්ඡාම භගිනි අජ්ජ වා හිය්‍යො වා පරෙ වා ගච්ඡාමාති සංවිදහති ආපත්ති දුක්කටස්ස.

**අන්තමසො ගාමන්තරම්පීති:** කුක්කුටසම්පාතෙ[2] ගාමෙ ගාමන්තරෙ ගාමන්තරෙ ආපත්ති පාචිත්තියස්ස. අගාමකෙ අරඤ්ඤෙ අද්ධයොජනෙ අද්ධයොජනෙ ආපත්ති පාචිත්තියස්ස.

**අඤ්ඤත්‍ර සමයාති:** ඨපෙත්වා සමයං. **සත්ථගමනීයො** නාම: මග්ගො න සක්කා හොති විනා සත්ථෙන ගන්තුං.

**සාසඞ්කං** නාම: තස්මිං මග්ගෙ චොරානං නිවිට්ඨොකාසො දිස්සති භුත්තොකාසො දිස්සති ඨිතොකාසො දිස්සති නිසින්නොකාසො දිස්සති නිපන්නොකාසො දිස්සති.

1. අච්ඡින්දිංසුච - මජසං
2. කුක්කුටසම්පාදෙ - සිමු

4. එකල්හි පසු වැ යන්නා වූ ඒ මෙහෙණන්ට අනදර කොට අතර මගැ සොරු (පා සිවුරු) අසිදගැත්ම ද කළහ. දූෂණ ද කළහ. එකල්හි ඒ මෙහෙණහු සැවැතට ගොස් මෙහෙණන්ට තෙල කරුණ දැන්වූහ, මෙහෙණහු මහණුන්ට තෙල කරුණ දැන්වූහ. මහණහු භාග්‍යවතුන්ට තෙල කරුණ දැන්වූහු. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙහි ලා මෙ අවසරයෙහි ලා දැහැමි කථා කොට මහණුන් ඇමතූසේක: "මහණෙනි, සැක සහිත යැ යි දන්නා ලද බිය සහිත වූ සාර්ථයක් හා සමඟ යා යුතු මඟෙකැ මෙහෙණක හා සමඟ කථා කොට ගෙන එක් වැ අදන්මඟට පිළිපදනට අනුදනිමි." තව ද මහණෙනි, මෙසේත් මෙ සිකපදය උදෙසවූ:

**"යම් මහණෙක් මෙහෙණක හා සමඟ කථා කොටගෙන යටත් පිරිසෙයින් අන්ගමකට ද (යනුවට) සුදුසු සමය තබා එක් වැ අදන්මඟට පිළිපදනේ නම් පචිති වේ. එහි මේ සුදුසු සමය යි: සාර්ථයක් හා යා යුතු වූ මාර්ගය වෙයි, සැක සහිත යැ යි සම්මත වෙයි, බිය සහිත වේ, මේ එහි සමය යි".**

5. **යොපන** යනු: යම්, යම්බඳු...**භික්ඛු**...මෙතෙම මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**භික්ඛුනී** නම්: දෙසඟුන් කෙරෙහි උපසපන් වූවා.

**සද්ධිං** යනු: එක් වැ.

**සංවිධාය** යනු: "යමු බුහුන යමු ආයර්‍ය, යමු ආයර්‍ය යමු බුහුන, අද හෝ හෙට හෝ තෙවන ද හෝ යමු"යි සංවිධාන කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

**අන්තමසො ගාමන්තරම්පි** යනු: කුක්කුට සම්පාත (පියස්සෙන් පියස්සට කුකුළකුට ඉගිළැ යා හැකි) ගම්හි ගමක් ගමක් පාසා පචිති ඇවැත් වේ. ගමක් නො වන අරන්හි නම් අඩයොදුනෙහි අඩයොදුනෙහි පචිති ඇවැත් වේ.

**අඤ්ඤත්‍ර සමයා** යනු: සුදුසු සමය තබා.

**සත්ථගමනීය** නම්: මාර්ගය ගැල්සාත්තුවෙන් තොර වැ යන්නට නො හැකි වෙයි.

**සාසඞ්ක** නම්: ඒ මාර්ගයෙහි සොරුන් පිවිසිතැන් පැනෙයි, අහර ගත් තැන් පැනෙයි, සිටිතැන් පැනෙයි, හුන්තැන් පැනෙයි, හොත් තැන් පැනෙයි.

**සප්පටිභයං** නාම: තස්මිං මග්ගෙ චොරෙහි මනුස්සා හතා දිස්සන්ති විලුත්තා දිස්සන්ති ආකොටිතා දිස්සන්ති සප්පටිභයං ගන්ත්වා අප්පටිභයං පස්සිත්වා[1] උය්‍යොජෙතබ්බා ගච්ඡථ භගිනියොති.

සංවිදහිතෙ සංවිදහිතසඤ්ඤී එකද්ධානමග්ගං පටිපජ්ජති අන්තමසො ගාමන්තරම්පි අඤ්ඤත්‍ර සමයා ආපත්ති පාචිත්තියස්ස. සංවිදහිතෙ වෙමතිකො එකද්ධානමග්ගං පටිපජ්ජති අන්තමසො ගාමන්තරම්පි අඤ්ඤත්‍ර සමයා ආපත්ති පාචිත්තියස්ස. සංවිදහිතෙ අසංවිදහිතසඤ්ඤී එකද්ධානමග්ගං පටිපජ්ජති අන්තමසො ගාමන්තරම්පි අඤ්ඤත්‍ර සමයා ආපත්ති පාචිත්තියස්ස.

භික්ඛු සංවිදහති භික්ඛුනී න සංවිදහති ආපත්ති දුක්කටස්ස. අසංවිදහිතෙ සංවිදහිතසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අසංවිදහිතෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අසංවිදහිතෙ අසංවිදහිතසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** සමයෙ අසංවිදහිත්වා ගච්ඡන්ති[2] භික්ඛුනී සංවිදහති භික්ඛු න සංවිදහති විසඞ්කෙතෙන ගච්ඡන්ති ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

සංවිධානසික්ඛාපදං සත්තමං.

## 6. 3. 8

## නාවාභිරූහන සික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුනීහි සද්ධිං සංවිධාය එකං නාවං[3] අභිරූහන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති යථෙව මයං සපජාපතිකා නාවාය[4] කීළාම එවමෙවිමෙ සමණා සක්‍යපුත්තියා භික්ඛුනීහි සද්ධිං සංවිධාය එකාය නාවාය කීළන්තී ති.

2. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුනීහි සද්ධිං සංවිධාය එකං නාවං අභිරූහිස්සන්තී"ති -පෙ-

---

1. දස්සෙත්වා - මජසං, දස්සිත්වා
2. ගච්ඡති - මජසං
3. එකනාවං - සයා
4. එකනාවාය - සයා

**සප්පටිභය** නම්: ඒ මාර්ගයෙහි සොරුන් විසින් නසන ලද මිනිස්සු පැනෙති. වොලොගන්නා ලදහු පැනෙති. කොළන ලද්දහු පැනෙත්. ප්‍රතිභය සහිත මග ගොස් ප්‍රතිභය රහිත මහ දකැ යවු නැහණියනැ''යි නහා යැවියයුත්තාහු ය.

සංවිදහිතයෙහි සංවිදහිතසංඥා ඇතියේ යටත්පිරිසෙයින් ග්‍රාමාන්තරයකුදු සුදුසු සමය තබා එක් වැ අදන්මගට බසී නම් පචිති ඇවැත්-වෙයි, සංවිදහිතයෙහි විමති ඇතියේ යටත් පිරිසෙයින් ග්‍රාමාන්තරයකුදු සුදුසු සමය තබා එක් වැ අදන් මහට බසී නම් පචිති ඇවැත් වෙයි, සංවිදහිතයෙහි අසංවිදහිතසංඥා ඇතියේ යටත් පිරිසෙයින් ග්‍රාමාන්තරයකුදු සුදුසු සමය තබා එක් වැ අදන් මහට බසී නම් පචිති ඇවැත් වේ.

මහණ සංවිධාන කෙරේ නම් මෙහෙණ සංවිධාන නො කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි, අසංවිදහිතයෙහි සංවිදහිතසංඥා ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි, අසංවිදහිතයෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි, අසංවිදහිතයෙහි අසංවිදහිතසඥා ඇතියේ නම් ඇවැත් නැති.

සුදුසු සමයෙහි සංවිධාන නො කොට යෙත් නම්, මෙහෙණ සංවිධාන කෙරේ නම් මහණ සංවිධාන නො කෙරේ නම්, කාලවිසඞකෙතයෙන් යෙත් නම් ඇවැත් නැති ආපදවන්හි, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**සත්වැනි සංවිධානශික්ෂාපද යි**

## 6.3.8

## නාවාභිරූහනශික්ෂාපදය

1. **එසමයෙහි** භාග්‍යවත් බුදුහු **සැවැත් නුවර ජේතවන** නම් වූ **අනේපිඩු සිටුහුගේ** අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි සවග මහණහු මෙහෙණන් සමහ කථා කොටගෙන එක් නැවකට නැඟෙති. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ කියති, දෙස් පතුරුවත්: යම්සේ මැ ඇපි අඹුන් සහිත වූවමෝ නැවෙහි කෙළිමු ද එසේ මැ මේ සැසිපුත් මහණහු මෙහෙණන් සමහ කථා කොටගෙන එක් නැවෙහි කෙළිති යි.

2. භික්ෂූහු ලමු කොට සිතන නුගුණ කියන දෙස් පතුරුවන ඒ මිනිසුන් ගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් සවග මහණහු මෙහෙණන් සමහ කථාකොට ගෙන එක් නැවකට නැඟී ගියාහු ද යි ...

සච්චං කිර තුම්හෙ භික්ඛවෙ භික්ඛුනීහි සද්ධිං සංවිධාය එකං නාවං අභිරුහථාති.

සච්චං භගවා.

විගරහි බුද්ධො භගවා - පෙ - කථං හි නාම තුම්හෙ මොඝපුරිසා භික්ඛුනීහි සද්ධිං සංවිධාය එකං නාවං අභිරුහිස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය - පෙ - එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ :

**''යො පන භික්ඛු භික්ඛුනියා සද්ධිං සංවිධාය එකං නාවං අභිරුහෙය්‍ය උද්ධගාමිනිං වා අධොගාමිනිං වා පාචිත්තිය''න්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

3. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ ච භික්ඛුනියො ච සාකෙතා සාවත්ථිං අද්ධානමග්ගං පටිපන්නා හොන්ති, අන්තරාමග්ගෙ නදී තරිතබ්බා[1] හොති. අථ ඛො තා භික්ඛුනියො තෙ භික්ඛූ එතදවොචුං: ''මයම්පි අය්‍යෙහි සද්ධිං උත්තරිස්සාමා''ති. න භගිනි කප්පති භික්ඛුනියා සද්ධිං සංවිධාය එකං නාවං අභිරුහිතුං. තුම්හෙ වා පඨමං උත්තරථ මයං වා උත්තරිස්සාමාති. අය්‍යා භන්තෙ අග්ගපුරිසා අය්‍යාව පඨමං උත්තරන්තූති.

4. අථ ඛො තාසං භික්ඛුනීනං පච්ඡා උත්තරන්තීනං චොරා අච්ඡින්දිංසු චෙව දූසෙසුඤ්ච. අථ ඛො තා භික්ඛුනියො සාවත්ථිං ගන්ත්වා භික්ඛුනීනං එතමත්ථං ආරොචෙසුං. භික්ඛුනියො භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. අනුජානාමි භික්ඛවෙ තිරියං තරණාය භික්ඛුනියා සද්ධිං සංවිධාය එකං නාවං අභිරුහිතුං'' එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**''යො පන භික්ඛු භික්ඛුනියා සද්ධිං සංවිධාය එකං නාවං අභිරුහෙය්‍ය උද්ධගාමිනිං[2] වා අධොගාමිනිං වා අඤ්ඤත්‍ර තිරියං තරණාය පාචිත්තිය''න්ති.**

---

1. උත්තරිතබ්බා - සයා
2. උද්ධංගාමිනිං - මජසං.

සැබෑ ද මහණෙනි, තෙපි මෙහෙණන් සමඟ කථා කොටගෙන එක් නැවකට නැගී ගියාහු දැ යි.

සැබෑව භාග්‍යවතුන් වහන්ස,

භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි මෙහෙණන් හා සමඟ බැණ ගෙන එක් නැවකට නැඟී ගියාහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... **මෙසේ** ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**"යම් මහණෙක් මෙහෙණක හා සමඟ බැණ ගෙන උඩුගං බලා යන්නා වූ හෝ යටිගං බලා යන්නා වූ හෝ එක් නැවකට නැඟ යන්නේ නම් පචිති වේ" යයි.**

තවද භාග්‍යවතුන් විසින් භික්ෂූන්ට මෙසේත් මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

3. එසමයෙහි වනාහි බොහෝ භික්ෂූහු ද භික්ෂුණීහු ද සාකෙතයෙන් සැවතට යන අද්දන්මගට පිළිපන්නාහු වෙති. අතර මඟැ තරණය කළයුතු ගඟෙක් වෙයි. එකල්හි ඒ භික්ෂුණීහු ඒ භික්ෂූන්ට මෙය කීහු: "ඇපිදු ආර්‍ය්‍යයන් හා සමඟ එතරවම්හ"යි නැඟණියනි, මෙහෙණක හා සමග නියම කොටගෙන එක් නැවක නැඟැ යන්නට නො කැප යැ. තෙපි හෝ පෙරාතු වැ එතර වවු. ඇපි හෝ එතර වම්හ යි. වහන්ස, ආර්‍ය්‍යයෝ අග්‍රපුරුෂයෝ යැ ආර්‍ය්‍යයෝ මැ පෙරාතු වැ එතර වෙත්වා යි.

4. එකල්හි පසුවැ එතරවන්නා වූ ඒ මෙහෙණන්ට අනදර කොට සොරු (පා සිවුරු) අසිද ගත්හ. දූෂණ ද කළහ. එකල්හි ඒ මෙහෙණු සැවැතට ගොස් මෙහෙණන්ට තෙල කරුණ දැන්වූහ. මෙහෙණු මහණුන්හට තෙල කරුණ දැන්වූහ. මහණහු භාග්‍යවතුන්ට තෙල කරුණ දැන්වූහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ කරුණෙහි ලා මේ අවසරයෙහි ලා දැහැමි කථා කොට මහණුන් ඇමතූ සේක. "මහණෙනි, සරසින් එතරවනු පිණිස මෙහෙණක හා සමඟ බැණ ගෙන එක් නැවක නැඟ යන්නට අනුදනිමි" මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"යම් මහණෙක් මෙහෙණක හා සමඟ බැණගෙන උඩුගං බලා යන්නා වූ හෝ යටිගං බලා යන්නා වූ හෝ එක් නැවකට සරසින් එතරවීමක් හැර නගින්නේ නම් පචිති වේ" යයි.**

5. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛුනීති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛුනී.

**භික්ඛුනී** නාම; උභතො සඞ්ඝෙ උපසම්පන්නා.

**සද්ධින්ති:** එකතො.

**සංවිධායාති:** අභිරූහාම භගිනි අභිරූහාමය්‍ය, අභිරූහාමය්‍ය අභිරූහාම භගිනි, අජ්ජ වා හීයො වා පරෙ වා අභිරූහාමාති සංවිදහති ආපත්ති දුක්කටස්ස. භික්ඛුනියා අභිරූළ්හෙ භික්ඛු අභිරූහති ආපත්ති පාචිත්තියස්ස. භික්ඛු[1] අභිරූළ්හෙ භික්ඛුනී අභිරූහති ආපත්ති පාචිත්තියස්ස. උභො වා අභිරූහන්ති ආපත්ති පාචිත්තියස්ස.

**උද්ධගාමිනින්ති:** උජ්ජවනිකාය.

**අධොගාමිනින්ති;** ඔජවනිකාය.

**අඤ්ඤත්‍ර තිරියං තරණායාති:** ඨපෙත්වා තිරියං තරණං.

කුක්කුටසම්පාතෙ ගාමෙ ගාමන්තරෙ ගාමන්තරෙ ආපත්ති පාචිත්තියස්ස. අගාමකෙ අරඤ්ඤෙ අද්ධයොජනෙ අද්ධයොජනෙ ආපත්ති පාචිත්තියස්ස. සංවිදහිතෙ සංවිදහිතසඤ්ඤී එකං නාවං අභිරූහති උද්ධගාමිනිං වා අධොගාමිනිං වා අඤ්ඤත්‍ර තිරියං තරණාය ආපත්ති පාචිත්තියස්ස. සංවිදහිතෙ වෙමතිකො එකං නාවං අභිරූහති උද්ධගාමිනිං වා අධොගාමිනිං වා අඤ්ඤත්‍ර තිරියං තරණාය ආපත්ති පාචිත්තියස්ස. සංවිදහිතෙ අසංවිදහිතසඤ්ඤී එකං නාවං අභිරූහති උද්ධගාමිනිං වා අධොගාමිනිං වා අඤ්ඤත්‍ර තිරියං තරණාය ආපත්ති පාචිත්තියස්ස.

භික්ඛු සංවිදහති භික්ඛුනී න සංවිදහති ආපත්ති දුක්කටස්ස. අසංවිදහිතෙ සංවිදහිතසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අසංවිදහිතෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අසංවිදහිතෙ අසංවිදහිතසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති;** තිරියං තරණාය අසංවිදහිත්වා අභිරූහන්ති භික්ඛුනී සංවිදහති භික්ඛු න සංවිදහති විසංකෙතෙන අභිරූහන්ති ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**නාවාභිරූහනසික්ඛාපදං අට්ඨමං.**

---

1. භික්ඛුම්හි-මජසං, සිමු

5. **යො පන** යනු: යම්, යම්බඳු... **භික්ඛු** යනු ... මෙතෙම මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**භික්ඛුනි** නම්: දෙසඟුන් කෙරෙහි උපසපන්වූවා.

**සද්ධිං** යනු: එක් ව.

**සංවිධාය** යනු: නැගෙමු බුහුනැ නැගෙමු ආයර්‍ය, නැගෙමු ආයර්‍ය නැගෙමු බුහුනැ, අද හෝ හෙට හෝ තෙවනද හෝ නැගෙමු යි සංවිධාන කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි, මෙහෙණ නැඟි කල්හි මහණ නඟී නම් පචිති ඇවැත් වෙයි, මහණහු නැඟි කල්හි මෙහෙණ නඟී නම් පචිති ඇවැත් වෙයි, දෙදෙන මැ හෝ නඟිත් නම් පචිති ඇවැත් වේ.

**උද්ධගාමිනිං** යනු: උඩුගං බලා යන නැවෙකැ.

**අධොගාමිනිං** යනු; යටිගං බලා යන නැවෙකැ.

**අඤ්ඤත්‍ර තිරියං තරණාය** යනු: සරසින් එතරවීම හැර

කුක්කුටසම්පාත ගම්හි ගමක් පාසා පචිති ඇවැත් වෙයි. ගමක් නො වන අරණ්‍යයෙහි නම් අඩයොදුනෙහි අඩයොදුනෙහි පචිති ඇවැත් වෙයි, සංවිදහිතයෙහි සංවිදහිතසංඥා ඇතියේ උඩුගං බලා යන්නා වූ හෝ යටිගං බලා යන්නා වූ හෝ එක් නැවකට සරසින් එතරවීමක් හැර නැගේ නම් පචිති ඇවැත් වෙයි, සංවිදහිතයෙහි විමති ඇතියේ උඩුගං බලා යන්නා වූ හෝ යටිගං බලා යන්නා වූ හෝ එක් නැවකට සරසින් එතරවීමක් හැර නැගේ නම් පචිති ඇවැත් වෙයි, සංවිදහිතයෙහි අසංවිදහිතසංඥා ඇතියේ උඩුගං බලා යන්නා වූ හෝ යටිගං බලා යන්නා වූ හෝ එක් නැවකට සරසින් එතරවීමක් හැර නැගේ නම් පචිති ඇවැත් වේ.

මහණ සංවිධාන කෙරේ නම් මෙහෙණ සංවිධාන නො කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි, අසංවිදහිතයෙහි සංවිදහිතසංඥා ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි, අසංවිදහිතයෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි, අසංවිදහිතයෙහි අසංවිදහිතසංඥා ඇතියේ නම් ඇවැත් නැති.

සරසින් එතරවීමෙහි සංවිධාන නො කොට නැගෙත් නම් මෙහෙණ සංවිධාන කෙරේ නම්, මහණ සංවිධාන නො කෙරේ නම්, කාලවිසංකෙතයෙන් නැගෙත් නම් ඇවැත් නැත. ආපදවන්හි උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

**අටවැනි නාවාභිරුහනශික්ෂාපද යි.**

## 6.3.9

## පරිපාචිතසික්ඛාපදං.

1. තෙන සමයෙන බුද්ධො භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන ථුල්ලනන්දා භික්ඛුනී අඤ්ඤතරස්ස කුලස්ස කුලූපිකා හොති නිච්චභත්තිකා. තෙන ච ගහපතිනා ථෙරා භික්ඛූ නිමන්තිතා හොන්ති. අථ ඛො ථුල්ලනන්දා භික්ඛුනී පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන තං කුලං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං ගහපතිං එතදවොච:

කිමිදං ගහපති පහූතං ඛාදනීයං භොජනීයං පටියත්තන්ති.

ථෙරා මයා අය්‍යෙ නිමන්තිතාති.

කෙ පන තෙ ගහපති ථෙරාති.

අය්‍යො සාරිපුත්තො අය්‍යො මහාමොග්ගල්ලානො අය්‍යො මහාකච්චානො අය්‍යො මහාකොට්ඨිතො අය්‍යො මහාකප්පිනො අය්‍යො මහාචුන්දො අය්‍යො අනුරුද්ධො අය්‍යො රෙවතො අය්‍යො උපාලි අය්‍යො ආනන්දො අය්‍යො රාහුලොති.

කිං පන ත්වං ගහපති මහානාගෙ තිට්ඨමානෙ චෙටකෙ නිමන්තෙසීති''

කෙ පන තෙ අය්‍යෙ මහානාගාති?

අය්‍යො දෙවදත්තො අය්‍යො කොකාලිකො අය්‍යො කටමොරක තිස්සකො[1] අය්‍යො ඛණ්ඩදෙවියා පුත්තො අය්‍යො සමුද්දදත්තොති.

අයං චරහි ථුල්ලනන්දාය භික්ඛුනියා අන්තරා කථා විප්පකතා. අථ ථෙරා[2] භික්ඛූ පවිසිංසු. සච්චං මහානාගා ඛො තයා ගහපති නිමන්තිතාති. ඉදානෙව ඛො ත්වං අය්‍යෙ චෙටකෙ අකාසි ඉදානි මහානාගෙති සරතො ච නික්කඩ්ඪි නිච්චභත්තඤ්ච පච්ඡින්දි.

2. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, ''කථං හි නාම දෙවදත්තො ජානං භික්ඛුනී පරිපාචිතං පිණ්ඩපාතං පරිභුඤ්ජිස්සතීති[3] -පෙ- සච්චං කිර ත්වං දෙවදත්ත ජානං භික්ඛුනිපරිපාචිතං පිණ්ඩපාතං පරිභුඤ්ජසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම ත්වං මොඝපුරිස ජානං භික්ඛුනී පරිපාචිතං පිණ්ඩපාතං පරිභුඤ්ජිස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**''යො පන භික්ඛු ජානං භික්ඛුනී පරිපාචිතං පිණ්ඩපාතං භුඤ්ජෙය්‍ය පාචිත්තිය''න්ති.**

---

1. කටමොදකතිස්සකො - මජ්ඣං. 2. අථ තෙ ථෙරා - මජ්ඣං.
3. භුඤ්ජිස්සතීති - මජ්ඣං.

## 6.3.9

## පරිපාචිතශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු රජගහනුවර වේළුවන නම් කලන්දක නිවාපයෙහි වැඩවෙසෙති. එසමයෙහි ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ එක්තරා කුලයෙකැ නිතිබත් ඇති කුලූපිකාවක් වෙයි. ඒ ගැහැවිහු විසිනුදු ස්ථවිර භික්ෂූහු පවරණ ලද්දහු වෙති. එකල්හි ථුල්ලනන්ද භික්ෂුණී තොමෝ පෙරවරුයෙහි හැද පෙරවැ පාසිවුරු ගෙන ඒ කුලය වෙත එළැඹියා යැ. එළැඹැ ඒ ගැහැවිහට තෙල කරුණ කිවු ය:

"ගැහැවිය, මේ බොහෝ කෑයුතු බුදිය යුතු දය කුමකට පිළියෙළ කරන ලද ද යි.

ආයසාවනි, මා විසින් ස්ථවිර භික්ෂූහු පවරන ලද්දහු යැ.

ගැහැවිය, තොපගේ ස්ථවිරභික්ෂූහු කවුරු ද?

ආයසා ශාරිපුත්‍ර යැ. ආයසා මහාමෞද්ගල්‍යායන යැ. ආයසා මහාකාත්‍යායන යැ. ආයසා මහාකොට්ඨිත යැ, ආයසා මහාකප්පින යැ. ආයසා මහාචුන්ද යැ. ආයසා අනුරුද්ධ යැ, ආයසා රෙවත යැ, ආයසා උපාලි යැ, ආයසා ආනන්ද යැ, ආයසා රාහුල යි.

කිමැ ගැහැවිය, තෙපි මහානාගයන් සිටීය දී දසයන් පැවරුහු ද යි, ආයසාවනි, තොපගේ මහානාගයෝ කවරහු ද?

ආයසා දෙවදත්ත යැ, ආයසා කොකාලික යැ, ආයසා කටමොරක-තිස්සක යැ, ආයසා ඛණ්ඩදෙවිපුත්‍ර යැ, ආයසා සමුද්දත්ත යි.

ථුල්ලනන්ද භික්ෂුණියගේ මේ අතුරුකථාව නිමාවට නො යා දී මැ ස්ථවිරභික්ෂූහු පැමිණියාහු යැ. සැබැවැ ගැහැවිය, තොප විසින් මහා-නාගණයෝ පවරන ලද්දහු මැ යි. ආයසාව, තෙපි දූත් මැ දසයන් කළවුන් දූත් මැ මහානාගයන් කළහු යැ යි ගෙයිනුදු ඇද දූමී යැ. නිතිබත ද සිද දූමී.

2. යම් ඒ භික්ෂූ කෙනෙක් අපිස් වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ කියති, දෙස් පතුරුවත්: කෙසේ නම් දෙවදත්ත තෙමේ දන දන මෙහෙණක විසින් (ගුණකීමෙන්) නිපදවන ලද පිණ්ඩපාතයක් වැළැඳී ද යි...සැබෑ ද දෙවදත්ත, තෙපි දනැ දනැ මෙහෙණක විසින් නිපදවන ලද පිණ්ඩපාතය වළඳවු ද'යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් හිස් පුරුෂය, තෙපි දන දන මෙහෙණක විසින් නිපදවන ලද පිණ්ඩපාතය වැළඳුවහු ද? හිස් පුරුෂය, මෙය අප්‍රසන්න-යන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙ යි...තව ද මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"යම් මහණෙක් දනැ දනැ මෙහෙණක විසින් නිපැයුණු පිණ්ඩපාතය වළඳා නම් පචිති වේ"ය යි.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

3. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු රාජගහා පබ්බජිතො ඤාතිකුලං අගමාසි. මනුස්සා චිරස්සම්පි[1] භදන්තො ආගතොති සක්කච්චං භත්තං අකංසු තස්ස කුලස්ස කුලූපිකා භික්ඛුනී තෙ මනුස්සෙ එතදවොච, "දෙථ ආවුසො අය්‍යස්ස භික්ඛ"න්ති[2]. අථ ඛො සො භික්ඛු භගවතා පටික්ඛිත්තං ජානං භික්ඛුනීපරිපාචිතං පිණ්ඩපාතං භුඤ්ජිතුන්ති. කුක්කුච්චායන්තො න පටිග්ගහෙසි. නාසක්ඛි පිණ්ඩාය චරිතුං ඡින්නභත්තො අහොසි. අථ ඛො සො භික්ඛු ආරාමං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. "අනුජානාමි භික්ඛවෙ පුබ්බෙ ගිහීසමාරම්භෙ ජානං භික්ඛුනීපරිපාචිතං පිණ්ඩපාතං භුඤ්ජිතුං" එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු ජානං භික්ඛුනීපරිපාචිතං පිණ්ඩපාතං භුඤ්ජෙය්‍ය අඤ්ඤත්‍ර පුබ්බෙ ගිහීසමාරම්භා පාචිත්තිය"න්ති.**

4. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**ජානාති** නාම: සාමං වා ජානාති අඤ්ඤෙ වා තස්ස ආරොචෙන්ති සා වා ආරොචෙති.

**භික්ඛුනී** නාම: උභතො සඞ්ඝෙ උපසම්පන්නා.

**පරිපාචෙති** නාම: පුබ්බෙ අදාතුකාමානං අකත්තුකාමානං අය්‍යො භාණකො අය්‍යො බහුස්සුතො අය්‍යො සුත්තන්තිකො අය්‍යො විනයධරො අය්‍යො ධම්මකථිකො දෙථ අය්‍යස්ස කරොථ අය්‍යස්සාති එසා පරිපාචෙති නාම.

**පිණ්ඩපාතො** නාම: පඤ්චන්නං භොජනානං අඤ්ඤතරං භොජනං. **අඤ්ඤත්‍ර පුබ්බෙ ගිහීසමාරම්භාති ඨපෙත්වා ගිහීසමාරම්භං.**

**ගිහීසමාරම්භො** නාම: ඤාතකා වා හොන්ති පවාරිතා වා පකතිපටියත්තං වා.

1. චිරස්සාපි - මජසං.
2. දෙථය්‍යස්ස ආවුසො භත්තන්ති - මජසං.

මෙසේ භාග්‍යවතුන් විසින් භික්ෂූන්ට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

3. එසමයෙහි එක්තරා මහණෙක් රජගහනුවරින් (නික්මැ) පැවිදි වූයේ නැකුලයට ගියේ යැ. මිනිස්සු බොහෝ කලෙකින් 'හිමියෝ ආහ'යි සකසා බතක් කළහ. ඒ කුලයෙහි කුලූපික වූ මෙහෙණක් ඒ මිනිසුනට 'ඇවැත්නි, ආයසීයහට භික්ෂාව දෙව'යි මෙය කිවු යැ. එකල්හි ඒ මහණ තෙමේ දනැ දනැ මෙහෙණක විසින් නිපැයුණු පිණ්ඩපාතය වළඳන්නට භාග්‍යවතුන් විසින් ප්‍රතික්ෂෙප කරන ලද යි කුකුස් කරනුයේ නො පිළිගත්තේ යි. පිඩු පිණිස හැසිරෙන්නට නො හැකි විය. සුන්බත් ඇත්තේ විය. එකල්හි ඒ මහණ තෙම අරමට ගොස් මහණුන්හට තෙල කරුණ දන්වී ය. මහණහු භාග්‍යවතුන්ට තෙල කරුණ සැලකළහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මේ කරුණෙහි ලා මේ අවසරයෙහි ලා දහැමි කථා කොට මහණුන් ඇමැතූ සේක. "මහණෙනි, පෙර ගිහියන් විසින් පිළියෙළ කරන ලද්දෙහි දනැ දනැ මෙහෙණක විසින් නිපදවන ලද පිණ්ඩපාතය වළඳන්නට අනුදනිමි" තව ද මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"යම් මහණෙක් පෙර ගිහියන් විසින් පිළියෙළ කරන ලද්දක් හැර මෙහෙණක විසින් නිපදවන ලද පිණ්ඩපාතය වළඳන්නේ නම් පචිති වේ" යයි.**

4. **යො පන** යනු: යම්, යම් බඳු...භික්වු යනු...මෙතෙම මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**ජානාති** නම්: තෙමේ හෝ දනී. අන්හු හෝ ඔහට දන්වත්. ඕතොමෝ හෝ දන්වයි.

**භික්ඛුනී** නම්: දෙ සඟුන් කෙරෙහි උපසපන් වූවා.

**පරිපාචෙති** නම්: පෙර නො දෙනු කැමැතියන්හට (සත්කාර) නො කරනු කැමැතියන්ට "ආයසී තෙමේ භාණක යැ, ආයසී තෙමේ බහුශ්‍රැත යැ, ආයසී තෙමේ සෞත්‍රාන්තික යැ, ආයසී තෙමේ විනයධර යැ, ආයසී තෙමේ ධර්මකථික යැ, ආයසීහට දෙවූ. ආයසීහට (සත්කාර) කරවූ"යයි. මෝ නොමෝ පරිපාචෙති නමු.

**පිණ්ඩපාත** නම්: පස් බොජුනෙන් එක්තරා බොජුනෙක්.

**අඤ්ඤත්‍ර පුබ්බෙ ගිහීසමාරම්භා** යනු: ගිහියන් විසින් පිළියෙළ කරන ලද්දක් තබා, **ගිහීසමාරම්භ** නම්: නැයෝ හෝ වෙති. පැවරුවෝ හෝ වෙති. පියවින් පිළියෙළ කරන ලද්දෙක් හෝ වෙයි.

5. අඤ්ඤත්‍ර පුබ්බෙ ගිහිසමාරම්භා භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස.

පරිපාචිතෙ පරිපාචිතසඤ්ඤී භුඤ්ජති අඤ්ඤත්‍ර පුබ්බෙ ගිහිසමාරම්භා, ආපත්ති පාචිත්තියස්ස. පරිපාචිතෙ වෙමතිකො භුඤ්ජති අඤ්ඤත්‍ර පුබ්බෙ ගිහිසමාරම්භා ආපත්ති දුක්කටස්ස. පරිපාචිතෙ අපරිපාචිතසඤ්ඤී භුඤ්ජති අඤ්ඤත්‍ර පුබ්බෙ ගිහිසමාරම්භා අනාපත්ති.

එකතො උපසම්පන්නාය පරිපාචිතං භුඤ්ජති අඤ්ඤත්‍ර පුබ්බෙ ගිහිසමාරම්භා ආපත්ති දුක්කටස්ස. අපරිපාචිතෙ පරිපාචිතසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අපරිපාචිතෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අපරිපාචිතෙ අපරිපාචිතසඤ්ඤී අනාපත්ති.

අනාපත්ති: ගිහිසමාරම්භො[1] සික්ඛමානා පරිපාචෙති සාමණෙරා පරිපාචෙති පඤ්චභොජනානි ඨපෙත්වා සබ්බත්ථ අනාපත්ති උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

පරිපාචිතසික්ඛාපදං නවමං.

## 6.3.10

## රහොනිසජ්ජ සික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මතො උදායිස්ස පුරාණදුතියිකා භික්ඛුනීසු පබ්බජිතා හොති. සා ආයස්මතො උදායිස්ස සන්තිකෙ අභික්ඛණං ආගච්ඡති. ආයස්මාපි උදායි තස්සා භික්ඛුනියා සන්තිකෙ අභික්ඛණං ගච්ඡති. තෙන ඛො පන සමයෙන ආයස්මා උදායි තස්සා භික්ඛුනියා සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙසි.

1 පුබ්බෙ ගිහි සමාරම්භො - මජසං

5. පෙර ගිහියන් විසින් පිළියෙළ කරන ලද්දක් තබා වළඳන්නෙමැ යි පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි, පරහලාවෙහි පරහලාවෙහි පචිති ඇවැත් වේ.

6. නිපදවන ලද්දෙහි නිපදවන ලද සත් ඇතියේ පෙර ගිහියන් විසින් පිළියෙල කරන ලද්දක් තබා වළඳා නම් පචිති ඇවැත් වෙයි. නිපදවන ලද්දෙහි විමති ඇතියේ පෙර ගිහියන් විසින් පිළියෙළ කරන ලද්දක් තබා වළඳා නම් දුකුළා ඇවැත් වෙයි, නිපදවන ලද්දෙහි නො නිපදවන ලද සත් ඇතියේ පෙර ගිහියන් විසින් පිළියෙළ කරන ලද්දක් තබා වළඳා නම් ඇවැත් නැති.

7. මෙහෙණ සඟුන් කෙරෙහි උපසපන් වූවක විසින් නිපදවන ලද්දක් පෙර ගිහියන් විසින් පිළියෙළ කරන ලද්දක් තබා වළඳා නම් දුකුළා ඇවැත් වෙයි. නො නිපදවන ලද්දෙහි නිපදවන ලද සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො නිපදවන ලද්දෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො නිපදවන ලද්දෙහි නො නිපදවන ලද සත් ඇතියේ නම් ඇවැත් නැති.

8. ගිහියන් විසින් පිළියෙළ කරන ලද්දෙහි නම්, සික්මනුව නිපදවා නම්, මෙහෙණී නිපදවා නම්, පස්බොජුන් තබා හැමනන්හි ඇවැත් නැති. උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

**නවවැනි පරිපාචිත ශික්ෂාපද යි.**

## 6. 3. 10

## රහොනිසජ්ජ ශික්‍ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩැවෙසෙති. එසමයෙහි ආයුෂ්මත් උදායී තෙරණුවන් පැරණි අඹුව මෙහෙණන් කෙරෙහි පැවිදිවූවා වෙයි. ඕ නිරතුරු ආයුෂ්මත් උදායී තෙරණුවන් වැළතට යෙයි. ආයුෂ්මත් උදායී තෙරණුවෝ ද එමෙහෙණ වැළතට නිරතුරු යෙති. එකල්හි එකලා වූ ආයුෂ්මත් උදායී තෙරණුවෝ එකලා වූ මැ එමෙහෙණ හා සමඟ නොරඹුරෙහි (පිළිසන් තැනෙකැ) හිඳීම කළහ.

2. යෙ තෙ භික්ඛු අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා උදායි භික්ඛුනියා සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙස්සතී"ති -පෙ- සච්චං කිර ත්වං උදායි, භික්ඛුනියා සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම ත්වං මොඝපුරිස, භික්ඛුනියා සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙස්සසි. නෙතං මොඝපුරිස, අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු භික්ඛුනියා සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙය්‍ය පාචිත්තිය"න්ති.**

3. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**භික්ඛුනී** නාම: උභතො සඞ්ඝෙ උපසම්පන්නා.

**සද්ධින්ති:** එකතො.

**එකො එකායාති:** භික්ඛු චෙව හොති භික්ඛුනී ච.

**රහො** නාම: චක්ඛුස්ස රහො සොතස්ස රහො. **චක්ඛුස්ස රහො** නාම: න සක්කා හොති අක්ඛිං වා නිඛණියමානෙ භමුකං වා උක්ඛිපියමානෙ සීසං වා උක්ඛිපියමානෙ පස්සිතුං. **සොතස්ස රහො** නාම: න සක්කා හොති පකතිකථා සොතුං.

**නිසජ්ජං කප්පෙය්‍යාති:** භික්ඛුනියා නිසින්නාය භික්ඛු උපනිසින්නො වා හොති උපනිපන්නො වා ආපත්ති පාචිත්තියස්ස. භික්ඛු නිසින්නෙ භික්ඛුනී උපනිසින්නා වා හොති උපනිපන්නා වා, ආපත්ති පාචිත්තියස්ස. උභො වා නිසින්නා හොන්ති උභො වා නිපන්නා, ආපත්ති පාචිත්තියස්ස.

රහො රහොසඤ්ඤී එකො එකාය නිසජ්ජං කප්පෙති ආපත්ති පාචිත්තියස්ස රහො වෙමතිකො එකො එකාය නිසජ්ජං කප්පෙති ආපත්ති පාචිත්තියස්ස. රහො අරහොසඤ්ඤී එකො එකාය නිසජ්ජං කප්පෙති ආපත්ති පාචිත්තියස්ස.

2. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස්වූවෝ ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් එකලා වූ ආයුෂ්මත් උදයී එකලා වූ මෙහෙණක හා සමඟ නොරඹුරෙහි හිඳී ද යි...සැබෑ ද? උදයී, එකලා වූ තෙපි එකලා වූ මෙහෙණක හා සමඟ නොරඹුරෙහි හිඳිවූ ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස; භාග්‍යවත් බුදුහු ගැරහූ... කෙසේ නම් හිස් පුරුෂය, එකලා වූ තෙපි එකලා වූ මෙහෙණක හා සමඟ නොරඹුරෙහි හිඳිවු ද? හිස් පුරුෂය, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...මෙසේ ද වනාහි මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**"යම් මහණෙක් එකලා වූයේ එකලා වූ මෙහෙණක හා සමඟ නොරඹුරෙහි (පිළිසන් තැනෙක) හිඳීම කරන්නේ නම් පචිති වේ"යයි.**

3. **යො පන** යනු යම් යම් බඳු. **භික්ඛු** නම් .මෙතෙමෙ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද **භික්ෂු** යි.

**භික්ඛුනී** නම්: දෙසඟුන් කෙරෙහි උපසපන් වූවා.

**සද්ධිං;** එක් වැ.

**එකො එකාය;** මහණෙක් ද වෙයි, මෙහෙණක් ද වෙයි.

**රහො** නම්: ඇසට නො හමු යැ, කනට නො හමු යැ. **චක්ඛුස්ස රහො** නම්: ඇස හෝ කසනු ලබන කල්හි බැම හෝ නඟනු ලබන කල්හි හිස හෝ ඔසවනු ලබන කල්හි බලන්නට නො හැකි වෙයි. **සොතස්ස රහො** නම්: පියවි බස් අසන්නට නො හැකි වෙයි.

**නිසජ්ජං කප්පෙය්‍ය** යනු: මෙහෙණ හුන් කල්හි මහණ වෙතැ හුන්නේ නම් හෝ වෙතැ හොත්තේ නම් හෝ පචිති ඇවැත් වේ. මහණ හුන් කල්හි මෙහෙණ වෙතැ හුන්නී නම් හෝ වෙතැ හොත්තී නම් හෝ පචිති ඇවැත් වේ. දෙදෙන මැ හෝ හුන්නාහු වෙත් නම් දෙදෙන මැ හෝ හොත්තාහු වෙත් නම් පචිති ඇවැත් වේ.

නොරඹුරෙහි නොරඹුරුසන් ඇතියේ මහණ මෙහෙණක හා සමඟ හිඳිම කෙරේ නම් පචිති ඇවැත් වෙ යි. නොරඹුරෙහි විමති ඇතියේ මහණ මෙහෙණක හා සමග හිඳීම කෙරේ නම් පචිති ඇවැත් වෙයි. නොරඹුරෙහි හමුසන් ඇතියේ මහණ මෙහෙණක හා සමඟ හිඳීම කෙරේ නම් පචිති ඇවැත් වේ.

අරහො රහොසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අරහො වෙමතිකො ආපත්ති දුක්කටස්ස, අරහො අරහොසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** යො කොචි විඤ්ඤූ දුතියො හොති තිට්ඨති න නිසීදති අරහොපෙක්ඛො අඤ්ඤවිහිතො නිසීදති උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**රහොනිසජ්ජසික්ඛාපදං දසමං.**

**භික්ඛුනොවාද වග්ගො තතියො.**

තස්සුද්දානං;

අසම්මත'ත්ථඞ්ගතා උපස්සයං ආමිසදෙනෙන[1] සිබ්බති
අද්ධානං නාවං භුඤ්ජෙය්‍ය එකො එකාය තෙ දසා'ති.

1. අසම්මත අත්ථඞ්ගුපස්සයාමිසදෙනෙන - මජසං

හමුයෙහි නොරඹුරු සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි, හමුයෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. හමුයෙහි හමුසත් ඇතියේ නම් ඇවැත් නැති.

යම් කිසිදු දැනුමැති දෙවැන්නෙක් වේ නම්, සිටී නම් නොහිඳී නම්, අනෙකක් කරනුයේ හිඳී නම්, නොරඹුරෙහි ලොකාස්වාදරතියක් නැතියේ නම්, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**දසවැනි රහොනිසජ්ජ ශික්ෂාපද යි.**

**තුන්වැනි භික්ඛුනොවාද වර්ග යි.**

එහි උද්දානය:

(අසම්මත වැ මෙහෙණන්හට ඔවා දීමෙන් පැන වූ) ඔවාද ය, අත්ථඞ්ගත යැ, භික්ඛුනී උපස්සය යැ, ආමිස යැ, චීවරදානය සමඟ චීවරසිබ්බන යැ, සංවිධාන යැ නාවාභිරුහන යැ, පරිපාචිත යැ, රහොනිසජ්ජ යැ යි සිකපදහු දස දෙනෙකි.

# 6. 4. 1.

## භොජන වග්ගො

## ආවසථපිණ්ඩ සික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන සාවත්ථියා අවිදූරෙ අඤ්ඤතරස්ස පූගස්ස ආවසථපිණ්ඩො පඤ්ඤත්තො හොති. ඡබ්බග්ගියා භික්ඛූ පුබ්බණ්හ සමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සාවත්ථියං පිණ්ඩාය පවිසිත්වා පිණ්ඩං අලභමානා ආවසථං අගමංසු. මනුස්සා චිරස්සාපි භදන්තා ආගතාති තෙ[1] සක්කච්චං පරිවිසිංසු. අථ ඛො ඡබ්බග්ගියා භික්ඛූ දුතියම්පි දිවසං -පෙ- තතියම්පි දිවසං පුබ්බණ්හ සමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය සාවත්ථිං පිණ්ඩාය පවිසිත්වා පිණ්ඩං අලභමානා ආවසථං ගන්ත්වා භුඤ්ජිංසු. අථ ඛො ඡබ්බග්ගියානං භික්ඛූනං එතදහොසි. කිං මයං කරිස්සාම ආරාමං ගන්ත්වා හියොපි ඉධෙව ආගන්තබ්බං භවිස්සතීති. තත්ථෙව අනුවසිත්වා අනුවසිත්වා ආවසථපිණ්ඩං භුඤ්ජන්ති. තිත්ථියා අපසක්කන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති; "කථං හි නාම සමණා සක්‍යපුත්තියා අනුවසිත්වා අනුවසිත්වා ආවසථපිණ්ඩං භුඤ්ජිස්සන්ති න ඉමෙසඤ්ඤෙව ආවසථපිණ්ඩො පඤ්ඤත්තො සබ්බසඤ්ඤෙව ආවසථපිණ්ඩො පඤ්ඤත්තොති.

2. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති; "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ අනුවසිත්වා අනුවසිත්වා ආවසථපිණ්ඩං භුඤ්ජිස්සන්ති"ති. -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ අනුවසිත්වා අනුවසිත්වා ආවසථපිණ්ඩං භුඤ්ජථාති? සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා අනුවසිත්වා අනුවසිත්වා ආවසථපිණ්ඩං භුඤ්ජිස්සථ නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ :

**"එකො ආවසථපිණ්ඩො භුඤ්ජිතබ්බො තතො චෙ උත්තරිං භුඤ්ජෙය්‍ය පාචිත්තිය"න්ති**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

---

1. තෙ ති පදං නදිස්සතෙ මරම්ම ඡට්ඨසඞ්ගීතිපිටකෙ.

## 6. 4. 1

### භෝජන වර්ගය

### ආවසථපිණ්ඩ ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩවෙසෙති. එසමයෙහි වනාහි සැවැත් නුවර සමීපයෙහි එක්තරා ශ්‍රෙණිකුලයක් විසින් ආවසථපිණ්ඩයක් (ආගන්තුක දනක්) තබන ලද්දේ වෙයි. සවග මහණහු පෙරවරුයෙහි හැඳ පෙර වැ පා සිවුරු ගෙන සැවැත් නුවර පිඩු පිණිස පිවිස පිඩු නො ලබන්නෝ දෙරදන්හලට ගියහ. මිනිස්සු බොහෝ කලෙකින් වහන්දැ ආහයි සකසා වැළැඳවූහ. එකල්හි වනාහි සවග මහණහු දෙවන දින ද-...තෙවන දින ද පෙරවරුයෙහි හැඳ පෙරවැ පා සිවුරු ගෙන සැවැත් නුවර පිඩු පිණිස පිවිස පිඩු නො ලබන්නාහු ආවසථපිඩු හලට ගොස් වැළඳූහ. එකල්හි සවග මහණුන්හට මෙවැනි සිතෙක් විය. ආරාමයට ගොස් ඇපි කුමක් කරමෝ ද? හෙටත් මෙහි මැ ඉයයුතු යැ යි එහි මැ නිබඳ වැ වසමින් ආවසථපිඩු වළඳත්. තීර්ථකයෝ පහවැ යෙති. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ එහි නිබඳ වැ වසමින් ආවසථපිඩු වැළඳූහු ද. මොවුනට මැ පමණක් ආවසථ පිඩු තබන ලද්දේ නො වෙයි. සියලු දෙනාට මැ ආවසථ පිඩු තබන ලද්දේ වෙයි.

2. භික්ෂූහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු මැ යි. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස්වූවාහු...ඔහු ලාමක කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් සවග මහණහු නිබඳ වැ වසමින් ආගන්තුක දන් වැළඳූහු ද?... සැබෑද, මහණෙනි, තෙපි නිබඳ වැ වසමින් ආගන්තුක දන් වළඳහු ද? සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ...කෙසේ නම් හිස් පුරුෂයෙනි, නිබඳ වැ වසමින් ආගන්තුක දන් වැළඳූහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මෙසේ ද වනාහි මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**''එක් අවස්පිඩුවෙක් වැළඳියයුතු ඉදින් එයින් මත්තෙහි වළඳන්නේ නම් පචිති වේ''**යයි

මෙසේත් භාග්‍යවතුන් විසින් භික්ෂූන්හට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

3. තෙන ඛො පන සමයෙන ආයස්මා සාරිපුත්තො කොසලෙසු ජනපදෙසු සාවත්ථිං ගච්ඡන්තො යෙන අඤ්ඤතරො ආවසථො තෙනුපසඞ්කමි. මනුස්සා චිරස්සාපි ථෙරො ආගතොති සක්කච්චං පරිවිසිංසු. අථ ඛො ආයස්මතො සාරිපුත්තස්ස භුත්තාවිස්ස ඛරො ආබාධො උප්පජ්ජි. නාසක්ඛි තම්හා ආවසථා පක්කමිතුං. අථ ඛො තෙ මනුස්සා දුතියම්පි දිවසං ආයස්මන්තං සාරිපුත්තං එතදවොචුං. භුඤ්ජථ භන්තෙති. අථ ඛො ආයස්මා සාරිපුත්තො භගවතා පටික්ඛිත්තං අනුවසිත්වා අනුවසිත්වා ආවසථපිණ්ඩං භුඤ්ජිතුන්ති කුක්කුච්චායන්තො න පටිග්ගහෙසි. ඡින්නභත්තො අහොසි. අථ ඛො ආයස්මා සාරිපුත්තො සාවත්ථිං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

4. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි "අනුජානාමි භික්ඛවෙ ගිලානෙන භික්ඛුනා අනුවසිත්වා අනුවසිත්වා ආවසථපිණ්ඩං භුඤ්ජිතුං", එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"අගිලානෙන භික්ඛුනා එකො ආවසථපිණ්ඩො භුඤ්ජිතබ්බො තතො චෙ උත්තරිං භුඤ්ජෙය්‍ය පාචිත්තිය"න්ති.**

5. **අගිලානො** නාම: සක්කොති තම්හා ආවසථා පක්කමිතුං. **ගිලානො** නාම න සක්කොති තම්හා ආවසථා පක්කමිතුං.

**ආවසථපිණ්ඩො** නාම පඤ්චන්නං භොජනානං අඤ්ඤතරං භොජනං, සාලාය වා මණ්ඩපෙ වා රුක්ඛමූලෙ වා අජ්ඣොකාසෙ වා අනොදිස්ස යාවදත්ථො පඤ්ඤත්තො හොති.

අගිලානෙන භික්ඛුනා සකිං භුඤ්ජිතබ්බං[1] තතො චෙ උත්තරිං භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස.

අගිලානො අගිලානසඤ්ඤී තතුත්තරිං ආවසථපිණ්ඩං භුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස. අගිලානො වෙමතිකො තතුත්තරිං ආවසථපිණ්ඩං භුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස. අගිලානො ගිලානසඤ්ඤී තතුත්තරිං ආවසථපිණ්ඩං භුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස.

---

1. භුඤ්ජිතබ්බො - මජසං.

3. **එසමයෙහි වනාහි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ කොසොල්** දනව්වෙහි සැවැතට යන්නාහු එක්තරා දෙරදන්හලකට එළැඹියහ. මිනිස්සු බොහෝ කලෙකින් තෙරුන් ආහයි සකසා වැළඳවූහ. එකල්හි වළඳා නිමවූ ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට බලවත් රෝගයෙක් උපන. ඒ ආගන්තුක දන්හලින් බැහැර යන්නට නො හැකිවූහ. එකල්හි ඒ මිනිස්සු දෙවන දින ද ආයුෂ්මත් සැරියුත් තෙරුනට මෙය කීහු. ස්වාමීනි, වළඳනු මැනැව්. එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ නිබඳ වැ වසමින් ආගන්තුකදන් වැළඳීම භාග්‍යවතුන් විසින් ප්‍රතික්ෂෙප කරන ලදයි කුකුස්කරනුවෝ නො පිළිගත්හ. සුන්බත් ඇතියෝ වූහ. එකල්හි ආයුෂ්මත් සැරියුත් තෙරණුවෝ සැවැතට ගොස් භික්ෂූන්ට මෙකරුණ දන්වූහ. භික්ෂූහු භාග්‍යවත්හට මෙකරුණ දන්වූහ.

4. එකල්හි භාග්‍යවත් බුදුහු මෙකරුණෙහි ලා මෙඅවසරයෙහි ලා දහැමි කථා කොට මහණුන් ඇමතූහ:

මහණෙනි, ගිලන් මහණහු විසින් නිබඳ වැ වසමින් දෙරදන් වළඳන්නට අනුදන වදරමි.

මෙසේ ද වනාහි මහණෙනි, මේ සිකපදය උදෙසවූ:

**"නො ගිලන් මහණහු විසින් එක් අවස් පිඩුවෙක් වැළඳිය යුතු ඉදින් එයින් මත්තෙහි වළඳන්නේ නම් පචිති වේ"** යයි.

5. **අගිලාන නම්**: ඒ දෙරදන්හලින් බැහැර යන්නට හැකි වෙයි. **ගිලාන නම්**: ඒ දෙරදන්හලින් බැහැර යන්නට නො හැකි වෙයි.

**ආවස්ථ පිණ්ඩ** නම් පස්බොජුන් අතුරෙන් එක්තරා බොජුනක් හලෙකැ හෝ මඩුවෙකැ හෝ රුක්මුලෙකැ හෝ අබවස්හි හෝ නො උදෙසා කැමැතිතාක් තබන ලද්දේ වෙයි.

නො ගිලන් මහණහු විසින් එක්වරක් වැළඳිය යුතු, ඉදින් එයින් මත්තෙහි වළඳන්නෙමි යි පිළිගනී නම් දුකුළා ඇවැත් වේ. පරහලායෙහි පරහලායෙහි පචිති ඇවැත් වේ.

නො ගිලන් වූයේ නො ගිලන්සන් ඇතියේ එයින් මත්තෙහි අවස්පිඩුවක් වළඳා නම් පචිති ඇවැත් වෙයි. නො ගිලන් වූයේ විමති ඇතියේ එයින් මත්තෙහි අවස්පිඩුවක් වළඳා නම් පචිති ඇවැත් වෙයි. නො ගිලන් වූයේ ගිලන්සන් ඇතියේ එයින් මත්තෙහි අවස්පිඩුවක් වළඳා නම් පචිති ඇවැත් වේ.

ගිලානො අගිලානසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. ගිලානො වෙමතිකො ආපත්ති දුක්කටස්ස. ගිලානො ගිලානසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** ගිලානස්ස, අගිලානො සකිං භුඤ්ජති, ගච්ඡන්තො වා ආගච්ඡන්තො වා භුඤ්ජති, සාමිකා නිමන්තෙත්වා භොජෙන්ති ඕදිස්ස පඤ්ඤත්තො හොති, න යාවදත්ථො පඤ්ඤත්තො හොති, පඤ්ච භොජනානි ඨපෙත්වා සබ්බත්ථ අනාපත්ති උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**ආවසථපිණ්ඩ සික්ඛාපදං පඨමං.**

## 6. 4. 2.

## ගණභොජන සික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන දෙවදත්තො පරිහීනලාභසක්කාරො සපරිසො කුලෙසු විඤ්ඤාපෙත්වා විඤ්ඤාපෙත්වා භුඤ්ජති මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා කුලෙසු විඤ්ඤාපෙත්වා විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සන්ති, කස්ස සම්පන්නං න මනාපං, කස්ස සාදු න රුච්චතී"ති.

2. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං, යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම දෙවදත්තො සපරිසො කුලෙසු විඤ්ඤාපෙත්වා විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සතී"ති. -පෙ- සච්චං කිර ත්වං දෙවදත්ත, සපරිසො කුලෙසු විඤ්ඤාපෙත්වා විඤ්ඤාපෙත්වා භුඤ්ජසීති. සච්චං භගවා, විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම ත්වං මොඝපුරිස, සපරිසො කුලෙසු විඤ්ඤාපෙත්වා විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සසි. නෙතං මොඝපුරිස, අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"ගණභොජනෙ පාචිත්තිය"න්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

ගිලන්වූයේ නො ගිලන්සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. ගිලන් වූයේ විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. ගිලන් වූහුය් ගිලන්සත් ඇතියේ නම් ඇවැත් නැති.

ගිලන්හට, නො ගිලන් වැ වරක් වළඳා නම්, යමින් හෝ එමින් හෝ වළඳා නම්, හිමියෝ නිමතා වළඳවත් නම්, (මහණුන්) උදෙසා තබන ලද්දේ නම්, කැමැතිතාක් තබන ලද්දේ නො වේ නම්, පස්බොජුන් තබා (හඹුකැවිලි ඈ) හැම වැළඳීමෙහි නම්, උම්මත්තකයහට ආදිකම්මිකය හට ඇවැත් නැති.

**පළමුවැනි ආවසථපිණ්ඩ ශික්ෂාපද යි.**

## 6. 4. 2

## ගණභෝජන ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු රජගහ නුවර **කලන්දක නිවාප** නම් වූ **වේළුවන** අරම්හි වැඩැ වෙසෙති. එසමයෙහි පිරිහුණු ලාභසත්කාර ඇති **දේවදත්ත** තෙමේ පිරිස සමඟ කුලයන්හි විනව-විනවා වළඳයි. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ කුලයන්හි විනව විනවා වැළඳූහු ද? කවරක්හට මිහිර නො මැනැවි ද? කවරක්හට රසවත් දය නුරුස්නේ ද යි.

2. භික්ෂූහු ලාමක කොට සිතන, නුගුණ පවසන, දෙස් පතුරුවන, ඒ මිනිසුන්ගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු යම් ඒ භික්ෂූ කෙනෙක් අපිස් වූවාහු...ඔහු ලාමක කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් දෙව්දත් තෙමේ පිරිස සමඟ කුලයන්හි විනව විනවා වැළඳී ද? ...සැබෑ ද, දේවදත්ත, තෙපි පිරිස සමග කුලයන්හි විනව විනවා වළඳවු ද? සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... හිස්පුරුෂය, කෙසේ නම් තෙපි පිරිස සමග කුලයන්හි විනව විනවා වැළඳුවහු ද? හිස් පුරුෂය! මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවූ:

''ගණබොජුනෙහි පචිති වේ''යයි·

මෙසේත් භාග්‍යවතුන් විසින් භික්ෂූන්ට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

3. තෙන ඛො පන සමයෙන මනුස්සා ගිලානෙ භික්ඛූ භත්තෙන නිමන්තෙන්ති. භික්ඛූ කුක්කුච්චායන්තා නාධිවාසෙන්ති, "පටික්ඛිත්තං භගවතා ගණභොජන"න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. "අනුජානාමි භික්ඛවෙ, ගිලානෙන භික්ඛුනා ගණභොජනං භුඤ්ජිතුං." එවඤ්ච පන භික්ඛවෙ, ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"ගණභොජනෙ අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං, තත්ථායං සමයො; ගිලානසමයො, අයං තත්ථ සමයො"ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

4. තෙන ඛො පන සමයෙන මනුස්සා චීවරදානසමයෙ සචීවර-භත්තං පටියාදෙත්වා භික්ඛූ නිමන්තෙන්ති, "භොජෙත්වා චීවරෙන[1] අච්ඡාදෙස්සාමා"ති. භික්ඛූ කුක්කුච්චායන්තා නාධිවාසෙන්ති, "පටික්ඛිත්තං භගවතා ගණභොජන"න්ති. චීවරං පරිත්තං උප්පජ්ජති. භගවතො එතමත්ථං ආරොචෙසුං. –පෙ– "අනුජානාමි භික්ඛවෙ චීවරදානසමයෙ ගණභොජනං භුඤ්ජිතුං". එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"ගණභොජනෙ අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං, තත්ථායං සමයො: ගිලානසමයො චීවරදානසමයො, අයං තත්ථ සමයො"ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

5. තෙන ඛො පන සමයෙන මනුස්සා චීවරකාරකෙ භික්ඛූ භත්තෙන නිමන්තෙන්ති. භික්ඛූ කුක්කුච්චායන්තා නාධිවාසෙන්ති, පටික්ඛිත්තං භගවතා ගණභොජනන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං –පෙ– අනුජානාමි භික්ඛවෙ චීවරකාරසමයෙ ගණභොජනං භුඤ්ජිතුං" එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"ගණභොජනෙ අඤ්ඤත්‍රසමයා පාචිත්තියං, තත්ථායං සමයො: ගිලානසමයො චීවරදානසමයො චීවරකාරසමයො, අයං තත්ථ සමයො"ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

---

චීවරෙහි–සිමු॥ සී।

3. එසමයෙහි මිනිස්සු ගිලන් මහණුන්ට බතින් පවරත්. භික්ෂූහු භාග්‍යවතුන් විසින් ගණ බොජුන ප්‍රතික්ෂෙප කරන ලද යි, කුකුස් කරන්නාහු නො ඉවසත්. භාග්‍යවතුන්හට මෙකරුණ දන්වූහ. එකල්හි භාග්‍යවත් බුදුහු මෙකරුණෙහි ලා මෙ අවසරයෙහි ලා දැහැමි කථා කොට මහණුන් ඇමැතූහ. ''මහණෙනි, ගිලන් මහණහු විසින් ගණ බොජුන් වළඳන්නට අනුදනිමි'' මෙසේ ද වනාහි මහණෙනි, මේ සික පදය උදෙසවු:

''සුදුසු සමය තබා ගණබොජුනෙහි පචිති වේ. එහි ලා මේ සුදුසු සමය යි, එනම්: ගිලන් සමයැ. එහි මේ සුදුසු සමය''යි.

මෙසේත් භාග්‍යවතුන් විසින් භික්ෂූන්ට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

4. එසමයෙහි වනාහි මිනිස්සු සිවුරු දෙන සමයෙහි සිවුරු බතක් පිළියෙළ කොට වළඳවා සිවුරු දෙම්හ යි භික්ෂූන් පවරත්. භික්ෂූහු භාග්‍යවතුන් විසින් ගණබොජුන ප්‍රතික්ෂෙප කරන ලද යි කුකුස් කරමින් නො ඉවසත්. මඳ සිවුරෙක් උපදී. භාග්‍යවතුන්හට මෙකරුණ දන්වූහ... ''මහණෙනි, සිවුරු දෙන සමයෙහි ගණබොජුන් වළඳන්නට අනුදනිමි''. තවද, මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

''සුදුසු සමය තබා ගණබොජුනෙහි පචිති වේ. එහි මේ සුදුසු සමය යි. ගිලන් සමයැ සිවුරු දෙනසමයැ, මේ එහි සුදුසු සමය''යි.

මෙසේත් මහණෙනි, භාග්‍යවතුන් විසින් භික්ෂූන්ට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

5. එසමයෙහි මිනිස්සු සිවුරු කරන මහණුන් බතින් පවරත්. භික්ෂූහු භාග්‍යවතුන් විසින් ගණබොජුන ප්‍රතික්ෂෙප කරන ලද යි කුකුස් කරමින් නො ඉවසත්. භාග්‍යවතුන්හට මෙකරුණ දන්වූහ.... ''මහණෙනි, සිවුරු කරන සමයෙහි ගණබොජුන් වළඳන්නට අනුදනිමි''. මහණෙනි, මේ සිකපදය තවද මෙසේ උදෙසවු:

''සුදුසු සමය තබා ගණබොජුනෙහි පචිති වේ. එහි මේ සුදුසු සමය යි. ගිලන්සමයැ, සිවුරු දෙනසමයැ, සිවුරු කරනසමයැ, මේ එහි සුදුසු සමය'' යි.

මෙසේත් භාග්‍යවතුන් විසින් භික්ෂූන්ට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

6. තෙන ඛො පන සමයෙන භික්ඛූ මනුස්සෙහි සද්ධිං අද්ධානං ගච්ඡන්ති, අථ ඛො තෙ භික්ඛූ තෙ මනුස්සෙ එතදවොචුං, මුහුත්තං ආවුසො ආගමෙථ පිණ්ඩාය චරිස්සාමා''ති, තෙ එවමාහංසු ඉධෙව භන්තෙ භුඤ්ජථාති. භික්ඛූ කුක්කුච්චායන්තා න පතිගණ්හන්ති පටික්ඛිත්තං භගවතා ගණභොජනන්ති, භගවතො එතමත්ථං ආරොචෙසුං. –පෙ– ''අනුජානාමි භික්ඛවෙ අද්ධානගමනසමයෙ ගණභොජනං භුඤ්ජිතුං''. එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**ගණභොජනෙ අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං. තත්‍ථායං සමයො: ගිලානසමයො චීවරදානසමයො චීවරකාරසමයො අද්ධානගමනසමයො. අයං තත්‍ථ සමයොති,**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

7. තෙන ඛො පන සමයෙන භික්ඛූ මනුස්සෙහි සද්ධිං නාවාය ගච්ඡන්ති. අථ ඛො තෙ භික්ඛූ තෙ මනුස්සෙ එතදවොචුං ''මුහුත්තං ආවුසො තීරං උපනෙථ පිණ්ඩාය චරිස්සාමා''ති. තෙ එවමාහංසු ඉධෙව භන්තෙ භුඤ්ජථාති. භික්ඛූ කුක්කුච්චායන්තා නපතිගණ්හන්ති, පටික්ඛිත්තං භගවතා ගණභොජනන්ති භගවතො එතමත්ථං ආරොචෙසුං. –පෙ– ''අනුජානාමි භික්ඛවෙ නාවාභිරූහනසමයෙ ගණභොජනං භුඤ්ජිතුං'' එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

**''ගණභොජනෙ අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං, තත්‍ථායං සමයො: ගිලානසමයො චීවරදානසමයො චීවරකාරසමයො අද්ධානගමනසමයො නාවාභිරූහනසමයො, අයං තත්‍ථ සමයො''ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

8. තෙන ඛො පන සමයෙන දිසාසු වස්සං වුත්‍ථා භික්ඛූ රාජගහං ආගච්ඡන්ති, භගවන්තං දස්සනාය. මනුස්සා නානාවෙරජ්ජකෙ භික්ඛූ පස්සිත්‍වා භොජනෙන නිමන්තෙන්ති. භික්ඛූ කුක්කුච්චායන්තා නාධිවාසෙන්ති, පටික්ඛිත්තං භගවතා ගණභොජනන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. –පෙ– ''අනුජානාමි භික්ඛවෙ මහාසමයෙ ගණභොජනං භුඤ්ජිතුං''. එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**''ගණභොජනෙ අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං, තත්‍ථායං සමයො: ගිලානසමයො චීවරදානසමයො චීවරකාරසමයො අද්ධානගමනසමයො. නාවාභිරූහනසමයො, මහාසමයො අයං තත්‍ථ සමයො''ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

6. එසමයෙහි වනාහි භික්ෂූහු මිනිසුන් සමඟ අදන්මගට (දීර්ග මාර්ගයට) පැමිණෙත්. එකල්හි ඒ භික්ෂූහු ඒ මිනිසුන්ට මෙය කීහු. ඇවැත්නි, මොහොතක් පොරොත්තුවවු, පිඩු පිණිස හැසිරෙමු. ඔවුහු මෙසේ කීහ. ස්වාමීනි මෙහි මැ වළඳනු මැනැවි. භික්ෂූහු භාග්‍යවතුන් විසින් ගණබොජුන ප්‍රතික්ෂෙප කරන ලද යි කුකුස් කරන්නාහු නො පිළිගතිත්. භාග්‍යවතුන්හට මෙකරුණ දන්වූහ...''මහණෙනි, අදන් මඟට පිළිපන් සමයෙහි ගණබොජුන් වළඳන්නට අනුදනිමි''. තවද මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**''සුදුසු සමය තබා ගණබොජුනෙහි පචිති වේ. එහි මේ සුදුසු සමය යි. ගිලන් සමයැ, සිවුරු දෙන සමයැ, සිවුරු කරන සමයැ, අදන් මගට පිළිපන් සමයැ. මේ එහි සුදුසු සමය''යි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් භික්ෂූන්ට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

7. එසමයෙහි භික්ෂූහු මිනිසුන් සමඟ නැවෙන් යෙති. එකල්හි ඒ භික්ෂූහු ඒ මිනිසුන්ට මෙය කීහු. ''ඇවැත්නි, මොහොතක් නැව තොටට පමුණුවවු.'' පිඩු පිණිස හැසිරෙන්නෙමු. ඔවුහු මෙසේ කීහ. ස්වාමීනි, මෙහි මැ වළඳනු මැනැවි. භික්ෂූහු භාග්‍යවතුන් විසින් ගණ-බොජුන ප්‍රතික්ෂෙප කරන ලද යි කුකුස් කරන්නාහු නො පිළිගතිත්. භාග්‍යවතුන්හට මෙකරුණ දන්වූහ....''මහණෙනි, නැව් නගින සමයෙහි ගණබොජුන් වළඳන්නට අනුදනිමි.'' මහණෙනි, තවද මේ සිකපදය මෙසේ උදෙසවු:

**''සුදුසු සමය තබා ගණබොජුනෙහි පචිති වේ. එහි මේ සුදුසු සමය යි ගිලන් සමයැ සිවුරු, දෙන සමයැ, සිවුරු කරන සමයැ, අදන්මගට පිළිපන්සමයැ, නැව් නගිනසමයැ, මේ එහි සුදුසු සමය''යි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් භික්ෂූන්ට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

8. එසමයෙහි දිශාවන්හි වස් වැස නිමවූ භික්ෂූහු භාග්‍යවතුන් දකීමට රජගහ නුවරට පැමිණෙත්. මිනිස්සු නොයෙක් අන් රටවල මහණුන් දක බතින් පවරත්. භික්ෂූහු භාග්‍යවතුන් විසින් ගණබොජුන ප්‍රතික්ෂෙප කරන ලද යි කුකුස්කරනුවෝ නො ඉවසත්. තෙල කරුණ භාග්‍යවතුන්හට දන්වූහ...''මහණෙනි, මහාසමයෙහි ගණබොජුන් වළ-දන්නට අනුදනිමි''. මහණෙනි, මේ සිකපදය තවද මෙසේ උදෙසවු.

**''සුදුසුසමය තබා ගණබොජුනෙහි පචිති වේ. එහි මේ සුදුසු සමය යැ, ගිලන්සමය යැ, සිවුරු දෙන සමය යැ, සිවුරු කරන සමය යැ, අදන් මඟට පිළිපන් සමය යැ නැව් නගින සමය යැ, මහාසමය යැ, මේ එහි සුදුසු සමය''යි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් භික්ෂූන්හට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

9. තෙන ඛො පන සමයෙන රඤ්ඤො මාගධස්ස සෙනියස්ස **බිම්බිසාරස්ස** ඤාතිසාලොහිතො ආජීවකෙසු පබ්බජිතො හොති. අථ ඛො සො ආජීවකො යෙන රාජා මාගධො සෙනියො බිම්බිසාරො තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා රාජානං මාගධං සෙනියං බිම්බිසාරං එතදවොච: ''ඉච්ඡාමහං මහාරාජ සබ්බපාසණ්ඩිකභත්තං කාතුන්ති''. සචෙ ඛො ත්වං භන්තෙ බුද්ධපමුඛං භික්ඛුසඞ්ඝං පඨමං භොජෙය්‍යාසි, එවං කරෙය්‍යාසී'ති. අථ ඛො සො ආජීවකො භික්ඛූනං සන්තිකෙ දූතං පාහෙසි: අධිවාසෙන්තු මෙ භික්ඛූ ස්වාතනාය භත්තන්ති. භික්ඛූ කුක්කුච්චායන්තා නාධිවාසෙන්ති, පටික්ඛිත්තං භගවතා ගණභොජනන්ති. අථ ඛො සො ආජීවකො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවතා සද්ධිං සම්මොදි, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො සො ආජීවකො භගවන්තං එතදවොච; ''භවම්පි ගොතමො පබ්බජිතො අහම්පි පබ්බජිතො, අරහති පබ්බජිතො පබ්බජිතස්ස පිණ්ඩං පටිග්ගහෙතුං, අධිවාසෙතු මෙ භවං ගොතමො ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා''ති අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ ඛො සො ආජීවකො භගවතො අධිවාසනං විදිත්වා පක්කාමි. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි, ''අනුජානාමි භික්ඛවෙ සමණභත්තසමයෙ ගණභොජනං භුඤ්ජිතුං'' එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**''ගණභොජනෙ අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං, තත්ථායං සමයො ගිලානසමයො චීවරදානසමයො චීවරකාරසමයො අද්ධානගමනසමයො නාවාභිරුහනසමයො මහාසමයො සමණභත්තසමයො, අයං තත්ථ සමයො''ති.**

10. **ගණභොජනං** නාම: යත්ථ චත්තාරො භික්ඛූ පඤ්චන්නං භොජනානං අඤ්ඤතරෙන භොජනෙන නිමන්තිතා භුඤ්ජන්ති, එතං ගණභොජනං නාම. **අඤ්ඤත්‍රසමයාති**: ඨපෙත්වා සමයං.

**ගිලානසමයො** නාම: අන්තමසො පාදපි ඵාලිතා[1] හොන්ති ගිලානසමයොති භුඤ්ජිතබ්බං. **චීවරදානසමයො** නාම: අනත්ථතෙ කඨිනෙ[2] වස්සානස්ස පච්ඡිමො මාසො. අත්ථතෙ කඨිනෙ පඤ්චමාසා චීවරදානසමයොති භුඤ්ජිතබ්බං. **චීවරකාරසමයො** නාම: චීවරෙ කයිරමානෙ චීවරකාරසමයොති භුඤ්ජිතබ්බං. **අද්ධානගමනසමයො** නාම අද්ධයොජනං ගච්ඡිස්සාමීති භුඤ්ජිතබ්බං, ගච්ඡන්තෙන භුඤ්ජිතබ්බං, ගතෙන භුඤ්ජිතබ්බං.

1. එලිතා-මජසං
2. කඨිනෙ-මජසං,

9. එසමයෙහි වනාහි මගධේශ්වර ශ්‍රේණිය **බිම්බිසාර** රජුගේ සහලේ නෑයෙක් ආජීවකයන් කෙරෙහි පැවිදි වූයේ වෙයි. එකල්හි ඒ ආජීවක තෙමේ මගධේශ්වර ශ්‍රේණිය බිම්බිසාර රජු වෙතැ එළැඹියේ යැ. එළැඹැ මගධේශ්වර ශ්‍රේණිය බිම්බිසාර රජුට මෙය කී යැ. මහරජ, සර්වපාෂණ්ඩික බතක් කොට දෙන්නට මම කැමැත්තෙමි. ඉදින් වනාහි ස්වාමීනි, ඔබ පළමු වැ බුදු පාමොක් භික්සඟන වළඳවත් නම් එසේ කරනු මැනැවි. එකල්හි ඒ ආජීවක තෙමේ භික්ෂූන්ගේ සමීපයට දූතයකු යැවී ය. "භික්ෂූහු මාගේ බත හෙට දවසට ඉවසත්වා" යි. භික්ෂූහු ගණබොජුන භාග්‍යවතුන් විසින් ප්‍රතික්ෂේප කරන ලද යි කුකුස් කරනුවෝ නො ඉවසත්. එකල්හි ඒ ආජීවක තෙමේ භාග්‍යවතුන් වෙතැ එළැඹියේ යැ. එළැඹැ භාග්‍යවතුන් සමඟ සතුටු විය. සතුටු විය යුතු සිහි කටයුතු කථා කොට නිමවා එකත්පසෙකැ සිටියේ යැ. එකත් පසෙකැ සිටි ඒ ආජීවකයා භාග්‍යවතුන්හට මෙය කී යැ. භවත් ගොයුම්හු ද පැවිදි කෙනෙකි. මම ද, පැවිද්දෙකිමි. පැවිද්දෙක් පැවිද්දකු ගේ පිඩු පිළිගන්නට සුදුසු වෙයි. භවත් ගොයුම්හු භික්ෂුසඞ්ඝයා සමඟ මාගේ බත හෙට දවසට ඉවසත්වා! භාග්‍යවත්හු තුෂ්ණීම්භාවයෙන් ඉවසූහු. එකල්හි ඒ ආජීවකයා භාග්‍ය වතුන්ගේ ඉවසීම දැනැ පිටත් වැ ගියේ යි. ඉක්බිති භාග්‍යවත්හු මෙ මකරුණෙහි ලා මෙ අවසරයෙහි ලා දැහැමි කථා කොට මහණුන් ඇමැතූහු: "මහණෙනි, මහණබත්සමයෙහි ගණබොජුන් වළඳන්නට අනුදනිමි" තවද මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"සුදුසු සමය තබා ගණබොජුනෙහි පචිති වේ. එහි මේ සුදුසු සමය වෙයි ගිලන් සමය යැ සිවුරු දෙන සමය යැ සිවුරු කරන සමය යැ අදන්මගට පිළිපන් සමය යැ නැව් නඟින සමය යැ මහාසමය යැ මහණබත් සමය යැ, මේ එහි සුදුසු සමය යි.**

10. **ගණභෝජන** නම්: යම් තැනෙකැ භික්ෂූහු සතර දෙනෙක් පස් බොජුන් අතුරෙන් එක්තරා බොජුනෙකින් නිමැතුම් ලදුවෝ වළඳත්. මේ ගණ භෝජන නම් වේ. **අඤ්ඤත්‍රසමයා:** සුදුසුසමය තබා.

**ගිලානසමය** නම්: යටත් පිරිසෙයින් පාදයෝ පැළුණහු වෙත් නම් ගිලන්සමය යැයි වැළඳිය යුතු යි. **චීවරදානසමය** නම්: කෙළින් සිවුරු නො අතුළ කල්හි වැසිකල් පිළිබැඳි පැසුළුමස ද, කෙළින් සිවුරු අතුළ කල්හි පස්මස ද සිවුරු දෙන සමය යැයි වැළඳිය යුතු යි. **චීවරකාරසමය** නම්: සිවුරක් කරනු ලබන කල්හි සිවුරු කරන සමය යැයි වැළඳිය යුතු යි. **අද්ධානගමනසමය** නම්: අඩ යොදුනක් යන්නෙමි යි වැළඳිය යුතු, යන්නහු විසින් වැළඳිය යුතු, ගියහු විසින් වැළඳිය යුතු යි.

**නාවාභිරූහනසමයො** නාම: නාවං අභිරූහිස්සාමීති භුඤ්ජිතබ්බං. ආරූළ්හෙන භුඤ්ජිතබ්බං, ඔරූළ්හෙන භුඤ්ජිතබ්බං. **මහාසමයො** නාම: යත්ථ වෙ තයො භික්ඛූ පිණ්ඩාය චරිත්වා යාපෙන්ති, චතුත්ථෙ ආගතෙ න යාපෙන්ති, මහාසමයොති භුඤ්ජිතබ්බං. **සමණභත්තසමයො** නාම: යො කොචි පරිබ්බාජකසමාපන්නො භත්තං කරොති සමණභත්තසමයොති භුඤ්ජිතබ්බං.

අඤ්ඤත්‍ර සමයා භුඤ්ජිස්සාමීති පතිගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස. ගණභොජනෙ ගණභොජනසඤ්ඤී අඤ්ඤත්‍ර සමයා භුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස. ගණභොජනෙ වෙමතිකො අඤ්ඤත්‍ර සමයා භුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස. ගණභොජනෙ න ගණභොජනසඤ්ඤී අඤ්ඤත්‍ර සමයා භුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස. න ගණභොජනෙ ගණභොජනසඤ්ඤී ආපත්ති දුක්කටස්ස, න ගණභොජනෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. න ගණභොජනෙ න ගණභොජනසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** සමයෙ ද්වෙ තයො එකතො භුඤ්ජන්ති පිණ්ඩාය චරිත්වා එකතො සන්නිපතිත්වා භුඤ්ජන්ති නිච්චභත්තෙ සලාකභත්තෙ, පක්ඛිකෙ, උපොසථිකෙ, පාටිපදිකෙ,[1] පඤ්ච භොජනානි ඨපෙත්වා සබ්බත්ථ අනාපත්ති උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

ගණභොජනසික්ඛාපදං දුතියං

## 6.4.3

## පරම්පරභොජන සික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන වෙසාලියං පණීතානං භත්තානං භත්තපටිපාටි අට්ඨිතා[2] හොති. අථ ඛො අඤ්ඤතරස්ස දළිද්දස්ස කම්මකරස්ස[3] එතදහොසි: "න ඛො ඉදං ඔරකං භවිස්සති, යථා ඉමෙ[4] මනුස්සා සක්කච්චං භත්තං කරොන්ති, යන්නූනාහම්පි භත්තං කරෙය්‍යන්ති." අථ ඛො සො දළිද්දො කම්මකරො යෙන කිරපතිකො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං කිරපතිකං එතදවොච:

---

1. නිච්චභත්තං සලාකභත්තං පක්ඛිකං උපොසථිකං පාටිපාදිකං-මජ්ඣසං
2. අධිට්ඨිතා-මජ්ඣසං
3. කම්මකාරස්ස-මජ්ඣසං
4. යථයිමෙ-මජ්ඣසං

**නාවාභිරූහනසමය** නම්: නැවට නඟින්නෙමියි වැළඳිය යුතු, නැවට නැඟුණහු විසින් වැළඳිය යුතු, නැවෙන් බටහු විසින් වැළඳිය යුතු යි.

**මහාසමය** නම්: යම් තැනෙකැ දෙතුන් භික්ෂු කෙනෙක් පිඩු පිණිස හැසිර යැපෙද්ද, සතර වැන්නකු ආ කල්හි නො යැපෙද්ද, මහාසමය යැයි වැළඳිය යුතු යි. **සමණභත්තසමය** නම්: පැවිදිබවට පැමිණි යම් කිසිවෙක් බතක් කරා නම් මහණබත්සමය යැයි වැළඳිය යුතු යි.

සුදුසුසමය තබා වළඳන්නෙමි යි පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරගලායෙහි පරගලායෙහි පචිති ඇවැත් වෙයි. ගණබොජුනෙහි ගණබොජුන්සඤ් ඇතියේ සුදුසු සමය තබා වළඳා නම් පචිති ඇවැත් වෙයි. ගණබොජුනෙහි විමති ඇතියේ සුදුසු සමය තබා වළඳා නම් පචිති ඇවැත් වෙයි. ගණබොජුනෙහි නො ගණ බොජුන්සඤ් ඇතියේ සුදුසු සමය තබා වළඳා නම් පචිති ඇවැත් වෙයි. නො ගණ බොජුනෙහි ගණබොජුන්සඤ් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො ගණ බොජුනෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො ගණ බොජුනෙහි නො ගණ බොජුන් සඤ් ඇතියේ නම් ඇවැත් නැති.

සුදුසු සමයෙහි දෙතුන් දෙනෙක් එක් වැ වළඳත් නම්, පිඩු පිණිස හැසිර එක් රැස් වැ වළඳත් නම්, නිතිබත්හි, ලහබත්හි, අඩමස්බත්හි, පොහොබත්හි, පැළවියබත්හි, පස් බොජුන් තබා (හඹු කැවිලි ඈ) හැම වැළඳීමෙහි ඇවැත් නැති, උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

**ගණභෝජන ශික්ෂාපද යි**

## 6.4.3

## පරම්පරභෝජන ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු විසල්පුර මහවෙනෙහි කූළාරහල්හි වැඩැ වෙසෙති. ඒසමයෙහි වනාහි විසල්පුර පිණිබත්වලින් බත්පිළිවෙළෙක් තබන ලද්දේ වෙයි. එකල්හි එක්තරා දිළිඳු කම්කරුවකුහට මෙ සිත විය: ''යම් සේ මේ මිනිස්සු සකසා බත් තැබීම කෙරෙද්ද, මෙ නම් ලමුවැඩෙක් නො වේ මැ යි, යම් හෙයෙකින් මම ද බතක් කරන්නෙම් නම් ඉතා යෙහෙකැ''යි. එකල්හි ඒ දිළිඳු කම්කරුවා කිරපතිකයා වෙත එළැඹියේ යැ. එළැඹැ ඒ කිරපතිකයා හට මෙය කී යැ:

''ඉච්ඡාමහං අය්‍යපුත්ත, බුද්ධ පමුඛස්ස භික්ඛුසඞ්ඝස්ස භත්තං කාතුං, දෙහි මෙ වෙතනන්ති''. සොපි ඛො කිරපතිකො සද්ධො හොති පසන්නො. අථ ඛො සො කිරපතිකො තස්ස දළිද්දස්ස කම්මකරස්ස අබ්භාතිරේකං[1] වෙතනං අදාසි. අථ ඛො සො දළිද්දෙ කම්මකරො යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො දළිද්දෙ කම්මකරො භගවන්තං එතදවොච; ''අධිවාසෙතු මෙ භන්තෙ භගවා ස්වාතනාය භත්තං සද්ධිං භික්ඛුසඞ්ඝෙනා''ති. මහා ඛො ආවුසො භික්ඛුසඞ්ඝො ජානාහීති හොතු භන්තෙ[2] මහාභික්ඛුසඞ්ඝො, බහූ මෙ බදරා පටියත්තා බදරමිස්සෙනපයායා[3] පරිපූරිස්සන්තීති. අධිවාසෙසි භගවා තුණ්හීභාවෙන. අථ ඛො සො දළිද්දො කම්මකරො භගවතො අධිවාසනං විදිත්වා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

2. අස්සොසුං ඛො භික්ඛු දළිද්දෙන කිර කම්මකරෙන ස්වාතනාය බුද්ධපමුඛො භික්ඛුසඞ්ඝො නිමන්තිතො, බදරමිස්සෙනපයායා පරිපූරිස්සන්තීති. තෙ කාලස්සෙව පිණ්ඩාය චරිත්වා භුඤ්ජිංසු. අස්සොසුං ඛො මනුස්සා දළිද්දෙන කිර කම්මකරෙන බුද්ධපමුඛො භික්ඛුසංඝො නිමන්තිතොති. තෙ දළිද්දස්ස කම්මකරස්ස පහූතං ඛාදනීයං භොජනීයං අභිහරිංසු.

3. අථ ඛො සො දළිද්දො කම්මකරො තස්සා රත්තියා අච්චයෙන පනීතං ඛාදනීයං භොජනීයං පටියාදපෙත්වා භගවතො කාලං ආරොචාපෙසි: කාලො භන්තෙ නිට්ඨිතං භත්තන්ති. අථ ඛො භගවා පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදය යෙන තස්ස දළිද්දස්ස කම්මකරස්ස නිවෙසනං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. සද්ධිං භික්ඛුසංඝෙන. අථ ඛො සො දිළිද්දො කම්මකරො භත්තග්ගෙ භික්ඛූ පරිවිසති. භික්ඛූ එවමාහංසු: ''ථොකං ආවුසො දෙහි, ථොකං ආවුසො දෙහී''ති. මා ඛො තුම්හෙ භන්තෙ අයං දළිද්දො කම්මකරොති ථොක–ථොකං[4] පටිගණ්හිත්ථ, පහූතං මෙ ඛාදනීයං භොජනීයං පටියත්තං පටිග්ගණ්හාථ භන්තෙ යාවදත්ථන්ති. න ඛො මයං ආවුසො එතං කාරණා ථොකං ථොකං පටිග්ගණ්හාම අපි ච මයං කාලස්සෙව පිණ්ඩාය චරිත්වා භුඤ්ජිම්හා, තෙන මයං ථොකං ථොකං පටිග්ගණ්හාමාති. අථ ඛො සො දළිද්දො කම්මකරො උජ්ඣායති ඛීයති විපාචෙති: ''කථං හි නාම භදන්තා මයා නිමන්තිතා අඤ්ඤත්‍ර භුඤ්ජිස්සන්ති, න චාහං පටිබලො යාවදත්ථං දතුන්ති. අස්සොසුං ඛො භික්ඛූ තස්ස දළිද්දස්ස කම්මකරස්ස උජ්ඣායන්තස්ස ඛීයන්තස්ස විපාචෙන්තස්ස.

1. අතිරෙකං–සයා
2. හොතු–මෙ–භන්තෙ–මජසං
3. පෙයායා–මජසං
4. ථොකං ථොකං–මජසං

''හිමි පුත, මම බුදුපාමොක් බික්සඟනට බතක් කරන්නට කැමැත්තෙමි, මාගේ වැටුප් දෙනුමැනැවැ''යි. ඒ කිරපතිකයා ද සැදැහැතියේ පහන් වූයේ වෙයි. එකල්හි ඒ කිරපතිකයා ඒ දිළිඳු කම්කරුවාහට අතිරේක දීමනා සහිත වැටුප දින. ඉක්බිති ඒ දිළිඳු කම්කරුවා භාග්‍යවතුන් වෙතැ එළැඹියේ යැ. එළැඹ භාග්‍යවතුන් සකසා වැඳ එකත් පසෙකැ හුන්නේ යැ. එකත් පසෙකැ හුන්නා වූ ඒ දිළිඳු කම්කරුවා භාග්‍යවතුන් හට මෙය කි යැ: ''ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, මාගේ බත සෙට දවසට බික්සඟන සමඟ ඉවසනසේක්ව''යි. ඇවැත, බික්සඟන බොහෝ යැ, (පමණ) දනුව යි. ස්වාමීනි, භික්ෂුසඞසයා බොහෝ වේවා, මා විසින් බොහෝ ඩෙබර පිළියෙළ කරන ලදහ. ඩෙබරමුසු අහරින් පිත්වත් හිමිවරු පිනායෙත්ව යි. භාග්‍යවතුන් වහන්සේ තුෂ්ණීම්භාවයෙන් ඉවසා වදළසේකැ. එකල්හි ඒ දිළිඳු කම්කරුවා භාග්‍යවතුන්ගේ ඉවසීම දැනැ අස්නෙන් නැඟිට භාග්‍යවතුන් සකසා වැඳ පැදකුණු කොට නික්මැ ගියේ යි.

2. ඒ දිළිඳු කම්කරුවා විසින් ඩෙබරමුසු අහරින් වත් ආර්‍ය්‍යයෝ පිනායෙත්වා'යි හෙට දවසට බුදුපාමොක් බික්සඟන නිමතන ලද යි භික්ෂූහු ඇසූහු. ඔවුහු කල්තබා මැ පිඩු පිණිස හැසිරැ වැළඳූහ. මිනිස්සු දිළිඳු කම්කරුවා විසින් බුදුපාමොක් බික්සඟන නිමතන ලද යි ඇසූහු යි. ඔවුහු බොහෝ කෑ යුතු බීදිය යුතු දැය ඒ දිළිඳු කම්කරුවා වෙතැ එළවූහ.

3. එකල්හි ඒ දිළිඳු කම්කරුවා ඒ රැය ඇවෑමෙන් පිණි කැවිලි බොජුන් පිළියෙල කොට භාග්‍යවතුන්හට කල් දන්වා යැවී ය. ස්වාමීනි, මේ කාලය යි, බත් නිමියේ යි. එකල්හි භාග්‍යවත්හු පෙරවරුයෙහි හැද පෙරවැ පා සිවුරු ගෙන ඒ දිළිඳු කම්කරුවාගේ නිවසට එළඹියහ. එළැඹැ පනවන ලද අසුනෙහි භික්ෂුසංඝයා සමඟ වැඩ හුන්හු. එකල්හි ඒ දිළිඳු කම්කරුවා භක්තාග්‍රයෙහි භික්ෂූන් වළඳවයි. භික්ෂූහු මෙසේ කීහ. ඇවැත, මඳක් දෙව, ඇවැත මඳක් දෙව. ස්වාමීනි, මුඹවහන්සේලා මේ දිළිඳු කම්කරුවෙකැයි මඳ මඳ කොට නො පිළිගනු මැනැවි. මා විසින් බොහෝ කැවිලි බොජුන් අහර පිළියෙළ කරන ලදි. ස්වාමීනි, කැමැතිතාක් පිළිගනු මැනැවි. ඇවැත, ඇපි මෙකරුණින් මඳ මඳ කොට නො පිළිගනුම්හ. තවද ඇපි කල්තබා මැ පිඩු පිණිස හැසිරැ වැළැඳුම්හ. එහෙයින් ඇපි මඳ මඳ පිළිගනුම්හ. එකල්හි ඒ දිළිඳු කම්කරුවා ලමු කොට සිතයි, නුගුණ පවසයි, දෙස් පතුරුවයි. කෙසේ නම් වහන්දැ මා විසින් නිමතන ලද්දහු අන් තැනෙක වැළැඳුහු ද? මම ද කැමැතිතාක් දීමට සමර්ථ නො වෙම් ද? භික්ෂූහු ලමු කොට සිතන, නුගුණ පවසන, දෙස් පතුරුවන ඒ දිළිඳු කම්කරුවා ගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු යි.

4. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. "කථං හි නාම භික්ඛූ අඤ්ඤත්‍ර නිමන්තිතා අඤ්ඤත්‍ර භුඤ්ජිස්සන්ති"ති -පෙ-සච්චං කිර භික්ඛවෙ භික්ඛූ අඤ්ඤත්‍ර නිමන්තිතා අඤ්ඤත්‍ර භුඤ්ජන්තීති? සච්චං භගවා විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා අඤ්ඤත්‍ර නිමන්තිතා අඤ්ඤත්‍ර භුඤ්ජිස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"පරම්පරභොජනෙ පාචිත්තිය"න්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

5. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ගිලානො හොති අඤ්ඤතරො භික්ඛු පිණ්ඩපාතං ආදය යෙන සො භික්ඛු තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තං භික්ඛුං එතදවොච: "භුඤ්ජාහි ආවුසොති". අලං ආවුසො අත්ථි මෙ භත්තපච්චාසාති තස්ස භික්ඛුනො පිණ්ඩපාතො උස්සූරෙ[1] ආහරියිත්ථ. සො භික්ඛු න චිත්තරූපං භුඤ්ජි භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ ගිලානෙන භික්ඛුනා පරම්පරභොජනං භුඤ්ජිතුං". එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"පරම්පරභොජනෙ අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං, තත්ථායං සමයො ගිලානසමයො අයං තත්ථ සමයො"ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

6. තෙන ඛො පන සමයෙන මනුස්සා චීවරදානසමයෙ සචීවරභත්තං[2] පටියාදෙත්වා[3] භික්ඛූ නිමන්තෙන්ති: "භොජෙත්වා චීවරෙන අච්ඡාදෙස්සාමා"ති භික්ඛූ කුක්කුච්චායන්තා නාධිවාසෙන්ති "පටික්ඛිත්තං භගවතා පරම්පර-භොජන"න්ති" චීවරං පරිත්තං උප්පජ්ජති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "අනුජානාමි භික්ඛවෙ චීවරදානසමයෙ පරම්පරභොජනං භුඤ්ජිතුං" එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"පරම්පරභොජනෙ අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං, තත්ථායං සමයො ගිලානසමයො චීවරදානසමයො අයං තත්ථ සමයො"ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

---

1. උස්සූරෙන (කත්ථචි)
2. චීවරභත්තං: සිමු සිමුii
3. පටියාදපෙත්වා-සිමු සිමුii

4. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස්වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් භික්ෂූහු අන්තැනෙකැ නිමතන ලද්දහු අන් තැනෙකැ වැළැඳූහු ද?...සැබෑ ද මහණෙනි, භික්ෂූහු අන්තැනෙකැ නිමතන ලද්දහු අන් තැනෙකැ වළඳද්ද? සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ...කෙසේ නම් මහණෙනි, ඒ හිස් පුරුෂයෝ අන් තැනෙකැ නිමතන ලද්දහු අන් තැනෙකැ වැළඳූහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන් ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මහණෙනි, මෙසේ මේ සිකපදය උදෙසවු:

**"පරම්පර භෝජනයෙහි පචිති වේ"** ය යි.

මෙසේත් භාග්‍යවතුන් විසින් භික්ෂූන්ට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

5. එසමයෙහි වනාහි එක්තරා මහණෙක් ගිලන්වූයේ වෙයි. එක්තරා මහණෙක් පිණ්ඩපාතය ගෙනැ ඒ භික්ෂු යම් තැනෙක ද එතැනට එළැඹියේ යි, එළැඹැ ඒ මහණහට මෙය කීය: ඇවැත වළඳන්න, කම් නැත ඇවැත, මා විසින් ඉවසූ බතෙක් ඇත. ඒ භික්ෂූහුගේ පිණ්ඩපාතය ඉතා දවාලෙහි ගෙනෙනු ලැබීයැ. ඒ භික්ෂු තෙමේ සිත්සේ නො වැළැඳී යැ. භාග්‍යවතුන්හට මෙකරුණ දන්වූහ. එකල්හි භාග්‍යවත්හු මෙකරුණෙහි ලා මෙඅවසරයෙහි ලා දැහැමි කථා කොට මහණුන් ඇමතූහ: "මහණෙනි, ගිලන්මහණහු විසින් පරම්පරභොජනය වළඳන්නට අනුදනිමි" මහණෙනි, තවද මෙසේ මේ සිකපදය උදෙසවු:

**"සුදුසු සමය තබා පරම්පර භොජනයෙහි පචිති වේ. එහි මේ සුදුසු සමය යි: ගිලන්සමය යැ එහි මේ සුදුසු සමය යි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් භික්ෂූන්ට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

6. එසමයෙහි මිනිස්සු සිවුරු දෙන සමයෙහි සිවුරුබතක් පිළියෙළ කොට වළඳවා සිවුරු දෙම්හ යි භික්ෂූන්හට නිමතත්. භික්ෂූහු භාග්‍යවතුන් විසින් පරම්පරභොජනය ප්‍රතික්ෂෙප කරන ලද යි කුකුස් කරනුවෝ නො ඉවසත්. මඳ සිවුරෙක් උපදී. භාග්‍යවතුන්හට මෙකරුණ දන්වූහ... " මහණෙනි, සිවුරු දෙනසමයෙහි පරම්පරභොජනය වළඳන්නට අනුදනිමි."

මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"සුදුසු සමය තබා පරම්පර භොජනයෙහි පචිති වේ. එහි මේ සුදුසු සමය යි: ගිලන් සමය යැ, සිවුරු දෙනසමය යැ, මෙහි ඒ සුදුසු සමය යි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් භික්ෂූන්ට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

7. තෙන ඛො පන සමයෙන මනුස්සා චීවරකාරකෙ භික්ඛූ භත්තෙන නිමන්තෙන්ති. භික්ඛූ කුක්කුච්චායන්තා නාධිවාසෙන්ති "පටික්ඛිත්තං භගවතා පරම්පරභොජන''න්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. -පෙ- "අනුජානාමි භික්ඛවෙ චීවරකාරසමයෙ පරම්පරභොජනං භුඤ්ජිතුං'' එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"පරම්පරභොජනෙ අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං, තත්‍ථායං සමයො ගිලානසමයො චීවරදානසමයො චීවරකාරසමයො අයං තත්‍ථ සමයො''ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

8. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය ආයස්මතා ආනන්දෙන පච්ඡාසමණෙන යෙන අඤ්ඤතරං කුලං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො තෙ මනුස්සා භගවතො ච ආයස්මතො ච ආනන්දස්ස භොජනං අදංසු. ආයස්මා ආනන්දො කුක්කුච්චායන්තො න පටිගණ්හාති. පටිගණ්හාහි[1] ආනන්දාති. අලං භගවා අත්ථි මෙ භත්තපච්චාසාති. තෙනහානන්ද, විකප්පෙත්වා ගණ්හාහීති. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ විකප්පෙත්වා[2] පරම්පරභොජනං භුඤ්ජිතුං', එවඤ්ච පන භික්ඛවෙ විකප්පෙතබ්බං: මය්හං භත්තපච්චාසං ඉත්ථන්නාමස්ස දම්මීති.

9. **පරම්පරභොජනං** නාම: පඤ්චන්නං භොජනානං අඤ්ඤතරෙන භොජනෙන නිමන්තිතො තං ඨපෙත්වා අඤ්ඤං පඤ්චන්නං භොජනානං අඤ්ඤතරං භොජනං භුඤ්ජති, එතං පරම්පරභොජනං නාම.

**අඤ්ඤත්‍රසමයාති** ඨපෙත්වා සමයං

**ගිලානසමයො** නාම: න සක්කොති එකාසනෙ නිසින්නො යාවදත්ථං භුඤ්ජිතුං ගිලානසමයොති භුඤ්ජිතබ්බං

**චීවරදානසමයො** නාම: අනත්ථතෙ කඨිනෙ වස්සානස්ස පච්ඡිමො මාසො, අත්ථතෙ කඨිනෙ පඤ්චමාසා චීවරදාන සමයොති භුඤ්ජිතබ්බං

**චීවරකාරසමයො** නාම: චීවරෙ කයිරමානෙ චීවරකාර සමයොති භුඤ්ජිතබ්බං.

අඤ්ඤත්‍ර සමයා භුඤ්ජිස්සාමීති පතිගණ්හාති, ආපත්ති දුක්කටස්ස අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස.

---

1. ගණ්හාති-මජසං
2. භත්ත පච්චාසං විකප්පෙත්වා-සයා

7. එසමයෙහි වනාහි මිනිස්සු සිවුරු කරන මහණුන්හට බතින් නිමතත්. භික්ෂූහු භාග්‍යවතුන් විසින් පරම්පරභොජනය ප්‍රතික්ෂෙප කරන ලදැයි කුකුස් කරනුවෝ නො ඉවසත්. භාග්‍යවතුන්හට මෙකරුණ දැන්වූහ....''මහණෙනි, සිවුරු කරන සමයෙහි පරම්පරභොජනය වළ-දන්නට අනුදනිමි.'' මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**''සුදුසු සමය තබා පරම්පරභොජනයෙහි පචිති වේ. එහි මේ සුදුසු සමය යි ගිලන් සමය යැ සිවුරු දෙනසමය යැ සිවුරු කරනසමය යැ, මේ එහි සුදුසු සමය යි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් භික්ෂූන්ට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

8. එකල්හි භාග්‍යවත්හු පෙරවරුයෙහි හැඳ පෙර වැ පා සිවුරු ගෙන ආයුෂ්මත් ආනන්දයන් පසුමහණුන් කොට එක්තරා කුලයකට එළැඹියහ. එළැඹැ පනවන ලද අසුනෙහි වැඩැහුන්හු. එකල්හි ඒ මිනිස්සු භාග්‍යවතුන්හට ද ආයුෂ්මත් ආනන්දයන්හට ද භෝජනය දුන්හ. ආයුෂ්මත් ආනන්දයෝ කුකුස් කරනුවෝ නො ඉවසති. පිළිගනු ව ආනන්ද, කම් නැති භාග්‍යවතුනි, මා විසින් ඉවසූ බතෙක් ඇත. එසේ නම් ආනන්ද විකපා පිළිගනුව. එකල්හි භාග්‍යවත්හු මෙකරුණෙහි ලා මෙඅවසරයෙහි ලා දැහැමි කථා කොට භික්ෂූන් ඇමතූහ. ''මහණෙනි, විකල්පනය කොට පරම්පරභෝජනය වළඳන්නට අනුදනිමි,'' මහණෙනි, 'මා ඉවසූ බත මෙනම්හුට දෙමි'යි මෙසේ විකල්පනය කළයුතු යි.

9. **පරම්පරභෝජනය** නම්: පස්බොජුන් අතුරෙන් එක්තරා බොජුන-කින් නිමතන ලද්දේ එය තබා පස් බොජුන් අතුරෙන් එක්තරා අන් බොජුනක් වළඳයි. මේ පරම්පරභොජන නම් වේ.

**අඤ්ඤත්‍ර සමයා:** සුදුසු සමය තබා.

**ගිලානසමය** නම්: එක් අසුනෙහි හුන්නේ කැමැති තාක් වළඳන්නට නො හැකිවේ ද, ගිලන්සමය යැ යි වැළඳියයුතු.

**චීවරදානසමය** නම්: කෙළින් සිවුරු නො අතුළ කල්හි වැසිකල් පිළිබැඳි පැසුළුමස ද කෙළින් සිවුරු අතුළ කල්හි පස්මස ද, සිවුරු දෙන සමය යැ යි වැළඳියයුතු.

**චීවරකාරසමය** නම්: සිවුරක් කරනු ලබන කල්හි සිවුරු කරන සමය යැ යි වැළඳියයුතු.

සුදුසු සමය තබා වළඳන්නෙමි යි පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරගලායෙහි පරගලායෙහි පචිති ඇවැත් වේ.

පරම්පරභොජනෙ පරම්පරභොජනසඤ්ඤී අඤ්ඤත්‍ර සමයා භුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස. පරම්පරභොජනෙ වෙමතිකො අඤ්ඤත්‍රසමයා භුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස. පරම්පරභොජනෙ න පරම්පරභොජනසඤ්ඤී අඤ්ඤත්‍ර සමයා භුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස.

න පරම්පරභොජනෙ පරම්පරභොජනසඤ්ඤී ආපත්ති දුක්කටස්ස න පරම්පරභොජනෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. න පරම්පර-භොජනෙ න පරම්පරභොජනසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** සමයෙ විකප්පෙත්වා භුඤ්ජති ද්වෙ තයො නිමන්තනෙ එකතො භුඤ්ජති, නිමන්තනපටිපාටියා භුඤ්ජති, සකලෙන ගාමෙන නිමන්තිතො තස්මිං ගාමෙ යත්ථ කත්ථචි භුඤ්ජති, සකලෙන පූගෙන නිමන්තිතො තස්මිං පූගෙ යත්ථ කත්ථචි භුඤ්ජති, නිමන්තියමානො භික්ඛං ගහෙස්සාමීති භණති, නිච්චභත්තෙ සලාකභත්තෙ පක්ඛිකෙ උපොසථිකෙ පාටිපදිකෙ පඤ්චභොජනානි ඨපෙත්වා සබ්බත්ථ අනාපත්ති, උම්මත්තකස්ස ආදිකම්මිකස්සා ති.

පරම්පර භොජනසික්ඛාපදං තතියං

## 6. 4. 4

## කාණමාතුසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ තෙන ඛො පන සමයෙන **කාණමාතා** උපාසිකා සද්ධා හොති පසන්නා. කාණා ගාමකෙ අඤ්ඤතරස්ස පුරිසස්ස දින්නා හොති. අථ ඛො කාණා මාතුඝරං අගමාසි කෙනචිදෙව කරණීයෙන. අථ ඛො කාණාය සාමිකො කාණාය සන්තිකෙ දූතං පාහෙසි: "ආගච්ඡතු කාණා, ඉච්ඡාමි කාණාය ආගත"න්ති. අථ ඛො කාණමාතා උපාසිකා කිස්මිං විය රිත්තහත්ථං ගන්තුන්ති පූවං[1] පචි. පක්කෙ පූවෙ අඤ්ඤතරො පිණ්ඩ-චාරිකො භික්ඛු කාණමාතාය උපාසිකාය නිවෙසනං පාවිසි. අථ ඛො

1. පූපං (කත්ථචි)

පරම්පරභෝජනයෙහි පරම්පරබොජුන්යන් ඇතියේ සුදුසු සමය තබා වළඳා නම් පචිති ඇවැත් වෙයි. පරම්පරභොජනයෙහි විමති ඇතියේ සුදුසු සමය තබා වළඳා නම් පචිති ඇවැත් වෙයි. පරම්පරබොජුනෙහි පරම්පරබොජුනැ යි සන් නැතියේ සුදුසු සමය තබා වළඳා නම් පචිති ඇවැත් වෙ.

නො පරම්පරබොජුනෙහි පරම්පරබොජුන්සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි නො පරම්පරබොජුනෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො පරම්පරබොජුනෙහි නො පරම්පරබොජුන්සන් ඇතියේ නම් ඇවැත් නැති.

සුදුසු සමයෙහි විකල්පනය කොට වළඳා නම්, දෙකුන් නිමැතුම්හි එකට වළඳා නම්, නිමතන ලද පිළිවෙළින් වළඳා නම්, සියලු ගම විසින් නිමතන ලද්දේ එගම්හි කිසියම් තැනෙකැ වළඳා නම්, සියලු මුළුවක් විසින් නිමතන ලද්දේ එමුළුවෙහි කිසියම් තැනෙකැ වළඳා නම්, නිමතනු ලබන්නේ භික්ෂාව ගන්නෙමි යි බෙණේ නම්, නිතිබත්හි නම්, ලහබත්හි නම්, පැකිබත්හි නම්, පොහොබත්හි නම්, පැළවිය බත්හි නම්, පස් බොජුන් තබා (හඹුකැවිලි ඈ) හැම වැළදීමෙහි නම් ඇවැත් නැති. උම්මත්තකහට ද ආදිකම්මිකහට ද ඇවැත් නැති.

**පරම්පරභෝජන ශික්ෂාපද යි.**

## 6.4.4

## කාණමාතු ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ අනේපිඩු සිටුහුගේ ජේතවන නම් අරම්හි වැඩැ වෙසෙති. එසමයෙහි වනාහි කාණමාතා උපාසිකාව සැදැහැත්තී පහන්වූවා වෙයි. කාණාව ගමෙකැ එක්තරා පුරුෂයකුට පාවා දුන්නී ය. එකල්හි කාණාව කිසියම් කරුණක් සඳහා මවගේ ගෙට ගියාය. එකල්හි කාණාවගේ සැමියා කාණාවගේ සමීපයට දූතයකු එවී යැ. කාණාව පැමිණේ වා, කාණාවගේ පැමිණීම කැමැත්තෙමි. එකල්හි කාණමාතා උපාසිකාව හිස් අතින් යන්නේ කෙසේ දූ යි කැවුම් පිසූවා යැ. කැවුම් පිසූ කල්හි එක්තරා පිඩු සැරි මහණෙක් කාණමාතා උපාසිකාවගේ නිවසට පැමිණියේ යැ. එකල්හි

කාණමාතා උපාසිකා තස්ස භික්ඛුනො පූවං දපෙසි. සො නික්ඛමිත්වා අඤ්ඤස්ස ආචික්ඛි. තස්සපි පූවං දපෙසි. සොපි[1] නික්ඛමිත්වා අඤ්ඤස්ස ආචික්ඛි. තස්සපි පූවං දපෙසි. යථා පටියත්තං පූවං පරික්ඛයං අගමාසි. දුතියම්පි ඛො කාණාය සාමිකො කාණාය සන්තිකෙ දූතං පාහෙසි. "ආගච්ඡතු කාණා, ඉච්ඡාමි කාණාය ආගත"න්ති දුතියම්පි ඛො කාණමාතා උපාසිකා කිස්මිං විය රිත්තහත්ථං ගන්තුන්ති පූවං පචි. පක්කෙ පූවෙ අඤ්ඤතරො පිණ්ඩචාරිකො භික්ඛු කාණමාතාය උපාසිකාය නිවෙසනං පාවිසි. අථ ඛො කාණමාතා උපාසිකා තස්ස භික්ඛුනො පූවං දපෙසි. සො නික්ඛමිත්වා අඤ්ඤස්ස ආචික්ඛි, තස්සපි පූවං දපෙසි සො පි නික්ඛමිත්වා අඤ්ඤස්ස ආචික්ඛි. තස්සපි පූවං දපෙසි. යථාපටියත්තං පූවං පරික්ඛයං අගමාසි. තතියම්පි ඛො කාණාය සාමිකො කාණාය සන්තිකෙ දූතං පාහෙසි "ආගච්ඡතු කාණා ඉච්ඡාමි කාණාය ආගතං සචෙ කාණා නාගච්ඡිස්සති අහං අඤ්ඤං පජාපතිං ආනෙස්සාමී"ති. තතියම්පි ඛො කාණමාතා උපාසිකා කිස්මිං විය රිත්ත හත්ථං ගන්තු නති පූවං පචි. පක්කෙ පූවෙ අඤ්ඤතරො පිණ්ඩචාරිකො භික්ඛු කාණමාතාය උපාසිකාය නිවෙසනං පාවිසි. අථ ඛො කාණමාතා උපාසිකා තස්ස භික්ඛුනො පූවං දපෙසි. සො නික්ඛමිත්වා අඤ්ඤස්ස ආචික්ඛි තස්සපි පූවං දපෙසි සොපි නික්ඛමිත්වා අඤ්ඤස්ස ආචික්ඛි. තස්සපි පූවං දපෙසි, යථා පටියත්තං පූවං පරික්ඛයං අගමාසි. අථ ඛො කාණාය සාමිකො අඤ්ඤං පජාපතිං ආනෙසි. අස්සොසි ඛො කාණා තෙන කිර පුරිසෙන අඤ්ඤා පජාපති ආනීතාති, සා රොදන්තී අට්ඨාසි.

2. අථ ඛො භගවා පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවර මාදාය යෙන කාණාමාතාය උපාසිකාය නිවෙසනං තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. අථ ඛො කාණමාතා උපාසිකා යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො කාණමාතරං උපාසිකං භගවා එතදවොච: "කිස්සායං කාණා රොදතී"ති, අථ ඛො කාණමාතා උපාසිකා භගවතො එතමත්ථං ආරොචෙසි. අථ ඛො භගවා කාණමාතරං උපාසිකං ධම්මියා කථාය සන්දස්සෙත්වා සමාදපෙත්වා සමුත්තෙජෙත්වා සම්පහංසෙත්වා උට්ඨායාසනා පක්කාමි.

1. සො - මජසං

කාණමාතා උපාසිකාව ඒ මහණහට කැවුම් දෙවූ යැ. හේ නික්ම ගොස් අනෙකකුට කී ය. ඔහුට ද කැවුම් දෙවූ යැ. හෙතෙමේ ද නික්ම ගොස් අනෙකකුට කී යැ. ඔහුට ද කැවුම් දෙවූ යැ. පිළියෙළ කළ තාක් කැවුම් අවසන් බවට ගියේ යි. දෙවනු ද වනාහි කාණාවගේ සැමියා කාණාවගේ සමීපයට දූතයකු එවී යැ. කාණාව පැමිණේවා. කාණාවගේ පැමිණීම කැමැත්තෙමි. දෙවනු ද කාණමාතා උපාසිකාව හිස් අතින් යන්නේ කෙසේ ද යි කැවුම් පිසුවා යැ. කැවුම් පිසූ කල්හි එක්තරා පිඩුසැරි මහණෙක් කාණමාතා උපාසිකාව ගේ නිවසට පැමිණියේ යැ. එකල්හි කාණමාතා උපාසිකාව ඒ මහණහට කැවුම් දෙවූ යැ. හේ නික්ම ගොස් අනෙකකුට කී යැ. ඔහුට ද කැවුම් දෙවූ යැ. හෙතෙමේ ද නික්ම ගොස් අනෙකකුට කී යැ. ඔහුට ද කැවුම් දෙවූ යැ. පිළියෙළ කළ තාක් කැවුම් අවසනට ගියේ යි. තෙවනු ද වනාහි කාණාවගේ සැමියා කාණාවගේ සමීපයට දූතයකු එවී යැ. "කාණාව පැමිණේවා, කාණාවගේ පැමිණීම කැමැත්තෙමි. ඉදින් කාණාව නො පැමිණෙන්නී නම් මම අන් අඹුවක ගෙනෙන්නෙමි" තෙවනුද කාණමාතා උපාසිකාව හිස් අතින් යන්නේ කෙසේ දැයි කැවුම් පිසුවා යැ. කැවුම් පිසූ කල්හි එක්තරා පිඩුසැරි මහණෙක් කාණමාතා උපාසිකාවගේ නිවසට පැමිණියේ යැ. එකල්හි කාණමාතා උපාසිකාව ඒ මහණහට කැවුම් දෙවූ යැ. හේ නික්ම ගොස් අනෙකකුට කී යැ. ඔහුට ද කැවුම් දෙවූ යැ. හෙ තෙමේ ද නික්ම ගොස් අනිකෙකුට කී යැ. ඔහුට ද කැවුම් දෙවූ යැ. පිළියෙළ කළ තාක් කැවුම් අවසනට ගියේයි. එකල්හි කාණාව ගේ සැමියා අන් අඹුවක ගෙනාවේ යැ. කාණාව ඒ පුරුෂයා විසින් අන් අඹුවක් ගෙනෙන ලදැ යි ඇසූ. ඕතොමෝ හඬමින් සිටියා යැ.

2. එකල්හි භාග්‍යවත්හු පෙරවරුයෙහි හැඳ පෙරවැ පාසිවුරු ගෙන කාණමාතා උපාසිකාවගේ නිවසට එළැඹියහ. එළඹැ පනවන ලද අස්නෙහි වැඩැ හුන්හූ. එකල්හි කාණමාතා උපාසිකාව භාග්‍යවතුන් වෙතැ එළඹියා යැ. එළැඹැ භාග්‍යවතුන් සකසා වැඳ එකත්පසෙකැ හුන්නා යැ. එකත්පසෙකැ හුන්නා වූ කාණමාතා උපාසිකාවට භාග්‍යවත්හු මෙය වදළහ: මේ කාණාව කුමකට හඬන්නීදැ යි. එකල්හි කාණමාතා උපාසිකාව භාග්‍යවතුන්හට මෙකරුණ දැන්වූවා යැ. එකල්හි භාග්‍යවත්හු කාණමාතා උපාසිකාවට දැහැමි කථායෙන් (දෙලෝවැඩ) මොනොවට දක්වා (කුසල් දහම්හි) සමාදන් කරවා මොනොවට තෙද ගන්වා සතුටු කරවා අසුනෙන් නැගිට වැඩිය හ.

3. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො සත්ථො **රාජගහා පටියාලොකං** ගන්තුකාමො හොති. අඤ්ඤතරො පිණ්ඩචාරිකො භික්ඛු තං සත්ථං පිණ්ඩාය පාවිසි. අඤ්ඤතරො උපාසකො තස්ස භික්ඛුනො සත්තුං දපෙසි. සො නික්ඛමිත්වා අඤ්ඤස්ස ආචික්ඛි. තස්සපි සත්තුං දපෙසි. සොපි නික්ඛමිත්වා අඤ්ඤස්ස ආචික්ඛි. තස්සපි සත්තුං දපෙසි. යථාපටියත්තං පාථෙය්‍යං පරික්ඛයං අගමාසි. අථ ඛො සො උපාසකො තෙ මනුස්සෙ එතදවොච: "අජ්ජණ්හා[1] අය්‍යා ආගමෙථ යථාපටියත්තං පාථෙය්‍යං අය්‍යානං දින්නං, පාථෙය්‍යං පටියාදෙස්සාමී"ති නාය්‍ය[2] සක්කා ආගමෙතුං පයාතො සත්ථොති අගමංසු. අථ ඛො තස්ස උපාසකස්ස පාථෙය්‍යං පටියාදෙත්වා පච්ඡා ගච්ඡන්තස්ස චොරා අච්ඡින්දිංසු. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා න මත්තං ජානිත්වා පටිග්ගහෙස්සන්ති, අයං ඉමෙසං දත්වා පච්ඡා ගච්ඡන්තො චොරෙහි අච්ඡින්නො"ති.

4. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: තෙන හි භික්ඛවෙ භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤපෙස්සාමි දසඅත්ථවසෙ පටිච්ච: සඞ්ඝසුට්ඨුතාය සඞ්ඝඵාසුතාය -පෙ- විනයානුග්ගහාය, එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"භික්ඛුං පනෙව කුලං උපගතං පූවෙහි වා මන්ථෙහි වා අභිහට්ඨුං පවාරෙය්‍ය, ආකඞ්ඛමානෙන භික්ඛුනා ද්වත්තිපත්තපූරා පටිග්ගහෙතබ්බා. තතො චෙ උත්තරිං පටිග්ගණ්හෙය්‍ය පාචිත්තියං, ද්වත්තිපත්තපූරෙ පටිග්ගහෙත්වා තතො නීහරිත්වා භික්ඛූහි සද්ධිං සංවිභජිතබ්බං, අයං තත්ථ සාමීචී"ති.**

5. භික්ඛුං පනෙව කුලං **උපගතන්ති** කුලං නාම: චත්තාරි කුලානි: ඛත්තියකුලං බ්‍රාහ්මණකුලං වෙස්සකුලං සුද්දකුලං

**උපගතන්ති:** තත්ථ උපගතං

**පූවං** නාම: යං කිඤ්චි පහෙනකත්ථාය පටියත්තං

**මන්ථං** නාම: යං කිඤ්චි පාථෙය්‍යත්ථාය පටියත්තං.

---

1. අජ්ජණ්හො - සිමු I
2. නාය්‍යො - මජසං

3. එසමයෙහි වනාහි එක්තරා ගැල්සාත්තුවක් රජගහ නුවරින් පැසුළු දිගට යනු කැමැත්තේ වෙයි. එක්තරා පිඩුසැරි මහණෙක් ඒ ගැල්සාත්තුව වෙනැ පිඩු පිණිස පැමිණියේ යැ. එක්තරා උවසුවෙක් ඒ මහණහට අත්සුණු දෙවී යැ. හේ නික්ම ගොස් අනෙකකුට කී යැ. ඔහුට ද අත්සුණු දෙවී යැ. හෙතෙමේ ද නික්ම ගොස් අනෙකකුට කී යැ. ඔහුට ද අත්සුණු දෙවී යැ. පිළියෙළ කළ තාක් මාර්ගොපකරණ අවසනට ගියේ යි. එකල්හි ඒ උවසු ඒ මිනිසුන්හට මෙය කී යැ: "ආයඬියෙනි අද දවස පමණක් පොරොත්තු වනු මැනැවී. පිළියෙළ කළ තාක් මාර්ගොපකරණ ආයඬියන්හට දෙන ලදී. මාර්ගොපකරණ පිළියෙළ කරන්නෙමි. ආයඬිය පොරොත්තු වන්නට නො හැකි යැ. තවලම ගියේ යැයි (ඔහුද) ගියහ. එකල්හි මාර්ගොපකරණ පිළියෙළ කොට ගෙන පසුවැ යන්නා වූ ඒ උවසුවාට අනදර කොට සොරූ අසිදගත්හ. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ශ්‍රමණශාක්‍යපුත්‍රයෝ පමණ දැන නො පිළිගත්තාහු ද? මෙතෙම මොවුන්ට දී පසු වැ යන්නේ සොරුන් විසින් අසිද ගන්නා ලද්දේ වේ යැ යි.

4. භික්ෂූහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ති ශබ්දය) ඇසූහු. එකල්හි ඒ භික්ෂූහු භාග්‍ය වතුන්හට මෙකරුණ දැන්වූහ. එකල්හි භාග්‍යවත්හු මෙකරුණෙහි ලා මෙඅවසරයෙහි ලා දැහැමි කථා වදරා භික්ෂූන් ඇමතූහ: එහෙයින් මහණෙනි, කරුණු දසයක් පිණිස භික්ෂූන්ට සිකපද පනවන්නෙමි. සඟුන්ගේ මනා පිළිගැනුම, සඟුන් ගේ පහසුබව...විනයට රුකුල්දීම පිණිස යැ. තව ද මහණෙනි මෙසේ මේ සිකපදය උදෙසවූ:

**"කුලයකට පැමිණි මහණක්හට වනාහි කැවුමෙන් හෝ අත් සුන්නෙන් හෝ වෙනැ එළවා පවරන්නේ නම් කැමැති වන්නා වූ මහණුන් විසින් පිරූ දෙකුන් පාත්‍රයෙක් පමණ පිළිගතයුතු යැ. ඉදින් ඉන්මත්තෙහි පිළි ගන්නේ නම් පචිති වේ. පිරූ දෙකුන් පාත්‍රයක් පිළිගෙන එයින් බැහැර ගෙන ගොස් භික්ෂූන් සමග බෙද ගතයුතු යි මේ එහි අනුදහම්බව යි.**

5. **භික්ඛුං පනෙව කුලං උපගතං**: කුලය නම් ක්ෂත්‍රිය කුල ය බ්‍රාහ්මණ කුල යැ, වෛශ්‍ය කුල යැ, ශුද්‍ර කුල යැ යි කුල සතරෙකි.

**උපගතං**: එහි පැමිණියහු.

**පූවං** නාම: ගෙන යන පඩුරු **පිණිස** පිළියෙළ කරන ලද යම් කිසි දෑයෙකි.

**මන්ථං** නාම: මාර්ගොපකරණ සඳහා පිළියෙළ කරන ලද යම් කිසි දෑයෙකි.

**අභිහට්ඨුං පවාරෙය්‍යාති:** යාවතකං ඉච්ඡසි තාවතකං ගණ්හාහීති.

**ආකඞ්ඛමානෙනාති:** ඉච්ඡමානෙන.

**ද්වත්තිපත්තපූරා පටිග්ගහෙතබ්බාති:** ද්වෙ තයො පත්තපූරා පටිග්ගහෙතබ්බා

**තතො චෙ උත්තරිං පටිග්ගණ්හෙය්‍යාති:** තදුත්තරිං පටිග්ගණ්හාති ආපත්ති පාචිත්තියස්ස. ද්වත්තිපත්තපූරෙ පටිග්ගහෙත්වා තතො නික්ඛමන්තෙන භික්ඛුං පස්සිත්වා ආචික්ඛිතබ්බං අමුත්‍ර[1] මයා ද්වත්තිපත්තපූරා පටිග්ගහිතා මා ඛො තත්ථ පටිග්ගණ්හීති. සචෙ පස්සිත්වා න ආචික්ඛති ආපත්ති දුක්කටස්ස. සචෙ ආචික්ඛිතෙ පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස.

**තතො නීහරිත්වා භික්ඛූහි සද්ධිං සංවිභජිතබ්බන්ති:** පටික්කමනං හරිත්වා[2] සංවිභජිතබ්බං

**අයං තත්ථ සාමීචීති:** අයං තත්ථ අනුධම්මතා

අතිරෙක ද්වත්තිපත්තපූරෙ අතිරෙක සඤ්ඤී පතිග්ගණ්හාති ආපත්ති පාචිත්තියස්ස. අතිරෙක ද්වත්තිපත්තපූරෙ වෙමතිකො පතිග්ගණ්හාති ආපත්ති පාචිත්තියස්ස. අතිරෙකද්වත්තිපත්තපූරෙ ඌනකසඤ්ඤී පතිග්ගණ්හාති ආපත්ති පාචිත්තියස්ස.

ඌනකද්වත්තිපත්තපූරෙ අතිරෙකසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. ඌනකද්වත්තිපත්තපූරෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. ඌනකද්වත්ති-පත්තපූරෙ ඌනකසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** ද්වත්තිපත්තපූරෙ පතිග්ගණ්හාති. ඌනකද්වත්තිපත්තපූරෙ පතිග්ගණ්හාති න පහෙණකත්ථාය න පාථෙය්‍යත්ථාය පටියත්තං දෙන්ති පහෙණකත්ථාය වා පාථෙය්‍යත්ථාය වා පටියත්තසෙසකං දෙන්ති ගමනෙ පටිප්පස්සද්ධෙ දෙන්ති ඤාතකානං පවාරිතානං අඤ්ඤස්සත්ථාය අත්තනො ධනෙන උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

කාණමාතුසික්ඛාපදං චතුත්ථං

1. අමු- සිමු II,
2. නීහරිත්වා- මජසං,

**අභිහට්ඨුං පවාරෙය්‍ය**: යම්තාක් කැමැති වේ නම් ඒතාක් ගනු මැනැවැයි පැවරීම යි.

**ආකඞ්ඛමානෙන** : කැමැති වන්නහු විසින්,

**ද්වත්තිපත්තපූරා පටිග්ගහෙතබ්බා**: පාත්‍ර දෙකක් පුරා හෝ තුනක් පුරා හෝ පිළිගතයුතු යි.

**තතො චෙ උත්තරිං පටිග්ගණ්හෙය්‍ය**: එයින් මත්තෙහි පිළිගනී නම් පචිති ඇවැත් වේ. දෙ තුන් පයක් පිළිගෙන එයින් නික්මෙන්නහු විසින් මහණකු දැක මෙහි මා විසින් පුරා දෙතුන් පාත්‍රයෙක් පිළිගන්නා ලදි. එහි නහමක් පිළිගන්නැයි කිවයුතු යි. ඉදින් දැක නො කියා නම් දුකුළා ඇවැත් වේ. ඉදින් කියන ලද කල්හි පිළිගනී නම් දුකුළා ඇවැත් වේ.

**තතො නීහරිත්වා භික්ඛූහි සද්ධිං සංවිභජිතබ්බා**: බැහැරට ගෙන ගොස් බෙදා දියයුතු යි.

**අයං තත්ථ සාමීචි**: මේ එහි අනුධර්මතා යි. පිරුණු දෙතුන් පයකට වැඩියෙක්හි අතිරේකසංඥා ඇතියේ පිළිගනී නම් පචිති ඇවැත් වෙයි. පිරුණු දෙ තුන් පයකට වැඩියෙක්හි විමති ඇතියේ පිළිගනී නම් පචිති ඇවැත් වෙයි. පිරුණු දෙතුන් පයකට වැඩියෙක්හි ඌනසන් ඇතියේ පිළිගනී නම් පචිති ඇවැත් වේ.

පිරුණු දෙතුන් පයකට අඩුවෙක්හි අතිරේකසංඥා ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. පිරුණු දෙතුන් පයකට අඩුවෙක්හි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. පිරුණු දෙතුන් පයකට අඩුවෙක්හි ඌනසන් ඇතියේ නම් ඇවැත් නැති.

පිරුණු දෙතුන් පයක් පිළිගනී නම්, පිරුණු දෙතුන් පයකට අඩුව පිළිගනී නම්, පඩුරු පිණිස යැවීමට හෝ මාර්ගොපකරණ පිණිස හෝ පිළියෙළ නො කරන ලද්දක් දෙත් නම්, පඩුරු පිණිස හෝ මාර්ගොපකරණ පිණිස හෝ පිළියෙළ කළ දැයෙකින් ඉතුරු වූවක් දෙත් නම්, ගමන වැළකුණු කල්හි දෙත් නම්, නෑයන්ගෙන් නම් පවාරිතයන්ගෙන් නම් අනෙකක්හු සඳහා නම්, ස්වකීය ධනයෙන් නම් ඇවැත් නැති. උම්මත්තකහට ද ආදිකම්මිකහට ද ඇවැත් නැති.

**සිවුවැනි කාණමාතු ශික්ෂාපදයි.**

## 6. 4. 5

## පඨමපවාරණසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො බ්‍රාහ්මණො භික්ඛූ නිමන්තෙත්වා භොජෙසි. භික්ඛූ භුත්තාවී පවාරිතා ඤාතිකුලානි ගන්ත්වා එකච්චෙ භුඤ්ජිංසු. එකච්චෙ පිණ්ඩපාතං ආදාය අගමංසු. අථ ඛො සො බ්‍රාහ්මණො පටිවිස්සකෙ එතදවොච: "භික්ඛූ මයා අය්‍යා සන්තප්පිතා, එථ තුම්හෙපි සන්තප්පෙස්සාමී"ති. තෙ එවමාහංසු: "කිං ත්වං අය්‍යො අම්හෙ සන්තප්පෙස්සසි. යෙපි තයා නිමන්තිතා, තෙපි අම්හාකං ඝරානි ආගන්ත්වා එකච්චෙ භුඤ්ජිංසු. එකච්චෙ පිණ්ඩපාතං ආදාය අගමංසූ"ති. අථ ඛො සො බ්‍රාහ්මණො උජ්ඣායති ඛීයති විපාචෙති: "කථං හි නාම භදන්තා අම්හාකං ඝරෙ භුඤ්ජිත්වා අඤ්ඤත්‍ර භුඤ්ජිස්සන්ති, න චාහං පටිබලො යාවදත්ථං දාතු"න්ති.

2. අස්සොසුං ඛො භික්ඛූ තස්ස බ්‍රාහ්මණස්ස උජ්ඣායන්තස්ස ඛීයන්තස්ස විපාචෙන්තස්ස. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති. ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛූ භුත්තාවී පවාරිතා අඤ්ඤත්‍ර භුඤ්ජිස්සන්තී"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛූ භුත්තාවී පවාරිතා අඤ්ඤත්‍ර භුඤ්ජන්තීති.

සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා භුත්තාවී පවාරිතා අඤ්ඤත්‍ර භුඤ්ජිස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

**යො පන භික්ඛු භුත්තාවී පවාරිතො ඛාදනීයං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පාචිත්තියන්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

## 6.4.5

## පඨමපවාරණ ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ අනේපිඬු සිටුහුගේ ජේතවන නම් අරම්හි වැඩ වෙසෙති. එකල්හි එක්තරා බමුණෙක් භික්ෂූන්ට ආරාධනා කොට වැළඳවූයේ යැ. වළඳා නිමි භික්ෂූහු පවාරණය කරන ලද්දහු නෑකුලයන් කරා ගොස් සමහරු වැළඳූහ. සමහරු පිඬු රැගෙන ගියහ. එකල්හි ඒ බමුණා අසල් වැසියනට මෙය කී යැ: පින්වත්නි, මා විසින් ආයර්‍ය භික්ෂූහු සන්තර්පණය කරන ලදහ. එවූ තොප ද සන්තර්පණය කරවන්නෙමි. ඔවුහු මෙසේ කීහු: කිම ආයර්‍ය වූ යුෂ්මත් තෙමේ අප සතපවන්නෙහි ද? ඔබ විසින් යම් කෙනෙක් නිමන්තනා ලද්දහු ද, ඔවුහු අපගේ ගෙවලට අවුත් සමහරු වැළඳූහ. සමහරු පිඬු රැගෙන ගියහ. එකල්හි ඒ බමුණා ලමු කොට සිතයි. නුගුණ පවසයි. දෙස් පතුරුවයි: ''කෙසේ නම් හිමිවරු අපගේ ගෙහි වළඳා අන්තැනෙකැ වැළඳූහු ද? මම ඇතිනාක් දීමට ප්‍රතිබලයෙකිම් නො වෙම් දැ''යි.

2. භික්ෂූහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ බමුණා ගේ (අකීර්ත්තිශබ්දය) ඇසූහු. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස්වූවෝ...ඔහු ලමු කොට සිතති. නුගුණ පවසති. දෙස් පතුරුවත් ''කෙසේ නම් භික්ෂූහු වළඳා ප්‍රතික්ෂේප කරන ලද්දහු අන්තැනෙකැ වැළඳූහු දැ''යි...සැබෑ ද මහණෙනි, භික්ෂූහු වළඳා ප්‍රතික්ෂේප කරන ලද්දහු අන්තැනෙකැ වළඳද් ද? සැබෑවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ... කෙසේ නම් මහණෙනි, හිස්පුරුෂ වූ ඒ භික්ෂූහු වළඳා නිමියාහු ප්‍රතික්ෂේප කරන ලද්දහු අන්තැනෙකැ වැළඳූහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි....තව ද මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවූ.

**යම් මහණෙක් කළ බත් කිස ඇතියේ, කළ පැවැරුණු ඇතියේ කෑයුතු දයක් හෝ බුදිය යුතු දයක් හෝ කන්නේ නම් හෝ බුදී නම් හෝ පචිති වේ යැයි.**

මෙසේ භාග්‍යවතුන් විසින් භික්ෂූන්ට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

3. තෙන ඛො පන සමයෙන භික්ඛූ ගිලානානං භික්ඛූනං පණීතෙ පිණ්ඩපාතෙ නීහරන්ති. ගිලානා න චිත්තරූපං භුඤ්ජන්ති තානි භික්ඛූ ඡඩ්ඩෙන්ති. අස්සොසි ඛො භගවා උච්චාසද්දං මහාසද්දං කාකොරවසද්දං. සුත්වාන ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: "කිං නු ඛො සො ආනන්ද උච්චාසද්දො මහාසද්දො කාකොරවසද්දො"ති. අථ ඛො ආයස්මා ආනන්දො භගවතො එතමත්ථං ආරොචෙසි: භුඤ්ජෙය්‍යුං පනානන්ද භික්ඛූ ගිලානාතිරිත්තන්ති. න භුඤ්ජෙය්‍යුං භගවාති. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: "අනුජානාමි භික්ඛවෙ ගිලානස්ස ච අගිලානස්ස ච අතිරිත්තං භුඤ්ජිතුං" එවඤ්ච පන භික්ඛවෙ අතිරිත්තං කාතබ්බං 'අලමෙතං සබ්බ'න්ති. එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**යො පන භික්ඛු භුත්තාවී පවාරිතො අනතිරිත්තං ඛාදනීයං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පාචිත්තියන්ති.**

4. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**භුත්තාවී** නාම: පඤ්චන්නං භොජනානං අඤ්ඤතරං භොජනං අන්තමසො කුසග්ගෙනපි භුත්තං හොති.

**පවාරිතො** නාම: අසනං පඤ්ඤායති භොජනං පඤ්ඤායති හත්ථපාසෙ ඨිතො අභිහරති පටික්ඛෙපො පඤ්ඤායති.

**අනතිරිත්තං** නාම: අකප්පියකතං හොති. අප්පටිග්ගහිතකතං හොති. අනුච්චාරිතකතං හොති. අහත්ථපාසෙ කතං හොති. අභුත්තාවිනා කතං හොති. භුත්තාවිනා[1] පවාරිතෙන ආසනා වුට්ඨිතෙන කතං හොති. අලමෙතං සබ්බන්ති අවුත්තං හොති. න ගිලානාතිරිත්තං හොති. එතං අනතිරිත්තං නාම.

**අතිරිත්තං** නාම: කප්පියකතං හොති. පටිග්ගහිතකතං හොති උච්චාරිතකතං හොති හත්ථපාසෙ කතං හොති. භුත්තාවිනා කතං හොති භුත්තාවිනා පවාරිතෙන ආසනා අවුට්ඨිතෙන කතං හොති. අලමෙතං සබ්බන්ති වුත්තං හොති. ගිලානාතිරිත්තං හොති. එතං අතිරිත්තං නාම.

**ඛාදනීයං** නාම: පඤ්ච භොජනානි යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං ඨපෙත්වා අවසෙසං ඛාදනීයං නාම.

**භොජනීයං** නාම: පඤ්ච භොජනානි: ඔදනො කුම්මාසො සත්තු මච්ඡො මංසං. ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස, අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස.

1. භුත්තාවිනා ච - මජසං.

3. එසමයෙහි භික්ෂූහු ගිලන් මහණුන්ට ප්‍රණීත පිණ්ඩ පාතය ගෙන යති. ගිලන්හු සිත් සේ නො වළඳති. ඒවා භික්ෂූහු ඉවත දමති. බුදුහු මුළුදුන් කවුඩන්ගේ උස්හඬ මහාහඬ ඇසූහු. අසා ආයුෂ්මත් ආනන්දයන් ඇමතූහ: ආනන්ද, මුළුදුන් කවුඩන් ගේ තෙල උස් හඬ, මහාහඬ කුමක් හෙයින් ද? එකල්හි ආයුෂ්මත් ආනන්දයෝ භාග්‍යවතුන්හට තෙල කරුණ දැන්වූහ. ආනන්ද, භික්ෂූහු වනාහි ගිලනුන් වළඳා ඉතිරි දය වළඳන්නාහු ද? භාග්‍යවතුන් වහන්ස, නො වළඳන්නාහ. එකල්හි බුදුහු මෙකරුණෙහිලා මෙ අවසරයෙහි ලා දැහැමි කථා කොට මහණුන් ඇමතූහ: ''මහණෙනි, ගිලනාට ද නො ගිලනාට ද ඉතිරිදය වළඳන්නට අනුදනිමි.'' මෙසේ මහණෙනි, අතිරිත්තය කළයුතු යි. 'මෙහැම පමණයැ'. තව ද මහණෙනි මේ සිකපදය මෙසේ උදෙසවූ.

**යම් මහණෙක් කළ බත් කිස ඇතියේ, කළ පැවැරුණු ඇතියේ අයිරික් නො වූ කැයුතු දයක් හෝ බුදිය යුතු දයක් හෝ කන්නේ නම් හෝ වළඳන්නේ නම් හෝ පචිති වේ යැයි.**

4. යො පන: යම්, යම්බඳු ... භිකබු ... මෙතෙමේ මේ අර්ථයෙහිලා අදහස් කරන ලද භික්ෂු යි.

**භුත්තාවී** නම්: පස් බොජුන් අතුරෙන් එක්තරා බොජුනක් යටත් පිරිසෙයින් කුසතණ අගකිනුදු අනුභව කෙළේ වෙයි.

**පවාරිත** නම්: වළඳනු පැනෙයි. (පවරනුවට පොහෝනා) බොජුන පැනෙයි. අත්පසැ සිටියේ වෙයි. එළවයි. ප්‍රතික්ෂේපය පැනෙයි.

**අනතිරිත්ත** නම්: නො කැපකළ දයෙකි. නො පිළිගත් දයෙකි. නො ඔසවනලද දයෙකි. අත්පසින් බැහැර සිටියහු විසින් කළදයෙකි. වළඳා නො නිමියහු විසින් කළදයෙකි. වළඳා පැවැරුණුහු අසුනෙන් නැඟිට කළදයෙකි. මේ හැම පමණයැ නො කියන ලද දයෙකි. ගිලනකු විසින් ඉතිරි නොකළ දයෙකි. මෙයැ අනතිරිත්ත නම්.

**අතිරිත්ත** නම්: කැප කළ දයෙකි, පිළිගත් දයෙකි, ඔසවන ලද දයෙකි, අත්පසැ සිටියහු විසින් කළ දයෙකි, වළඳා නිමියහු විසින් කළ දයෙකි, වළඳා පැවැරුණාහු අසුනෙන් නො නැඟිට කළ දයෙකි, මේ හැම පමණැ යි කියන ලද දයෙකි, ගිලනක්හු විසින් ඉතිරි කළ දයෙකි, මේ යැ අතිරිත්ත නම්.

**ඛාදනීය** නම්: පස් බොජුන් ද යාමකාලිකය ද සත්තාහකාලිකය ද යාවජීවකය ද තබා සෙසු දය ඛාදනීය නම් වේ.

**භොජනීය** නම්: බත් යැ කොමු යැ අත්පුණු යැ දියමස් යැ ගොඩමස් යැ යන පස් බොජුනි. කන්නෙමි බුදින්නෙමියි පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරගලායෙහි පරගලායෙහි පචිති ඇවැත් වේ.

අනතිරිත්තෙ අනතිරිත්තසඤ්ඤී ඛාදනීයං වා භොජනීයං වා ඛාදති වා භුඤ්ජති වා ආපත්ති පාචිත්තියස්ස. අනතිරිත්තෙ වෙමතිකො ඛාදනීයං වා භොජනීයං වා ඛාදති වා භුඤ්ජති වා ආපත්ති පාචිත්තියස්ස. අනතිරිත්තෙ අතිරිත්තසඤ්ඤී ඛාදනීයං වා භොජනීයං වා ඛාදති වා භුඤ්ජති වා ආපත්ති පාචිත්තියස්ස.

යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං ආහාරත්ථාය පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති දුක්කටස්ස.

අතිරිත්තෙ අනතිරිත්තසඤ්ඤී ආපත්ති දුක්කටස්ස, අතිරිත්තෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස, අතිරිත්තෙ අතිරිත්තසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** අතිරිත්තං කාරාපෙත්වා භුඤ්ජති අතිරිත්තං කාරාපෙත්වා භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති අඤ්ඤස්සත්ථාය හරන්තො ගච්ඡති ගිලානස්ස සෙසකං භුඤ්ජති යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං සති පච්චයෙ පරිභුඤ්ජති උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

පඨමපවාරණ[1]සික්ඛාපදං පඤ්චමං

## 6. 4. 6.

## දුතියපවාරණ සික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ද්වෙ භික්ඛූ කොසලෙසු ජනපදෙසු සාවත්ථිං අද්ධානමග්ගපටිපන්නා හොන්ති. එකො භික්ඛු අනාචාරං ආචරති. දුතියො භික්ඛු තං භික්ඛුං එතදවොච: "මා ආවුසො එවරූපං අකාසි. නෙතං කප්පතී"ති. සො තස්මිං උපනන්ධි. අථ ඛො තෙ භික්ඛූ සාවත්ථිං අගමංසු. තෙන ඛො පන සමයෙන සාවත්ථියං අඤ්ඤතරස්ස පූගස්ස සංඝභත්තං හොති. දුතියො භික්ඛු භුත්තාවී පවාරිතො හොති. උපනද්ධො[2] භික්ඛු ඤාතිකුලං ගන්ත්වා පිණ්ඩපාතං ආදාය යෙන සො භික්ඛු තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං භික්ඛුං එතදවොච "භුඤ්ජාහි ආවුසො"ති. අලං ආවුසො පරිපුණ්ණොම්හීති. සුන්දරො ආවුසො පිණ්ඩපාතො භුඤ්ජාහීති. අථ ඛො සො භික්ඛු තෙන භික්ඛුනා නිපීළියමානො තං පිණ්ඩපාතං භුඤ්ජි. උපනද්ධො භික්ඛු තං භික්ඛුං එතදවොච: "ත්වං හි[3] නාම ආවුසො මං වත්තබ්බං මඤ්ඤසි. යං ත්වං භුත්තාවී පවාරිතො අනතිරිත්තං භොජනං භුඤ්ජසී"ති. නනු ආවුසො ආචික්ඛිතබ්බන්ති. නනු ආවුසො පුච්ඡිතබ්බන්ති.

1. පඨම පවාරණා - මජසං, 2. උපනන්ධො - සිමු
3. ත්වංපි - මජසං

අයිරිත් නො වූයෙහි අයිරිත් නොවූ සත් ඇතියේ කැයුතු දයක් හෝ බීදියයුතු දයක් හෝ කා නම හෝ බුදී නම හෝ පවිති ඇවැත් වෙයි. අයිරිත් නො වූයෙහි විමති ඇතියේ කැයුතු දයක් හෝ බීදිය යුතු දයක් හෝ කා නම හෝ බුදී නම හෝ පවිති ඇවැත් වෙයි. අයිරිත් නො වූයෙහි අයිරිත්සත් ඇතියේ කැයුතු දයක් හෝ බීදිය යුතු දයක් හෝ කා නම හෝ බුදී නම හෝ පවිති ඇවැත් වේ.

යාමකාලිකය සත්තාහකාලිකය යාවජීවිකය අහර පිණිස පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරහලායෙහි පරහලායෙහි දුකුළා ඇවැත් වේ.

අයිරිත්හි නො අයිරිත්සත් ඇතියේ නම දුකුළා ඇවැත් වෙයි. අයිරිත්හි විමති ඇතියේ නම දුකුළා ඇවැත් වෙයි. අයිරිත්හි අයිරිත්සත් ඇතියේ නම ඇවැත් නැති.

අයිරිත් කරවා වළඳා නම අයිරිත් කරවා වළඳන්නෙමියි පිළි ගනී නම අනෙකක්හු සඳහා ගෙනැ යේ නම, ගිලන්හු ගේ ඉතිරි දය වළඳා නම යාමකාලිකය සත්තාහකාලිකය යාවජීවිකය කරුණක් ඇති කල්හි වළඳා නම උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

පස්වැනි පඨමපවාරණ ශික්ෂාපදයි.

## 6.4.6

## දුතියපවාරණ ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ අනේපිඬු සිටුහුගේ ජේතවන නම් අරම්හි වැඩැ වෙසෙති. එසමයෙහි දෙ මහණ කෙනෙක් කොසොල් දනව්වෙහි සිටැ සැවැතට යන අදන්මගට පිළිපන්නාහු වෙති. එක් මහණෙක් පනත් විකුම් කෙරෙයි. දෙවන මහණ තෙමේ එමහණහට ඇවැත, මෙබන්දක් නහමක් කරව, 'මෙය නො කැප'යැයි මෙ බස කී යැ. හේ ඔහු කෙරෙහි වෙර බැන්දේ යි. එකල්හි ඒ භික්ෂූහු සැවැතට ගියහ. එසමයෙහි සැවැතෙහි එක්තරා මුළුවෙක්හි සඟබතෙක් වෙයි. දෙවන මහණ වළඳා නිමියේ පවාරිත වෙයි. වෙර බැදි මහණ නැකුලයට ගොස් පිණ්ඩපාතය ගෙනවුත් එමහණ වෙතැ එළැඹියේ යැ. එළැඹැ එමහණහට මෙය කී යැ; ඇවැත, වළඳන්නැයි. පමණි ඇවැත, පිරිපුන් වෙමි. ඇවැත, පිණ්ඩපාතය යහපත් යැ, වළඳන්නැයි. එකල්හි ඒ මහණ තෙමේ එමහණහු විසින් පෙළනු ලබන්නේ ඒ පිණ්ඩපාතය වැළඳී යැ, වෙර බැදි මහණ තෙමේ එ මහණහට මෙය කී යැ: ඇවැත, යම් හෙයෙකින් තෙපි වළඳා නිමියහු කළ පැවැරුණු ඇතියහු අයිරිත් නො කළ බොජුන් වළඳවු නම (එබඳු) තෙපි මා කියයුතු කොට හඟනාහු දැයි. ඇවැත, කිය යුතු නො වේ ද? ඇවැත, පිළිවිසිය යුතු නො වේ දැයි.

2. අථ ඛො සො භික්ඛු භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛු භික්ඛුං භුත්තාවිං පවාරිතං අනතිරිත්තෙන භොජනෙන අභිහට්ඨුං පවාරෙස්සතී"ති -පෙ- සච්චං කිර ත්වං භික්ඛු භික්ඛුං භුත්තාවිං පවාරිතං අනතිරිත්තෙන භොජනෙන අභිහට්ඨුං පවාරෙසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම ත්වං මොඝපුරිස භික්ඛුං භුත්තාවිං පවාරිතං අනතිරිත්තෙන භොජනෙන අභිහට්ඨුං පවාරෙස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

**යො පන භික්ඛු භික්ඛුං භුත්තාවිං පවාරිතං අනතිරිත්තෙන ඛාදනීයෙන වා භොජනීයෙන වා අභිහට්ඨුං පවාරෙය්‍ය හන්ද භික්ඛු ඛාද වා භුඤ්ජ වා ති ජානං ආසාදනාපෙක්ඛො භුත්තස්මිං පාචිත්තියන්ති.**

3. යො පනාති: යො යාදිසො -පෙ- භික්ඛූති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**භික්ඛුන්ති:** අඤ්ඤං භික්ඛුං.

**භුත්තාවී** නාම: පඤ්චන්නං භොජනානං අඤ්ඤතරං භොජනං අන්තමසො කුසග්ගෙනපි භුත්තං හොති.

**පවාරිතො** නාම: අසනං පඤ්ඤායති භොජනං පඤ්ඤායති හත්ථපාසෙ ඨිතො අභිහරති පටික්ඛෙපො පඤ්ඤායති.

**අනතිරිත්තං** නාම: අකප්පියකතං හොති අප්පටිග්ගහිතකතං හොති අනුච්චාරිතකතං හොති අහත්ථපාසෙ කතං හොති අභුත්තාවිනා කතං හොති භුත්තාවිනා පවාරිතෙන ආසනා වුට්ඨිතෙන කතං හොති අලමෙතං සබ්බන්ති අවුත්තං හොති න ගිලානාතිරිත්තං හොති එතං අනතිරිත්තං නාම.

**ඛාදනීයං** නාම: පඤ්චභොජනානි යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං ඨපෙත්වා අවසෙසං ඛාදනීයං නාම.

**භොජනීයං** නාම: පඤ්චභොජනානි ඔදනො කුම්මාසො සත්තු මච්ඡො මංසං.

2. එකල්හි ඒ මහණ තෙම භික්ෂූන්හට මෙකරුණ සැල කෙළේ යැ. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස්වූවෝ...ඔහු ලමු කොට සිතති. තුගුණ පවසති. දෙස් පතුරුවත්. "කෙසේ නම් මහණෙක් වළඳා නිමි කළ පැවැරුණු ඇති මහණක්හු වෙතැ එළවා අයිරිත් නො කළ බොජුනෙන් පැවැරිද යි...සැබැද මහණ, තෙපි වළඳා නිමි කළ පැවැරුණු ඇති මහණක්හු වෙතැ එළවා අයිරිත් නො කළ බොජුනෙන් පැවැරුවහු ද? සැබැව, භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහු...කෙසේ නම් හිස් පුරුෂය, තෙපි වළද නිම කළ පැවැරුණු ඇති මහණක්හු වෙතැ එළවා අයිරිත් නො කළ බොජුනෙන් පැවැරුහු ද? හිස් පුරුෂය, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...තවද මහණෙනි! මේ සිකපදය මෙසේ උදෙසවු.

**යම් මහණෙක් වළඳා නිමි කළ පැවැරුණු ඇති මහණක්හු වෙතැ එළවා අයිරිත් නො කළ කැයුතු දෑයෙකින් හෝ බුදිය යුතු දෑයෙකින් හෝ හිද මහණ කන්නේයැ හෝ බුදින්නේයැ හෝ යි ගටනු කැමැත්තේ දනැ දනැ පවරන්නේ නම් වැළඳුව පචිති වේ යැයි.**

3. **යො පන;** යමෙක් යම් බඳුයෙක්...**භික්ඛු**...මේ තෙමේ මේ අර්ත්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**භික්ඛුං :** අන් මහණක්හු;

**භුත්තාවී** නම් : පස් බොජුන් අතුරෙන් එක්තරා බොජුනෙක් යටත් පිරිසෙයින් කුසතණ අගිතුදු අනුභව කෙළේ වෙයි.

**පවාරිත** නම් : නො නිමි කැම පැනෙයි. (පවරනුවට පොහෝනා) බොජුන පැනෙයි. අත්පස සිටියේ වෙයි, එළවයි, ප්‍රතික්ෂේපය පැනෙයි.

**අනතිරිත්ත** නම් : නො කැපකළ දෑයෙකි. නො පිළිගත් දෑයෙකි. නො ඔසවන ලද දෑයෙකි. අත්පසින් බැහැර සිටියහු විසින් කළ දෑයෙකි. වළඳා නො නිමියහු විසින් කළ දෑයෙකි. වළඳා පැවැරුණහු අසුනෙන් නැගිට කළ දෑයෙකි. මේ හැම පමණැයි නො කියනලද දෑයෙකි. ගිලනකු විසින් ඉතිරි නො කළ දෑයෙකි. මේ යැ අනතිරික්ත නම්.

**ඛාදනීය** නම් : පස් බොජුන් ද යාමකාලිකය ද සත්තාහකාලිකය ද යාවජීවිකය ද තබා සෙසු දෑ ඛාදනීය නම් වේ.

**භොජනීය** නම් : බත් යැ කොමු යැ අත්සුණු යැ දියමස් යැ ගොඩ මස් යැ යන පස් බොජුනි.

**අභිහට්ඨුං පවාරෙය්‍යාති:** යාවතකං ඉච්ඡසි තාවතකං ගණ්හාහීති.

**ජානාති** නාම: සාමං වා ජානාති අඤ්ඤෙ වා තස්ස ආරොචෙන්ති සො වා ආරොචෙති.

**ආසාදනාපෙක්ඛොති:** ඉමිනා ඉමං චොදෙස්සාමි සාරෙස්සාමි පටිචොදෙස්සාමි පටිසාරෙස්සාමි මඞ්කු[1] කරිස්සාමීති ආහරති ආපත්ති දුක්කටස්ස. තස්ස වචනෙන ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පතිගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති දුක්කටස්ස. භොජන-පරියොසානෙ ආපත්ති පාචිත්තියස්ස.

පවාරිතෙ පවාරිතසඤ්ඤී අනතිරිත්තෙන ඛාදනීයෙන වා භොජනීයෙන වා අභිහට්ඨුං පවාරෙති ආපත්ති පාචිත්තියස්ස. පවාරිතෙ වෙමතිකො අනතිරිත්තෙන ඛාදනීයෙන වා භොජනීයෙන වා අභිහට්ඨුං පවාරෙති ආපත්ති දුක්කටස්ස. පවාරිතෙ අප්පවාරිතසඤ්ඤී අනතිරිත්තෙන ඛාදනීයෙන වා භොජනීයෙන වා අභිහට්ඨුං පවාරෙති අනාපත්ති.

යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං ආහාරත්ථාය අභිහරති ආපත්ති දුක්කටස්ස. තස්ස වචනෙන ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පතිගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති දුක්කටස්ස.

අප්පවාරිතෙ පවාරිතසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අප්පවාරිතෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අප්පවාරිතෙ අප්පවාරිතසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** අතිරිත්තං කාරාපෙත්වා දෙති, අතිරිත්තං කාරාපෙත්වා භුඤ්ජාහීති දෙති, අඤ්ඤස්සත්ථාය හරන්තො ගච්ඡාහීති දෙති, ගිලානස්ස සෙසකං දෙති, යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං සතිපච්චයෙ පරිභුඤ්ජාහීති දෙති, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**දුතියපවාරණසික්ඛාපදං නිට්ඨිතං.**

---

1. මඞ්කුං - මජසං.

**අභිහට්ඨුංපවාරෙය්‍ය;** යම්තාක් කැමැත්තෙහි ද ඒතාක් ගනුවයි.

**ජානාති** නම්: තෙමේ ම හෝ දනී. අන්හු හෝ ඔහුට කියත්, හෙතෙමේ හෝ දන්වයි.

**ආසාදනාපෙක්ඛො;** මෙයින් මොහුට චෝදනා කරන්නෙමි, සිහි කරවන්නෙමි, නැවැතැ චෝදනා කරන්නෙමි, නැවැතැ සිහි කරවන්නෙමි, මකු කරන්නෙමැයි අත්පසට එළවා නම් දුකුළා ඇවැත් වෙයි. ඔහුගේ වචනයෙන් කන්නෙමි, බුදින්නෙමැයි පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරහලායෙහි පරහලායෙහි දුකුළා ඇවැත් වෙයි. බොජුන් අවසනැ පචිති ඇවැත් වේ.

පවාරිතයෙහි පවාරිතසංඥා ඇතියේ අයිරිත් නො වූ කැ යුතු දෑයෙකින් හෝ බිදිය යුතු දෑයෙකින් හෝ අත්පසට එළවා පවරා නම් පචිති ඇවැත් වෙයි. පවාරිතයෙහි විමති ඇතියේ අයිරිත් නො වූ කැයුතු දෑයෙකින් හෝ බිදිය යුතු දෑයෙකින් හෝ වෙතැ එළවා පවරා නම් දුකුළා ඇවැත් වෙයි. පවාරිතයෙහි අපවාරිතසංඥා ඇතියේ අයිරිත් නො වූ කැ යුතු දෑයෙකින් හෝ බිදියයුතු දෑයෙකින් හෝ වෙතැ එළවා පවරා නම් ඇවැත් නැති.

යාවකාලිකය සත්තාහකාලිකය යාවජීවකය අහර පිණිස වෙතැ එළවා නම් දුකුළා ඇවැත් වෙයි. ඔහුගේ වචනයෙන් කන්නෙමි, බුදින්නෙමැ යි පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරහලායෙහි පරහලායෙහි දුකුළා ඇවැත් වේ. .

නො පැවැරුණුයෙහි පැවැරුණුසන් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො පැවැරුණුයෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො පැවැරුණුයෙහි නො පැවැරුණුසන් ඇතියේ නම් ඇවැත් නැති.

අයිරිත් කරවා දේ නම්, අයිරිත් කරවා වළඳන්නැයි දේ නම්, අනෙකක්හු සඳහා ගෙනැයන්නැයි දේ නම්, ගිලනා ගේ ඉතිරිදැය දේ නම්, යාමකාලිකය සත්තාහකාලික ය යාවජීවක ය කරුණක් ඇති කල්හි වළඳන්නැයි දේ නම්, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**සවැනි දුතිය පවාරණ ශික්ෂාපදයි.**

## 6. 4. 7.

## විකාලභොජනසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **රාජගහෙ** විහරති **වෙළුවනෙ කලන්දකනිවාපෙ.** තෙන ඛො පන සමයෙන රාජගහෙ **ගිරග්ගසමජ්ජො** හොති. **සත්තරසවග්ගියා** භික්ඛූ ගිරග්ගසමජ්ජං දස්සනාය අගමංසු, මනුස්සා සත්තරසවග්ගියෙ භික්ඛූ පස්සිත්වා නහාපෙත්වා විලිම්පෙත්වා භොජෙත්වා ඛාදනීයං අදංසු. සත්තරසවග්ගියා භික්ඛූ ඛාදනීයං ආදය ආරාමං ගන්ත්වා ඡබ්බග්ගියෙ භික්ඛූ එතදවොචුං; "හන්දාවුසො[1] ඛාදනීයං ඛාදථා"ති. "කුතො තුම්හෙහි ආවුසො ඛාදනීයං ලද්ධන්ති". සත්තරසවග්ගියා භික්ඛූ ඡබ්බග්ගියානං භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං. කිම්පන තුම්හෙ ආවුසො විකාලෙ භොජනං භුඤ්ජථාති. එවමාවුසොති. ඡබ්බග්ගියා භික්ඛූ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. "කථං හි නාම සත්තරසවග්ගියා භික්ඛූ විකාලෙ භොජනං භුඤ්ජිස්සන්ති"ති.

2. අථ ඛො ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සත්තරසවග්ගියා භික්ඛූ විකාලෙ භොජනං භුඤ්ජිස්සන්ති"ති -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ විකාලෙ භොජනං භුඤ්ජථා'ති. සච්චං භගවා, විගරහි බුද්ධො භගවා -පෙ- "කථං හි නාම තුම්හෙ මොඝපුරිසා විකාලෙ භොජනං භුඤ්ජිස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

**යො පන භික්ඛු විකාලෙ ඛාදනීයං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පාචිත්තියන්ති.**

3. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**විකාලො** නාම: මජ්ඣන්තිකෙ වීතිවත්තෙ යාව අරුණුග්ගමනා.

**ඛාදනීයං** නාම: පඤ්චභොජනානි යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං ඨපෙත්වා අවසෙසං ඛාදනීයං නාම.

**භොජනීයං** නාම: පඤ්ච භොජනානි ඔදනො කුම්මාසො සත්තු මච්ඡො මංසං. ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පතිගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස.

1. ගණ්හථාවුසො - මජසං, සිමු

# 6.4.7

## විකාලභොජන ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු රජගහ නුවර කලන්දකනිවාප නම් වූ වේළුවන අරමෙහි වැඩැ වෙසෙති. එසමයෙහි වනාහි රජගහ නුවර ගිරග්ගසමජ්ජ නම් නෘත්‍යයෙක් වෙයි. සත්තරස වර්ග්ගීය භික්ෂූහු ගිරග්ග සමජ්ජ නම් නෘත්‍යය බැලීමට ගියහ. මිනිස්සු සත්තරස වර්ග්ගීය භික්ෂූන් දැකැ නහවා විලෙවුන් ගල්වා වළඳවා කැයුතු දැ දුන්හ. සත්තරස වර්ග්ගීය භික්ෂූහු කැයුතු දැ ගෙනැ ආරාමයට ගොස් ෂඩ්වර්ග්ගීය භික්ෂූන්හට මෙය කීහු. ගනිවු ඇවැත්නි, කෑ යුතු දැ වළඳන්නැ යි. ඇවැත්නි, තොප විසින් කොයින් කෑ යුතු දැ ලබන ලද දූයි. සත්තරස වර්ග්ගීය භික්ෂූහු ෂඩ්වර්ග්ගීය භික්ෂූන්හට මෙකරුණ දැන්වූහ. කිමෙක් ද ඇවැත්නි, තෙපි විකාලයෙහි බොජුන් වළඳවු දූයි. එසේ යැ ඇවැත්නි. සවග මහණුහු ලමු කොට සිතති. නුගුණ පවසති. දෙස් පතුරුවත්. ''කෙසේ නම් සත්තරස වර්ග්ගීය භික්ෂූහු විකල්හි බොජුන් වැළඳූහු දැ''යි

2. එකල්හි සවග මහණුහු භික්ෂූන්හට මෙකරුණ දැන්වූහ. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස්වූවෝ ... ඔහු ලමු කොට සිතති. නුගුණ පවසති. දෙස් පතුරුවත් : ''කෙසේ නම් සත්තරස වර්ග්ගීය භික්ෂූහු විකල්හි බොජුන් වැළඳූහු දූයි ... සැබෑද මහණෙනි, තෙපි විකාලයෙහි බොජුන් වළඳවු දූයි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ... කෙසේ නම් හිස් පුරුෂයෙනි තෙපි විකල්හි බොජුන් වැළඳූහු දූයි. හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... තව ද මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු.

**යම් මහණෙක් විකාලයෙහි කැයුතු දයක් හෝ බිදිය යුතු දයක් හෝ කා නම් හෝ බුදී නම් හෝ පචිති වේ යැයි.**

3. යො පන: යම් යම්බඳු...භික්ඛු... මෙතෙමේ මේ අර්ථයෙහිලා අදහස් කරන ලද භික්ෂු යි.

විකාල නම්: මද්දහන ඉක්මැ ගිය කල්හි අරුණ නැගිම දක්වා.

ඛාදනීය නම්: පස් බොජුන් ද යාමකාලිකය ද සත්තාහ කාලිකය ද යාවජ්ජීවිකය ද තබා සෙසු දැ ඛාදනීය නම් වේ.

භොජනීය නම්: බත් යැ, කොමු යැ, අත්සුණු යැ, දියමස් යැ, ගොඩමස් යැ යන පස් බොජුනි. කන්නෙමි වළඳන්නෙමැයි පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරභලායෙහි පරභලායෙහි පචිති ඇවැත් වේ.

විකාලෙ විකාලසඤ්ඤී ඛාදනීයං වා භොජනීයං වා ඛාදති වා භුඤ්ජති වා ආපත්ති පාචිත්තියස්ස. විකාලෙ වෙමතිකො ඛාදනීයං වා භොජනීයං වා ඛාදති වා භුඤ්ජති වා ආපත්ති පාචිත්තියස්ස. විකාලෙ කාලසඤ්ඤී ඛාදනීයං වා භොජනීයං වා ඛාදති වා භුඤ්ජති වා ආපත්ති පාචිත්තියස්ස.

යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං ආහාරත්ථාය පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති දුක්කටස්ස.

කාලෙ විකාලසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. කාලෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. කාලෙ කාලසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං සති පච්චයෙ පරිභුඤ්ජති උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**විකාලභොජනසික්ඛාපදං සත්තමං.**

## 6. 4. 8.

## සන්නිධිකාරසික්ඛාපදං.

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මතො ආනන්දස්ස උපජ්ඣායො ආයස්මා **බෙලට්ඨසීසො**[1] අරඤ්ඤෙ විහරති. සො පිණ්ඩාය චරිත්වා සුක්ඛකුරං ආරාමං හරිත්වා සුක්ඛාපෙත්වා නික්ඛිපති. යදා ආහාරෙන අත්ථො හොති තදා උදකෙන තෙමෙත්වා තෙමෙත්වා පරිභුඤ්ජති[2]. චිරෙන ගාමං පිණ්ඩාය පවිසති. භික්ඛූ ආයස්මන්තං බෙලට්ඨසීසං එතදවොචුං; කිස්ස ත්වං ආවුසො බෙලට්ඨසීස චිරෙන ගාමං පිණ්ඩාය පවිසසීති.

---

1. බෙලට්ඨසීසො – මජසං. බෙලට්ඨිසීසො – සිමු.
2. භුඤ්ජති – මජසං.
3. කිස්ස ත්වං ආවුසො චිරෙන. – මජසං.

විකාලයෙහි විකාලසංඥා ඇතියේ කැයුතු දයක් හෝ බිදියයුතු දයක් හෝ කා නම් හෝ බුදී නම් හෝ පචිති ඇවැත් වෙයි. විකාලයෙහි විමති ඇති යේ කැයුතු දයක් හෝ බිදියයුතු දයක් හෝ කා නම් හෝ බුදී නම් හෝ පචිති ඇවැත් වෙයි. විකාලයෙහි කාලසංඥා ඇතියේ කැයුතු දයක් හෝ බිදියයුතු දයක් හෝ කා නම් හෝ බුදී නම් හෝ පචිති ඇවැත් වේ.

යාමකාලිකය සත්තාහකාලිකය යාවජීවිකය අහර පිණිස පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරහලායෙහි පරහලායෙහි දුකුළා ඇවැත් වේ.

කාලයෙහි විකාලසංඥා ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. කාලයෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. කාලයෙහි කාලසංඥා ඇතියේ නම් ඇවැත් නැති.

යාමකාලිකය සත්තාහකාලිකය යාවජීවිකය කරුණක් ඇති කල්හි වළඳා නම්, උම්මත්තකයහට, ආදිකම්මිකයහට ඇවැත් නැති.

**සත්වැනි විකාලභොජන ශික්ෂාපදයි.**

## 6.4.8

## සන්නිධිකාර ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ අනේපිඩු සිටුහුගේ ජේතවන නම් අරම්හි වැඩැ වෙසෙති. එසමයෙහි ආයුෂ්මත් ආනන්ද තෙරුන් ගේ උපාධ්‍යාය වූ ආයුෂ්මත් බෙල්ලට්ඨසීස තෙරණුවෝ අරණ්‍ය-යෙහි වෙසෙති. උන්වහන්සේ පිඩු පිණිස හැසිර සූප ව්‍යඤ්ජනයෙන් නො මුසු බත් ආරාමයට ගෙනැ ගොස් වියළවා තබති. යම් දිනෙකැ අහරින් ප්‍රයෝජන වේ ද, එදින දියෙන් තෙම තෙමා වළඳති. බොහෝ කලෙකින් පිඩු පිණිස ගමට පිවිසෙති. භික්ෂූහු ආයුෂ්මත් බෙල්ලට්ඨසීස තෙරුන්ට මෙය කීහු: ඇවැත්නි බෙල්ලට්ඨසීසයෙනි, කුමකට තෙපි බොහෝ කලෙකින් පිඩු පිණිස ගමට පිවිසෙවු දැයි.

2. අථ ඛො ආයස්මා බෙලට්ඨසීසො භික්ඛූනං එතමත්ථං ආරොචෙසි: කිම්පන ත්වං ආවුසො සන්නිධිකාරකං භොජනං භුඤ්ජසී''ති? එවමාවුසොති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති ''කථං හි නාම ආයස්මා බෙලට්ඨසීසො සන්නිධිකාරකං භොජනං භුඤ්ජිස්සති -පෙ- සච්චං කිර ත්වං බෙලට්ඨසීස, සන්නිධිකාරකං භොජනං භුඤ්ජසීති? සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- ''කථං හි නාම ත්වං බෙලට්ඨසීස, සන්නිධිකාරකං භොජනං භුඤ්ජිස්සසි නෙතං බෙලට්ඨසීස, අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**''යො පන භික්ඛු සන්නිධිකාරකං ඛාදනීයං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පාචිත්තිය''න්ති.**

3. **යො පනාති;** යො යාදිසො -පෙ- **භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**සන්නිධිකාරකං** නාම: අජ්ජපටිග්ගහිතං අපරජ්ජු.[1]

**ඛාදනීයං** නාම: පඤ්ච භොජනානි යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං ඨපෙත්වා අවසෙසං ඛාදනීයං නාම.

**භොජනීයං** නාම: පඤ්ච භොජනානි ඔදනො කුම්මාසො සත්තු මච්ඡො මංසං ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස, අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස.

සන්නිධිකාරකෙ සන්නිධිකාරකසඤ්ඤී ඛාදනීයං වා භොජනීයං වා ඛාදති වා භුඤ්ජති වා ආපත්ති පාචිත්තියස්ස. සන්නිධිකාරකෙ වෙමතිකො ඛාදනීයං වා භොජනීයං වා ඛාදති වා භුඤ්ජති වා ආපත්ති පාචිත්තියස්ස. සන්නිධිකාරකෙ අසන්නිධිකාරකසඤ්ඤී ඛාදනීයං වා භොජනීයං වා ඛාදති වා භුඤ්ජති වා ආපත්ති පාචිත්තියස්ස.

යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං ආහාරත්ථාය පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති දුක්කටස්ස.

අසන්නිධිකාරකෙ සන්නිධිකාරකසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අසන්නිධිකාරකෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අසන්නිධිකාරකෙ අසන්නිධිකාරකසඤ්ඤී අනාපත්ති.

1. අපරජ්ජු ඛාදිතං හොති - මජසං.

2. එකල්හි ආයුෂ්මත් බෙල්ලට්ඨසීස තෙරණුවෝ භික්ෂූන්හට තෙල කරුණ දැන්වූහ. කිමෙක් ද? ඇවැත්නි, තෙපි තැන්පත් කොට තැබූ බොජුන් වළඳහු ද යි. එසේ යැ ඇවැත්නි, යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ආයුෂ්මත් බෙල්ලට්ඨසීස තෙරණුවෝ තැන්පත් කොට තැබූ බොජුන් වැළඳූහු ද''යි... සැබෑද බෙල්ලට්ඨසීස, තෙපි තැන්පත් කොට තැබූ බොජුන් වළඳවූ ද යි, සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ...කෙසේ නම් බෙල්ලට්ඨසීස, තෙපි තැන්පත් කොට තැබූ බොජුන් වැළඳුවහු ද? බෙල්ලට්ඨසීස, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**''යම් මහණෙක් තැන්පත් කොට තැබූ කෑයුතු දයක් හෝ බිදියයුතු දයක් හෝ කා නම් හෝ බුදී නම් හෝ පචිති වේ''යයි.**

3. යො පන: යම්, යම්බඳු...භිකබූ...මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**සන්නිධිකාරක** නම්: අද පිළිගත් ආමිසය අන් දිනකට තැබීම යි.

**ඛාදනීය** නම්: පස් බොජුන් ද යාමකාලිකය ද සත්තාහ-කාලිකය ද යාවජීවිකය ද තබා සෙසු දෑ ඛාදනීය නම් වේ.

**භොජනීය** නම්: බත් යැ කොමු යැ අත්සුණු යැ දියමස් යැ ගොඩමස් යැ යන පස් බොජුනි. කන්නෙමි වළඳන්නෙමැ යි පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරගලායෙහි පරගලායෙහි පචිති ඇවැත් වේ.

තැන්පත් කොට තබන ලදුයෙහි තැන්පත් කොට තැබූ සන් ඇතියේ කෑයුතු දයක් හෝ බිදියයුතු දයක් හෝ කා නම් හෝ බුදී නම් හෝ පචිති ඇවැත් වෙයි. තැන්පත් කොට තබන ලදුයෙහි විමති ඇතියේ කෑයුතු දයක් හෝ බිදිය යුතු දයක් හෝ කා නම් හෝ බුදී නම් හෝ පචිති ඇවැත් වෙයි. තැන්පත් කොට තබන ලදුයෙහි නො තැන්පත් කොට තැබූ සන් ඇතියේ කෑයුතු දයක් හෝ බිදිය යුතු දයක් හෝ කා නම් හෝ බුදී නම් හෝ පචිති ඇවැත් වේ.

යාමකාලිකය, සත්තාහකාලිකය, යාවජීවිකය අහර පිණිස පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරගලායෙහි පරගලායෙහි දුකුළා අවැත් වේ.

නො තැන්පත් කොට තබන ලදුයෙහි තැන්පත් කොට තැබූ සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො තැන්පත් කොට තබන ලදුයෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො තැන්පත් කොට තබන ලදුයෙහි නො තැන්පත් කොට තැබූසන් ඇතියේ නම් ඇවැත් නැති.

**අනාපත්ති:** යාවකාලිකං යාවකාලෙ නිදහිත්වා භුඤ්ජති යාමකාලිකං යාමෙ නිදහිත්වා භුඤ්ජති. සත්තාහකාලිකං සත්තාහං නිදහිත්වා භුඤ්ජති. යාවජීවිකං සති පච්චයෙ පරිභුඤ්ජති උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**සන්නිධිකාරකසික්ඛාපදං අට්ඨමං.**

## 6. 4. 9.

## පණීතභොජනසික්ඛාපදං.

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන **ඡබ්බග්ගියා භික්ඛූ** පණීත භොජනානි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: කථං හි නාම සමණා සක්‍යපුත්තියා පණීතභොජනානි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සන්ති, කස්ස සම්පන්නං න මනාපං කස්ස සාදු[1] න රුච්චතීති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා –පෙ– තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ පණීත භොජනානි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සන්තීති –පෙ– සච්චං කිර තුම්හෙ භික්ඛවෙ පණීතභොජනානි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජථාති. සච්චං භගවා, විගරහි බුද්ධො භගවා –පෙ– කථං හි නාම තුම්හෙ මොඝපුරිසා, පණීතභොජනානි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සථ, නෙතං මොඝපුරිසා, අප්පසන්නානං වා පසාදය –පෙ– එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යානි ඛො පන තානි පණීතභොජනානි සෙය්‍යථීදං: සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං මච්ඡො මංසං ඛීරං දධි. යො පන භික්ඛු එවරූපානි පණීතභොජනානි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය පාචිත්තිය"න්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

---

1. සාදුං, මජසං.

යාවකාලිකය යාවකාලයෙහි තැන්පත් කොට තබා වළඳා නම් යාමකාලිකය යාමකාලයෙහි තැන්පත් කොට තබා වළඳා නම් සත්තාහකාලිකය සත්දිනක් තැන්පත් කොට තබා වළඳා නම් යාවජීවිකය කරුණක් ඇති කල්හි වළඳා නම් ඇවැත් නැත. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**අටවැනි සන්නිධිකාරක ශික්ෂාපද යි.**

## 6. 4. 9

## පණීතභෝජන ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ **ජේතවන** නම් **අනේපිඩු** සිටුහුගේ **අරම්හි** වැඩැවෙසෙති. එසමයෙහි ඡබ්බග්ගිය මහණහු පිණීබොජුන් තමා පිණිස විනවා වළඳත්. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රයෝ පිණීබොජුන් තමා පිණිස විනවා වැළඳූහු දැ''යි කවරකුහට මිහිරිද්දය නො මැනවිද? කවරකුහට රසවත්ද්දය නො රුස්නේ දැ යි. භික්ෂූහු ලමු කොට සිතන, නුගුණ පවසන, දෙස් පතුරුවන, ඒ මිනිසුන් ගේ (අකීර්ත්තිශබ්ද..) ඇසූහු. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් ඡබ්බග්ගිය මහණහු පිණීබොජුන් තමා පිණිස විනවා වැළඳූහු දැ යි ... සැබෑද මහණෙනි, තෙපි පිණීබොජුන් තමා පිණිස විනවා වැළඳූහු දැ යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් හිස් පුරුෂයෙනි; තෙපි පිණීබොජුන් තමා පිණිස විනවා වැළඳූහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන් ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි....

මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**''යම්බඳු ඒ පිණීබොජුන් එනම්:- ගිතෙල්, වෙඬරු, තෙල්, මී, උක්සකුරු, දියමස්, ගොඩමස්, කිරි, දී, යන එබඳු වූ පිණීබොජුන් යම් මහණෙක් තමා පිණිස විනවා වළඳන්නේ නම් පචිති වේ'' යයි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් භික්ෂූන්ට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

2. තෙන ඛො පන සමයෙන භික්ඛූ ගිලානා හොන්ති ගිලානපුච්ඡකා භික්ඛූ ගිලානෙ භික්ඛූ එතදවොචුං: කච්චි ආවුසො ඛමනීයං කච්චි යාපනීය''න්ති. පුබ්බෙ මයං ආවුසො පණීතභොජනානි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජාම තෙන නො ඵාසු හොති ඉදානි පන භගවතා පටික්ඛිත්තන්ති කුක්කුච්චායන්තා න විඤ්ඤාපෙම තෙන නො න ඵාසු හොතීති. භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. අනුජානාමි භික්ඛවෙ ගිලානෙන භික්ඛුනා පණීතභොජනානි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජිතුං'' එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**''යානි ඛො පන තානි පණීතභොජනානි සෙය්‍යථීදං : සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං මච්ඡො මංසං ඛීරං දධි. යො පන භික්ඛු එවරූපානි පණීතභොජනානි අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය පාචිත්තිය''න්ති.**

3. **යානි ඛො පන තානි පණීතභොජනානීති:** **සප්පි** නාම : ගොසප්පි වා අජිකාසප්පි වා මාහිසං[1] වා සප්පි යෙසං මංසං කප්පති තෙසං සප්පි. **නවනීතං** නාම: තෙසඤ්ඤෙව නවනීතං. **තෙලං** නාම : තිලතෙලං සාසපතෙලං මධුකතෙලං එරණ්ඩකතෙලං වසාතෙලං. **මධු** නාම : මක්ඛිකා මධු. **ඵාණිතං** නාම : උච්ඡුම්හා නිබ්බත්තං. **මච්ඡො** නාම : ඕදකො[2] වුච්චති. **මංසං** නාම : යෙසං මංසං කප්පති තෙසං මංසං. **ඛීරං** නාම : ගොඛීරං වා අජිකාඛීරං වා මාහිසං වා ඛීරං, යෙසං මංසං කප්පති තෙසං ඛීරං. **දධි** නාම : තෙසඤ්ඤෙව දධි.

**යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**එවරූපානි පණීතභොජනානීති:** තථාරූපානි පණීතභොජනානි.

**අගිලානො** නාම : යස්ස විනා පණීතභොජනා[3] ඵාසු හොති.

**ගිලානො** නාම : යස්ස විනා පණීතභොජනා න ඵාසු හොති.

අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙති පයොගෙ[4] දුක්කටං. පටිලාභෙන භුඤ්ජිස්සාමීති පතිගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස.

---

1. මහිංසසප්පි වා - මජසං.
2. උදකචරො - මජසං.
3. පණීත භොජනානි - මජසං.
4. පයොගෙ පයොගෙ - මජසං.

2. එසමයෙහි වනාහි භික්ෂූහු ගිලන් වෙති. ගිලනුන් පුළුවුස්නා භික්ෂූහු ගිලන් භික්ෂූන්ට මෙය කීහු: "කිම ඇවැත්නි, ඉවසිය හැකි ද යැපිය හැකි දැ"යි. "ඇවැත්නි, ඇපි පෙර පිණීබොජුන් තමා පිණිස විනවා වළඳමහ. එයින් අපට පහසු වෙයි. දැන් වූ කලි භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රතික්ෂේප කරන ලද යි කුකුස් කරනුවෝ නො විනවමහ. එයින් අපට පහසු නො වේ. භාග්‍යවත්හට මෙකරුණ දැන්වූහ. එකල් හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණෙහි ලා මෙ අවසරයෙහි ලා දැහැමි කථා කොට මහණුන් ඇමතුසේක. "මහණෙනි, ගිලන් මහණහු විසින් පිණීබොජුන් තමා පිණිස විනවා වළඳන්නට අනුදනිමි" මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවූ;

**"යම්බඳු ඒ පිණීබොජුන් එනම්: ගිතෙල්, වෙඬරු, තෙල්, මී, උක් සකුරු, දියමස්, ගොඩමස්, කිරි දී යන එබඳු වූ පිණීබොජුන් යම් මහණෙක් නොගිලන් වැ තමා පිණිස විනවා වළඳන්නේ නම් පචිති වේ" යයි.**

3. **යානි ඛො පන තානි පණීතභොජනානි: සප්පි** නම් එළගිතෙල් හෝ එළුගිතෙල් හෝ මිහිගිතෙල් හෝ යැ. යම් කෙනකුන්ගේ මස් කැප නම් ඔවුන්ගේ ගිතෙල. **නවනීත** නම්: ඔවුන්ගේ මැ වෙඬරු. **තෙල** නම්: තලතෙල්, අබතෙල්, මීතෙල්, එරඬුතෙල්, වූරුණුතෙල. **මධු නම්**: මීමැසි මී. **ඵාණිත** නම්: උක්ගසින් නිපදවනලද යැ. **මච්ඡ නම්**: දියෙහි හටගත් මසැ යි කියනු ලැබේ. **මංස** නම්: යම් කෙනකුන්ගේ මස් කැප නම් ඔවුන් ගේ මස. **ඛීර** නම්: එළකිරි හෝ එළුකිරි හෝ මීකිරි හෝ යි, යම් කෙනකුන්ගේ මස් කැප නම් ඔවුන් ගේ කිරි. **දධි නම්**: ඔවුන් ගේ මැ දිහි.

**යො පන**: යම්, යම්බඳු ... **භික්ඛු** ... මෙ තෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**එවරූපානි පණීතභොජනානි:** එබඳු වූ පිණීබොජුන්.

**අගිලාන නම්:** යමකුහට පිණීබොජුනෙන් වෙන් වැ පහසු වේ නම් හේ යැ.

7. **ගිලාන නම්:** යමකුහට පිණීබොජුනෙන් වෙන් වැ පහසු නො වේ නම් හේ යැ.

නොගිලන් වූයේ තමා පිණිස විනවා නම් පියෝහි දුකුළා ඇවැත් වෙයි. ලැබීමෙන් වළඳන්නෙමැ යි පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරගලායෙහි පරගලායෙහි පචිති ඇවැත් වේ.

අගිලානො අගිලානසඤ්ඤී පණීතභොජනානි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස. අගිලානො වෙමතිකො පණීතභොජනානි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස. අගිලානො ගිලානසඤ්ඤී පණීතභොජනානි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස

ගිලානො අගිලානසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. ගිලානො වෙමතිකො ආපත්ති දුක්කටස්ස. ගිලානො ගිලානසඤ්ඤී අනාපත්ති

**අනාපත්ති:** ගිලානස්ස ගිලානො හුත්වා විඤ්ඤාපෙත්වා අගිලානො භුඤ්ජති, ගිලානස්ස සෙසකං භුඤ්ජති ඤාතකානං පවාරිතානං අඤ්ඤස්සත්ථාය අත්තනො ධනෙන උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**පණීතභොජනසික්ඛාපදං නවමං.**

## 6. 4. 10

## දන්තපොනසික්ඛාපදං.

1. තෙන සමයෙන බුද්ධො භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සබ්බපංසුකූලිකො සුසානෙ විහරති සො මනුස්සෙහි දීයමානං න ඉච්ඡති පටිග්ගහෙතුං සුසානෙපි රුක්ඛමූලෙපි උම්මාරෙපි අය්‍යවොසාටිකතානි[1] සාමං ගහෙත්වා පරිභුඤ්ජති මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛු අම්හාකං අය්‍යවොසාටිකතානි සාමං ගහෙත්වා පරිභුඤ්ජිස්සති. ථෙරොයං භික්ඛු වග්ඝරො මනුස්සමංසං මඤ්ඤෙ ඛාදතී"ති අස්සොසුං ඛො භික්ඛු තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛු අප්පිච්ඡා –පෙ– තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති; "කථං හි නාම භික්ඛු අදින්නං මුඛද්වාරං ආහාරං ආහරිස්සතී"ති –පෙ– සච්චං කිර ත්වං භික්ඛු අදින්නං මුඛද්වාර ආහාරං ආහරසීති. සච්චං භගවා, විගරහි බුද්ධො භගවා –පෙ– කථං හි නාම ත්වං මොඝපුරිස, අදින්නං මුඛද්වාරං ආහාරං ආහරිස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදය –පෙ– එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු අදින්නං මුඛද්වාරං ආහාරං ආහාරෙය්‍ය පාචිත්තිය"න්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

1. අය්‍යවොසාටිතකානි - මජසං.

නොගිලන් වූයේ නොගිලන් සන් ඇති වැ පිණීබොජුන් තමා පිණිස විනවා වළඳා නම් පචිති ඇවැත් වෙයි. නොගිලන් වූයේ විමති ඇති වැ පිණීබොජුන් තමා පිණිස විනවා වළඳා නම් පචිති ඇවැත් වෙයි. නොගිලන් වූයේ ගිලන්සන් ඇති වැ පිණීබොජුන් තමා පිණිස විනවා වළඳා නම් පචිති ඇවැත් වේ.

ගිලන් වූයේ නොගිලන්සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. ගිලන් වූයේ විමති ඇති යේ නම් දුකුළා ඇවැත් වෙයි. ගිලන් වූයේ ගිලන්සන් ඇතියේ නම් ඇවැත් නැති.

ගිලනාහට, ගිලන් වැ විනවා නොගිලන් වූයේ වළඳා නම්, ගිලනාගේ ඉතිරිද්දය වළඳා නම් නෑයන්ගේ නම් පැවැරුණුවන්ගේ නම් මෙරමා පිණිස නම් තමන්ගේ ධනයෙන් නම් ඇවැත් නැත. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**නව වැනි පණීතභොජන ශික්ෂාපද යි.**

## 6. 4. 10

## දන්තපොන ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු **විසල් පුර කූළාරහල්හි** වැඩැවෙසෙති. එසමයෙහි වනාහි එක්තරා මහණෙක් සර්වපාංශුකූලික වූයේ සොහොනෙහි වෙසෙයි. හෙතෙම මිනිසුන් විසින් දෙනු ලබන්නක් පිළිගන්නට නො කැමැති වෙයි. සොහොනෙහි දු රුක්මුලෙහි දු එළිපත්තෙහි දු මළගිය නෑයන් උදෙසා තබන පිඩු තෙමෙ මැ ගෙනැ වළඳ යි. මිනිස්සු ලාමක කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත් : ''කෙසේ නම් මේ මහණ අපගේ මළගිය නෑයන් උදෙසා තබන පිඩු තෙමෙ මැ ගෙනැ වැළඳී''ද යි. මේ මහණ තර වට සිරිරි ඇතියෙක. මිනීමස් කතීයි හඟිමු. භික්ෂූහු ලාමක කොට සිතන, නුගුණ පවසන, දෙස් පතුරුවන, ඒ මිනිසුන්ගේ (අකීර්ත්තිශබ්දය) ඇසූහු. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලාමක කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත් : ''කෙසේ නම් මහණෙක් නො පිළිගත් අහරක් පරගලා කෙළේ ද''යි ... සැබෑද මහණ, තෙපි නො පිළිගත් අහරක් පරගලා කරවු ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් හිස් පුරුෂය, තෙපි නො පිළිගත් අහරක් පරගලා කළහු ද? හිස් පුරුෂය, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි. ... මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු :

**''යම් මහණෙක් නො පිළිගත් අහරක් ගලබිලයට ගන්නේ නම් පචිති වේ'' යයි.**

මෙසේත් භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්ට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

2. තෙන ඛො පන සමයෙන භික්ඛූ උදකදන්තපොනෙ කුක්කුච්චායන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. "අනුජානාමි භික්ඛවෙ අදින්නං උදකදන්තපොනං සාමං ගහෙත්වා පරිභුඤ්ජිතුං." එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු අදින්නං මුඛද්වාරං ආහාරං ආහරෙය්‍ය අඤ්ඤත්‍ර උදකදන්තපොනා පාචිත්තිය"න්ති.**

3 **යො පනාති:** යො යාදිසො -පෙ- භික්ඛූති -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**අදින්නං** නාම: අපටිග්ගහිතකං වුච්චති. **දින්නං** නාම: කායෙන වා කායපටිබද්ධෙන වා නිස්සග්ගියෙන වා දෙන්තෙ හත්ථපාසෙ ඨිතො කායෙන වා කායපටිබද්ධෙන වා පතිගණ්හාති එතං දින්නං නාම.

**ආහාරො** නාම: උදකදන්තපොනං ඨපෙත්වා යං කිඤ්චි අජ්ඣොහරණීයං එසො ආහාරො නාම.

**අඤ්ඤත්‍ර උදකදන්තපොනාති:** ඨපෙත්වා උදකදන්තපොනං ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පතිගණ්හාති ආපත්ති දුක්කටස්ස, අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාචිත්තියස්ස.

අපටිග්ගහිතකෙ අපටිග්ගහිතකසඤ්ඤී අදින්නං මුඛද්වාරං ආහාරං ආහරති[1] අඤ්ඤත්‍ර උදකදන්තපොනා ආපත්ති පාචිත්තියස්ස. අපටිග්ගහිතකෙ වෙමතිකො අදින්නං මුඛද්වාරං ආහාර ආහරති අඤ්ඤත්‍ර උදකදන්තපොනා ආපත්ති පාචිත්තියස්ස. අපටිග්ගහිතකෙ පටිග්ගහිතකසඤ්ඤී අදින්නං මුඛද්වාරං ආහාරං ආහරති අඤ්ඤත්‍ර උදකදන්තපොනා ආපත්ති පාචිත්තියස්ස.

පටිග්ගහිතකෙ අපටිග්ගහිතකසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. පටිග්ගහිතකෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. පටිග්ගහිතකෙ පටිග්ගහිතකසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** උදකදන්තපොනෙ චත්තාරි මහාවිකටානි[2] සති පච්චයෙ අසති කප්පියකාරකෙ සාමං ගහෙත්වා පරිභුඤ්ජති, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**දන්තපොනසික්ඛාපදං දසමං.**

**භොජනවග්ගො චතුත්ථො.**

**තස්සුද්දානං:**

පිණ්ඩො ගණං පරං පූවං ද්වෙ ච වුත්තා පවාරණා
විකාලෙ සන්නිධී ඛීරං දන්තපොනෙන තෙ දසාති.

---

1. ආහාරෙති - මජසං.
2. මහාවිකතානි - මජසං.

2. එසමයෙහි වනාහි භික්ෂූහු දැහැටි පැන්හි කුකුස් කරති. භාග්‍යවත්හට මෙකරුණ දැන්වූහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙහි ලා මෙ අවසරයෙහි ලා දැහැමි කථා කොට භික්ෂූන් ඇමැතූසේක. ''මහණෙනි, නො පිළිගන්වන ලද දැහැටිපැන් තෙමේ මැ ගෙනැ වළඳන්නට අනුදනිමි''. මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**''යම් මහණෙක් දැහැටි පැන් තබා නො පිළි ගන්වන ලද අහරක් ගලබිලයට ගන්නේ නම් පචිති වේ'' යයි.**

3. **යො පන:** යම්, යම්බඳු ... භිකුු ... මේ තෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**අදින්න නම්:** නො පිළිගන්වනලද්ද යි කියනු ලැබේ. **දින්න නම්:** කයින් හෝ කය පිළිබද්දෙන් හෝ නිසැගියෙන් හෝ දෙන කල්හි අත්පසැ සිටියේ කයින් හෝ කය පිළිබද්දෙන් හෝ පිළිගනී නම් තෙලෙ දෙනලද්ද නම් වේ.

**ආහාර නම්:** දැහැටි පැන් තබා යම් කිසි පරගලා කළයුතු දෑයෙකි, මේ යැ ආහාර නම්.

**අඤ්ඤත්‍ර උදකදන්ත පොනා:** දැහැටි පැන් තබා කන්නෙමි බුදින්නෙමි යි පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරගලායෙහි පරගලායෙහි පචිති ඇවැත් වේ.

නො පිළිගත් දෑයෙහි නො පිළිගත්සන් ඇතියේ දැහැටි පැන් තබා නොදුන් අහරක් ගලබිලයට ගනී නම් පචිති ඇවැත් වෙයි. නො පිළිගත් දෑයෙහි විමති ඇතියේ දැහැටි පැන් තබා නො දුන් අහරක් ගලබිලයට ගනී නම් පචිති ඇවැත් වෙයි. නො පිළිගත් දෑයෙහි පිළිගත්සන් ඇතියේ දැහැටි පැන් තබා නො දුන් අහරක් ගලබිලයට ගනී නම් පචිති ඇවැත් වේ.

පිළිගත් දෑයෙහි නො පිළිගත්සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. පිළිගත් දෑයෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. පිළිගත් දෑයෙහි පිළිගත්සන් ඇතියේ නම් ඇවැත් නැති.

දැහැටි පැන්හි, සතර මහාවිකටයන් කැපකරුවකු නැති සඳ කරුණක් ඇති කල්හි තෙමේ මැ ගෙනැ වළඳා නම් ඇවැත් නැත. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**දසවැනි දන්තපොන ශික්ෂාපද යි.**

## චතුර්ථ භොජනවර්ග යි.

**එහි උදනය:**

ආවසථපිණ්ඩ යැ ගණභොජන යැ පරම්පරභොජන යැ කාණමාතු යැ පඨමපවාරණ දුතියපවාරණ දෙක යැ විකාලභොජන යැ සන්නිධිකාරක යැ පණීතභොජන යැ දන්තපොනය සමඟ වදළ ඒ සිකපද දශයෙකි.

## 6. 5. 1

### අචෙලකසික්ඛාපදං.

1. තෙන සමයෙන බුද්ධො භගවා වෙසාලියං විහරති මහාවනෙ කූටාගාරසාලායං තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස ඛාදනීයං උස්සන්නං හොති. අථ ඛො ආයස්මා ආනන්දො භගවතො එතමත්ථං ආරොචෙසි තෙනහානන්ද විඝාසාදනං පූවං දෙහීති. එවං භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුණිත්වා විඝාසාදෙ පටිපාටියා නිසීදපෙත්වා එකෙකං පූවං දෙන්තො අඤ්ඤතරිස්සා පරිබ්බාජිකාය එකං මඤ්ඤමානො ද්වෙ පූවෙ අදාසි. සාමන්තා පරිබ්බාජිකායො තං පරිබ්බාජිකං එතදවොචුං. "ජාරො තෙ එසො සමණො"ති. න මෙ සො සමණො ජාරො එකං මඤ්ඤමානො ද්වෙ පූවෙ අදාසීති දුතියම්පි ඛො ... තතියම්පි ඛො ආයස්මා ආනන්දො එකෙකං පූවං දෙන්තො තස්සායෙව පරිබ්බාජිකාය එකං මඤ්ඤමානො ද්වෙ පූවෙ අදාසි. සාමන්තා පරිබ්බාජිකායො තං පරිබ්බාජිකං එතදවොචුං. "ජාරො තෙ එසො සමණො"ති. න මෙසො සමණො ජාරො එකං මඤ්ඤමානො ද්වෙ පූවෙ අදාසීති. ජාරො න ජාරොති භණ්ඩිංසු.

2. අඤ්ඤතරොපි ආජීවිකො පරිවෙසනං අගමාසි. අඤ්ඤතරො භික්ඛු පහූතෙන සප්පිනා ඔදනං මද්දිත්වා තස්ස ආජීවිකස්ස මහන්තං පිණ්ඩං අදාසි. අථ ඛො සො ආජීවිකො තං පිණ්ඩං අදය අගමාසි. අඤ්ඤතරො ආජීවිකො තං ආජීවිකං එතදවොච. "කුතො තයා ආවුසො පිණ්ඩො ලද්ධො"ති තස්සාවුසො සමණස්ස ගොතමස්ස මුණ්ඩගහපතිකස්ස පරිවෙසනාය ලද්ධොති. අස්සොසුං ඛො උපාසකා තෙසං ආජීවිකානං ඉමං කථාසල්ලාපං අථ ඛො තෙ උපාසකා යෙන භගවා තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. එකමන්තං නිසින්නා ඛො තෙ උපාසකා භගවන්තං එතදවොචුං. "ඉමෙ භන්තෙ තිත්ථියා අවණ්ණකාමා බුද්ධස්ස අවණ්ණකාමා ධම්මස්ස අවණ්ණකාමා සඞ්ඝස්ස, සාධු භන්තෙ අය්‍යා තිත්ථියානං සහත්ථා න දදෙය්‍යුන්ති. අථ ඛො භගවා තෙ උපාසකෙ ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. අථ ඛො තෙ උපාසකා භගවතා ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කමිංසු.

## 6. 5. 1

## අචෙලක ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු විසල් පුර මහවෙනෙහි කූළාර හල්හි වැඩවෙසෙති, එසමයෙහි වනාහි සඟනට කැවිලි බහුල වූයේ වෙයි, එකල්හි ආයුෂ්මත් ආනන්‍ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැලකළහ. එසේ වී නම් ආනන්‍දයෙනි, ඉඳුල් කන්නවුනට කැවුම් දෙව යි. එසේ යැ වහන්සැ යි ආයුෂ්මත් ආනන්‍ද තෙරණුවෝ භාග්‍යවතුන්ට පිළිවදන් දී ඉඳුල් කන්නවුන් පිළිවෙළින් හිඳුවා එක් එක් කැවුමක් දෙන්නාහු එක්තරා පිරිවැජිය කට එකෙකැ යි හඟිමින් දෙ කැවුමක් දුන්හ. අවට පිරිවැජිනියෝ එපිරිවැජිනියට මෙය කීහු. ''තෙල මහණ තීගේ සොර සැමි දැ''යි තෙල මහණ මාගේ සොර සැමි නො වෙයි, එකෙකැ යි හඟිමින් දෙ කැවුමක් දුන් වනැ යි. දෙවනවට ද ... තෙවනවට ද ආයුෂ්මත් ආනන්‍ද තෙරණුවෝ එක් එක් කැවුමක් දෙන්නෝ එ මැ පිරිවැජිනියට එකෙකැ යි හඟිමින් දෙ කැවුමක් දුන්හ, අවට පිරිවැජිනියෝ එපිරිවැජි නියට මෙය කීහු; ''තෙල මහණ තීගේ සොරසැමි''දැ යි තෙල මහණ මාගේ සොරසැමි නො වෙයි, එකෙකැ යි හඟිමින් දෙ කැවුමක් දුන් වනැ යි. සොරසැමි යැ නො සොරසැමි'' යැ යි ඩබර කළහ.

2. එක්තරා ආජීවකයෙක් ද දන් වළඳන තැනට ගියේ ය. එක්තරා මහණෙක් බොහෝ වූ ගිතෙලින් බත් හනා මහත් පිඩුවක් ඒ ආජීවකයාට දුන්නේ යැ. එකල්හි ඒ ආජීවක තෙමේ ඒ බත් පිඩුව රැගෙන ගියේ යි. එක්තරා ආජීවකයෙක් ඒ ආජීවකයාට මෙය කී යැ. ''ඇවැත්නි, තා විසින් පිඩු කොයින් ලබන ලද'' දැ යි ඇවැත්නි, ඒ මුඩුගැහැවි මහණගොයුම්හුගේ දන් වළඳනා තෙනින් ලදිමි, උවසුවෝ ඒ ආජීවකයන්ගේ මෙ කථාසල්ලාපය ඇසූහු, එකල්හි ඒ උවසුවෝ භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වැඳ එකත් පසෙකැ හුන්හු, එකත් පසෙකැ හුන් ඒ උවසුවෝ භාග්‍යවතුන්හට මෙය කීහු. ''ස්වාමීනි, මේ අන්තොටුවෝ බුදුනට ගරහනු කැමැතියෝ දහමට ගරහනු කැමැතියෝ සඟනට ගරහනු කැමැතියෝ යි, ස්වාමීනි, ආර්‍යයෝ අන්තොටුවනට සියතින් යමක් නො දෙන්නහු නම් මැනැවැ යි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ දැහැමි කථායෙන් ඒ උවසුවනට (දෙලෝවැඩ) මොනවට දැක්වූ සේක. (කුසල්දහම්හි) සමාදන් කරවූ සේක. මොනවට තෙද ගැන්වූ සේක, මොනවට සතුටු කරවූ සේකි. එකල්හි ඒ උවසුවෝ භාග්‍යවතුන් විසින් දැහැමි කථායෙන් මොනවට දක්වන ලදුවෝ මොනවට සමාදන් කරවන ලදුවෝ මොනවට තෙද ගන්වන ලදුවෝ මොනවට සතුටු කරවන ලදුවෝ හුනස්නෙන් නැඟිට භාග්‍යවතුන් සකසා වැඳ පැදකුණු කොට ගියහ.

3. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. තෙන හි භික්ඛවෙ භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤාපෙස්සාමි, දස අත්ථවසෙ පටිච්ච සංඝසුට්ඨුතාය –පෙ– සද්ධම්මට්ඨිතියා විනයානුග්ගහාය. එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු අචෙලකස්ස වා පරිබ්බාජකස්ස වා පරිබ්බාජිකාය වා සහත්ථා ඛාදනීයං වා භොජනීයං වා දදෙය්‍ය පාචිත්තිය"න්ති.**

4. **යො පනාති:** යො යාදිසො –පෙ– **භික්ඛූති** –පෙ– අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති. **අචෙලකො** නාම: යො කොචි පරිබ්බාජක සමාපන්නො නග්ගො. **පරිබ්බාජකො** නාම: භික්ඛුඤ්ච සාමණෙරඤ්ච ඨපෙත්වා යො කොචි පරිබ්බාජකසමාපන්නො. **පරිබ්බාජිකා** නාම; භික්ඛුනිඤ්ච සික්ඛමානඤ්ච සාමණෙරිඤ්ච ඨපෙත්වා යා කාචි පරිබ්බාජික සමාපන්නා. **ඛාදනීයං** නාම: පඤ්චභොජනානි උදකදන්තපොනං ඨපෙත්වා අවසෙසං ඛාදනීයං නාම **භොජනීයං** නාම: පඤ්චභොජනානි ඔදනො කුම්මාසො සත්තු මච්ඡො මංසං. **දදෙය්‍යාති:** කායෙන වා කායපටිබද්ධෙන වා නිස්සග්ගියෙන වා දෙති ආපත්ති පාචිත්තියස්ස.

තිත්ථියෙ තිත්ථියසඤ්ඤී සහත්ථා ඛාදනීයං වා භොජනීයං වා දෙති ආපත්ති පාචිත්තියස්ස. තිත්ථියෙ වෙමතිකො සහත්ථා ඛාදනීයං වා භොජනීයං වා දෙති ආපත්ති පාචිත්තියස්ස. තිත්ථියෙ අතිත්ථියසඤ්ඤී සහත්ථා ඛාදනීයං වා භොජනීයං වා දෙති ආපත්ති පාචිත්තියස්ස.

උදකදන්තපොනං දෙති ආපත්ති දුක්කටස්ස. අතිත්ථියෙ තිත්ථියසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අතිත්ථියෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස අතිත්ථියෙ අතිත්ථියසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** දාපෙති න දෙති උපනික්ඛිපිත්වා දෙති බාහිරාලෙපං දෙති උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**අචෙලක සික්ඛාපදං පඨමං.**

3. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙහි ලා මෙ අවසරයෙහි ලා දැහැමි කථා කොට මහණුන් ඇමැතූසේක. එසේ වී නම් මහණෙනි, කරුණු දසයක් පිණිස මහණුන්හට සිකපද පනවන්නෙමි. සඟුන්ගේ මනා පිළිගැනුම, සඟුන්ගේ පහසුබව ... සසුන් පැවැත්ම, විනයට රුකුල් දීම පිණිස යැ. මෙසේත් මහණෙනි, මේ සිකපදය උදෙසවූ:

**"යම් මහණෙක් නිවටක්හට හෝ පිරිවැජියකුට හෝ පිරිවැජියකට හෝ සියතින් කෑයුතු දූයක් හෝ බිදියයුතු දූයක් හෝ දෙන්නේ නම් පචිති වේ"යයි.**

4. **යො පන:** යම්, යම්බඳු ... භිකචු ... මෙතෙම් මේ අර්‍ථයෙහි ලා අදහස් කරනලද භික්ෂු යි; **අචෙලක** නම්: යම් කිසි පිරිවැජිබවට පැමිණි නිරිවතෙකි. **පරිබ්බාජික** නම් මහණ ද හෙරණ ද තබා යම් කිසි පිරිවැජිබවට පැමිණියෙකි. **පරිබ්බාජිකා නම්:** මෙහෙණ ද සික්මනුව ද හෙරණිය ද තබා යම් කිසි පිරිවැජිබවට පැමිණියකි. **ඛාදනීය** නම්; පස් බොජුන් දූහැවූ පැන් තබා අවශෙෂය ඛාදනීය නම් වෙයි.

**භොජනීය** නම්; බත් යැ කොමුපිඩු යැ අත්සුණු යැ දියමස් යැ ගොඩ මස් යැ යන පස්බොජුනි. **දදෙයය:** කයින් හෝ කයපිළිබද්දෙන් හෝ නිසැගියෙන් හෝ දේ නම් පචිති ඇවැත් වේ.

තීර්‍ථිකයා කෙරෙහි තීර්‍ථිකසංඥා ඇතියේ සියතින් කෑයුතු දූයක් හෝ බිදියයුතු දූයක් හෝ දේ නම් පචිති ඇවැත් වෙයි. තීර්‍ථිකයා කෙරෙහි විමති ඇතියේ සියතින් කෑයුතු දූයක් හෝ බිදිය යුතු දූයක් හෝ දේ නම් පචිති ඇවැත් වෙයි. තීර්‍ථිකයා කෙරෙහි අතීර්‍ථිකසංඥා ඇතියේ සියතින් කෑයුතු දූයක් හෝ බිදියයුතු දූයක් හෝ දේ නම් පචිති ඇවැත් වේ.

දූහැවූ පැන් දේ නම් දුකුලා ඇවැත් වෙයි. අතීර්‍ථිකයා කෙරෙහි තීර්‍ථිකසංඥා ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අතීර්‍ථිකයා කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අතීර්‍ථිකයා කෙරෙහි අතීර්‍ථිකසංඥා ඇතියේ නම් ඇවැත් නැති.

දෙවා නම් නො දේ නම් වෙතැ තබා දේ නම් බැහැරි ගැල්වීමක් දේ නම් ඇවැත් නැත, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**අචෙලක ශික්‍ෂාපදය නිමි.**

## 6. 5. 2

## උය්‍යොජනසික්ඛාපදං

1 තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **උපනන්දො** සක්‍යපුත්තො භාතුනො සද්ධිවිහාරිකං භික්ඛුං එතදවොච: "එහාවුසො ගාමං පිණ්ඩාය පවිසිස්සාමා"ති. තස්ස අදාපෙත්වා උය්‍යොජෙසි "ගච්ඡාවුසො න මෙ තයා සද්ධිං කථා වා නිසජ්ජා වා ඵාසු හොති. එකකස්ස මෙ කථා වා නිසජ්ජා වා ඵාසු හොතී"ති. අථ ඛො සො භික්ඛු උපකට්ඨෙ කාලෙ නාසක්ඛි පිණ්ඩාය චරිතුං පටික්කමනෙපි භත්තවිස්සග්ගං න සම්භාවෙසි. ඡින්නභත්තො අහොසි.

2. අථ ඛො සො භික්ඛු ආරාමං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති, විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා උපනන්දො සක්‍යපුත්තො භික්ඛුං එහාවුසො ගාමං පිණ්ඩාය පවිසිස්සාමාති තස්ස අදාපෙත්වා උය්‍යොජෙස්සතී"ති -පෙ- සච්චං කිර ත්වං උපනන්ද භික්ඛුං එහාවුසො ගාමං පිණ්ඩාය පවිසිස්සාමාති තස්ස අදාපෙත්වා උය්‍යොජෙසීති"ති සච්චං භගවා, විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම ත්වං මොඝපුරිස භික්ඛුං එහාවුසො ගාමං පිණ්ඩාය පවිසිස්සාමාති තස්ස අදාපෙත්වා උය්‍යොජෙස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු භික්ඛුං එහාවුසො ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසිස්සාමාති තස්ස දාපෙත්වා වා අදාපෙත්වා වා උය්‍යොජෙය්‍ය ගච්ඡාවුසො න මෙ තයා සද්ධිං කථා වා නිසජ්ජා වා ඵාසු හොති එකකස්ස මෙ කථා වා නිසජ්ජා වා ඵාසු හොතී ති. එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං පාචිත්තිය"න්ති.**

3. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති :** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති. **භික්ඛුන්ති:** අඤ්ඤං භික්ඛුං. **එහාවුසො ගාමං වා නිගමං වාති:** ගාමොපි නිගමොපි නගරම්පි ගාමො චෙව නිගමො ච.

## 6. 5. 2

## උයොාජන ශික්ෂාපදය

1. එසමයෙහි භගවත් බුදුහු සැවැතැ ජේතවන නම් අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර බැයාගේ සද්ධිවිහාරික භික්ෂුහට මෙය කී යැ. "එව ඇවැත්නි, ගමට පිඩු පිණිස පිවිසෙම්හ"යි, ඔහුට නො දෙවා නහා යැවී යැ: "යා ඇවැත්නි, තොප සමඟ බිණීම හෝ හිඳීම හෝ මට පහසු නො වෙයි, එකලා වූ මට බිණීම හෝ හිඳීම හෝ පහසු වේ"යයි. එකල්හි ඒ මහණ වළඳන වේලා එළඹැ සිටී කල්හි පිඩු පිණිස හැසිරෙන්නට නො හැකි වූයේ යැ. අසුන්හලෙහි ද බත්කිස නො හඹා ගත්තේ යැ සුන්බත් විය.

2. ඉක්බිති ඒ මහණ ආරාමයට ගොස් මහණුන්ට තෙල කරුණ දැන්වී යැ. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවාහු ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර "එව ඇවැත්නි, ගමට පිඩු පිණිස පිවිසෙම්හ"යි මහණක්හට කියා ඔහුට (යමක්) නො දෙවා නහා යැවී"ද යි ... සැබෑ ද උපනන්දයෙනි, තෙපි "එව ඇවැත්නි, ගමට පිඩු පිණිස පිවිසෙම්හ යි මහණක්හට කියා ඔහුට නො දෙවා නහා යැවූ ද"යි, සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු නොයෙක් අයුරින් ගැරහූ ... කෙසේ නම් හිස් පුරුෂය; තෙපි "එව ඇවත්නි, ගමට පිඩු පිණිස පිවිසෙම්හ" යි කියා ඔහුට නො දෙවා නහා යැවූහුද? හිස් පුරුෂය, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි. ... මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**"යම් මහණෙක් මහණක්හට "එව ඇවැත්නි, ගමට හෝ නියම්ගමට හෝ පිඩු පිණිස පිවිසෙම්හ"යි බැණ ඔහුට දෙවා හෝ නො දෙවා හෝ "යා ඇවැත්නි, තොප සමඟ බිණීම හෝ හිඳීම හෝ මට පහසු නො වෙයි, එකලා වූ මට බිණීම හෝ හිඳීම හෝ පහසු වේ" යයි අන් කරුණක් නො වැ මෙය මැ කරුණු කොට ගෙන නහා යවන්නේ නම් පචිති වේ" යයි.**

3. **යො පන:** යම් යම්බඳු ... **භිකබු:** ... මෙ තෙමේ මේ අර්‍ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි. **භිකබුං:** අන් මහණක්හු. **එහාවුසො ගාමං වා නිගමං වා:** ගම ද නියම්ගම ද නගරය ද ගමත් වේ නියම්ගමත් වේ.

**තස්ස දාපෙත්වාති:** යාගුං වා භත්තං වා ඛාදනීයං වා භොජනීයං වා දාපෙත්වා.

**අදාපෙත්වාති:** න කිඤ්චි දාපෙත්වා.

**උය්‍යොජෙය්‍යාති:** මාතුගාමෙන සද්ධිං හසිතුකාමො කීළිතුකාමො රහො නිසීදිතුකාමො අනාචාරං ආචරිතුකාමො එවං වදෙති: "ගච්ඡාවුසො න මෙ තයා සද්ධිං කථා වා නිසජ්ජා වා ඵාසු හොති. එකකස්ස මෙ කථා වා නිසජ්ජා වා ඵාසු හොතී''ති, උය්‍යොජෙති ආපත්ති දුක්කටස්ස දස්සනූපචාරං වා සවනූපචාරං වා විජහන්තස්ස ආපත්ති දුක්කටස්ස. විජහිතෙ ආපත්ති පාචිත්තියස්ස.

**එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤන්ති:** න අඤ්ඤො කොචි පච්චයො හොති උය්‍යොජෙතුං.

උපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී උය්‍යොජෙති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ වෙමතිකො උය්‍යොජෙති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී උය්‍යොජෙති ආපත්ති පාචිත්තියස්ස.

කලිසාසනං ආරොපෙති ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නං උය්‍යොජෙති ආපත්ති දුක්කටස්ස කලිසාසනං ආරොපෙති ආපත්ති දුක්කටස්ස.

අනුපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** උභො එකතො න යාපෙස්සාමාති උය්‍යොජෙති, මහග්ඝං භණ්ඩං පස්සිත්වා ලොභධම්මං උප්පාදෙස්සතීති උය්‍යොජෙති, මාතුගාමං පස්සිත්වා අනභිරතිං උප්පාදෙස්සතීති උය්‍යොජෙති, ගිලානස්ස වා ඔහීයකස්ස වා විහාරපාලස්ස වා යාගුං වා භත්තං වා ඛාදනීයං වා භොජනීයං වා නීහරාති උය්‍යොජෙති, න අනාචාරං ආචරිතුකාමො සති කරණීයෙ උය්‍යොජෙති උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

උය්‍යොජනසික්ඛාපදං දුතියං

**තස්ස දපෙත්වා;** හඹු හෝ බත් හෝ කෑයුතු දයක් හෝ බිදිය යුතු දයක් හෝ දෙවා,

**අදපෙත්වා;** කිසිවක් නො දෙවා,

**උය්‍යොජෙය්‍ය:** මාගමක සමඟ සෙනු කැමැත්තේ කෙළිනු කැමැත්තේ නොරහුරෙහි හිඳිනු කැමැත්තේ නොසිරිත්හි හැසිරෙනු කැමැත්තේ මෙසේ කියා: "යා ඇවැත්නි! තොප සමඟ බිණීම හෝ හිඳීම හෝ මට පහසු නො වෙයි, එකලා වූ මට බිණීම හෝ හිඳීම හෝ පහසු වේ"යැයි නහා යවා නම් දුකුළා ඇවැත් වෙයි; දසුන් උවසර හෝ සවන් උවසර හෝ හරින්නහුට දුකුළා ඇවැත් වෙයි. හළ කල්හි පචිති ඇවැත් වේ.

**එතදෙවපච්චයං කරිත්වා අනඤ්ඤං:** නහා යවන්නට අන් කිසිදු කරුණෙක් නො වේ.

උපසපනක්හු කෙරෙහි උපසපනෙකැයි සංඥා ඇතියේ නහා යවා නම් පචිති ඇවැත් වෙයි. උපසපනක්හු කෙරෙහි විමති ඇතියේ නහා යවා නම් පචිති ඇවැත් වෙයි. උපසපන්නක්හු කෙරෙහි අනුපසපනෙකැයි සංඥා ඇතියේ නහා යවා නම් පචිති ඇවැත් වේ.

එරෙහි බස් නහා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු නහා යවා නම් දුකුළා ඇවැත් වෙයි. එරෙහි බස් නහා නම් දුකුළා ඇවැත් වෙයි.

අනුපසපනක්හු කෙරෙහි උපසපනෙකැයි සංඥා ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි, අනුපසපනක්හු කෙරෙහි අනුපසපන්සඤ් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි.

දෙදෙන එක් වැ නො යැපෙන්නම්හ යි නහා යවා නම් මාඇඟි බඩුවක් දකැ ගිජුකම උපදවන්නේ යයි නහා යවා නම්, මාගමක දකැ උකටළිය උපදවන්නේ යැයි නහා යවා නම්, ගිලනුනට හෝ නැවතී සිටින්නහුට හෝ වෙහෙර රක්නහුට හෝ හඹු හෝ බත් හෝ කෑයුතු දයක් හෝ බිදියයුතු දයක් හෝ ගෙන යව යි නහා යවා නම්, නො සිරිත්හි නො හැසිරෙනු කැමැත්තේ කරුණක් ඇති කල්හි නහා යවා නම් ඇවැත්නැති, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**දෙවැනි උය්‍යොජන ශික්ෂාපද යි**

## 6. 5. 3

## සභොජන සික්ඛාපදං

1 තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා උපනන්දො සක්‍යපුත්තො සහායස්ස ඝරං ගන්ත්වා තස්ස පජාපතියා සද්ධිං සයනිඝරෙ නිසජ්ජං කප්පෙසි. අථ ඛො සො පුරිසො යෙනායස්මා උපනන්දො සක්‍යපුත්තො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො සො පුරිසො පජාපතිං එතදවොච. "දෙහය්‍යස්ස[1] භික්ඛ"න්ති. අථ ඛො සා ඉත්ථී ආයස්මතො උපනන්දස්ස සක්‍යපුත්තස්ස භික්ඛං අදාසි අථ ඛො සො පුරිසො ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං එතදවොච: "ගච්ඡථ භන්තෙ යතො අය්‍යස්ස භික්ඛා දින්නා"ති. අථ ඛො සා ඉත්ථී සල්ලක්ඛෙත්වා පරියුට්ඨිතො අයං පුරිසොති ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං එතදවොච. "නිසීදථ භන්තෙ මා අගමිත්ථා"ති දුතියම්පි ඛො සො පුරිසො -පෙ- තතියම්පි ඛො සො පුරිසො ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං එතදවොච; "ගච්ඡථ භන්තෙ යතො අය්‍යස්ස භික්ඛා දින්නා"ති. තතියම්පි ඛො සා ඉත්ථී ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං එතදවොච: "නිසීදථ භන්තෙ මා අගමිත්ථා"ති.

2 අථ ඛො සො පුරිසො නික්ඛමිත්වා භික්ඛූ උජ්ඣාපෙසි. "අයං භන්තෙ අය්‍යො උපනන්දො මය්හං පජාපතියා සද්ධිං සයනිඝරෙ නිසින්නො සො මයා උය්‍යොජියමානො න ඉච්ඡති. ගන්තුං බහුකිච්චා මයං බහුකරණීයා"ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ආයස්මා උපනන්දො සක්‍යපුත්තො සභොජනෙ කුලෙ අනුපඛජ්ජ නිසජ්ජං කප්පෙස්සතී"ති -පෙ- සච්චං කිර ත්වං උපනන්ද සභොජනෙ කුලෙ අනුපඛජ්ජ නිසජ්ජං කප්පෙසීති සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම ත්වං මොඝපුරිස සභොජනෙ කුලෙ අනුපඛජ්ජ නිසජ්ජං කප්පෙස්සසි, නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

**යො පන භික්ඛු සභොජනෙ කුලෙ අනුපඛජ්ජ නිසජ්ජං කප්පෙය්‍ය පාචිත්තියන්ති.**

1. දෙහායාස්ස-මජසං.

## 6. 5. 3

## සභොජන ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ අනේපිඩු සිටුහුගේ ජේතවන නම් අරම්හි වැඩැ වෙසෙති. එසමයෙහි ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර යහළුවක්හුගේ ගෙට ගොස් ඔහුගේ අඹුව සමඟ යහන්ගෙයි හිඳීම කෙළේයැ. එකල්හි ඒ පුරුෂ තෙමේ ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍රයා වෙත එළැඹියේයැ, එළැඹ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයා සකසා වැඳ එකත්පසෙකැ හුන්නේ යැ, එකත් පසෙකැ හුන් ඒ පුරුෂ තෙමේ 'ආර්යයහට (වහන්දූට) භික්ෂාව දෙව' යි අඹුවට කී යැ. ඉක්බිති ඒ ස්ත්‍රී තොමෝ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයහට භික්ෂාව දුන්නී යැ, එකල්හි ඒ පුරුෂ තෙමේ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයහට මෙය කී ය. ''ආර්යයහට භික්ෂාව දෙනලද හෙයින් වහන්ස, වඩින්නැ''යි. එකල්හි ඒ ස්ත්‍රීතොමෝ ''මේ පුරුෂ රාගපර්යුත්ථිත'' යැයි සලකා ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයහට මෙය කිවුය; ''වැඩ හිඳින්න වහන්ස, නහමක් වඩින්නැ'' යි. දෙවනවටදු ඒ පුරුෂ තෙමේ......... තෙවනවටදු ඒ පුරුෂ තෙමේ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයහට මෙය කී ය: ''ආර්යහට භික්ෂාව දෙන ලද හෙයින් වහන්ස, වඩින්නැ''යි, තෙවනවටදු ඒ ස්ත්‍රී තොමෝ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයහට මෙය කිවු ය: ''වැඩැ හිඳින්නැ වහන්ස, නහමක් වඩින්නැ''යි.

2. ඉක්බිති ඒ පුරුෂ තෙමේ නික්මැ මහණුන් (හමුයෙහි) දෙස් පැවැරී යැ: ''ස්වාමීනි, මේ ආර්ය උපනන්ද තෙමේ මාගේ අඹුව සමඟ යහන්ගෙයි හුන්නේ යැ, හේ මා විසින් නභා යවනු ලබන්නේ යන්නට නො කැමැති වෙයි, ඇපි බොහෝ කිස ඇතියම්හ. බොහෝ කරණී ඇති යම්හ''යි. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස්වූවාහු..........ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්, ''කෙසේ නම් ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර තෙමේ අඹුසැමියුවළ සහිත කුලයෙකැ ඇතුළට වැද හිඳීම කෙළේ ද යි.........සැබෑද උපනන්ද, තෝ අඹුසැමියුවළ සහිත කුලයෙකැ ඇතුළට වැද හිඳීම කෙළෙහි දැයි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු නොයෙක් අයුරින් ගැරහූහ.........කෙසේ නම් හිස් පුරුෂය! තෝ අඹුසැමියුවළ සහිත කුලයෙකැ ඇතුළට වැද හිඳීම කෙළෙහි ද? හිස් පුරුෂය මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නොවෙයි.........මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු.

**යම් මහණෙක් අඹුසැමියුවළ සහිත කුලයෙකැ ඇතුළට වැද හිඳීම කරන්නේ නම් පචිති වේ යැයි.**

3. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**සභොජනං නාම කුලං;** ඉත්ථී චෙව හොති පුරිසො ච ඉත්ථී ච පුරිසො ච උභො අනික්ඛන්තා හොන්ති උභො අවීතරාගා,

**අනුපඛජ්ජාති:** අනුපවිසිත්වා.

**නිසජ්ජං කප්පෙය්‍යාති:** මහල්ලකෙ ඝරෙ පිට්ඨසංඝාටස්ස හත්ථපාසං විජහිත්වා නිසීදති ආපත්ති පාචිත්තියස්ස, ඛුද්දකෙ ඝරෙ පිට්ඨිවංසං අතික්කමිත්වා නිසීදති ආපත්ති පාචිත්තියස්ස.

සයනිඝරෙ සයනිඝරසඤ්ඤී සභොජනෙ කුලෙ අනුපඛජ්ජ නිසජ්ජං කප්පෙති ආපත්ති පාචිත්තියස්ස සයනිඝරෙ වෙමතිකො සභොජනෙ කුලෙ අනුපඛජ්ජ නිසජ්ජං කප්පෙති ආපත්ති පාචිත්තියස්ස සයනිඝරෙ න සයනිඝරසඤ්ඤී සභොජනෙ කුලෙ අනුපඛජ්ජ නිසජ්ජං කප්පෙති ආපත්ති පාචිත්තියස්ස.

න සයනිඝරෙ සයනිඝරසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. න සයනිඝරෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස න සයනිඝරෙ න සයනිඝරසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** මහල්ලකෙ ඝරෙ පිට්ඨසංඝාටස්ස හත්ථපාසං අවිජහිත්වා නිසීදති, ඛුද්දකෙ ඝරෙ පිට්ඨිවංසං අනතික්කමිත්වා නිසීදති, භික්ඛු දුතියො හොති උභො නික්ඛන්තා හොන්ති, උභො වීතරාගා න සයනිඝරෙ, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**සභොජන සික්ඛාපදං තතියං**

## 6. 5. 4

## පට්ඨිච්ඡන්නරහොනිසජ්ජ සික්ඛාපදං.

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **උපනන්දො සක්‍යපුත්තො** සහායස්ස[1] ඝරං ගන්ත්වා තස්ස පජාපතියා සද්ධිං රහො **පටිච්ඡන්නෙ** ආසනෙ **නිසජ්ජං** කප්පෙසි[2]. අථ ඛො සො පුරිසො උජ්ඣායති ඛීයති විපාචෙති. "කථං හි නාම අය්‍යො උපනන්දො මය්හං පජාපතියා සද්ධිං රහො පටිච්ඡන්නෙ ආසනෙ නිසජ්ජං කප්පෙස්සතී"ති.

1. සහායකස්ස-මජ්ඣං.
2. කප්පෙති-සී සිමු ii

3. **යො පන:** යම් යම්බඳු.........**භික්ඛු**.........මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**සභොජන කුල** නම්: ස්ත්‍රී තොමොත් වෙයි. පුරුෂ තෙමේත් වෙයි. ස්ත්‍රිය ද පුරුෂයා දූයි දෙදෙන (ගෙයින්) නො නික්මුණෝ වෙති. දෙදෙන නො පහකළ රාගඇතියෝ ද වෙත්.

**අනුපඛජ්ජ:** ඇතුළට පිවිසැ,

**නිසජ්ජං කප්පෙය්‍ය:** මහත් යහන්ගෙයකැ දෙරබාවෙහි (දෙරියන්වියත්) අත්පස හැරපියා හිඳී නම් පචිති ඇවැත් වෙයි. කුඩා යහන්ගෙයකැ ගෙමැද ඉක්මවා හිඳී නම් පචිති ඇවැත් වේ.

යහන්ගෙයි යහන්ගෙයෙකැ යන සන් ඇතියේ අඹුසැමියුවළ සහිත කුලයෙකැ ඇතුළට වැදහිඳීම කෙරේ නම් පචිති ඇවැත් වෙයි යහන්ගෙයි විමති ඇතියේ අඹුසැමියුවළ සහිත කුලයෙකැ ඇතුළට වැද හිඳීම කෙරේ නම් පචිති ඇවැත් වෙයි. යහන්ගෙයි යහන්ගෙයෙකැ යන සන් නැතියේ අඹුසැමියුවළ සහිත කුලයෙකැ ඇතුළට වැද හිඳීම කෙරේ නම් පචිති ඇවැත් වේ.

නො යහන්ගෙයි යහන්ගෙයෙකැ යන සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො යහන්ගෙයි විමතිඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො යහන්ගෙයි නො යහන්ගෙයෙකැ යන සන් ඇතියේ නම් ඇවැත් නැති.

මහත් යහන්ගෙයි දෙරබාවෙහි අත්පස නො හැරපියා හිඳී නම්, කුඩා යහන්ගෙයි ගෙමැද නො ඉක්මවා හිඳී නම්, මහණක්හු දෙවැති කොට ඇතියේ වේ නම්, දෙදෙන නික්මුණාහු වෙත් නම්, දෙදෙන පහකළ රාගඇතියෝ නම්, නො යහන්ගෙයි නම්, ඇවැත්නැති උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**තෙවැනි සභොජනශික්ෂාපදයි**

## 6. 5. 4

## පඨමරහොනිසජ්ජ ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ අනේපිඩු සිටුහුගේ ජෙතවන නම් අරම්හි වැඩැ වෙසෙති. එසමයෙහි ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර යහළුවාගේ ගෙට ගොස් ඔහුගේ ඇඹෑණිය සමඟ නොරඹුරෙහි පිළිසන් අස්නෙකැ හුන්නේ යැ. එකල්හි ඒ පුරුෂ තෙමේ ලමු කොට සිතයි, නුගුණ පවසයි, දෙස් පතුරුවයි. "කෙසේ නම් ආර්ය්‍ය උපනන්ද මාගේ ඇඹෑණිය සමග නොරඹුරෙහි පිළිසන් අස්නෙකැ හිඳීම කරන්නේ" දූයි.

2 අසෙසාසුං ඛො භික්ඛූ තස්ස පුරිසස්ස උජ්ඣායන්තස්ස ඛීයන්තස්ස විපාචෙන්තස්ස. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. "කථං හි නාම ආයස්මා උපනන්දො සක්‍යපුත්තො මාතුගාමෙන සද්ධිං රහො පටිච්ඡන්නෙ ආසනෙ නිසජ්ජං කප්පෙස්සතී"ති -පෙ- සච්චං කිර ත්වං උපනන්ද මාතුගාමෙන සද්ධිං රහො පටිච්ඡන්නෙ ආසනෙ නිසජ්ජං කප්පෙසීති. සච්චං භගවා, විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම ත්වං මොඝපුරිස මාතුගාමෙන සද්ධිං රහො පටිච්ඡන්නෙ ආසනෙ නිසජ්ජං කප්පෙස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

**යො පන භික්ඛු මාතුගාමෙන සද්ධිං රහො පටිච්ඡන්නෙ ආසනෙ නිසජ්ජං කප්පෙය්‍ය පාචිත්තියන්ති.**

3. **යො පනාති:** යො යාදිසො-පෙ- **භික්ඛූති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**මාතුගාමො** නාම; මනුස්සිත්ථී න යක්ඛී න පෙතී න තිරච්ඡානගතා අන්තමසො තදහුජාතාපි දාරිකා, පගෙව මහත්තරී. **සද්ධින්ති:** එකතො.

**රහො** නාම: චක්ඛුස්ස රහො සොතස්ස රහො. **චක්ඛුස්සරහො** නාම; න සක්කා හොති. අක්ඛිං වා නිඛණියමානෙ භමුකං වා උක්ඛිපියමානෙ සීසං වා උක්ඛිපියමානෙ පස්සිතුං. **සොතස්ස රහො** නාම: න සක්කා හොති පකති කථා සොතුං.

**පටිච්ඡන්නං** නාම; ආසනං කුඩ්ඩෙන[1] වා කවාටෙන වා කිලඤ්ජෙන වා සාණිපාකාරෙන වා රුක්ඛෙන වා ථම්භෙන වා කොත්ථලියා[2] වා යෙන කෙනචි පටිච්ඡන්නං හොති.

**නිසජ්ජං කප්පෙය්‍යාති:** මාතුගාමෙ නිසින්නෙ භික්ඛු උපනිසින්නො වා හොති උපනිපන්නො වා ආපත්ති පාචිත්තියස්ස, භික්ඛු නිසින්නෙ මාතුගාමො උපනිසින්නො වා හොති උපනිපන්නො වා ආපත්ති පාචිත්තියස්ස. උභො වා නිසින්නා හොන්ති උභො වා නිපන්නා ආපත්ති පාචිත්තියස්ස.

මාතුගාමෙ මාතුගාමසඤ්ඤී රහො පටිච්ඡන්නෙ ආසනෙ නිසජ්ජං කප්පෙති ආපත්ති පාචිත්තියස්ස. මාතුගාමෙ වෙමතිකො රහො පටිච්ඡන්නෙ ආසනෙ නිසජ්ජං කප්පෙති ආපත්ති පාචිත්තියස්ස. මාතුගාමෙ අමාතුගාමසඤ්ඤී රහො පටිච්ඡන්නෙ ආසනෙ නිසජ්ජං කප්පෙති ආපත්ති පාචිත්තියස්ස.

---

1. කුට්ටෙන වා - මජ්සං.
2. කොත්ථලිකාය - මජ්සං.

2. භික්ෂූහු ලමුකොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ පුරුෂයාගේ (අකීර්තිශබ්දය) ඇසූහු. යම් ඒ භික්ෂූ කෙනෙක් අපිස්වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්. "කෙසේ නම් ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර මාගමක සමඟ නොරඹුරෙහි පිළිසන් අස්නෙකැ හිඳීම කෙළේ" දැයි ... සැබෑ ද උපනන්දයෙනි, තෙපි මාගමක සමඟ නොරඹුරෙහි පිළිසන් අස්නෙකැ නිසද්‍යා කළවු දැයි, සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ ... කෙසේ නම් හිස් පුරුෂය! තෙපි මාගමක සමඟ නොරඹුරෙහි පිළිසන් අස්නෙකැ හුන්නහු ද? හිස් පුරුෂය, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...... මෙසේ ද වනාහි මහණෙනි, මේ සිකපදය උදෙසවු.

**යම් මහණෙක් මාගමක සමඟ නොරඹුරෙහි පිළිසන් අස්නෙකැ නිසද්‍යා කරන්නේ නම් පචිති වේ** යයි.

3. **යො පන:** යම් යම්බඳු ...භික්ෂු...මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**මාතුගාම නම්:** මිනිස්මාගම යි. යකිනි නො වෙයි. ප්‍රෙතී නො වෙයි. තිරිසන්ගිය මාගම නො වෙයි. යටත් පිරිසෙයින් එදවස උපන්නා වූ ද දැරිය යි. වැඩිහිටියක ගැන කියනුම කවරේ ද?

**සද්ධිං:** එක්වැ;

**රහො නම්:** ඇසට නො හමු යැ, කනට නො හමු යැ, ඇසට නො හමුව නම්; ඇස හෝ කසනු ලබන කල්හි බැම හෝ නහනු ලබන කල්හි හිස හෝ ඔසවනු ලබන කල්හි බලන්නට නො හැකි වෙයි. කනට නො හමුව නම්: පියවිබස් අසන්නට නො හැකි වෙයි.

**පටිච්ඡන්න නම්:** අසුන භිත්තියෙන් හෝ කවුළුයෙන් දොරපියනින් හෝ කළාල යෙන් හෝ කඩතුරායෙන් හෝ රුකින් හෝ ටැඹෙන් හෝ කොතැලියෙන් හෝ යම් කිසිවෙකින් පිළිසන් වූයේ වෙයි.

**නිසජ්ජං කප්පෙය්‍ය:** මාගම හුන් කල්හි මහණ වෙතැ හුන්නේ හෝ වෙතැ හොත්තේ හෝ වේ නම් පචිති ඇවැත් වෙයි. මහණ හුන් කල්හි මාගම වෙතැ හුන්නේ හෝ වෙතැ හොත්තේ හෝ වේ නම් පචිති ඇවැත් වෙයි. දෙදෙන මැ හුන්නාහු වෙත් නම් හෝ දෙදෙන මැ හොත්තාහු වෙත් නම් හෝ පචිති ඇවැත් වේ.

මාගම කෙරෙහි මාගමක යන සත් ඇතියේ නොරඹුරෙහි පිළිසන් අස්නෙකැ හිඳී නම් පචිති ඇවැත් වෙයි. මාගම කෙරෙහි විමති ඇතියේ නොරඹුරෙහි පිළිසන් අස්නෙකැ හිඳී නම් පචිති ඇවැත් වෙයි. මාගම කෙරෙහි නො මාගමකයන සත් ඇතියේ නොරඹුරෙහි පිළිසන් අස්නෙකැ නිසද්‍යා කෙරේ නම් පචිති ඇවැත් වේ.

යක්ඛියා වා පෙතියා වා පණ්ඩකෙන වා තිරච්ඡානගත[1] මනුස්සවිග්ගහිත්ථියා වා සද්ධිං රහො පටිච්ඡන්නෙ ආසනෙ නිසජ්ජං කප්පෙති ආපත්ති දුක්කටස්ස.

අමාතුගාමෙ මාතුගාමසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අමාතුගාමෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අමාතුගාමෙ අමාතුගාමසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** යො කොචි විඤ්ඤූපුරිසො දුතියො හොති තිට්ඨති න නිසීදති, අරහොපෙක්ඛො අඤ්ඤවිහිතො නිසීදති, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**පඨමරහොනිසජ්ජ සික්ඛාපදං[2] චතුත්ථං.**

## 6. 5. 5

## දුතිය රහොනිසජ්ජ සික්ඛාපදං.

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා උපනන්දො සක්‍යපුත්තො සහායස්ස සරං ගන්ත්වා තස්ස පජාපතියා සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙසි. අථ ඛො සො පුරිසො උජ්ඣායති ඛීයති විපාචෙති. "කථං හි නාම අය්‍යො උපනන්දො මය්හං පජාපතියා සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙස්සතී"ති.

2. අස්සොසුං ඛො භික්ඛූ තස්ස පුරිසස්ස උජ්ඣායන්තස්ස ඛීයන්තස්ස විපාචෙන්තස්ස. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම ආයස්මා උපනන්දො සක්‍යපුත්තො මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙස්සතීති. -පෙ- සච්චං කිර ත්වං උපනන්ද මාතුගාමෙන සද්ධිං එකොඑකාය රහො නිසජ්ජං කප්පෙසීති. සච්චං භගවා, විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම ත්වං මොඝපුරිස මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙස්සසි, නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

**යො පන භික්ඛු මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙය්‍ය පාචිත්තියන්ති.**

1. තිරච්ඡානගතාය වා-මජසං.
2. රහොනිසජ්ජසික්ඛාපදං-මජසං.

යකින්නක සමඟ හෝ ප්‍රෙතියක සමඟ හෝ පණ්ඩකයක්හු සමඟ හෝ තිරිසන්ගිය මිනිස්සිරිරි දරන ඉතිරියක සමඟ හෝ නොරඹුරෙහි පිළිසන් අස්නෙකැ නිසදාා කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

නො මාගම කෙරෙහි මාගමක යන සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නොමාගම කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි නොමාගම කෙරෙහි නොමාගමක යන සන් ඇතියේ නම් ඇවැත් නැති.

යම් කිසිදු දැනුමැති පිරිමි දෙවැන්නෙක් වේ නම්, සිටී නම් නො හිඳී නම්, නොරඹුරෙහි, ලොකාස්වාදරති නැතියේ නම්; අනෙකක් කරනුයේ හිඳී නම් ඇවැත් නැති උම්මත්තකය හට ආදිකම්මිකය හට ඇවැත් නැති.

**සිව්වැනි පඨමරහොනිසජ්ජ ශික්ෂාපදයි.**

## 6. 5. 5

## දුතියරහො නිසජ්ජ ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු **සැවැත්** නුවර **අනේපිඩු සිටුහුගේ ජේතවන** නම් අරම්හි වැඩැ වෙසෙති. එසමයෙහි ආයුෂ්මත් **උපනන්ද** ශාක්‍යපුත්‍ර එකලා වූයේ යහළුවාගේ ගෙට ගොස් ඔහුගේ එකලා වූ ඇඹෙණිය සමඟ නොරඹුරෙහි නිසදාා කෙළේ යැ. එකල්හි ඒ පුරුෂ තෙමේ ලමු කොට සිතයි, නුගුණ පවසයි, දෙස් පතුරුවයි; ''කෙසේ නම් ආර්ය උපනන්ද එකලා වූයේ මාගේ එකලා වූ ඇඹෙණිය සමඟ නොරඹුරෙහි නිසදාා කෙළේ''දැයි.

2. භික්ෂූහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ පුරුෂයාගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහ. යම් භික්ෂු කෙනෙක් අපිස් වූවාහු ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්. ''කෙසේ නම් ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර එකලා වූයේ එකලා වූ මාගමක සමඟ නොරඹුරෙහි නිසදාා කෙළේ'' දැයි ... සැබෑ ද උපනන්දයෙනි, තෙපි එකලා වැ එකලා වූ මාගමක සමඟ නොරඹුරෙහි නිසදාා කළහු දැයි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස භාග්‍යවත් බුදුහු ගැරහූ සේක... කෙසේ නම් හිස් පුරුෂය, තෙපි එකලා වැ එකලා වූ මාගමක සමඟ නොරඹුරෙහි නිසදාා කළහු ද? හිස් පුරුෂය, මෙය අප්‍රසන්නයන් ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මෙසේ ද මහණෙනි; මේ සිකපදය උදෙසවු.

**යම් මහණෙක් එකලා වූයේ එකලා වූ මාගමක සමඟ නොරඹු-රෙහි නිසදාා කරන්නේ නම් පචිති වේ යැයි.**

3. **යො පනාති:** යො යාදිසො -පෙ- භික්ඛූති; -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති

**මාතුගාමො** නාම: මනුස්සිත්ථී න යක්ඛී න පෙතී න තිරච්ඡානගතා **විඤ්ඤූ** පටිබලා සුභාසිතදුබ්භාසිතං දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආජානිතුං.

**සද්ධින්ති:** එකතො.

**එකො එකායාති:** භික්ඛු චෙව හොති මාතුගාමො ච.

**රහො** නාම: චක්ඛුස්ස රහො සොතස්ස රහො **චක්ඛුස්ස රහො** නාම: න සක්කා හොති අක්ඛිං වා නිඛනියමානෙ භමුකං වා උක්ඛිපියමානෙ සීසං වා උක්ඛිපියමානෙ පස්සිතුං. **සොතස්සරහො** නාම: න සක්කා හොති පකති කථා සොතුං.

**නිසජ්ජං කප්පෙය්‍යාති:** මාතුගාමෙ නිසින්නෙ භික්ඛු උපනිසින්නො වා හොති උපනිපන්නො වා ආපත්ති පාචිත්තියස්ස. භික්ඛු නිසින්නෙ මාතුගාමො උපනිසින්නො වා හොති උපනිපන්නො වා ආපත්ති පාචිත්තියස්ස. උභො වා නිසින්නා හොන්ති උභො වා නිපන්නා ආපත්ති පාචිත්තියස්ස.

මාතුගාමෙ මාතුගාමසඤ්ඤී එකො එකාය රහො නිසජ්ජං කප්පෙති ආපත්ති පාචිත්තියස්ස. මාතුගාමෙ වෙමතිකො එකො එකාය රහො නිසජ්ජං කප්පෙති ආපත්ති පාචිත්තියස්ස. මාතුගාමෙ අමාතුගාමසඤ්ඤී එකො එකාය රහො නිසජ්ජං කප්පෙති ආපත්ති පාචිත්තියස්ස.

යක්ඛියා වා පෙතියා වා පණ්ඩකෙන වා තිරච්ඡානගතමනුස්ස-විග්ගහිත්ථියා වා සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙති ආපත්ති දුක්කටස්ස.

අමාතුගාමෙ මාතුගාමසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අමාතුගාමෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අමාතුගාමෙ අමාතුගාමසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** යො කොචි විඤ්ඤූපුරිසො දුතියො හොති තිට්ඨති න නිසීදති අරහො පෙක්ඛො අඤ්ඤවිහිතො නිසීදති. උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**දුතිය රහොනිසජ්ජ සික්ඛාපදං පඤ්චමං.**

3. **යො පන:** යම් යම්බඳු...භික්ඛු...මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**මාතුගාම** නම්: මිනිස්මාගම යි, යකිනි නො වෙයි, ප්‍රෙතී නො වෙයි, තිරිසන්ගිය මාගම නො වෙයි. සුබැසි දුබැසි දුළුල් නො දුළුල් තෙපුල් දන්නට ප්‍රතිබල දැනුමැත්තී යි.

**සද්ධිං:** එක් වැ

**එකො එකාය:** මහණ ද වෙයි, මාගම ද වෙයි.

**රහො** නම්: ඇසට නො හමු යැ, කනට නො හමු යැ. ඇසට නො හමුව නම්: ඇස හෝ කසනු ලබන කල්හි බැම හෝ නඟනු ලබන කල්හි හිස හෝ ඔසවනු ලබන කල්හි බලන්නට නො හැකි වෙයි. කනට නො හමුව නම්: පියවිබස් අසන්නට නො හැකි වෙයි.

**නිසජ්ජං කප්පෙය්‍ය:** මාගම හුන් කල්හි මහණ වෙතැ හුන්නේ හෝ වෙතැ හොත්තේ හෝ වේ නම් පචිති ඇවැත් වෙයි. මහණ හුන් කල්හි මාගම වෙතැ හුන්නී හෝ වෙතැ හොත්තී හෝ වේ නම් පචිති ඇවැත් වෙයි. දෙදෙන මැ හුන්නාහු හෝ දෙදෙන මැ හොත්තාහු හෝ වෙත් නම් පචිති ඇවැත් වේ.

මාගමකෙරෙහි මාගමක යන සත් ඇතියේ එකලා වූයේ එකලා වූවක සමඟ නොරඹුරෙහි හිඳී නම් පචිති ඇවැත් වෙයි. මාගම කෙරෙහි විමති ඇතියේ එකලා වූයේ එකලා වූවක සමඟ නොරඹුරෙහි හිඳී නම් පචිති ඇවැත් වෙයි. මාගමක කෙරෙහි නොමාගම් සත් ඇතියේ එකලා වූයේ එකලා වූවක සමඟ නොරඹුරෙහි හිඳීම කෙරේ නම් පචිති ඇවැත් වේ.

එකලා වූයේ එකලා වූ යකින්නක හෝ ප්‍රෙතියක හෝ පණ්ඩක-යක්හු හෝ තිරිසන්ගිය මිනිස් සිරිරි දරන ඉතිරියක හෝ සමඟ නොරඹුරෙහි හිඳී නම් දුකුළා ඇවැත් වේ.

නොමාගම කෙරෙහි මාගමක යන සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නොමාගම කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො මාගම කෙරෙහි නොමාගමක යන සත් ඇතියේ නම් ඇවැත් නැති.

7. යම් කිසිදු දැනුමැති පිරිමි දෙවැන්නෙක් වේ නම්, සිටී නම්, නො හිඳී නම්, නොරඹුරෙහි, ලොකාස්වාදරතියක් නැතියේ නම්, අනෙකක් කරනුයේ හිඳී නම් ඇවත් නැත. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**පස්වැනි දුතිය රහොනිසජ්ජ ශික්ෂාපද යි.**

## 6. 5. 6.

## චාරිත්ත සික්ඛාපදං.

1. තෙන සමයෙන බුද්ධො භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන ආයස්මතො උපනන්දස්ස සක්‍යපුත්තස්ස උපට්ඨාකකුලං ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං භත්තෙන නිමන්තෙසි. අඤ්ඤෙපි භික්ඛූ භත්තෙන නිමන්තෙසි, තෙන ඛො පන සමයෙන ආයස්මා උපනන්දො සක්‍යපුත්තො පුරෙභත්තං කුලානි පයිරුපාසති. අථ ඛො තෙ භික්ඛූ තෙ මනුස්සෙ එතදවොචුං; "දෙථාවුසො භත්ත"න්ති. ආගමෙථ භන්තෙ යාව අය්‍යො උපනන්දො ආගච්ඡතීති, දුතියම්පි ඛො තෙ භික්ඛූ -පෙ- තතියම්පි ඛො තෙ භික්ඛූ තෙ මනුස්සෙ එතදවොචුං; "දෙථාවුසො භත්තං පුරෙ කාලො අතික්කමතී"ති. යම්පි මයං භන්තෙ භත්තං කරිම්හා අය්‍යස්ස උපනන්දස්ස කාරණා ආගමෙථ භන්තෙ යාව අය්‍යො උපනන්දො ආගච්ඡතීති.

2. අථ ඛො ආයස්මා උපනන්දො සක්‍යපුත්තො පුරෙභත්තං කුලානි පයිරුපාසිත්වා දිවා ආගඤ්ඡි[1]. භික්ඛූ න චිත්තරූපං භුඤ්ජිංසු. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. කථං හි නාම ආයස්මා උපනන්දො සක්‍යපුත්තො නිමන්තිතො සභත්තො සමානො පුරෙභත්තං කුලෙසු චාරිත්තං ආපජ්ජිස්සතීති -පෙ- සච්චං කිර ත්වං උපනන්ද නිමන්තිතො සභත්තො සමානො පුරෙභත්තං කුලෙසු චාරිත්තං ආපජ්ජසීති. සච්චං භගවා විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම ත්වං මොඝපුරිස නිමන්තිතො සභත්තො සමානො පුරෙභත්තං කුලෙසු චාරිත්තං ආපජ්ජිස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

**යො පන භික්ඛු නිමන්තිතො සභත්තො සමානො පුරෙභත්තං කුලෙසු චාරිත්තං ආපජ්ජෙය්‍ය පාචිත්තියන්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

3. තෙන ඛො පන සමයෙන ආයස්මතො උපනන්දස්ස සක්‍යපුත්තස්ස උපට්ඨාකකුලං සඞ්ඝස්ස අත්ථාය ඛාදනීයං පාහෙසි. "අය්‍යස්ස උපනන්දස්ස දස්සෙත්වා සංඝස්ස දාතබ්බ"න්ති. තෙන ඛො පන සමයෙන ආයස්මා උපනන්දො සක්‍යපුත්තො ගාමං පිණ්ඩාය පවිට්ඨො හොති. අථ ඛො තෙ මනුස්සා ආරාමං ගන්ත්වා භික්ඛූ පුච්ඡිංසු: "කහං භන්තෙ අය්‍යො උපනන්දො"ති. එසාවුසො ආයස්මා උපනන්දො සක්‍යපුත්තො ගාමං පිණ්ඩාය පවිට්ඨොති. ඉදං භන්තෙ ඛාදනීයං අය්‍යස්ස උපනන්දස්ස දස්සෙත්වා සංඝස්ස දාතබ්බන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං[2] තෙන හි භික්ඛවෙ පටිග්ගහෙත්වා නික්ඛිපථ යාව උපනන්දො ආගච්ඡතීති.

---

1. ආගච්ඡි මජ්ස..
2. "අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි."-මජ්සං.

## 6 . 5 . 6

## වාරිතක ශික්ෂාපදය

ප 1. එසමයෙහි භාග්‍යවත් බුදුහු රජගහ නුවර කලන්දක නිවා නම් වූ වෙළුවනයෙහි වැඩැ වෙසෙති. එසමයෙහි ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයාගේ උපස්ථායක කුලය ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍රයහට බතින් පැවැරී යැ. අන්‍ය භික්ෂූහුදු බතින් පැවැරී යැ. එසමයෙහි වනාහි ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර පෙරබත්හි කුලයන් ඇසිරි කෙරෙයි. එකල්හි ඒ භික්ෂූහු ඒ මිනිසුනට මෙය කීහු; 'ඇවැත්නි, බත් දෙව'යි. ස්වාමීනි, ආර්‍ය්‍ය උපනන්ද වහන්දැ පැමිණෙන තාක් පොරොත්තු වනු මැනැවැ යි. දෙවන වටදු ඒ භික්ෂූහු ... තෙවන වටදු ඒ භික්ෂූහු ඒ මිනිසුනට මෙය කීහු. ''ඇවැත්නි! බත් දෙවු, පෙරවරු ඉක්මැ යේ යැ යි ස්වාමීනි, ඇපි යම් හෙයෙකින් ආර්‍ය්‍ය උපනන්ද හිමිහු කරුණු කොට ගෙන බත කළමෝ ද? එහෙයින් ආර්‍ය්‍ය උපනන්ද වහන්දැ පැමිණෙන තාක් වහන්ස, පොරොත්තුවනු මැනැවැයි.

2. ඉක්බිති ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර පෙරබත්හි කුලයන් ඇසිරි කොට දහවල්හි පැමිණියේ යැ. භික්ෂූහු සිත්සේ නො වැළඳූහු. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවාහු...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවති; ''කෙසේ නම් ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර නිමතන ලදුයේ බොජුන් සහිත වූයේ මැ පෙරබත්හි කුලයන්හි හැසිරීමට පැමිණියේ''ද යි...සැබෑද උපනන්දයෙහි, තෙපි නිමතන ලදුයෙහි බොජුන් සහිත වූයෙහි මැ පෙරබත්හි කුලයන්හි හැසිරීමට පැමිණියෙහි ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ සේක...කෙසේ නම් හිස් පුරුෂය! තෙපි නිමතන ලදුයෙහි බොජුන් සහිත වූයෙහි මැ පෙරබත්හි කුලයන්හි හැසිරීමට පැමිණියෙහි ද? හිස් පුරුෂය! මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි.... මෙසේ ද මහණෙනි! මේ සිකපදය උදෙසවු.

**යම් මහණෙක් පවරන ලදුයේ බොජුන් සහිත වූයේ මැ පෙරබත්හි කුලයන්හි හැසිරීමට පැමිණෙන්නේ නම් පචිති වෙ ය යි.**

මෙසේත් භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්හට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

3. එසමයෙහි වනාහි ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රයාගේ උපස්ථායකකුලයෙක් සඞ්ඝයාගේ ප්‍රයෝජනය පිණිස ''ආර්‍ය්‍ය උපනන්ද තෙරුනට දක්වා සඟනට දියයුතු''යැයි කෑ යුතු දූය එවී යැ. එසමයෙහි වනාහි ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍ර ගමට පිඩු පිණිස පිවිසියේ වෙයි. එකල්හි ඒ මිනිස්සු ආරාමයට ගොස් ''ස්වාමීනි, ආර්‍ය්‍ය උපනන්ද වහන්දැ කොහි''දැයි මහණුන් පිළිවිසියහ. ඇවැත්නි, තෙලෙ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර ගමට පිඩු පිණිස පිවිසියේ යි. ස්වාමීනි, මේ කැයුතු දූය ආර්‍ය්‍ය උපනන්ද වහන්දැහට දක්වා සඟනට දිය යුතු යි. තෙල කරුණ භාග්‍යවතුන්හට දන්වූහ. එසේ නම් මහණෙනි, උපනන්ද පැමිණෙන තුරු පිළිගෙන තැන්පත් කොට තබවු.

4. අථ ඛො ආයස්මා උපනන්දො සක්‍යපුත්තො භගවතා පටික්ඛිත්තං පුරෙභත්තං කුලෙසු චාරිත්තං ආපජ්ජිතුන්ති. පච්ඡාභත්තං කුලානි පයිරුපාසිත්වා දිවා පක්කාමි, ඛාදනීයං උස්සාදියිත්ථ[1]. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: කථං හි නාම ආයස්මා උපනන්දො සක්‍යපුත්තො පච්ඡාභත්තං කුලෙසු චාරිත්තං ආපජ්ජිස්සතීති -පෙ- සච්චං කිර ත්වං උපනන්ද පච්ඡාභත්තං කුලෙසු චාරිත්තං ආපජ්ජසීති. සච්චං භගවා, විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම ත්වං මොඝපුරිස පච්ඡාභත්තං කුලෙසු චාරිත්තං ආපජ්ජිස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

**යො පන භික්ඛු නිමන්තිතො සභත්තො සමානො පුරෙභත්තං වා පච්ඡාභත්තං වා කුලෙසු චාරිත්තං ආපජ්ජෙය්‍ය පාචිත්තියන්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

5. තෙන ඛො පන සමයෙන භික්ඛූ චීවරදානසමයෙ කුක්කුච්චායන්තා කුලානි න පයිරුපාසන්ති. චීවරං පරිත්තං උප්පජ්ජති භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- අනුජානාමි භික්ඛවෙ චීවරදානසමයෙ කුලානි පයිරුපාසිතුං. එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

**යො පන භික්ඛු නිමන්තිතො සභත්තො සමානො පුරෙභත්තං වා පච්ඡාභත්තං වා කුලෙසු චාරිත්තං ආපජ්ජෙය්‍ය අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං. තත්ථායං සමයො චීවරදානසමයො අයං තත්ථ සමයොති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

6. තෙන ඛො පන සමයෙන භික්ඛූ චීවරකම්මං කරොන්ති. අත්ථො ච හොති සූචියාපි සුත්තෙනපි සත්ථකෙනපි. භික්ඛූ කුක්කුච්චායන්තා කුලානි න පයිරුපාසන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- අනුජානාමි භික්ඛවෙ චීවරකාරසමයෙ කුලානි පයිරුපාසිතුං. එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

**යො පන භික්ඛු නිමන්තිතො සභත්තො සමානො පුරෙභත්තං වා පච්ඡාභත්තං වා කුලෙසු චාරිත්තං ආපජ්ජෙය්‍ය අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං තත්ථායං සමයො චීවරදානසමයො චීවරකාරසමයො අයං තත්ථ සමයොති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

---

1. උස්සාරිසිත්ථ-මජ්ඣං.

4. ඉක්බිති ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර පෙරබත්හි කුලයන්හි හැසිරීම භාග්‍යවතුන් විසින් ප්‍රතික්ෂේප කරන ලද යි පසුබත්හි කුලයන් ඇසිරි කොට දහවල්හි පෙරළා පැමිණියේ යි. කෑ යුතු දැය පෙරළා ගෙනැ ගියහ. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවාහු...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවති. ''කෙසේ නම් ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර පසුබත්හි කුලයන්හි හැසිරීමට පැමිණියේ'' දැ යි...සැබෑද උපනන්ද, තෙපි පසුබත්හි කුලයන්හි හැසිරීමට පැමිණියවු දැ යි, සැබැවැ භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවත් බුදුහු ගැරහූ....කෙසේ නම් හිස් පුරුෂය, තෝ පසුබත්හි කුලයන්හි හැසිරීමට පැමිණියෙහි ද? හිස් පුරුෂය! මෙය අප්‍රසන්නයන් ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මෙසේ ද මහණෙනි! මේ සිකපදය උදෙසවු.

**යම් මහණෙක් නිමතන ලදුයේ බොජුන් සහිත වූයේ මැ පෙරබත්හි හෝ පසු බත්හි හෝ කුලයන්හි හැසිරීමට පැමිණේ නම් පචිති වේ යැ යි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් මේ සිකපදය භික්ෂූන්හට පනවන ලද්දේ වෙයි.

5. එසමයෙහි භික්ෂූහු සිවුරු දෙන සමයෙහි කුකුස් කරන්නාහු කුලයන් ඇසිරි නො කෙරෙති. මඳ සිවුරෙක් උපදී. තෙල කරුණ භාග්‍යවතුන්හට දැන්වූහ...''මහණෙනි! සිවුරු දෙන සමයෙහි කුලයන් ඇසිරි කරන්නට අනුදනිමි.'' මෙසේ ද මහණෙනි! මේ සිකපදය උදෙසවු.

**යම් මහණෙක් නිමන්ත්‍රණ ලදුයේ බොජුන් සහිත වූයේ මැ සුදුසු සමය තබා පෙරබත්හි හෝ පසුබත්හි හෝ කුලයන්හි හැසිරීමට පැමිණේ නම් පචිති වේ. එහි මේ සුදුසු සමය යි, සිවුරු දෙන සමය යැ, මේ එහි සුදුසු සමය යි.**

මෙසේ භාග්‍යවතුන් විසින් මේ සිකපදය භික්ෂූන්හට පනවන ලද්දේ වෙයි.

6. එසමයෙහි භික්ෂූහු සිවුරුකම් කෙරෙති. හිදියෙනුදු හුයෙනුදු සැතිනුදු ප්‍රයෝජන වෙයි. භික්ෂූහු කුකුසනුවෝ කුලයන් ඇසිරි නො කෙරෙති. තෙල කරුණ භාග්‍යවතුන්හට දැන්වූහ... මහණෙනි! සිවුරු කරන සමයෙහි කුලයන් ඇසිරි කරන්නට අනුදනිමි.'' මෙසේ ද මහණෙනි! මේ සිකපදය උදෙසවු.

**යම් මහණෙක් නිමන්ත්‍රණ ලදුයේ බොජුන් සහිත වූයේ මැ සුදුසු සමය තබා පෙර බත්හි හෝ පසුබත්හි හෝ කුලයන්හි හැසිරීමට පැමිණේ නම් පචිති වේ. එහි මේ සුදුසු සමය යි. සිවුරු දෙන සමය යැ සිවුරු කරන සමය යැ. මේ එහි සුදුසු සමය යි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් මේ සිකපදය භික්ෂූන්හට පනවන ලද්දේ වෙයි.

7. තෙන ඛො පන සමයෙන භික්ඛූ ගිලානා හොන්ති අත්ථො ච හොති භෙසජ්ජෙහි. භික්ඛූ කුක්කුච්චායන්තා කුලානි න පයිරුපාසන්ති භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- අනුජානාමි භික්ඛවෙ සන්තං භික්ඛුං ආපුච්ඡා කුලානි පයිරුපාසිතුං. එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

**යො පන භික්ඛු නිමන්තිතො සභත්තො සමානො සන්තං භික්ඛුං අනාපුච්ඡා පුරෙභත්තං වා පච්ඡාභත්තං වා කුලෙසු චාරිත්තං ආපජ්ජෙය්‍ය අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං, තත්ථායං සමයො; චීවරදානසමයො චීවරකාර සමයො, අයං තත්ථ සමයොති.**

8. යො පනාති: යො යාදිසො -පෙ- භික්ඛූති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**නිමන්තිතො** නාම: පඤ්චන්නං භොජනානං අඤ්ඤතරෙන භොජනෙන නිමන්තිතො.

**සභත්තො** නාම: යෙන නිමන්තිතො තෙන සභත්තො.

**සන්තං** නාම: භික්ඛුං සක්කා හොති ආපුච්ඡා පවිසිතුං. අසන්තං නාම භික්ඛුං න සක්කා හොති ආපුච්ඡා පවිසිතුං.

**පුරෙභත්තං** නාම: යෙන නිමන්තිතො තං අභුත්තාවී.

**පච්ඡාභත්තං** නාම: යෙන නිමන්තිතො අන්තමසො අරුණුග්ගමනෙපි[1] භුත්තං හොති.

**කුලං** නාම: චත්තාරි කුලානි ඛත්තියකුලං බ්‍රාහ්මණකුලං වෙස්සකුලං සුද්දකුලං.

**කුලෙසු චාරිත්තං ආපජ්ජෙය්‍යාති:** අඤ්ඤස්ස ඝරූපචාරං ඔක්කමන්තස්ස ආපත්ති දුක්කටස්ස. පඨමං පාදං උම්මාරං අතික්කාමෙති ආපත්ති දුක්කටස්ස. දුතියං පාදං අතික්කාමෙති ආපත්ති පාචිත්තියස්ස.

**අඤ්ඤත්‍ර සමයාති:** ඨපෙත්වා සමයං.

**චීවරදානසමයො** නාම: අනත්ථතෙ කඨිනෙ වස්සානස්ස පච්ඡිමො මාසො. අත්ථතෙ කඨිනෙ පඤ්චමාසා.

**චීවරකාරසමයො** නාම: චීවරෙ කයිරමානෙ.

---

1. තං අන්තමසො කුසග්ගෙනාපි - මජසං,

7. එසමයෙහි වනාහි භික්ෂූහු ගිලන්වූවෝ වෙති. බෙහෙදින් ප්‍රයෝජන වෙයි. භික්ෂූහු කුකුස්කරනුවෝ කුලයන් ඇසිරි නො කෙරෙති. තෙල කරුණ භාග්‍යවතුන් හට දැන්වූහ....''මහණෙනි, ඇති මහණක්හු පිළිවිසැ කුලයන් ඇසිරි කරන්නට අනුදනිමි.'' මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු.

යම් මහණෙක් නිමතන ලදුයේ බොජුන් සහිත වූයේ මැ සුදුසු සමය තබා ඇති මහණක්හු නො පිළිවිසැ පෙරබත්හි හෝ පසුබත්හි හෝ කුලයන්හි හැසිරිමට පැමිණේ නම් පචිති වේ. එහි මේ සුදුසු සමය යි: සිවුරු දෙන සමය යැ සිවුරු කරන සමය යැ, මේ එහි සුදුසු සමය යි.

8. යො පන: යම් යම්බඳු...භික්‍ෂු... මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**නිමන්තිත** නම්: පස් බොජුනෙන් එක්තරා බොජුනෙකින් නිමතන ලදුයේ;

**සභත්ත** නම්: යමකින් නිමන්තන ලදුයේ නම් එයින් බොජුන් සහිත වූයේ;

**සන්ත භික්‍ෂු** නම්: පිළිවිසැ පිවිසෙන්නට හැකියේ වෙයි. **අසන්ත භික්‍ෂු** නම්: පිළිවිසැ පිවිසෙන්නට නො හැකියේ වෙයි.

**පුරෙභත්ත** නම්: යමකින් නිමන්ත්‍රණ කරන ලදුයේ නම් එය නො-වැළඳූයේ,

**පච්ඡාභත්ත** නම්: යමකින් නිමන්ත්‍රණ කරන ලදුයේ නම් යටත් පිරිසෙයින් අරුණ නැඟීමෙහිදු වළඳන ලදුයේ වෙයි.

**කුල** නම්: ක්ෂත්‍රියකුල යැ බ්‍රාහ්මණකුල යැ වෛශ්‍යකුල යැ ශුද්‍ර කුල යැයි කුල සතරෙකි.

**කුලෙසු චාරිත්තං ආපජ්ජෙය්‍ය** යනු: අනෙකක්හුගේ ගෘහොප-චාරයට බස්නාහට දුකුළා ඇවැත් වෙයි. පළමු පය එළිපත ඉක්මවා නම් දුකුළා ඇවැත් වෙයි. දෙවන පය ඉක්මවා නම් පචිති ඇවැත් වේ.

**අඤ්ඤත්‍ර සමයා;** සුදුසු සමය තබා,

**චීවරදන සමය** නම්: කෙළින් නො අතුළ කල්හි වසන්හි පැසුළු මස යි, කෙළින් අතුළ කල්හි පස් මස යි.

**චීවරකාර සමය** නම්: සිවුරක් කරනු ලබන කල්හි.

නිමන්තිතෙ නිමන්තිතසඤ්ඤී සන්තං භික්ඛුං අනාපුච්ඡා පුරෙභත්තං වා පච්ඡාභත්තං වා කුලෙසු චාරිත්තං ආපජ්ජති, අඤ්ඤත්‍ර සමයා ආපත්ති පාචිත්තියස්ස. නිමන්තිතෙ වෙමතිකො සන්තං භික්ඛුං අනාපුච්ඡා පුරෙභත්තං වා පච්ඡාභත්තං වා කුලෙසු චාරිත්තං ආපජ්ජති අඤ්ඤත්‍ර සමයා ආපත්ති පාචිත්තියස්ස. නිමන්තිතෙ අනිමන්තිතසඤ්ඤී සන්තං භික්ඛුං අනාපුච්ඡා පුරෙභත්තං වා පච්ඡාභත්තං වා කුලෙසු චාරිත්තං ආපජ්ජති අඤ්ඤත්‍ර සමයා ආපත්ති පාචිත්තියස්ස.

අනිමන්තිතෙ නිමන්තිතසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අනිමන්තිතෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අනිමන්තිතෙ අනිමන්තිතසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** සමයෙ සන්තං භික්ඛුං ආපුච්ඡා පවිසති, අසන්තං භික්ඛුං අනාපුච්ඡා පවිසති, අඤ්ඤස්ස ඝරෙන මග්ගො හොති, ඝරූපචාරෙන මග්ගො හොති, අන්තරාරාමං ගච්ඡති, භික්ඛුනූපස්සයං ගච්ඡති, තිත්ථියසෙය්‍යං ගච්ඡති, පටික්කමනං ගච්ඡති, භත්තියඝරං ගච්ඡති, ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

චාරිත්තසික්ඛාපදං ඡට්ඨං.

## 6 . 5 . 7

## මහානාමසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. තෙන ඛො පන සමයෙන මහානාමස්ස සක්කස්ස භෙසජ්ජං උස්සන්නං හොති. අථ ඛො මහානාමො සක්කො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මහානාමො සක්කො භගවන්තං එතදවොච: "ඉච්ඡාමහං භන්තෙ සඞ්ඝං චාතුමාසං[1] භෙසජ්ජෙන පවාරෙතුන්ති. සාධු සාධු මහානාම තෙන හි ත්වං මහානාම සඞ්ඝං චාතුමාසං භෙසජ්ජෙන පවාරෙහීති. භික්ඛූ කුක්කුච්චායන්තා නාධිවාසෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "අනුජානාමි භික්ඛවෙ චාතුමාසප්පච්චයපවාරණං[2] සාදියිතු"න්ති.[3]

---

1. චතුමාසං - මජසං,
2. චතුමාසං භෙසජ්ජපච්චයපවාරණං - මජසං,
3. සාදිතුන්ති - මජසං

තිමතන ලද්දයෙහි තිමතනලද සත් ඇතියේ විද්‍යමාන මහණක්හු නො පිළිවිසැ සුදුසු සමය තබා පෙරබත්හි හෝ පසුබත්හි හෝ කුලයන්හි හැසිරීමට පැමිණේ නම් පචිති ඇවැත් වෙයි. තිමතන ලද්දයෙහි විමති ඇතියේ විද්‍යමාන මහණක්හු නො පිළිවිසැ සුදුසු සමය තබා පෙරබත්හි හෝ පසු බත්හි හෝ කුලයන්හි හැසිරීමට පැමිණේ නම් පචිති ඇවැත් වෙයි. තිමතන ලද්දයෙහි නො තිමතනලද සත් ඇතියේ විද්‍යමාන මහණක්හු නො පිළිවිසැ සුදුසු සමය තබා පෙරබත්හි හෝ පසුබත්හි හෝ කුලයන්හි හැසිරීමට පැමිණේ නම් පචිති ඇවැත් වේ.

නො තිමතන ලද්දයෙහි තිමතනලද සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො තිමතන ලද්දයෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො තිමතන ලද්දයෙහි නො තිමතනලද සත් ඇතියේ නම් ඇවැත් නැති.

සුදුසු සමයෙහි ඇති මහණක්හු පිළිවිසැ පිවිසේ නම්, නැති මහණක් හු නො පිළිවිසැ පිවිසේ නම් අනෙකක්හුගේ ගෙයින් මග වේ නම්; ගෙහි උවසරින් මග වේ නම්, අත් අරමකට යේ නම්; මෙහෙණ-වරකට යේ නම්; තීර්ත්ථක සෙනසුනකට යේ නම්, අසුන්හලට යේ නම්, බොජුන් දෙන ගෙට යේ නම්, ආපදවෙහි ඇවැත් නොවේ, උම්මත්තකය හට ආදිකම්මිකය හට ඇවැත් නැති.

සවැනි චාරිත්තශික්ෂාපද යි.

## 6. 5. 7

## මහානාම ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු ශාක්‍යජනපදයෙහි කිඹුල්වත් නුවර නුගඅරම්හි වැඩැ වෙසෙති. එසමයෙහි මහානාම ශාක්‍යයනට බෙහෙත් බහුල වෙයි. එකල්හි මහානාම ශාක්‍ය තෙමේ භාග්‍යවතුන් වෙතැ එළැඹියේ යැ. එළැඹැ භාග්‍යවතුන් සකසා වැඳ එකත් පසෙකැ හුන්නේ යැ. එකත් පසෙකැ හුන්නා වූ මහානාම ශාක්‍ය තෙමේ භාග්‍යවතුන්හට මෙය කීයැ; "ස්වාමීනි, මම සඟනට සිවුමස මුළුල්ලෙහි බෙහෙදින් පවරන්නට කැමැත්තෙමි"යි මැනැවි මැනැවි මහානාම, එසේ නම් මහානාම තෙපි සඟනට සිවුමස මුළුල්ලෙහි බෙහෙදින් පවරව යි භික්ෂූහු කුකුස්ඇතියාහු නො ඉවසත්. භාග්‍යවතුන් හට තෙල කරුණ දන්වූහ... "මහණෙනි, සිවුමසකට ගිලන්පස පැවැරීම ඉවසන්නට අනුදනිමි"යි

2. තෙන ඛො පන සමයෙන භික්ඛූ මහානාමං සක්කං පරිත්තං භෙසජ්ජං විඤ්ඤාපෙන්ති. තථෙව මහානාමස්ස සක්කස්ස භෙසජ්ජං උස්සන්නං හොති. දුතියම්පි ඛො මහානාමො සක්කො යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මහානාමො සක්කො භගවන්තං එතදවොච: "ඉච්ඡාමහං භන්තෙ සඞ්ඝං අපරම්පි චාතුමාසං භෙසජ්ජෙන පවාරෙතු''න්ති. සාධු සාධු මහානාම තෙන හි ත්වං මහානාම, සඞ්ඝං අපරම්පි චාතුමාසං භෙසජ්ජෙන පවාරෙහීති. භික්ඛූ කුක්කුච්චායන්තා නාධිවාසෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "අනුජානාමි භික්ඛවෙ පුන පවාරණම්පි සාදියිතු''න්ති.

3. තෙන ඛො පන සමයෙන භික්ඛූ මහානාමං සක්කං පරිත්තඤ්ඤෙව භෙසජ්ජං විඤ්ඤාපෙන්ති. තථෙව මහානාමස්ස සක්කස්ස භෙසජ්ජං උස්සන්නං හොති. තතියම්පි ඛො මහානාමො සක්කො යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මහානාමො සක්කො භගවන්තං එතදවොච: "ඉච්ඡාමහං භන්තෙ සඞ්ඝං යාවජීවං භෙසජ්ජෙන පවාරෙතු''න්ති. සාධු සාධු මහානාම තෙන හි ත්වං මහානාම සඞ්ඝං යාවජීවං භෙසජ්ජෙන පවාරෙහීති. භික්ඛූ කුක්කුච්චායන්තා නාධිවාසෙන්ති. භගවතො එතමත්ථං අරොචෙසුං -පෙ- "අනුජානාමි භික්ඛවෙ නිච්චපවාරනම්පි සාදියිතු''න්ති.

4. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ දුන්නිවත්ථා හොන්ති දුප්පාරුතා අනාකප්පසම්පන්නා. මහානාමො සක්කො වත්තා හොති. "කිස්ස තුම්හෙ භන්තෙ දුන්නිවත්ථා දුප්පාරුතා අනාකප්පසම්පන්නා නනු නාම පබ්බජිතෙන සුනිවත්ථෙන භවිතබ්බං සුපාරුතෙන ආකප්ප-සම්පන්නෙනා''ති. ඡබ්බග්ගියා භික්ඛූ මහානාමෙ සක්කෙ උපනන්ධිංසු. අථ ඛො ඡබ්බග්ගියානං භික්ඛූනං එතදහොසි. කෙන නුඛො මයං උපායෙන මහානාමං සක්කං මඞ්කුකරෙය්‍යාමාති. අථ ඛො ඡබ්බග්ගියානං භික්ඛූනං එතදහොසි: "මහානාමෙන ඛො ආවුසො සක්කෙන සඞ්ඝො භෙසජ්ජෙන පවාරිතො. හන්ද මයං ආවුසො මහානාමං සක්කං සප්පිං විඤ්ඤාපෙමා''ති.

5. අථ ඛො ඡබ්බග්ගියා භික්ඛූ යෙන මහානාමො සක්කො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා මහානාමං සක්කං එතදවොචුං: "දෙථෙන ආවුසො සප්පිනා අත්ථො''ති අජ්ජණ්හො භන්තෙ ආගමෙථ. මනුස්සා වජං ගතා සප්පිං ආහරිතුං. කාලං[1] හරිස්සථාති.[2]

1. කාලෙ – සහ
2. ආහරිස්සථාති – මඡසං

2. එසමයෙහි වනාහි භික්ෂූහු මහානාම ශාක්‍යයන්ගෙන් මද බෙහෙදක් විනවත්. එපරිද්දෙන් මැ මහානාම ශාක්‍යයහට බෙහෙත් බහුල වෙයි. දෙවනවටදු මහානාම ශාක්‍ය තෙමේ භාග්‍යවතුන් වෙතැ එළැඹියේ යැ. එළැඹැ භාග්‍යවතුන් සකසා වැද එකත් පසෙකැ හුන්නේ යැ. එකත් පසෙකැ හුන් මහානාම ශාක්‍ය තෙමේ භාග්‍යවතුන් හට මෙය කී යැ: ''ස්වාමීනි, මම අනෙකුදු සිවුමසක් මුළුල්ලෙහි සඟහු බෙහෙදින් පවරන්නට කැමැත්තෙමි''යි මැනැවි මැනැවි මහානාමයෙනි! එසේ වී නම් මහානාමයෙනි, තෙපි අනෙකුදු සිවුමසක් මුළුල්ලෙහි සඟහු බෙහෙදින් පවරව යි. භික්ෂූහු කුකුස්කරනුවෝ නො ඉවසත්. භාග්‍යවතුන් හට තෙල කරුණු දන්වූහ...''මහණෙනි! වටාලා පැවරීමකුදු ඉවසන්නට අනුදනිමි''යි.

3. එසමයෙහි භික්ෂූහු මහානාම ශාක්‍යයාගෙන් මද වූ ම බෙහෙත් විනවත්. එපරිද්දෙන් මැ මහානාම ශාක්‍යයහට බෙහෙත් බහුල වෙයි. තෙවනවටදු මහානාම ශාක්‍ය තෙමේ භාග්‍යවතුන් වෙතැ එළැඹියේ යැ. එළැඹැ භාග්‍යවතුන් සකසා වැද එකත් පසෙකැ හුන්නේ යැ. එකත් පසෙකැ හුන් මහානාම ශාක්‍ය තෙමේ භාග්‍යවතුන් හට මෙය කී යැ. ''ස්වාමීනි, මම දිවිහිමියෙන් සඟහු බෙහෙදින් පවරන්-නට කැමැත්තෙමි''යි මැනැවි මැනැවි මහානාමයෙනි, එසේ වී නම් මහානාමයෙනි, තෙපි දිවිහිමියෙන් සඟහු බෙහෙදින් පවරව යි. භික්ෂූහු කුකුස්ඇත්තෝ නො ඉවසත්. භාග්‍යවතුන් හට තෙල කරුණ දන්වූහ... ''මහණෙනි! නිති පැවරීම ද ඉවසන්නට අනුදනිමි''යි.

4. එසමයෙහි වනාහි සවග මහණහු නොසකස් කොට හැඳ පෙරෙවියාහු නො සරිලන පැවැතුම් ඇතියාහු වෙති. මහානාම ශාක්‍ය තෙමේ මෙසේ දෙස් නඟා කියන්නේ වෙයි:'' ''වහන්ස, කුමට නුඹවහන්දැ නො මනා වැ හැඳ පෙරෙවියාහු නො සරිලන පැවැතුම් ඇතියාහු වූ දැද? පැවිද්දහු විසින් මොනවට හැඳ පෙරෙව-ආකල්ප සම්පන්න වියයුතු නොවේ දැ''යි. සවග මහණහු මහානාම ශාක්‍යයන් කෙරෙහි වෙර බැඳියහ. එකල්හි සවග මහණුන්හට මෙසිත විය: ''ඇපි කිනම් උපායයෙකින් මහානාම ශාක්‍යයන් මකු කරන්නමෝ දැ''යි. එකල්හි සවග මහණුන්හට මෙසිත විය: ''ඇවැත්නි, මහානාම ශාක්‍යයන් විසින් බෙහෙදින් සඬසයා පවරනලද්දේ යැ, එබැවින් ඇවැත්නි, ඇපි මහානාම ශාක්‍යයන්ගෙන් ගිතෙල් විනවම්හ''යි.

5. ඉක්බිති සවග මහණහු මහානාම ශාක්‍යයන් වෙතැ එළැඹියහ. එළැඹැ මහානාම ශාක්‍යයන්ට මෙය කීහු: ''ඇවැත්නි, ගිතෙල් ද්‍රොණයකින් ප්‍රයෝජන වේ''යයි. ස්වාමීනි, අද දවස පොරොත්තු වනු මැනැවි, මිනිස්සු ගිතෙල් ගෙනැ එන්නට ගොවුදට ගියහ. කල් ගනු මැනැවැයි.

දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො ඡබ්බග්ගියා භික්ඛූ මහානාමං සක්කං එතදවොචුං: "දෙන්ත ආවුසො සප්පිනා අත්ථො"ති අජ්ජණ්හො භන්තෙ ආගමෙථ මනුස්සා වජං ගතා සප්පිං ආහරිතුං කාලං හරිස්සථාති. කිං පන තයා ආවුසො අදතුකාමෙන පවාරිතෙන යං ත්වං පවාරෙත්වා න දෙසී''ති.

6. අථ ඛො මහානාමො සක්කො උජ්ඣායති ඛීයති විපාචෙති: කථං හි නාම භදන්තා අජ්ජණ්හො භන්තෙ ආගමෙථාති වුච්චමානා නාගමෙස්සන්තීති. අස්සොසුං ඛො භික්ඛූ මහානාමස්ස සක්කස්ස උජ්ඣායන්තස්ස ඛීයන්තස්ස විපාචෙන්තස්ස. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ මහානාමෙන සක්කෙන අජ්ජණ්හො භන්තෙ ආගමෙථාති වුච්චමානා නාගමෙස්සන්තීති -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ මහානාමෙන සක්කෙන අජ්ජණ්හො භන්තෙ ආගමෙථාති වුච්චමානා නාගමෙථාති. සච්චං භගවා, විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා මහානාමෙන සක්කෙන අජ්ජණ්හො භන්තෙ ආගමෙථාති වුච්චමානා නාගමෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

**අගිලානෙන භික්ඛුනා චාතුමාසප්පච්චයපවාරණා සාදිතබ්බා අඤ්ඤත්‍ර පුන පවාරණාය අඤ්ඤත්‍ර නිච්චපවාරණාය තතො චෙ උත්තරිං සාදියෙය්‍ය පාචිත්තියන්ති.**

7. **අගිලානෙන භික්ඛුනා චාතුමාසප්පච්චයපවාරණා සාදිතබ්බාති:**, ගිලානපච්චයපවාරණා සාදිතබ්බා.

**පුනපවාරණාපි සාදිතබ්බාති:** යදා ගිලානො භවිස්සාමි, තදා විඤ්ඤාපෙස්සාමීති.

**නිච්චපවාරණාපි සාදිතබ්බාති:** යදා ගිලානො භවිස්සාමි, තදා විඤ්ඤාපෙස්සාමීති.

**තතො චෙ උත්තරිං සාදියෙය්‍යාති:** අත්ථි පවාරණා භෙසජ්ජපරියන්තා න රත්තිපරියන්තා, අත්ථි පවාරණා රත්තිපරියන්තා න භෙසජ්ජපරියන්තා, අත්ථි පවාරණා භෙසජ්ජපරියන්තා ච රත්තිපරියන්තා ච, අත්ථි පවාරණා නෙව භෙසජ්ජපරියන්තා න රත්තිපරියන්තා.

දෙවනවටද ... තෙවනවටද සවග මහණුහු මහානාම ශාක්‍යයන්ට මෙය කීහු: "ඇවැත්නි, ගිතෙල් දොණයකින් ප්‍රයෝජන වේ"යැයි ස්වාමීනි, අද දවස පොරොත්තු වනු මැනැව්, මිනිස්සු ගිතෙල් ගෙන එන්නට ගොවුදට ගියහ. කල් ගනු මැනැවැයි. ඇවැත්නි, තෙපි යමක් පවරා නො දෙවු නම් නො දෙනු කැමැති තොප විසින් පවරන ලද්දෙන් කවර වැඩෙක් වේ දැයි.

6. ඉක්බිති මහානාම ශාක්‍ය ලමු කොට සිතයි. නුගුණ පවසයි. දෙස් පතුරුවයි. "කෙසේ නම් භිමිවරු ස්වාමීනි, අද දවස පොරොත්තු-වනු මැනැවැයි කියනු ලබන්නාහු පොරොත්තු නො වූහු"දැයි. භික්ෂූහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන මහානාම ශාක්‍යයන්ගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු යම් භික්ෂු කෙනෙක් අපිස්වූවාහු ... ඔහු ලමු කොට සිතති. නුගුණ පවසති. දෙස් පතුරුවත්. "කෙසේ නම් සවග මහණුහු මහානාම ශාක්‍යයන් විසින් "ස්වාමීනි, අද දවස පොරොත්තු වනු මැනැවැ"යි කියනු ලබන්නාහු පොරොත්තු නො වූහුද"යි....සැබෑ ද මහණෙනි, තෙපි මහානාම ශාක්‍යයන් විසින් "ස්වාමීනි, අද දවස පොරොත්තු වනු මැනැවැ"යි කියනු ලබන්නාහු පොරොත්තු නොවවූදැයි සැබැවි භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ ... කෙසේ නම් හිස් පුරුෂයෙනි තෙපි මහානාම ශාක්‍යයන් විසින් "ස්වාමීනි, අද දවස පොරොත්තු වනු මැනැවැ"යි කියනු ලබන්නාහු පොරොත්තු නො වූවහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන් ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු.

**නො ගිලන් මහණුහු විසින් සිවුමසකට ගිලන්පසයෙන් පැවරීම ඉවසිය යුතු යි. වටාලා සිවුමසකට පැවරීම තබා නිති පැවැරීම තබා ඉදින් ඉන් මත්තෙහි ඉවසන්නේ නම් පචිති වෙ යැයි.**

7. **අගිලානෙන භික්ඛුනා චාතුමාසපච්චයපවාරණා සාදිතබ්බා;** ගිලන්පසයෙන් පැවැරීම ඉවසිය යුතු යි.

**පුන පවාරණාපි සාදිතබ්බා:** යම් දිනෙකැ ගිලනෙකිම් වන්නෙම් නම් එදිනැ විනවන්නෙමි යි;

**නිච්චපවාරණාපි සාදිතබ්බා**: යම් දිනෙක ගිලනෙකිම් වන්නෙම් නම් එදිනැ විනවන්නෙමැයි:

**තතො චෙ උත්තරිං සාදියෙය්‍ය;** බෙහෙත් පිරියත් කොට ඇති රෑ පිරියත් කොට නැති පැවැරීමෙක් ඇත, රෑ පිරියත් කොට ඇති බෙහෙත් පිරියත් කොට නැති පැවැරීමෙක් ඇත, බෙහෙතුත් පිරියත් කොට ඇති රෑත් පිරියත් කොට ඇති පැවැරීමෙක් ඇත, බෙහෙතුත් පිරියත් කොට නො මැති රෑත් පිරියත් කොට නැති පැවැරීමෙක් ඇති.

**භෙසජ්ජපරියන්තා** නාම: භෙසජ්ජානි පරිග්ගහිතානි හොන්ති එත්තකෙහි භෙසජ්ජෙහි පවාරෙමීති. **රත්තිපරියන්තා** නාම: රත්තියො පරිග්ගහිතායො හොන්ති එත්තිකාසු[1] රත්තීසු පවාරෙමීති. **භෙසජ්ජපරියන්තා ච රත්තිපරියන්තාච** නාම: භෙසජ්ජානි ච පරිග්ගහිතානි හොන්ති රත්තියො ච පරිග්ගහිතායො හොන්ති. එත්තකෙහි භෙසජ්ජෙහි එත්තිකාසු රත්තීසු පවාරෙමීති. **නෙව භෙසජ්ජ පරියන්තා න රත්තිපරියන්තා** නාම: භෙසජ්ජානි ච අපරිග්ගහිතානි හොන්ති, රත්තියො ච අපරිග්ගහිතායො හොන්ති.

භෙසජ්ජපරියන්තෙ යෙහි භෙසජ්ජෙහි පවාරිතො හොති, තානි භෙසජ්ජානි ඨපෙත්වා අඤ්ඤානි භෙසජ්ජානි විඤ්ඤාපෙති ආපත්ති පාචිත්තියස්ස. රත්තිපරියන්තෙ යාසු රත්තීසු පවාරිතො හොති තා රත්තියො ඨපෙත්වා අඤ්ඤාසු රත්තීසු විඤ්ඤාපෙති ආපත්ති පාචිත්තියස්ස. භෙසජ්ජපරියන්තෙ ච රත්තිපරියන්තෙ යෙහි භෙසජ්ජෙහි පවාරිතො හොති. තානි භෙසජ්ජානි ඨපෙත්වා යාසු රත්තීසු පවාරිතො හොති තා රත්තියො ඨපෙත්වා අඤ්ඤානි භෙසජ්ජානි අඤ්ඤාසු රත්තීසු විඤ්ඤාපෙති ආපත්ති පාචිත්තියස්ස. නෙව භෙසජ්ජපරියන්තෙ න රත්තිපරියන්තෙ අනාපත්ති.

න භෙසජ්ජෙන කරණීයෙ[2] භෙසජ්ජං විඤ්ඤාපෙති ආපත්ති පාචිත්තියස්ස. අඤ්ඤෙන භෙසජ්ජෙන කරණීයෙ අඤ්ඤං භෙසජ්ජං විඤ්ඤාපෙති ආපත්ති පාචිත්තියස්ස.

තතුත්තරිං තතුත්තරිසඤ්ඤී භෙසජ්ජං විඤ්ඤාපෙති ආපත්ති පාචිත්තියස්ස. තතුත්තරිං වෙමතිකො භෙසජ්ජං විඤ්ඤාපෙති ආපත්ති පාචිත්තියස්ස. තතුත්තරිං න තතුත්තරිසඤ්ඤී භෙසජ්ජං විඤ්ඤාපෙති ආපත්ති පාචිත්තියස්ස.

න තතුත්තරිං තතුත්තරිසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. න තතුත්තරිං වෙමතිකො ආපත්ති දුක්කටස්ස. න තතුත්තරිං න තතුත්තරිසඤ්ඤී අනාපත්ති.

13. **අනාපත්ති:** යෙහි භෙසජ්ජෙහි පවාරිතො හොති තානි භෙසජ්ජානි විඤ්ඤාපෙති යාසු රත්තීසු පවාරිතො හොති කාසු රත්තීසු විඤ්ඤාපෙති ඉමෙහි තයා භෙසජ්ජෙහි පවාරිතම්හා අම්හාකඤ්ච ඉමිනා ච ඉමිනා ච භෙසජ්ජෙන අත්ථොති ආචික්ඛිත්වා විඤ්ඤාපෙති, යාසු රත්තීසු තයා පවාරිතම්හා තායො ච රත්තියො වීතිවත්තා[3] අම්හාකඤ්ච භෙසජ්ජෙන අත්ථොති ආචික්ඛිත්වා විඤ්ඤාපෙති, ඤාතකානං පවාරිතානං අඤ්ඤස්සත්ථාය අත්තනො ධනෙන උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**මහානාම සික්ඛාපදං සත්තමං.**

---

1. එත්තකාසු - මජසං
2. කරණීයෙන - මජසං
3. වීතිවත්තා - මජසං

**භෙසජ්ජ පරියන්ත** නම්: මෙතෙක් බෙහෙදින් පවරමැයි බෙහෙත්හු සලකා ගන්නා ලද්දාහු වෙති. **රත්තිපරියන්ත** නම්: මෙතෙක් රාත්‍රීන්හි පවරමැයි රාත්‍රීහු සලකා ගන්නා ලද්දාහු වෙති. **භෙසජ්ජපරියන්ත** හා **රත්තිපරියන්ත** නම්: මෙතෙක් බෙහෙදින් මෙතෙක් රාත්‍රීන්හි පවරමැයි බෙහෙතුත් සලකා ගන්නා ලද්දාහු වෙති. රාත්‍රීහුත් සලකා ගන්නා ලද්දාහු වෙති. **නෙව භෙසජ්ජපරියන්ත න රත්තිපරියන්ත** නම්: බෙහෙතුත් නො සලකා ගන්නා ලද්දාහු වෙති, රාත්‍රීහුත් නො සලකා ගන්නා ලද්දාහු වෙති.

බෙහෙත් පිරියත්හි: යම් බෙහෙතකින් පවරන ලද්දේ වේ නම් ඒ බෙහෙත් තබා අන් බෙහෙත් විනවා නම් පචිති ඇවැත් වෙයි. රැපිරියත්හි: යම් රාත්‍රීන්හි පවරන ලද්දේ වේ නම් ඒ රාත්‍රීන් තබා අන්‍ය රාත්‍රීන්හි විනවා නම් පචිති ඇවැත් වෙයි. බෙහෙත් පිරියත්හි හා රැපිරි-යත්හි; යම් බෙහෙතකින් පවරන ලද්දේ වේ නම් ඒ බෙහෙත් තබා යම් රාත්‍රීන්හි පවරන ලද්දේ වේ නම් ඒ රාත්‍රීන් තබා අන් බෙහෙත් අන්‍ය රාත්‍රීන්හි විනවා නම් පචිති ඇවැත් වේ. බෙහෙත් පිරියතක් නො මැති කල්හි රැ පිරියතක් නැති කල්හි ඇවැත් නැති.

බෙහෙතින් කරණී නැති කල්හි බෙහෙත් විනවා නම් පචිති ඇවැත් වෙයි. අන් බෙහෙතකින් කරණී ඇති කල්හි අන් බෙහෙතක් විනවා නම් පචිති ඇවැත් වේ.

ඉන් මත්තෙහි ඉන් මතු සත් ඇතියේ බෙහෙත් විනවා නම් පචිති ඇවැත් වෙයි. ඉන් මත්තෙහි විමති ඇතියේ බෙහෙත් විනවා නම් පචිති ඇවැත් වෙයි. ඉන් මත්තෙහි ඉන් මතු සත් නැතියේ බෙහෙත් විනවා නම් පචිති ඇවැත් වේ.

ඉන් මතු නො වූයෙහි ඉන් මතු සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. ඉන් මතු නො වූයෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. ඉන් මතු නො වූයෙහි ඉන්මතු සත් නැතියේ නම් ඇවැත් නැති.

යම් බෙහෙතකින් පවරන ලද්දේ වේ නම් ඒ බෙහෙත් විනවා නම්, යම් රාත්‍රීන්හි පවරන ලද්දේ වේ නම් ඒ රාත්‍රීන්හි විනවා නම්, තොප විසින් මේ බෙහෙතින් පවරන ලදු වම්හ අපට ද මේ මේ බෙහෙතින් ප්‍රයෝජන යැයි කියා විනවා නම්, තොප විසින් යම් රාත්‍රීන්හි පවරන ලදුමෝ නම් ඒ රාත්‍රීහුත් නො ඉක්මැ ගියෝ නම් අපට ද බෙහෙතින් ප්‍රයෝජන යැයි කියා විනවා නම්, නෑයන්ගෙන් නම්, පැවැරුවන්ගෙන් නම්, අනෙකක්හු සඳහා නම්; තමාගේ ධනයෙන් නම් ඇවැත් නැති. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**සත්වැනි මහානාම ශික්ෂාපදයි.**

## 6. 5. 8

### උය්‍යුත්තසෙනාසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන රාජා පසෙනදි කොසලො සෙනාය අබ්භුය්‍යාතො හොති. ඡබ්බග්ගියා භික්ඛූ උය්‍යුත්තං සෙනං දස්සනාය අගමංසු. අද්දසා ඛො රාජා පසෙනදි කොසලො ඡබ්බග්ගියෙ භික්ඛූ දූරතොව ආගච්ඡන්තෙ දිස්වාන පක්කොසාපෙත්වා එතදවොච: ''කිස්ස තුම්හෙ භන්තෙ ආගතත්ථා''ති මහාරාජානං මයං දට්ඨුකාමාති. ''කිං භන්තෙ මං දිට්ඨෙන යුද්ධාභිනන්දිං[1], නනු භගවා පස්සිතබ්බො''ති.

2. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති; ''කථං හි නාම සමණා සක්‍යපුත්තියා උය්‍යුත්තං සෙනං දස්සනාය ආගච්ඡිස්සන්ති අම්හාකම්පි අලාභා අම්හාකම්පි දුල්ලද්ධං යෙ මයං ආජීවස්ස හෙතු පුත්තදාරස්ස කාරණා සෙනාය ආගච්ඡාමා''ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ උය්‍යුත්තං සෙනං දස්සනාය ගච්ඡිස්සන්ති''ති. -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ උය්‍යුත්තං සෙනං දස්සනාය ගච්ඡථාති සච්චං භගවා විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා උය්‍යුත්තං සෙනං දස්සනාය ගච්ඡිස්සථ නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

**යො පන භික්ඛු උය්‍යුත්තං සෙනං දස්සනාය ගච්ඡෙය්‍ය පාචිත්තියන්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

1. යුද්ධාභිනන්දිනා - මජසං

# 6 . 5 . 8

## උය්‍යුත්තසෙනා ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්නුවර අනේපිඩුසිටුහුගේ ජෙතවන නම් අරමෙහි වැඩැ වෙසෙති. එසමයෙහි වනාහි ප්‍රසෙනජිත් කොශල රජ තෙමේ (රිපුසෙන් ඉදිරියට යන්නෙමැයි නුවරින්) සෙන් සමඟ නික්මුණේ වෙයි. ඡවග මහණහු යුදයට නික්මුණු සෙන් දකිනු පිණිස ගියහ. ප්‍රසෙනජිත් කොශල රජ එන්නා වූ ඡවග මහණුන් දුරුදී මැ දුටුයේ යි. දුකැ කැඳවා මෙය කී යැ: "කුමකට ස්වාමීනි, නුඹවහන්දැ ආදැ දැයි. ඇපි මහරජහු දකිනු කැමැතියම්හ යි. "ස්වාමීනි, යුදයට රිසි දක්වන මා දකීමෙන් කවර වැඩෙක් ද? භාග්‍යවතුන් වහන්සේ දැකිය යුතු සේක් නො වෙත්"දැයි.

2. මිනිස්සු ලමු කොට සිතති. නුගුණ පවසති, දෙස් පතුරුවත්. "කෙසේ නම් ශ්‍රමණශාක්‍යපුත්‍රයෝ යුදයට නික්මුණු සෙන් දකිනු පිණිස පැමිණියෝ ද? යම්බඳු ඇපි දිවෙල් හෙතුයෙන් අඹුදරුවන්ගේ කාරණයෙන් සෙන් හමුවට යන්නමෝ නම් එබඳු අපට ද අලාභයෙකැ එබඳු අප විසිනුදු දුකසේ ලැබිය යුත්තෙකැ"යි. භික්ෂූහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහ. යම් භික්ෂු කෙනෙක් අපිස් වූවාහු... ඔහු ලමු කොට සිතති. නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ඡවග මහණහු යුදයට නික්මුණු සෙන් දකිනු පිණිස පැමිණියෝ දැ යි... සැබෑ ද මහණෙනි, තෙපි යුදයට නික්මුණු සෙන් දකිනු පිණිස යවු දැයි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ....කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි යුදයට නික්මුණු සෙන් දකිනු පිණිස පැමිණයහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**යම් මහණෙක් යුදයට නික්මුණු සෙන් දකිනු පිණිස යන්නේ නම් පචිති වෙ යයි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් භික්ෂූන්හට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

3. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරස්ස භික්ඛුනො මාතුලො සෙනාය ගිලානො හොති. සො තස්ස භික්ඛුනො සන්තිකෙ දූතං පාහෙසි: "අහං හි සෙනාය ගිලානො ආගච්ඡතු භදන්තො ඉච්ඡාමි භදන්තස්ස ආගත"න්ති. අථ ඛො තස්ස භික්ඛුනො එතදහොසි. "භගවතා භික්ඛූනං[1] සික්ඛාපදං පඤ්ඤත්තං හොති[2] න උය්‍යුත්තං සෙනං දස්සනාය ගන්තබ්බ"න්ති. අයඤ්ච මෙ මාතුලො සෙනාය ගිලානො කථන්නු ඛො මයා පටිපජ්ජිතබ්බන්ති භගවතො එතමත්ථං ආරොචෙසි. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. "අනුජානාමි භික්ඛවෙ තථාරූපපච්චයා සෙනං ගන්තුං." එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

**යො පන භික්ඛු උය්‍යුත්තං සෙනං දස්සනාය ගච්ඡෙය්‍ය අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා පාචිත්තියන්ති.**

4. යො පනාති යො යාදිසො -පෙ- භික්ඛූති -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

උය්‍යුත්තා නාම: සෙනා ගාමතො නික්ඛමිත්වා නිවිට්ඨා වා හොති. පයාතා වා.

සෙනා නාම: හත්ථී අස්සා රථා පත්ති. ද්වාදසපුරිසො හත්ථී තිපුරිසො අස්සො චතුපුරිසො රථො චත්තාරො පුරිසා සරහත්ථා පත්ති. දස්සනාය ගච්ඡති ආපත්ති දුක්කටස්ස. යත්ථ ඨිතො පස්සති ආපත්ති පාචිත්තියස්ස. දස්සනූපචාරං විජහිත්වා පුනප්පුනං පස්සති ආපත්ති පාචිත්තියස්ස.

**අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයාති; ඨපෙත්වා තථාරූපපච්චයං.**

උය්‍යුත්තෙ උය්‍යුත්තසඤ්ඤී දස්සනාය ගච්ඡති. අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා ආපත්ති පාචිත්තියස්ස. උය්‍යුත්තෙ වෙමතිකො දස්සනාය ගච්ඡති අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා ආපත්ති පාචිත්තියස්ස. උය්‍යුත්තෙ අනුය්‍යුත්තසඤ්ඤී දස්සනාය ගච්ඡති අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා ආපත්ති පාචිත්තියස්ස.

එකමෙකං දස්සනාය ගච්ඡති ආපත්ති දුක්කටස්ස. යත්ථ ඨිතො පස්සති ආපත්ති දුක්කටස්ස. දස්සනූපචාරං විජහිත්වා පුනප්පුනං පස්සති ආපත්ති දුක්කටස්ස.

1. භික්ඛූනං ඉතිපි.
2. හොති ඉතිපි මරම්මඡට්ඨසංගීතිපිටකෙ න දිස්සතෙ.

3. එසමයෙහි වනාහි එක්තරා මහණක්හු ගේ මයිලණු කෙනෙක් සෙනායෙහි ගිලන් වූවාහු වෙති. හේ එමහණහු වෙතැ දූතයකු එවී යැ. "මම වනාහි සෙනායෙහි ගිලන්වීමි, වහන්සේ වඩනා සේක්වා, ඔබගේ පැමිණීම කැමැත්තෙමැ"යි. එකල්හි එමහණහට මෙ සිත විය: "යුදයට නික්මුණු සෙන් දැකීමට නො යායුතු යැයි භාග්‍යවතුන් විසින් භික්ෂූන්හට සිකපද පනවන ලද්දේ වෙයි. මේ මාගේ මයිලණුවෝ ද සෙනායෙහි ගිලන් වූවාහු වෙති. මා විසින් කෙසේ පිළිපැදිය යුතු දෝ හෝ"යි. භාග්‍යවතුන් හට තෙල කරුණ දන්වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණෙහි ලා මෙ අවසරයෙහි ලා දැහැමි කථා කොට මහණුන් ඇමැතූ සේකැ. "මහණෙනි! එබඳු කරුණක් ඇති කල්හි සෙන් හමුවට යන්නට අනුදනිමි." මෙසේ ද මහණෙනි! මේ සිකපදය උදෙසවු:

**යම් මහණෙක් එබඳු කරුණක් තබා යුදයට නික්මුණු සෙන් දකිනු පිණිස යේ නම් පචිති වෙ යයි.**

4. **යො පන;** යම් යම්බඳු ... **භිකඛු** ... මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**උය්‍යුත්තා** නම්: සෙන් ගමින් නික්ම කඳවුරු බැඳ සිටියා හෝ ගියා හෝ වෙයි.

**සේනා** නම්: ඇත් අස් රිය පාබලයැ, දෙළොස් පුරුෂ කෙනකුන් ඇති ඇතෙකැ. තුන් පුරුෂ කෙනකුන් ඇති අසෙකැ. සිව් පුරුෂ කෙනකුන් ඇති රියෙකැ දුනු හී ගත් අත් ඇති පුරුෂයෝ සතර දෙනෙකැ යන මේ පත්ති (පාබළ) නමු. දැකීමට යේ නම් දුකුළා ඇවැත් වෙයි. යම් තැනෙකැ සිටියේ බලා නම් පචිති ඇවැත් වෙයි. දසුන් උවසර හැරපියා පුන පුනා බලා නම් පචිති ඇවැත් වේ.

**අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා:** එබඳු කරුණක් තබා; හැරපියා යුදයට නික්මුණු සෙන්හි යුදයට නික්මුණු සන් ඇතියේ එබඳු කරුණක් තබා දැකීමට යේ නම් පචිති ඇවැත් වෙයි. යුදයට නික්මුණු සෙන්හි විමති ඇතියේ එබඳු කරුණක් තබා දැකීමට යේ නම් පචිති ඇවැත් වෙයි. යුදයට නික්මුණු සෙන්හි යුදයට නො නික්මුණු සන් ඇතියේ එබඳු කරුණක් තබා දැකීමට යේ නම් පචිති ඇවැත් වේ.

**එකක් එකක්හු** දැකීමට යේ නම් දුකුළා ඇවැත් වෙයි. යම් තැනෙකැ සිටියේ බලා නම් දුකුළා ඇවැත් වෙයි. දසුන් උවසර හැරපියා පුනපුනා බලා නම් දුකුළා ඇවැත් වේ.

6 අනුයුත්තෙ උය්‍යුත්තසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අනුයුත්තෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අනුයුත්තෙ අනුයුත්තසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** ආරාමෙ ඨිතො පස්සති, භික්ඛුස්ස ඨිතොකාසං වා නිසින්නොකාසං වා නිපන්නොකාසං වා ආගච්ඡති පටිපථං ගච්ඡන්තො පස්සති තථාරූපප්පච්චයා ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

උය්‍යුත්තසෙනාසික්ඛාපදං අට්ඨමං.

## 6. 5. 9

### සෙනාවාසසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සතිකරණීයෙ සෙනං ගන්ත්වා අතිරෙකතිරත්තං සෙනාය වසන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම සමණා සක්‍යපුත්තියා සෙනාය වසිස්සන්ති අම්හාකම්පි අලාභා අම්හාකම්පි දුල්ලද්ධං යෙ මයං ආජීවස්ස හෙතු පුත්තදාරස්ස කාරණා සෙනාය පටිවසාමා"ති.

2. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ අතිරෙකතිරත්තං සෙනාය වසිස්සන්තී"ති -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ අතිරෙකතිරත්තං සෙනාය වසථාති සච්චං භගවා විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා අතිරෙකතිරත්තං සෙනාය වසිස්සථ නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

**සියා ච තස්ස භික්ඛුනො කොචිදෙව පච්චයො සෙනං ගමනාය දිරත්තතිරත්තං තෙන භික්ඛුනා සෙනාය වසිතබ්බං තතො චෙ උත්තරිං වසෙය්‍ය පාචිත්තියන්ති.**

යුදයට නො නික්මුණු සෙන්හි යුදයට නික්මුණු සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. යුදයට නො නික්මුණු සෙන්හි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. යුදයට නො නික්මුණු සෙන්හි යුදයට නොනික්මුණු සත් ඇතියේ නම් ඇවැත් නැති.

අරමෙහි සිටියේ බලා නම්, මහණක්හු සිටි තැනට හෝ හුන් තැනට හෝ හොත් තැනට හෝ පැමිණේ නම්, පෙරමගට යන්නේ දකී නම්, එබඳු කරුණකින් නම්; ඇවැත් නැති ආපදවෙහි, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**අටවැනි උය්‍යුත්තසෙනා ශික්ෂාපද යි.**

## 6 . 5 . 9

## සෙනාවාස ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩැ වෙසෙති. එසමයෙහි ෂවග්ග මහණහු කරණී ඇති කල්හි සෙනාවට ගොස් අයිරා තුන් රැයක් සෙනායෙහි වසති. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්. ''කෙසේ නම් ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ සෙනායෙහි වුසූහු ද? යම්බඳු ඇපි දිවෙල් හෙතුයෙන් අඹුදරුවන්ගේ කාරණයෙන් සෙනායෙහි වසමු නම් එබඳු අපට ද අලාභයෙකැ, එබඳු අප විසිනුදු දුකසේ ලැබිය යුත්තෙකැ''යි.

2. භික්ෂූහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්. ''කෙසේ නම් ෂවග්ග මහණහු අයිරා තුන් රැයක් සෙනායෙහි වුසූහු''දැයි... සැබෑ ද මහණෙනි තෙපි අයිරා තුන් රැයක් සෙනායෙහි වසවු දැ යි සැබෑ වැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු විගැරහූ...කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි අයිරා තුන් රැයක් සෙනායෙහි වුසුවහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නොවෙයි...මෙසේ ද මහණෙනි! මේ සිකපදය උදෙසවු:

**යම් ඒ මහණක්හට සෙනාවට යාම පිණිස කිසියම් කරුණෙක් වන්නේ නම් ඒ මහණහු විසින් දෙතුන් රැයක් සෙනායෙහි විසිය යුතුයි. ඉදින් ඉන් මත්තෙහි වෙසේ නම් පචිති වේ යැයි.**

3. සියා ච තස්ස භික්ඛුනො කොචිදෙව පච්චයො ගමනායාති; සියා පච්චයො සියා කරණීයං

දිරත්තතිරත්තං තෙන භික්ඛුනා සෙනාය වසිතබ්බන්ති; ද්වෙ තිස්සො රත්තියො වසිතබ්බං.

තතො චෙ උත්තරිං වසෙය්‍යාති; චතුත්ථෙ දිවසෙ අත්ථඞ්ගතෙ සුරියෙ සෙනාය වසති ආපත්ති පාචිත්තියස්ස. අතිරෙකතිරත්තෙ අතිරෙකසඤ්ඤී සෙනාය වසති ආපත්ති පාචිත්තියස්ස. අතිරෙකතිරත්තෙ වෙමතිකො සෙනාය වසති ආපත්ති පාචිත්තියස්ස. අතිරෙකතිරත්තෙ ඌනකසඤ්ඤී සෙනාය වසති ආපත්ති පාචිත්තියස්ස.

4. ඌනකතිරත්තෙ අතිරෙකසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. ඌනකතිරත්තෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. ඌනකතිරත්තෙ ඌනකසඤ්ඤී අනාපත්ති.

5. අනාපත්ති; ද්වෙ තිස්සො රත්තියො වසති ඌනක ද්වෙ තිස්සො රත්තියො වසති ද්වෙ රත්තියො වසිත්වා තතියාය රත්තියා පුරාරුණා නික්ඛමිත්වා පුන වසති, ගිලානො වසති, ගිලානස්ස කරණීයෙන වසති, සෙනාය වා පටිසෙනා රුද්ධා[1] හොති, කෙනචි පිළිබුද්ධො හොති, ආපදාසු, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

සෙනාවාස සික්ඛාපදං නිට්ඨිතං.

## 6. 5. 10

## උය්‍යොධිකසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ දිරත්තතිරත්තං සෙනාය වසමානා උය්‍යොධිකම්පි බලග්ගම්පි සෙනාබ්‍යූහම්පි අනීකදස්සනම්පි ගච්ඡන්ති. අඤ්ඤතරොපි ඡබ්බග්ගියො භික්ඛු උය්‍යොධිකං ගන්ත්වා කණ්ඩෙන පටිවිද්ධො හොති. මනුස්සා තං භික්ඛුං පස්සිත්වා[2] උප්පණ්ඩෙසුං කච්චි භන්තෙ සුයුද්ධං අහොසි කති තෙ ලක්ඛානි ලද්ධානීති. සො භික්ඛු තෙහි මනුස්සෙහි උප්පණ්ඩියමානො මඞ්කු අහොසි.

1. සෙනා වා පටිසෙනාය රුද්ධා-මජසං සහා.
2. පස්සිත්වා-ඉති මරම්ම ඡට්ඨසඞ්ගීති පිටකෙ න දිස්සතෙ.

3. සියා ච තසස භික්‍ඛුනො කොචිදෙව පච්චයො සෙනං ගමනාය; කරුණෙක් වන්නේ යැ කළයුත්තෙක් වන්නේ යි.

දිරත්තතිරත්තං තෙන භික්ඛුනා සෙනාය වසිතබ්බං; දෙතුන් රැයක් විසිය යුතු යි.

තතො චෙ උත්තරිං වසෙය්‍ය; සතරවන දිනයෙහි හිරු අත්ගල් ගිය කලැ සෙනායෙහි වෙසේ නම් පචිති ඇවැත් වෙයි. වැඩි තුන් රැයෙහි අයිරා සත් ඇතියේ සෙනායෙහි වෙසේ නම් පචිති ඇවැත් වෙයි. අයිරා තුන් රැයෙහි විමති ඇතියේ සෙනායෙහි වෙසේ නම් පචිති ඇවැත් වෙයි. වැඩි තුන් රැයෙහි අඩුය යන සංඥා ඇතියේ සෙනායෙහි වෙසේ නම් පචිති ඇවැත් වේ.

4. උනුතුන්රැයෙහි අයිරා සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. උනුතුන්රැයෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. උනුතුන්රැයෙහි උනුසත් ඇතියේ නම් ඇවැත් නැති.

5. දෙතුන් රැයක් වෙසේ නම්, උනු දෙතුන්රැයක් වෙසේ නම්, දෙරැයක් වැස තෙවන රැය අරුණට පළමු නික්මැ යළි වෙසේ නම්, ගිලන් වැ වෙසේ නම්, ගිලනක්හුගේ කළයුත්තෙකින් වෙසේ නම්, සෙනාව විසින් ප්‍රතිවිරුද්ධ සෙනාව වළහන ලද්දී හෝ වේ නම්, කිසිවකු විසිනුදු වළහන ලද්දේ වේ නම්, ආපදවෙහි උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

නවවැනි සෙනාවාස ශික්ෂාපද යි.

## 6 . 5 . 10

## උයොධික ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරමහි වැඩැ වෙසෙති. එසමයෙහි ඡබ්බග්ගිය මහණෝ දෙතුන් රැයක් සෙනායෙහි වසනුවෝ රණබිමට ද බලසෙන් ගණිනා තැනට ද සෙන් කඳවුරු බැඳි තැනට ද ඇණි දකුමට ද යෙති. එක්තරා ඡබ්බග්ගිය මහණෙක් රණබිමට ගොස් ඊයෙන් විදින ලදුයේ වෙයි. මිනිස්සු එ මහණ දැකැ වෙළඳහ. "කිමෙක් ද? ස්වාමීනි! මනා යුද්ධයෙක් වී ද? තුඹ වහන්දැ විසින් කෙතෙක් ලක්හු ලබන ලද්හු දැ යි හේ මහණ තෙමේ ඒ මිනිසුන් විසින් වෙළපතු ලබන්නේ මකු විය.

2. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. “කථං හි නාම සමණා සක්‍යපුත්තියා උය්‍යොධිකං දස්සනාය ආගච්ඡිස්සන්ති අම්හාකම්පි අලාභා අම්හාකම්පි දුල්ලද්ධං යෙ මයං ආජීවස්ස හෙතු පුත්තදාරස්ස කාරණා උය්‍යොධිකං ආගච්ඡාමා”ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති “කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ උය්‍යොධිකං දස්සනාය ගච්ඡිස්සන්ති”ති -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ උය්‍යොධිකං දස්සනාය ගච්ඡථාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා උය්‍යොධිකං දස්සනාය ගච්ඡිස්සථ, නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

**දිරත්තතිරත්තං චෙ භික්ඛු සෙනාය වසමානො උය්‍යොධිකං වා බලග්ගං වා සෙනාබ්‍යූහං වා අනීකදස්සනං වා ගච්ඡෙය්‍ය පාචිත්තියන්ති.**

3. දිරත්තතිරත්තං චෙ භික්ඛු සෙනාය වසමානොති ද්වෙ තිස්සො රත්තියො වසමානො.

**උය්‍යොධිකං** නාම: යත්ථ සම්පහාරො දිය්‍යති.[1]

බලග්ගං නාම; එත්තකා හත්ථී එත්තකා අස්සා එත්තකා රථා එත්තකා පත්තී.

සෙනාබ්‍යූහං නාම: ඉතො හත්ථී හොන්තු ඉතො අස්සා හොන්තු ඉතො රථා හොන්තු ඉතො පත්තී හොන්තු.

අනීකං නාම: හත්ථානීකං අස්සානීකං රථානීකං පත්තානීකං තයො හත්ථී පච්ඡිමං හත්ථානීකං තයො අස්සා පච්ඡිමං අස්සානීකං තයො රථා පච්ඡිමං රථානීකං චත්තාරො පුරිසා සරහත්ථා පච්ඡිමං පත්තානීකං.

දස්සනාය ගච්ඡති ආපත්ති දුක්කටස්ස. යත්ථ ඨිතො පස්සති ආපත්ති පාචිත්තියස්ස. දස්සනූපචාරං විජහිත්වා පුනප්පුනං පස්සති පාචිත්තියස්ස.

---

1. දිස්සති - මජසං.
2. පත්තිකා - සිමු මජසං

2. **මිනිස්සු** ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්. "කෙසේ නම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ රණබිම බැලීම පිණිස ආවෝ ද? යම් බඳු ඇපි දිවෙල් හෙතුයෙන් අඹුදරුවන්ගේ කාරණයෙන් රණබිමට යමු නම් එබඳු අපට ද අලාභයෙකැ, එබඳු අප විසිනුදු දුකයේ ලැබිය යුත් නෙකැ"යි. භික්ෂූහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ති ශබ්දය) ඇසූහු මැ යි. යම් ඒ භික්ෂු කෙනෙක්. අපිස් වූවෝ...ඔහු ලමු කොට සිතති නුගුණ පවසති දෙස් පතුරුවත්. "කෙසේ නම් සවග මහණෝ රණබිම දකිම පිණිස ගියෝ"ද යි...සැබෑ ද මහණෙනි! තෙපි රණබිම දකිම පිණිස යවු දැයි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස! භාග්‍යවත් බුදුහු විගැරහූ...කෙසේ නම් හිස් පුරුෂයෙනි! තෙපි රණබිම දකිම පිණිස ගියහු ද? හිස් පුරුෂයෙනි! මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...මෙසේ ද වනාහි මහණෙනි! මේ සික‍පදය උදෙසවු.

**ඉදින් මහණෙක් දෙතුන්රැයක් සෙනායෙහි වසන්නේ රණබිමට හෝ බලසෙන් ගණින තැනට හෝ සෙන් කඳවුරු බැඳි තැනට හෝ ඇණි දකුමට හෝ යන්නේ නම් පචිති වේ යැයි.**

3. **දිරත්තතිරත්තං** වෙ **භික්ඛු සෙනාය වසමානො**; දෙතුන් රැයක් වසන්නේ;

**උය්‍යොධික** නම්: යම් තැනෙකැ සම්ප්‍රහාරය දෙනු ලැබේ ද?

**බලග්ග** නම්: මෙතෙක් ඇත්තු යැ, මෙතෙක් අස්හු යැ, මෙතෙක් රියහු යැ මෙතෙක් පාබල යැ.

**සෙනාබ්‍යුහ** නම්: මෙහි ඇත්තු වෙත්වා, මෙහි අස්හු වෙත්වා, මෙහි රියහු වෙත්වා මෙහි පාබලහු වෙත්වා.

**අණීක** නම්: ඇත් ඇණි යැ අස් ඇණි යැ රිය ඇණි යැ පාබල ඇණි යැ තුන් ඇත්හු පැසුළු ඇත් ඇණි යැ තුන් අස්හු පැසුළු අස් ඇණි යැ තුන් රියහු පැසුළු රිය ඇණි යැ අවි ගත් අත් ඇති සිවු පුරිස්හු පැසුළු පාබල ඇණිය යි.

දකිම පිණිස යේ නම් දුකුළා ඇවැත් වෙයි. යම් තැනෙකැ සිටියේ බලා නම් පචිති ඇවැත් වෙයි. දසුන් උවසර හැරපියා පුන පුනා බලා නම් පචිති ඇවැත් වේ.

5. එකමෙකං දස්සනාය ගච්ඡති ආපත්ති දුක්කටස්ස. යත්ථ ඨිතො පස්සති ආපත්ති දුක්කටස්ස. දස්සනූපචාරං විජහිත්වා පුනප්පුනං පස්සති ආපත්ති දුක්කටස්ස.

6. අනාපත්ති: ආරාමෙ ඨිතො පස්සති භික්ඛුස්ස ඨිතොකාසං වා නිසින්නොකාසං වා නිපන්නොකාසං වා ආගන්ත්වා සම්පහාරො දීයති, පටිපථං ගච්ඡන්තො පස්සති, සති කරණීයෙ ගන්ත්වා පස්සති, ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

උය්‍යොධිකසික්ඛාපදං නිට්ඨිතං.

## අචෙලකවග්ගො පඤ්චමො.

තස්සුද්දානං:

අචෙලකං උය්‍යොජෙත්වා සභොජනං ද්වෙ රහො
සභත්තකඤ්ච භෙසජ්ජං උය්‍යුත්තං සෙනුය්‍යොධිකන්ති.[3]

3. පුව්ං කතොපනද්ධාය — තයං පච්චාකමෙව ච
මහානාමො සෙනාදි — සොනාවිදෙධා ඉමෙ දසාති-මසරං.

5. එකක් එකක්හු දැකීම පිණිස යේ නම් දුකුළා ඇවැත් වෙයි. යම් තැනෙකැ සිටියේ බලා නම් දුකුළා ඇවැත් වෙයි. දසුන් උවසර හැරපියා පුන පුනා බලා නම් දුකුළා ඇවැත් වේ.

6. අරමෙහි සිටියේ දකී නම්, මහණක්හු සිටී තැනට හෝ හුන් තැනට හෝ හොත් තැනට හෝ අවුත් පහර දෙනු ලැබේ නම්, පෙර මඟට යන්නේ දකී නම්, කරණී ඇති කල්හි ගොස් බලා නම්, ආපදායෙහි, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

දසවැනි උයොාාධිකශික්ෂාපද යි.

## පඤ්චම අචෙලකවර්ග යි.

එහි උද්දානය:

අචෙලක යැ උයොාාජන යැ සභොජන යැ පඨම–දුතිය රහො නිසජ්ජ දෙක යැ බොජුන් සහිත චාරිත්ත යැ බෙහෙත් තිසා පැන වූ මහානාම සිඛ යැ උයාුුක්ත සෙනා යැ සෙනා වාස යැ උයොාාධික සිඛපදය ද වේ.

## සුරාපානසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා චෙතියෙසු චාරිකං චරමානො යෙන භද්දවතිකා තෙන පායාසි. අද්දසංසු ඛො ගොපාලකා පසුපාලකා කස්සකා පථාවිනො භගවන්තං දූරතොව ආගච්ඡන්තං, දිස්වාන භගවන්තං එතදවොචුං. මා ඛො භන්තෙ භගවා අම්බතිත්ථං අගමාසි, අම්බතිත්ථෙ භන්තෙ ජටිලස්ස අස්සමෙ නාගො පටිවසති ඉද්ධිමා ආසිවිසො ඝොරවිසො. සො භගවන්තං මා විහෙඨෙසී''ති, එවං වුත්තෙ භගවා තුණ්හී අහොසි. දුතියම්පි ඛො -පෙ- තතියම්පි ඛො ගොපාලකා පසුපාලකා කස්සකා පථාවිනො භගවන්තං එතදවොචුං; ''මා ඛො භන්තෙ භගවා අම්බතිත්ථං අගමාසි, අම්බතිත්ථෙ භන්තෙ ජටිලස්ස අස්සමෙ නාගො පටිවසති ඉද්ධිමා ආසිවිසො ඝොරවිසො. සො භගවන්තං මා විහෙඨෙසී''ති. තතියම්පි ඛො භගවා තුණ්හී අහොසි.

2. අථ ඛො භගවා අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන භද්දවතිකා තදවසරි, තත්‍රසුදං භගවා භද්දවතිකායං විහරති. අථ ඛො ආයස්මා සාගතො යෙන අම්බතිත්ථකස්ස[1]. ජටිලස්ස අස්සමො තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා අග්‍යාගාරං පවිසිත්වා තිණසන්ථාරකං පඤ්ඤාපෙත්වා නිසීදි පල්ලඞ්කං ආභුජිත්වා උජුංකායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. අථ ඛො[2] සො නාගො ආයස්මන්තං සාගතං පවිට්ඨං දිස්වාන දුක්ඛී[3] දුම්මනො පධූපායි. ආයස්මාපි සාගතො පධූපායි. අථ ඛො සො නාගො මක්ඛං අසහමානො පජ්ජලි. ආයස්මාපි සාගතො තෙජොධාතුං සමාපජ්ජිත්වා පජ්ජලි. අථ ඛො ආයස්මා සාගතො තස්ස නාගස්ස තෙජසා තෙජං පරියාදියිත්වා යෙන භද්දවතිකා තෙනුපසඞ්කමි. අථ ඛො භගවා භද්දවතිකායං යථාභිරන්තං විහරිත්වා යෙන කොසම්බි තෙන චාරිකං පක්කාමි. අස්සොසුං ඛො කොසම්බිකා උපාසකා අය්‍යො කිර සාගතො අම්බතිත්ථකෙන නාගෙන සද්ධිං සඞ්ගාමෙසීති.

---

1. අම්බතිත්ථස්ස - මජසං. අම්බතිත්ථකං - සයා.
2. අද්දසා ඛො - මජසං.
3. දුක්ඛී ඉති මරම්මඡට්ඨසඞ්ගීතිපිටකෙ නදිස්සතෙ.

# 6 . 6 . 1

## සුරාපාන ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු චේතිය දනවුහි සැරි සරනුවෝ භද්දවතිකා නම් ග්‍රාමයට වැඩවදළෝ. ගවපාලකයෝ පශුපාලකයෝ කර්ෂකයෝ මාර්ගිකයෝ වඩනා භාග්‍යවතුන් දුරු දී ම දුටුහ. දැක භාග්‍යවතුන්හට මෙල කීහු. "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අම්බතීර්ථයට නහමක් වඩනා සේක්වා. වහන්ස! අම්බතීර්ථයෙහි ජටිලයාගේ අසපුවෙහි සෘද්ධිමත් වූ ආශීවිෂ ඇති ඝොරවිෂ ඇති නාගයෙක් වෙසෙයි. ඔහු භාග්‍යවතුන් නහමක් වෙහෙසාව"යි. මෙසේ කී කල්හි බුදුහු නිහඬ වූහු. දෙවනවටද ... තෙවනවටද ගවපාලකයෝ පශුපාලකයෝ කර්ෂකයෝ මාර්ගිකයෝ භාග්‍යවතුන්හට මෙය කීහු. "වහන්ස, භාග්‍යවතුන් වහන්සේ අම්බතීර්ථයට නහමක් වඩනා සේක්වා, වහන්ස, අම්බතීර්ථයෙහි ජටිලයාගේ අසපුවෙහි සෘද්ධිමත් වූ ආශීවිෂ ඇති ඝොරවිෂ ඇති නාගයෙක් වෙසෙයි. ඔහු භාග්‍යවතුන් නහමක් වෙහෙසාව"යි. තෙවනවටද බුදුහු නිහඬ වූහු.

2. ඉක්බිති භාග්‍යවත් බුදුහු පිළිවෙළින් සැරි සරනුවෝ භද්දවතිකා නම් ග්‍රාමයට වැඩමකළහ. බුදුහු ඒ භද්දවතිකායෙහි වැඩැවෙසෙති. එකල්හි ආයුෂ්මත් සාගත ස්ථවිර තෙමේ අම්බතීර්ථයෙහි ජටිලයාගේ අසපුවට එළැඹියේ යැ. එළැඹැ ගිනිහල්ගෙට පිවිස තණ ඇතිරියක් පනවා පලඟ බැඳ උඩුකය ඉදීව තබා කමටහනට අබිමුව කොට සිහි එළවා හුන්නේ යි. එකල්හි ඒ නාගයා පිවිසි ආයුෂ්මත් සාගත තෙරුන් දැක දුකට පැමිණියේ නො සතුටු වූයේ දුමාලී යැ. ආයුෂ්මත් සාගත ස්ථවිර තෙමේත් දුමාලී යැ. එකල්හි ඒ නාගයා ක්‍රොධය නො ඉවසන්නේ දිලිහී ගියේ යැ. ආයුෂ්මත් සාගත ස්ථවිර තෙමේත් තෙජොධාතුවට සමවැද දිලිහී ගියේ යි. ඉක්බිති ආයුෂ්මත් සාගත ස්ථවිර තෙමේ ඒ නාගයාගේ තෙද (තමාගේ) තෙදින් මැඩැගෙන භද්දවතිකා ග්‍රාමයට එළැඹියේ යි. ඉක්බිති භාග්‍යවත් බුදුහු භද්දවතිකායෙහි කැමැතිතාක් විහරණය කොට කොසඹෑනුවර බලා සැරි සැරුහු කොසඹෑනුවර වූ උවසුවෝ "ආයර්‍ය සාගතස්ථවිර තෙමේ අඹතොටැ නාගයා හා සමඟ යුද කෙළේ යැ"යි ඇසූහු.

3. අථ ඛො භගවා අනුපුබ්බෙන චාරිකං චරමානො යෙන කොසම්බී තදවසරි. අථ ඛො කොසම්බිකා උපාසකා භගවතො පච්චුග්ගමනං කරිත්වා යෙනායස්මා සාගතො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා ආයස්මන්තං සාගතං අභිවාදෙත්වා එකමන්තං අට්ඨංසු. එකමන්තං ඨිතා ඛො කොසම්බිකා උපාසකා ආයස්මන්තං සාගතං එතදවොචුං; ''කිං භන්තෙ අය්‍යානං දුල්ලභඤ්ච මනාපඤ්ච කිං පටියාදෙමා''ති. එවං වුත්තෙ ඡබ්බග්ගියා භික්ඛූ කොසම්බිකෙ උපාසකෙ එතදවොචුං: ''අත්ථාවුසො කාපොතිකා නාම පසන්නා භික්ඛූනං දුල්ලභා ච මනාපා ච තං පටියාදෙථා''ති. අථ ඛො කොසම්බිකා උපාසකා ඝරෙ ඝරෙ කාපොතිකං පසන්නං පටියාදෙත්වා ආයස්මන්තං සාගතං පිණ්ඩාය චරන්තං[1] දිස්වාන ආයස්මන්තං සාගතං එතදවොචුං: ''පිවතු භන්තෙ අය්‍යො සාගතො කාපොතිකං පසන්නං, පිවතු භන්තෙ අය්‍යො සාගතො කාපොතිකං පසන්න''න්ති. අථ ඛො ආයස්මා සාගතො ඝරෙ ඝරෙ කාපොතිකං පසන්නං පිවිත්වා නගරම්හා නික්ඛමන්තො නගරද්වාරෙ පරිපති.

4. අථ ඛො භගවා සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං නගරම්හා නික්ඛමන්තො අද්දස ආයස්මන්තං සාගතං නගරද්වාරෙ පරිපතිතං[2] දිස්වාන භික්ඛූ ආමන්තෙසි: ''ගණ්හථ භික්ඛවෙ සාගත''න්ති. ''එවං භන්තෙ''ති ඛො තෙ භික්ඛූ භගවතො පටිස්සුණිත්වා ආයස්මන්තං සාගතං ආරාමං නෙත්වා යෙන භගවා තෙන සීසං කත්වා නිපාතෙසුං. අථ ඛො ආයස්මා සාගතො පරිවත්තිත්වා යෙන භගවා තෙන පාදෙ කරිත්වා සෙය්‍යං කප්පෙසි. අථ ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: ''නනු භික්ඛවෙ පුබ්බෙ සාගතො තථාගතෙ සගාරවො අහොසි සප්පතිස්සො''ති.

එවං භන්තෙ.

''අපි නු ඛො භික්ඛවෙ සාගතො එතරහි තථාගතෙ සගාරවො සප්පතිස්සො''ති.

නොහෙතං භන්තෙ.

න නු භික්ඛවෙ සාගතො අම්බතිත්ථකෙන නාගෙන සද්ධිං සඞ්ගාමෙසීති.

එවං භන්තෙ.

---

1. පවිට්ඨං - මජසං.
2. පරිපතන්තං - මජසං.

3. ඉක්බිති බුදුහු පිළිවෙළින් සැරි සරනුවෝ කොසඹෑ නුවරට වැඩම කළහ. එකල්හි කොසඹෑ නුවර උවසුවෝ භාග්‍යවතුන්හට පෙරගමන් කොට ආයුෂ්මත් සාගත තෙරුන් වෙත එළැඹියහ. එළැඹැ ආයුෂ්මත් සාගත තෙරුන් සකසා වැඳ එකත්පසෙකැ සිටියහ. එකත්පසෙකැ සිටියා වූ කොසඹෑනුවර උවසුවෝ ආයුෂ්මත් සාගත තෙරුන්ට තෙල කීහු: "වහන්ස, ආයසීයන්හට කිමෙක් දුර්ලභත් වේ ද? මනවඩන් නේත් වේ ද? කුමක් පිළියෙළ කරමෝ"දූ යි. මෙසේ කී කල්හි සවග මහණහු කොසඹෑ නුවර උවසුවනට තෙල කීහු: "ඇවැත්ති, මහණුන්හට දුර්ලභ වූත් මනවඩන්නා වූත් **කාපොතිකා** නම් සුරාමණ්ඩයෙක් ඇති, එය පිළියෙළ කරව" යි. එකල්හි කොසඹෑනුවර උවසුවෝ ගෙයක් පාසා කාපොතිකා සුරා මණ්ඩය පිළියෙළ කොට ආයුෂ්මත් සාගත තෙරුන් පිඩු පිණිස හැසිරෙන්නවුන් දැක ආයුෂ්මත් සාගත තෙරුනට මෙය කීහු: "වහන්ස, ආයසී සාගත තෙමේ කාපොතිකාසුරාමණ්ඩය පානය කෙරේවා" වහන්ස, සාගත ආයසීයන් වහන්සේ කාපොතිකාසුරාමණ්ඩය පානය කෙරෙත්වා"යි. එකල්හි ආයුෂ්මත් සාගත තෙමේ ගෙයක් පාසා කාපොතිකා සුරාමණ්ඩය පානය කොට නුවරින් නික්මෙනුයේ නුවර දෙර වැටුණේ යි.

4. ඉක්බිති භාග්‍යවත් බුදුහු බොහෝ භික්ෂූන් සමඟ නුවරින් නික්මෙනුවෝ නුවරදෙර වැටුණු ආයුෂ්මත් සාගත තෙරුන් දුටුහ. දැකැ වදරා "මහණෙනි, සාගතයා ගනුව"යි මහණුන් ඇමැතූහ. එසේ යැ වහන්සැ යි ඒ භික්ෂූහු භාගැවතුන්හට පිළිවදන් දී ආයුෂ්මත් සාගත තෙරුන් ආරාමයට ගෙන ගොස් භාග්‍යවතුන් දෙසට හිස කොට හොවා තැබූහු. එකල්හි ආයුෂ්මත් සාගත පෙරළී භාග්‍යවතුන් දිසාවට පාදිගු කොට ශයනය කෙළේ යැ. එකල්හි බුදුහු මහණුන් ඇමැතූහ: "මහණෙනි, සාගත මහණ තථාගතයන් කෙරෙහි ගරු සහිත වූයේ බුහුමන් සහිත වූයේ නො වේ" දූ යි.

එසේ යැ වහන්ස,

මහණෙනි, සාගත මහණ දැන් වූ කලි තථාගතයන් කෙරෙහි ගරු සහිත වූයේ බුහුමන් සහිත වූයේ වේ දූ යි.

තෙල කරුණ නො වේ මැ යි වහන්ස,

මහණෙනි, සාගත මහණ අම්බතිර්ථයෙහි වැසි නාගයා සමඟ යුද කෙළේ නො වේ දූ යි.

එසේ යැ වහන්ස,

අපි නු ඛො භික්ඛවෙ සාගතො එතරහි පහොති දෙඩ්ඩුභෙනාපි[1] සද්ධිං සඞ්ගාමෙතුන්ති.

නොහෙතං භන්තෙ.

අපි නු ඛො භික්ඛවෙ තං පාතබ්බං යං පිවිත්වා විසඤ්ඤී අස්සාති

නොහෙතං භන්තෙති.

අනනුච්ඡවියං භික්ඛවෙ සාගතස්ස අනනුලොමිකං අප්පතිරූපං අස්සාමණකං අකප්පියං අකරණීයං: කථං හි නාම භික්ඛවෙ සාගතො මජ්ජං පිවිස්සති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

සුරාමෙරයපානෙ පාචිත්තියන්ති.

5. සුරා නාම; පිට්ඨසුරා පූවසුරා ඔදනියසුරා[2] කිණ්ණපක්ඛිත්තා සම්භාරසංයුත්තා.

මෙරයො නාම: පුප්ඵාසවො ඵලාසවො මධ්වාසවො ගුළාසවො සම්භාරසංයුත්තො.

පිවෙය්‍යාති: අන්තමසො කුසග්ගෙනපි පිවති, ආපත්ති පාචිත්තියස්ස.

6. මජ්ජෙ මජ්ජසඤ්ඤී පිවති ආපත්ති පාචිත්තියස්ස. මජ්ජෙ වෙමතිකො පිවති ආපත්ති පාචිත්තියස්ස. මජ්ජෙ අමජ්ජසඤ්ඤී පිවති ආපත්ති පාචිත්තියස්ස.

7. අමජ්ජෙ මජ්ජසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අමජ්ජෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අමජ්ජෙ අමජ්ජසඤ්ඤී අනාපත්ති.

8. අනාපත්ති: අමජ්ජඤ්ච හොති මජ්ජවණ්ණං මජ්ජගන්ධං මජ්ජරසං තං පිවති, සූපසම්පාකෙ මංසසම්පාකෙ තෙලසම්පාකෙ ආමලකඵාණිතෙ අමජ්ජං අරිට්ඨං පිවති උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

සුරාපානසික්ඛාපදං පඨමං.

---

1. නාගෙන - මජසං.
2. ඔදනසුරා - මජසං

දූන් වූ කලි මහණෙනි, සාගතමහණ දියබරණක්හු සමඟ වත් යුද කරනට සමර්ථ වේ ද යි.

නෙල කරුණ නො වේ මැ යි වහන්ස,

මහණෙනි, යමක් පානය කොට විසංඥ වේ නම් එය පානය කළයුතු වේ ද යි.

නෙල කරුණ නො වේ මැ යි වහන්ස,

මහණෙනි, සාගත මහණහට මෙය නො සිහෙන්නොකැ, නො අනුලොමෙකැ නො සුදුස්සෙකැ, නො මහණකමෙකැ, නො කැපයෙකැ නො කළයුත්තෙකි. කෙසේ නම් මහණෙනි, සාගත මහණ මත්පැන් පානය කෙළේ ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු;

**රහමෙර බීමෙහි පචිති වේ යැ යි.**

5. **සුරා** නම්: පිට්ඨසුරා යැ පූවසුරා යැ ඔදනියසුරා යැ කිණණ පක්ඛිත්තසුරා යැ සම්භාරසංයුත්තසුරා යි.

**මෙරය** නම්: පුප්ඵාසව යැ ඵලාසව යැ මධ්වාසව යැ ගුළාසව යැ සම්භාර සංයුත්ත යි.

**පිවෙය්‍ය**: යටත් පිරිසෙයින් කුසතණගිනූදු පානය කෙරේ නම් පචිති ඇවැත් වේ.

6. මද්‍යයෙහි මද්‍යසංඥා ඇතියේ පානය කෙරේ නම් පචිති ඇවැත් වෙයි. මද්‍යයෙහි විමති ඇතියේ පානය කෙරේ නම් පචිති ඇවැත් වෙයි. මද්‍යයෙහි අමද්‍ය සංඥා ඇතියේ පානය කෙරේ නම් පචිති ඇවැත් වේ.

අමද්‍යයෙහි මද්‍යසංඥා ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අමද්‍යයෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අමද්‍යයෙහි අමද්‍ය සංඥා ඇතියේ නම් ඇවැත් නැති.

මද්‍යවර්ණය ඇති මද්‍යගන්ධය ඇති මද්‍යරසය ඇති (යම්) අමද්‍යයෙක් වේ ද එය පානය කෙරේ නම්, සූපසම්පාකයෙහි මංසසම්පාකයෙහි තෙලසම්පාකයෙහි ඇඹුල්පැණියෙහි මද්‍ය නො වූ අරිෂ්ටය පානය කෙරේ නම්, ඇවැත් නැති. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**පළමුවැනි සුරාපාන ශික්ෂාපද යි**

## 6. 6. 2.

## අඞ්ගුලිපතොදක සික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන **ඡබ්බග්ගියා** භික්ඛූ සත්තරසවග්ගියං භික්ඛුං අඞ්ගුලිපතොදකෙන හාසෙසුං. සො භික්ඛු උත්තසන්තො අනස්සාසකො කාලමකාසි. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුං අඞ්ගුලිපතොදකෙන හාසෙස්සන්ති" -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ භික්ඛුං අඞ්ගුලිපතොදකෙන හාසෙථා'ති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා භික්ඛුං අඞ්ගුලිපතොදකෙන හාසෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**අඞ්ගුලිපතොදකෙ පාචිත්තියන්ති.**

2. අඞ්ගුලිපතොදකො නාම:[1] උපසම්පන්නො උපසම්පන්නං හස්සාධිප්පායො[2] කායෙන කායං ආමසති. ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී අඞ්ගුලිපතොදකෙන හාසෙති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ වෙමතිකො අඞ්ගුලිපතොදකෙන හාසෙති, ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී අඞ්ගුලිපතොදකෙන හාසෙති, ආපත්ති පාචිත්තියස්ස.

කායෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. කායපටිබද්ධෙන කායං ආමසති, ආපත්ති දුක්කටස්ස. කායපටිබද්ධෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන කායං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන නිස්සග්ගියං ආමසති, ආපත්ති දුක්කටස්ස.

අනුපසම්පන්නං කායෙන කායං ආමසති ආපත්ති දුක්කටස්ස.[3] අනුපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** න හස්සාධිප්පායො, සති කරණීයෙ ආමසති උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**අඞ්ගුලිපතොදක සික්ඛාපදං දුතියං.**

---

1. අඞ්ගුලියාපි තුදන්ති-ස්‍යා.
2. හසාධිප්පායො-මජසං.
3. කායෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස. කායපටිබද්ධෙන කායං අමාසති ආපත්ති දුක්කටස්ස, කායපටිබද්ධෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස, නිස්සග්ගියෙන කායං ආමයති ආපත්ති දුක්කටස්ස. නිස්සග්ගියෙන කායපටිබද්ධං ආමසති ආපත්ති දුක්කටස්ස නිස්සග්ගියෙන නිස්සග්ගියං ආමසති ආපත්ති දුක්කටස්ස. -මජසං.

## 6 . 6 . 2

## අඞ්ගුලිපතොදක ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්නුවර අනේ පිඩුසිටුහුගේ ජේතවන නම්වූ අරමෙහි වැඩැවෙසෙති. එසමයෙහි සවග මහණහු සතළොස් වගැ මහණක්හු ඇඟිල්ලෙන් ගිරිති කැවීමෙන් සිනා ගැන්වූහ. ඒ මහණ මහ සිනායෙන් මිරිකුණේ හුස්ම හිර වූයේ කලුරිය කෙළේ යැ. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් සවග මහණහු මහණක්හු ඇඟිල්ලෙන් ගිරිති කැවීමෙන් සිනා ගැන්වූහු''දැ යි....සැබෑද මහණෙනි, තෙපි මහණක්හු ඇඟිල්ලෙන් ගිරිති කැවීමෙන් සිනා ගන්වවු දැ යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ ... කෙසේ නම් හිස් පුරුෂයෙනි තෙපි මහණක්හු ඇඟිල්ලෙන් ගිරිති කැවීමෙන් සිනා ගැන්වූවහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි.... තවද මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවූ:

**ඇඟිල්ලෙන් ගිරිති කැවීම නිමිතිකොට පචිති වේ යයි.**

2. අඞ්ගුලිපතොදක නම්: උපසපනෙක් උපසපනක්හු කෙළිරිසි ඇති වැ කයින් කය පහසා නම් පචිති ඇවැත් වෙයි. උපසපන්හු කෙරෙහි උපසපන්සත් ඇතියේ ඇඟිල්ලෙන් ගිරිති කැවීමෙන් සිනහ දනවා නම් පචිති ඇවැත් වෙයි. උපසපන්හු කෙරෙහි විමති ඇතියේ ඇඟිල්ලෙන් ගිරිති කැවීමෙන් සිනහ දනවා නම් පචිති ඇවැත් වෙයි. උපසපන්හු කෙරෙහි අනුපසපන්සත් ඇතියේ ඇඟිල්ලෙන් ගිරිති කැවීමෙන් සිනහ දනවා නම් පචිති ඇවැත් වේ.

කයින් කයපිළිබැදියක් පහසා නම් දුකුළා ඇවැත් වෙයි. කය පිළි බද්දෙන් කය පහසා නම් දුකුළා ඇවැත් වෙයි. කය පිළිබද්දෙන් කය පිළිබැදියක් පහසා නම් දුකුළා ඇවැත් වෙයි. නිසැගියෙන් කය පහසා නම් දුකුළා ඇවැත් වෙයි. නිසැගියෙන් කය පිළිබැදියක් පහසා නම් දුකුළා ඇවැත්වෙයි. නිසැගියෙන් නිසැගියක් පහසා නම් දුකුළා ඇවැත් වේ.

අනුපසපනක්හු කයින් කය පහසා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි උපසපන්සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි අනුපසපන්සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වේ.

කෙළනා රිසි නැතියේ නම්, කරණී ඇති කල්හි පහසා නම්, ඇවැත් නැති. උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

**දෙවැනි අඞ්ගුලිපතොදක ශික්ෂාපද යි**

## 6. 6. 3

## හස්සධම්මසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන **සත්තරසවග්ගියා** භික්ඛූ **අචිරවතියා** නදියා උදකෙ කීළන්ති. තෙන ඛො පන සමයෙන රාජා **පසෙනදි කොසලො මල්ලිකාය** දෙවියා සද්ධිං උපරිපාසාදවරගතො හොති, අද්දසා ඛො රාජා පසෙනදි කොසලො සත්තරසවග්ගියෙ භික්ඛූ අචිරවතියා නදියා උදකෙ කීළන්තෙ දිස්වාන මල්ලිකං දෙවිං එතදවොච: "එතෙ තෙ මල්ලිකෙ අරහන්තො උදකෙ කීළන්තී"ති. නිස්සංසයං ඛො මහාරාජ භගවතා සික්ඛාපදං අපඤ්ඤත්තං තෙ වා භික්ඛූ අප්පකතඤ්ඤුනොති.

2. අථ ඛො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස[1] එතදහොසි; කෙන නු ඛො අහං උපායෙන භගවතො ච න ආරොචෙය්‍යං භගවා ච ජානෙය්‍ය ඉමෙ භික්ඛූ උදකෙ කීළිතාති. අථ ඛො රාජා පසෙනදි කොසලො සත්තරසවග්ගියෙ භික්ඛූ පක්කොසාපෙත්වා තෙසං[2] මහන්තං ගුළපිණ්ඩං අදාසි "ඉමං භන්තෙ ගුළපිණ්ඩං භගවතො දෙථා"ති. සත්තරසවග්ගියා භික්ඛූ තං ගුළපිණ්ඩං ආදාය යෙන භගවා තෙනුපසඞ්කමිංසු උපසඞ්කමිත්වා භගවන්තං එතදවොචුං: "ඉමං භන්තෙ ගුළපිණ්ඩං රාජා පසෙනදි කොසලො භගවතො දෙතී"ති. කහං පන තුම්හෙ භික්ඛවෙ රාජා අද්දසාති. අචිරවතියා නදියා භගවා උදකෙ කීළන්තෙති. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා උදකෙ කීළිස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**උදකෙ හස්සධම්මෙ[3] පාචිත්තියන්ති.**

3. **උදකෙ හස්සධම්මො** නාම: උපරිගොප්ඵකෙ උදකෙ හස්සාධිප්පායො නිමුජ්ජති වා උම්මුජ්ජති වා පලවති[4] වා ආපත්ති පාචිත්තියස්ස.

උදකෙ හස්සධම්මෙ හස්සධම්මසඤ්ඤී ආපත්ති පාචිත්තියස්ස. උදකෙ හස්සධම්මෙ වෙමතිකො ආපත්ති පාචිත්තියස්ස. උදකෙ හස්සධම්මෙ අහස්සධම්මසඤ්ඤී ආපත්ති පාචිත්තියස්ස.

---

1. පසෙනදිකොසලස්ස - මජසං.
2. තෙසං ඉති - මජසං නත්ථි.
3. හසධම්මෙ - මජසං
4. පලවති - මජසං.

## 6 . 6 . 3

## හසසධමම ශිකෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්නුවර අනේපිඩු සිටුහුගේ දෙව්රම වෙහෙර වැඩැවෙසෙති. එසමයෙහි වනාහි සතළොස් වග මහණහු අචිරවතී නදියෙහි දිය කෙළිති. එසමයෙහි පසෙනදි කොසොල් රජ මල්ලිකා දේවිය සමඟ මතුමහලට ගියේ වෙයි. පසෙනදි කොසොල් රජ අචිරවතී නදියෙහි දිය කෙළින සතළොස් වග මහණුන් දුටුවේ ය. දැකැ මල්ලිකා දේවියට මෙල කී යැ: ''මල්ලිකාවෙනි, තොපගේ මෙලෙ රහත්හු ජලක්‍රීඩා කෙරෙති යි. මහරජ, නිසැකයෙන් මැ භාග්‍යවතුන් වහන්සේ විසින් සිකපද නො පනවන ලද්දේ වන. ඒ භික්ෂූහු ද සිකපද පනවන ලද බව නො දන්නෝ හෝ වෙතැ යි.

2. ඉක්බිති පසෙනදි කොසොල් රජහට මෙල සිත විය. ''මම මේ මහණුන් දිය කෙළියෙහි යෙදුණු බව භාග්‍යවතුන් වහන්සේට නො දන්-වන්නෙම් කවර නම් උපායෙකින් උන්වහන්සේත් මෙය දැනගන්නා සේක්''දැ යි. එකල්හි පසෙනදි කොසොල් රජ තෙමේ සතළොස් වග මහණුන් කැඳවා ''වහන්ස, මේ ගුළපිඩ භාග්‍යවතුන් වහන්සේට දෙනු මැනැවැ''යි ඔවුනට මහත් ගුළපිඩක් දුන්නේ යි. සතළොස්වග මහණහු ඒ ගුළපිඩ රැගෙන භාග්‍යවතුන් වෙතැ එළැඹියහ. එළැඹ භාග්‍යවතුන් වහන්සේට මෙල කීහු: ''වහන්ස, මේ ගුළපිඩ පසෙනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේට දේ''යැ යි. මහණෙනි, රජ තෙමේ තොප කොහි දී දිටී දැ යි. භාග්‍යවතුන් වහන්ස: අචිරවතී නදියෙහි දිය කෙළනා කල්හි යැ. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි දිය කෙළියහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**දියෙහි කෙළෙනා සැහැවියෙහි පචිති වෙ ය යි.**

3. **උදකෙ හසසධමම** නම්: ගොප් ඇටයෙන් මතු දියෙහි කෙළනා රිසි ඇති වැ ගැලේ නම් හෝ නැගේ නම් හෝ පිහිනා නම් හෝ පචිති ඇවැත් වේ.

දිය කෙළනා සැහැවියෙහි කෙළනා සැහැවි සන් ඇතියේ නම් පචිති ඇවැත් වෙයි. දිය කෙළනා සැහැවියෙහි විමති ඇතියේ නම් පචිති ඇවැත් වෙයි. දිය කෙළනා සැහැවියෙහි නො කෙළනා සැහැවි-සන් ඇතියේ නම් පචිති ඇවැත් වේ.

හෙට්ඨා ගොප්ඵකෙ උදකෙ කීළති ආපත්ති දුක්කටස්ස. උදකෙ නාවාය කීළති ආපත්ති දුක්කටස්ස. හත්ථෙන වා පාදෙන වා කට්ඨෙන වා කඨලාය වා උදකං පහරති[1] ආපත්ති දුක්කටස්ස. භාජනගතං උදකං වා කඤ්ජිකං වා ඛීරං වා තක්කං වා රජනං වා පස්සාවං වා චික්ඛල්ලං වා කීළති ආපත්ති දුක්කටස්ස.

උදකෙ අහස්සධම්මෙ හස්සධම්මසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. උදකෙ අහස්සධම්මෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. උදකෙ අහස්සධම්මෙ අහස්සධම්මසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** න හස්සාධිප්පායො, සති කරණීයෙ උදකං ඔතරිත්වා නිමුජ්ජති වා උම්මුජ්ජති වා පලවති වා, පාරං ගච්ඡන්තො නිමුජ්ජති වා උම්මුජ්ජති වා පලවති වා ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**හස්සධම්ම සික්ඛාපදං තතියං.**

## 6. 6. 4

## අනාදරිය සික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **කොසම්බියං** විහරති **ඝොසිතාරාමෙ.** තෙන ඛො පන සමයෙන ආයස්මා **ඡන්නො** අනාචාරං ආචරති. භික්ඛූ එවමාහංසු; "මා ආවුසො **ඡන්න** එවරූපං අකාසි නෙතං කප්පතී"ති. සො අනාදරියං **පටිච්ච** කරොතියෙව යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම ආයස්මා ඡන්නො අනාදරියං කරිස්සතී"ති -පෙ- සච්චං කිර ත්වං ඡන්න අනාදරියං කරොසීති. සච්චං භගවා; විගරහි බුද්ධො භගවා -පෙ- "කථං හි නාම ත්වං මොඝපුරිස අනාදරියං කරිස්සසි, නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ;

**අනාදරියෙ පාචිත්තියන්ති.**

---

1. උදකෙ හපති-සිමු: සිමු:: සි

ගොප්ඇටයෙන් යටැ දියෙහි කෙළනේ නම් දුකුළා ඇවැත් වෙයි. දියෙහි නැවෙකැ කෙළනේ නම් දුකුළා ඇවැත් වෙයි. අතින් හෝ පයින් හෝ කැටින් හෝ කැබිලිත්තෙන් හෝ දියට පහරදෙන්නේ නම් දුකුළා ඇවැත් වෙයි. බඳුනෙහි වූ දිය හෝ කැඳ හෝ කිරි හෝ මෝරු හෝ රදන් හෝ මූ හෝ මඩ හෝ කෙළනේ නම් දුකුළා ඇවැත් වේ.

දියෙහි නො කෙළනා සැහැවියෙහි කෙළනා සැහැවියන් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. දියෙහි නො කෙළනා සැහැවියෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. දියෙහි නො කෙළනා සැහැවි යෙහි නො කෙළනා සැහැවිසන් ඇතියේ නම් ඇවැත් නැති.

නො කෙළනා රිසි ඇතියේ නම්, කරණී ඇති කල්හි දියට බැස ගැලේ නම් හෝ නැගේ නම් හෝ පිහිනා නම් හෝ, පරතෙරට යමින් ගැලේ නම් හෝ නැගේ නම් හෝ පිහිනා නම් හෝ, ආපදවෙහි ඇවැත් නොවේ, උම්මත්තක හට ආදිකම්මිකහට ඇවැත් නැති.

**තෙවැනි හසසධමම ශිකෂාපද යි.**

## 6 . 6 . 4

## අනාදරිය ශිකෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු **කොසඹැ** නුවර **ඝෝෂිතාරාමයෙහි** වැඩැවෙසෙති. එසමයෙහි වනාහි ආයුෂ්මත් **ඡන්නස්ථවිර** තෙමෙ පනත් විකුම් කෙරෙයි භික්ෂූහු මෙසේ කීහු: "ඇවැත් ඡන්නයෙනි, මෙබන් දක් නහමක් කරන්නැ, තෙල නො කැප යැ"යි. හෙ අනදර බව පිණිස කෙරේ මැ යි. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවති: "කෙසේ නම් ආයුෂ්මත් ඡන්න ස්ථවිර තෙමෙ අනදරබව කෙළේ දැ"යි...සැබෑද ඡන්න, තෙපි අනදර බව කරවු දැ යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරැහූ... කෙසේ නම් හිස් පුරුෂය, තෙපි අනදර බව කළහු ද? හිස් පුරුෂය, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...මෙසේ මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**අනදරබව කිරීමෙහි පචිති වෙ යයි.**

2. අනාදරියං නාම: ද්වෙ අනාදරියානි: පුග්ගලානාදරියඤ්ච ධම්මානාදරියඤ්ච,

පුග්ගලානාදරියං නාම: උපසම්පන්නෙන පඤ්ඤත්තෙන වුච්චමානො "අයං උක්ඛිත්තො වා[1] වම්හිතො වා ගරහිතො වා ඉමස්ස වචනං අකතං භවිස්සතී"ති අනාදරියං කරොති ආපත්ති පාචිත්තියස්ස.

ධම්මානාදරියං නාම: උපසම්පන්නෙන පඤ්ඤත්තෙන වුච්චමානො "කථායං නස්සෙය්‍ය වා විනස්සෙය්‍ය වා අන්තරධායෙය්‍ය වා" තං වා න සික්ඛිතුකාමො අනාදරියං කරොති ආපත්ති පාචිත්තියස්ස.

උපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී අනාදරියං කරොති, ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ වෙමතිකො අනාදරියං කරොති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී අනාදරියං කරොති ආපත්ති පාචිත්තියස්ස.

උපසම්පන්නෙන[2] අපඤ්ඤත්තෙන වුච්චමානො ඉදං න සල්ලෙඛාය න ධුතාය[3] න පාසාදිකතාය න අපචයාය න විරියාරම්භාය සංවත්තතීති අනාදරියං කරොති ආපත්ති දුක්කටස්ස.

අනුපසම්පන්නෙන පඤ්ඤත්තෙන වා අපඤ්ඤත්තෙන වා වුච්චමානො ඉදං න සල්ලෙඛාය න ධුතාය න පාසාදිකතාය න අපචයාය න විරියාරම්භාය සංවත්තතීති අනාදරියං කරොති ආපත්ති දුක්කටස්ස.

අනුපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස.

අනාපත්ති: එවං අම්හාකං ආචරියානං උග්ගහො පරිපුච්ඡාති භණති, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

අනාදරියසික්ඛාපදං චතුත්ථං.

1. උක්ඛිත්තකො වා-මජසං.
2. උපසම්පන්නෙන - ඉති මජසං නත්ථි.
3. න ධුතත්තාය-මජසං.

2. අනාදරිය නම්: අනාදරිය දෙකෙකි: පුද්ගලානාදරිය ද ධර්මානාදරිය ද යි.

පුග්ගලානාදරිය නම්: "උපසපනක්හු, විසින් පනවන ලද සිකපදයෙකින් කියනු ලබන්නේ "මෙතෙම උක්ඛිත්තයෙකැ යි හෝ අවමන් ලද්දෙකැ යි හෝ ගැරහුම් ලද්දෙකැ යි හෝ වෙයි. මොහුගේ වචනය නො කළයුතු වන්නේ"ය යි අනදරබව කෙරේ නම් පචිති ඇවැත් වේ.

ධම්මානාදරිය නම්: උපසපනක්හු, විසින් පනවන ලද සිකපදයෙකින් කියනු ලබන්නේ "මේ ධර්මය කෙසේ නැසෙන්නේ හෝ වැනසෙන්නේ හෝ අතුරුධන් වන්නේ හෝ වේ"ද යි ඒ පනවන ලදුයෙහි නො හික්මෙනු කැමැත්තේ අනදරබව කෙරේ නම් පචිති ඇවැත් වේ.

උපසපනක්හු කෙරෙහි උපසපන් සත් ඇතියේ අනදරබව කෙරේ නම් පචිති ඇවැත් වෙයි. උපසපනක්හු කෙරෙහි විමති ඇතියේ අනදරබව කෙරේ නම් පචිති ඇවැත් වෙයි. උපසපනක්හු කෙරෙහි අනුපසපන් සත් ඇතියේ අනදරබව කෙරේ නම් පචිති ඇවැත් වේ.

උපසපනක්හු විසින් නො පනවන ලද්දෙකින් (සූත්‍රයෙහි හෝ අභිධර්මයෙහි හෝ ආයෙකින්) කියනු ලබන්නේ "මෙය සලේපැවැත්මට කෙලෙස් කැපීමට පැහැදුම් එළවීමට නිවනට වැර ඇරැඹුමට නො පවතී" ය යි අනදරබව කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

අනුපසපනක්හු විසින් පනවන ලද්දෙකින් හෝ නොපනවන ලද්දෙකින් හෝ කියනු ලබන්නේ "මෙය සලේපැවැත්මට කෙලෙස් කැපීමට පැහැදුම් එළවීමට නිවනට වැර ඇරඹුමට නො පවතී"ය යි අනදරබව කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

අනුපසපනක්හු කෙරෙහි උපසපන්සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි අනුපසපන් සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වේ.

අපගේ ගුරුවරුන්ගේ උගැන්ම අර්ථකථනය මෙසේ යැ යි බෙණේ නම් ඇවැත් නො වේ. උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

**සිවුවැනි අනාදරිය ශික්ෂාපද යි.**

## 6. 6. 5

## භිංසාපනක සික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සත්තරසවග්ගියෙ භික්ඛූ භිංසාපෙන්ති. තෙ භිංසාපියමානා රොදන්ති. භික්ඛූ එවමාහංසු; "කිස්ස තුම්හෙ ආවුසො රොදථා"ති. ඉමෙ ආවුසො ඡබ්බග්ගියා භික්ඛූ අම්හෙ භිංසාපෙන්තීති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛියන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුං භිංසාපෙස්සන්තීති." -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ භික්ඛුං භිංසාපෙථාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- "කථං හි නාම තුම්හෙ මොඝපුරිසා භික්ඛුං භිංසාපෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**යො පන භික්ඛු භික්ඛුං භිංසාපෙය්‍ය පාචිත්තියන්ති.**

2. යො පනාති:, යො යාදිසො -පෙ- භික්ඛූති -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති. භික්ඛුන්ති: අඤ්ඤං භික්ඛුං.

භිංසාපෙය්‍යාති: උපසම්පන්නො උපසම්පන්නං භිංසාපෙතුකාමො රූපං වා සද්දං වා ගන්ධං වා රසං වා ඵොට්ඨබ්බං වා උපසංහරති, භායෙය්‍ය වා සො න වා භායෙය්‍ය ආපත්ති පාචිත්තියස්ස. චොරකන්තාරං වා වාලකන්තාරං වා පිසාචකන්තාරං වා ආචික්ඛති, භායෙය්‍ය වා සො න වා භායෙය්‍ය ආපත්ති පාචිත්තියස්ස.

උපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී භිංසාපෙති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ වෙමතිකො භිංසාපෙති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී භිංසාපෙති ආපත්ති පාචිත්තියස්ස.

අනුපසම්පන්නං භිංසාපෙතුකාමො රූපං වා සද්දං වා රසං වා ඵොට්ඨබ්බං වා උපසංහරති භායෙය්‍ය වා සො න වා භායෙය්‍ය ආපත්ති දුක්කටස්ස. චොරකන්තාරං වා වාලකන්තාරං වා පිසාචකන්තාරං වා ආචික්ඛති භායෙය්‍ය වා සො න වා භායෙය්‍ය ආපත්ති දුක්කටස්ස.

# 6 . 6 . 5

## භිංසාපනක ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්නුවර ජෙතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරමහි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි සවග මහණහු සතළොස්වග මහණුන් බිය ගන්වති. ඔහු බිය ගන්වනු ලබන්නාහු හඬති. භික්ෂූහු මෙසේ කීහු: ''කුමකට ඇවැත්නි, තෙපි හඬවු''ද යි. ඇවැත්නි, මේ සවග මහණහු අප බිය ගන්වති යි. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස්වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් සවග මහණෝ මහණක්හු බිය ගැන්වූහු''ද යි...සැබෑද? මහණෙනි, තෙපි මහණක්හු බිය ගන්වහු ද යි සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ...කෙසේ නම් හිස් පුරුෂයෙනි තෙපි මහණක්හු, බිය ගැන්වූවහු ද, හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...මෙසේත් මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**යම් මහණෙක් මහණක්හු බිය ගන්වා නම් පචිති වේ ය යි**

2. **යො පන:** යම්, යම්බඳු ... **භික්ඛු** ... මෙතෙම මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි. **භික්ඛුං:** අන් මහණක්හු;

**භිංසාපෙය්‍ය;** උපසපනෙක් උපසපනක්හු බිය ගන්වනු කැමැත්තේ රූපයක් හෝ ශබ්දයක් හෝ ගන්ධයක් හෝ රසයක් හෝ ස්ප්‍රෂ්ටව්‍යයක් හෝ එළවයි. හේ බිය වේ නම් හෝ නො බිය වේ නම් හෝ පචිති ඇවැත් වෙයි. සොරකතරක් හෝ වල්කතරක් හෝ නොමිනිස් කතරක් හෝ කියයි. හේ බිය වේ නම් හෝ නො බිය වේ නම් හෝ පචිති ඇවැත් වේ.

උපසපනක්හු කෙරෙහි උපසපන් සත් ඇතියේ බියගන්වා නම් පචිති ඇවැත් වෙයි. උපසපනක්හු කෙරෙහි විමති ඇතියේ බියගන්වා නම් පචිති ඇවැත් වෙයි. උපසපනක්හු කෙරෙහි අනුපසපන් සත් ඇතියේ බියගන්වා නම් පචිති ඇවැත් වේ.

අනුපසපනක්හු බියගන්වනු කැමැත්තේ රූපයක් හෝ ශබ්දයක් හෝ ගන්ධයක් හෝ රසයක් හෝ ස්ප්‍රෂ්ටව්‍යයක් හෝ එළවයි. හේ බිය වේ නම් හෝ නො බිය වේ නම් හෝ දුකුළා ඇවැත් වෙයි. සොරකතරක් හෝ වල් කතරක් හෝ නොමිනිස් කතරක් හෝ කියා ද හේ බිය වේ නම් හෝ නො බිය වේ නම් හෝ දුකුළා ඇවැත් වේ.

අනුපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස.

6. **අනාපත්ති:** න භිංසාපෙතුකාමො රූපං වා සද්දං වා ගන්ධං වා රසං වා ඵොට්ඨබ්බං වා උපසංහරති, චොරකන්තාරං වා වාලකන්තාරං වා පිසාචකන්තාරං වා ආචික්ඛති උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**භිංසාපනකසික්ඛාපදං පඤ්චමං.**

## 6. 6. 6.

## ජොතිසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා භග්ගෙසු විහරති සුංසුමාරගිරෙ භෙසකලාවනෙ මිගදායෙ. තෙන ඛො පන සමයෙන භික්ඛූ හෙමන්තිකෙ කාලෙ අඤ්ඤතරං මහන්තං සුසිරකට්ඨං ජොතිං සමාදහිත්වා විසිබ්බෙසුං. තස්මිං ච සුසිරෙ කණ්හසප්පො අග්ගිනා සන්තත්තො නික්ඛමිත්වා භික්ඛූ පරිපාතෙසි, භික්ඛූ තහං තහං උපධාවිංසු. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භික්ඛූ ජොතිං සමාදහිත්වා විසිබ්බෙස්සන්තී"ති. -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛූ ජොතිං සමාදහිත්වා විසිබ්බෙස්සන්තී"ති, සච්චං භගවා විගරහි බුද්ධො භගවා -පෙ- "කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා ජොතිං සමාදහිත්වා විසිබ්බෙස්සන්ති", නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**යො පන භික්ඛු විසිබ්බනාපෙක්ඛො ජොතිං සමාදහෙය්‍ය වා සමාදහාපෙය්‍ය වා පාචිත්තියන්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

අනුපසපන්නක්හු කෙරෙහි උපසපන සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි අනුපසපන් සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙ.

6. නො බියගන්වනු කැමැත්තේ රූපයක් හෝ ශබ්දයක් හෝ ගන්ධයක් හෝ රසයක් හෝ ස්ප්‍රෂ්ටව්‍යයක් හෝ එළවා නම්, සොර-කතරක් හෝ වල් කතරක් හෝ නො මිනිස් කතරක් හෝ කියා නම්, ඇවැත් නො වේ. උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

පස්වැනි භිංසාපනකශික්ෂාපද යි

## 6. 6. 6

## ජොති ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු භග්ග ජනවියෙහි සුංසුමාරගිරි නම් නුවර මිගදය නම් වූ භෙසකලාවනයෙහි වැඩැවෙසෙති. එසමයෙහි භික්ෂූහු හිමත්කල්හි එක්තරා මහත් බෙණය සහිත දරකඩකට ගිනි දල්වා තැපූහු. ඒ බෙණෙහි දු කළුනයෙක් ගින්නෙන් තැවුණේ නික්මැ මහණුන් ලුහුබැඳී යැ. භික්ෂූහු තන්හි තන්හි දිවූහු. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් භික්ෂූහු ගිනි දල්වා තැපූහු" දැ යි...සැබෑද මහණෙනි, භික්ෂූහු ගිනි දල්වා තපිත් දැ යි, සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ...කෙසේ නම් මහණෙනි ඒ හිස් පුරුෂයෝ ගිනි දල්වා තැපූහු ද, මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...මෙසේ මහණෙනි, මේ සිකපදය උදෙසවූ:

**යම් මහණෙක් තපිනු කැමැත්තේ ගිනි දල්වා නම් හෝ දල්වවා නම් හෝ පචිති වෙ ය යි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් භික්ෂූන්හට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

2. තෙන ඛො පන සමයෙන භික්ඛු ගිලානො හොති, ගිලානපුච්ඡකා භික්ඛු ගිලානෙ භික්ඛු එතදවොචුං: "කච්චාවුසො ඛමනීයං කච්චියාපනීය"න්ති, "පුබ්බෙ මයං ආවුසො ජොතිං සමාදහිත්වා විසිබ්බෙම, තෙන නො ඵාසු හොති, ඉදානි පන භගවතා පටික්ඛිත්තන්ති කුක්කුච්චායන්තා න විසිබ්බෙම තෙන නො න ඵාසු හොතී"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- අනුජානාමි භික්ඛවෙ ගිලානෙන භික්ඛුනා ජොතිං සමාදහිත්වා වා සමාදහාපෙත්වා වා විසිබ්බෙතුං"

එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**යො පන භික්ඛු අගිලානො විසිබ්බනාපෙඛො ජොතිං සමාදහෙය්‍ය වා සමාදහාපෙය්‍ය වා පාචිත්තියන්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

3. තෙන ඛො පන සමයෙන භික්ඛු පදීපෙපි ජොතිකෙපි ජන්තාඝරෙපි කුක්කුච්චායන්ති, භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "අනුජානාමි භික්ඛවෙ තථාරූපප්පච්චයා ජොතිං සමාදහිතුං සමාදහාපෙතුං," එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**යො පන භික්ඛු අගිලානො විසිබ්බනාපෙඛො ජොතිං සමාදහෙය්‍ය වා සමාදහාපෙය්‍ය වා අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා පාචිත්තියන්ති.**

4, **යොපනාති:** යො යාදිසො -පෙ-**භික්ඛූති**-පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**අගිලානො** නාම: යස්ස විනා අග්ගිනා ඵාසු හොති.

**ගිලානො** නාම: යස්ස විනා අග්ගිනා න ඵාසු හොති.

**විසිබ්බනාපෙඛොති** තප්පිතුකාමො.

**ජොති** නාම: අග්ගි වුච්චති.

**සමාදහෙය්‍යාති:** සයං සමාදහති ආපත්ති පාචිත්තියස්ස.

**සමාදහාපෙය්‍යාති:** අඤ්ඤං ආණාපෙති ආපත්ති පාචිත්තියස්ස, සකිං ආණත්තො බහුකම්පි සමාදහති ආපත්ති පාචිත්තියස්ස.

**අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයාති;** ඨපෙත්වා තථාරූපප්පච්චයං.

2. එසමයෙහි භික්ෂූහු ගිලන්වූවාහු වෙති. ගිලනුන් පුළුවුස්නා මහණහු ගිලන් මහණුන්ට මෙය කීහු: ''කිම ඇවැත්නි, සිහිය හැකි ද? කිම යැපිය හැකි''ද යි ඇවැත්නි, පෙර ඇපි ගිනි දල්වා තපිමු. එයින් අපට පහසු වෙයි. දැන් වූ කලි භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රතික්ෂිප්ත යැ යි කුකුස් කරන්නමෝ නො තපිම්හ, එයින් අපට පහසු නො වෙයි. භාග්‍යවතුන්හට තෙල කරුණ දැන්වූහ... ''මහණෙනි, ගිලන් මහණහු විසින් ගිනි දල්වා හෝ දල්වවා හෝ තපින්නට අනුදනිමි.'' මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**යම් මහණෙක් නො ගිලන් වැ තප්නාකැමැත්තේ ගිනි දල්වා නම් හෝ දල්වවා නම් හෝ පචිති වේ ය යි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් භික්ෂූන්හට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

3. එසමයෙහි භික්ෂූහු පහන් දල්වීමෙහි දු ගිනිදල්වීමෙහි දු ගිනිහල් ගෙහි දු කුකුස් කෙරෙත්. භාග්‍යවතුන්හට තෙල කරුණ දැන්වූහ. ... ''මහණෙනි, එබඳු කරුණක් ඇති කල්හි ගිනි දල්වන්නට දල්වවන්නට අනුදනිමි.'' තවද මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**යම් මහණෙක් නො ගිලන් වැ එබඳු කරුණක් තබා තප්නා කැමැත්තේ ගිනි දල්වා නම් හෝ දල්වවා නම් හෝ පචිති වේ ය යි.**

4. යො පන: යම්, යම්බඳු...භික්ඛු...මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**අගිලාන** නම්: යමක්හට ගින්නෙන් තොර වැ පහසු වේ නම් හේ යැ.

**ගිලාන** නම්: යමක්හට ගින්නෙන් තොර වැ පහසු නො වේ නම් හේ යැ.

**විසිබ්බනාපෙක්ඛො;** තපිනු කැමැත්තේ,

**ජොති** නම්: ගිනි යැ යි කියනු ලැබේ.

**සමාදහෙය්‍ය;** තෙමේ දල්වා නම් පචිති ඇවැත් වේ.

**සමාදහාපෙය්‍ය;** අනෙකක්හු අණවා නම් පචිති ඇවැත් වෙයි. වරක් අණවන ලදුයේ බොහෝ වරකුදු දල්වා නම් පචිති ඇවැත් වේ.

**අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා;** එබඳු කරුණක් තබා.

අගිලානො අගිලානසඤ්ඤී විසිබ්බනාපෙක්ඛො ජොතිං සමාදහති වා සමාදහාපෙති වා අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා ආපත්ති පාචිත්තියස්ස. අගිලානො වෙමතිකො විසිබ්බනාපෙක්ඛො ජොතිං සමාදහති වා සමාදහාපෙති වා අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා ආපත්ති පාචිත්තියස්ස. අගිලානො ගිලානසඤ්ඤී විසිබ්බනාපෙක්ඛො ජොතිං සමාදහති වා සමාදහාපෙති වා අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා ආපත්ති පාචිත්තියස්ස.

පටිලාතං උක්ඛිපති ආපත්ති දුක්කටස්ස, ගිලානො අගිලානසඤ්ඤී ආපත්ති දුක්කටස්ස, ගිලානො වෙමතිකො ආපත්ති දුක්කටස්ස. ගිලානො ගිලානසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** ගිලානස්ස අඤ්ඤෙන කතං විසිබ්බෙති විතච්චිකඞ්ගාරං විසිබ්බෙති පදීපෙ ජොතිකෙ ජන්තාඝරෙ තථාරූපප්පච්චයා ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

ජොතිසික්ඛාපදං ඡට්ඨං.

## 6. 6. 7.

## නහානසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන භික්ඛූ තපොදෙ නහායන්ති. අථ ඛො[1] රාජා මාගධො සෙනියො බිම්බිසාරො සීසං නහායිස්සාමීති තපොදං ගන්ත්වා යාව අය්‍යා නහායන්තීති එකමන්තං පතිමානෙසි. භික්ඛූ යාව සමන්ධකාරා නහායිංසු. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො විකාලෙ සීසං නහායිත්වා නගරද්වාරෙ ථකිතෙ බහි නගරෙ වසිත්වා කාලස්සෙව අසම්භින්නෙන විලෙපනෙන යෙන භගවා තෙනුපසඞ්කමි; උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො රාජානං මාගධං සෙනියං බිම්බිසාරං භගවා එතදවොච: "කිස්ස ත්වං මහාරාජ කාලස්සෙව ආගතො අසම්භින්නෙන විලෙපනෙනා"ති. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො භගවතො එතමත්ථං ආරොචෙසි.

1. තෙන ඛො පන සමයෙන- මජසං.

නො ගිලනෙක් නො ගිලන් සත් ඇති වැ තපිනු කැමැත්තේ එබඳු කරුණක් තබා ගිනි දල්වා නම් හෝ දල්වවා නම් හෝ පචිති ඇවැත් වෙයි. නො ගිලනෙක් විමති ඇති වැ තපිනු කැමැත්තේ එබඳු කරුණක් තබා ගිනි දල්වා නම් හෝ දල්වවා නම් හෝ පචිති ඇවැත් වෙයි. නො ගිලනෙක් ගිලන් සත් ඇති වැ තපිනු කැමැත්තේ එබඳු කරුණක් තබා ගිනි දල්වා නම් හෝ දල්වවා නම් හෝ පචිති ඇවැත් වේ.

දැවී වැටුණු ගිනි පෙනෙලි ඔසවා තබා නම් දුකුළා ඇවැත් වෙයි. ගිලනෙක් නො ගිලන් සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. ගිලනෙක් විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වේ. ගිලනෙක් ගිලන් සත් ඇතියේ නම් ඇවැත් නැති.

ගිලනාහට, අනෙකක්හු විසින් කළ ගින්නක් තපි නම්, ගිනිදලින් තොර අඟුරු තපි නම්, පහන් දල්විමෙහි නම්, (පාත්‍රපචනාදියට) දල් විමෙහි නම්, ගිනිහල්ගෙහි නම්, එබඳු අන් කරුණක් ඇති කල්හි නම්, ඇවැත් නො වේ. ආපදාවෙහි උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**සවැනි ජොති ශික්ෂාපද යි**

## 6. 6. 7

## නහාන ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු රජගහ නුවර කලන්දකනිවාප නම් වූ වෙළුවනයෙහි වැඩැවෙසෙති. එසමයෙහි ෂඩ්වර්ගික භික්ෂූහු තපොදයෙහි ස්නාන කෙරෙත්. එකල්හි මගධෙශ්වර වූ ශ්‍රෙණිය බිම්බිසාර රජතෙමේ හිස සොධා නහන්නෙමැ යි තපොදයට ගොස් ආයුෂ්මතුන් සනහා නිමාවන තෙක් එකත් පසෙකැ සාපෙක්ෂක වැ සිටියේ ය. භික්ෂූහු අඳුරු වැටෙන තුරු ස්නානය කළහ. එකල්හි මගධෙශ්වර වූ ශ්‍රෙණිය බිම්බිසාර රජ විකල්හි හිස් සොධා නහා නුවර දොර වැසූ කල්හි බිහිනුවර වැසැ උදැසන මැ නො මැකිවිලෙවුනෙන් යුතු වැ භාග්‍යවතුන් වහන්සේ වෙතැ එළඹියේ යි. එළඹැ බුදුන් වැඳ එකත් පසෙකැ හුන්නේ යැ. භාග්‍යවතුන් වහන්සේ එකත් පසෙකැ හුන් මගධෙශ්වර වූ ශ්‍රෙණිය බිම්බිසාර රජුහට තෙල වදාළ සේක: ''මහරජ, තෙපි උදසන මැ නොමැකි විලෙවුනෙන් යුතු වැ කුමකට අවු''ද යි. එකල්හි මගධෙශ්වර වූ ශ්‍රෙණිය බිම්බිසාර රජ තෙමේ භාග්‍ය වතුන්හට තෙල කරුණ සැලකෙළේ යැ.

2. අථ ඛො භගවා රාජානං මාගධං සෙනියං බිම්බිසාරං ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. අථ ඛො රාජා මාගධො සෙනියො බිම්බිසාරො භගවතා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතෙත්වා භික්ඛු පටිපුච්ඡි. සච්චං කිර භික්ඛවෙ භික්ඛූ රාජානම්පි පස්සිත්වා න මත්තං ජානිත්වා නහායන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා රාජානම්පි පස්සිත්වා න මත්තං ජානිත්වා නහායිස්සන්ති, නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**යො පන භික්ඛු ඔරෙනද්ධමාසං නහායෙය්‍ය පාචිත්තියන්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

3. තෙන ඛො පන සමයෙන භික්ඛූ උණ්හසමයෙ පරිළාහසමයෙ කුක්කුච්චායන්තා න නහායන්ති සෙදගතෙන ගත්තෙන සයන්ති චීවරම්පි සෙනාසනම්පි දූසෙන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "අනුජානාමි භික්ඛවෙ උණ්හසමයෙ පරිළාහසමයෙ ඔරෙනද්ධමාසං නහායිතුං" එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**යො පන භික්ඛු ඔරෙනද්ධමාසං නහායෙය්‍ය අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං. තත්ථායං සමයො දියඩ්ඪො මාසො සෙසො ගිම්හානන්ති වස්සානස්ස පඨමො මාසො ඉච්චෙතෙ අඩ්ඪතෙය්‍ය මාසා උණ්හසමයො පරිළාහසමයො, අයං තත්ථ සමයොති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති,

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මගධෙශ්වර වූ ශ්‍රෙණිය බිම්බිසාර රජහු දැහැමි කථායෙන් මොනවට කරුණු දැක්වූ සේක. මොනවට කරුණු ගැන්වූ සේක. මොනවට තෙද ගැන්වූ සේක. මොනවට සතුටු කරවූ සේකි. එකල්හි මගධෙශ්වර වූ ශ්‍රෙණිය බිම්බිසාර රජ තෙමේ භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමි කථායෙන් මොනවට කරුණු දක්වන ලදුයේ මොනවට කරුණු ගන්වන ලදුයේ මොනවට තෙද ගන්වන ලදුයේ මොනවට සතුටු කරවන ලදුයේ හුනස්නෙන් නැගැ භාග්‍යවතුන් වහන්සේ සකසා වැඳ පැදකුණු කොට නික්ම ගියේ යි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මේ කරුණෙහි ලා මේ අවසරයෙහි ලා බික්සඟන රැස් කරවා මහණුන් පුළුවුත්සේක. සැබෑ ද මහණෙනි, භික්ෂූහු රජහු දු දැක පමණ නො දැනැ සනහද්ද යි, සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, ඒ හිස් පුරුෂයෝ රජහුදු දැක පමණ නො දැනැ සනැහු ද ? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**යම් මහණෙක් නෑ දින පටන් අඩමසක් නො පිරුණු සඳ සනහා නම් පචිති වේ ය යි.**

මෙසේ භාග්‍යවතුන් විසින් භික්ෂූන්හට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

3. එසමයෙහි භික්ෂූහු උෂ්ණසමයෙහි පරිදහසමයෙහි කුකුස් කරන්නාහු නො සනහත්. ඩහවැකුණු සිරුරෙන් යුතු වැ හොවිත්. සිවුර ද සෙනසුන ද කිලිටි වෙයි. භාග්‍යවතුන්හට තෙල කරුණ සැලකළහ. ......"මහණෙනි, උෂ්ණසමයෙහි පරිදහසමයෙහි අඩ-මසකින් මෙපිට නහන්නට අනුදනිමි" මහණෙනි, මෙසේත් මේ සිකපදය උදෙසවු:

**යම් මහණෙක් සුදුසුසමය තබා අඩමසෙකින් මොබ නහන්නේ නම් පචිති වේ. එහි මේ සුදුසු සමය යි: ග්‍රීෂ්ම මාසයන් අතුරින් ඉතිරිවැ සිටි යෙළමස යැ, වස්සාන සෘතුව පිළිබඳ පළමු මස යැ යි මෙසේ මේ අඩුතුන් මසෙකි, උෂ්ණසමය යැ පරිදහ සමය යි. මෙ එහි සුදුසු සමය යි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් භික්ෂූන්හට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

4. තෙන ඛො පන සමයෙන භික්ඛූ ගිලානා හොන්ති ගිලානපුච්ඡකා භික්ඛූ ගිලානෙ භික්ඛූ එතදවොචුං: "කච්චාවුසො ඛමනීයං කච්චි යාපනීය''න්ති. පුබ්බෙ මයං ආවුසො ඔරෙනද්ධමාසං නහායාම තෙන නො ඵාසු හොති. ඉදානි පන භගවතා පටික්ඛිත්තන්ති කුක්කුච්චායන්තා න නහායාම තෙන නො න ඵාසු හොතී''ති. භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "අනුජානාමි භික්ඛවෙ ගිලානෙන භික්ඛුනා ඔරෙනද්ධමාසං නහායිතුං.'' එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**යො පන භික්ඛු ඔරෙනද්ධමාසං නහායෙය්‍ය අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං. තත්ථායං සමයො දියඩ්ඪො මාසො සෙසො ගිම්හානන්ති වස්සානස්ස පඨමො මාසො ඉච්චෙතෙ අඩ්ඪතෙය්‍ය මාසා උණ්හසමයො පරිළාහසමයො ගිලානසමයො, අයං තත්ථ සමයොති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

5. තෙන ඛො පන සමයෙන භික්ඛූ නවකම්මං කත්වා කුක්කුච්චායන්තා න නහායන්ති සෙදගතෙන ගත්තෙන සයන්ති චීවරම්පි සෙනාසනම්පි දූසන්ති භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "අනුජානාමි භික්ඛවෙ කම්මසමයෙ ඔරෙනද්ධමාසං නහායිතුං'', එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**යො පන භික්ඛු ඔරෙනද්ධමාසං නහායෙය්‍ය අඤ්ඤත්‍ර සමයා. පාචිත්තියං. තත්ථායං සමයො දියඩ්ඪො මාසො සෙසො ගිම්හානන්ති වස්සානස්ස පඨමො මාසො ඉච්චෙතෙ අඩ්ඪතෙය්‍ය මාසා උණ්හසමයො පරිළාහසමයො ගිලානසමයො කම්මසමයො, අයං තත්ථ සමයොති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

6. තෙන ඛො පන සමයෙන භික්ඛූ අද්ධානං ගන්ත්වා කුක්කුච්චායන්තා න නහායන්ති සෙදගතෙන ගත්තෙන සයන්ති චීවරම්පි සෙනාසනම්පි දූසන්ති, භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "අනුජානාමි භික්ඛවෙ අද්ධානගමනසමයෙ ඔරෙනද්ධමාසං නහායිතුං.'' එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**යො පන භික්ඛු ඔරෙනද්ධමාසං නහායෙය්‍ය අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං. තත්ථායං සමයො දියඩ්ඪො මාසො සෙසො ගිම්හානන්ති වස්සානස්ස පඨමො මාසො ඉච්චෙතෙ අඩ්ඪතෙය්‍යමාසා උණ්හසමයො පරිළාහසමයො ගිලානසමයො කම්මසමයො අද්ධානගමනසමයො, අයං තත්ථ සමයොති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

4. එසමයෙහි වනායි භික්ෂූහු ගිලන් වූවාහු වෙති. ගිලනුන් පුළු වුස්නා භික්ෂූහු ගිලන් මහණුන්ට මෙය කීහු: "කිම ඇවැත්නි, සිහිය හැකි ද? කිම යැපිය හැකි ද යි. ඇවැත්නි, පෙර ඇපි අඩමසකින් මොබ සනහම්හ. එයින් අපට පහසු වෙයි. දැන් වනාහි භාග්‍යවතුන් විසින් ප්‍රතික්ෂිප්ත යැ යි කුකුස් කරන්නමෝ නො සනහම්හ. එයින් අපට පහසු නො වේ යැ"යි භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැලකළහ. "මහණෙනි, ගිලන් මහණහු විසින් අඩමසෙකින් මොබ නහන්නට අනුදැනිමි." මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**යම් මහණෙක් සුදුසු සමය තබා අඩමසෙකින් මොබ සනහා නම් පචිති වේ. එහි මේ සුදුසු සමය යි; ගිමන් සිවු මස අතුරින් ඉතිරිව සිටි යෙළ මස යැ වසන් සෙමෙහි පළමු මස යැ යි මෙසේ තෙල අඩු තුන් මස උෂ්ණසමය යැ පරිදහසමය යැ. ගිලානසමය යි. මේ එහි සුදුසු සමය යි.**

මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්හට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

5. එසමයෙහි වනාහි භික්ෂූහු නවාම් කොට කුකුස් කරන්නාහු නො සනහත්. ඩහවැකුණු සිරුරෙන් යුතු වැ හොවිත්. සිවුර ද සෙනසුන ද කිලිටි වෙයි. භාග්‍යවතුන්හට තෙල කරුණ සැලකළහ... "මහණෙනි, කර්මාන්තසමයෙහි අඩමසෙකින් මොබ සනහන්නට අනුදැනිමි" මෙසේ මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**යම් මහණෙක් සුදුසු සමය තබා අඩමසෙකින් මොබ සනහා නම් පචිති වේ. එහි මේ සුදුසු සමය යි: ගිමන් සිවුමසින් ඉතිරි වැ සිටි යෙළමස යැ වසන් සිවුමස පළමු මස යැ, මෙසේ තෙල දෙමස් අඩ මස උෂ්ණසමය යැ පරිදහසමය යැ ගිලානසමය යැ කම් සමය යි මේ එහි සුදුසු සමය යි.**

මෙසේ භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූන්හට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

6. එසමයෙහි වනාහි භික්ෂූහු දුරුමඟ ගොස් කුකුස් කරන්නාහු නො සනහති. ඩහවැකුණු කයින් යුතු වැ හොවිත්. සිවුර ද සෙනසුන ද කිලිටි වෙයි. භාග්‍යවතුන්හට තෙල කරුණ සැලකළහ... "මහණෙනි, දුරුමග යන කල්හි අඩමසෙකින් මොබ සනහන්නට අනුදැනිමි" මහණෙනි මේ සිකපදය මෙසේ උදෙසවු:

**යම් මහණෙක් සුදුසු සමය තබා අඩමසෙකින් මොබ සනහා නම් පචිති වේ. එහි මේ සුදුසු සමය යි. ගිමන් සිවු මස පිළිබඳ වූ සෙසු එක්මස් අඩමස යැ වසන් සිවුමස පිළිබඳ වූ පළමු මස යැ. මෙසේ මේ දෙමස් අඩමස උෂ්ණසමය යැ පරිදහසමය යැ, ගිලානසමය යැ කම්සමය යැ අද්ධාන ගමන සමය යි. මේ එහි සුදුසු සමය යි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් භික්ෂූන්හට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

7. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ අජ්ඣොකාසෙ චීවරකම්මං කරොන්තා සරජෙන වාතෙන ඔකිණ්ණා හොන්ති දෙවො ච ථොක ථොකං ඵුසායති භික්ඛූ කුක්කුච්චායන්තා න නහායන්ති කිලින්නෙන ගත්තෙන සයන්ති. චීවරම්පි සෙනාසනම්පි දුස්සති, භගවතො එතමත්ථං ආරොචෙසුං -පෙ- "අනුජානාමි භික්ඛවෙ වාතවුට්ඨිසමයෙ ඔරෙනද්ධමාසං නහායිතුං." එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

"යො පන භික්ඛු ඔරෙනද්ධමාසං නහායෙය්‍ය අඤ්ඤත්‍ර සමයා පාචිත්තියං. තත්‍ථායං සමයො: දියඩ්ඪො මාසො සෙසො ගිම්හානන්ති වස්සානස්ස පඨමො මාසො ඉච්චෙතෙ අඩ්ඪතෙය්‍යමාසා උණ්හසමයො පරිළාහසමයො ගිලානසමයො කම්මසමයො අද්ධානගමනසමයො වාතවුට්ඨිසමයො අයං තත්ථ සමයො"ති.

8. යො පනාති: යො යාදිසො -පෙ- භික්ඛූති -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

ඔරෙනද්ධමාසන්ති: ඌනකද්ධමාසං.

නහායෙය්‍යාති: චුණ්ණෙන වා මත්තිකාය වා නහායති පයොගෙ[1] දුක්කටං, නහානපරියොසානෙ ආපත්ති පාචිත්තියස්ස.

අඤ්ඤත්‍රසමයාති: ඨපෙත්වා සමයං.

උණ්හසමයො නාම; දියඩ්ඪො මාසො සෙසො ගිම්හානං[2]

පරිළාහසමයො නාම; වස්සානස්ස පඨමො මාසො. ඉච්චෙතෙ අඩ්ඪතෙය්‍ය මාසා උණ්හසමයො පරිළාහසමයොති නහායිතබ්බං.

ගිලානසමයො නාම: යස්ස විනා නහානෙන ඵාසු හොති. ගිලානසමයොති නහායිතබ්බං.

කම්මසමයො නාම; අන්තමසො පරිවෙනම්පි සම්මට්ඨං හොති කම්මසමයොති නහායිතබ්බං.

අද්ධානගමනසමයො නාම; අඩ්ඪයොජනං ගච්ඡිස්සාමීති නහායිතබ්බං ගච්ඡන්තෙන නහායිතබ්බං ගතෙන නහායිතබ්බං.

වාතවුට්ඨිසමයො නාම; භික්ඛූ සරජෙන වාතෙන ඔකිණ්ණා හොන්ති ද්වෙ වා තීණි වා උදකඵුසිතානි කායෙ නිපතිතානි හොන්ති වාතවුට්ඨිසමයොති නහායිතබ්බං.

1. පයොගෙ ඡයොගෙ - මජසං
2. ගිම්හානන්ති - ම්ා සීමු සීමු

7. එසමයෙහි වනාහි බොහෝ භික්ෂූහු එළිමහනෙහි සිවුරුකම් කරන්නාහු දූහුවිලි සහිත සුළඟින් වැකුණාහු වෙති. වැස්ස ද මඳින් මඳ වැටෙයි. භික්ෂූහු කුකුස්කරන්නාහු නො සනහත්, තෙත් වූ කයින් යුතු වැ හොවිත්. සිවුර ද සෙනසුන ද කිලිටි වෙයි. භාග්‍යවතුන්හට මෙල කරුණ සැලකළහ. ... "මහණෙනි, වැසි සුළං සමයෙහි අඩමසෙකින් මොබ සනහන්නට අනුදනිමි." මෙසේ මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**"යම් මහණෙක් සුදුසු සමය තබා අඩමසින් මොබ සනහා නම් පචිති වේ. එහි මේ සුදුසු සමය යි: ගිමන් සිවුමසින් ඉතිරි වැ සිටි යෙළ මස යැ. වසන් සිවුමස්හි පළමු මස යැ, මෙසේ මේ දෙමස් අඩමස උෂ්ණසම යැ පරිදහසමය යැ, ගිලානසමය යැ කම්මසමය යැ අද්ධාන ගමන සමය යැ වාතවුට්ඨීසමය යි. මේ එහි සුදුසු සමය යි.**

8. යො පන යම් යම්බඳු ... භික්‍ෂු ...මෙතෙමේ මේ අර්ථයෙහිලා අදහස් කරන ලද භික්ෂු යි.

**ඔරෙනඩමාසං:** යනු උනු අඩමසක්,

**නහායෙය්‍ය** යනු සුන්නෙන් හෝ මැටියෙන් හෝ සනහා නම් පියෝහි දුකුළා වෙයි. සනහන අවසන්හි පචිති ඇවැත් වේ.

**අඤ්ඤත්‍ර සමයා;** සුදුසු සමය තබා,

**උණ්හසමය නම්:** ගිමන් සිවුමස අතුරින් ඉතිරිවැ සිටි යෙළ මස යැ, පරිළාහසමය නම්: වැයි සිවුමස පිළිබඳ පළමු මස යැ, මෙසේ තෙල දෙමස් අඩමස උෂ්ණසමයැ පරිදහසමයැ යි ස්නාන කළ යුතු යි.

**ගිලානසමය නම්:** යමක්හට නැමෙන් තොර වැ පහසු නො වේ නම් ගිලානසමයැ යි සැනභිය යුතු යි.

**කම්මසමය නම්:** යටත් පිරිසෙයින් පිරිවෙන ද හමදනා ලද්දේ වේ නම් කම්මසමයැ යි සැනභිය යුතු යි.

**අද්ධානගමනසමය නම්:** අඩයොත්නක් යෙමි යි සැනභිය යුතු, යන්නහු විසින් සැනභිය යුතු, ගියහු විසින් සැනභිය යුතු යි.

**වාතවුට්ඨීසමය නම්:** භික්ෂූහු දූහුවිලි සහිත සුළඟින් වැකුණාහු වෙද්ද, දෙඇුන් දිය පොදෙක් සිරුරෙහි වැටුණේ හෝ වේ ද, වාතවුට්ඨීසම යැ යි සැනභිය යුතු යි.

ඌනකද්ධමාසෙ ඌනකසඤ්ඤී අඤ්ඤත්‍ර සමයා නහායති ආපත්ති පාචිත්තියස්ස. ඌනකද්ධමාසෙ වෙමතිකො අඤ්ඤත්‍රසමයා නහායති ආපත්ති පාචිත්තියස්ස, ඌනකද්ධමාසෙ අතිරෙකසඤ්ඤී අඤ්ඤත්‍ර සමයා නහායති ආපත්ති පාචිත්තියස්ස.

අතිරෙකද්ධමාසෙ ඌනකසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අතිරෙකද්ධමාසෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අතිරෙකද්ධමාසෙ අතිරෙකසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** සමයෙ අද්ධමාසං නහායති, අතිරෙකද්ධමාසං නහායති, සති කරණීයෙ උදකං ඔතරිත්වා නහායති, පාරං ගච්ඡන්තො නහායති, සබ්බපච්චන්තිමෙසු ජනපදෙසු ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**නහානසික්ඛාපදං සත්තමං.**

## 6. 6. 8

## දුබ්බණ්ණකරණසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ **අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ ච පරිබ්බාජකා ච **සාකෙතා** සාවත්ථිං අද්ධානමග්ගපටිපන්නා හොන්ති. අන්තරාමග්ගෙ චොරා නික්ඛමිත්වා තෙ අච්ඡින්දිංසු. සාවත්ථියා රාජභටා නික්ඛමිත්වා තෙ චොරෙ සභණ්ඩෙ ගහෙත්වා භික්ඛූනං සන්තිකෙ දූතං පාහෙසුං: "ආගච්ඡන්තු භදන්තා සකං සකං චීවරං සඤ්ජානිත්වා ගණ්හන්තූ"ති භික්ඛූ න සඤ්ජානන්ති තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම භදන්තා අත්තනො අත්තනො චීවරං න සඤ්ජානන්තී"ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

2. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතෙත්වා භික්ඛූනං තදනුච්ඡවිකං තදනුලොමිකං ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: තෙන හි භික්ඛවෙ භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤාපෙස්සාමි දස අත්ථවසෙ පටිච්ච, සඞ්ඝසුට්ඨුතාය, සඞ්ඝඵාසුතාය -පෙ- සද්ධම්මට්ඨිතියා, විනයානුග්ගහාය. එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**නවං පන භික්ඛුනා චීවරලාභෙන තිණ්ණං දුබ්බණ්ණකරණානං අඤ්ඤතරං දුබ්බණ්ණකරණං ආදාතබ්බං නීලං වා කද්දමං වා කාලසාමං වා, අනාදා චෙ භික්ඛු තිණ්ණං දුබ්බණ්ණකරණානං අඤ්ඤතරං දුබ්බණ්ණකරණං නවං චීවරං පරිභුඤ්ජෙය්‍ය පාචිත්තියන්ති.**

උතු අඩමස්හි උතු සත් ඇතියේ සුදුසු සමය තබා සනහා නම් පචිති ඇවැත් වෙයි. උතු අඩමස්හි විමති ඇතියේ සුදුසු සමය තබා සනහා නම් පචිති ඇවැත් වෙයි. උතු අඩමස්හි අයිරා සත් ඇතියේ සුදුසු සමය තබා සනහා නම් පචිති ඇවැත් වේ.

අයිරා අඩමස්හි උතු සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අයිරා අඩමස්හි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි, අයිරා අඩමස්හි අයිරා සත් ඇතියේ නම් ඇවැත් නැති.

සුදුසු සමයෙහි නම්, අඩමසකට වරක් සනහා නම්, අයිරා අඩමසෙකින් සනහා නම්, කරුණු ඇති කල්හි දියට බැස සනහා නම්, පරතෙරට යෙමින් සනහා නම් ඇවැත් නො වේ. සියලු පසල්දනව්හි, ආපදයෙහි, උම්මත්තකහට, ආදිකම්මිකහට ඇවැත් නැති.

සත්වැනි නහාන ශික්ෂාපද යි.

## 6. 6. 8

## දුබ්බණ්ණකරණ ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජේතවන නම් වූ, අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි බොහෝ භික්ෂූහු ද පරිව්‍රාජකයෝ ද සාකෙතයෙන් සැවැතට යන අදන්මගට පිළිපන්නාහු වෙති. අතර මහැ සොරු නික්මැ ඔවුන් ඇසිඳගත්හ. රාජපුරුෂයෝ සැවැතින් නික්මැ ගොස් බඩු සහිත ඒ සොරුන් අල්වා ගෙන භික්ෂූන් වෙතැ දූතයකු යැවූහු: ''පින්වතුන් වහන්සේ එත්වා, තමන් තමන් සතු සිවුරු හැඳිනැ ගනිත්වා,''යි. භික්ෂූහු නො හඳුනති. ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්. ''කෙසේ නම් වහන්දෑ තමන් තමන් සතු සිවුරු නො හඳුනද්දෑ''යි භික්ෂූහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේහට තෙල කරුණ සැලකළාහු ය.

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ තෙල කරුණෙහි ලා තෙල අවසරයෙහි ලා බික්සඟන රැස් කරවා මහණුන්හට එයට සරිලන එයට අනුලොම් වන දැහැමි කථා කොට මහණුන් ඇමැතුසේක. එහෙයින් මහණෙනි, කරුණු දසයක් පිණිස මහණුන්හට සිකපද පනවන්නෙමි. (එනම්) සඞසයාගේ මනා පිළිගැනුම පිණිස සඞසයාගේ පහසුබව පිණිස ... සසුන් පැවැත්ම පිණිස විනයට රුකුල් දීම පිණිස යි. මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**''අලුත් සිවුරක් ලත් මහණහු විසින් නිල් හෝ මඩ හෝ කළු හෝ යන තෙවැදෑරුම් දුර්වර්ණ කිරීම් අතුරෙන් එක්තරා දුර්වර්ණ කිරීමෙක් ගත යුත්තේ යි. ඉදින් මහණ තෙවැදෑරුම් දුර්වර්ණ කිරීම් අතුරෙන් එක්තරා දුර්වර්ණ කිරීමක් නොගෙන අළුත් සිවුරක් පරිභොග කෙරේ නම් පචිති වේ''යි.**

3. **නවං** නාම; අකතකප්පං වුච්චති.

**චීවරං** නාම: ඡන්නං චීවරානං අඤ්ඤතරං චීවරං.

**තිණ්ණං දුබ්බණ්ණකරණානං අඤ්ඤතරං දුබ්බණ්ණකරණං ආදාතබ්බන්ති:** අන්තමසො කුසග්ගෙනපි ආදාතබ්බං.

**නීලං** නාම; **ද්වෙ නීලානි** කංසනීලං පලාසනීලං.

**කද්දමො** නාම: ඔදකො වුච්චති.

**කාළසාමං** නාම: යං කිඤ්චි කාළකං.

**අනාදා චෙ භික්ඛු දුබ්බණ්ණකරණානං අඤ්ඤතරං දුබ්බණ්ණකරණන්ති:** අන්තමසො කුසග්ගෙනපි අනාදියිත්වා තිණ්ණං දුබ්බණ්ණකරණානං අඤ්ඤතරං දුබ්බණ්ණකරණං නවං චීවරං පරිභුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස.

අනාදින්නෙ අනාදින්නසඤ්ඤී පරිභුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස අනාදින්නෙ වෙමතිකො පරිභුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස, අනාදින්නෙ ආදින්නසඤ්ඤී පරිභුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස. ආදින්නෙ අනාදින්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස ආදින්නෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. ආදින්නෙ ආදින්නසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** ආදියිත්වා පරිභුඤ්ජති, කප්පො නට්ඨො හොති කප්පකතොකාසො ජිණ්ණො හොති, කප්පකතෙන අකප්පකතං සංසිබ්බිතං හොති, අග්ගළෙ[1] අනුවාතෙ පරිභණ්ඩෙ උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

දුබ්බණ්ණකරණසික්ඛාපදං අට්ඨමං.

1. අග්ගළෙ - මජ්සං.

3 නව නම්: කප්බිඳු නො තැබූ සිවුර කියනු ලැබෙයි.

**චීවර නම්:** සවැදෑරුම් සිවුරු අතුරෙන් එක්තරා සිවුරෙකි.

**තිණ්ණං දුබ්බණ්ණකරණානං අඤ්ඤතරං දුබ්බණ්ණකරණං ආදාතබ්බං;** යටත් පිරිසෙයින් තුසතණගිනුදු (කප්බිඳු) තැබීම කළ යුතු.

**නීල නම්:** කංසනීල (යමල) යැ පලාසනීල (කොළපැහැ) යැයි දෙනිමලකි.

**කද්දම නම්:** දියමඩැ යි කියනු ලැබෙයි.

**කාළසාම නම්:** යම් කිසි කළු පැහැයක්:

**අනාදා චෙ භික්ඛු දුබ්බණ්ණ කරණානං අඤ්ඤතරං දුබ්බණ්ණකරණං** යනු යටත් පිරිසෙයින් කුසතණගිනුදු තෙ වැදෑරුම් දුර්වර්ණ කිරීම් අතුරෙන් එක්තරා දුර්වර්ණ කිරීමක් නො කොට අලුත් සිවුරක් පරිභොග කෙරේ නම් පචිති ඇවැත් වේ.

කප් බිඳු නො දුන් කල්හි නුදුන් සන් ඇතිවැ පරිභොග කෙරේ නම් පචිති ඇවැත් වෙයි. කප්බිඳු නුදුන් කල්හි විමති ඇතිවැ පරිභොග කෙරේ නම් පචිති ඇවැත් වෙයි. කප් බිඳු නො දුන් කල්හි දුන් සන් ඇතිවැ පරිභොග කෙරේ නම් පචිති ඇවැත් වේ. කප්බිඳු දුන් කල්හි නො දුන්සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. කප්බිඳු දුන් කල්හි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. කප් බිඳු දුන් කල්හි දුන් සන් ඇතියේ නම් ඇවැත් නැති.

කප්බිඳු ගෙන පරිභොග කෙරේ නම්; කප් බිඳු නැසුණේ වී නම්, කප් බිඳු කළ තැන දිරා ගියේ වී නම්, කප් බිඳු තබන ලද්ද හා කප් බිඳු නො තබන ලද්දක් හිවන ලදුයේ වී නම් අවැත් නො වේ. මැඩිල්ලෙහි දිගනුවායෙහි සරසනුවායෙහි උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

අටවැනි දුබ්බණ්ණකරණ ශික්ෂාපද යි.

## 6. 6. 9

# විකප්පනසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා උපනන්දො සක්‍යපුත්තො භාතුනො සද්ධිවිහාරිකස්ස භික්ඛුනො සාමං චීවරං විකප්පෙත්වා අපච්චුද්ධාරකං[1] පරිභුඤ්ජති අථ ඛො සො භික්ඛු භික්ඛූනං එතමත්ථං ආරොචෙසි: ''අයං ආවුසො ආයස්මා උපනන්දො සක්‍යපුත්තො මය්හං සාමං චීවරං[2] විකප්පෙත්වා අපච්චුද්ධාරකං පරිභුඤ්ජතී''ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: කථං හි නාම ආයස්මා උපනන්දො සක්‍යපුත්තො භික්ඛුස්ස සාමං චීවරං විකප්පෙත්වා අපච්චුද්ධාරකං පරිභුඤ්ජිස්සතීති -පෙ- සච්චං කිර ත්වං උපනන්ද භික්ඛුස්ස සාමං චීවරං විකප්පෙත්වා අපච්චුද්ධාරකං පරිභුඤ්ජසීති. සච්චං භගවා විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම ත්වං මොඝපුරිස භික්ඛුස්ස සාමං චීවරං විකප්පෙත්වා අපච්චුද්ධාරකං පරිභුඤ්ජිස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**''යො පන භික්ඛු භික්ඛුස්ස වා භික්ඛුනියා වා සික්ඛමානාය වා සාමණෙරස්ස වා සාමණෙරියා වා සාමං චීවරං විකප්පෙත්වා අපච්චුද්ධාරකං පරිභුඤ්ජෙය්‍ය පාචිත්තිය''න්ති.**

2. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**භික්ඛුස්සාති:** අඤ්ඤස්ස භික්ඛුස්ස,

**භික්ඛුනී** නාම: උභතොසඞ්ඝෙ උපසම්පන්නා.

**සික්ඛමානා** නාම: ද්වෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛා.

**සාමණෙරො** නාම: දසසික්ඛාපදිකො.

**සාමණෙරී** නාම: දසසික්ඛාපදිකා.

**සාමන්ති:** සයං විකප්පෙත්වා.

**චීවරං** නාම: ඡන්නං චීවරානං අඤ්ඤතරං චීවරං විකප්පනුපගං පච්ඡිමං[3].

---

1. අපච්චුද්ධාරණං - මජසං.
2. මය්හං චීවරං සාමං - මජසං.
3. විකප්පනුපගං පච්ඡිමං - සී මජසං.

## 6.6.9

## විකප්පන ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම්වූ අනේපිඩු සිටුහුගේ අරමහි වැඩැවෙසෙති. එසමයෙහි ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර බෑයාගේ සද්ධිවිහාරික භික්ෂුහට තමා මැ සිවුරක් විකපා නොපසුදුරා පරිභොග කෙරෙයි. එකල්හි ඒ මහණ මහණුන්හට තෙල කාරුණ දන්වී සැ : "ඇවැත්ති, මේ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර මාහට තමා මැ සිවුරක් විකපා නො පසුදුරා පරිභොග කෙරේ" යසී. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ...ඔහු ලමු කොට සිතති. නුගුණ පවසති. දෙස් පතුරුවත්. "කෙසේ නම් ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර මහණක්හට තමා මැ සිවුරක් විකපා නො පසුදුරා පරිභොග කෙළේ" දයි ... සැබෑ ද උපනන්ද, තෙපි මහණක්හට තමා මැ සිවුරක් විකපා නො පසුදුරා පරිභොග කරවූ ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් හිස් පුරුෂය තෙපි මහණක්හට තමා මැ සිවුරක් විකපා නො පසුදුරා පරිභොග කළහු ද? හිස් පුරුෂය මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මහණෙනි මෙසේ මේ සිකපදය උදෙසවූ:

**"යම් මහණෙක් මහණක්හට හෝ මෙහෙණක්හට හෝ සික්මනුවක්හට හෝ හෙරණකුහට හෝ හෙරණකහට හෝ තෙමේ සිවුරක් විකපා නො පසුදුරා පරිභොග කෙරේ නම් පචිති වේ" යයි.**

2. යො පන: යම් යම්බඳු...භික්ඛු...මෙ තෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**භික්ඛුස්ස;** අන් මහණක්හට.

**භික්ඛුනී නම:** දෙසඟුන් කෙරෙහි උපසපන් වූවා.

**සික්ඛමානා නම:** දෙවසක් සදහම්හි භික්මුණු සික ඇත්ති.

**සාමණෙර නම:** දස සිකපද ඇතියේ.

**සාමණෙරී නම:** දස සිකපද ඇත්තී.

**සාමං;** තෙමේ විකපා

**චීවර නම:** ස වැදෑරුම් සිවුරු අතුරෙන් එක්තරා විකපුන් පොහෝනා පැසුළු සිවුරක්.

**විකප්පනා** නාම ද්වෙ විකප්පනා: සම්මුඛා විකප්පනා ච පරම්මුඛා විකප්පනා ච.

**සම්මුඛා විකප්පනා** නාම: ඉමං චීවරං තුය්හං විකප්පෙමි ඉත්ථන්නාමස්ස වාති.

**පරම්මුඛා විකප්පනා** නාම: ඉමං චීවරං විකප්පනත්ථාය තුය්හං දම්මීති... තෙන වත්තබ්බො කො තෙ මිත්තො වා සන්දිට්ඨො වාති. ඉත්ථන්නාමො ච ඉත්ථන්නාමො චාති තෙන වත්තබ්බො. අහං තෙසං දම්මි, තෙසං සන්තකං පරිභුඤ්ජ වා විස්සජ්ජෙහි වා යථාපච්චයං වා කරොහීති.

**අපච්චුද්ධාරකං** නාම: තස්ස වා අදින්නං, තස්ස වා අවිස්සසන්තො පරිභුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස. අපච්චුද්ධාරකෙ අපච්චුද්ධාරකසඤ්ඤී පරිභුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස. අපච්චුද්ධාරකෙ වෙමතිකො පරිභුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස. අපච්චුද්ධාරකෙ පච්චුද්ධාරකසඤ්ඤී පරිභුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස.

අධිට්ඨෙති වා විස්සජ්ජෙති වා ආපත්ති දුක්කටස්ස. පච්චුද්ධාරකෙ අපච්චුද්ධාරකසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. පච්චුද්ධාරකෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. පච්චුද්ධාරකෙ පච්චුද්ධාරකසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** සො වා දෙති තස්ස වා විස්සසන්තො පරිභුඤ්ජති, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

විකප්පන සික්ඛාපදං නවමං.

## 6. 6. 10

## චීවරාපනිධාන සික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ, තෙන ඛො පන සමයෙන සත්තරසවග්ගියා භික්ඛූ අසන්නිහිත පරික්ඛාරකා[1] හොන්ති. ඡබ්බග්ගියා භික්ඛූ සත්තරසවග්ගියානං භික්ඛූනං පත්තම්පි චීවරම්පි අපනිධෙන්ති, සත්තරසවග්ගියා භික්ඛූ ඡබ්බග්ගියෙ භික්ඛූ එතදවොචුං: "දෙථාවුසො අම්හාකං පත්තම්පි චීවරම්පී"ති, ඡබ්බග්ගියා භික්ඛූ හසන්ති. තෙ රොදන්ති. භික්ඛූ එවමාහංසු; "කිස්ස තුම්හෙ ආවුසො රොදථා"ති". ඉමෙ ආවුසො ඡබ්බග්ගියා භික්ඛූ අම්හාකං පත්තම්පි චීවරම්පි අපනිධෙන්තී"ති.

1. අසන්නිහිතපරික්ඛාරා–මජසං.

**විකප්පනා නම්:** හමුයෙහි විකප්පනා යැ, නොහමුයෙහි විකප්පනා යි විකප්පනා දෙකෙකි.

**සම්මුඛා විකප්පනා** නම්: මේ සිවුර තොපට හෝ මෙනම් ඇතියහුට හෝ විකපමි.

**පරම්මුඛා විකප්පනා** නම්: මේ සිවුර විකපුන් සඳහා තොපට දෙමැ යි. කවරෙක් තාගේ මිතුරු හෝ දුටුමිතුරු හෝ වේ දැ යි ඔහු විසින් කිය යුත්තේ යි. මෙනම් ඇතියේ ද මෙනම් ඇතියේ දැ යි ඔහු විසින් කිය යුත්තේ යි. මම ඔවුනට දෙමි, ඔවුන් සතු වූව පරිභොග හෝ කරව, දීම හෝ කරව, රිසියෙන්නක් හෝ කරව යි.

**අපච්චුද්ධාරක** නම්: ඔහුට නො දෙන ලද්ද හෝ ඔහුට අවිස්වසින් හෝ පරිභොග කෙරේ නම් පචිති ඇවැත් වෙයි. නො කළ පසුදුරුණෙහි නො කළ පසුදුරුණු සන් ඇතියේ පරිභොග කෙරේ නම් පචිති ඇවැත් වෙයි. නො කළ පසුදුරුණෙහි විමති ඇතියේ පරිභොග කෙරේ නම් පචිති ඇවැත් වෙයි. නො කළ පසුදුරුණෙහි කළ පසුදුරුණු සන් ඇතියේ පරිභොග කෙරේ නම් පචිති ඇවැත් වේ.

ඉටා නම් හෝ විසඳා නම් හෝ දුකුළා ඇවැත් වෙයි. කළ පසු-දුරුණෙහි නො කළ පසුදුරුණු සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. කළ පසුදුරුණෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. කළ පසුදුරු-ණෙහි කළ පසුදුරුණු සන් ඇතියේ නම් ඇවැත් නැති.

හෙතෙමේ දෙයි හෝ, ඔහු කෙරෙහි විස්වස් කරමින් පරිභොග කෙරෙයි හෝ ඇවැත් නො වේ. උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

**නවවැනි විකප්පනශික්ෂාපද යි**

## 6.6.10

## චීවරාපනිධාන ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්නුවර ජේතවන නම්වූ, අනේපිඩු සිටුහුගේ අරමෙහි වැඩැවෙසෙති. එසමයෙහි සතළොස් වග මහණුහු නො තැන්පත් කළ පිරිකර ඇතියෝ වෙති. සවග මහණුහු සතළොස්වග මහණුන්ගේ පා ද සිවුරු ද සඟවති. සතළොස් වග මහණුහු සවග මහණුන්ට තෙල කීහු : ''ඇවැත්නි, අපගේ පාත්‍ර ද සිවුරු ද දෙව''යි සවග මහණෝ සිනා සෙති. ඔහු හඩත්. භික්ෂූහු මෙසේ කීහු : ''ඇවැත්නි, තෙපි කුමකට හඩවු''දැ යි ඇවැත්නි, මේ සවග මහණෝ අපගේ පාත්‍ර ද සිවුරු ද සඟවති යයි.

2. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති; "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛූනං පත්තම්පි චීවරම්පි අපනිධෙස්සන්තී"ති -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ භික්ඛූනං පත්තම්පි චීවරම්පි අපනිධෙථාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා භික්ඛූනං පත්තම්පි චීවරම්පි අපනිධෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු භික්ඛුස්ස පත්තං වා චීවරං වා නිසීදනං වා සූචිඝරං වා කායබන්ධනං වා අපනිධෙය්‍ය වා අපනිධාපෙය්‍ය වා අන්තමසො හස්සාපෙක්ඛොපි[1] පාචිත්තිය"න්ති.**

3. යො පනාති; යො යාදිසො -පෙ- භික්ඛූති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

භික්ඛුස්සාති: අඤ්ඤස්ස භික්ඛුස්ස.

පත්තො නාම: ද්වෙ පත්තා අයොපත්තො මත්තිකාපත්තො.

චීවරං නාම; ඡන්නං චීවරානං අඤ්ඤතරං චීවරං විකප්පනුපගපච්ඡිමං.

නිසීදනං නාම: සදසං වුච්චති.

සූචිඝරං නාම: සසූචිකං වා අසූචිකං වා.

කායබන්ධනං නාම: ද්වෙ කායබන්ධනානි පට්ටිකා සූකරන්තකං.

අපනිධෙය්‍යාති[2]: සයං අපනිධෙති ආපත්ති පාචිත්තියස්ස.

අපනිධාපෙය්‍යාති[3]: අඤ්ඤං ආණාපෙති ආපත්ති පාචිත්තියස්ස. සකිං ආණත්තො බහුකම්පි අපනිධෙති ආපත්ති පාචිත්තියස්ස.

අන්තමසො හස්සාපෙක්ඛොපීති: කීළාධිප්පායො.

උපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී පත්තං වා චීවරං වා නිසීදනං වා සූචිඝරං වා කායබන්ධනං වා අපනිධෙති වා අපනිධාපෙති වා අන්තමසො හස්සාපෙක්ඛොපි ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ වෙමතිකො -පෙ- උපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී පත්තං වා චීවරං වා නිසීදනං වා සූචිඝරං වා කායබන්ධනං වා අපනිධෙති වා අපනිධාපෙති වා අන්තමසො හස්සාපෙක්ඛොපි ආපත්ති පාචිත්තියස්ස.

---

1. හස්සාපෙක්ඛෙනපි - මඡසං.
2. අපනිධෙය්‍ය වාති - මඡසං.
3. අපනිධාපෙය්‍ය වාති - මඡසං.

2. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස්වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් සවග මහණහු මහණුන්ගේ පාත්‍ර ද සිවුරු ද සැඟවූහු'' දැ යි...සැබෑ ද මහණෙනි, තෙපි මහණුන්ගේ පාත්‍ර ද සිවුරු ද සඟවවු දැ යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි මහණුන්ගේ පාත්‍ර ද සිවුරු ද සැඟවූවහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**''යම් මහණෙක් යටත් පිරිසෙයින් කෙළිරිසියෙන් නමුදු මහණක්හුගේ පයක් හෝ සිවුරක් හෝ නිසීදනයක් හෝ හිදිගුළාවක් හෝ කාබානක් හෝ සඟවන්නේ නම් හෝ සඟවවන්නේ නම් හෝ පචිති වේ'' යයි.**

3. **යො පන**: යම්, යම්බඳු...**භික්‍ඛු**...මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**භික්ඛුස්ස**; අන් මහණක්හුගේ;

**පත්ත** නම්: යපයැ මැටිපයැ යි දෙපයෙකි.

**චීවර** නම්: සවැදෑරුම් සිවුරු අතුරෙන් එක්තරා විකපුන් පොහොනා පැසුළු සිවුරක්;

**නිසීදන** නම්: දවලු සහිත නිසීදන යැ යි කියනු ලැබෙ.

**සූචිඝර** නම්: හිදි සහිත වූ හෝ හිදි රහිත වූ හෝ,

**කායබන්ධන** නම්: පට්ටිකා යැ සූකරන්තක යැ යි දෙ කාබානෙකි.

**අපනිධෙය්‍ය**; තෙමේ සඟවා නම් පචිති ඇවැත් වෙයි.

**අපනිධාපෙය්‍ය**: අනෙකක්හු අණවා නම් පචිති ඇවැත් වෙයි. වරක් අණවන ලදුයේ බොහෝ වරකුදු සඟවා නම් පචිති ඇවැත් වේ.

**අන්තමසො හස්සාපෙක්ඛො** යනු කෙළිරිසි ඇතියේ.

උපසපනක්හු කෙරෙහි උපසපන් සත් ඇතියේ යටත් පිරිසෙයින් කෙළිරිසි ඇතියේ නමුදු පාත්‍රයක් හෝ සිවුරක් හෝ නිසීදනයක් හෝ හිදිගුළාවක් හෝ කාබානක් හෝ සඟවා නම් හෝ සඟවවා නම් හෝ පචිති ඇවැත් වෙයි. උපසපනක්හු කෙරෙහි විමති ඇතියේ...උපසපනක්හු කෙරෙහි අනුපසපන් සත් ඇතියේ යටත් පිරිසෙයින් කෙළිරිසි ඇතියේ නමුදු පාත්‍රයක් හෝ සිවුරක් හෝ නිසීදනයක් හෝ හිදිගුළාවක් හෝ කාබානක් හෝ සඟවා නම් හෝ සඟවවා නම් හෝ පචිති ඇවැත් වේ.

අඤ්ඤං පරික්ඛාරං අපනිධෙති වා අපනිධාපෙති වා අන්තමසො හස්සාපෙක්ඛොපි ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නස්ස පත්තං වා චීවරං වා අඤ්ඤං වා පරික්ඛාරං අපනිධෙති වා අපනිධාපෙති වා අන්තමසො හස්සාපෙක්ඛොපි ආපත්ති දුක්කටස්ස.

අනුපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස අනුපසම්පන්නෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** න හස්සාධිප්පායො දුන්නික්ඛිත්තං පටිසාමෙති ධම්මකථං[1] කත්වා දස්සාමීති පටිසාමෙති උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

චීවරාපනිධානසික්ඛාපදං දසමං.

## සුරාපානවග්ගො ඡට්ඨො.

තස්සුද්දානං:

සුරා අඞ්ගුලි හාසො ච අනාදරියඤ්ච භිංසනං
ජොති නහාන දුබ්බණ්ණං සාමං අපනිධෙන චාති.

1. ධම්මිකථං - මජසං. සතා.

යටත් පිරිසෙයින් කෙළිරිසි ඇතියේ නමුදු අන් පිරිකරක් සඟවා නම් හෝ සඟවවා නම් හෝ දුකුළා ඇවැත් වෙයි. යටත්පිරිසෙයින් කෙළිරිසි ඇතියේ නමුදු අනුපසපනක්හුගේ පයක් හෝ සිවුරක් හෝ අන් පිරිකරක් හෝ සඟවා නම් හෝ සඟවවා නම් හෝ දුකුළා ඇවැත් වේ.

අනුපසපනක්හු කෙරෙහි උපසපන්සන් ඇතියේ නම් දුකුළාඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි අනුපසපන්සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වේ.

කෙළිඅදහස් නැතියේ නම්, නො මනාසේ තබන ලද්දක් තැන්පත් කෙරේ නම්; දැහැමි කථා කොට දෙන්නෙමැ යි තැන්පත් කෙරේ නම් ඇවැත් නො වේ. උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

දසවැනි චීවරාපනිධාන ශික්ෂාපද යි

## සවැනි සුරාපාන වර්ග යි

එහි උද්දානය:

සුරාපාන යැ, අඞ්ගුලිපතොදක යැ, හසධම්ම යැ, අනාදරිය යැ, භිංසාපනක යැ, ජොති යැ, නහාන යැ, දුබ්බණ්ණකරණ යැ, චීවරාප-නිධාන සිකපදය සමඟ විකප්පනය ද වෙයි.

## 6. 7. 1

## සඤ්චිච්චපාණසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ **අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා උදායි ඉස්සාසො හොති. කාකා චස්ස අමනාපා හොන්ති සො කාකෙ විජ්ඣිත්වා විජ්ඣිත්වා සීසං ඡින්දිත්වා සූලෙ පටිපාටියා ඨපෙසි. භික්ඛූ එවමාහංසු: කෙනිමෙ ආවුසො කාකා ජීවිතා වොරොපිතාති. මයා ආවුසො අමනාපා මෙ කාකාති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛිය්‍යන්ති විපාචෙන්ති. කථං හි නාම උදායි සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙස්සතීති -පෙ- සච්චං කිර ත්වං උදායි සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙසීති. සච්චං භගවා විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම ත්වං මොඝපුරිස සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙය්‍ය පාචිත්තිය"න්ති.**

2. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**සඤ්චිච්චාති:** ජානන්තො සඤ්ජානන්තො චෙච්ච අභිවිතරිත්වා වීතික්කමො.

**පාණො නාම:** තිරච්ඡානගතපාණො වුච්චති.

**ජීවිතා වොරොපෙය්‍යාති:** ජීවිතින්ද්‍රියං උපච්ඡින්දති උපරොධෙති සන්තතිං විකොපෙති ආපත්ති පාචිත්තියස්ස.

පාණෙ පාණසඤ්ඤී ජීවිතා වොරොපෙති ආපත්ති පාචිත්තියස්ස. පාණෙ වෙමතිකො ජීවිතා වොරොපෙති ආපත්ති දුක්කටස්ස. පාණෙ අප්පාණසඤ්ඤී ජීවිතා වොරොපෙති[1] අනාපත්ති.

4. අප්පාණෙ පාණසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අප්පාණෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අප්පාණෙ අප්පාණසඤ්ඤී අනාපත්ති.

5. **අනාපත්ති:** අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, න මරණාධිප්පායස්ස උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**සඤ්චිච්චපාණ සික්ඛාපදං[2] පඨමං**

---

1. ජීවිතා වොරොපෙති, - මජසං නත්ථි.
2. සඤ්චිච්ච සික්ඛාපදං - මජසං.

## 6. 7. 1

## සඤ්චිච්චපාණ ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩවෙසෙති. එසමයෙහි ආයුෂ්මත් උදායි දුනුවායෙක් වෙයි. කපුටුවෝ ඔහුට අමනාප වෙති. හේ කපුටුවන් විද විද හිස සිඳ හුලෙහි පිළිවෙළින් තැබී යැ. භික්ෂූහු මෙසේ කීහු: ඇවැත්නි කවරක්හු විසින් මේ කපුටුවෝ දිවියෙන් තොර කරන ලද්දාහු දැ යි. ඇවැත්නි, මා විසිනි මට කපුටුවෝ අමනාපයෝ යි. යම් ඒ භික්ෂූ කෙනෙක් අපිස් වූවාහු ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවති: "කෙසේ නම් උදායි තෙරණුවෝ දැනැ දැනැ සතක්හු දිවියෙන් තොර කළෝ" ද යි. ... සැබෑ ද උදායි, තෙපි දැනැදැනැ සතක්හු දිවියෙන් තොර කළහු ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ. ... කෙසේ නම් හිස් පුරුෂය, තෙපි දැනැදැනැ සතක්හු දිවියෙන් තොර කළහු ද? හිස් පුරුෂය, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි.... මහණෙනි මෙසේ මේ සිකපදය උදෙසවූ:

**"යම් මහණෙක් දැනදැන සතක්හු දිවියෙන් තොර කරන්නේ නම් පචිති වේ" යි.**

2. **යො පන:** යම්, යම්බඳු...භිකවු...මෙ තෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**සඤ්චිච්ච;** දන්නේ මැනැවින් දන්නේ සිතා මෙහෙයා විකුම් කිරීම යි.

**පාණ** නම්: තිරිසන් ගිය සතෙකැ යි කියනු ලැබෙයි.

**ජීවිතා වොරොපෙය්‍ය;** ජීවිතෙන්ද්‍රියය සිඳලා නම් වළහා නම් සන්තතිය විකොපනය කෙරේ නම් පචිති ඇවැත් වේ.

සතක්හු කෙරෙහි සතෙකැ යි සත් ඇතියේ දිවියෙන් තොර කෙරේ නම් පචිති ඇවැත් වෙයි. සතක්හු කෙරෙහි විමති ඇතියේ දිවියෙන් තොර කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. සතක්හු කෙරෙහි සතෙකැ යි සත් නැතියේ දිවියෙන් තොර කෙරේ නම් ඇවැත් නැති.

නො සතක්හු කෙරෙහි සතෙකැයි සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො සතක්හු කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො සතක්හු කෙරෙහි නො සතෙකැ යි සත් ඇතියේ නම් ඇවැත් නැති.

නො සිතා කරන්නහුට, නො සිහියෙන් කරන්නහුට, නො දන්නහුට මරණ අදහස් නැතියහුට, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**පළමුවැනි සඤ්චිච්චපාණ ශික්ෂාපද යි.**

## 6. 7. 2

### සප්පාණකසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ජානං සප්පාණකං උදකං පරිභුඤ්ජන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ ජානං සප්පාණකං උදකං පරිභුඤ්ජිස්සන්ති"ති -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ ජානං සප්පාණකං උදකං පරිභුඤ්ජථාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා ජානං සප්පාණකං උදකං පරිභුඤ්ජිස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු ජානං සප්පාණකං උදකං පරිභුඤ්ජෙය්‍ය පාචිත්තියන්ති."**

2. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති. **ජානාති** නාම: සාමං වා ජානාති අඤ්ඤෙ වා තස්ස ආරොචෙන්ති. සප්පාණකන්ති ජානන්තො පරිභොගෙන මරිස්සන්තීති ජානන්තො පරිභුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස.

සප්පාණකෙ සප්පාණකසඤ්ඤී පරිභුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස. සප්පාණකෙ වෙමතිකො පරිභුඤ්ජති ආපත්ති දුක්කටස්ස. සප්පාණකෙ අප්පාණකසඤ්ඤී පරිභුඤ්ජති අනාපත්ති.

අප්පාණකෙ සප්පාණකසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අප්පාණකෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අප්පාණකෙ අප්පාණකසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** අප්පාණකන්ති ජානන්තො[1], පරිභොගෙන න මරිස්සන්තීති ජානන්තො පරිභුඤ්ජති, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**සප්පාණකසික්ඛාපදං දුතියං**

1. සප්පාණකන්ති අජානන්තො, අප්පාණකන්ති ජානන්තො-මජසං,

# 6. 7. 2

## සප්පාණක ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්නුවර ජේතවන නම් අනේපිඩු සිටුහුගේ අරමහි වැඩවෙසෙති. එසමයෙහි සවග මහණහු දනැදනැ පණුවන් සහිත ජලය පරිභොග කෙරෙති යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවාහු...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් සවග මහණහු දනැදනැ පණුවන් සහිත ජලය පරිභොග කළාහු ද යි... සැබැ ද මහණෙනි, තෙපි දනැදනැ පණුවන් සහිත ජලය පරිභොග කරවූ ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු නොයෙක් අයුරින් ගැරහූහ...කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි දනැදනැ පණුවන් සහිත ජලය පරිභොග කළහු ද ? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"යම් මහණෙක් දැනදැනැ පණුවන් සහිත ජලය පරිභොග කරන්නේ නම් පචිති වේ" යි.**

2. යො පන: යම්, යම්බදු...භික්ෂු...මෙ තෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි. ජානාති නම්: තෙමේ හෝ දනී. අන්හු හෝ ඔහුට ඇරොජත්. පණුවන් සහිත යැ යි දන්නේ පරිභොගයෙන් මැරෙති යි දන්නේ පරිභොග කෙරේ නම් පචිති ඇවැත් වේ.

පණුවන් සහිතයෙහි පණුවන් සහිතය යන සත් ඇතියේ පරිභොග කෙරේ නම් පචිති ඇවැත් වෙයි. පණුවන් සහිතයෙහි විමති ඇතියේ පරිභොග කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. පණුවන් සහිතයෙහි පණුවන් රහිතය යන සත් ඇතියේ පරිභොග කෙරේ නම් ඇවැත් නැති.

පණුවන් රහිතයෙහි පණුවන් සහිතය යන සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. පණුවන් රහිතයෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. පණුවන් රහිතයෙහි පණුවන් රහිතය යන සත් ඇතියේ නම් ඇවැත් නැති.

පණුවන් රහිත යැ යි දන්නේ නම්, පරිභොගයෙන් නො මැරෙති යි දන්නේ නම්, ඇවැත් නො වේ. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**දෙවැනි සප්පාණක ශික්ෂාපද යි.**

## උක්කොටන සික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන **ඡබ්බග්ගියා** භික්ඛූ ජානං යථාධම්මං නිහතාධිකරණං පුනකම්මාය උක්කොටෙන්ති, අකතං කම්මං දුක්කතං කම්මං පුන කාතබ්බං කම්මං අනිහතං දුන්නිහතං පුන නිහනිතබ්බන්ති, යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ ජානං යථාධම්මං නිහතාධිකරණං පුනකම්මාය උක්කොටෙස්සන්ති"ති -පෙ-සච්චං කිර තුම්හෙ භික්ඛවෙ ජානං යථාධම්මං නිහතාධිකරණං පුනකම්මාය උක්කොටෙථාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ-කථං හි නාම තුම්හෙ මොඝපුරිසා ජානං යථාධම්මං නිහතාධිකරණං පුනකම්මාය උක්කොටෙස්සථ නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු ජානං යථාධම්මං නිහතාධිකරණං පුන කම්මාය උක්කොටෙය්‍ය පාචිත්තිය"න්ති.**

2. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති:** -පෙ-අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**ජානාති නාම:** සාමං වා ජානාති, අඤ්ඤෙ වා තස්ස ආරොචෙන්ති, සො වා ආරොචෙති.

**යථාධම්මං නාම:** ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන කතං, එතං යථාධම්මං නාම.

**අධිකරණං නාම:** චත්තාරි අධිකරණානි විවාදාධිකරණං අනුවාදාධිකරණං ආපත්තාධිකරණං කිච්චාධිකරණං.

**පුනකම්මාය උක්කොටෙය්‍යාති:** අකතං කම්මං දුක්කතං කම්මං පුන කාතබ්බං කම්මං අනිහතං දුන්නිහතං පුන නිහනිතබ්බන්ති ජානාපෙන්තො[1] උක්කොටෙති ආපත්ති පාචිත්තියස්ස.

1. ජානන්තො - මජසං නත්ථි

# 6. 7 .3

## උක්කොටන ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් අනේපිඩු සිටුහුගේ අරමහි වැඩැවෙසෙති. එසමයෙහි සවග මහණහු ධර්ම වූ පරිද්දෙන් සන්සිඳුවන ලද අධිකරණය දැනදැනැ යළි කරනු පිණිස මතු කරලති. "කර්මය නො කරන ලදැ යැ, කර්මය නපුරු කොට කරන ලද යැ, කර්මය යළි කළයුතු යැ, නො සන් හිඳුවන ලද යැ, නපුරු කොට සන්හිඳුවන ලද යැ, යළි සන්හිඳවිය යුතු"යැ යි. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවාහු ... ඔහු ලමු කොට සිතති. නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් සවග මහණහු ධර්ම වූ පරිද්දෙන් සන්හිඳුවන ලද අධිකරණය දනැදනැ යළි කරනු පිණිස මතු කොළෝ"ද යි......සැබෑ ද මහණෙනි, තෙපි ධර්ම වූ පරිද්දෙන් සන්හිඳුවන ලද අධිකරණය දනැ දනැ යළි කරනු පිණිස මතු කරහු දැයි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු නොයෙක් අයුරින් ගැරහූහ....කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි ධර්ම වූ පරිද්දෙන් සන්හිඳුවන ලද අධිකරණය දනැදනැ යළි කරනු පිණිස මතු කළහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මහණෙනි, මෙසේ මේ සිකපදය උදෙසවු:

**"යම් මහණෙක් ධර්ම වූ පරිද්දෙන් සන්හිඳුවන ලද අධිකරණයක් දනැ දනැ යළි කරනු පිණිස මතු කරලන්නේ නම් පචිති වේ" යි.**

2. **යො පන:** යම්, යම්බඳු භික්ෂු...මෙ තෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**ජානාති** නම්: තෙමේ හෝ දනී, අන්හු හෝ ඔහුට ඇරොජත් මෙහෙතෙමේ හෝ ඇරොජයි.

**යථාධම්ම** නම්: ධර්මයෙන් විනයයෙන් ශාස්තෘශාසනයෙන් කරන ලද්ද යැ. මේ යැ යථාධම්ම නම්;

**අධිකරණ** නම්: විවාදාධිකරණ යැ අනුවාදාධිකරණ යැ ආපත්තාධිකරණයැ කිච්චාධිකරණ යැ යි අධිකරණ සතරෙකි.

**පුනකම්මාය උක්කොටෙය්‍ය:** කර්මය නො කරන ලද යැ කර්මය නපුරු කොට කරන ලද යැ කර්මය යළි කළ යුතු යැ නො සන්හිඳු වන ලද යැ නපුරු කොට සන්හිඳුවන ලද යැ යළි සන්හිඳවිය යුතු යැ යි දනිමින් මතුකරා නම් පචිති ඇවැත් වේ.

ධම්මකම්මං ධම්මකම්මසඤ්ඤී උක්කොටෙති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ වෙමතිකො උක්කොටෙති ආපත්ති දුක්කටස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී උක්කොටෙති අනාපත්ති.

අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** අධම්මෙන වා වග්ගෙන වා න කම්මාරහස්ස වා කම්මං කතන්ති ජානන්තො උක්කොටෙති, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

උක්කොටනසික්ඛාපදං තතියං

## 6. 7. 4

## දුට්ඨුල්ලසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ **අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා උපනන්දො සක්‍යපුත්තො සඤ්චෙතනිකං සුක්කවිස්සට්ඨිං ආපත්තිං ආපජ්ජිත්වා භාතුනො සද්ධිවිහාරිකස්ස භික්ඛුනො ආරොචෙසි: අහං ආවුසො සඤ්චෙතනිකං සුක්කවිස්සට්ඨිං ආපත්තිං ආපන්නො මා කස්සචි ආරොචෙහීති. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු සඤ්චෙතනිකං සුක්කවිස්සට්ඨිං ආපත්තිං ආපජ්ජිත්වා සඞ්ඝං තස්සා ආපත්තියා පරිවාසං යාචි. තස්ස සඞ්ඝො තස්සා ආපත්තියා පරිවාසං අදාසි. සො පරිවසන්තො තං භික්ඛුං පස්සිත්වා එතදවොච: "අහං ආවුසො සඤ්චෙතනිකං සුක්කවිස්සට්ඨිං ආපත්තිං ආපජ්ජිත්වා සඞ්ඝං තස්සා ආපත්තියා පරිවාසං යාචිං, තස්ස මෙ සඞ්ඝො තස්සා ආපත්තියා පරිවාසං අදාසි සොහං පරිවසාමි. වෙදියාමහං ආවුසො වෙදියතීති මං ආයස්මා ධාරෙතූ"ති.

2. කින්නු ඛො ආවුසො යො අඤ්ඤොපි ඉමං ආපත්තිං ආපජ්ජති සොපි එවං කරොතීති. එවමාවුසොති. අයං ආවුසො ආයස්මා උපනන්දො සක්‍යපුත්තො සඤ්චෙතනිකං සුක්කවිස්සට්ඨිං ආපත්තිං ආපජ්ජිත්වා සො මෙ ආරොචෙසි මා කස්සචි ආරොචෙහීති. කිම්පන ත්වං ආවුසො පටිච්ඡාදෙසීති එවමාවුසොති. අථ ඛො සො භික්ඛු භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති:

දැහැමිකම්හි දැහැමිකමෙක යන සත් ඇතියේ මතු කරලා නම් පචිති ඇවැත් වෙයි. දැහැමිකම්හි විමති ඇතියේ මතු කරලා නම් දුකුළා ඇවැත් වෙයි. දැහැමිකම්හි නො දැහැමිකමෙක යන සත් ඇතියේ මතු කරලා නම් ඇවැත් නැති.

නො දැහැමිකම්හි දැහැමිකමෙක යන සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො දැහැමිකම්හි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො දැහැමිකම්හි නො දැහැමිකමෙක යන සත් ඇතියේ නම් ඇවැත් නැති.

අධර්මයෙන් හෝ ව්‍යග්‍රයෙන් හෝ කර්මාර්හ නොවනුවක්හට හෝ කර්ම කරන ලද යි දන්නේ මතුකරලා නම් ඇවැත් නො වේ. උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

තුන්වැනි උක්කොටනශික්ෂාපද යි.

## 6. 7. 4

## දුවඩුල්ල ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර අනේපිඩු සිටුහුගේ ජේතවන නම් අරම්හි වැඩැ වෙසෙත්. එසමයෙහි ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර දනැ දනැ සුක්විසැට් ඇවතකට පැමිණ බැයාගේ සද්ධිවිහාරික භික්ෂුහට ඇරොජි යැ: ඇවැත්නි මම දනැ දනැ සුක්විසැට් ඇවැතකට පැමිණියෙමි, කිසිවක්හට නහමක් ඇරොජ යි. එසමයෙහි වනාහි එක්තරා මහණෙක් දනැ දනැ සුක්විසැට් ඇවැතකට පැමිණ සඞ්ඝයාගෙන් ඒ ඇවැතට පිරිවෙස් යැදී යැ. සඞ්ඝ තෙමෙ ඔහුට ඒ ඇවතට පිරිවෙස් දුන්නේ යැ. හේ පිරිවසනුයේ එමහණහු දකැ මෙය කී යැ: ''ඇවැත්නි, මම දනැ දනැ සුක්විසැට් ඇවැතකට පැමිණ සඞ්ඝයාගෙන් ඒ ඇවැතට පිරිවෙස් යැදීමි. සඞ්ඝ තෙමෙ ඒ මාහට ඒ ඇවතට පිරිවෙස් දුන්නේ යැ. හේ මම පිරිවසමි. ඇවැත්නි, මම දනිමි. මා දනී යැ යි ආයුෂ්මත් තෙමේ දරාව යි.

2. කිමෙක් ද? ඇවැත්නි, අන් යමෙකුත් මේ ඇවැතට පැමිණේ නම් හෙතෙමෙත් මෙසේ කෙරේ ද යි. ඇවැත්නි, එසේ යැ. ඇවැත්නි, මේ ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍ර දනැ දනැ සුක්විසැට් ඇවැතකට පැමිණ හේ කිසිවක්හට නහමක් ඇරොජ යි මට දන්වී යැ. කිමෙක් ද? ඇවැත්නි, තෙපි පිළිසන් කරවු ද යි. ඇවැත්නි, එසේ යැ. එකල්හි ඒ මහණ මහණුන්හට තෙල කරුණ දන්වී යැ. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවාහු...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්:

"කථං හි නාම භික්ඛු භික්ඛුස්ස ජානං දුට්ඨුල්ලං ආපත්තිං පටිච්ඡාදෙස්සතී"ති -පෙ- සච්චං කිර ත්වං භික්ඛු භික්ඛුස්ස ජානං දුට්ඨුල්ලං ආපත්තිං පටිච්ඡාදෙසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම ත්වං මොඝපුරිස භික්ඛුස්ස ජානං දුට්ඨුල්ලං ආපත්තිං පටිච්ඡාදෙස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

"යො පන භික්ඛු භික්ඛුස්ස ජානං දුට්ඨුල්ලං ආපත්තිං පටිච්ඡාදෙය්‍ය පාචිත්තිය"න්ති.

3. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති. **භික්ඛුස්සාති:** අඤ්ඤස්ස භික්ඛුස්ස. **ජානාති** නාම: සාමං වා ජානාති, අඤ්ඤෙ වා තස්ස ආරොචෙන්ති, සො වා ආරොචෙති. **දුට්ඨුල්ලා** නාම: ආපත්ති චත්තාරි ච පාරාජිකානි තෙරස ච සඞ්ඝාදිසෙසා. **පටිච්ඡාදෙය්‍යාති:** ඉමං ජානිත්වා චොදෙස්සන්ති සාරෙස්සන්ති ඛුංසෙස්සන්ති වම්භෙස්සන්ති මඞ්කුකරිස්සන්ති නාරොචෙස්සාමීති ධුරං නික්ඛිත්තමත්තෙ ආපත්ති පාචිත්තියස්ස.

දුට්ඨුල්ලාය ආපත්තියා දුට්ඨුල්ලාපත්තිසඤ්ඤී පටිච්ඡාදෙති ආපත්ති පාචිත්තියස්ස. දුට්ඨුල්ලාය ආපත්තියා වෙමතිකො පටිච්ඡාදෙති ආපත්ති දුක්කටස්ස. දුට්ඨුල්ලාය ආපත්තියා අදුට්ඨුල්ලාපත්තිසඤ්ඤී පටිච්ඡාදෙති ආපත්ති දුක්කටස්ස.

අදුට්ඨුල්ලං ආපත්තිං පටිච්ඡාදෙති ආපත්ති දුක්කටස්ස, අනුපසම්පන්නස්ස දුට්ඨුල්ලං වා අදුට්ඨුල්ලං වා අජ්ඣාචාරං පටිච්ඡාදෙති ආපත්ති දුක්කටස්ස.

අදුට්ඨුල්ලාය ආපත්තියා දුට්ඨුල්ලාපත්තිසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අදුට්ඨුල්ලාය ආපත්තියා වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අදුට්ඨුල්ලාය ආපත්තියා අදුට්ඨුල්ලාපත්තිසඤ්ඤී ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** සඞ්ඝස්ස භණ්ඩනං වා කලහො වා විග්ගහො වා විවාදො වා භවිස්සතීති නාරොචෙති, සඞ්ඝභෙදො වා සඞ්ඝරාජි වා භවිස්සතීති නාරොචෙති, අයං කක්ඛළො ඵරුසො ජීවිතන්තරායං වා බ්‍රහ්මචරියන්තරායං වා කරිස්සතීති නාරොචෙති. අඤ්ඤෙ පතිරූපෙ භික්ඛූ අපස්සන්තො නාරොචෙති; නච්ඡාදෙතුකාමො නාරොචෙති, පඤ්ඤායිස්සති සකෙන කම්මෙනාති නාරොචෙති, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

දුට්ඨුල්ලසික්ඛාපදං චතුත්ථං.

"කෙසේ නම් මහණෙක් මහණක්හුගේ දුළුල් ඇවැතක් දනාදන පිළිසන් කෙළේ"ද යි ... සැබෑ ද මහණ, තෙපි මහණක්හුගේ දුළුල් ඇවැතක් දනැ දැනැ පිළිසන් කරවු ද යි, සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහු ... කෙසේ නම් හිස් පුරුෂය. තෙපි මහණක්හුගේ දුළුල් ඇවැතක් දනැ දනැ පිළිසන් කළහු ද? හිස් පුරුෂය, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"යම් මහණෙක් මහණක්හුගේ දුළුල් ඇවැතක් දනැ දනැ පිළිසන් කරන්නේ නම් පචිති වේ" ය යි.**

3. **යො පන;** යම්, යම්බඳු ... භික්‍ෂු ... මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්‍ෂු යි. **භික්ඛුස්ස:** අන් මහණක්හුගේ, **ජානාති** නම්: තෙමේ හෝ දනී, අන්හු හෝ ඔහුට ඇරොජත්. හෙතෙමේ හෝ ඇරොජයි. **දුට්ඨුල්ල** නම්: සතර පරිජි හා තෙළෙස් සඟ වෙසෙස් හා ඇවැති. **පටිච්ඡාදෙය්‍ය;** මේ කරුණ දැන සොයන්නාහ සිහිකරවන්නාහ මෙළා දක්නාහ, ගරහන්නාහ, මකුකරන්නාහ, නො ඇරොජන්නෙමැ යි ධුරය බහා තැබූ කෙණෙහි පචිති ඇවැත් වේ.

දුළුල් ඇවැතෙහි දුළුල් ඇවැත් සන් ඇතියේ පිළිසන් කෙරේ නම් පචිති ඇවැත් වෙයි. දුළුල් ඇවැතෙහි විමති ඇතියේ පිළිසන් කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. දුළුල් ඇවැතෙහි නො දුළුල් ඇවැත්සන් ඇතියේ පිළිසන් කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

නො දුළුල් ඇවැතක් පිළිසන් කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හුගේ දුළුල් වූ හෝ නො දුළුල් වූ හෝ අධ්‍යාචාරයක් පිළිසන් කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

නො දුළුල් ඇවැතෙහි දුළුල් ඇවැත්සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො දුළුල් ඇවැතෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො දුළුල් ඇවැතෙහි නො දුළුල් ඇවැත්සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වේ.

සඞ්ඝයාගේ භණ්ඩනයෙක් හෝ කලහයෙක් හෝ විග්‍රහයෙක් හෝ විවාදයෙක් හෝ වන්නේ යැ යි නො ඇරොජා නම්, සඞ්ඝභෙදය හෝ සඞ්ඝරාජිය හෝ වන්නේ යැ යි නො ඇරොජා නම්, මෙතෙමේ කර්කශ යැ පරුෂ යැ දිවියට අනතුරු හෝ බඹසරට අනතුරු හෝ කරන්නේ යැ යි නො ඇරොජා නම් අන් සුදුසු මහණුන් නො දක්නේ නො ඇරොජා නම්, නො වසනු කැමැත්තේ නො ඇරොජා නම්, සිය කැමින් පැනෙන්නේ යැයි නො ඇරොජා නම් ඇවැත් නො වේ. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**සතරවැනි දුට්ඨුල්ල ශික්ෂාපද යි.**

## 6. 7. 5

## ඌනවීසතිවස්සසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන රාජගහෙ සත්තරසවග්ගියා දාරකා සහායකා හොන්ති. උපාලිදාරකො තෙසං පාමොක්ඛො හොති. අථ ඛො උපාලිස්ස මාතාපිතූනං එතදහොසි; "කෙන නු ඛො උපායෙන උපාලි අම්හාකං අච්චයෙන සුඛඤ්ච ජීවෙය්‍ය න ච කිලමෙය්‍යා''ති. අථ ඛො උපාලිස්ස මාතාපිතූනං එතදහොසි; "සචෙ ඛො උපාලි ලෙඛං සික්ඛෙය්‍ය එවං ඛො උපාලි අම්හාකං අච්චයෙන සුඛඤ්ච ජීවෙය්‍ය න ච කිලමෙය්‍යා''ති. අථ ඛො උපාලිස්ස මාතාපිතූනං එතදහොසි: "සචෙ ඛො උපාලි ලෙඛං සික්ඛිස්සති අඞ්ගුලියො දුක්ඛා භවිස්සන්ති. සචෙ ඛො උපාලි ගණනං සික්ඛෙය්‍ය එවං ඛො උපාලි අම්හාකං අච්චයෙන සුඛඤ්ච ජීවෙය්‍ය න ච කිලමෙය්‍යා''ති. අථ ඛො උපාලිස්ස මාතාපිතූනං එතදහොසි: "සචෙ ඛො උපාලි ගණනං සික්ඛිස්සති උරස්ස දුක්ඛො භවිස්සති. සචෙ ඛො උපාලි රූපං සික්ඛෙය්‍ය එවං ඛො උපාලි අම්හාකං අච්චයෙන සුඛඤ්ච ජීවෙය්‍ය න ච කිලමෙය්‍යා''ති. අථ ඛො උපාලිස්ස මාතාපිතූනං එතදහොසි; "සචෙ ඛො උපාලි රූපං සික්ඛිස්සති අක්ඛීනි දුක්ඛා භවිස්සන්ති.

2. ඉමෙ ඛො සමණා සක්‍යපුත්තියා සුඛසීලා සුඛසමාචාරා සුභොජනානි භුඤ්ජිත්වා නිවාතෙසු සයනෙසු සයන්ති. සචෙ ඛො උපාලි සමණෙසු සක්‍යපුත්තියෙසු පබ්බජෙය්‍ය එවං ඛො උපාලි අම්හාකං අච්චයෙන සුඛඤ්ච ජීවෙය්‍ය න ච කිලමෙය්‍යාති. අස්සොසි ඛො උපාලිදාරකො මාතාපිතූනං ඉමං කථාසල්ලාපං. අථ ඛො උපාලි දාරකො යෙන තෙ දාරකා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තෙ දාරකෙ එතදවොච: "එථ මයං අය්‍යා සමණෙසු සක්‍යපුත්තියෙසු පබ්බජිස්සාමා''ති· සචෙ ඛො ත්වං අය්‍ය පබ්බජිස්සසි එවං මයම්පි පබ්බජිස්සාමාති.

## 6. 7. 5

## ඌනවීසතිවස්ස ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු රජගහ නුවර කලන්දක නිවාප නම් වෙළුවනයෙහි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි රජගහ නුවර සතළොස්වග දරුවෝ යහළුවෝ වෙති. උපාලි දරු ඔවුන්ගේ ප්‍රමුඛයා වෙයි. එකල්හි උපාලිහුගේ මාපියනට මෙ සිත විය: "කි නම් උපායෙකින් උපාලි තෙමේ අපගේ ඇවෑමෙන් සැපසේ දිවි වටන්නේත් නො මිරිකෙන්නේත් වේ ද යි. එකල්හි උපාලිහුගේ මාපියනට මෙ සිත විය: ඉදින් උපාලි තෙමේ ලෙඛනයෙහි හික්මෙන්නේ නම් මෙසේ උපාලි තෙමේ අපගේ ඇවෑමෙන් සැපසේ දිවි වටන්නේත් නො මිරිකෙන්නේත් වෙයි. එකල්හි උපාලිහුගේ මාපියනට මේ සිත විය: ඉදින් උපාලි තෙමේ ලෙඛනයෙහි හික්මෙන්නේ නම් ඇඟිලි රිදෙයි. ඉදින් උපාලි තෙමේ ගණිතයෙහි හික්මෙන්නේ නම් මෙසේ උපාලි තෙමේ අපගේ ඇවෑමෙන් සැපසේ දිවි වටන්නේත් නො මිරිකෙන්නේත් වෙයි. ඉක්බිති උපාලිහුගේ මාපියනට මෙ සිත විය: ඉදින් උපාලි තෙමේ ගණිතයෙහි හික්මෙන්නේ නම් ළයට දුක් වන්නේයැ. ඉදින් උපාලි තෙමේ රූපසූත්‍රයෙහි හික්මෙන්නේ නම් මෙසේ උපාලි තෙමේ අපගේ ඇවෑමෙන් සැපසේ දිවි වටන්නේත් නො මිරිකෙන්නේත් වෙයි. එකල්හි උපාලිහුගේ මාපියනට මෙසිත විය: ඉදින් උපාලි තෙමේ රූපසූත්‍රයෙහි හික්මෙන්නේ නම් ඇස් රිදෙයි.

2. මේ ශ්‍රමණශාක්‍යපුත්‍රයෝ වනාහි සුවසැහැවි ඇතියෝ සැප පැවතුම් ඇතියෝ මනා බොජුන් වළඳා සිසිල් යහන්හි සැතැපෙත්. ඉදින් උපාලි තෙමේ ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයන් කෙරෙහි පැවිදි වන්නේ නම් මෙසේ උපාලි තෙමේ අපගේ ඇවෑමෙන් සැපසේ දිවි වටන්-නේත් නො මිරිකෙන්නේත් වෙයි. උපාලි දරු තෙමේ මාපියන්ගේ මේ කතාබහ ඇසුයේ යි. ඉක්බිති උපාලි දරු තෙමේ ඒ (යහළු) දරුවන් වෙතැ එළඹියේ යැ. එළැඹැ ඒ දරුවනට මෙය කී යැ: "එව සගයෙනි ඇපි ශ්‍රමණශාක්‍යපුත්‍රයන් කෙරෙහි පැවිදි වම්හ" යි. ඉදින් සගය තෙපි පැවිදි වන්නහු නම් මෙසේ ඇපිදු පැවිදි වම්හ යි.

3. අථ ඛො තෙ දරකා එකමෙකස්ස මාතාපිතරො උපසඞ්කමිත්වා එතදවොචුං; “අනුජානාථ මං අගාරස්මා අනගාරියං පබ්බජ්ජායා”ති අථ ඛො තෙසං දරකානං මාතාපිතරො සබ්බෙපි මෙ දරකා සමානච්ඡන්දා කල්‍යාණාධිප්පායා”ති අනුජානිංසු. තෙ භික්ඛූ උපසඞ්කමිත්වා පබ්බජ්ජං යාචිංසු. තෙ භික්ඛූ පබ්බාජෙසුං උපසම්පාදෙසුං. තෙ රත්තියා පච්චූස සමයං පච්චුට්ඨාය රොදන්ති: යාගුං දෙථ භත්තං දෙථ ඛාදනීයං දෙථාති, භික්ඛූ එවමාහංසු. ආගමෙථ ආවුසො යාව විභායති.[1] සචෙ යාගු භවිස්සති පිවිස්සථ සචෙ භත්තං භවිස්සති භුඤ්ජිස්සථ. සචෙ ඛාදනීයං භවිස්සති ඛාදිස්සථ. නො චෙ භවිස්සති යාගුං වා භත්තං වා ඛාදනීයං වා පිණ්ඩාය චරිත්වා භුඤ්ජිස්සථාති. එවම්පි ඛො තෙ භික්ඛූ භික්ඛූහි වුච්චමානා රොදන්තෙව[2] යාගුං දෙථ භත්තං දෙථ ඛාදනීයං දෙථාති. සෙනාසනං ඌහදන්තිපි උම්මිහන්තිපි. අස්සොසි ඛො භගවා රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය දරකසද්දං සුත්වාන ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි: “කින්නු ඛො සො ආනන්ද දරකසද්දො”ති. අථ ඛො ආයස්මා ආනන්දො භගවතො එතමත්ථං ආරොචෙසි.

4. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතෙත්වා භික්ඛූ පටිපුච්ඡි. සච්චං කිර භික්ඛවෙ භික්ඛූ ජානං ඌනවීසතිවස්සං පුග්ගලං උපසම්පාදෙන්තීති. සච්චං භගවා, විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා ජානං ඌනවීසතිවස්සං පුග්ගලං උපසම්පාදෙස්සන්ති. ඌනවීසති වස්සො භික්ඛවෙ පුග්ගලො අක්ඛමො හොති සීතස්ස උණ්හස්ස ජිඝච්ඡාය පිපාසාය ඩංසමකසවාතාතපසිරිංසප සම්ඵස්සානං දුරුත්තානං දුරාගතානං වචනපථානං උප්පන්නානං සාරීරිකානං වෙදනානං දුක්ඛානං තිබ්බානං ඛරානං කටුකානං අසාතානං අමනාපානං පාණහරානං අනධිවාසකජාතිකො හොති. වීසතිවස්සො ච ඛො භික්ඛවෙ පුග්ගලො ඛමො හොති සීතස්ස උණ්හස්ස -පෙ- පාණහරානං අධිවාසකජාතිකො හොති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**“යො පන භික්ඛු ජානං ඌනවීසතිවස්සං පුග්ගලං උපසම්පාදෙය්‍ය සො ච පුග්ගලො අනුපසම්පන්නො තෙ ච භික්ඛූ ගාරය්හා ඉදං තස්මිං පාචිත්තියන්ති.”**

---

1. යාව රත්ති විභායති - මජසං.
2. රොදන්තියෙව - මජසං.

3. ඉක්බිති ඒ දරුවෝ එකිනෙකාගේ මාපියන් වෙතැ එළැඹැ මෙය කීහු: ''ගිහිගෙයින් නික්මැ සස්නෙහි පැවිදිවීමට මට අනුදනුව''යි එකල්හි ඒ දරුවන්ගේ මාපියෝ මේ හැම දරුවෝ මැ සමසදැතියෝ කලණ අදහස්ඇතියෝ යැ යි අනුදුන්හ. ඔහු මහණුන් වෙතැ එළැඹැ පැවිද්ද යැදූහ. භික්ෂූහු ඔවුන් පැවිදි කළහ, උපසපන් කළහ. ඔහු රෑ පසොස්සල්හි (අලුයම) නැඟිට හඬත්: ''හඹු දෙව, බත් දෙව, කැයුතුද්දය දෙව''යි. භික්ෂූහු මෙසේ කීහු: ඇවැත්නි, පහන් වන තෙක් පොරොත්තු වවු, ඉදින් හඹුවන්නේ නම් පානය කරන්නහු යැ, ඉදින් බත් වන්නේ නම් වළඳන්නහු යැ, ඉදින් කැයුතුද්දය වන්නේ නම් කන්නහු යැ. ඉදින් හඹු හෝ බත් හෝ කැයුතුද්දය හෝ නො වන්නේ නම් පිඩු පිණිස හැසිර වළඳන්නහු යැ යි. මෙසේ මහණුන් විසින් කියනු ලබන්නා වූ ඒ භික්ෂූහු ''හඹු දෙව බත් දෙව කැයුතුද්දය දෙව''යි හඬත් මැ යි. සෙනසුනැ මල පැහැරීම ද කෙරෙති. සුලුදිය පහකිරීම ද කෙරෙත්. භාග්‍යවතුන් වහන්සේ රෑ පසොස්සල්හි නැඟිට දරුහඬ අසා ආයුෂ්මත් ආනන්ද තෙරුන් ඇමැතුසේකැ කිමෙක් ද ආනන්ද, ඒ දරුහඬැ යි. එකල්හි ආයුෂ්මත් ආනන්දස්ථවිර තෙමේ භාග්‍යවතුන් හට තෙල කරුණ දන්වී යැ.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙහි ලා මෙඅවසරයෙහි ලා බික්සඟන රැස් කරවා මහණුන් පුළුවුත් සේකැ: සැබැ ද මහණෙනි, භික්ෂූහු දනැ දනැ ඌනුවිසිවස් ඇති පුඟුලක්හු උපසපන් කරවද්දූ යි. සැබැව භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ ... කෙසේ නම් මහණෙනි, ඒ හිස් පුරුෂයෝ දනැදනැ ඌනුවිසිවස් ඇති පුඟුලක්හු උපසපන් කොළෙෝ ද යි. මහණෙනි, ඌනුවිසිවස් ඇති පුඟුල් තෙමේ සිහිලස උණුසුම සාගිනි පවස නො ඉවසන්නෙක් වෙයි. ඩැහැමැසි මදුරු වා හිරුරැස් දිග්දැ පහස ද දුබැසි දුවදනා වදන්මඟ ද සිරිරි පිළිබැඳි උපන් නො සිහිය හැකි බහල තියුණු රළු නො මිහිරි නො මනවඩන දිවි හරන වෙයිනුදු නො ඉවසන සැහැවි ඇති වෙයි මහණෙනි, විසිවස් ඇති පුඟුල් තෙමේ වනාහි සිහිලස උණුසුම ... ඉවසන්නෙක් වෙයි. ... දිවිහරන වෙයිනුදු ඉවසන සැහැවි වෙයි. මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මහණෙනි මෙසේ මේ සිකපදය උදෙසවූ:

**''යම් මහණෙක් දැනැ දැනැ ඌනු විසිවස් පුඟුලක්හු උපසපන් කරවා නම් ඒ පුද්ගල ද අනුපසපන් වූයේ වෙයි. ඒ භික්ෂූහු ද ගැරහිය යුත්තෝ යැ, ඒ උපාධ්‍යායයා කෙරෙහි මේ පචිති ඇවැත් වේ'' යි.**

5. **යො පනාති:** යො යාදිසො -පෙ- භික්ඛූති-පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති. **ජානාති නාම:** සාමං වා ජානාති අඤ්ඤෙ වා තස්ස ආරොචෙන්ති, සො වා ආරොචෙති. **ඌනවීසතිවස්සො නාම:** අප්පත්තවීසතිවස්සො.

උපසම්පාදෙස්සාමීති ගණං වා ආචරියං වා පත්තං වා චීවරං වා පරියෙසති සීමං වා සම්මන්නති, ආපත්ති දුක්කටස්ස. ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි දුක්කටා. කම්මවාචාපරියොසානෙ උපජ්ඣායස්ස ආපත්ති පාචිත්තියස්ස. ගණස්ස ච ආචරියස්ස ච ආපත්ති දුක්කටස්ස.

ඌනවීසතිවස්සෙ ඌනවීසතිවස්සසඤ්ඤී උපසම්පාදෙති ආපත්ති පාචිත්තියස්ස. ඌනවීසතිවස්සෙ වෙමතිකො උපසම්පාදෙති ආපත්ති දුක්කටස්ස. ඌනවීසතිවස්සෙ පරිපුණ්ණවීසතිවස්සසඤ්ඤී උපසම්පාදෙති අනාපත්ති.

පරිපුණ්ණවීසතිවස්සෙ ඌනවීසතිවස්සසඤ්ඤී ආපත්ති දුක්කටස්ස පරිපුණ්ණවීසතිවස්සෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. පරිපුණ්ණවීසතිවස්සෙ පරිපුණ්ණවීසතිවස්සසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** ඌනවීසතිවස්සං පරිපුණ්ණවීසතිවස්සසඤ්ඤී උපසම්පාදෙති, පරිපුණ්ණවීසතිවස්සං පරිපුණ්ණවීසතිවස්සසඤ්ඤී උපසම්පාදෙති, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති

**ඌනවීසතිවස්සසික්ඛාපදං පඤ්චමං.**

## 6. 7. 6

## ථෙය්‍යසත්ථසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො සත්ථො රාජගහා පටියාලොකං ගන්තුකාමො හොති. අඤ්ඤතරො භික්ඛු තෙ මනුස්සෙ එතදවොච: "අහම්පායස්මන්තෙහි සද්ධිං ගමිස්සාමී"ති. මයං ඛො භන්තෙ සුඞ්කං පරිහරිස්සාමාති. පජානාථාවුසොති. අස්සොසුං ඛො කම්මිකා සත්ථො කිර සුඞ්කං පරිහරිස්සතීති. තෙ මග්ගෙ පරියුට්ඨිංසු. අථ ඛො තෙ කම්මිකා තං සත්ථං ගහෙත්වා අච්ඡින්දිත්වා තං භික්ඛුං එතදවොචුං; "කිස්ස ත්වං භන්තෙ ජානං ථෙය්‍යසත්ථෙන සද්ධිං ගච්ඡසී"ති පළිබුද්ධිත්වා මුඤ්චිංසු. අථ ඛො සො භික්ඛු සාවත්ථිං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති;

1. ගච්ඡසීති - සිමු සිමු
2. පළිබුද්ධෙත්වා - මජ්ඣං.

5\. **යො පන:** යම් යම්බඳු .... භික්ෂු .... මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි. **ජානාති නම්:** තෙමේ හෝ දනී. අන්හු හෝ ඔහුට ඇරෝජත්. ඔහෙතෙමේ හෝ ඇරෝජයි. **ඌනවීසතිවස්ස** නම් : නො පත් විසිවස් ඇතියේ යි.

උපසපන් කරවන්නෙමියි ගණයා හෝ ඇජරක්හු හෝ පයක් හෝ සිවුරක් හෝ සොයා නම් සීමාව හෝ සම්මත කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. ඥප්තියෙහි දුකුළායෙක් වෙයි. දෙකම් වදනින් දෙ දුකුළායෙක් වෙයි. කම්වදන් අවසන්හි වත්හිමිහට පචිති ඇවැත් වෙයි. ගණයාහට ද ඇජරහටද දුකුළා ඇවැත් වේ.

උනුවිසිවස් ඇතියහු කෙරෙහි උනුවිසිවසැයි සත් ඇතියේ උපසපන් කරවා නම් පචිති ඇවැත් වෙයි. උණුවිසිවස් ඇතියහු කෙරෙහි විමති ඇතියේ උපසපන් කරවා නම් දුකුළා ඇවැත් වෙයි. උනු විසිවස් ඇතියහු කෙරෙහි පිරිපුන් විසිවසැයි සත් ඇතියේ උපසපන් කරවා නම් ඇවැත් නැති.

පිරිපුන් විසිවස් ඇතියහු කෙරෙහි උනුවිසිවසැයි සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. පිරිපුන් විසිවස් ඇතියහු කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. පිරිපුන් විසිවස් ඇතියහු කෙරෙහි පිරිපුන් විසිවසැයි සත් ඇතියේ නම් ඇවැත් නැති.

උනු විසිවස් ඇතියක්හු පිරිපුන් විසිවසැයි සත් ඇතියේ උපසපන් කරවා නම්, පිරිපුන්විසිවස් ඇතියක්හු පිරිපුන් විසිවසැයි සත් ඇතියේ උපසපන් කරවා නම් ඇවැත් නො වේ. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**පස් වැනි ඌනවීසතිවස්ස ශික්ෂාපද යි**

## 6. 7. 6

## ථෙය්‍යසත්ථ ශික්ෂාපදය

1\. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජෙතවන නම් අනේපිඩු සිටුහුගේ අරමහි වැඩ වෙසෙති. එසමයෙහි වනාහි එක්තරා ගැල් සාත්තුවෙක් රජගහ නුවරින් පැසුළුදිගට යනු කැමැත්තේ වෙයි. එක්තරා මහණෙක් ඒ මිනිසුන්හට මෙය කී යැ. ''මමද ඇවතුන් සමඟ යන්නෙමැ''යි. ස්වාමීනි, ඇපි වනාහි සුංවත් වළහා යන්නම්හ, ඇවැත්නි, දනුවයි. අයකැමියෝ වනාහි සාත්තුවෙක් සුංවත් වළහා යන්නේ යැ යි ඇසූහු. ඔවුහු මගෙහි නැති සිටියහ. ඉක්බිති ඒ කැමියෝ ඒ සාත්තුව ගෙනැ අසිද එමහණහට මෙය කීහු: ''කුමකට ස්වාමීනි, තුඹ වහන්ද දනැදනැ සොරසාත්තුවක් සමඟ යනදැ දැ යි වද දී මුදහළහ. ඉක්බිති ඒ මහණ සැවැතට ගොස් මහණුන්හට තෙල කරුණ දන්වී යැ. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්:

"කථං හි නාම භික්ඛු ජානං ථෙය්‍යසත්ථෙන සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජිස්සතී"ති. -පෙ- සච්චං කිර ත්වං භික්ඛු ජානං ථෙය්‍යසත්ථෙන සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම ත්වං මොඝපුරිස ජානං ථෙය්‍යසත්ථෙන සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජිස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ :

**"යො පන භික්ඛු ජානං ථෙය්‍යසත්ථෙන සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය අන්තමසො ගාමන්තරම්පි පාචිත්තිය"න්ති.**

2. **යො පනාති:** යො යාදිසො -පෙ- භික්ඛූති -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති. **ජානාති** නාම: සාමං වා ජානාති, අඤ්ඤෙ වා තස්ස ආරොචෙන්ති, සො වා ආරොචෙති. **ථෙය්‍යසත්ථො** නාම: චොරා කතකම්මා වා හොන්ති අකතකම්මා වා, රාජානං වා ථෙය්‍යං ගච්ඡන්ති සුඞ්කං වා පරිහරන්ති. **සද්ධින්ති;** එකතො. **සංවිධායාති;** ගච්ඡාම ආවුසො ගච්ඡාම භන්තෙ, ගච්ඡාම භන්තෙ ගච්ඡාම ආවුසො. අජ්ජ වා හීයො වා පරෙ වා ගච්ඡාමාති සංවිදහති ආපත්ති දුක්කටස්ස. **අන්තමසො ගාමන්තරම්පීති:** කුක්කුටසම්පාදෙ ගාමෙ ගාමන්තරෙ ආපත්ති පාචිත්තියස්ස. අගාමකෙ අරඤ්ඤෙ අද්ධයොජනෙ අද්ධයොජනෙ ආපත්ති පාචිත්තියස්ස.

ථෙය්‍යසත්ථෙ ථෙය්‍යසත්ථසඤ්ඤී සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජති අන්තමසො ගාමන්තරම්පි ආපත්ති පාචිත්තියස්ස. ථෙය්‍යසත්ථෙ වෙමතිකො සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජති අන්තමසො ගාමන්තරම්පි ආපත්ති දුක්කටස්ස. ථෙය්‍යසත්ථෙ අථෙය්‍යසත්ථසඤ්ඤී සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජති අන්තමසො ගාමන්තරම්පි අනාපත්ති.

භික්ඛු සංවිදහති න සංවිදහන්ති ආපත්ති දුක්කටස්ස. අථෙය්‍යසත්ථෙ ථෙය්‍යසත්ථසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අථෙය්‍යසත්ථෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අථෙය්‍යසත්ථෙ අථෙය්‍යසත්ථසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** අසංවිදහිත්වා ගච්ඡති මනුස්සා සංවිදහන්ති භික්ඛු න සංවිදහති, විසඞ්කෙතෙන ගච්ඡති, ආපදසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**ථෙය්‍යසත්ථසික්ඛාපදං ඡට්ඨං.**

"කෙසේ නම් මහණෙක් දනැ දනැ සොරසාත්තුවක් සමඟ බැණ ගෙනැ එක් වැ අදන්මඟට පිළිපන්නේ"ද යි... සැබෑ ද මහණ, තෙපි දැන දැන සොරසාත්තුවක් සමඟ බැණගෙනැ එක් වැ අදන්මඟට පිළිපන්හු ද යි සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ. කෙසේ නම් හිස් පුරුෂය, තෙපි දනැ දනැ සොරසාත්තුවක් සමඟ බැණගෙනැ එක් වැ අදන්මඟට පිළිපන්හු ද ? හිස් පුරුෂය, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මහණෙනි, මෙසේ මේ සිකපදය උදෙසවු :

**"යම් මහණෙක් දැනැ දැනැ සොරසාත්තුවක් සමඟ බැණගෙනැ එක් වැ අදන්මඟට-යටත් පිරිසෙයින් අන් ගමකටදු පිළිපදනේ නම් පචිති වේ" ය යි.**

2. **යො පන;** යම් යම්බඳු ... **භික්ඛු** ... මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි. **ජානාති** නම් : තෙමේ හෝ දනී අන්හු හෝ ඔහුට ඇරොජත්, ඉහතෙමේ හෝ ඇරොජයි. **ථෙය්‍යසත්ථ** නම්. කළසොරකම් ඇත්තා වූ හෝ නො කළ සොරකම් ඇත්තා වූ හෝ සොරු වෙති. සොරකමට රජහු වෙතැ හෝ යෙති. සුංවත් හෝ වළඟා යෙත්. **සද්ධිං: එක් වැ. සංවිධාය :** යමු ඇවැත්නි, යමඟ ස්වාමිනී, යමඟ ස්වාමිනි, යමඟ ඇවැත්නි, අද හෝ හෙට හෝ අතිද්ද හෝ යමඟ යි සංවිධාන කෙරේ නම් දුකුළා ඇවැත් වේ. **අන්තමසො ගාමන්තරම්පි:** කුකුළුගමන් ඇති ගමෙහි නම් ගමතුරෙහි ගමතුරෙහි පචිති ඇවැත් වෙයි. ගමක් නො වන ආරණ්‍යයෙහි නම් අඩයොදුනෙහි අඩයොදුනෙහි පචිති ඇවැත් වේ.

සොරසාත්තුවෙහි සොරසාත්තුසන් ඇතියේ බැණගෙනැ එක් වැ අදන්මඟට යටත්පිරිසෙයින් අන් ගමකටදු පිළිපදනේ නම් පචිති ඇවැත් වෙයි. සොරසාත්තුවෙහි විමති ඇතියේ බැණගෙනැ එක් වැ අදන් මඟට යටත් පිරිසෙයින් අන්ගමකටදු පිළිපදනේ නම් පචිති ඇවැත් වෙයි. සොර සාත්තුවෙහි නො සොරසාත්තුසන් ඇතියේ බැණගෙනැ එක් වැ අදන්මඟට යටත් පිරිසෙයින් අන්ගමකටදු පිළිපදනේ නම් ඇවැත් නැති.

මහණ සංවිධාන කෙරේ නම් මිනිස්සු සංවිධාන නො කෙරෙත් නම් දුකුළා ඇවැත් වෙයි. නො සොරසාත්තුයෙහි සොරසාත්තුයෙක යන සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො සොරසාත්තුයෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො සොරසාත්තුයෙහි නො සොරසාත්තුයෙක යන සන් ඇතියේ නම් ඇවැත් නැති.

සංවිධාන නො කොට යේ නම්, මිනිස්සු සංවිධාන කෙරෙත් නම් මහණ සංවිධාන නො කෙරේ නම්, කාලවිසඞ්කෙතයෙන් යේ නම් ඇවැත් නො වේ. ආපදවෙහි, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**සවැනි ථෙය්‍යසත්ථ ශික්ෂාපද යි.**

## 6. 7. 7

## සංවිධානසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු කොසලෙසු ජනපදෙසු සාවත්ථිං ගච්ඡන්තො අඤ්ඤතරෙන ගාමද්වාරෙන අතික්කමති. අඤ්ඤතරා ඉත්ථී සාමිකෙන සහ භණ්ඩිත්වා ගාමතො නික්ඛමිත්වා තං භික්ඛුං පස්සිත්වා එතදවොච; “කහං භන්තෙ, අය්‍යො ගමිස්සතී”ති. සාවත්ථිං ඛො අහං භගිනි ගමිස්සාමීති. අහම්පය්‍යෙන සද්ධිං ගමිස්සාමීති. එය්‍යාසි භගිනීති. අථ ඛො තස්සා ඉත්ථියා සාමිකො ගාමතො නික්ඛමිත්වා මනුස්සෙ පුච්ඡි, “අපය්‍යා,[1] එවරූපිං ඉත්ථිං පස්සෙය්‍යාථා”ති. එසා අය්‍ය, පබ්බජිතෙන සහ ගච්ඡතීති. අථ ඛො සො පුරිසො අනුබන්ධිත්වා තං භික්ඛුං ගහෙත්වා ආකොටෙත්වා මුඤ්චි. අථ ඛො සො භික්ඛු අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ පධූපෙන්තො නිසීදි. අථ ඛො සා ඉත්ථී තං පුරිසං එතදවොච; “නාය්‍යො සො භික්ඛු මං නිප්පාතෙසි. අපි ච අහමෙව තෙන භික්ඛුනා සද්ධිං ගච්ඡාමි. අකාරකො සො භික්ඛු ගච්ඡ නං ඛමාපෙහීති.” අථ ඛො සො පුරිසො තං භික්ඛුං ඛමාපෙසි.

2. අථ ඛො සො භික්ඛු සාවත්ථිං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. “කථං හි නාම භික්ඛු මාතුගාමෙන සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජිස්සතී”ති. -පෙ- සච්චං කිර ත්වං භික්ඛු මාතුගාමෙන සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම ත්වං මොඝපුරිස මාතුගාමෙන සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජිස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**“යො පන භික්ඛු මාතුගාමෙන සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය අන්තමසො ගාමන්තරම්පි පාචිත්තිය”න්ති.**

3. **යො පනාති:** යො යාදිසො... **භික්ඛූති:**...අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

1. අපාය්‍යො-මජසං,

## 6. 7. 7

## සංවිධාන ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජෙතවන නම් අනේපිඩුසිටුහුගේ අරමෙහි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි එක්තරා මහණෙක් කොසොල් දනව්වෙහි සිටැ සැවැතට යන්නේ එක්තරා ගම්දෙරක් ඉක්මවයි. එක්තරා ස්ත්‍රියක් තොමෝ සැමියා සමඟ ඩබර කොට ගමින් නික්මැ එමහණ දකැ මෙය කිවු යැ. "ස්වාමීනි, ආයර්‍ය්‍යයෝ කොහි වඩිත්" ද යි, බුහුන, මම වනාහි සැවැතට යන්නෙමි"යි. "මම ද ආයර්‍ය්‍යයන් සමඟ යන්නෙමැ"යි. "එන්නැ බුහුනැ"යි. එකල්හි ඒ ස්ත්‍රියගේ සැමියා ගමින් නික්මැ මිනිසුන් පිළිවිසී යැ. සගයෙනි, මෙබඳු ස්ත්‍රියක දක්නාහු දැයි. ආයර්‍ය්‍යය, තෙල මාගම පැවිද්දකු සමඟ යේ යැ යි. එකල්හි ඒ පුරුෂ තෙමේ ලුහුබැඳ එමහණ ගෙනැ අකොළා මුදලී යැ. ඉක්බිති ඒ මහණ එක්තරා රුක්මුලෙකැ (තමාට මැ) අවමන් කරමින් හුන්නේ යැ. එකල්හි ඒ ස්ත්‍රී තොමෝ ඒ පුරුෂයාට මෙය කිවු යැ. "ආයර්‍ය්‍ය වූ මේ භික්ෂු තෙමේ මා ගෙනැ නො ආයේ යැ, වැළිදු මම මැ ඒ මහණහු සමඟ යමි. ඒ මේ මහණ අකාරක යැ. යා, එ මහණහු කමාකරව යි. එකල්හි ඒ පුරුෂ තෙමේ එමහණහු කමා කැරැවී.

2. ඉක්බිති ඒ මහණ සැවැතට ගොස් තෙල කරුණ මහණුන්හට දැන්වී යැ. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූහු වෝ ... ඔහු ලමු කොට සිතති. නුගුණ පවසති දෙස් පතුරුවත්; "කෙසේ නම් මහණෙක් මාගමක සමඟ බැණ ගෙනැ එක් වැ අදන්මඟට පිළිපන්නේ"ද යි...සැබෑ ද මහණ, තෙපි මාගමක සමඟ බැණගෙනැ එක් වැ අදන්මඟට පිළිපන්හු ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ. ... කෙසේ නම් හිස් පුරුෂය, තෙපි මාගමක සමඟ බැණගෙනැ එක් වැ අදන්මඟට පිළිපන්නාහු ද? හිස් පුරුෂය, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි. ... මෙසේ ද මහණෙනි මේ සිකපදය උදෙසවු:

"යම් මහණෙක් මාගමක සමඟ බැණ ගෙනැ එක්වැ අදන්මඟට-යටත් පිරිසෙයින් අන්ගමකට දු—පිළිපදනේ නම් පචිති වේ" යයි.

3. යො පන: යම්, යම්බඳු ... භික්ෂු ... මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

මාතුගාමො නාම: මනුස්සිත්ථී න යක්ඛී න පෙතී න තිරච්ඡානගතා විඤ්ඤූ පටිබලා සුභාසිතදුබ්භාසිතං දුට්ඨුල්ලාදුට්ඨුල්ලං ආජානිතුං.

සද්ධින්ති: එකතො.

සංවිධායාති: ගච්ඡාම භගිනි, ගච්ඡාම අය්‍ය, ගච්ඡාම අය්‍ය, ගච්ඡාම භගිනි. අජ්ජ වා හීයො වා පරෙ වා ගච්ඡාමාති සංවිදහති ආපත්ති දුක්කටස්ස.

අනන්තමසො ගාමන්තරම්පීති: කුක්කුටසම්පාදෙ ගාමෙ ගාමන්තරෙ ගාමන්තරෙ ආපත්ති පාචිත්තියස්ස. අගාමකෙ අරඤ්ඤෙ අද්ධයොජනෙ අද්ධයොජනෙ ආපත්ති පාචිත්තියස්ස.

මාතුගාමෙ මාතුගාමසඤ්ඤී සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජති අනන්තමසො ගාමන්තරම්පි ආපත්ති පාචිත්තියස්ස. මාතුගාමෙ වෙමතිකො සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජති අනන්තමසො ගාමන්තරම්පි ආපත්ති පාචිත්තියස්ස. මාතුගාමෙ අමාතුගාමසඤ්ඤී සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජති අනන්තමසො ගාමන්තරම්පි ආපත්ති පාචිත්තියස්ස.

භික්ඛු සංවිදහති මාතුගාමො න සංවිදහති ආපත්ති දුක්කටස්ස. යක්ඛියා වා පෙතියා වා පණ්ඩකෙන වා තිරච්ඡානගතමනුස්සවිග්ගහිත්ථියා වා සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජති අනන්තමසො ගාමන්තරම්පි ආපත්ති දුක්කටස්ස.

අමාතුගාමෙ මාතුගාමසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අමාතුගාමෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අමාතුගාමෙ අමාතුගාමසඤ්ඤී අනාපත්ති.

අනාපත්ති: අසංවිදහිත්වා ගච්ඡති, මාතුගාමො සංවිදහති භික්ඛු න සංවිදහති, විසඞ්කෙතෙන ගච්ඡති, ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**සංවිධානසික්ඛාපදං සත්තමං.**

**මාතුගාම නම්:** මිනිස් ඉතිරි යැ. යකින්නක් නො වෙයි. ප්‍රේතියක් නො වෙයි. තිරිසන් ගිය මාගමක් නො වේ. සුබැයි දුබැයි දුළුල් නො දුළුල් තෙපුල් දන ගන්නට පිළිවන් දැනුමැතියා යි.

**සද්ධිං:** එක් වැ.

**සංවිධාය:** යමුහ බුහුන, යමුහ ආයඨ්‍ය, යමුහ ආයඨ්‍ය, යමුහ බුහුන, අද හෝ හෙට හෝ අනිද්ද හෝ යමුහ යි සංවිධාන කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

**අන්තමසො ගාමන්තරම්පි;** කුකුළුගමන් ඇති ගමෙහි නම් ගමංතුරෙහි ගමතුරෙහි පචිති ඇවැත් වෙයි. ගමක් නො වන අරන්හි නම් අඩ යොදුනෙහි අඩ යොදුනෙහි පචිති ඇවැත් වේ.

මාගම කෙරෙහි මාගමක යන සත් ඇතියෙ බැණ ගෙනැ එක් වැ අදන් මහට යටත් පිරිසෙයින් අන්ගමකට දු-පිළිපදනේ නම් පචිති ඇවැත් වෙයි. මාගම කෙරෙහි විමති ඇතියෙ බැණගෙනැ එක් වැ අදන්මහට-යටතින් අන්ගමකට දු-පිළිපදනේ නම් පචිති ඇවැත් වෙයි. මාගම කෙරෙහි නො මාගම් සත් ඇතියේ බැණගෙනැ එක් වැ අදන්මහට, යටතින් අන්ගමකට දු, පිළිපදනේ නම් පචිති ඇවැත් වේ.

මහණ සංවිධාන කෙරේ නම් මාගම සංවිධාන නො කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. යකින්නක හෝ ප්‍රේතියක හෝ පණ්ඩකයකු හෝ තිරිසන්ගිය මිනිස් සිරිරි දරන ඉතිරියක හෝ සමහ බැණගෙනැ එක් වැ අදන්මහට-යටත්පිරිසෙයින් අන්ගමකටදු-පිළිපදනේ නම් දුකුළා ඇවැත් වේ.

නො මාගම්හි මාගම්සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො මාගම්හි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො මාගම්හි නො මාගම්සත් ඇති යේ නම් ඇවැත් නැති.

සංවිධාන නො කොට යේ නම්, මාගම සංවිධාන කෙරේ නම් මහණ සංවිධාන නො කෙරේ නම්, කාලවිසඞ්කෙතයෙන් යේ නම්, ආපදවෙහි, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**සත්වැනි සංවිධාන ශික්ෂාපද යි**

## 6. 7. 8

## අරිට්ඨසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන අරිට්ඨස්ස නාම භික්ඛුනො ගද්ධබාධිපුබ්බස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං හොති, ''තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙමෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායාති''. අස්සොසුං ඛො සම්බහුලා භික්ඛූ ''අරිට්ඨස්ස කිර නාම භික්ඛුනො ගද්ධබාධිපුබ්බස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙමෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායා''ති.

2. අථ ඛො තෙ භික්ඛූ යෙන අරිට්ඨො භික්ඛු ගද්ධබාධිපුබ්බො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා අරිට්ඨං භික්ඛුං ගද්ධබාධිපුබ්බං එතදවොචුං; ''සච්චං කිර තෙ ආවුසො අරිට්ඨ, එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං, තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙමෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායා''ති. එවං බ්‍යා ඛො අහං ආවුසො, භගවතා ධම්මං දෙසිතං ආජානාමි ''යථා යෙමෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායා''ති. මා ආවුසො අරිට්ඨ, එවං අවච. මා භගවන්තං අබ්භාචික්ඛි. න හි සාධු භගවතො අබ්භක්ඛානං[1]. න හි භගවා එවං වදෙය්‍ය, අනෙකපරියායෙන ආවුසො අරිට්ඨ, අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා අලඤ්ච පන තෙ පටිසෙවතො අන්තරායාය; අප්පස්සාද කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහුපායාසා ආදීනවො එත්ථ භිය්‍යො, අට්ඨිකඞ්කලූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහුපායාසා ආදීනවො එත්ථ භීය්‍යො, මංසපෙසූපමා කාමා වුත්තා භගවතා -පෙ- තිණුක්කූපමා කාමා වුත්තා භගවතා— අඞ්ගාරකාසූපමා කාමා වුත්තා භගවතා— සුපිනකූපමා කාමා වුත්තා භගවතා— යාචිතකූපමා කාමා වුත්තා භගවතා— රුක්ඛඵලූපමා කාමා වුත්තා භගවතා— අසිසූනූපමා කාමා වුත්තා භගවතා— සත්තිසූලූපමා කාමා වුත්තා භගවතා— සප්පසිරූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහුපායාසා ආදීනවො එත්ථ භිය්‍යොති.

1. අබ්භාචික්ඛණං, (කත්ථචි)

# 6. 7. 8

## අරිට්ඨ ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි ගිජ්ඣලිහිණියන් මැරූ කුලෙහි උපන් අරිට්ඨ නම් මහණහට මෙබඳු ලමු දිට්ඨියෙක් උපන්නේ වෙයි. ''භාග්‍යවතුන් විසින් යම් මේ අන්තරායකර ධර්ම කෙනෙක් වදරන ලදහු නම් ඒ ධර්මයන් සෙවුනාහට අනතුරු පිණිස යම්සේ සමර්ථ නො වෙද්ද, එසේ භාග්‍යවතුන් වදළ ධර්මය මම දනිමි''යි. බොහෝ භික්ෂූහු ගිජ්ඣලිහිණියන් මැරූ කුලෙහි උපන් අරිට්ඨ නම් මහණහට භාග්‍යවතුන් විසින් යම් මේ අන්තරායකර ධර්ම කෙනෙක් වදරන ලදහු නම් ඒ ධර්මයන් සෙවුනාහට අනතුරු පිණිස යම්සේ සමර්ථ නො වෙද්ද, එසේ භාග්‍යවතුන් වදළ ධර්මය මම දනිමැ යි මෙබඳු ලමු දිට්ඨියෙක් උපනැයි ඇසූහු.

2. ඉක්බිති ඒ භික්ෂූහු ගද්ධබාධිපුබ්බ (ගිජු ලිහිණියන් මැරූ කුලෙහි උපන්) අරිට්ඨ නම් මහණහු වෙතැ එළැඹියහ. එළැඹැ ගද්ධබාධිපුබ්බ අරිට්ඨ නම් මහණහට මෙය කීහු. සැබැ ද ඇවැත්නි අරිට්ඨයෙනි, භාග්‍ය-වතුන් විසින් යම් අන්තරායකර ධර්ම කෙනෙක් වදරන ලදහු නම් ඒ ධර්ම-යන් සෙවුනාහට අනතුරු පිණිස යම්සේ සමර්ථ නො වෙද්ද, එසේ භාග්‍ය-වතුන් වදළ ධර්මය මම දනිමැ යි මෙබඳු ලාමක දෘෂ්ටියක් තොපට උපන්-නේ ද? භාග්‍යවතුන් විසින් යම් අන්තරායකර ධර්ම කෙනෙක් වදරන ලදහු නම් ඒ ධර්මයන් සෙවුනාහට අනතුරු පිණිස යම්සේ සමර්ථ නො-වෙද්ද, එසෙයින් ඇවැත්නි, භාග්‍යවතුන් වදළ ධර්මය මම දනිමි, ඇවැත්නි අරිට්ඨයෙනි, මෙසේ නාහමක් කියව, භාග්‍යවතුන්හට නාහමක් නුගුණ කියව, භාග්‍යවතුන් හට නුගුණකීම නො මනා මැ යි. භාග්‍යවතුන් වහන්සේ මෙසේ නො වදරන සේක් මැ යි. ඇවැත්නි අරිට්ඨයෙනි, භාග්‍යවතුන් විසින් නොයෙක් කරුණෙන් අන්තරායකර ධර්මයෝ අන්තරායකරහ යි වදරන ලද යැ. තව ද ඒ ධර්මයන් සෙවුනාහට අනතුරු පිණිස සමර්ථ වෙත් මැ යි. කාමයෝ අල්පාස්වාද ඇතියහ බොහෝ දුක් ඇතියහ බොහෝ දැඩි ආයාස ඇතියහ. මෙහි ආදීනවය බෙහෙවැ යි භාග්‍යවතුන් විසින් වදරන ලද. බොහෝ දුක් ඇති බොහෝ දැඩි ආයාස ඇති කාමයෝ ඇටසැකිලි බන්දහ මෙහි ආදීනවය බෙහෙවැ යි භාග්‍යවතුන් විසින් වදරන ලද. කාමයෝ මස් වැදලි බන්දහ...භාග්‍යවතුන් විසින් වදරන ලද. කාමයෝ තණහුලක් බන්දහ...භාග්‍යවතුන් විසින් වදරන ලද. කාමයෝ අඟුරුවළක් බන්දහ...භාග්‍යවතුන් විසින් වදරන ලද. කාමයෝ සිහිනයක් බන්දහ ... භාග්‍යවතුන් විසින් වදරන ලද. කාමයෝ පිරුළින් අළදුයක් බන්දහ...භාග්‍යවතුන් විසින් වදරන ලද. කාමයෝ රුක්පල බන්දහ...භාග්‍යවතුන් විසින් වදරන ලදහ. කාමයෝ අසිසූනා බන්දහ... භාග්‍යවතුන් විසින් වදරන ලද. කාමයෝ ශක්තිශූල බන්දහ ... භාග්‍ය වතුන් විසින් වදරන ලද. බොහෝ දුක් ඇති බොහෝ දැඩි ආයාස ඇති කාමයෝ සර්ප ශීර්ෂ බන්දහ. මෙහි ආදීනවය බෙහෙවැ යි භාග්‍යවතුන් විසින් වදරන ලද්දේ යැ.

3. එවම්පි ඛො අරිට්ඨො භික්ඛු ගද්ධබාධිපුබ්බො තෙහි භික්ඛූහි වුච්චමානො තථෙව තං පාපකං දිට්ඨිගතං ථාමසා පරාමස්ස[1] අභිනිවිස්ස වොහරති. එවං ව්‍යාඛො අහං ආවුසො, භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙ මෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායාති. යතො ච ඛො තෙ භික්ඛූ නාසක්ඛිංසු අරිට්ඨං භික්ඛුං ගද්ධබාධිපුබ්බං එතස්මා පාපකා දිට්ඨිගතා විවෙචෙතුං. අථ ඛො තෙ භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවතො එතමත්ථං ආරොචෙසුං.

4. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතෙත්වා අරිට්ඨං භික්ඛුං ගද්ධබාධිපුබ්බං පටිපුච්ඡි. සච්චං කිර ත්වං අරිට්ඨ, එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං, තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි, යථා යෙමෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායාති. එවං ව්‍යාඛො අහං භන්තෙ, භගවතා ධම්මං දෙසිතං ආජානාමි, යථා යෙමෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායාති. කස්ස නු ඛො නාම ත්වං මොඝපුරිස, මයා එවං ධම්මං දෙසිතං ආජානාසි, නනු මයා මොඝපුරිස අනෙකපරියායෙන අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා, අලඤ්ච පන තෙ පටිසෙවතො අන්තරායාය. අප්පස්සාදා කාමා වුත්තා මයා බහුදුක්ඛා බහුපායාසා ආදීනවො එත්ථ භිය්‍යො, අට්ඨිකඞ්කලූපමා කාමා වුත්තා මයා -පෙ- මංසපෙසූපමා කාමා වුත්තා මයා— තිණුක්කූපමා කාමා වුත්තා මයා— අඞ්ගාරකාසූපමා කාමා වුත්තා මයා— සුපිනකූපමා කාමා වුත්තා මයා— යාචිතකූපමා කාමා වුත්තා මයා— රුක්ඛඵලූපමා කාමා වුත්තා මයා— අසිසූනූපමා කාමා වුත්තා මයා — සත්තිසූලූපමා කාමා වුත්තා මයා — සප්පසිරූපමා කාමා වුත්තා මයා බහුදුක්ඛා බහුපායාසා ආදීනවො එත්ථ භිය්‍යො.

1. පරාමාසා - මජසං.

3. මෙසේ ද වනාහි ගද්ධබාධිපුබ්බ අරිට්ඨ මහණ ඒ භික්ෂූන් විසින් කියනු ලබන්නේ එසේ මැ ඒ ලාමකදෘෂ්ටිය දැඩිසේ අල්වා ගෙනැ (එයම) බැසැගෙනැ බැවහර කෙරෙයි. "භාග්‍යවතුන් විසින් යම් මේ අන්තරායකර ධර්ම කෙනෙක් වදරන ලදහු නම් ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස යමසේ සමර්ථ නො වෙද්ද, එසේ ඇවැත්ති, භාග්‍යවතුන් වදළ ධර්මය මම දනිමැ"යි. ඒ භික්ෂූහු වනාහි ගිජුලිහිණියන් මැරූ කුලෙහි උපන් අරිට්ඨ මහණහු මෙලෙ ලමු දිට්ඨයෙන් වෙන් කරන්නට යම් හෙයකින් නොහැකිවූහු ද එකල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වෙතැ එළැඹියහ. එළැඹ භාග්‍යවතුන්හට මෙල කරුණ දන්වූහු.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණෙහි ලා මෙ අවසරයෙහි ලා භික්සඝන රැස්කරවා ගිජුලිහිණියන් මැරූ කුලෙහි උපන් අරිට්ඨ මහණහු පිළිවුසු සේක. සැබෑ ද අරිට්ඨය, භාග්‍යවතුන් විසින් යම් මේ අන්තරාය කර ධර්ම කෙනෙක් වදරන ලදහු නම් ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස යමසේ සමර්ථ නො වෙද්ද, එසේ භාග්‍යවතුන් වදළ ධර්මය මම දනිමැ යි මෙබඳු ලමු දිට්ඨයෙක් තාහට උපන්නේ ද යි. භාග්‍යවතුන් විසින් යම් මේ අන්තරායකර ධර්ම කෙනෙක් වදරන ලදහු නම් ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස යමසේ සමර්ථ නො වෙද්ද, එසෙයින් ස්වාමීනි, භාග්‍යවතුන් වදළ ධර්මය මම දනිමි. හිස් පුරුෂය, තෙපි මා විසින් කවරක්හට නම් එසේ ධර්මය දෙසන ලද යි දනිහු ද? හිස් පුරුෂය, මා විසින් නොයෙක් කරුණෙන් අන්තරායකර ධර්මයෝ අන්තරාය කරහ යි වදරන ලද්දහු නො වෙද්ද? තවද ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස සමර්ථ නො වෙද්ද? කාමයෝ අල්පාස්වාදයහ. බොහෝ දුක් ඇතියහ. බොහෝ දැඩි ආයාස ඇතියහ. මෙහි ආදීනවය බෙහෙවැ යි මා විසින් වදරන ලද. කාමයෝ ඇටසැකිල්ලක් බන්දහ ... මා විසින් වදරන ලද. කාමයෝ මස් වැදැල්ලක් බන්දහ... මා විසින් වදරන ලද. කාමයෝ තණහුලක් බන්දහ ... මා විසින් වදරන ලද. කාමයෝ අඟුරුවළක් බන්දහ ... මා විසින් වදරන ලද. කාමයෝ සිහිනයක් බන්දහ .... මා විසින් වදරන ලද. කාමයෝ පිරූළු අළදියක් බන්දහ... මා විසින් වදරන ලද. කාමයෝ රුක්පල බන්දහ ... මා විසින් වදරන ලද. කාමයෝ අසිසූනා බන්දහ...මා විසින් වදරන ලද. කාමයෝ සත්තිශූල බන්දහ ... මා විසින් වදරන ලද. බොහෝ දුක් ඇති බොහෝ දැඩි ආයාස ඇති කාමයෝ සර්පශීර්ෂ බන්දහ මෙහි ආදීනවය බෙහෙවැ යි මා විසින් වදරන ලද්මද් ය.

5. අථ ච පන ත්වං මොඝපුරිස, අත්තනා දුග්ගහිතෙන අම්හෙ චෙව අබ්භාචික්ඛසි, අත්තානඤ්ච ඛණසි, බහුඤ්ච අපුඤ්ඤං පසවසි, තං හි තෙ මොඝපුරිස, භවිස්සති දීඝරත්තං අහිතාය දුක්ඛාය, නෙතං මොඝපුරිස, අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

"යො පන භික්ඛු එවං වදෙය්‍ය, තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙමෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායාති, සො භික්ඛු භික්ඛූහි එවමස්ස වචනීයො, මා ආයස්මා එවං අවච, මා භගවන්තං අබ්භාචික්ඛි, නහි සාධු භගවතො අබ්භක්ඛානං, නහි භගවා එවං වදෙය්‍ය, අනෙකපරියායෙන ආවුසො, අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා අලඤ්ච පන තෙ පටිසෙවතො අන්තරායායාති. එවඤ්ච පන සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තථෙව පග්ගණ්හෙය්‍ය සො භික්ඛු භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බො තස්ස පටිනිස්සග්ගාය, යාවතතියං චෙ සමනුභාසියමානො තම්පටි-නිස්සජ්ජෙය්‍ය ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය පාචිත්තිය"න්ති.

6. යො පනාති: යො යාදිසො -පෙ- භික්ඛූති -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

එවං වදෙය්‍යාති: තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි, යථා යෙමෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායාති.

සො භික්ඛූති: යො සො එවං වාදී භික්ඛු;

භික්ඛූහීති: අඤ්ඤෙහි භික්ඛූහි; යෙ පස්සන්ති යෙ සුණන්ති තෙහි වත්තබ්බො මා ආයස්මා එවං අවච මා භගවන්තං අබ්භාචික්ඛි, නහි සාධු භගවතො අබ්භක්ඛානං නහි භගවා එවං වදෙය්‍ය, අනෙකපරියායෙන ආවුසො අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, අලඤ්ච පන තෙ පටිසෙවතො අන්තරායායාති. දුතියම්පි වත්තබ්බො තතියම්පි වත්තබ්බො. සචෙ පටිනිස්සජ්ජති ඉච්චෙතං කුසලං නො චෙ පටිනිස්සජ්ජති ආපත්ති දුක්කටස්ස. සුත්වා න වදන්ති ආපත්ති දුක්කටස්ස.

5. එතෙකුදු වුවත් හිස් පුරුෂය, තෙපි තමා විසින් නපුරු කොට ගන්නා ලද දිට්ඨියෙන් අපට ද නුගුණ කියව, තමා ද සැරු ගුණ ඇතියව, බොහෝ අකුසල් ද රැස් කරව, හිස් පුරුෂය, එය බලත් තා හට දිගුරැයක් අහිත පිණිස දුක් පිණිස වන්නේ යැ, හිස් පුරුෂය, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු.

**''භාග්‍යවතුන් විසින් යම් අන්තරායකර ධර්ම කෙනෙක් වදරන ලදහු නම් ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස යම්සේ සමර්ථ නො වෙද්ද, එසේ භාග්‍යවතුන් වදාළ ධර්මය මම දනිමැ යි යම් මහණෙක් මෙසේ කියන්නේ නම් ඒ මහණ මහණුන් විසින් ඇවැත්නි, මෙසේ නහමක් කියව, භාග්‍යවතුන්හට නහමක් නුගුණකියව භාග්‍යවතුන් හට නුගුණ කීම නො මැනැවි, භාග්‍යවත් තෙමේ මෙසේ නො මැ වදරන්නේ යැ, ඇවැත්නි නොයෙක් කරුණෙන් අන්තරායකර ධර්මයෝ අන්තරායකරහ යි භාග්‍යවතුන් විසින් වදරන ලද. ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස සමර්ථ වෙත් මැ යි මෙසේ කිය යුත්තෙක් වන්නේ යැ. මෙසේ ද වනාහි ඒ මහණ මහණුන් විසින් කියනු ලබන්නේ එසේ මැ දැඩි වැ ගන්නේ නම් ඒ මහණ මහණුන් විසින් ඒ දිට්ඨිය හැරපිම පිණිස තුන්යළ තෙක් සමනුභාසන කර්ම කළ යුත්තෙක් වෙයි. ඉදින් තුන්යළ තෙක් සමනුභාසනකර්ම කරනු ලබන්නේ ඒ දිට්ඨිය හැරපියන්නේ නම් මෙසේ තෙල හැරපිම මැනැවි. ඉදින් නො හැරපියන්නේ නම් පචිති වේ'' යයි.**

6. **යො පන:** යම්, යම්බඳු ... භික්ඛු ... මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**එවං වදෙය්‍ය:** භාග්‍යවතුන් විසින් යම් අන්තරායකර ධර්ම කෙනෙක් වදරන ලදහු නම් ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස යම්සේ සමර්ථ නො වෙද්ද, එසේ භාග්‍යවතුන් වදාළ ධර්මය මම දනිමැ යි.

**සො භික්ඛු:** යමෙක් මෙසේ කියන යුලු නම් ඒ මහණ තෙමේ;

**භික්ඛූහි:** අන් මහණුන් විසින්; යම් කෙනෙක් දකිත් නම් යම් කෙනෙක් අසත් නම් ඔවුන් විසින් ඇවැත්නි, මෙසේ නහමක් කියව, භාග්‍යවතුන්හට නහමක් නුගුණ කියව, භාග්‍යවතුන්හට නුගුණ කීම නො මැනැවි. භාග්‍යවත් තෙමේ මෙසේ නො වදරන්නෙ යැ, ඇවැත්නි, නොයෙක් කරුණෙන් අන්තරායකර ධර්මයෝ අන්තරායකරහ යි භාග්‍යවතුන් විසින් වදරන ලද. ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස සමර්ථ වෙත් මැ යි කියයුත්තේ යැ. දෙවනවටදු කියයුත්තේ යැ. තෙවන වටදු කිය යුත්තේ යි. ඉදින් හැර පියා නම් මෙසේ තෙල හැරපිම මැනැවි. ඉදින් නො හැරපියා නම් දුකුළා ඇවැත් වෙයි. අසා නො කියත් නම් දුකුළා ඇවැත් වේ.

7. සො භික්ඛු සඞ්ඝමජ්ඣම්පි ආකඩ්ඪිත්වා වත්තබ්බො මා ආයස්මා එවං අවච, මා භගවන්තං අබ්භාචික්ඛි, න හි සාධු භගවතො අබ්භක්ඛානං න හි භගවා එවං වදෙය්‍ය. අනෙකපරියායෙන ආවුසො අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, අලඤ්ච පන තෙ පටිසෙවතො අන්තරායායාති. දුතියම්පි වත්තබ්බො තතියම්පි වත්තබ්බො, සචෙ පටිනිස්සජ්ජති ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජති ආපත්ති දුක්කටස්ස.

8. සො භික්ඛු භික්ඛූහි සමනුභාසිතබ්බො[1], එවඤ්ච පන භික්ඛවෙ සමනුභාසිතබ්බො. බ්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො.

"සුණාතු මෙ භන්තෙ සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙ මෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායාති. සො තං දිට්ඨිං නප්පටිනිස්සජ්ජති, යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං සමනුභාසෙය්‍ය තස්සා දිට්ඨියා පටිනිස්සග්ගාය, එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො. ඉත්ථන්නාමස්ස භික්ඛුනො එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙ මෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායාති. සො තං දිට්ඨිං නප්පටිනිස්සජ්ජති, සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං සමනුභාසති තස්සා දිට්ඨියා පටිනිස්සග්ගාය. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො සමනුභාසනා තස්සා දිට්ඨියා පටිනිස්සග්ගාය, සො තුණ්හස්ස යස්ස නක්ඛමති සො භාසෙය්‍ය, දුතියම්පි එතමත්ථං වදාමි -පෙ- තතියම්පි එතමත්ථං වදාමි. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි, යථා යෙමෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායාති. සො තං දිට්ඨිං නප්පටිනිස්සජ්ජති, සඞ්ඝො ඉත්ථන්නාමං භික්ඛුං සමනුභාසති තස්සා දිට්ඨියා පටිනිස්සග්ගාය. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො සමනුභාසනා තස්සා දිට්ඨියා පටිනිස්සග්ගාය සො තුණ්හස්ස යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

සමනුභට්ඨො සඞ්ඝෙන ඉත්ථන්නාමො භික්ඛු තස්සා දිට්ඨියා පටිනිස්සග්ගාය. ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී එවමෙතං ධාරයාමී"ති.

1. සො භික්ඛු සමනුභාසිතබ්බො -- මජ්ඣං.

7. ඒ මහණ සඟමැදට බහා ගෙනැ ඇවැත්නි, මෙසේ නාහමක් කියව භාග්‍යවතුන්හට නාහමක් නුගුණ කියව, භාග්‍යවතුන්හට නුගුණ කීම නො මැනැවි. භාග්‍යවත් තෙමේ මෙසේ නො මැ වදරන්නෙ යැ, ඇවැත්නි, නොයෙක් කරුණෙන් අන්තරායකර ධර්මයෝ අන්තරායකරහ යි භාග්‍යවතුන් විසින් වදරන ලද. ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස සමර්ථ වෙත් මැ යි කිය යුත්තේ යැ, දෙවනවට ද කිය යුත්තේ යැ, තෙවනවට ද කිය යුත්තේ යි. ඉදින් හැරපියා නම් මෙසේ තෙල හැරපීම මැනැවි. ඉදින් නො හැරපියා නම් දුකුළා ඇවැත් වේ.

8. ඒ මහණ මහණුන් විසින් සමනුභාසන කර්ම කළයුත්තේ යැ. මෙසේ ද වනාහි මහණෙනි, සමනුභාසන කර්ම කළයුත්තේ යැ, ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණක්හු විසින් සඞ්ඝයා දැන්විය යුත්තේ යි.

ස්වාමීනි, සඞ්ඝයා මවදන් අසාවා. මෙනම් ඇති මහණහට මෙබඳු ලාමක දෘෂ්ටියෙක් උපන. ''භාග්‍යවතුන් විසින් යම් අන්තරායකර ධර්ම කෙනෙක් වදරන ලදහු නම් ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස යම්සේ සමර්ථ නො වෙද්ද, එසේ භාග්‍යවතුන් වදළ ධර්මය මම දනිමැ''යි. හෙ ඒ දෘෂ්ටි නො හැරපියයි. ඉදින් සඞ්ඝයාහට පැමිණි කල් ඇත්තේ නම් සඞ්ඝයා මෙනම් ඇති මහණහට ඒ දෘෂ්ටි හැරපීම පිණිස සමනුභාසන කර්ම කරන්නෙ යැ. මේ ඥප්තිය යි.

ස්වාමීනි, සඞ්ඝයා මවදන් අසාවා. මෙනම් ඇති මහණහට මෙබඳු ලාමක දෘෂ්ටියෙක් උපන, ''භාග්‍යවතුන් විසින් යම් අන්තරායකර ධර්ම කෙනෙක් වදරන ලදහු නම් ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස යම්සේ සමර්ථ නො වෙද්ද, එසේ භාග්‍යවතුන් වදළ ධර්මය මම දනිමැ යි. හෙ ඒ දෘෂ්ටි නො හැරපිය යි. සඞ්ඝයා මෙනම් ඇති මහණහට ඒ දෘෂ්ටි හැරපීම පිණිස සමනුභාසන කර්ම කරයි. මෙනම් ඇති මහණහුගේ ඒ දෘෂ්ටි හැරපීම පිණිස සමනුභාසන කර්මය යම් ආයුෂ්මත් නමක්හට රුස්නේ නම් හේ නිහඬ වන්නේ යැ, යමක්හට නො රුස්නේ නම් හේ කියන්නේ යි. දෙවනවට ද තෙල කරුණ කියමි ... තෙවනවට ද තෙල කරුණ කියමි. වහන්ස, සඞ්ඝයා මවදන් අසාවා. මෙනම් ඇති මහණහට මෙබඳු ලාමක දෘෂ්ටියෙක් උපන. ''භාග්‍යවතුන් විසින් යම් අන්තරායකර ධර්ම කෙනෙක් වදරන ලදහු නම් ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස යම්සේ සමර්ථ නො වෙද්ද, එසේ භාග්‍යවතුන් වදළ ධර්මය මම දනිමැ''යි. හෙ ඒ දෘෂ්ටි නො හැරපියයි. සඞ්ඝයා මෙනම් ඇති මහණහට ඒ දෘෂ්ටි හැරපීම පිණිස සමනුභාසන කර්ම කරයි. මෙනම් ඇති මහණහුගේ ඒ දෘෂ්ටි හැරපීම පිණිස සමනුභාසන කර්මය යම් ආයුෂ්මත් නමක්හට රුස්නේ නම් හේ නිහඬ වන්නෙ යැ, යමක්හට නො රුස්නේ නම් හේ කියන්නේ යි.

සඞ්ඝයා විසින් මෙනම් ඇති මහණ ඒ දෘෂ්ටි හැරපීම පිණිස සමනුභාසන කර්ම කරන ලදුයේ යැ. සඞ්ඝයාට රුස්නේ යැ. එහෙයින් නිහඬ වන්නේ යි. මෙසේ මෙය දරමි.

9. ඤත්තියා දුක්කටං. ද්වීහි කම්මවාචාහි දුක්කටා, කම්මවාචා පරියොසානෙ ආපත්ති පාචිත්තියස්ස.

ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී නප්පටිනිස්සජ්ජති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ වෙමතිකො නප්පටිනිස්සජ්ජති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී නප්පටිනිස්සජ්ජති ආපත්ති පාචිත්තියස්ස.

අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී ආපත්ති දුක්කටස්ස.

අනාපත්ති: අසමනුභාසන්තස්ස පටිනිස්සජ්ජන්තස්ස, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.[1]

අරිට්ඨසික්ඛාපදං අට්ඨමං.

## 6. 7. 9

## උක්ඛිත්තසම්භොගසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ජානං තථාවාදිනා අරිට්ඨෙන භික්ඛුනා අකටානුධම්මෙන තං දිට්ඨිං අප්පටිනිස්සට්ඨෙන සද්ධිං සම්භුඤ්ජන්තිපි සංවසන්තිපි සහාපි සෙය්‍යං කප්පෙන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛියන්ති විපාචෙන්ති: "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ ජානං තථාවාදිනා අරිට්ඨෙන භික්ඛුනා අකටානුධම්මෙන තං දිට්ඨිං අප්පටිනිස්සට්ඨෙන සද්ධිං සම්භුඤ්ජිස්සන්තිපි සංවසිස්සන්තිපි සහාපි සෙය්‍යං කප්පෙස්සන්ති"ති -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ, ජානං තථාවාදිනා අරිට්ඨෙන භික්ඛුනා අකටානුධම්මෙන තං දිට්ඨිං අප්පටිනිස්සට්ඨෙන සද්ධිං සම්භුඤ්ජථාපි සංවසථාපි සහාපි සෙය්‍යං කප්පෙථාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා, ජානං තථාවාදිනා අරිට්ඨෙන භික්ඛුනා අකටානුධම්මෙන තං දිට්ඨිං අප්පටිනිස්සට්ඨෙන සද්ධිං සම්භුඤ්ජිස්සථාපි සංවසිස්සථාපි සහාපි සෙය්‍යං කප්පෙස්සථ. නෙතං මොඝපුරිසා, අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

"යො පන භික්ඛු ජානං තථාවාදිනා භික්ඛුනා අකටානුධම්මෙන තං දිට්ඨිං අප්පටිනිස්සට්ඨෙන සද්ධිං සම්භුඤ්ජෙය්‍ය වා සංවසෙය්‍ය වා සහ වා සෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තිය"න්ති.

---

1. ආදිකම්මිකස්සාති පදං මරම්මඡට්ඨසඞ්ගීතිපිටකෙ න දිස්සති.

9. ඥප්තියෙහි දුකුළායෙකි. දෙ කම වදනින් දෙ දුකුළායෙකි. කම්වදන් අවසන්හි පචිති ඇවැත් වේ.

දහැමිකම්හි දහැමිකම්සඤ් ඇතියේ නො හැරපියා නම් පචිති ඇවැත් වෙයි. දහැමිකම්හි විමති ඇතියේ නො හැරපියා නම් පචිති ඇවැත් වෙයි. දහැමිකම්හි නො දහැමිකම්සඤ් ඇතියේ නො හැරපියා නම් පචිති ඇවැත් වේ.

නො දහැමිකම්හි දහැමිකම්සඤ් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො දහැමිකම්හි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො දහැමිකම්හි නො දහැමිකම්සඤ් ඇතියේ නම් දුකුළා ඇවැත් වේ.

සමනුභාසන කම් නො කළහුට, (ලබ්ධිය) හැරපියන්නහුට උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

අටවැනි අරිට්ඨ ශික්ෂාපද යි.

## 6. 7. 9

## උක්ඛිත්තසම්භොග ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි ඡවග්ග මහණහු එසේ මැ කියන ඒ ලබ්ධිය නො හළ ඔසාරණය නො කළ අරිට්ඨ මහණහු සමඟ දනැ දනැ සම්භොග ද කෙරෙති, විනයකම් ද කෙරෙති, එක් වැ ශයනය ද කෙරෙත්. යම් භික්ෂු කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ඡවග්ග මහණහු දනැ දනැ එසේ මැ කියන ඒ ලබ්ධිය නො හළ ඔසාරණය නො කළ අරිට්ඨ මහණහු සමඟ සම්භොගත් කොළෝ ද විනයකම්ත් කොළෝ ද එක් වැ ශයනයත් කොළෝ" දු යි ... සැබෑ ද මහණෙනි, තෙපි දනැදනැ එසේ මැ කියන ඒ ලබ්ධිය නො හළ ඔසාරණය නො කළ අරිට්ඨ මහණහු සමඟ සම්භොගත් කරවු ද විනයකම්ත් කරවු ද එක් වැ ශයනයත් කරවු දු යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූහ ... කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි දනැ දනැ එසේ මැ කියන ඒ ලබ්ධිය නො හළ ඔසාරණය නො කළ අරිට්ඨ මහණහු සමඟ සම්භොගත් කළහු ද විනයකම්ත් කළහු ද එක් වැ ශයනයත් කළහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි. ... මෙසේ ද වනාහි මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**"යම් මහණෙක් දනැ දනැ එසේ මැ කියන ඒ දෘෂ්ටි නො හළ ඔසාරණය නො කළ මහණක්හු සමඟ සම්භොග කරන්නේ නම් හෝ විනයකම් කරන්නේ නම් හෝ එක් වැ ශයනය කරන්නේ නම හෝ පචිති වේ" යයි.**

2. යො පනාති: යො යාදිසො -පෙ- භික්ඛූති -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

ජානාති නාම; සාමං වා ජානාති, අඤ්ඤෙ වා තස්ස ආරොචෙන්ති. සො වා ආරොචෙති.

තථාවාදිනාති: තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙ මෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායාති එවං වාදිනා.

අකටානුධම්මො නාම; උක්ඛිත්තො අනොසාරිතො,

තං දිට්ඨිං අප්පටිනිස්සට්ඨෙන සද්ධින්ති එතං දිට්ඨිං අප්පටිනිස්සට්ඨෙන සද්ධිං.

සම්භුඤ්ජෙය්‍ය වාති: සම්භොගො නාම ද්වෙ සම්භොගා ආමිසසම්භොගො ච ධම්මසම්භොගො ච. ආමිසසම්භොගො නාම: ආමිසං දෙති වා පතිගණ්හාති වා ආපත්ති පාචිත්තියස්ස. ධම්මසම්භොගො නාම: උද්දිසති වා උද්දිසාපෙති වා, පදෙන උද්දිසති වා උද්දිසාපෙති වා පදෙ පදෙ ආපත්ති පාචිත්තියස්ස. අක්ඛරාය උද්දිසති වා උද්දිසාපෙති වා අක්ඛරක්ඛරාය ආපත්ති පාචිත්තියස්ස.

සංවසෙය්‍ය වාති: උක්ඛිත්තකෙන සද්ධිං උපොසථං වා පවාරණං වා සඞ්ඝකම්මං වා කරොති ආපත්ති පාචිත්තියස්ස.

සහ වා සෙය්‍යං කප්පෙය්‍යාති: එකච්ඡන්නෙ උක්ඛිත්තකෙ නිපන්නෙ භික්ඛු නිපජ්ජති ආපත්ති පාචිත්තියස්ස. භික්ඛු නිපන්නෙ උක්ඛිත්තකො නිපජ්ජති ආපත්ති පාචිත්තියස්ස. උභො වා නිපජ්ජන්ති ආපත්ති පාචිත්තියස්ස. උට්ඨහිත්වා පුනප්පුනං නිපජ්ජන්ති ආපත්ති පාචිත්තියස්ස.

උක්ඛිත්තකෙ උක්ඛිත්තකසඤ්ඤී සම්භුඤ්ජති වා සංවසති වා සහ වා සෙය්‍යං කප්පෙති ආපත්ති පාචිත්තියස්ස. උක්ඛිත්තකෙ වෙමතිකො සම්භුඤ්ජති වා සංවසති වා සහ වා සෙය්‍යං කප්පෙති ආපත්ති දුක්කටස්ස. උක්ඛිත්තකෙ අනුක්ඛිත්තකසඤ්ඤී සම්භුඤ්ජති වා සංවසති වා සහ වා සෙය්‍යං කප්පෙති අනාපත්ති.

2. **යො පන ;** යම්, යම්බඳු ... **භික්ඛු** ... මෙතෙමේ මේ අර්ථයෙහිලා අදහස් කරන ලද භික්ෂු යි.

**ජානාති** නම්: තෙමේ හෝ දනී. අන්හු හෝ ඔහුට ඇරොජත් හෙතෙමේ හෝ ඇරොජයි.

**තථාවාදිනා :** භාග්‍යවතුන් විසින් යම් අන්තරායකර ධර්ම කෙනෙක් වදරන ලදහු නම් ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස යම්සේ සමර්ථ නො වෙද්ද, එසේ භාග්‍යවතුන් වදළ ධර්මය මම දනිමැ යි මෙසේ කියන්නාවූ ;

**අකටානුධම්ම** නම්; උකෙවනීකම් කරන ලදුයේ-ඔසාරණය නො කරන ලදුයේ යි.

**තං දිට්ඨිං අප්පටිනිස්සජ්ජෙන සද්ධිං ;** තෙල දෘෂ්ටි නො හැරපියන ලදහු සමඟ ;

**සම්භුඤ්ජෙය්‍ය වා** සම්භොග නම්; සම්භොගයෝ දෙදෙනෙකි, ආමිස සම්භොගය ද ධම්ම සම්භොගය ද යි. **ආමිසසම්භොග** නම් : ආමිෂයක් දේ නම් හෝ පිළිගනී නම් හෝ පචිති ඇවැත් වේ. **ධම්මසම්භොග** නම්: උදෙසා නම් හෝ උදෙසවා නම් හෝ, පදයෙන් උදෙසා නම් හෝ උදෙසවා නම් හෝ පෙදෙහි පෙදෙහි පචිති ඇවැත් වෙයි. අක්ෂරයෙන් උදෙසා නම් හෝ උදෙසවා නම් හෝ අකුරෙහි අකුරෙහි පචිති ඇවැත් වේ.

**සංවසෙය්‍ය වා :** උකෙවනීකම් කරන ලද්දක්හු සමඟ පොහොය හෝ පවුරුණු හෝ සඟකම් හෝ කෙරේ නම් පචිති ඇවැත් වේ.

**සහ වා සෙය්‍යං කප්පෙය්‍ය :** එක් සෙවින්නෙහි උක්ඛිත්තකයා හොත් කල්හි මහණ හොවී නම් පචිති ඇවැත් වෙයි. මහණ හොත් කල්හි උක්ඛිත්තකයා හොවී නම් පචිති ඇවැත් වෙයි. දෙදෙන ම හෝ හොවිත් නම් පචිති ඇවැත් වෙයි. නැඟිට පුන පුනා හොවිත් නම් පචිති ඇවැත් වේ.

උක්ඛිත්තකයා කෙරෙහි උකෙවනීකම් කළ සත් ඇතියේ සම්භොග කෙරේ නම් හෝ විනයකර්ම කෙරේ නම් හෝ එක් වැ ශයනය කෙරේ නම් හෝ පචිති ඇවැත් වෙයි. උක්ඛිත්තකයා කෙරෙහි විමති ඇතියේ සම්භොග කෙරේ නම් හෝ විනයකර්ම කෙරේ නම් හෝ එක් වැ ශයනය කෙරේ නම් හෝ දුකුළා ඇවැත් වෙයි. උක්ඛිත්තකයා කෙරෙහි උකෙවනීකම් නො කළ සත් ඇතියේ සම්භොග කෙරේ නම් හෝ විනයකර්ම කෙරේ නම් හෝ එක් වැ ශයනය කෙරේ නම් හෝ ඇවැත් නැති.

අනුක්ඛිත්තකෙ උක්ඛිත්තකසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අනුක්ඛිත්තකෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අනුක්ඛිත්තකෙ අනුක්ඛිත්තකසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** අනුක්ඛිත්තොති ජානාති, උක්ඛිත්තො ඔසාරිතොති ජානාති, තං දිට්ඨිං පටිනිස්සට්ඨොති ජානාති, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

උක්ඛිත්තසම්භොගසික්ඛාපදං නවමං.

## 6. 7. 10

## කණ්ටකසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන **කණ්ටකස්ස** නාම සමණුද්දෙසස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං හොති, "තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙමෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායා"ති. අස්සොසුං ඛො සම්බහුලා භික්ඛූ කණ්ටකස්ස නාම කිර සමණුද්දෙසස්ස එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙමෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායා"ති. අථ ඛො තෙ භික්ඛූ යෙන කණ්ටකො සමණුද්දෙසො තෙනුපසඞ්කමිංසු, උපසඞ්කමිත්වා කණ්ටකං සමණුද්දෙසං එතදවොචුං; "සච්චං කිර තෙ ආවුසො කණ්ටක එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙ මෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායා"ති. එවංබ්‍යාඛො අහං භන්තෙ, භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙ මෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායා"ති.

2. මා ආවුසො කණ්ටක, එවං අවච මා භගවන්තං අබ්භාචික්ඛි න හි සාධු භගවතො අබ්භක්ඛානං. න හි භගවා එවං වදෙය්‍ය අනෙකපරියායෙන ආවුසො කණ්ටක, අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා අලඤ්ච පන තෙ පටිසෙවතො අන්තරායාය, අප්පස්සාද කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහූපායාසා ආදීනවො එත්ථ භියෙය්‍යා, අට්ඨිකඞ්කලූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහූපායාසා ආදීනවො එත්ථ භියෙය්‍යා -පෙ-

උක්ඛෙපනීකම් නො කළහු කෙරෙහි උක්ඛෙපනීකම් කළ සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. උක්ඛෙපනී කම් නො කළහු කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. උක්ඛෙපනීකම් නො කළහු කෙරෙහි උක්ඛෙපනීකම් නො කළ සත් ඇතියේ නම් ඇවැත් නැති.

උක්ඛෙපනීකම් නො කෙළෙකැ යි දනී නම්, උක්ඛෙපනීකම් කරන ලදු වැ ඔසාරණය කරන ලද්දෙකැයි දනී නම්, ඒ දෘෂ්ටි හැරපියන ලද්දෙකැ යි දනී නම්, උම්මත්තකයහට ආදිකම්මිකයහට, ඇවැත් නැති.

**නවවැනි උක්ඛිත්තසම්භොග ශික්ෂාපද යි.**

## 6.7.10

## කණ්ටක ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජෙතවන නම් අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි කණ්ටක නම් හෙරණහට මෙබඳු ලාමකදෘෂ්ටියෙක් උපන්නේ වෙයි. ''භාග්‍යවතුන් විසින් යම් අන්තරායකර ධර්ම කෙනෙක් වදරන ලදහු නම් ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස යම්සේ සමර්ථ නො වෙද්ද, එසේ භාග්‍යවතුන් වදළ ධර්මය මම දනිමැ''යි. බොහෝ භික්ෂූහු කණ්ටක නම් හෙරණහට මෙබඳු ලාමකදෘෂ්ටියෙක් උපනැ යි ඇසූහු ''භාග්‍යවතුන් විසින් යම් අන්තරායකර ධර්ම කෙනෙක් වදරන ලදහු නම් ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස යම්සේ සමර්ථ නො වෙද්ද, එසේ භාග්‍යවතුන් වදළ ධර්මය මම දනිමැ''යි. එකල්හි ඒ භික්ෂූහු කණ්ටක හෙරණහු වෙත එළැඹියහ. එළැඹ කණ්ටක හෙරණහට මෙය කීහු. සැබෑ ද ඇවැත් කණ්ටකය, තොපට මෙබඳු ලාමක දෘෂ්ටියෙක් උපන්නේ ද? ''භාග්‍යවතුන් විසින් යම් අන්තරායකර ධර්ම කෙනෙක් වදරන ලදහු නම් ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස යම්සේ සමර්ථ නො වෙද්ද, එසේ භාග්‍යවතුන් වදළ ධර්මය මම දනිමි''යි. භාග්‍යවතුන් විසින් යම් අන්තරායකර ධර්ම කෙනෙක් වදරන ලදහු නම් ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස යම්සේ සමර්ථ නො වෙද්ද, එසෙයින් ස්වාමීනි, භාග්‍යවතුන් වදළ ධර්මය මම දනිමි.

2. ඇවැත් කණ්ටකය, මෙසේ නහමක් කියව, භාග්‍යවතුන්හට නහමක් නුගුණ කියව, භාග්‍යවතුන්හට නුගුණ කීම නො මැනැවි. භාග්‍යවත් තෙමේ මෙසේ නො මැ වදරන්නේ යැ. ඇවැත්නි කණ්ටකය, නොයෙක් කරුණෙන් අන්තරායකර ධර්මයෝ අන්තරායකරහ යි භාග්‍යවතුන් විසින් වදරන ලදහ. ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස සමර්ථ වෙත් මැයි. කාමයෝ අල්පාස්වාද ඇතියහ. බොහෝ දුක් ඇතියහ. බොහෝ දැඩි ආයාස ඇතියහ, මෙහි ආදීනවය බෙහෙවැ යි භාග්‍යවතුන් විසින් වදරන ලද. බොහෝ දුක් ඇති බොහෝ දැඩි ආයාස ඇති කාමයෝ ඇට සැකිල්ලක් බන්දුහ මෙහි ආදීනවය බෙහෙවැ යි භාග්‍යවතුන් විසින් වදරන ලද ...

සප්පසිරූපමා කාමා වුත්තා භගවතා බහුදුක්ඛා බහූපායාසා ආදීනවො එත්ථ භියොයාති. එවම්පි ඛො කණ්ටකො සමණුද්දෙසො තෙහි භික්ඛූහි වුච්චමානො තථෙව තං පාපකං දිට්ඨිගතං ථාමසා පරාමස්ස අභිනිවිස්ස වොහරති, එවංබ්‍යාඛො අහං භන්තෙ, භගවතො ධම්මං දෙසිතං ආජානාමි "යථා යෙ මෙ අන්තරායිකා ධම්මා වුත්තා[1] භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායා"ති.

3. යතො ච ඛො තෙ භික්ඛූ නාසක්ඛිංසු කණ්ටකං සමණුද්දෙසං එතස්මා පාපකා දිට්ඨිගතා විවෙචෙතුං. අථ ඛො තෙ භික්ඛූ යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා භගවතො එතමත්ථං ආරොචෙසුං, අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ භික්ඛුසඞ්ඝං සන්නිපාතෙත්වා කණ්ටකං සමණුද්දෙසං පටිපුච්ඡි. සච්චං කිර තෙ කණ්ටක, එවරූපං පාපකං දිට්ඨිගතං උප්පන්නං, "තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙමෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායා"ති. එවං බ්‍යා ඛො අහම්භන්තෙ, භගවතා ධම්මං දෙසිතං ආජානාමි. "යථා යෙමෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායා"ති.

4. කස්ස නුඛො නාම ත්වං මොඝපුරිස, මයා එවං ධම්මං දෙසිතං ආජානාසි? නනු මයා මොඝපුරිස, අනෙකපරියායෙන අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා. අලඤ්ච පන තෙ පටිසෙවතො අන්තරායාය, අප්පස්සාද කාමා වුත්තා මයා බහුදුක්ඛා බහූපායාසා ආදීනවො එත්ථ භියොයා, අට්ඨිකඞ්කලූපමා කාමා වුත්තා මයා -පෙ- සප්පසිරූපමා කාමා වුත්තා මයා බහුදුක්ඛා බහූපායාසා ආදීනවො එත්ථ භියොයා, අථ ච පන ත්වං මොඝපුරිස, අත්තනා දුග්ගහිතෙන අම්හෙ චෙව අබ්භාචික්ඛසි අත්තානඤ්ච ඛණසි බහුඤ්ච අපුඤ්ඤං පසවසි, තංහි තෙ මොඝපුරිස, භවිස්සති දීඝරත්තං අහිතාය දුක්ඛාය. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි, තෙන හි භික්ඛවෙ සඞ්ඝො කණ්ටකං සමණුද්දෙසං නාසෙතු. එවඤ්ච පන භික්ඛවෙ නාසෙතබ්බො. "අජ්ජතග්ගෙ තෙ ආවුසො කණ්ටක, න චෙව සො භගවා සත්ථා අපදිසිතබ්බො. යම්පි චඤ්ඤෙ සමණුද්දෙසා ලභන්ති භික්ඛූහි සද්ධිං දිරත්තතිරත්තං සහසෙය්‍යං සාපි තෙ නත්ථි චර පරෙ[2] විනස්සාති. අථ ඛො සඞ්ඝො කණ්ටකං සමණුද්දෙසං නාසෙසි.

---

1. වුත්තාතිපදං මරම්මඡට්ඨසඞ්ගීතිපිටකෙ න දිස්සතෙ.
2. චරපිරෙ-මජසං.

බොහෝ දුක් ඇති බොහෝ දැඩි ආයාස ඇති කාමයෝ සර්ප ශීර්ෂ බන්දහ. මෙහි ආදීනවය බෙහෙවැ යි භාග්‍යවතුන් විසින් වදරන ලද. මෙසේ ද වනාහි කණ්ටක හෙරණ ඒ භික්ෂූන් විසින් කියනු ලබන්නේ එසේ මැ ඒ ලාමක දෘෂ්ටිය දැඩිසේ අල්වාගෙනැ (එයට) බැසගෙනැ බැවහර කෙරෙයි. ''භාග්‍යවතුන් විසින් යම් අන්තරායකර ධර්ම කෙනෙක් වදරන ලදහු නම් ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස යම්සේ සමර්ථ නො වෙද්ද, එසේ ස්වාමීනි, භාග්‍යවතුන් වදළ ධර්මය මම දනිමැ''යි.

3. ඒ භික්ෂූහු කණ්ටක හෙරණහු තෙල ලාමකදෘෂ්ටියෙන් වෙන් කරන්නට යම් හෙයකින් නො හැකිවූහු ද, එකල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වෙතැ එළැඹියහ. එළැඹැ භාග්‍යවතුන්හට තෙල කරුණ දන්වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙහි ලා මෙ අවසරයෙහි ලා භික්සඟන රැස් කරවා කණ්ටක හෙරණහු පුළුවුත් සේකැ. සැබෑ ද කණ්ටකය තොපට මෙබඳු ලාමකදෘෂ්ටියෙක් උපන්නේ ද? ''භාග්‍යවතුන් විසින් යම් අන්තරායකර ධර්ම කෙනෙක් වදරන ලදහු නම් ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස යම්සේ සමර්ථ නො වෙද්ද, එසේ භාග්‍යවතුන් වදළ ධර්මය දනිමැ''යි. භාග්‍යවතුන් විසින් යම් අන්තරායකර ධර්ම කෙනෙක් වදරන ලදහු නම් ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස යම්සේ සමර්ථ නො වෙද්ද එසෙයින් ස්වාමීනි, භාග්‍යවතුන් වදළ ධර්මය මම දනිමි.

4. හිස් පුරුෂය, තෙපි මා විසින් කවරක්හට නම් එසේ ධර්මය දෙසන ලද යි දනිවු ද? හිස් පුරුෂය, මා විසින් නොයෙක් කරුණෙන් අන්තරායකරධර්මයෝ අන්තරායකරහ යි දෙසන ලද්දහු නො වෙද්ද? තව ද ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස සමර්ථ නො වෙද්ද? කාමයෝ අල්පාස්වාද ඇතියහ. බොහෝ දුක් ඇතියහ. බොහෝ දැඩි ආයාස ඇතියහ. මෙහි ආදීනවය බෙහෙවැ යි මා විසින් දෙසන ලද යැ. කාමයෝ ඇටසැකිල්ලක් බන්දහ යි මා විසින් දෙසන ලද... බොහෝ දුක් ඇති බොහෝ දැඩි ආයාස ඇති කාමයෝ සර්පශීර්ෂ බන්දහ. මෙහි ආදීනවය බෙහෙවැ යි මා විසින් දෙසන ලද. එතෙකුදු වුවත් හිස් පුරුෂය, තෙපි තමා විසින් නපුරු කොට ගන්නා ලද දෘෂ්ටියෙන් අපට ද නුගුණ කියව, තමා ද සැරූ ගුණ ඇතියව. බොහෝ පව් ද රැස් කරහි. හිස් පුරුෂය, එය බලත් තොපට දිගුරැයක් අහිත පිණිස දුක් පිණිස වන්නේ යැ. හිස් පුරුෂය, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... ...ගරහා දැහැමි කථා කොට මහණුන් ඇමැතූ සේකැ. එකරුණෙන් මැ මහණෙනි, සඞසතෙමේ කණ්ටක හෙරණහු (දණ්ඩකර්මනාසනායෙන්) නසාවා. මෙසේ ද මහණෙනි, නැසිය යුත්තේ යි. ''ඇවැත්නි කණ්ටකය, අද පටන් කොට ඒ භාග්‍යවත් තෙමේ තොපෙ ශාස්තෘ යැ යි නොම කිය යුත්තේ යැ. අන් හෙරණහු මහණුන් සමඟ යම් දෙතුන්රැයක් එක් වැ ශයනය ලබත් නම් ඒ එක් වැ ශයන ද තට නැති, මමතා නැත්තව, බැහැරැ යා, නො දක්මට යව''යි. ඉක්බිති සඞස තෙමේ කණ්ටක හෙරණහු නැසී යැ.

5. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ජානං තථා නාසිතං කණ්ටකං සමණුද්දෙසං උපලාපෙන්තිපි උපට්ඨාපෙන්තිපි සම්භුඤ්ජන්තිපි සහාපි සෙය්‍යං කප්පෙන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, ''කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ ජානං තථා නාසිතං කණ්ටකං සමණුද්දෙසං උපලාපෙස්සන්තිපි උපට්ඨාපෙස්සන්තිපි සම්භුඤ්ජිස්සන්තිපි සහාපි සෙය්‍යං කප්පෙස්සන්ති''ති -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ, ජානං තථා නාසිතං කණ්ටකං සමණුද්දෙසං උපලාපෙථාපි උපට්ඨාපෙථාපි සම්භුඤ්ජථාපි සහාපි සෙය්‍යං කප්පෙථාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා, ජානං තථා නාසිතං කණ්ටකං සමණුද්දෙසං උපලාපෙස්සථාපි උපට්ඨාපෙස්සථාපි සම්භුඤ්ජිස්සථාපි සහාපි සෙය්‍යං කප්පෙස්සථ. නෙතං මොඝපුරිසා, අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

''සමණුද්දෙසොපි චෙ එවං වදෙය්‍ය, තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙමෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායාති. සො සමණුද්දෙසො භික්ඛූහි එවමස්ස වචනීයො, මා ආවුසො සමණුද්දෙස, එවං අවච මා භගවන්තං අබ්භාචික්ඛි න හි සාධු භගවතො අබ්භක්ඛානං. න හි භගවා එවං වදෙය්‍ය. අනෙකපරියායෙන ආවුසො සමණුද්දෙස, අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා අලඤ්ච පන තෙ පටිසෙවතො අන්තරායායාති. එවඤ්ච පන සො සමණුද්දෙසො භික්ඛූහි වුච්චමානො තථෙව පග්ගණ්හෙය්‍ය, සො සමණුද්දෙසො භික්ඛූහි එවමස්ස වචනීයො. අජ්ජතග්ගෙ තෙ ආවුසො සමණුද්දෙස, න චෙව සො භගවා සත්ථා අපදිසිතබ්බො. යම්පි චඤ්ඤෙ සමණුද්දෙසා ලභන්ති භික්ඛූහි සද්ධිං දිරත්තතිරත්තං සහසෙය්‍යං සාපි තෙ නත්ථි. චර පරෙ විනස්සාති. යො පන භික්ඛු ජානං තථා නාසිතං සමණුද්දෙසං උපලාපෙය්‍ය වා උපට්ඨාපෙය්‍ය වා සම්භුඤ්ජෙය්‍ය වා සහ වා සෙය්‍යං කප්පෙය්‍ය පාචිත්තිය''න්ති.

5. එසමයෙහි වනාහි සවග මහණහු දැනැ දැනැ එසේ නසන ලද කණ්ටක හෙරණහු නැළවීම ද කෙරෙති. උවටැන් කරවා ගැනීම ද කෙරෙති. සම්භොග ද කෙරෙති, එක් වැ ශයනය ද කෙරෙති. යම් භික්ෂු කෙනෙක් අපිස් වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් සවග මහණහු දැනැ දැනැ එසේ නසන ලද කණ්ටක හෙරණහු නැළවීමත් කොළෝ ද උවැටන් කරවා ගැනීමත් කොළෝ ද සම්භොගත් කොළෝ ද එක් වැ ශයනයත් කොළෝ"දැ යි... සැබැ ද මහණෙනි, තෙපි දැනැ දැනැ එසේ නසන ලද කණ්ටක හෙරණහු නැළවීමත් කරවු ද උවැටන් කරවා ගැනීමත් කරවු ද සම්භොගත් කරවුද එක් වැ ශයනයත් කරවු ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූහ...කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි දැනැ දැනැ එසේ නසන ලද කණ්ටක හෙරණහු නැළවීමත් කළහු ද උවැටන් කරවා ගැනීමත් කළහු ද සම්භොගත් කළහු ද එක් වැ ශයනයත් කළහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

"හෙරණකුදු "භාග්‍යවතුන් විසින් යම් අන්තරායකර ධර්ම කෙනෙක් වදරන ලදහු නම් ඒ ධර්මයන් සෙවුනාහට අනතුරු පිණිස යම්සේ සමර්ථ නො වෙද්ද, එසේ භාග්‍යවතුන් වදළ ධර්මය මම දනිමැ"යි මෙසේ කියන්නේ නම් ඒ හෙරණ මහණුන් විසින් "ඇවැත් හෙරණ, මෙසේ නහමක් කියව, භාග්‍යවතුන්හට නහමක් නුගුණ කියව, භාග්‍යවතුන්හට නුගුණකීම නො මැනැවි, භාග්‍යවත් තෙමේ මෙසේ නො මැ වදරන්නෙ යැ, ඇවැත් හෙරණ, නොයෙක් කරුණෙන් අන්තරායකර ධර්මයෝ අන්තරායකරහ යි භාග්‍යවතුන් විසින් වදරන ලද. ඒ ධර්මයන් සෙවුනාහට අනතුරු පිණිස සමර්ථ වෙත් මැ යි, මෙසේ කියයුත්තෙක් වන්නේ යැ. මෙසේ ද වනාහි ඒ හෙරණ මහණුන් විසින් කියනු ලබන්නේ එසේ මැ දැඩි වැ ගන්නේ නම් ඒ හෙරන මේ මහණුන් විසින් "ඇවැත, හෙරණ, අද පටන් කොට ඒ භාග්‍යවත් තෙමේ තාගේ ශාස්තෘ යැ යි නො මැ කිය යුත්තේ යැ, අන් හෙරණෝ මහණුන් සමඟ යම් දෙතුන් රැයකුදු එක් වැ ශයනය ලබත් නම් ඒ එක් වැ ශයනය ද තොපට නැති. මමතා නැත්තව, බැහැර යා, නො දක්මට යව යි මෙසේ කියයුත්තෙක් වන්නේ යැ. යම් මහණෙක් දැනැ දැනැ එසේ නසන ලද හෙරණක්හු නළවන්නේ නම් හෝ උවටැන් කරවා ගන්නේ නම් හෝ සම්භොග කරන්නේ නම් හෝ එක් වැ ශයනය කරන්නේ නම් හෝ පචිති වේ" යයි.

6. **සමණුද්දෙසො** නාම: සාමණෙරො වුච්චති.

**එවං වදෙය්‍යාති:** තථාහං භගවතා ධම්මං දෙසිතං ආජානාමි යථා යෙමෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා තෙ පටිසෙවතො නාලං අන්තරායායාති. **සො සමණුද්දෙසොති:** යො සො එවං වාදී සමණුද්දෙසො;

**භික්ඛූහීති:** අඤ්ඤෙහි භික්ඛූහි. යෙ පස්සන්ති යෙ සුණන්ති තෙහි වත්තබ්බො මා ආවුසො සමණුද්දෙස, එවං අවච මා භගවන්තං අබ්භාචික්ඛි න හි සාධු භගවතො අබ්භක්ඛානං න හි භගවා එවං වදෙය්‍ය, අනෙකපරියායෙන ආවුසො සමණුද්දෙස, අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා අලඤ්ච පන තෙ පටිසෙවතො අන්තරායායාති. දුතියම්පි වත්තබ්බො, තතියම්පි වත්තබ්බො. –පෙ–සචෙ පටිනිස්සජ්ජති ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජති සො සමණුද්දෙසො භික්ඛූහි එවමස්ස වචනීයො: "අජ්ජතග්ගෙ තෙ ආවුසො සමණුද්දෙස, න චෙව සො භගවා සත්ථා අපදිසිතබ්බො යම්පි චඤ්ඤෙ සමණුද්දෙසා ලභන්ති භික්ඛූහි සද්ධිං දිරත්තතිරත්තං සහසෙය්‍යං සාපි තෙ නත්ථි චර පරෙ විනස්සාති.

**යො පනාති:** යො යාදිසො –පෙ– **භික්ඛූති:** –පෙ– අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**ජානාති** නාම: සාමං වා ජානාති අඤ්ඤෙ වා තස්ස ආරොචෙන්ති. සො වා ආරොචෙති.

**තථා නාසිතන්ති:** එවං නාසිතං.

**සමණුද්දෙසො** නාම: සාමණෙරො වුච්චති,

**උපලාපෙය්‍ය වාති:** තස්ස පත්තං වා චීවරං වා උද්දෙසං වා පරිපුච්ඡං වා දස්සාමීති උපලාපෙති ආපත්ති පාචිත්තියස්ස.

**උපට්ඨාපෙය්‍ය වාති:** තස්ස චුණ්ණං වා මත්තිකං වා දන්තකට්ඨං වා මුඛොදකං වා සාදියති ආපත්ති පාචිත්තියස්ස.

6. **සමණුද්දෙස** නම්: හෙරණැ යි කියනු ලැබෙ.

**එවං වදෙය්‍ය;** භාග්‍යවතුන් විසින් යම් අන්තරායකර ධර්ම කෙනෙක් වදරන ලදහු නම් ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස යම්සේ සමර්ථ නො වෙද්ද, එසේ භාග්‍යවතුන් වදළ ධර්මය මම දනිමැ යි.

**සො සමණුද්දෙසො:** යමෙක් මෙසේ කියන සුලු නම් ඒ හෙරණ තෙමේ;

**භික්ඛූහි;** අන් මහණුන් විසින්. යම් කෙනෙක් දකිත් නම් යම් කෙනෙක් අසත් නම් ඔවුන් විසින් "ඇවැත් හෙරණ, මෙසේ නහමක් කියව, භාග්‍යවතුන්හට නහමක් නුගුණකියව, භාග්‍යවතුන්හට නුගුණ කීම නො මැනැවි. භාග්‍යවත් තෙමේ මෙසේ නො මැ වදරන්නේ යැ. ඇවැත් හෙරණ, නොයෙක් කරුණෙන් භාග්‍යවතුන් විසින් අන්තරාය කරධර්මයෝ අන්තරායකරහ යි වදරන ලද. ඒ ධර්මයන් සෙවුනාහට අන්තරාය පිණිස සමර්ථ වෙත් මැ යි කියයුත්තේ යැ. දෙවනවට ද කියයුත්තේ යැ, තෙවනවට ද කිය යුත්තේ යි..............ඉදින් හැරපියා නම් මෙසේ තෙල හැරපීම මැනැවි. ඉදින් නො හැරපියා නම් ඒ හෙරණ මහණුන් විසින් "ඇවැත් හෙරණ, අද පටන් කොට ඒ භාග්‍යවත් තෙමේ තොපගේ ශාස්තෘ යැ යි නො මැ කිය යුත්තේ ය, අන් හෙරණහු මහණුන් සමඟ යම් දෙතුන් රැයකුදු එක් වැ ශයනය ලබත් නම් ඒ එක් වැ ශයනය ද තොපට නැති, මමතා නැත්තව, බැහැර යා, නො දක්මට යව යි.

**යො පන;** යම්, යම්බඳු ...භික්ඛු...මෙ තෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**ජානාති** නම්: තෙමේ හෝ දනී. අන්හු හෝ ඔහුට ඇරොජත්. හෙතෙමේ හෝ ඇරොජයි.

**තථානාසිතං;** එසේ නසන ලද;

**සමණුද්දෙස** නම්: හෙරණැ යි කියනු ලැබෙ.

**උපලාපෙය්‍ය වා;** ඔහට පාත්‍රයක් හෝ සිවුරක් හෝ උදෙසීමක් හෝ පිළිවිසීමක් හෝ දෙන්නෙමැ යි නළවා නම් පචිති ඇවැත් වෙ.

**උපට්ඨාපෙය්‍ය වා;** ඔහුගේ සුණු හෝ මැටි හෝ දැහැටි හෝ මුව දෝනාදිය හෝ ඉවසා නම් පචිති ඇවැත් වෙ.

**සම්භුඤ්ජෙය්‍ය වාති:** සම්භොගො නාම: ද්වෙ සම්භොගා ආමිස සම්භොගො ච ධම්මසම්භොගො ච. **ආමිසසම්භොගො** නාම: ආමිසං දෙති වා පටිග්ගණ්හාති වා ආපත්ති පාචිත්තියස්ස. ධම්මසම්භොගො නාම: උද්දිසති වා උද්දිසාපෙති වා, පදෙන උද්දිසති වා උද්දිසාපෙති වා පදෙ පදෙ ආපත්ති පාචිත්තියස්ස. අක්ඛරාය උද්දිසති වා උද්දිසාපෙති වා අක්ඛරක්ඛරාය ආපත්ති පාචිත්තියස්ස.

සහ වා සෙය්‍යං කප්පෙය්‍යාති: එකච්ඡන්නෙ නාසිතකෙ සමණුද්දෙසෙ නිපන්නෙ භික්ඛු නිපජ්ජති ආපත්ති පාචිත්තියස්ස. භික්ඛු නිපන්නෙ නාසිතකො සමණුද්දෙසො නිපජ්ජති ආපත්ති පාචිත්තියස්ස. උභො වා නිපජ්ජන්ති ආපත්ති පාචිත්තියස්ස. උට්ඨහිත්වා පුනප්පුනං නිපජ්ජති ආපත්ති පාචිත්තියස්ස.

නාසිතකෙ නාසිතකසඤ්ඤී උපලාපෙති වා උපට්ඨාපෙති වා සම්භුඤ්ජති වා සහ වා සෙය්‍යං කප්පෙති ආපත්ති පාචිත්තියස්ස. නාසිතකෙ වෙමතිකො උපලාපෙති වා උපට්ඨාපෙති වා සම්භුඤ්ජති වා සහ වා සෙය්‍යං කප්පෙති ආපත්ති දුක්කටස්ස. නාසිතකෙ අනාසිතකසඤ්ඤී උපලාපෙති වා උපට්ඨාපෙති වා සම්භුඤ්ජති වා සහ වා සෙය්‍යං කප්පෙති අනාපත්ති.

අනාසිතකෙ නාසිතකසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අනාසිතකෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අනාසිතකෙ අනාසිතකසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** අනාසිතකොති ජානාති, තං දිට්ඨිං පටිනිස්සට්ඨොති ජානාති, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

කණ්ටකසික්ඛාපදං දසමං.

## සප්පාණකවග්ගො සත්තමො

තස්සුද්දානං:-

සඤ්චිච්චවධසප්පාණං — උක්කොටං දුට්ඨුල්ලඡාදනං,
ඌනවීසතිසත්ථඤ්ච[1] — සංවිධානං අරිට්ඨකං,
උක්ඛිත්තං කණ්ටකං චෙව — දසසික්ඛාපද ඉමෙති.

1. චසාණඤ්ච - සිමු

**සම්භුඤ්ජෙය්‍ය වා:** සම්භොග නම්; සම්භොගයෝ දෙදෙනෙකි. ආමිස සම්භොගය ද ධම්ම සම්භොගය දැ යි. ආමිසසම්භොග නම්: ආමිසයක් දේ නම් හෝ පිළිගනී නම් හෝ පචිති ඇවැත් වේ. ධම්ම සම්භොග නම් උදෙසා නම් හෝ උදෙසවා නම් හෝ පදයෙන් උදෙසා නම් හෝ උදෙසවා නම් හෝ පෙදෙහි පෙදෙහි පචිති ඇවැත් වෙයි. අක්ෂර යෙන් උදෙසා නම් හෝ උදෙසවා නම් හෝ අකුරෙහි අකුරෙහි පචිති ඇවැත් වේ.

**සහ වා සෙය්‍යං කප්පෙය්‍ය:** එක් සෙවින්නෙහි නැසූ හෙරණක්හු හොත් කල්හි මහණ හො වී නම් පචිති ඇවැත් වෙයි. මහණහු හොත් කල්හි නැසූ හෙරණ හොවී නම් පචිති ඇවැත් වෙයි. දෙදෙන මැ හෝ හොවිත් නම් පචිති ඇවැත් වෙයි. නැඟිට පුන පුනා හොවිත් නම් පචිති ඇවැත් වේ.

නැසුවහු කෙරෙහි නැසුණු සන් ඇතියේ නළවා නම් හෝ උවටැන් කරවා ගනී නම් හෝ සම්භොග කෙරේ නම් හෝ එක් වැ ශයනය කෙරේ නම් හෝ පචිති ඇවැත් වෙයි. නැසුවහු කෙරෙහි විමති ඇතියේ නළවා නම් හෝ උවටැන් කරවා ගනී නම් හෝ සම්භොග කෙරේ නම් හෝ එක් වැ ශයනය කෙරේ නම් හෝ දුකුළා ඇවැත් වෙයි. නැසුවහු කෙරෙහි නො නැසුණු සන් ඇතියේ නළවා නම් හෝ උවටැන් කරවා ගනී නම් හෝ සම්භොග කෙරේ නම් හෝ එක් වැ ශයනය කෙරේ නම් හෝ ඇවැත් නැති.

නො නැසුවහු කෙරෙහි නැසුණු සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො නැසුවහු කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො නැසුවහු කෙරෙහි නො නැසුණු සන් ඇතියේ නම් ඇවැත් නැති.

නො නැසුවෙකැ යි දනී නම්, ඒ දෘෂ්ටි හැරුපුවෙකැ යි දනී නම්, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**දසවැනි කණ්ටකශික්ෂාපද යි**

**සප්තම සප්පාණක වර්ග යි.**

එහි උදනය:

**සඤ්චිච්චපාණ** යැ සප්පාණක යැ උක්කොටන යැ දුට්ඨුල්ල යැ ඌනවීසතිවස්ස යැ ථෙය්‍යසත්ථ යැ සංවිධාන යැ අරිට්ඨ යැ උක්ඛිත්තසම්භොග යැ කණ්ටක ය දැ යි මේ සිකපදයෝ දස දෙනෙකි.

## 6. 8. 1

## සහධම්මිකසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **කොසම්බියං** විහරති **ඝොසිතාරාමෙ.** තෙන ඛො පන සමයෙන ආයස්මා **ඡන්නො** අනාචාරං ආචරති. භික්ඛූ එවමාහංසු. "මා ආවුසො ඡන්න, එවරූපං අකාසි නෙතං කප්පතී"ති. සො එවං වදෙති. "න තාවාහං ආවුසො, එතස්මිං සික්ඛාපදෙ සික්ඛිස්සාමි යාව න අඤ්ඤං භික්ඛුං ව්‍යත්තං විනයධරං පරිපුච්ඡාමී"ති.

2. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. "කථං හි නාම ආයස්මා ඡන්නො භික්ඛූහි සහධම්මිකං වුච්චමානො එවං වක්ඛති, න තාවාහං ආවුසො එතස්මිං සික්ඛාපදෙ සික්ඛිස්සාමි යාව න අඤ්ඤං භික්ඛුං ව්‍යත්තං විනයධරං පරිපුච්ඡාමී"ති. -පෙ- සච්චං කිර ත්වං ඡන්න, භික්ඛූහි සහධම්මිකං වුච්චමානො එවං වදෙසි. "න තාවාහං ආවුසො, එතස්මිං සික්ඛාපදෙ සික්ඛිස්සාමි යාව න අඤ්ඤං භික්ඛුං ව්‍යත්තං විනයධරං පරිපුච්ඡාමී"ති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම ත්වං මොඝපුරිස, භික්ඛූහි සහධම්මිකං වුච්චමානො එවං වක්ඛසි, "න තාවාහං ආවුසො, එතස්මිං සික්ඛාපදෙ සික්ඛිස්සාමි යාව න අඤ්ඤං භික්ඛුං ව්‍යත්තං විනයධරං පරිපුච්ඡාමී"ති. නෙතං මොඝපුරිස, අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු භික්ඛූහි සහධම්මිකං වුච්චමානො එවං වදෙය්‍ය න තාවාහං ආවුසො, එතස්මිං සික්ඛාපදෙ සික්ඛිස්සාමි යාව න අඤ්ඤං භික්ඛුං ව්‍යත්තං විනයධරං පරිපුච්ඡාමීති පාචිත්තියං. සික්ඛමානෙන භික්ඛවෙ, භික්ඛුනා අඤ්ඤාතබ්බං පරිපුච්ඡිතබ්බං පරිපඤ්හිතබ්බං අයං තත්‍ථ සාමීචී"ති.**

3. **යො පනාති:** යො යාදිසො **භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්‍ථෙ අධිප්පෙතො භික්ඛූති.

**භික්ඛූහීති:** අඤ්ඤෙහි භික්ඛූහි.

**සහධම්මිකං** නාම: යං භගවතා පඤ්ඤත්තං සික්ඛාපදං **එතං** සහධම්මිකං නාම. තෙන වුච්චමානො.

## 6. 8. 1

## සහධම්මික ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු **කොසඹෑ** නුවර **ඝොෂිතාරාමයෙහි** වැඩැවෙසෙති. එසමයෙහි වනාහි ආයුෂ්මත් **ඡන්නයෝ** අනාචාරයෙහි හැසිරෙති. භික්ෂූහු මෙසේ කීහු. ''ඇවැත්නි ඡන්නයෙනි, මෙබන්දක් නහමක් කරව, මෙය නො කැප''යැ යි. හේ මෙසේ කියයි. ''ඇවැත්නි, මම යම්තාක් ව්‍යක්ත වූ විනයධර වූ අන් මහණක්හු පිළිවිසිම් ද, ඒ තාක් තෙල සිකපදයෙහි නො හික්මෙන්නෙමි''යි.

2. යම් ඒ භික්ෂූ කෙනෙක් අපිස් වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ආයුෂ්මත් ඡන්නයෝ භික්ෂූන් විසින් පැනවූ සිකපදයෙන් කියනු ලබන්නෝ මෙසේ කීහු ද ''ඇවැත්නි, මම යම් තාක් ව්‍යක්ත විනයධර අන් මහණක්හු පිළිවිසිම් ද, ඒ තාක් තෙල සිකපදයෙහි නො හික්මෙන්නෙමැ''යි...සැබෑ ද ඡන්නයෙනි, තෙපි භික්ෂූන් විසින් පැනවූ සිකපදයෙන් කියනු ලබන්නහු මෙසේ කියා ද, ''ඇවැත්නි, මම යම් තාක් ව්‍යක්ත විනයධර අන් මහණක්හු පිළිවිසිම් ද, ඒ තාක් තෙල සිකපදයෙහි නො හික්මෙන්නෙමැ''යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ...කෙසේ නම් හිස් පුරුෂය, තෙපි භික්ෂූන් විසින් පැනවූ සිකපදයෙන් කියනු ලබන්නහු මෙසේ කීහු ද? ''ඇවැත්නි, මම යම් තාක් ව්‍යක්ත විනයධර අන් මහණක්හු පිළිවිසිම් ද, ඒ තාක් තෙල සිකපදයෙහි නො හික්මෙන්නෙමැ''යි. හිස් පුරුෂය, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**''යම් මහණෙක් භික්ෂූන් විසින් පැනවූ සිකපදයෙන් කියනු ලබන්නේ ඇවැත්නි, මම යම් තාක් ව්‍යක්ත විනයධර අන්‍ය මහණක්හු පිළිවිසිම් ද, ඒ තාක් තෙල සිකපදයෙහි නො හික්මෙන්නෙමැ''යි මෙසේ කියන්නේ නම් පචිති වේ. මහණෙනි, හික්මෙන මහණහු විසින් දතයුතු යැ පිළිවිසිය යුතු යැ සිතිය යුතු යි. මේ එහි අනුධම්තා යි.''**

3. **යො පන:** යම්, යම්බඳු... **භික්ඛු**... මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**භික්ඛුහි;** අන්‍ය භික්ෂූන් විසින්;

**සහධම්මික නම්:** භාග්‍යවතුන් වහන්සේ විසින් පනවන ලද යම් සිකපදයෙක් වේ නම් මෙය සහධම්මික නම් වේ. එයින් කියනු ලබන්නේ;

**එවං වදෙය්‍යාති:**[1] න තාවාහං ආවුසො, එතස්මිං සික්ඛාපදෙ සික්ඛිස්සාමි යාව න අඤ්ඤං භික්ඛුං ව්‍යත්තං විනයධරං පරිපුච්ඡාමීති පණ්ඩිතං ව්‍යත්තං මෙධාවිං බහුස්සුතං ධම්මකථිකං පරිපුච්ඡාමීති භණති ආපත්ති පාචිත්තියස්ස.

උපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී එවං වදෙති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ වෙමතිකො එවං වදෙති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී එවං වදෙති ආපත්ති පාචිත්තියස්ස.

අපඤ්ඤත්තෙන වුච්චමානො ඉදං න සල්ලෙඛාය න ධුතාය[2] න පාසාදිකතාය න අපචයාය න විරියාරම්භාය සංවත්තතීති එවං වදෙති "න තාවාහං ආවුසො, එතස්මිං සික්ඛාපදෙ සික්ඛිස්සාමි යාව න අඤ්ඤං භික්ඛුං ව්‍යත්තං විනයධරං පණ්ඩිතං මෙධාවිං බහුස්සුතං ධම්මකථිකං පරිපුච්ඡාමී"ති භණති ආපත්ති දුක්කටස්ස.

අනුපසම්පන්නෙන පඤ්ඤත්තෙන වා අපඤ්ඤත්තෙන වා වුච්චමානො ඉදං න සල්ලෙඛාය න ධුතාය න පාසාදිකතාය න අපචයාය න විරියාරම්භාය සංවත්තතීති එවං වදෙති, "න තාවාහං ආවුසො, එතස්මිං සික්ඛාපදෙ සික්ඛිස්සාමි යාව න අඤ්ඤං භික්ඛුං ව්‍යත්තං විනයධරං පණ්ඩිතං මෙධාවිං බහුස්සුතං ධම්මකථිකං පරිපුච්ඡාමී"ති භණති ආපත්ති දුක්කටස්ස.

අනුපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස.

**සික්ඛමානෙනාති:** සික්ඛිතුකාමෙන.

**අඤ්ඤාතබ්බන්ති:** ජානිතබ්බං.

**පරිපුච්ඡිතබ්බන්ති:** ඉදං භන්තෙ කථං ඉමස්ස කව්වත්ථොති.

**පරිපඤ්හිතබ්බන්ති:** චින්තෙතබ්බං තුලයිතබ්බං.

**අයං තත්ථ සාමීචීති:** අයං තත්ථ අනුධම්මතා.

**අනාපත්ති:** ජානිස්සාමි සික්ඛිස්සාමීති භණති උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**සහධම්මිකසික්ඛාපදං පඨමං.**

---

1. තෙන වුච්චමානො එවං වදෙය්‍ය - මජ්ඣං.
2. න ධුතත්තාය - මජ්ඣං.

එවං වදෙය්‍ය; ඇවැත්නි, මම යම් තාක් ව්‍යක්ත වූ විනයධර වූ අන්‍ය භික්ෂුනමක් පිළිවිසිම් ද, ඒ තාක් තෙල සිකපදයෙහි නො හික්මෙන්නෙමැ යි. පණ්ඩිත වූ ව්‍යක්ත වූ නුවණැති වූ බහුශ්‍රැත වූ ධර්මකථිකයකු පිළිවිසිමැ යි බෙණේ නම් පචිති ඇවැත් වේ.

උපසපනකු කෙරෙහි උපසපන් සන් ඇතියේ මෙසේ කියා නම් පචිති ඇවැත් වෙයි. උපසපනකු කෙරෙහි විමති ඇතියේ මෙසේ කියා නම් පචිති ඇවැත් වෙයි. උපසපනකු කෙරෙහි අනුපසපන් සන් ඇතියේ මෙසේ කියා නම් පචිති ඇවැත් වේ.

(ප්‍රඥප්ත ශික්ෂාපද තබා) සූත්‍රාභිධර්මයෙන් කියනු ලබන්නේ මෙය සලේ පැවැත්මට කෙලෙස් කැපීමට පැහැදුම් එළවීමට නිවනට වැරඇරැඹුමට නො පවතී යැ යි මෙසේ කියයි. ඇවැත්නි, මම යම් තාක් ව්‍යක්ත වූ විනයධර වූ පණ්ඩිත වූ නුවණැති වූ බහුශ්‍රැත ධර්මකථික අන්‍ය භික්ෂුනමක් පිළිවිසිම් ද, ඒ තාක් තෙල සිකපදයෙහි නො හික්මෙන්නෙමැ යි බෙණේ නම් දුකුළා ඇවැත් වේ.

අනුපසපනකු විසින් පනවන ලද සිකපදයෙන් හෝ සූත්‍රාභිධර්මයෙන් හෝ කියනු ලබන්නේ මෙය සලේ පැවැත්මට කෙලෙස් කැපීමට පැහැදුම් එළවීමට නිවනට වැර ඇරැඹුමට නො පවතී යැ යි මෙසේ කියයි. ''ඇවැත්නි, මම යම් තාක් ව්‍යක්ත වූ විනයධර වූ පණ්ඩිත වූ නුවණැති බහුශ්‍රැත ධර්මකථික අන්‍ය භික්ෂුනමක් පිළිවිසිම් ද, ඒ තාක් තෙල සිකපදයෙහි නො හික්මෙන්නෙමැ''යි බෙණේ නම් දුකුළා ඇවැත් වේ.

අනුපසපනකු කෙරෙහි උපසපන් සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනකු කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනකු කෙරෙහි අනුපසපන් සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වේ.

**සික්ඛමානෙන** යනු: හික්මෙනු කැමැත්තහු විසින්;

**අඤ්ඤාතබ්බං**: දතයුතු යැ;

**පරිපුච්ඡිතබ්බං** යනු වහන්ස මෙය කෙසේ ද? මෙහි අර්ථය කුමක් දැ යි.

**පරිපඤ්හිතබ්බං** යනු සිතිය යුතු යැ, තුලනය කළ යුතු යි,

**අයං තත්‍ථ සාමීචි** යනු මේ එහි අනුධර්මතා යි.

දන්නෙම් හික්මෙන්නෙමැ යි බෙණේ නම් ඇවැත් නැත. උම්මත්තක හට, ආදිකම්මිකහට ඇවැත් නැති.

**පළමුවැනි සහධම්මික ශික්ෂාපද යි.**

## 6. 8. 2

## විලෙඛනසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන භගවා භික්ඛූනං අනෙකපරියායෙන විනයකථං කථෙති විනයස්ස වණ්ණං භාසති. විනයපරියත්තියා වණ්ණං භාසති ආදිස්ස ආදිස්ස ආයස්මතො උපාලිස්ස වණ්ණං භාසති. භික්ඛූ "භගවා ඛො අනෙකපරියායෙන විනයකථං කථෙති විනයස්ස වණ්ණං භාසති විනයපරියත්තියා වණ්ණං භාසති ආදිස්ස ආදිස්ස ආයස්මතො උපාලිස්ස වණ්ණං භාසති හන්ද මයං ආවුසො ආයස්මතො උපාලිස්ස සන්තිකෙ විනයං පරියාපුණාමා"ති තෙධ බහූ භික්ඛූ ථෙරා ච නවා ච මජ්ඣිමා ච ආයස්මතො උපාලිස්ස සන්තිකෙ විනයං පරියාපුණන්ති.

2. අථ ඛො ඡබ්බග්ගියානං භික්ඛූනං එතදහොසි: "එතරහි ඛො ආවුසො බහූ භික්ඛූ ථෙරා ච නවා ච මජ්ඣිමා ච ආයස්මතො උපාලිස්ස සන්තිකෙ විනයං පරියාපුණන්ති සචෙ ඉමෙ විනයෙ පකතඤ්ඤුනො භවිස්සන්ති අම්හෙ යෙනිච්ඡකං යදිච්ඡකං යාවතිච්ඡකං[1] ආකඩ්ඪිස්සන්ති පරිකඩ්ඪිස්සන්ති, හන්ද මයං ආවුසො විනයං විවණ්ණෙමා"ති. අථ ඛො ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛූ උපසංකමිත්වා එවං වදෙන්ති: "කිං පනිමෙහි ඛුද්දානුඛුද්දකෙහි සික්ඛාපදෙහි උද්දිට්ඨෙහි යාවදෙව කුක්කුච්චාය විහෙසාය විලෙඛාය සංවත්තන්තී"ති.

3. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ **උජ්ඣායන්ති ඛීයන්ති** විපාචෙන්ති "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ විනයං විවණ්ණෙස්සන්තී"ති -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ, විනයං විවණ්ණෙථාති. සච්චං භගවා, විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා විනයං විවණ්ණෙස්සථ. නෙතං මොඝපුරිසා, අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ, ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ එවං වදෙය්‍ය කිං පනිමෙහි ඛුද්දානුඛුද්දකෙහි සික්ඛාපදෙහි උද්දිට්ඨෙහි යාවදෙව කුක්කුච්චාය විහෙසාය විලෙඛාය සංවත්තන්තීති සික්ඛාපදවිවණ්ණකෙ පාචිත්තිය"න්ති.**

1. ඉමස්ස වා - මජ්ඣං.

## 6. 8. 2

## විලෙඛන ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි භාග්‍යවත්හු නොයෙක් අයුරින් විනයකථා කෙරෙති, විනයෙහි ගුණ පවසති, විනය වනපොත් කිරීමෙහි අනුසස් පවසති, පුනපුනා ආයුෂ්මත් උපාලි තෙරුන්ගේ ගුණ පවසත්. භික්ෂූහු "භාග්‍යවතුන් වහන්සේ නන් අයුරින් විනයකථාව කරන සේක, විනයෙහි ගුණ පවසන සේක, විනය වනපොත් කිරීමෙහි අනුසස් දෙසන සේක, පුනපුනා ආයුෂ්මත් උපාලි තෙරුන්ගේ ගුණ පවසන සේක, එබැවින් ඇවැත්නි, ඇපි ආයුෂ්මත් උපාලි තෙරුන්ගේ සමීපයෙහි විනය පිරිවහම්හ' යි කීහු. ස්ථවිර නවක මධ්‍යම ඒ බොහෝ භික්ෂූහු ආයුෂ්මත් උපාලි තෙරුන් සමීපයෙහි විනය පිරිවහති.

2. එකල්හි සවග මහණුන්හට මෙල සිත විය: මෙකල්හි ඇවැත්නි, ස්ථවිර නවක මධ්‍යම බොහෝ භික්ෂූහු ආයුෂ්මත් උපාලි තෙරුන් සමීපයෙහි විනය පිරිවහති. ඉදින් මොහු විනයෙහි දැනුමැතියෝ වන්නාහු නම් අප රිසිතෙනකට රිසිසේ රිසිතාක් අදනාහ, ඔබ මොබ අදනාහ. එබැවින් ඇවැත්නි, ඇපි විනය ගරහම්හ යි. එකල්හි සවග මහණුහු මහණුන් වෙතැ එළැඹැ මෙසේ කියත්: "මේ කුඩා ඉතා කුඩා සිකපද උදෙසීමෙන් කවර වැඩෙක් ද? හුදෙක් කුකුස් පිණිස වෙහෙස පිණිස සැක පිණිස වැටෙති යි.

3. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් සවග මහණුහු විනය ගරහත් ද යි...සැබෑ ද මහණෙනි, තෙපි විනය ගරහවු ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ" ... කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි විනය ගරහවු ද? හිස් පුරුෂයෙනි, තෙල අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...මෙසේද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**"පාමොක් උදෙසනු ලබන කල්හි යම් මහණෙක් "මේ කුඩා අනුකුඩා සිකපද උදෙසීමෙන් කවර වැඩෙක් ද හුදෙක් කුකුස් පිණිස වෙහෙස පිණිස සැක පිණිස වැටෙති" යි මෙසේ කියන්නේ නම් සිකපද ගැරහීමෙහි පචිති වේ" යි.**

4\. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**පාතිමොක්ඛෙ උද්දිස්සමානෙති:** උද්දිසන්තෙ වා උද්දිසාපෙන්තෙ වා සජ්ඣායං වා කරොන්තෙ.

**එවං වදෙය්‍යාති:** කිං පනිමෙහි ඛුද්දානුඛුද්දකෙහි සික්ඛාපදෙහි උද්දිට්ඨෙහි යාවදෙව කුක්කුච්චාය විහෙසාය විලෙඛාය සංවත්තන්ති යෙ ඉමං පරියාපුණන්ති තෙසං කුක්කුච්චං හොති විහෙසා හොති විලෙඛා හොති. "යෙ ඉමං න පරියාපුණන්ති තෙසං කුක්කුච්චං න හොති විහෙසා න හොති විලෙඛා න හොති, අනුද්දිට්ඨං ඉදං වරං අනුග්ගහිතං ඉදං වරං අපරියාපුණිතං[1] ඉදං වරං, අධාරිතං ඉදං වරං විනයො වා අන්තරධායතු, ඉමෙ වා භික්ඛූ අපකතඤ්ඤුනො හොන්තූ"ති උපසම්පන්නස්ස විනයං විවණ්ණෙති ආපත්ති පාචිත්තියස්ස.

5\. උපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී විනයං විවණ්ණෙති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ වෙමතිකො විනයං විවණ්ණෙති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී විනයං විවණ්ණෙති ආපත්ති පාචිත්තියස්ස.

6\. අඤ්ඤං ධම්මං විවණ්ණෙති ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නස්ස විනයං වා අඤ්ඤං වා ධම්මං විවණ්ණෙති ආපත්ති දුක්කටස්ස.

7\. අනුපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස.

8\. **අනාපත්ති:** න විවණ්ණෙතුකාමො ඉඞ්ඝ තාව[2] සුත්තන්තෙ වා ගාථායො වා අභිධම්මං වා පරියාපුණස්සු පච්ඡාපි විනයං පරියාපුණිස්සසීති භණති උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**විලෙඛනසික්ඛාපදං දුතියං.**

---

1. අපරියාපුටං - මජසං.
2. තාවං - මජසං.

4. **යො පන** යනු යම්; යම්බඳු ... **භිකඛු** යනු ... මෙතෙමේ මේ අර්ථ යෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**පාතිමොකෙඛ උද්දිස්සමානෙ** යනු උදෙසන කල්හි හෝ උදෙසවන කල්හි හෝ හැදෑරීම කරන කල්හි හෝ,

**එවං වදෙය්‍ය** යනු උදෙසන ලද මේ කුඩා අනුකුඩා සිකපදවලින් කවර වැඩෙක් ද? හුදෙක් කුකුස් පිණිස වෙහෙස පිණිස සැක පිණිස වැටෙති. යම් කෙනෙක් මෙය පිරිවහත් නම් ඔවුනට කුකුස් වෙයි. වෙහෙස වෙයි. සැක වෙයි. යම් කෙනෙක් මෙය නො පිරිවහත් නම් ඔවුනට කුකුස් නො වෙයි. වෙහෙස නො වෙයි. සැක නො වෙයි. මෙය නො උදෙසන ලද නම් මැනැවැ. මෙය නො ඉගෙන ගනු ලද නම් මැනැවැ, මෙය නො පිරිවහන ලද නම් මැනැවැ, මෙය නො දරන ලද නම් මැනැවි. විනය හෝ අතුරුධන් වේවා. මේ භික්ෂුහු හෝ නො දැනුමැතියෝ වෙත්ව යි උපසපනක්හට විනය ගරහා නම් පචිති ඇවැත් වේ.

උපසපනක්හු කෙරෙහි උපසපන්සඥ ඇතියේ විනය ගරහා නම් පචිති ඇවැත් වෙයි. උපසපනක්හු කෙරෙහි විමති ඇතියේ විනය ගරහා නම් පචිති ඇවැත් වෙයි. උපසපනක්හු කෙරෙහි අනුපසපන්සඥ ඇතියේ විනය ගරහා නම් පචිති ඇවැත් වේ.

අන් දහමක් ගරහා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හට විනය හෝ අන් දහමක් හෝ ගරහා නම් දුකුළා ඇවැත් වේ.

අනුපසපනක්හු කෙරෙහි උපසපන්සඥ ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි අනුපසපන්සඥ ඇතියේ නම් දුකුළා ඇවැත් වේ.

නො ගරහනු කැමැත්තේ දැන් පළමු කොට සූත්‍රාන්තයන් හෝ ගාථා හෝ අභිධර්මය හෝ හදරව පසු වැ විනය ද හදරවයි **බණේ** නම් ඇවැත් නො වේ. උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

**දෙවැනි විලෙඛන ශික්ෂාපද යි.**

## 6. 8. 3

## මොහනසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ අනාචාරං ආචරිත්වා අඤ්ඤාණකෙන ආපන්නාති ජානන්තූති පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ එවං වදෙන්ති. "ඉදානෙව ඛො මයං ජානාම අයම්පි කිර ධම්මො සුත්තාගතො සුත්තපරියාපන්නො අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡතී''ති.

2. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ එවං වක්ඛන්ති: 'ඉදානෙව ඛො මයං ජානාම අයම්පි කිර ධම්මො සුත්තාගතො සුත්තපරියාපන්නො අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡතී''ති. -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ එවං වදෙථ. ඉදානෙව ඛො මයං ජානාම අයම්පි කිර ධම්මො සුත්තාගතො සුත්තපරියාපන්නො අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡතී''ති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ එවං වක්ඛථ. "ඉදානෙව ඛො මයං ජානාම අයම්පි කිර ධම්මො සුත්තාගතො සුත්තපරියාපන්නො අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡතී''ති. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු අන්වද්ධමාසං පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ එවං වදෙය්‍ය ඉදානෙව ඛො අහං ජානාමි අයම්පි කිර ධම්මො සුත්තාගතො සුත්තපරියාපන්නො අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡතීති. තඤ්චෙ භික්ඛුං අඤ්ඤෙ භික්ඛූ ජානෙය්‍යුං නිසින්නපුබ්බං ඉමිනා භික්ඛුනා ද්විත්තික්ඛත්තුං පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ කො පන වාදො භිය්‍යො න ච තස්ස භික්ඛුනො අඤ්ඤාණකෙන මුත්ති අත්ථි යඤ්ච තත්ථ ආපත්තිං ආපන්නො තඤ්ච යථාධම්මො කාරෙතබ්බො උත්තරිං චස්ස මොහො ආරොපෙතබ්බො තස්ස තෙ ආවුසො අලාභා තස්ස තෙ දුල්ලද්ධං යං ත්වං පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ න සාධුකං අට්ඨිකත්වා[1] මනසිකරොසීති. ඉදං තස්මිං මොහනකෙ පාචිත්තිය''න්ති.**

---

1. අට්ඨිංකත්වා - මජසං.

## 6. 8. 3

## මොහන ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර අනේපිඬු සිටුහුගේ ජේතවන අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි සවග මහණහු පනත් විකුම් කොට නො දැනීමෙන් අවන්හ යි දනිත්වා යි පාමොක් උදෙසනු ලබන කල්හි මෙසේ කියත්; "මේ ශික්ෂාපදධර්මය ද විනය ශික්ෂායෙහි ආයේ යැ විනය ශික්ෂායෙහි ඇතුළත් යැ අඩමසක් පාසා උදෙසීමට පැමිණේ යි මෙ දැන් මැ ඇපි දනුම්හ"යි.

2. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් සවග මහණහු පාමොක් උදෙසනු ලබන කල්හි මේ ශික්ෂාපදධර්මය ද විනය ශික්ෂායෙහි ආයේ යැ විනය ශික්ෂායෙහි ඇතුළත් යැ අඩමසක් පාසා උදෙසීමට පැමිණෙයැ යි මෙ දැන් මැ ඇපි දනුම්හ යි මෙසේ කීහු"ද?...සැබෑ ද මහණෙනි, තෙපි පාමොක් උදෙසනු ලබන කල්හි මේ ශික්ෂාපද ධර්මය ද විනය ශික්ෂායෙහි ආයේ යැ විනය ශික්ෂායෙහි ඇතුළත් යැ අඩමසක් පාසා උදෙසීමට පැමිණෙයැයි මෙ දැන් මැ ඇපි දනුම්හ යි මෙසේ කියවු ද? සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි පාමොක් උදෙසනු ලබන කල්හි මේ ශික්ෂාපද ධර්මය ද විනය ශික්ෂායෙහි ආයේ යැ විනය ශික්ෂායෙහි ඇතුළත් යැ අඩමසක් පාසා උදෙසීමට පැමිණෙයැ යි මෙ දැන් මැ ඇපි දනුම්හ යි මෙසේ කියන්නහු ද හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවූ;

**"යම් මහණෙක් අඩමසක් පාසා පාමොක් උදෙසනු ලබන කල්හි මෙසේ කියා නම්; "මෙ දහම ද විනයෙහි ආයේ විනයෙහි ඇතුළු වූයේ අඩමසක් පාසා උදෙසීමට ඒ ලැ යි මම දැන් මැ දනිමි"යි ඉදින් ඒ මහණ "මේ මහණහු දෙතුන් වරක් පාමොක් උදෙසනු ලබන කල්හි හුන්විරූ"යයි අන් මහණහු දන්නාහු නම් ඒ මහණහට නො දැන්මෙන් මිදීමෙක් නැති, බොහෝ වුව කවර කථා යැ? එහි ලා යම් මැ ඇවැතකට අවනේ නම් ඒ ඇවතින් ධර්ම වූ පරිද්දෙන් කැරැවිය යුතු යැ. මත්තෙහි දු ඔහුට ඇවැත, යම් හෙයෙකින් තෙපි පාමොක් උදෙසනු ලබන කල්හි මොනවට වැඩ ඇති කොට මෙනෙහි නො කරවු ද (එහෙයින්) ඒ තොපට අලාභයහ. ඒ තොපට දුක් පිණිස ලද්දෙකැයි මෙසේ මොහය ආරොපණය කළ යුතු යැ, මොහනය කරන ඔහු කෙරෙහි මේ පචිති වේ" යයි.**

3. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**අන්වද්ධමාසන්ති:** අනුපොසථිකං.

**පාතිමොක්ඛෙ උද්දිස්සමානෙති:** උද්දිසන්තෙ.

**එවං වදෙය්‍යාති:** අනාචාරං ආචරිත්වා අඤ්ඤාණකෙන ආපන්නොති ජානන්තූති. පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ එවං වදෙති "ඉදානෙව ඛො අහං ජානාමි අයම්පි කිර ධම්මො සුත්තාගතො සුත්තපරියාපන්නො අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡතී"ති ආපත්ති දුක්කටස්ස.

4. **තඤ්චෙති:** මොහෙතුකාමං භික්ඛුං අඤ්ඤෙ භික්ඛූ ජානෙය්‍යුං නිසින්නපුබ්බං ඉමිනා භික්ඛුනා ද්විත්තික්ඛත්තුං පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ කො පන වාදො භිය්‍යො. න ච තස්ස භික්ඛුනො අඤ්ඤාණකෙන මුත්ති අත්ථි. යඤ්ච තත්ථ ආපත්තිං ආපන්නො තඤ්ච යථාධම්මො කාරෙතබ්බො. උත්තරිං චස්ස මොහො ආරොපෙතබ්බො. එවඤ්ච පන භික්ඛවෙ ආරොපෙතබ්බො. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො:

**සුණාතු** මෙ භන්තෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමො භික්ඛු පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ න සාධුකං අට්ඨිකත්වා මනසි කරොති යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො මොහං ආරොපෙය්‍ය- එසා ඤත්ති.

**සුණාතු** මෙ භන්තෙ සඞ්ඝො අයං ඉත්ථන්නාමො භික්ඛු පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ න සාධුකං අට්ඨිකත්වා මනසිකරොති සඞ්ඝො ඉත්ථන්නාමස්ස භික්ඛුනො මොහං ආරොපෙති, යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස භික්ඛුනො මොහස්ස ආරොපනා සො තුණ්හස්ස යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

ආරොපිතො සඞ්ඝෙන ඉත්ථන්නාමස්ස භික්ඛුනො මොහො, ඛමති සඞ්ඝස්ස තස්මා තුණ්හී එවමෙතං ධාරයාමීති.

අනාරොපිතෙ මොහෙ මොහෙති ආපත්ති දුක්කටස්ස. ආරොපිතෙ මොහෙ මොහෙති ආපත්ති පාචිත්තියස්ස.

3\. යො පන යනු; යම්, යම්බඳු...භිකඛු යනු... මෙතෙමේ මේ අර්ථ-යෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**අන්වද්ධමාසං** යනු: පොහොකිරීමක් (පාමොක් උදෙසීමක්) පාසා

**පාතිමොක්ඛෙ උද්දිස්සමනෙ** යනු: උදෙසන කල්හි;

**එවං වදෙය්‍ය** යනු: පනත් විකුම් කොට නො දැනීමෙන් අවනැ යි දනිත්ව යි පාමොක් උදෙසන කල්හි ''මේ ධර්මය ද විනයෙහි ආයේ යැ විනයෙහි ඇතුළත් යැ අඩමසක් පාසා උදෙසීමට පැමිණෙයැයි මෙ දැන් මැ මම දනිමි''යි මෙසේ කියා නම් දුකුළා ඇවැත් වේ.

**තඤ්චෙ** යනු: මුළා කරනු කැමැති මහණහු – දෙතුන් වරක් පාමොක් උදෙසනු ලබන කල්හි මේ මහණ හුන් විරූ යයි'' අන් මහණහු දන්නාහු නම් ඒ මහණහට නො දැනීමෙන් මිදීමෙක් නැත, බොහෝ වරෙකැ වුව කවර කථා යැ. එහි ලා යම් ඇවතකට අවනෝ නම් එද ධර්ම වූ පරිද්දෙන් කැරැවිය යුතු, මත්තෙහි දු ඔහට මොහය ආරොපණය කළ යුත්තේ යි. මහණෙනි මෙසේ ආරොපණය කළ යුතු යැ, ව්‍යක්ත වූ ප්‍රතිබල වූ මහණහු විසින් සඞ්ඝ තෙමේ දැන්විය යුත්තේ යි.

වහන්ස, සඞ්ඝ තෙමේ මවදන් අසාවා, මේ මෙනම් ඇති මහණ පාමොක් උදෙසනු ලබන කල්හි මොනවට අර්ථවත් කොට මෙනෙහි නො කෙරෙයි. ඉදින් සඞ්ඝයාහට පැමිණි කල් ඇත්තේ නම් සඞ්ඝ තෙමේ මෙනම් මහණහට මොහය ආරොපණය කරන්නේ යැ තෙල ඥප්ති යි.

වහන්ස, සඞ්ඝ තෙමේ මවදන් අසාවා මේ මෙනම් මහණ පාමොක් උදෙසනු ලබන කල්හි මොනොවට අර්ථවත් කොට මෙනෙහි නො-කෙරෙයි. සඞ්ඝ තෙමේ මෙනම් මහණහට මොහය ආරොපණය කරයි. යම් ආයුෂ්මත්නමක්හට මෙනම් මහණහට මොහය ආරොපණය කිරීම රුස්නේ නම් හේ නිහඬ වන්නේ යැ, යමක්හට නො රුස්නේ නම් හේ කියන්නේ යැ.

සඞ්ඝයා විසින් මෙනම් ඇති මහණහට මොහය ආරොපණය කරන ලද්දේ යැ සංඝයාහට රුස්නේ යැ එහෙයින් නිහඬ යැ, තෙල මෙසේ දරමි යි.

මොහය ආරොපණය නො කළ කල්හි මුළා කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. මොහය ආරොපණය කළ කල්හි මුළා කෙරේ නම් පචිති ඇවැත් වේ.

ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී මොහෙති ආපත්ති පාචිත්තියස්ස. අධම්මකම්මෙ වෙමතිකො මොහෙති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී මොහෙති ආපත්ති පාචිත්තියස්ස.

අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී මොහෙති ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකො මොහෙති ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** න විත්ථාරෙන සුතං හොති, ඌනකද්වත්තික්ඛත්තුං විත්ථාරෙන සුතං හොති, න මොහෙතුකාමස්ස උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

මොහනසික්ඛාපදං තතියං

## 6. 8. 4

## පහාරසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන **ඡබ්බග්ගියා** භික්ඛූ කුපිතා අනත්තමනා සත්තරසවග්ගියානං භික්ඛූනං පහාරං දෙන්ති. තෙ රොදන්ති. භික්ඛූ එවමාහංසු: ''කිස්ස තුම්හෙ ආවුසො රොදථා''ති. ඉමෙ ආවුසො ඡබ්බග්ගියා භික්ඛූ කුපිතා අනත්තමනා අම්හාකං පහාරං දෙන්තීති.

2. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. ''කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ කුපිතා අනත්තමනා භික්ඛූනං පහාරං දස්සන්තීති -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ කුපිතා අනත්තමනා භික්ඛූනං පහාරං දෙථාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා-පෙ-''කථං හි නාම තුම්හෙ මොඝපුරිසා කුපිතා අනත්තමනා භික්ඛූනං පහාරං දස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**''යො පන භික්ඛු භික්ඛුස්ස කුපිතො අනත්තමනො පහාරං දදෙය්‍ය පාචිත්තිය''න්ති.**

දූහැම්කම්හි දූහැම්කම්සඥ් ඇති යේ මුළා කෙරේ නම් පචිති ඇවැත් වෙයි. දූහැම්කම්හි විමති ඇතියේ මුළා කෙරේ නම් පචිති ඇවැත් වෙයි. දූහැම්කම්හි නොදූහැම්කම් සඥ් ඇතියේ මුළා කෙරේ නම් පචිති ඇවැත් වේ.

නො දූහැම්කම්හි දූහැම්කම්සඥ් ඇතියේ මුළා කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. නො දූහැම්කම්හි විමති ඇතියේ මුළා කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. නො දූහැම්කම්හි නො දූහැම්කම්සඥ් ඇතියේ මුළා කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

විස්තර විසින් (පාමොක්) නො අසන ලද නම්, උතු දෙතුන් යළක් විස්තර විසින් අසන ලද නම් (ඇවැක් නො වේ) මුළා නො කරනු කැමැත්තහුට උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

තෙවැනි මොහන ශික්ෂාපද යි.

## 6. 8. 4

## පහාර ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩවෙසෙති. එසමයෙහි සවග මහණහු කිපියෝ නොසියමන් ඇත්තෝ සතළොස්වගැ මහණුන්හට පහර දෙති. ඔහු හඬත්, භික්ෂූහු මෙසේ කීහු: ''ඇවැත්නි, තෙපි කුමකට හඬවු''ද යි ඇවැත්නි, මේ සවග මහණෝ කිපී නොසියමන් වැ අපහට පහර දෙති යි.

2. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස්වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් සවග මහණහු කිපියෝ නොසියමන් වූවෝ මහණුන්හට පහර දුන්නු''ද යි.. සැබෑ ද මහණෙනි, තෙපි කිපියාහු නොසියමන් වූවාහු මහණුන්හට පහර දෙවු දෑ යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ...කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි කිපියෝ නොසියමන් වූවෝ මහණුන්හට පහර දුන්නහු ද, හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

> ''යම් මහණෙක් මහණක්හට කිපියේ නොසියමන් වූයේ පහර දෙන්නේ නම් පචිති වේ'' යයි.

3. **යො පනාති:** යො යාදිසො -පෙ- භික්ඛූති -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**භික්ඛුස්සාති:** අඤ්ඤස්ස භික්ඛුස්ස.

**කුපිතො අනත්තමනොති:** අනභිරද්ධො ආහතචිත්තො ඛිලජාතො.

**පහාරං දදෙය්‍යාති:** කායෙන වා කායපටිබද්ධෙන වා නිස්සග්ගියෙන වා අන්තමසො උප්පලපත්තෙනපි පහාරං දෙති ආපත්ති පාචිත්තියස්ස.

උපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී කුපිතො අනත්තමනො පහාරං දෙති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ වෙමතිකො කුපිතො අනත්තමනො පහාරං දෙති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී කුපිතො අනත්තමනො පහාරං දෙති ආපත්ති පාචිත්තියස්ස.

අනුපසම්පන්නස්ස කුපිතො අනත්තමනො පහාරං දෙති ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** කෙනචි විහෙඨියමානො මොක්ඛාධිප්පායො පහාරං දෙති, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

පහාරසික්ඛාපදං චතුත්ථං

## 6. 8. 5

## තලසත්තිකසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ කුපිතා අනත්තමනා සත්තරසවග්ගියානං භික්ඛූනං තලසත්තිකං උග්ගිරන්ති. තෙ පහාරසමුච්චිතා[1] රොදන්ති. භික්ඛූ එවමාහංසු: "කිස්ස තුම්හෙ ආවුසො රොදථා"ති. ඉමෙ ආවුසො ඡබ්බග්ගියා භික්ඛූ කුපිතා අනත්තමනා අම්හාකං තලසත්තිකං උග්ගිරන්තීති.

1. පහාරසමුච්චිතා - මජසං.

3. යො පන යනු යම්, යම්බඳු... භික්ඛු යනු... මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**භික්ඛුස්ස** යනු අන් මහණක්හට,

**කුපිතො අනත්තමනො** යනු නොසතුටු වූයේ ප්‍රතිඝයෙන් ගැටුණු සිත් ඇතියේ හටගත් පිළිසුහුල් ඇතියේ,

**පහාරං දදෙය්‍ය** යනු කයින් හෝ කය පිළිබද්දෙන් හෝ නිසැගි යෙන් හෝ යටත් පිරිසෙයින් උපුල් පතිනුදු පහර දේ නම් පචිති ඇවැත් වේ.

උපසපනක්හු කෙරෙහි උපසපන්සත් ඇතියේ කිපියේ නො සියමන් වූයේ පහර දේ නම් පචිති ඇවැත් වෙයි. උපසපනක්හු කෙරෙහි විමති ඇතියේ කිපියේ නොසියමන් වූයේ පහරදේ නම් පචිති ඇවැත් වෙයි. උපසපනක්හු කෙරෙහි අනුපසපන්සත් ඇතියේ කිපියේ නොසියමන් වූයේ පහර දේ නම් පචිති ඇවැත් වේ.

5. අනුපසපනක්හට කිපියේ නොසියමන් වූයේ පහර දේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි උපසපන්සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි අනුපසපන්සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වේ.

6. කිසිවකු විසිනුදු වෙහෙසනු ලබන්නේ මිදෙනු කැමැති වැ පහර දේ නම් ඇවැත් නැත උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

**සිවුවැනි පහාරශික්ෂාපද යි.**

## 6. 8. 5

## තලසත්තික ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජෙතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩවෙසෙත්. එසමයෙහි ඡබ්බග්ගිය මහණහු කිපියෝ නොසියමන්වූවෝ සතළොස්වග මහණුන්හට තලසැත් නඟා දක්වති. ඔහු පුරුදු පහර එතියි භගනාහු හඬති. භික්ෂූහු මෙසේ කීහු: ''ඇවැත්නි, තෙපි කුමකට හඬවු''දැ යි ඇවැත්නි, මේ ඡබ්බග්ගිය මහණෝ කිපියෝ නොසියමන්වූවෝ අපහට තලසැත් නඟා දක්වන්නාහ යි.

2. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ කුපිතා අනත්තමනා භික්ඛූනං[1] තලසත්තිකං උග්ගිරිස්සන්ති"ති -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ කුපිතා අනත්තමනා භික්ඛූනං තලසත්තිකං උග්ගිරථා'ති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා කුපිතා අනත්තමනා භික්ඛූනං තලසත්තිකං උග්ගිරිස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු භික්ඛුස්ස කුපිතො අනත්තමනො තලසත්තිකං උග්ගිරෙය්‍ය පාචිත්තිය"න්ති.**

3. **යොපනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**භික්ඛුස්සාති:** අඤ්ඤස්ස භික්ඛුස්ස.

**කුපිතො අනත්තමනොති:** අනභිරද්ධො ආහතචිත්තො ඛිලජාතො.

**තලසත්තිකං උග්ගිරෙය්‍යාති:** කායං වා කායපටිබද්ධං වා අන්තමසො උප්පලපත්තම්පි උච්චාරෙති ආපත්ති පාචිත්තියස්ස.

උපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී කුපිතො අනත්තමනො තලසත්තිකං උග්ගිරති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ වෙමතිකො කුපිතො අනත්තමනො තලසත්තිකං උග්ගිරති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී කුපිතො අනත්තමනො තලසත්තිකං උග්ගිරති ආපත්ති පාචිත්තියස්ස.

අනුපසම්පන්නස්ස කුපිතො අනත්තමනො තලසත්තිකං උග්ගිරති ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** කෙනචි විහෙඨියමානො මොක්ඛාධිප්පායො තලසත්තිකං උග්ගිරති, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**තලසත්තිකසික්ඛාපදං පඤ්චමං.**

1. සත්තරසවග්ගියානං භික්ඛූනං - මජසං.

2. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස්වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් සවග මහණුහු කිපියෝ නො සියමන් වූවෝ මහණුන්හට තලසැත් නහා දක්වූහු"දැයි...සැබෑ ද මහණෙනි, තෙපි කිපියාහු නො සියමන් වූවාහු මහණුන්හට තලසැත් නහා දක්වවු ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ... කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි කිපියාහු නොසියමන්වූවාහු මහණුන්හට තලසැත් නහා දක්වූවහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි....මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**"යම් මහණෙක් කිපියේ නො සියමන් වූයේ මහණක්හට තලසැත් නහන්නේ නම් පචිති වේ" යයි.**

3. යො පන: යම්, යම්බඳු...භික්ඛු...මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**භික්ඛුස්ස:** අන් මහණක්හට,

**කුපිතො අනත්තමනො:** නො සතුටු වූයේ ප්‍රතිඝයෙන් හැපුණු සිත් ඇතියේ හටගත් පිළසුහුල් ඇතියේ,

**තලසත්තිකං උග්ගිරෙය්‍ය:** කය හෝ කය පිළිබද්දක් හෝ යටත් පිරිසෙයින් උපුල්පතකුදු නහා දක්වා නම් පචිති ඇවැත් වේ.

උපසපනක්හු කෙරෙහි උපසපන්සත් ඇතියේ කිපියේ නො සියමන් වූයේ තලසැත් නහා දක්වා නම් පචිති ඇවැත් වේ උපසපනක්හු කෙරෙහි විමති ඇතියේ කිපියේ නොසියමන් වූයේ තලසැත් නහා දක්වා නම් පචිති ඇවැත් වෙයි. උපසපනක්හු කෙරෙහි අනුපසපන්සත් ඇතියේ කිපියේ නොසියමන් වූයේ තලසැත් නහා දක්වා නම් පචිති ඇවැත් වේ.

අනුපසපනක්හට කිපියේ නොසියමන්වූයේ තලසැත් නහා දක්වා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි උපසපන්සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි අනුපසපනක්හු කෙරෙහි අනුපසපන්සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වේ.

කිසිවකු විසිනුදු වෙහෙසනු ලබන්නේ මිදෙනු කැමැති වැ තල සැත් නහා දක්වා නම් ඇවැත් නැත, උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

**පස්වැනි තලසත්තික ශික්ෂාපද යි.**

## 6. 8. 6

## අමූලකසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුං අමූලකෙන සඞ්ඝාදිසෙසෙන අනුද්ධංසෙන්ති.

2. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. ''කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුං අමූලකෙන සඞ්ඝාදිසෙසෙන අනුද්ධංසෙස්සන්ති''ති. -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ භික්ඛුං අමූලකෙන සඞ්ඝාදිසෙසෙන අනුද්ධංසෙථා''ති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- ''කථං හි නාම තුම්හෙ මොඝපුරිසා භික්ඛුං අමූලකෙන සඞ්ඝාදිසෙසෙන අනුද්ධංසෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

> ''යො පන භික්ඛු භික්ඛුං අමූලකෙන සඞ්ඝාදිසෙසෙන අනුද්ධංසෙය්‍ය පාචිත්තිය''න්ති.

3. යො පනාති: යො යාදිසො -පෙ- භික්ඛූති -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**භික්ඛුන්ති:** අඤ්ඤං භික්ඛුං.

**අමූලකං** නාම: අදිට්ඨං අසුතං අපරිසඞ්කිතං.

**සඞ්ඝාදිසෙසෙනාති:** තෙරසන්නං අඤ්ඤතරෙන.

**අනුද්ධංසෙය්‍යාති:** චොදෙති වා චොදාපෙති වා ආපත්ති පාචිත්තියස්ස.

උපසම්පන්නො උපසම්පන්නස්ස සඤ්ඤී අමූලකෙන සඞ්ඝාදිසෙසෙන අනුද්ධංසෙති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ වෙමතිකො අමූලකෙන සඞ්ඝාදිසෙසෙන අනුද්ධංසෙති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී අමූලකෙන සඞ්ඝාදිසෙසෙන අනුද්ධංසෙති ආපත්ති පාචිත්තියස්ස.

## 6.8.6

## අමූලක ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් අනේපිඩු සිටුහුගේ අරමෙහි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි සවග මහණහු මහණක්හට අමූලක සඞ්ඝාදිශෙෂයෙකින් චොදනා කරති.

2. යම් ඒ භික්ෂූ කෙනෙක් අපිස්වූවාහු...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්; "කෙසේ නම් සවග මහණහු මහණක් හට අමූලක සඞ්ඝාදිශෙෂයෙකින් චොදනා කොළෝ"ද යි...සැබෑ ද මහණෙනි, තෙපි මහණක්හට අමූලක සඞ්ඝාදිශෙෂයෙකින් චොදනා කරවු ද යි, සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ... කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි මහණක්හට අමූලක සඞ්ඝාදිශෙෂයෙකින් චොදනා කළහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

> **"යම් මහණෙක් මහණක්හට අමුල් සඟවෙසෙසකින් චොදනා කරන්නේ නම් පචිති වේ" යයි.**

3. **යො පන:** යම්, යම්බඳු...භිකබු...මෙතෙමේ මේ අර්ථයෙහිලා අදහස් කරන ලද භික්ෂු යි.

**භික්ඛුං:** අන් මහණක්හු,

**අමූලක නම්:** නො දක්නා ලද්ද යැ නො අසන ලද්ද යැ සැක නො කරන ලද්ද යි.

**සඞ්ඝාදිසෙසෙන:** තෙළෙස් සඟවෙසෙසුන් අතුරෙන් එක්තරයෙකින්,

**අනුද්ධංසෙය්‍ය:** චොදනා කෙරේ නම් හෝ චොදනා කරවා නම් හෝ පචිති ඇවැත් වේ.

උපසපනක්හු කෙරෙහි උපසපන්සන් ඇතියේ අමුල් සඟවෙසෙසෙකින් චොදනා කෙරේ නම් පචිති ඇවැත් වෙයි. උපසපනක්හු කෙරෙහි විමති ඇතියේ අමුල් සඟවෙසෙසෙකින් චොදනා කරයි නම් පචිති ඇවැත් වෙයි. උපසපනක්හු කෙරෙහි අනුපසපන්සන් ඇතියේ අමුල් සඟවෙසෙසකින් චොදනා කෙරේ නම් පචිති ඇවැත් වේ.

ආචාරවිපත්තියා වා දිට්ඨිවිපත්තියා වා අනුද්ධංසෙති ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නං අනුද්ධංසෙති ආපත්ති දුක්කටස්ස.

අනුපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** තථාසඤ්ඤී චොදෙති වා චොදාපෙති වා, උම්මත්තකස්ස වා ආදිකම්මිකස්සාති.

**අමූලකසික්ඛාපදං ඡට්ඨමං.**

## 6. 8. 7

## සඤ්චිච්චසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන **ඡබ්බග්ගියා** භික්ඛූ සත්තරසවග්ගියානං භික්ඛූනං සඤ්චිච්ච කුක්කුච්චං උපදහන්ති: "භගවතා ආවුසො සික්ඛාපදං පඤ්ඤත්තං 'න ඌනවීසතිවස්සො පුග්ගලො උපසම්පාදෙතබ්බො'ති තුම්හෙ ච ඌනවීසතිවස්සා උපසම්පන්නා කච්චි නො තුම්හෙ අනුපසම්පන්නා"ති. තෙ රොදන්ති, භික්ඛූ එවමාහංසු "කිස්ස තුම්හෙ ආවුසො රොදථා"ති. ඉමෙ ආවුසො ඡබ්බග්ගියා භික්ඛූ අම්හාකං සඤ්චිච්ච කුක්කුච්චං උපදහන්තීති.

2. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛූනං සඤ්චිච්ච කුක්කුච්චං උපදහිස්සන්ති"ති -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ භික්ඛූනං සඤ්චිච්ච කුක්කුච්චං උපදහථාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා භික්ඛූනං සඤ්චිච්ච කුක්කුච්චං උපදහිස්සථ, නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු භික්ඛුස්ස සඤ්චිච්ච කුක්කුච්චං උපදහෙය්‍ය ඉතිස්ස මුහුත්තම්පි අඵාසු භවිස්සතීති එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං පාචිත්තිය"න්ති.**

ආචාරවිපත්තියෙකින් හෝ දෘෂ්ටිවිපත්තියෙකින් හෝ චොදනා කෙරේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හට චොදනා කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

අනුපසපනක්හු කෙරෙහි උපසපන්සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි අනුපසපන්සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වේ.

එසේ සභවෙසෙස් සන් ඇතියේ චොදනා කෙරේ නම් හෝ චොදනා කරවා නම් හෝ ඇවැත් නැත, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

සවැනි අමූලකශික්ෂාපද යි.

## 6. 8. 7

## සඤ්චිච්ච ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩැ වෙසෙති. එසමයෙහි වනාහි ඝවග මහණහු සතළොස් වග මහණුන්හට දනැ දනැ කුකුස් උපදවති. ''ඇවැත්නි, භාග්‍යවතුන් විසින් උනුවිසිවස් ඇති පුහුල් තෙමෙ උපසපන් නො කැරැවිය යුතු යැ යි සිකපදයෙක් පනවන ලදි. තෙපි දු උනුවිසිවස් ඇතියව්හු උපසපන් වූවහු යැ. කිම, තෙපි අනුපසපන්හු''ද යි. ඔහු හඬත්. භික්ෂූහු මෙසේ කීහු: ''කුමකට ඇවැත්නි, තෙපි හඬවු''ද යි. ඇවැත්නි, මෙ ඝවග මහණහු අපට දනදනැ කුකුස් උපදවතැ යි.

2. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවාහු...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්; ''කෙසේ නම් ඝවග මහණහු මහණුන්හට දනැ දනැ කුකුස් ඉපැදවූහු''ද යි...සැබැ ද මහණෙනි, තෙපි මහණුන්හට දනැ දනැ කුකුස් උපදවවු ද යි, සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ... කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි මහණුන්හට දනැ දනැ කුකුස් ඉපැදවූවහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**''යම් මහණෙක් මහණක්හට 'මෙයින් මොහුට ඇසිල්ලකුදු නො පහසුවෙක් වන්නේ'යැ යි දැන දැනැ අනෙකක් නො වැ මෙය මැ කරුණු කොට කුකුස් උපදවන්නේ නම් පචිති වේ'' යයි.**

3. යො පනාති: යො යාදිසො -පෙ- භික්ඛූති -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

භික්ඛුස්සාති: අඤ්ඤස්ස භික්ඛුස්ස.

සඤ්චිච්චාති: ජානන්තො සඤ්ජානන්තො චෙච්ච අභිවිතරිත්වා වීතික්කමො.

කුක්කුච්චං උපදහෙය්‍යාති: ඌනවීසතිවස්සො මඤ්ඤෙ ත්වං උපසම්පන්නො. විකාලෙ මඤ්ඤෙ තයා භුත්තං මජ්ජං මඤ්ඤෙ තයා පීතං මාතුගාමෙන සද්ධිං රහො මඤ්ඤෙ තයා නිසින්නන්ති කුක්කුච්චං උපදහති ආපත්ති පාචිත්තියස්ස.

එතදෙවපච්චයං කරිත්වා අනඤ්ඤන්ති: න අඤ්ඤො කොචි පච්චයො හොති කුක්කුච්චං උපදහිතුං.

උපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී සඤ්චිච්ච කුක්කුච්චං උපදහති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ වෙමතිකො සඤ්චිච්ච කුක්කුච්චං උපදහති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී සඤ්චිච්ච කුක්කුච්චං උපදහති ආපත්ති පාචිත්තියස්ස.

අනුපසම්පන්නස්ස සඤ්චිච්ච කුක්කුච්චං උපදහති ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස.

අනාපත්ති: න කුක්කුච්චං උපදහිතුකාමො ඌනවීසතිවස්සො මඤ්ඤෙ ත්වං උපසම්පන්නො විකාලෙ මඤ්ඤෙ තයා භුත්තං මජ්ජං මඤ්ඤෙ තයා පීතං මාතුගාමෙන සද්ධිං රහො මඤ්ඤෙ තයා නිසින්නං ඉඞ්ඝ ජානාහි මා තෙ පච්ඡා කුක්කුච්චං අහොසීති භණති උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

සඤ්චිච්චසික්ඛාපදං සත්තමං.

3. යො පන: යම්, යම්බඳු ..භික්ඛු...මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

භික්ඛුස්ස: අන් මහණක්හට,

සඤ්චිච්ච; දන්නේ මැනැවින් දන්නේ සිතා මෙහෙයා විකුම් කිරීම යි.

කුක්කුච්චං උපදහෙය්‍යා: තෙපි උනුවිසිවස් ඇති වැ උපසපන් වූහු යි හඟිමි. තොප විකල්හි වළඳන ලදැ යි හඟිමි. තොප මත්පැන් බොන ලදැ යි හඟිමි. තොප නොරඹුරෙහි මාගමක හා හිනැ යි හඟිමැ යි කුකුස් උපදවා නම් පචිති ඇවැත් වේ.

එතදෙව පච්චයං කරිත්‍වා අනඤ්ඤං: කුකුස් උපදවන්නට අන් කිසිදු කරුණෙක් නැති.

උපසපනක්හු කෙරෙහි උපසපන් සන් ඇතියේ දනැ දනැ කුකුස් උපදවා නම් පචිති ඇවැත් වෙයි. උපසපනක්හු කෙරෙහි විමති ඇතියේ දනැ දනැ කුකුස් උපදවා නම් පචිති ඇවැත් වෙයි. උපසපනක්හු කෙරෙහි අනුපසපන් සන් ඇතියේ දනැ දනැ කුකුස් උපදවා නම් පචිති ඇවැත් වේ.

අනුපසපනක්හට දනැ දනැ කුකුස් උපදවා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි උපසපන් සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි අනුපසපන් සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වේ.

කුකුස් නො උපදවනු කැමැත්තේ "තෙපි උනු විසි වස් ඇති වැ උපසපන් වූහු යි හඟිමි, තොප විකල්හි වළඳන ලදැ යි හඟිමි, තොප මත් පැන් බොන ලදැ යි හඟිමි, තොප නොරඹුරෙහි මාගමක සමග හිනැ යි හඟිමි, එබැවින් දනුව, තොපට පසුවැ කුකුසෙක් නහමක් වේව යි බෙණේ නම් ඇවැත් නැත, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

සත්වැනි සඤ්චිච්ච ශික්ෂාපද යි.

# 6. 8. 8

## උපස්සුතිසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන **ඡබ්බග්ගියා භික්ඛූ** පෙසලෙහි භික්ඛූහි සද්ධිං භණ්ඩන්ති.[1] පෙසලා භික්ඛූ එවං වදෙන්ති: අලජ්ජිනො ඉමෙ ආවුසො ඡබ්බග්ගියා භික්ඛූ න සක්කා ඉමෙහි සහ භණ්ඩිතුන්ති. ඡබ්බග්ගියා භික්ඛූ එවං වදෙන්ති. "කිස්ස තුම්හෙ ආවුසො අම්හෙ අලජ්ජිවාදෙන පාපෙථා"ති. කහං පන තුම්හෙ ආවුසො අස්සුත්ථාති. මයං ආයස්මන්තානං උපස්සුතිං තිට්ඨම්හාති.

2. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛූනං භණ්ඩනජාතානං කලහජාතානං විවාදාපන්නානං උපස්සුතිං තිට්ඨිස්සන්ති"ති -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ භික්ඛූනං භණ්ඩනජාතානං කලහජාතානං විවාදාපන්නානං උපස්සුතිං තිට්ඨථාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා භික්ඛූනං භණ්ඩනජාතානං කලහජාතානං විවාදාපන්නානං උපස්සුතිං තිට්ඨිස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු භික්ඛූනං භණ්ඩනජාතානං කලහජාතානං විවාදාපන්නානං උපස්සුතිං තිට්ඨෙය්‍ය යං ඉමෙ භණිස්සන්ති තං සොස්සාමීති එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං පාචිත්තිය"න්ති.**

3. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**භික්ඛූනන්ති:** අඤ්ඤෙසං භික්ඛූනං.

**භණ්ඩනජාතානං කලහජාතානං විවාදාපන්නානන්ති:** අධිකරණජාතානං.

**උපස්සුතිං තිට්ඨෙය්‍යාති:** ඉමෙසං සුත්වා චොදෙස්සාමි සාරෙස්සාමි පටිචොදෙස්සාමි පටිසාරෙස්සාමි මඞ්කුං කරිස්සාමීති ගච්ඡති ආපත්ති දුක්කටස්ස. යත්ථ ඨිතො සුණාති ආපත්ති පාචිත්තියස්ස. පච්ඡතො ගච්ඡන්තො තුරිතො ගච්ඡති සොස්සාමීති ආපත්ති දුක්කටස්ස. යත්ථ ඨිතො සුණාති ආපත්ති පාචිත්තියස්ස. පුරතො ගච්ඡන්තො ඔහීයති සොස්සාමීති ආපත්ති දුක්කටස්ස. යත්ථ ඨිතො සුණාති ආපත්ති පාචිත්තියස්ස. භික්ඛුස්ස ඨිතොකාසං වා නිසින්නොකාසං වා නිපන්නොකාසං වා ආගන්ත්වා මන්තෙන්තං උක්කාසිතබ්බං විජානාපෙතබ්බං නො චෙ උක්කාසෙය්‍ය වා විජානාපෙය්‍ය වා ආපත්ති පාචිත්තියස්ස.

1. භණ්ඩන්ති - මජසං.

## 6. 8. 8

## උපස්සුති ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි සවග මහණහු ප්‍රියශීලී භික්ෂූන් සමඟ ඩබර කෙරෙති. ප්‍රියශීලී භික්ෂූහු මෙසේ කියත්: ''ඇවැත්නි මේ සවග මහණහු අලජ්ජීහු යැ, මොවුන් සමඟ ඩබර කරන්නට නොහැකි''යැ යි සවග මහණහු මෙසේ කියත්: ''කුමකට ඇවැත්නි, තෙපි අප අලජ්ජීවාදයෙන් පමුණුවවු''ද යි ඇවැත්නි, තෙපි කොබ සිටැ ඇසුවහු ද යි. ඇපි ආයුෂ්මතුන්ගේ බස් ඇසෙන තන්හි සිටියමහ යි.

2. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවාහු...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්; ''කෙසේ නම් සවග මහණහු හටගත් ඩබර ඇති හටගත් කලහ ඇති විරුද්ධවාදයට බැස ගත් මහණුන්ගේ බස් ඇසෙන තන්හි සිටියෝ''ද යි ...සැබෑ ද මහණෙනි, තෙපි හටගත් ඩබර ඇති හටගත් කලහ ඇති විරුද්ධවාදයට බැසගත් මහණුන්ගේ බස් ඇසෙන තන්හි සිටිවු ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ. කෙසේ නම් හිස් පුරුෂයෙනි. තෙපි හටගත් ඩබර ඇති හටගත් කලහ ඇති විවාදයට බැසගත් මහණුන්ගේ බස් ඇසෙන තන්හි සිටියහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**''යම් මහණෙක් හටගත් ඩබර ඇති හටගත් කලහ ඇති විරුද්ධවාදයට පැමිණි මහණුන්ගේ බස් ඇසෙන තන්හි මොහු යමක් බෙණෙත් නම් එය අසන්නෙමැ'යි අනෙකක් නො වැ මෙය මැ කරුණු කොට සිටින්නේ නම් පචිති වේ'' යයි.**

3. යො පන: යම්, යම්බඳු...භික්ඛු...මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**භික්ඛූනං:** අන් මහණුන්ගේ.

**භණ්ඩනජාතානං කලහජාතානං විවාදපන්නානං:** හටගත් අධිකරණ ඇතියවුන්ගේ.

**උපස්සුතිං තිට්ඨෙය්‍ය:** මොවුන්ගේ බස් අසා චොදනා කරන්නෙමි සිහි කරවන්නෙමි නැවැතැ චොදනා කරන්නෙමි නැවැතැ සිහි කරවන්නෙමි මකු කරන්නෙමැ යි යේ නම් දුකුළා ඇවැත් වෙයි. යම් තැනෙකැ සිටියේ අසා නම් පචිති ඇවැත් වෙයි. පසු වැ යන්නේ අසන්නෙමැ යි යුහු වැ යේ නම් දුකුළා ඇවැත් වෙයි. යම් තැනෙක සිටියේ අසා නම් පචිති ඇවැත් වෙයි. පෙරටු වැ යන්නේ අසන්නෙමැ යි පසුබසිමින් එළිඑළී යේ නම් දුකුළා ඇවැත් වෙයි. යම් තැනෙකැ සිටියේ අසා නම් පචිති ඇවැත් වෙයි. මහණක්හුගේ සිටි තැනට හෝ හුන් තැනට හෝ හොත් තැනට හෝ අවුත් මන්ත්‍රණය කරන්නහුට කැරිය යුතු යැ දැන්විය යුතු යැ. ඉදින් නොකාරන්නේ නම් හෝ නො දන්වන්නේ නම් හෝ පචිති ඇවැත් වේ.

**එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤන්ති:** න අඤ්ඤො කොචි පච්චයො හොති උපස්සුතිං තිට්ඨිතුං.

උපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී උපස්සුතිං තිට්ඨති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ වෙමතිකො උපස්සුතිං තිට්ඨති ආපත්ති පාචිත්තියස්ස. උපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී උපස්සුතිං තිට්ඨති ආපත්ති පාචිත්තියස්ස.

අනුපසම්පන්නස්ස උපස්සුතිං තිට්ඨති ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ උපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නෙ අනුපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** ඉමෙසං සුත්වා ඔරමිස්සාමි විරමිස්සාමි වූපසමිස්සාමි අත්තානං පරිමොචෙස්සාමීති ගච්ඡති උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

උපස්සුතිසික්ඛාපදං අට්ඨමං.

## 6. 8. 9

## කම්මපටිබාහනසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන **ඡබ්බග්ගියා** භික්ඛූ අනාචාරං ආචරිත්වා එකමෙකස්ස කම්මෙ කයිරමානෙ පටික්කොසන්ති. තෙන ඛො පන සමයෙන සඞ්ඝො සන්නිපතිතො හොති කෙනචිදෙව කරණීයෙන. ඡබ්බග්ගියා භික්ඛූ චීවරකම්මං කරොන්තා එකස්ස ඡන්දං අදංසු. අථ ඛො සඞ්ඝො අයං ආවුසො ඡබ්බග්ගියා භික්ඛු එකකො ආගතො හන්දස්ස මයං කම්මං කරොමාති තස්ස කම්මං අකාසි. අථ ඛො සො භික්ඛු යෙන ඡබ්බග්ගියා භික්ඛූ තෙනුපසඞ්කමි. ඡබ්බග්ගියා භික්ඛූ තං භික්ඛුං එතදවොචුං. "කිං ආවුසො සඞ්ඝො අකාසී"ති. සඞ්ඝො මෙ ආවුසො කම්මං අකාසීති. න මයං ආවුසො එතදත්ථාය ඡන්දං අදම්හ තුය්හං කම්මං කරිස්සතීති. සචෙ ච මයං ජානෙය්‍යාම තුය්හං කම්මං කරිස්සතීති න මයං ඡන්දං දදෙය්‍යාමාති.

1. වූපසමෙස්සාමි - සී මු

එතදෙව පච්චයං කරිත්වා අනක්ඛාතුං; බස් ඇසෙන තන්හි සිටින්නට අන් කිසිදු කරුණෙක් නැත.

උපසපනක්හු කෙරෙහි උපසපන්සන් ඇතියේ බස් ඇසෙන තන්හි සිටී නම් පචිති ඇවැත් වෙයි. උපසපනක්හු කෙරෙහි විමති ඇතියේ බස් ඇසෙන තන්හි සිටී නම් පචිති ඇවැත් වෙයි. උපසපනක්හු කෙරෙහි අනුපසපන්සන් ඇතියේ බස් ඇසෙන තන්හි සිටී නම් පචිති ඇවැත් වේ.

අනුපසපනක්හුගේ බස් ඇසෙන තන්හි සිටී නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි උපසපන් සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපනක්හු කෙරෙහි අනුපසපන් සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වේ.

මොවුන්ගේ බස් අසා මිදෙන්නෙමි වළකින්නෙමි සන්හිඳින්නෙමි තමා හාත්පසින් මිදෙන්නෙමැ යි යේ නම් ඇවැත් නැත, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**අටවැනි උපස්සුති ශික්ෂාපද යි.**

## 6. 8. 9

## කම්මපටිබාහන ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි සවග මහණහු පනත් විකුම් කොට එකක් එකක්හට කම් කරනු ලබන කල්හි වළහත්. එසමයෙහි වනාහි කිසියම් කරුණෙකින් සඞසයා රැස්වූයේ වෙයි. සවග මහණහු සිවුරුකම් කරන්නෝ එකක්හට ඡන්දය දුන්හු. එකල්හි සඞසයා ඇවැත්නි, මේ සවග මහණ එකලා වැ පැමිණියේ යැ. එබැවින් ඇපි මොහුට කම් කරම්හ යි ඔහට කර්ම කෙළේ යැ. එකල්හි එ මහණ සවග මහණුන් වෙතැ එළැඹියේ යැ. සවග මහණහු එ මහණහට මෙය කීහු. ඇවැත්නි, සඞසයා කුමක් කෙළේ දැයි. ඇවැත්නි, සඞසයා මාහට කම් කෙළේ යැ යි. ඇවැත්නි, ඇපි තොපට කම් කරන්නේ යැ යි තෙල කරුණ සඳහා ඡන්දය නුදුම්හ. ඉදින් තොපට කම් කරන්නේ යැයි ඇපි දන්නමෝ නම් ඇපි ඡන්දය නො දෙම්හ යි.

2. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ ධම්මිකානං කම්මානං ඡන්දං දත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජිස්සන්ති"ති-පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ ධම්මිකානං කම්මානං ඡන්දං දත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජථාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා-පෙ-කථං හි නාම තුම්හෙ මොඝපුරිසා ධම්මිකානං කම්මානං ඡන්දං දත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජිස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය-පෙ-එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු ධම්මිකානං කම්මානං ඡන්දං දත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජෙය්‍ය පාචිත්තිය"න්ති.**

3. යො පනාති: යො යාදිසො -පෙ- භික්ඛූති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

ධම්මිකං නාම කම්මං: අපලොකනකම්මං ඤත්තිකම්මං ඤත්තිදුතිය කම්මං ඤත්තිචතුත්ථකම්මං ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන කතං එතං ධම්මිකං නාම කම්මං, ඡන්දං දත්වා ඛීයති ආපත්ති පාචිත්තියස්ස.

ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී ඡන්දං දත්වා ඛීයති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ වෙමතිකො ඡන්දං දත්වා ඛීයති ආපත්ති දුක්කටස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී ඡන්දං දත්වා ඛීයති අනාපත්ති.

අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී අනාපත්ති.

අනාපත්ති: අධම්මෙන වා වග්ගෙන වා න කම්මාරහස්ස වා කතන්ති ජානන්තො ඛීයති උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**කම්මපටිබාහනසික්ඛාපදං නවමං.**

2. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවාහු...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ෂවග මහණහු දැහැමි කර්‍මයනට ඡන්දය දී පසු වැ ගරහන බවට පැමිණියෝ''ද යි...සැබෑ ද මහණෙනි, තෙපි දැහැමි කර්‍මයනට ඡන්දය දී පසු වැ ගරහන බවට පැමිණෙවු ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ... කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි දැහැමි කර්‍මයනට ඡන්දය දී පසු වැ ගරහන බවට පැමිණියහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**''යම් මහණෙක් දැහැමි කර්‍මයනට ඡන්දය දී පසු වැ ගරහන බවට පැමිණෙන්නේ නම් පචිති වේ''යයි.**

3. යො පන: යම්, යම්බඳු.. භික්ෂු...මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

ධම්මික කම්ම නම්: අපලොකන කම් යැ ඥප්ති කම් යැ ඥප්තිද්විතීය කම් යැ, ඥප්තිචතුර්ථ කම් යි. ධර්‍මයෙන් විනයෙන් ශාස්තෘශාසනයෙන් කරන ලද තෙල කර්‍මය ධම්මික නම් වෙයි. ඡන්දය දී ගරහා නම් පචිති ඇවැත් වේ.

දැහැමිකම්හි දැහැමිකම්සඤ් ඇතියේ ඡන්දය දී ගරහා නම් පචිති ඇවැත් වෙයි. දැහැමිකම්හි විමති ඇතියේ ඡන්දය දී ගරහා නම් දුකුළා ඇවැත් වෙයි. දැහැමිකම්හි නො දැහැමි කම්සඤ් ඇතියේ ඡන්දය දී ගරහා නම් ඇවැත් නැති.

නො දැහැමිකම්හි දැහැමිකම්සඤ් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො දැහැමිකම්හි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො දැහැමිකම්හි නො දැහැමිකම්සඤ් ඇතියේ නම් ඇවැත් නැති.

අධර්‍මයෙන් හෝ ව්‍යග්‍රයෙන් හෝ කර්‍මාර්හ නොවනුවක්හට කම් කරන ලදැ යි දන්නේ ගරහා නම් (ඇවැත් නොවේ), උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**නවවැනි කම්මපටිබාහන ශික්ෂාපද යි.**

## 6. 8. 10

## ඡන්දං අදත්වාගමනසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන සඞ්ඝො සන්නිපතිතො හොති කෙනචිදෙව කරණීයෙන. ඡබ්බග්ගියා භික්ඛූ චීවරකම්මං කරොන්තා එකස්ස ඡන්දං අදංසු. අථ ඛො සඞ්ඝො යස්සත්ථාය සන්නිපතිතො තං කම්මං කරිස්සාමීති ඤත්තිං ඨපෙසි. අථ ඛො සො භික්ඛු එවමෙවිමෙ එකමෙකස්ස කම්මං කරොන්ති. කස්ස තුම්හෙ කම්මං කරිස්සථාති ඡන්දං අදත්වා උට්ඨායාසනා පක්කාමි.

2. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම භික්ඛු සඞ්ඝෙ විනිච්ඡයකථාය වත්තමානාය ඡන්දං අදත්වා උට්ඨායාසනා පක්කමිස්සතී"ති -පෙ- සච්චං කිර භික්ඛු සඞ්ඝෙ විනිච්ඡයකථාය වත්තමානාය ඡන්දං අදත්වා උට්ඨායාසනා පක්කමසීති, සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම ත්වං මොඝපුරිස සඞ්ඝෙ විනිච්ඡයකථාය වත්තමානාය ඡන්දං අදත්වා උට්ඨායාසනා පක්කමිස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු සඞ්ඝෙ විනිච්ඡයකථාය වත්තමානාය ඡන්දං අදත්වා උට්ඨායාසනා පක්කමෙය්‍ය පාචිත්තිය"න්ති.**

3. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**සඞ්ඝෙ විනිච්ඡයකථා** නාම; වත්ථු වා ආරොචිතං හොති අවිනිච්ඡිතං, ඤත්ති වා ඨපිතා හොති කම්මවාචා වා විප්පකතා.[1]

**ඡන්දං අදත්වා උට්ඨායාසනා පක්කමෙය්‍යාති:** කථං ඉදං කම්මං කුප්පං අස්ස වග්ගං අස්ස න කරෙය්‍යාති ගච්ඡති ආපත්ති දුක්කටස්ස. පරිසාය හත්ථපාසං විජහන්තස්ස ආපත්ති දුක්කටස්ස. විජහිතෙ ආපත්ති පාචිත්තියස්ස.

ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී ඡන්දං අදත්වා උට්ඨායාසනා පක්කමති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ වෙමතිකො ඡන්දං අදත්වා උට්ඨායාසනා පක්කමති ආපත්ති දුක්කටස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී ඡන්දං අදත්වා උට්ඨායාසනා පක්කමති අනාපත්ති.

---

1. විප්පකතා හොති - මජසං

## 6. 8. 10

## ඡන්දංඅදත්වාගමන ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි සඞ්ඝයා කිසියම් කරුණෙකින් රැස් වූයේ වෙයි. සවග මහණහු සිවුරුකම් කරන්නෝ එකක්හට ඡන්දය දුන්හු. එකල්හි සඞ්ඝයා යමක්හු සඳහා රැස් වූයේ නම් ඒ කර්‍මය කරන්නෙමැ යි ඤප්තිය තැබී යැ. එකල්හි එ මහණ මෙපරිද්-දෙන් මැ මොහු එකක් එකක්හට කම් කෙරෙති. තෙපි කවරක්හට කම් කරන්නහු දැයි ඡන්දය නො දී හුනස්නෙන් නැඟිට ගියේ යි.

2. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවාහු...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මහණෙක් සඟමැද විනිශ්වය කථාවක් පවත්නා කල්හි ඡන්දය නො දී හුනස්නෙන් නැඟිට ගියේ"දැ යි...සැබෑ ද මහණ තෝ සඟමැද විනිශ්වයකථාවක් පවත්නා කල්හි ඡන්දය නො දී හුනස්නෙන් නැඟිට යෙහි දැ යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ...කෙසේ නම් හිස් පුරුෂය, තෙපි සඟ මැද විනිශ්වය කථාවක් පවත්නා කල්හි ඡන්දය නො දී හුනස්නෙන් නැඟිට ගියහු ද? හිස් පුරුෂය, මෙය අප්‍රසන්නයන් ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"යම් මහණෙක් සඟමැද විනිශ්වය කථාවක් පවත්නා කල්හි ඡන්දය නො දී හුනස්නෙන් නැඟිට බැහැර යන්නේ නම් පචිති වේ" යැ යි.**

3. **යො පන:** යම්, යම්බඳු...**භික්ඛු**...මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**සඞ්ඝෙ විනිච්ඡයකථා** නම්: වස්තුව ආරොචනය කරන ලද්දේ හෝ විනිශ්වය නො කරන ලද්දේ හෝ වෙයි. ඤප්තිය තබන ලද හෝ කම්වදන් නො නිමියේ හෝ වෙයි.

**ඡන්දං අදත්වා උට්ඨායාසනා පක්කමෙය්‍ය:** කෙසේ මේ කර්‍මය කොප්‍ය වන්නේ ද ව්‍යග්‍ර වන්නේ ද නො කරන්නේ දැ යි යේ නම් දුකුළා ඇවැත් වෙයි. පිරිසෙන් අත්පස හරනාහට දුකුළා ඇවැත් වෙයි. හළ කල්හි පචිති ඇවැත් වේ.

දැහැමිකම්හි දැහැමිකම්සත් ඇතියේ ඡන්දය නො දී හුනස්නෙන් නැඟිට බැහැර යේ නම් පචිති ඇවැත් වෙයි. දැහැමිකම්හි විමති ඇතියේ ඡන්දය නො දී හුනස්නෙන් නැඟිට බැහැර යේ නම් දුකුළා ඇවැත් වෙයි. **දැහැමිකම්හි නො දැහැමිකම්සත් ඇතියේ ඡන්දය නො දී හුනස්නෙන්** නැඟිට බැහැර යේ නම් ඇවැත් නැති.

5. අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී අනාපත්ති.

6. අනාපත්ති: සඞ්ඝස්ස භණ්ඩනං වා කලහො වා විග්ගහො වා විවාදො වා භවිස්සතීති ගච්ඡති. සඞ්ඝභෙදො වා සඞ්ඝරාජී වා භවිස්සතීති ගච්ඡති අධම්මෙන වා වග්ගෙන වා න කම්මාරහස්ස වා කම්මං කරිස්සතීති ගච්ඡති, ගිලානො වා ගච්ඡති, ගිලානස්ස කරණීයෙන වා ගච්ඡති උච්චාරෙන වා පස්සාවෙන වා පීළිතො ගච්ඡති, න කම්මං කොපෙතුකාමො පුන පච්චාගමිස්සාමීති ගච්ඡති, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

ඡන්දංඅදත්වාගමනසික්ඛාපදං දසමං

## 6. 8. 11

## දබ්බසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා දබ්බො මල්ලපුත්තො සඞ්ඝස්ස සෙනාසනඤ්ච පඤ්ඤපෙති භත්තානි ච උද්දිසති. සො චායස්මා දුබ්බලචීවරො හොති. තෙන ඛො පන සමයෙන සඞ්ඝස්ස එකං චීවරං උප්පන්නං හොති. අථ ඛො සඞ්ඝො තං චීවරං ආයස්මතො දබ්බස්ස මල්ලපුත්තස්ස අදාසි. ඡබ්බග්ගියා භික්ඛූ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. "යථාසන්ථුතං භික්ඛූ සඞ්ඝිකං ලාභං පරිණාමෙන්ති"ති.

2. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ සමග්ගෙන සඞ්ඝෙන චීවරං දත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජිස්සන්ති"ති -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ සමග්ගෙන සඞ්ඝෙන චීවරං දත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජථා'ති. සච්චං භගවා විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා සමග්ගෙන සඞ්ඝෙන චීවරං දත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජිස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු සමග්ගෙන සඞ්ඝෙන චීවරං දත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජෙය්‍ය යථාසන්ථුතං භික්ඛූ සඞ්ඝිකං ලාභං පරිණාමෙන්තීති පාචිත්තිය"න්ති,**

නො දැහැමිකම්හි දැහැමිකම් සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො දැහැමිකම්හි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො දැහැමිකම්හි නො දැහැමිකම් සත් ඇතියේ නම් ඇවැත් නැති.

සඞ්ඝයාගේ භණ්ඩනයෙක් හෝ කලහයෙක් හෝ විග්‍රහයෙක් හෝ විරුද්ධවාදයෙක් හෝ වන්නේ යැ යි යේ නම්, සඞ්ඝභෙදය හෝ සඞ්ඝරාජිය හෝ වන්නේ යැ යි යේ නම්, අධර්මයෙන් හෝ ව්‍යග්‍රයෙන් හෝ කර්මාර්හ නොවනුවක්හට කර්ම කරන්නේ යැ යි හෝ යේ නම්, ගිලන් වැ හෝ යේ නම්, ගිලනක්හුගේ කළයුත්තෙකින් හෝ යේ නම්, මහවටතින් හෝ සුළුවටතින් හෝ පෙළෙනුයේ යේ නම් කර්මය කොප්‍ය කරනු කැමැත්තක් නැතියේ යළි පෙරළා එන්නෙමැ යි යේ නම් (ඇවැත් නො වේ), උම්මත්තකයහට ආදිකර්මිකයහට ඇවැත් නැති.

**දසවැනි ඡන්දංඅදත්වාගමන ශික්ෂාපද යි.**

## 6. 8. 11

## දබ්බ ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු රජගහ නුවර කලන්දකනිවාස නම් වෙළුවන අරමහි වැඩැ වෙසෙති. එසමයෙහි වනාහි ආයුෂ්මත් දබ්බමල්ලපුත්‍ර සඞ්ඝයාහට සෙනසුනුදු පනවයි. බතුදු උදෙසයි. ඒ ආයුෂ්මත් තෙමේත් දුබල සිවුරු ඇතියේ වෙයි. එසමයෙහි වනාහි සඞ්ඝයාහට එක් සිවුරක් උපන්නේ වෙයි. එකල්හි සඞ්ඝයා ඒ සිවුර ආයුෂ්මත් දබ්බමල්ල පුත්‍රයහට දුන්නේ යැ. එකල්හි සවග මහණහු ලමු කොට සිතති නුගුණ පවසති දෙස් පතුරුවත්: "භික්ෂූහු විශ්වස්ත පරිද්දෙන් සඞ්ඝික ලාභය පිරිනමති යි.

2. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස්වූවාහු...ඔහු ලමු කොට සිතති. නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් සවග මහණහු සමග්‍ර සඞ්ඝයා හා එක්වැ සිවුරු දී පසු වැ ගරහන බවට පැමිණියෝ දැ"යි... සැබෑ ද මහණෙනි, තෙපි සමග්‍ර සඞ්ඝයා හා එක්වැ සිවුරු දී පසු වැ ගරහන බවට පැමිණෙවු දැ යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ. ...කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි සමග්‍ර සඞ්ඝයා හා එක් වැ සිවුරු දී පසු වැ ගරහන බවට පැමිණියහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි.... මහණෙනි, මේ සිකපදය මෙසේ උදෙසවු:

**"යම් මහණෙක් සමග්‍ර සඞ්ඝයා හා එක් වැ සිවුරු දී භික්ෂූහු විශ්වස්තපරිද්දෙන් සඞ්ඝිකලාභය පිරිණමත් යයි පසු වැ ගරහන බවට පැමිණේ නම් පචිති වේ"යයි.**

3. යො පනාති: යො යාදිසො –පෙ– භික්ඛූති: –පෙ– අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

සමග්ගො නාම: සඞ්ඝො සමානසංවාසකො සමානසීමායං ඨිතො.

චීවරං නාම: ඡන්නං චීවරානං අඤ්ඤතරං චීවරං විකප්පනූපග පච්ඡිමං.

දත්වාති: සයං දත්වා.

යථාසන්ථුතං නාම: යථාමිත්තතා යථාසන්දිට්ඨතා යථාසම්භත්තතා යථාසමානුපජ්ඣායකතා යථාසමානාචරියකතා.

සඞ්ඝිකං නාම; සඞ්ඝස්ස දින්නං හොති පරිච්චත්තං.

ලාභො නාම: චීවරපිණ්ඩපාතසෙනාසනගිලානප්පච්චයභෙසජ්ජ-පරික්ඛාරා අන්තමසො චුණ්ණපිණ්ඩොපි දන්තකට්ඨම්පි දසිකසුත්තම්පි[1],

පච්ඡා ඛීයනධම්මං ආපජ්ජෙය්‍යාති: උපසම්පන්නස්ස සඞ්ඝෙන සම්මතස්ස සෙනාසනපඤ්ඤාපකස්ස වා භත්තුද්දෙසකස්ස වා යාගුභාජකස්ස වා ඵලභාජකස්ස වා ඛජ්ජකභාජකස්ස වා අප්පමත්තකවිස්සජ්ජකස්ස වා චීවරං දින්නෙ ඛීයති ආපත්ති පාචිත්තියස්ස.

ධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී චීවරං දින්නෙ ඛීයති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ වෙමතිකො චීවරං දින්නෙ ඛීයති ආපත්ති පාචිත්තියස්ස. ධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී චීවරං දින්නෙ ඛීයති ආපත්ති පාචිත්තියස්ස.

අඤ්ඤං පරික්ඛාරං දින්නෙ ඛීයති ආපත්ති දුක්කටස්ස. උපසම්පන්නස්ස සඞ්ඝෙන අසම්මතස්ස සෙනාසනපඤ්ඤාපකස්ස වා භත්තුද්දෙසකස්ස වා යාගුභාජකස්ස වා ඵලභාජකස්ස වා ඛජ්ජකභාජකස්ස වා අප්පමත්තකවිස්සජ්ජකස්ස වා චීවරං වා අඤ්ඤං වා පරික්ඛාරං දින්නෙ ඛීයති ආපත්ති දුක්කටස්ස.

1. දසිකසුත්තමත්තම්පි - සී I

3. **යො පන ;** යම්, යම්බඳු ... භික්ඛු ... -මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**සමග්ග** නම්: සමානසංවාසක වූ සමාන **සීමායෙහි සිටී සඞ්ඝ තෙමේ යි.**

**චීවර** නම්: සවැදෑරුම් සිවුරු ඈතුරෙන් එක්තරා විකපුන් පොහෝනා පැසුළු සිවුරක්.

**දත්වා ;** තෙමේ දී.

**යථාසන්ථුත** නම්: මිතුරුබව ඇති පරිදි දුටු මිතුරුබව ඇති පරිදි දැඩි මිතුරු බව ඇති පරිදි සමාන උපාධ්‍යාය බව ඇති පරිදි සමාන ඇදුරු බව ඇති පරිදි.

**සඞ්ඝික** නම්: සඟනට දෙන ලද්දෙක් පරිත්‍යක්තයෙක් වෙයි.

**ලාභ** නම්: චීවර යැ පිණ්ඩපාත යැ ශයනාසන යැ ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍යපරිෂ්කාර යැ, යටත් පිරිසෙයින් සුණු පිඩු ද දැහැටු ද දහවලුහුය ද.

**පච්ඡා ඛීයනධම්මං ආපජ්ජෙය්‍ය ;** සඞ්ඝයා විසින් සම්මත වූ උපසපන් වූ සෙනසුන් පනවන්නකුහට හෝ බත් උදෙසන්නකුහට හෝ හඹු බෙදන්නකුහට හෝ පලතුරු බෙදන්නකුහට හෝ කැවිලි බෙදන්නකුහට හෝ මඳද්‍රයක් බෙද ලන්නකුහට හෝ සිවුරක් දුන් කල්හි ගරහා නම් පචිති ඇවැත් වේ.

දැහැමිකම්හි දැහැමිකම්සන් ඇතියේ සිවුරක් දුන් කල්හි ගරහා නම් පචිති ඇවැත් වෙයි. දැහැමිකම්හි විමති ඇතියේ සිවුරක් දුන් කල්හි ගරහා නම් පචිති ඇවැත් වෙයි. දැහැමිකම්හි නො දැහැමිකම්සන් ඇති යේ සිවුරක් දුන් කල්හි ගරහා නම් පචිති ඇවැත් වේ.

අන් පිරිකරක් දුන් කල්හි ගරහා නම් දුකුළා ඇවැත් වෙයි. සඞ්ඝයා විසින් සම්මත නො වූ උපසපන් වූ සෙනසුන් පනවන්නකුහට හෝ බත් උදෙසන්නකුහට හෝ හඹු බෙදන්නකුහට හෝ පලතුරු බෙදන්නකුහට හෝ කැවිලි බෙදන්නකුහට හෝ මඳ ද්‍රයක් බෙදලන්නකුහට හෝ සිවුරක් හෝ අන් පිරිකරක් හෝ දුන් කල්හි ගරහා නම් දුකුළා ඇවැත් වේ.

අනුපසම්පන්නස්ස සඞ්ඝෙන සම්මතස්ස වා අසම්මතස්ස වා සෙනාසනපඤ්ඤාපකස්ස වා භත්තුද්දෙසකස්ස වා යාගුභාජකස්ස වා ඵලභාජකස්ස වා ඛජ්ජකභාජකස්ස වා අප්පමත්තකවිස්සජ්ජකස්ස වා චීවරං වා අඤ්ඤං වා පරික්ඛාරං දින්නෙ ඛීයති ආපත්ති දුක්කටස්ස.

අධම්මකම්මෙ ධම්මකම්මසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අධම්මකම්මෙ අධම්මකම්මසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** පකතියා ඡන්ද දොසා මොහා භයා කරොන්තං කවතො, තස්ස දින්නෙන ලද්ධාපි විනිපාතෙස්සති න සම්මා උපනෙස්සතීති ඛීයති, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**දබ්බසික්ඛාපදං[1] එකාදසමං**

## 6. 8. 12

## පරිණාමනසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන සාවත්ථියං අඤ්ඤතරස්ස පූගස්ස සඞ්ඝස්ස සචීවරභත්තං පටියත්තං හොති, භොජෙත්වා චීවරෙන අච්ඡාදෙස්සාමාති. අථ ඛො ඡබ්බග්ගියා භික්ඛූ යෙන සො පූගො තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා තං පූගං එතදවොචුං: "දෙථාවුසො ඉමානි චීවරානි ඉමෙසං භික්ඛූන"න්ති. න මයං භන්තෙ දස්සාම අම්හාකං සඞ්ඝස්ස අනුවස්සං[2] සචීවරභික්ඛා පඤ්ඤත්තාති. බහූ ආවුසො සඞ්ඝස්ස දායකා බහූ සඞ්ඝස්ස භද්දාති[3] ඉමෙ තුම්හෙ නිස්සාය තුම්හෙ සම්පස්සන්තා ඉධ විහරන්ති. තුම්හෙ චෙ ඉමෙසං න දස්සථ අථ කො චරහි ඉමෙසං දස්සති. දෙථාවුසො ඉමානි චීවරානි ඉමෙසං භික්ඛූනන්ති. අථ ඛො සො පූගො ඡබ්බග්ගියෙහි භික්ඛූහි නිප්පීළියමානො යථාපටියත්තං චීවරං ඡබ්බග්ගියානං භික්ඛූනං දත්වා සඞ්ඝං භත්තෙන පරිවිසි. යෙ තෙ භික්ඛූ ජානන්ති සඞ්ඝස්ස සචීවරභත්තං පටියත්තං න ච ජානන්ති ඡබ්බග්ගියානං භික්ඛූනං දින්නන්ති. තෙ එවමාහංසු "ඔණොජෙථාවුසො සඞ්ඝස්ස චීවර"න්ති. නත්ථි භන්තෙ යථාපටියත්තං චීවරං. අය්‍යා ඡබ්බග්ගියා අය්‍යානං ඡබ්බග්ගියානං පරිණාමෙසුන්ති.

1. දුබ්බලසික්ඛාපදං - මජසං
2. අනුවස්සකං - සී
3. භත්තා - මජසං,

සඞ්ඝයා විසින් සම්මත වූ හෝ සම්මත නො වූ හෝ අනුප- සපනක් වූ සෙනසුන් පනවන්නකුහට හෝ බත් උදෙසන්නකුහට හෝ හඹු බෙදන්නකුහට හෝ පලතුරු බෙදන්නකුහට හෝ කැවිලි බෙදන්නකුහට හෝ මඳ දෑයක් බෙදා ලන්නකුහට හෝ සිවුරක් හෝ අන් පිරිකරක් හෝ දුන් කල්හි ගරහා නම් දුකුළා ඇවැත් වෙ.

නො දැහැමිකම්හි දැහැමිකම් සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නොදැහැමිකම්හි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො දැහැමිකම්හි නොදැහැමිකම් සත් ඇතියේ නම් ඇවැත් නැති.

ප්‍රකෘතියෙන් ඡන්දයෙන් ද්වෙෂයෙන් මොහයෙන් භයෙන් කරන්නහුට, ඔහුට දුන් දෑයින් කවර වැඩෙක් ද, ලැබ ද නසාපියන්නේ යැ, මොනවට නො එළවන්නේ යැ යි ගරහා නම් ඇවැත් නො වේ. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

එකොළොස්වැනි දබ්බ ශික්ෂාපද යි.

## 6. 8. 12

## පරිණාමන ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජෙතවන නම් අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි සැවැතැ එක්තරා මුළුවක් විසින් සඟනට සිවුරු සහිත බතෙක් පිළියෙළ කරන ලද්දේ වෙයි. වළඳවා සිවුරු පුදම්හ යි. එකල්හි සවග මහණහු ඒ මුළුව වෙතැ එළැඹියහ. එළැඹැ එ මුළුවට මෙය කීහු: ඇවැත්නි, මේ සිවුරු මේ මහණුන්හට දෙවයි. ස්වාමීනි, ඇපි නො දෙම්හ. අප විසින් අවුරුද්දක් පාසා සඟනට සිවුරු සහිත බතෙක් පනවන ලද්දේ වෙයි. ඇවැත්නි, සඟනට දයකයෝ බොහෝ යැ, සඟනට ලාභමුඛයෝ බොහෝ යැ, මොහු තොප නිසා තොප බලමින් මෙහි වෙසෙති ඉදින් තෙපි මොවුනට නො දෙන්නහු නම් වැළි කවරෙක් මොවුනට දෙන්නේ ද? ඇවැත්නි, මේ සිවුරු මේ මහණුන්හට දෙවූ. එකල්හි ඒ මුළුව සවග මහණුන් විසින් පෙළනු ලබන්නේ පිළියෙළ කළ තාක් සිවුරු සවග මහණුන්හට දී සඞ්ඝයා බතින් වැළඳවී යැ. යම් ඒ භික්ෂු කෙනෙක් සඟනට සිවුරු සහිත බතෙක් පිළියෙළ කරන ලද යි දනිද්ද, සවග මහණුන්හට දෙන ලද යි නො ද දනිද්ද, ඔහු ඇවැත්නි, සඟනට සිවුරු පුදව යි මෙසේ කීහු. නැත ස්වාමීනි, සවග හිමිවරු පිළියෙළ කළ තාක් සිවුරු සවග හිමිවරුනට පිරිනැමවූහු යි.

2. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ ජානං සඞ්ඝිකං ලාභං පරිණතං පුග්ගලස්ස පරිණාමෙස්සන්ති" -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ ජානං සඞ්ඝිකං ලාභං පරිණතං පුග්ගලස්ස පරිණාමෙථාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා ජානං සඞ්ඝිකං ලාභං පරිණතං පුග්ගලස්ස පරිණාමෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු ජානං සඞ්ඝිකං ලාභං පරිණතං පුග්ගලස්ස පරිණාමෙය්‍ය පාචිත්තිය"න්ති.**

3. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**ජානාති** නාම: සාමං වා ජානාති අඤ්ඤෙ වා තස්ස ආරොචෙන්ති සො වා ආරොචෙති.

**සඞ්ඝිකං** නාම: සඞ්ඝස්ස දින්නං හොති පරිච්චත්තං.

**ලාභො** නාම: චීවරපිණ්ඩපාතසෙනාසනගිලානප්පච්චයභෙසජ්ජ-පරික්ඛාරා අන්තමසො චුණ්ණපිණ්ඩොපි දන්තකට්ඨම්පි දසිකසුත්තම්පි.

**පරිණතං** නාම: දස්සාම කරිස්සාමාති වාචා භින්නා හොති තං පුග්ගලස්ස පරිණාමෙති ආපත්ති පාචිත්තියස්ස. පරිණතෙ පරිණතසඤ්ඤී පුග්ගලස්ස පරිණාමෙති ආපත්ති පාචිත්තියස්ස. පරිණතෙ වෙමතිකො පුග්ගලස්ස පරිණාමෙති ආපත්ති දුක්කටස්ස. පරිණතෙ අපරිණතසඤ්ඤී පුග්ගලස්ස පරිණාමෙති අනාපත්ති.

සඞ්ඝස්ස පරිණතං අඤ්ඤසඞ්ඝස්ස වා චෙතියස්ස වා පරිණාමෙති ආපත්ති දුක්කටස්ස. චෙතියස්ස පරිණතං අඤ්ඤචෙතියස්ස වා සඞ්ඝස්ස වා ගණස්ස වා[1] පුග්ගලස්ස වා පරිණාමෙති ආපත්ති දුක්කටස්ස. පුග්ගලස්ස පරිණතං අඤ්ඤපුග්ගලස්ස වා සඞ්ඝස්ස වා ගණස්ස වා චෙතියස්ස වා පරිණාමෙති ආපත්ති දුක්කටස්ස. අපරිණතෙ පරිණතසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අපරිණතෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අපරිණතෙ අපරිණතසඤ්ඤී අනාපත්ති.

1. ගණස්ස වාති පදං ම. ඡ. සං. නදිස්සතෙ.

2. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවාහු...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් සවග මහණහු පිරි නමන ලද සඞ්ඝික ලාභය දනැදනැ පුඟුලක්හට පිරිනැමූහු"ද යි...සැබෑ ද මහණෙනි, තෙපි පිරිනමන ලද සඞ්ඝික ලාභය දනැදනැ පුඟුලක්හට පිරිනමවු ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ... කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි පිරිනමන ලද සඞ්ඝික ලාභය දන දනැ පුඟුලක්හට පිරිනැමුවහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්න යන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...මෙසේ මහණෙනි. මේ සිකපදය උදෙසවු:

"යම් මහණෙක් පිරිනමන ලද සඞ්ඝික ලාභය දනැ දනැ පුඟුලක්හට පිරිනමන්නේ නම් පචිති වේ"යයි

3. යො පන: යම්, යම්බඳු... භික්ෂු... මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

ජානාති නම්: තෙමේ හෝ දනී. අන්හු හෝ ඔහුට ඇරොජත්- හෙතෙමේ හෝ ඇරොජයි.

සඞ්ඝික නම්: සඟනට දෙන ලද්දෙක් පරිත්‍යක්තයෙක් වෙයි.

ලාභ නම්: චීවර යැ පිණ්ඩපාත යැ ශයනාසන යැ ග්ලානප්‍රත්‍යය භෛෂජ්‍යපරිෂ්කාර යැ. යටත් පිරිසෙයින් සුණුපිඩු ද දැහැටූ ද දහවලුහුය ද,

පරිණත නම්: දෙම්හ කරම්හ යි වාක් බිඳින ලද වෙයි. එය පුඟුලක්හට පිරිනමා නම් පචිති ඇවැත් වෙයි. පිරිනැමුණෙහි පිරිනැමුණු සත් ඇතියේ පුඟුලක්හට පිරිනමා නම් පචිති ඇවැත් වෙයි. පිරිනැමුණෙහි විමති ඇතියේ පුඟුලක්හට පිරිනමා නම් දුකුළා ඇවැත් වෙයි. පිරිනැමුණෙහි නො පිරිනැමුණු සත් ඇතියේ පුඟුලක්හට පිරිනමා නම් ඇවැත් නැති.

සඟනට පිරිනැමුණක් අන් සඟනට හෝ සෑයට හෝ පිරිනමා නම් දුකුළා ඇවැත් වෙයි. සෑයට පිරිනැමුණක් අන්සෑයකට හෝ සඟනට හෝ ගණයට හෝ පුඟුලක්හට හෝ පිරිනමා නම් දුකුළා ඇවැත් වෙයි. පුඟුලක්හට පිරිනැමුණක් අන් පුඟුලක්හට හෝ සඟනට හෝ ගණයාට හෝ සෑයට හෝ පිරිනමා නම් දුකුළා ඇවැත් වෙයි. නො පිරිනැමුණෙහි පිරිනැමුණු සත් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො පිරිනැමුණෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. නො පිරිනැමුණෙහි නො පිරි නැමුණු සත් ඇතියේ නම් ඇවැත් නැති.

අනාපත්ති: කත්ථ දෙමාති පුච්ඡියමානො යත්ථ තුම්හාකං දෙය්‍යධම්මො පරිභොගං වා ලභෙය්‍ය පටිසඞ්ඛාරං වා ලභෙය්‍ය චිරට්ඨිතිකො වා අස්ස යත්ථ වා පන තුම්හාකං චිත්තං පසීදති තත්ථ දෙථාති භණති උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**පරිණාමනසික්ඛාපදං ද්වාදසමං**

## සහධම්මිකවග්ගො අට්ඨමො

**තස්සුද්දානං :**

සහධම්ම විවණ්ණඤ්ච – මොහාපනං පහාරකං
තලසත්ති අමූලඤ්ච – සඤ්චිච්ච ච උපස්සුති
පටිබාහනඡන්දඤ්ච – දබ්බඤ්ච පරිණාමනන්ති.

කොයට දෙමු ද යි පුළුවුස්නා ලබන්නේ යම් තැනෙකැ තොපගේ දිය යුතු වත් පරිභොග හෝ ලබන්නේ නම් පිළිසකර හෝ ලබන්නේ නම් තිරකල් පැවැත්මෙක් හෝ වන්නේ නම් යම් තැනෙකැ වනාහි තොපගේ සිත පහදී නම් හෝ එයට දෙව යි බෙණේ නම් ඇවැත් නො වේ, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**දොළොස්වැනි පරිණාමන ශික්ෂාපද යි.**

## අෂ්ටම සහධම්මික වර්ග යි.

**එහි උද්දනය:**

සහධම්මික යැ විවර්ණ සංඛ්‍යාත විලේඛන යැ මොහන යැ පහාර යැ තලසත්තික යැ අමූලක යැ සඤ්චිච්ච යැ උපස්සුති යැ කම්ම පටිබාහන යැ ඡන්දං අදත්වා ගමන යැ දබ්බ යැ පරිණාමන සිඛය ද යි.

## 6. 9. 1

# රාජන්තෙපුරසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන රාජා පසෙනදි කොසලො උය්‍යානපාලං ආණාපෙසි ගච්ඡ භණෙ උය්‍යානං සොධෙහි උය්‍යානං ගමිස්සාමාති.[1] එවං දෙවාති ඛො සො උය්‍යානපාලො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස පටිස්සුත්වා උය්‍යානං සොධෙන්තො අද්දස භගවන්තං අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ නිසින්නං, දිස්වාන යෙන රාජා පසෙනදි කොසලො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා රාජානං පසෙනදිං කොසලං එතදවොච: "සුද්ධං දෙව උය්‍යානං අපි ච භගවා තත්ථ නිසින්නො"ති. හොතු භණෙ මයං භගවන්තං පයිරුපාසිස්සාමාති.

2. අථ ඛො රාජා පසෙනදි කොසලො උය්‍යානං ගන්ත්වා යෙන භගවා තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො උපාසකො භගවන්තං පයිරුපාසන්තො නිසින්නො හොති. අද්දසා ඛො රාජා පසෙනදි කොසලො තං උපාසකං භගවන්තං පයිරුපාසන්තං නිසින්නං, දිස්වාන භීතො අට්ඨාසි. අථ ඛො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස එතදහොසි, නාරහතායං පුරිසො පාපො හොතුං යථාභගවන්තං පයිරුපාසතීති. යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. අථ ඛො සො උපාසකො භගවතො ගාරවෙන රාජානං පසෙනදිං කොසලං නෙව අභිවාදෙසි න පච්චුට්ඨාසි. අථ ඛො රාජා පසෙනදි කොසලො අනත්තමනො අහොසි, "කථං හි නාමායං පුරිසො මයි ආගතෙ නෙව අභිවාදෙස්සති න පච්චුට්ඨෙස්සතී"ති. අථ ඛො භගවා රාජානං පසෙනදිං කොසලං අනත්තමනං විදිත්වා රාජානං පසෙනදිං කොසලං එතදවොච, "එසො ඛො මහාරාජ උපාසකො බහුස්සුතො ආගතාගමො කාමෙසු වීතරාගො"ති.

3. අථ ඛො රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස එතදහොසි, නාරහතායං උපාසකො ඔරකො හොතුං, භගවාපි ඉමස්ස වණ්ණං භාසතීති. තං උපාසකං එතදවොච: "වදෙය්‍යාසි උපාසක යෙන අත්ථො"ති. සුට්ඨු දෙවාති. අථ ඛො භගවා රාජානං පසෙනදිං කොසලං ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි, අථ ඛො රාජා පසෙනදි කොසලො භගවතා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි.

---

1. ගමිස්සාමීති, සීමු.

## 6. 9. 1

## රාජනෙතපුර ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජෙතවන නම් අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි ප්‍රසෙනජිත් කොශල රාජ තෙමේ උයන්පල්ලාට 'යව කොලෙනි, උයනට යන්නෙමි උයන ශොධනය කරව'යි අණ කෙළේ යැ. 'එසේ යැ දෙවයෙනි'යි ඒ උයන්පල් තෙමේ ප්‍රසෙනජිත් කොශල රාජයාහට පිළිවදන් දී උයන ශොධනය කරන්නේ එක්තරා රුක්මුලෙකැ වැඩැහුන් භාග්‍යවතුන් දිටි. දකැ ප්‍රසෙනජිත් කොශල රාජයා වෙතැ එළැඹියේ යැ. එළැඹැ ප්‍රසෙනජිත් කොශලරාජයාට මෙය කී යැ. දෙවයෙනි, උයන ශොධනය කරන ලදී. තවද භාග්‍යවතුන් වහන්සේ එහි වැඩැහුන් සෙයෙකැ යි. වේවා, බල, ඇපි භාග්‍යවතුන් පර්යුපාසන කරම්හ යි.

2. ඉක්බිති ප්‍රසෙනජිත් කොශල රාජ තෙමේ උයනට ගොස් භාග්‍යවතුන් වෙතැ එළැඹියේ යැ. එසමයෙහි වනාහි එක්තරා උවසුවෙක් භාග්‍යවතුන් පර්යුපාසන කරමින් හුන්නේ වෙයි. ප්‍රසෙනජිත් කොශල රාජ තෙමේ භාග්‍යවතුන් ඇසිරිකරමින් හුන් ඒ උවසුවා දිටි. දකැ බියපත් වැ සිටියේ යි. එකල්හි ප්‍රසෙනජිත් කොශල රජහට මෙ සිත විය: මේ පුරුෂ තෙමේ යම් හෙයකින් භාග්‍යවතුන් ඇසිරි කෙරේ ද, එහෙයින් ලාමක වන්නට නො සුදුස්සෙකැ යි භාග්‍යවතුන් වෙතැ එළැඹියේ යැ. එළැඹැ භාග්‍යවතුන් සකසා වැඳ එකත් පසෙකැ හුන්නේ යැ. එකල්හි ඒ උවසු තෙමේ භාග්‍යවතුන්හට ගෞරවයෙන් ප්‍රසෙනජිත් කොශල රාජයා නො මැ වැන්දේ යැ. හුනස්නෙන් නො නැඟ සිටියේ යැ. එකල්හි ප්‍රසෙනජිත් කොශල රාජ තෙමේ නො සතුටු විය: ''කෙසේ නම් මේ පුරුෂ තෙමේ මා ආ කල්හි නො මැ වැන්දේ ද? නො නැඟ සිටියේ''දැ යි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ප්‍රසෙනජිත් කොශල රාජයා නො සතුටුවූවහු දනැ ප්‍රසෙනජිත් කොශල රාජයාහට මෙය වදළසේ කැ. මහරජ තෙල උවසු බහුශ්‍රැතයෙකැ ආගතාගමයෙකැ කාමයෙහි වීතරාගයෙකැ යි.

3. ඉක්බිති ප්‍රසෙනජිත් කොශල රාජයාහට මෙ සිත විය: මේ උවසු ලාමක වන්නට නො නිසි යැ, භාග්‍යවතුන් වහන්සේත් මොහුගේ ගුණ වනන සේකැ යි ඒ උවසුවාට මෙය කී යැ: උවසුව, යමෙකින් වැඩෙක් වේ නම් කියන්නෙහි යැ යි යහපති දෙවයෙනි යි (හේ කීය) එකල්හි භාග්‍යවතුන් වහන්සේ ප්‍රසෙනජිත් කොශල රාජයාට දැහැමි කථායෙන් මොනවට කරුණු දක්වූ සේකැ, මොනවට කරුණු ගැන්වූ සේකැ, මොන වට තෙද ගැන්වූ සේකැ, මොනවට සතුටු කැරවූ සේකි. එකල්හි ප්‍රසෙනජිත් කොශලරාජ තෙමේ භාග්‍යවතුන් විසින් දැහැමි කථායෙන් මොනවට කරුණු දක්වන ලදුයේ මොනවට කරුණු ගන්වන ලදුයේ මොනවට තෙද ගන්වන ලදුයේ මොනවට සතුටු කරවන ලදුයේ හුනස්නෙන් නැඟිට භාග්‍යවතුන් සකසා වැඳ පැදකුණු කොට ඉවත් වැ ගියේ යි.

4. තෙන ඛො පන සමයෙන රාජා පසෙනදි කොසලො උපරිපාසාදවරගතො හොති. අද්දසා ඛො රාජා පසෙනදි කොසලො තං උපාසකං රථිකාය ඡත්තපාණිං ගච්ඡන්තං. දිස්වාන පක්කොසාපෙත්වා එතදවොච: "ත්වං කිර උපාසක බහුස්සුතො ආගතාගමො, සාධු උපාසක අම්හාකං ඉත්ථාගාරං ධම්මං වාචෙහී''ති. "යම්පාහං[1] දෙව ජානාමි අය්‍යානං වාහසා, අය්‍යාව දෙවස්ස ඉත්ථාගාරං ධම්මං වාචෙස්සන්තී''ති. අථ ඛො රාජා පසෙනදි කොසලො සච්චං ඛො උපාසකො ආහාති යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි, එකමන්තං නිසින්නො ඛො රාජා පසෙනදි කොසලො භගවන්තං එතදවොච: "සාධු භන්තෙ භගවා එකං භික්ඛුං ආණාපෙතු, යො අම්හාකං ඉත්ථාගාරං ධම්මං වාචෙස්සතී''ති. අථ ඛො භගවා රාජානං පසෙනදිං කොසලං ධම්මියා කථාය සන්දස්සෙසි -පෙ-. පදක්ඛිණං කත්වා පක්කාමි.

5. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං ආමන්තෙසි, තෙන හා'නන්ද රඤ්ඤො ඉත්ථාගාරං ධම්මං වාචෙහීති. එවං භන්තෙති ඛො ආයස්මා ආනන්දො භගවතො පටිස්සුත්වා[2] කාලෙන කාලං පවිසිත්වා රඤ්ඤො ඉත්ථාගාරං ධම්මං වාචෙති. අථ ඛො ආයස්මා ආනන්දො පුබ්බන්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන රඤ්ඤො පසෙනදිස්ස කොසලස්ස නිවෙසනං තෙනුපසඞ්කමි. තෙන ඛො පන සමයෙන රාජා පසෙනදි කොසලො මල්ලිකාය දෙවියා සද්ධිං සයනගතො හොති. අද්දසා ඛො මල්ලිකා දෙවී ආයස්මන්තං ආනන්දං දූරතොව ආගච්ඡන්තං, දිස්වාන සහසා වුට්ඨාසි. පීතකමට්ඨං[3] දුස්සං පභස්සිත්ථ. අථ ඛො ආයස්මා ආනන්දො තතොව පටිනිවත්තිත්වා ආරාමං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි.

6. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛිය්‍යන්ති විපාචෙන්ති. "කථං හි නාම ආයස්මා ආනන්දො පුබ්බෙ අප්පටිසංවිදිතො රඤ්ඤො අන්තෙපුරං පවිසිස්සතී''ති -පෙ-. සච්චං කිර ත්වං ආනන්ද පුබ්බෙ අප්පටිසංවිදිතො රඤ්ඤො අන්තෙපුරං පවිසසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම ත්වං ආනන්ද පුබ්බෙ අප්පටිසංවිදිතො රඤ්ඤො අන්තෙපුරං පවිසිස්සසි. නෙතං ආනන්ද අප්පසන්නානං වා පසාදාය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි.

1. යම්හං. - මජසං
2. පටිස්සුණිත්වා - සිමු
3. පීතකමට්ඨා - මජසං

4. එසමයෙහි වනාහි ප්‍රසෙනජිත් කොශලරාජ තෙමේ මතු මහල් තලයට පැමිණියේ වෙයි. ප්‍රසෙනජිත් කොශල රාජ තෙමේ වීථියෙහි කුඩගත් අත් ඇති ව යන්නා වූ ඒ උවසුවා දිටි. දැකැ කැඳවා මෙය කී යැ. උවසුව, තෙපි බහුශ්‍රැත වව ආගතාගම ඇත්තව, මැනැවැ උවසුව; අපගේ ඇතොවුරට බණ උගන්වව යි. දෙවයෙනි, මම යමක් දනිම් නම් එය ද ආයඝියන් කරුණු කොට ගෙන වෙයි. ආයඝියෝ මැ දෙවයන්ගේ ඇතොවුරට බණ උගන්වන්නාහ යි. එකල්හි ප්‍රසෙනජිත් කොශල රාජ තෙමේ 'සැබැවක් මැ උවසු කියා යැ යි භාග්‍යවතුන් වෙතැ එළැඹියේ යැ. එළැඹැ භාග්‍යවතුන් සකසා වැඳ එකක්පසෙකැ හුන්නේ යැ. එකත් පසෙකැ හුන්නා මැ වූ ප්‍රසෙනජිත් කොශල රාජ තෙමේ භාග්‍යවතුන්හට මෙය කී යැ: ස්වාමීනි, යමෙක් අපගේ ඇතොවුරට ධර්‍මය උගන්වන්නේ නම් භාග්‍යවතුන් වහන්සේ එබඳු එක් මහණක්හු අණවන සේක් නම් මැනැවැ'යි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ප්‍රසෙනජිත් කොශල රාජයා දැහැමි කථායෙන් මොනවට කරුණු දක්වූසේකැ...පැදකුණු කොට ඉවත් වැ ගියේ යි.

5. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද තෙරුන් ඇමතූ සේකැ. එසේ නම් ආනන්දයෙනි, රජහුගේ ඇතොවුරට බණ උගන්වවයි.එසේ යැ වහන්සැ යි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ භාග්‍යවතුන් හට පිළිවදන් දී කලින් කල පිවිස රජහුගේ ඇතොවුරට බණ උගන්වති. එකල්හි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ පෙරවරු හැඳ පෙරෙවැ පාසිවුරු ගෙනැ ප්‍රසෙනජිත් කොශල රාජයාගේ මැඳුරට එළැඹියහ. එසමයෙහි වනාහි පසේනදි කොසොල් රජ මල්ලිකා දෙවිය සමඟ ශයනගත වූයේ වෙයි. මල්ලිකා දෙවි ආයුෂ්මත් අනඳ තෙරුන් දුරින් ම එනුවන් දැකැ යුහු වැ නැගී සිටියා යැ. ඇයගේ රන්වන් සළුව ගිලිහිණ, එකල්හි ආයුෂ්මත් අනඳ තෙරණුවෝ එයින් මැ නැවැතී ආරාමයට ගොස් මහණුනහට තෙල කරුණ දන්වූහ.

6. යම් මහණ කෙනෙක් අපිස් වූවාහු... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවති: ''කෙසේ නම් පෙර නො දන්වාලූ ආයුෂ්මත් අනඳ තෙරණුවෝ රජහුගේ ඇතොවුරට පිවිසියාහු''ද යි... සැබෑ ද ආනන්දයෙනි, තෙපි පෙර නො දන්වන ලද්දහු රජහුගේ ඇතොවුරට පිවිසියහු ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ...කෙසේ නම් ආනන්දයෙනි, තෙපි පෙර නො දන්වන ලද්දහු රජහුගේ ඇතොවුරට පිවිසියහු ද? ආනන්දයෙනි, මෙය අප්‍රසන්න යන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...ගරහා දැහැමි කථා කොට මහණුන් ඇමතූහු.

7. දස ඉමෙ භික්ඛවෙ ආදීනවා රාජන්තෙපුරප්පවෙසනෙ, කතමෙ දස: ඉධ භික්ඛවෙ රාජා මහෙසියා සද්ධිං නිපන්නො[1] හොති, තත්ථ භික්ඛු පවිසති, මහෙසී වා භික්ඛුං දිස්වා සිතං පාතුකරොති, භික්ඛු වා මහෙසිං දිස්වා සිතං පාතුකරොති. තත්ථ රඤ්ඤො එවං හොති. "අද්ධා ඉමෙසං කතං වා කරිස්සන්ති වා"ති. අයං භික්ඛවෙ පඨමො ආදීනවො රාජන්තෙපුරප්පවෙසනෙ.

පුනචපරං භික්ඛවෙ රාජා බහුකිච්චො බහුකරණීයො අඤ්ඤතරං ඉත්ථිං ගන්ත්වා නස්සරති, සා තෙන ගබ්භං ගණ්හාති[2], තත්ථ රඤ්ඤො එවං හොති. "න ඛො ඉධ අඤ්ඤො කොචි පවිසති, අඤ්ඤත්‍ර පබ්බජිතෙන. සියා නු ඛො පබ්බජිතස්ස කම්ම"න්ති, අයං භික්ඛවෙ දුතියො ආදීනවො රාජන්තෙපුරප්පවෙසනෙ.

පුනචපරං භික්ඛවෙ රඤ්ඤො අන්තෙපුරෙ අඤ්ඤතරං රතනං නස්සති. තත්ථ රඤ්ඤො එවං හොති. "න ඛො ඉධ අඤ්ඤො කොචි පවිසති, අඤ්ඤත්‍ර පබ්බජිතෙන. සියා නුඛො පබ්බජිතස්ස කම්ම"න්ති, අයං භික්ඛවෙ තතියො ආදීනවො රාජන්තෙපුරප්පවෙසනෙ.

පුනචපරං භික්ඛවෙ රඤ්ඤො අන්තෙපුරෙ අබ්භන්තරා ගුය්හමන්තා බහිද්ධා සම්භෙදං ගච්ඡන්ති. තත්ථ රඤ්ඤො එවං හොති. "න ඛො ඉධ අඤ්ඤො කොචි පවිසති, අඤ්ඤත්‍ර පබ්බජිතෙන. සියා නු ඛො පබ්බජිතස්ස කම්ම"න්ති, අයං භික්ඛවෙ චතුත්ථො ආදීනවො රාජන්තෙපුරප්පවෙසනෙ.

පුනචපරං භික්ඛවෙ රඤ්ඤො අන්තෙපුරෙ පුත්තො වා පිතරං පත්ථෙති, පිතා වා පුත්තං පත්ථෙති; තෙසං එවං හොති. "න ඛො ඉධ අඤ්ඤො කොචි පවිසති, අඤ්ඤත්‍ර පබ්බජිතෙන, සියා නු ඛො පබ්බජිතස්ස කම්ම"න්ති, අයං භික්ඛවෙ පඤ්චමො ආදීනවො රාජන්තෙපුරප්පවෙසනෙ.

පුනචපරං භික්ඛවෙ රාජා නීචට්ඨානියං උච්චෙ ඨානෙ ඨපෙති, යෙසං තං අමනාපං තෙසං එවං හොති. "රාජා ඛො පබ්බජිතෙන සංසට්ඨො, සියා නු ඛො පබ්බජිතස්ස කම්ම"න්ති. අයං භික්ඛවෙ ඡට්ඨො ආදීනවො රාජන්තෙපුරප්පවෙසනෙ.

පුනචපරං භික්ඛවෙ රාජා උච්චට්ඨානියං නීචෙ ඨානෙ ඨපෙති. යෙසං තං අමනාපං තෙසං එවං හොති. "රාජා ඛො පබ්බජිතෙන සංසට්ඨො, සියා නු ඛො පබ්බජිතස්ස කම්ම"න්ති. අයං භික්ඛවෙ සත්තමො ආදීනවො රාජන්තෙපුරප්පවෙසනෙ.

---

1. නිසින්නො – මජසං
2. ගණ්හි – මජසං

7. මහණෙනි, රජහුගේ ඇතොවුරට පිවිසීමෙහි මේ ආදීනවයෝ දස දෙනෙකි. කවර දස දෙනෙක් ද යත්: මෙහි මහණෙනි, රජ තෙමේ මෙහෙසිය සමඟ හොත්තේ වෙයි. එහි මහණෙක් පිවිසෙයි. මෙහෙසිය හෝ මහණහු දැකැ සිනා පහළ කෙරෙයි. මහණ හෝ මෙහෙසිය දැකැ සිනා පහළ කෙරෙයි. එහි ලා රජහට මෙබඳු සිතෙක් වෙයි. එකැතින් මොවුන් විසින් ව්‍යතික්‍රම කරන ලදැ යි හෝ කරන්නහු හෝ වෙති යි. මහණෙනි, මේ රජහුගේ ඇතොවුරට පිවිසීමෙහි පළමුවන ආදීනව යි.

තවද මහණෙනි, බොහෝ කිස ඇති බොහෝ කරණී ඇති රජ තෙමේ එක්තරා ස්ත්‍රියක වෙතැ ගොස් නො සිහි කෙරෙයි ඕ තොමෝ ඕහු කරණ කොට ගෙනැ ගැබ් ගනී. එහි ලා රජහට මෙසේ සිත් වෙයි. මෙහි පැවිද්දකු තබා අන් කිසිවෙක් නො පිවිසෙයි. පැවිද්දගේ කර්මයෙක් වන්නේ හො යි. මහණෙනි, රජහුගේ ඇතොවුරට පිවිසීමෙහි මේ දෙවන ආදීනව යි.

තවද මහණෙනි, රජහුගේ ඇතොවුරෙහි එක්තරා මිණිරුවනෙක් නස්සී. එහිලා රජහට මෙසේ සිත් වෙයි. මෙහි පැවිද්දකු තබා අන් කිසිවෙක් නො පිවිසෙයි, පැවිද්දගේ කර්මයෙක් වන්නේ හො යි. මහණෙනි, රජහුගේ ඇතොවුරට පිවිසීමෙහි මේ තෙවන ආදීනව යි.

තවද මහණෙනි, රජහුගේ ඇතොවුරෙහි ඇතුළත්හි වූ සැඟැවුණු රහස්හු පිටත්හි සම්භෙදයට යෙති. එහි ලා රජහට මෙසේ සිත් වෙයි. මෙහි පැවිද්දකු තබා අන් කිසිවෙක් නො පිවිසෙයි. පැවිද්දගේ කර්මයෙක් වන්නේ හො යි. මහණෙනි, රජහුගේ ඇතොවුරට පිවිසීමෙහි මේ සතරවන ආදීනව යි.

තවද මහණෙනි, රජුහුගේ ඇතොවුරෙහි පුත්‍රයා හෝ පියහු (නසන්-නට) කැමැති වෙයි. පියා හෝ පුත්හු (නසන්නට) කැමැති වෙයි. ඔවුනට මෙසේ සිත් වෙයි· මෙහි පැවිද්දකු තබා අන් කිසිවෙක් නො පිවිසෙයි. පැවිද්දගේ කර්මයෙක් වන්නේ හො යි. මහණෙනි, රජ-හුගේ ඇතොවුරට පිවිසීමෙහි මේ පස්වන ආදීනව යි.

තවද මහණෙනි, රජ තෙමේ පහත්තන්හි සිටියහු උසස් තන්හි තබයි. එය යම් කෙනකුන්හට නො මැනැවි නම් ඔවුන්ට මෙසේ සිත් වෙයි. රජ තෙමේ වනාහි පැවිද්දහු සමඟ හැනී සිටියේ යැ. පැවිද්දගේ කර්මයෙක් වන්නේ හො යි. මහණෙනි, රජහුගේ ඇතොවුරට පිවිසීමෙහි මේ සවන ආදීනව යි.

තවද මහණෙනි, රජ තෙමේ උසස් තන්හි සිටියහු පහත් තන්හි තබයි. එය යම් කෙනකුන්හට නො මැනැවි නම් ඔවුනට මෙසේ සිත් වෙයි. රජ තෙමේ වනාහි පැවිද්දහු සමඟ හැනී සිටියේ යැ, පැවිද්දගේ කර්මයෙක් වන්නේ හො යි. මහණෙනි, රජහුගේ ඇතොවුරට පිවිසීමෙහි මේ සත්වන ආදීනව යි.

පුනචපරං භික්ඛවෙ රාජා අකාලෙ සෙනං උය්‍යොජෙති. යෙසං තං අමනාපං තෙසං එවං හොති, "රාජා ඛො පබ්බජිතෙන සංසට්ඨො සියා නු ඛො පබ්බජිතස්ස කම්මන්"ති. අයං භික්ඛවෙ අට්ඨමො ආදීනවො රාජන්තෙපුරප්පවෙසනෙ.

පුනචපරං භික්ඛවෙ රාජා කාලෙ සෙනං උය්‍යොජෙත්වා අන්තරාමග්ගතො නිවත්තාපෙති, යෙසං තං අමනාපං තෙසං එවං හොති. ,'රාජා ඛො පබ්බජිතෙන සංසට්ඨො, සියා නු ඛො පබ්බජිතස්ස කම්මන්"ති. අයං භික්ඛවෙ නවමො ආදීනවො රාජන්තෙපුරප්පවෙසනෙ.

පුනචපරං භික්ඛවෙ රඤ්ඤො රාජන්තෙපුරං හත්ථිසම්මද්දං අස්ස-සම්මද්දං රථසම්මද්දං රජනීයානි[1] රූපසද්දගන්ධරසඵොට්ඨබ්බානි යානි න පබ්බජිතස්ස සාරුප්පානි, අයං භික්ඛවෙ දසමො ආදීනවො රාජන්තෙපුරප්පවෙසනෙ. ඉමෙ ඛො භික්ඛවෙ දස ආදීනවා රාජන්තෙපුරප්පවෙසනෙති.

8. අථ ඛො භගවා ආයස්මන්තං ආනන්දං අනෙකපරියායෙන විගරහිත්වා දුබ්භරතාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

"යො පන භික්ඛු රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස[2] අනික්ඛන්තරාජකෙ අනිග්ගතරතනකෙ[3] පුබ්බෙ අප්පටිසංවිදිතො ඉන්දඛීලං අතික්කාමෙය්‍ය පාචිත්තියන්"ති.

9. යො පනාති: යො යාදිසො -පෙ- භික්ඛූති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

ඛත්තියො නාම: උභතො සුජාතො හොති මාතිතො ච පිතිතො ච සංසුද්ධගහණිකො යාව සත්තමා පිතාමහයුගා අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන.

මුද්ධාවසිත්තො නාම: ඛත්තියාභිසෙකෙන අභිසිත්තො හොති.

1. රජනීයානි - මජසං
2. මුද්ධාභිසිත්තස්ස - ස්‍යා.
3. අනිග්ගහරතනකෙ - මජසං.

තවද මහණෙනි, රජ තෙමේ නො කල්හි සෙන් (යුදයට) නඟා යවයි. එය යම් කෙනකුන්හට නො මැනැවි නම් ඔවුනට මෙසේ සිත් වෙයි: රජතෙමේ වනාහි පැවිද්දහු සමඟ ගැනී සිටියේ යැ. පැවිද්දගේ කම්යෙක් වන්නේ හො යි. මහණෙනි, රජහුගේ ඇතොවුරට පිවිසීමෙහි මේ අටවැනි ආදීනව යි.

තවද මහණෙනි, රජතෙමේ කල්හි සෙන් නඟා යවා අතරමඟින් නවත්වාලයි. එය යම් කෙනකුන්හට නො මැනැවි නම් ඔවුනට මෙසේ සිත් වෙයි. රජ තෙමේ වනාහි පැවිද්දහු සමඟ හැනී සිටියේ යැ. පැවිද්දගේ කම්යෙක් වන්නේ හො යි. මහණෙනි, රජහුගේ ඇතොවුරට පිවිසී මෙහි මේ නවවන ආදීනව යි.

තවද මහණෙනි, රජහුගේ ඇතොවුරෙහි ඇත්ගැටුම් අස්ගැටුම් රිය. ගැටුම් පැවිද්දහුට නො තිසි රාගයට කරුණු වූ රූ හඩ ගඳ රස පහස්හු වෙති. මහණෙනි, රජහුගේ ඇතොවුරට පිවිසීමෙහි මේ දසවන ආදීනව යි. මහණෙනි, මොහු වනාහි රජහුගේ ඇතොවුරට පිවිසීමෙහි දස ආදීනවයෝ යි.

8. ඉක්බිති භාගාවතුන් වහන්සේ නොයෙක් කරුණෙන් ආයුෂ්මත් අනඳ තෙරුන් ගරහා දුබරබව පිණිස...මෙසේ මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**"යම් මහණෙක් පෙර නොදන්වන ලද්දේ රජු නික්ම නොගිය කල්හි මෙහෙසිය නික්ම නො ගිය කල්හි මුදුනෙහි බිසෙස් කළ ක්ෂත්‍රිය රජක්හුගේ යහන් ගෙයි එළිපත ඉක්මවා නම් පචිති වේ" යැ යි.**

9. යො පන: යම්, යම්බඳු...භික්ඛු... මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

ඛත්තිය නම්- මවුපසින් හා පියපසින් හා දෙපසින් ෙවාගවට දුනුයේ ද පිරිසිදු මවුකුස ඇතියේ ද සත්වන කුලපරවිටිය තෙක් ජාතිවාදයෙන් බැහැර නො කරන ලදුයේ ද අවමන් නො කරන ලදුයේ ද වෙයි.

මුද්ධාවසිත්ත නම්: ක්ෂත්‍රියාභිෂෙකයෙන් අභිෂික්ත වූයේ වෙයි.

**අනික්ඛන්තරාජකෙති:** රාජා සයනිඝරා අනික්ඛන්තො හොති.

**අනිග්ගතරතනකෙති:** මහෙසී සයනිඝරා අනික්ඛන්තා හොති. උභො වා අනික්ඛන්තා හොන්ති.

**පුබ්බෙ අප්පටිසංවිදිතොති:** පුබ්බෙ අනිමන්තිතො.[1]

**ඉන්දඛීලො** නාම: සයනිඝරස්ස උම්මාරො වුච්චති.

සයනිඝරං නාම: යත්ථ කත්ථචි රඤ්ඤො සයනං පඤ්ඤත්තං හොති අන්තමසො සාණිපාකාරපරික්ඛිත්තම්පි.

**ඉන්දඛීලං අතික්කාමෙය්‍යාති:** පඨමං පාදං උම්මාරං අතික්කාමෙති ආපත්ති දුක්කටස්ස. දුතියං පාදං අතික්කාමෙති ආපත්ති පාචිත්තියස්ස.

අප්පටිසංවිදිතෙ අප්පටිසංවිදිතසඤ්ඤී ඉන්දඛීලං අතික්කාමෙති ආපත්ති පාචිත්තියස්ස. අප්පටිසංවිදිතෙ වෙමතිකො ඉන්දඛීලං අතික්කාමෙති ආපත්ති පාචිත්තියස්ස. අප්පටිසංවිදිතෙ පටිසංවිදිතසඤ්ඤී ඉන්දඛීලං අතික්කාමෙති ආපත්ති පාචිත්තියස්ස.

පටිසංවිදිතෙ අප්පටිසංවිදිතසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. පටිසංවිදිතෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. පටිසංවිදිතෙ පටිසංවිදිතසඤ්ඤී අනාපත්ති.

අනාපත්ති පටිසංවිදිතෙ න ඛත්තියො හොති; න ඛත්තියාභිසෙකෙන අභිසිත්තො හොති, රාජා වා[2] සයනිඝරා නික්ඛන්තො හොති- මහෙසී වා[2] සයනිඝරා නික්ඛන්තා හොති. උභො වා නික්ඛන්තා ච හොන්ති, න සයනිඝරෙ උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**රාජන්තෙපුරසික්ඛාපදං පඨමං.**[3]

---

1. අනාමන්තෙත්වා-මජස..
2. වාති පදං – මජසං නත්ථි
3. අන්තෙපුර සික්ඛාපදං – මජසං.

**අනික්ඛන්තරාජකෙ:** රජ තෙමේ යහන්ගෙයින් නො නික්මුණේ වෙයි.

**අනිග්ගතරතනකෙ:** මෙහෙසි තොමෝ යහන් ගෙයින් නො නික්මුණී වෙයි. දෙදෙන මැ හෝ නො නික්මුණාහු වෙත්.

**පුබ්බෙ අප්පටිසංවිදිතො:** පෙර නිමන්ත්‍රණ නොකරන ලදුයේ,

**ඉන්දඛීල** නම්: යහන් ගෙයි එළිපත කියනු ලැබෙයි.

**සයනිඝර** නම්: යම් කිසි තැනෙකැ රජහට යහනෙක් පනවන ලද වේ ද යටත්පිරිසෙයින් කඩතුරාවෙකින් වට කරන ලද්දෙකුත් වේ ද (එය යි).

**ඉන්දඛීලං අතික්කාමෙය්‍ය:** පළමු පිය එළිපත ඉක්මවා නම් දුකුළා ඇවැත් වෙයි. දෙවන පිය ඉක්මවා නම් පචිති ඇවැත් වේ.

නො දන්වන ලදුයෙහි නො දන්වනලද සන් ඇතියේ එළිපත ඉක්මවා නම් පචිති ඇවැත් වෙයි. නො දන්වනලදුයෙහි විමති ඇතියේ එළිපත ඉක්මවා නම් පචිති ඇවැත් වෙයි. නො දන්වන ලදුයෙහි දන්වන ලද සන් ඇතියේ එළිපත ඉක්මවා නම් පචිති ඇවැත් වේ.

දන්වන ලදුයෙහි නො දන්වන ලද සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. දන්වන ලදුයෙහි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. දන්වන ලදුයෙහි දන්වන ලද සන් ඇතියේ නම් ඇවැත් නැති.

දන්වන ලදුයෙහි, ක්ෂත්‍රියයෙක් නො වේ නම්, ක්ෂත්‍රියාභිෂෙක යෙන් අභිෂික්තයෙක් නො වේ නම්, රජතෙමේ හෝ යහන්ගෙයින් නික් මුණේ වේ නම්, මෙහෙසි තොමෝ හෝ යහන්ගෙයින් නික්මුණී වේ නම්, දෙදෙන මැ හෝ නික්මුණෝ වෙත් නම්, නො යහන්ගෙයි නම්, (ඇවැත්-නො වේ) උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**පළමුවැනි රාජන්තෙපුර ශික්ෂාපදයි.**

# 6. 9. 2

## රතනසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අචිරවතියා නදියා නහායති. අඤ්ඤතරොපි බ්‍රාහ්මණො පඤ්චසතානං ථවිකං ථලෙ නික්ඛිපිත්වා අචිරවතියා නදියා නහායිත්වා[1] විස්සරිත්වා අගමාසි. අථ ඛො සො භික්ඛු තස්සායං බ්‍රාහ්මණස්ස ථවිකා මා ඉධ නස්සීති අග්ගහෙසි. අථ ඛො සො බ්‍රාහ්මණො සරිත්වා තුරිතතුරිතො[2] ආධාවිත්වා තං භික්ඛුං එතදවොච: අපි මෙ භො ථවිකං පස්සෙය්‍යාසීති. හන්ද බ්‍රාහ්මණාති අදාසි. අථ ඛො තස්ස බ්‍රාහ්මණස්ස එතදහොසි. කෙන නු ඛො අහං උපායෙන ඉමස්ස භික්ඛුනො පුණ්ණපත්තං න දදෙය්‍යන්ති. න මෙ භො පඤ්චසතානි සහස්සං මෙති පලිබුද්ධිත්වා මුඤ්චි.

2. අථ ඛො සො භික්ඛු ආරාමං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, "කථං හි නාම භික්ඛු රතනං උග්ගහෙස්සතී"ති -පෙ- සච්චං කිර ත්වං භික්ඛු රතනං උග්ගහෙසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම ත්වං මොඝපුරිස රතනං උග්ගහෙස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යො පන භික්ඛු රතනං වා රතනසම්මතං වා උග්ගණ්හෙය්‍ය වා උග්ගණ්හාපෙය්‍ය වා පාචිත්තිය"න්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

3. තෙන ඛො පන සමයෙන සාවත්ථියං උස්සවො හොති, මනුස්සා අලඞ්කතපටියත්තා උය්‍යානං ගච්ඡන්ති. විසාඛාපි මිගාරමාතා අලඞ්කතපටියත්තා උය්‍යානං ගමිස්සාමීති ගාමතො නික්ඛමිත්වා "ක්‍යාහං කරිස්සාමි උය්‍යානං ගන්ත්වා' යන්නූනාහං භගවන්තං පයිරුපාසෙය්‍ය"න්ති ආභරණං ඔමුඤ්චිත්වා උත්තරාසඞ්ගෙන භණ්ඩිකං බන්ධිත්වා දාසියා අදාසි, "හන්ද ජෙ ඉමං භණ්ඩිකං ගණ්හාහී"ති. අථ ඛො විසාඛා මිගාරමාතා යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නං ඛො විසාඛං මිගාරමාතරං භගවා ධම්මියා කථාය සන්දස්සෙසි, සමාදපෙසි. සමුත්තෙජෙසි සම්පහංසෙසි. අථ ඛො විසාඛා මිගාරමාතා භගවතා ධම්මියා කථාය සන්දස්සිතා සමාදපිතා සමුත්තෙජිතා සම්පහංසිතා උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො සා දාසී තං භණ්ඩිකං විස්සරිත්වා අගමාසි. භික්ඛූ පස්සිත්වා භගවතො එතමත්ථං ආරොචෙසුං. තෙන හි භික්ඛවෙ උග්ගහෙත්වා නික්ඛිපථාති.

---

1. නහායන්තො – මජසං.
2. තුරිතො – මජසං.

## 6. 9. 2

## රතන ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි එක්තරා මහණෙක් අචිරවතී නදියෙහි ස්නාන කෙරෙයි. එක්තරා බමුණෙකුදු පන්සියයෙකින් පිරි පියැල්ලක් ගොඩබිමැ බහා තබා අචිරවතී නදියෙහි නහා නො සිහි කොට ගියේ යැ. එකල්හි එ මහණ ඒ බමුණාගේ මෙ පියැල්ල මෙහි නහමක් නසීව යි ගත්තේ යැ. එකල්හි ඒ බමුණා සිහි කොට වෙළෙවි වෙළෙවි වැ දිවැ අවුත් එමහණහට 'පින්වත, මාගේ පියැල්ල දක්නෙහි දැ' යි මෙය කී යැ. ඉද බමණැයි දීන. එකල්හි එ බමණහට මෙසිත විය; මම කිනම් උපායෙකින් මෙ මහණහට පූර්ණ පත්‍රය (සියයට පහ) නො දෙන්නෙම් දැ යි. පින්වත, මාගේ පන්සියයෙක් නො වෙයි. මාගේ දහසෙකැ යි වද දී මුදලී යැ.

2. ඉක්බිති ඒ මහණ ආරාමයට ගොස් මහණුන්හට තෙල කරුණ දැන්වී යැ. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් මහණෙක් රත්නයක් පිළිගත්තේ"දැ යි ...සැබෑ ද මහණ, තෙපි රත්නයක් පිළි ගත්තු දැ යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ය, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් හිස් පුරුෂය, තෙපි රත්නයක් පිළිගත්තහු ද? හිස් පුරුෂය, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...මෙසේ මහණෙනි, මේ සිකපදය උදෙසවු.

**"යම් මහණෙක් රත්නයක් හෝ රත්න සම්මතයක් හෝ ගන්නේ නම් හෝ ගන්වන්නේ නම් හෝ පචිති වේ" යයි.**

මෙසේ භාග්‍යවතුන් විසින් භික්ෂූන්හට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

3. එසමයෙහි වනාහි සැවැතෙහි උත්සවයෙක් වෙයි. මිනිස්සු අබරණ ලා සැරසුණාහු උයනට යෙති. විශාඛා මිගාරමාතෘ තොමෝත් අබරණ ලා සැරසුණී උයනට යන්නෙමැ යි ගමින් තික්ම මම උයනට ගොස් කුමක් කෙරෙම් ද? යම් හෙයකින් මම භාග්‍යවතුන් වහන්සේ පර්යුපාසන කරන්නෙම් නම් යෙහෙකැ යි අබරණ මුදපියා උතුරු සළුවෙන් පොදියක් බැඳ "ඉද කෙල්ල! මේ පොදිය ගනුව"යි දැස්සට දීන. ඉක්බිති විශාඛා මිගාරමාතෘ තොමෝ භාග්‍යවතුන් වෙතැ එළැඹියා යැ. එලැඹැ භාග්‍යවතුන් සකසා වැඳ එකත්පසෙකැ හුන්නී යැ. භාග්‍යවතුන් වහන්සේ එකත් පසෙක හුන් මිගාරමාතෘ වූ විසාඛාව දැහැමි කථායෙන් මොනවට කරුණු දක්වූ සේකැ මොනවට කරුණු ගැන්වූ සේකැ, මොනවට තෙද ගැන්වූ සේකැ මොනවට සතුටු කැරවූ සේකි. ඉක්බිති මිගාරමාතෘ විසාඛා තොමෝ භාග්‍යවතුන් විසින් මොනවට කරුණු දක්වන ලදුවා මොනවට කරුණු ගන්වන ලදුවා මොනවට තෙද ගන්වන ලදුවා මොනවට සතුටු කරවන ලදුවා හුනස්නෙන් නැඟී භාග්‍යවතුන් සකසා වැඳ පැදකුණු කොට ඉවත් වැ ගියා යැ. එකල්හි ඒ දසී තොමෝ ඒ පොදිය නො සිහි කොට ගියා යැ. භික්ෂූහු දැකැ භාග්‍යවතුන්හට තෙල කරුණ දැන්වූහු. එසේ නම් මහණෙනි, රැගෙනැ තැන්පත් කොට තබව යි.

4. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. අනුජානාමි භික්ඛවෙ රතනං වා රතනසම්මතං වා අජ්ඣාරාමෙ වා අජ්ඣාවසථෙ වා, උග්ගහෙත්වා වා උග්ගහාපෙත්වා වා නික්ඛිපිතුං යස්ස භවිස්සති සො හරිස්සතීති. එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**යො පන භික්ඛු රතනං වා රතනසම්මතං වා අඤ්ඤත්‍ර අජ්ඣාරාමා වා, අජ්ඣාවසථා වා උග්ගණ්හෙය්‍ය වා උග්ගණ්හාපෙය්‍ය වා පාචිත්තියන්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

5. තෙන ඛො පන සමයෙන කාසීසු ජනපදෙසු අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස කම්මන්තගාමො හොති, තෙන ච ගහපතිනා අන්තෙවාසී ආණත්තො හොති, සචෙ භදන්තා ආගච්ඡන්ති භත්තං කරෙය්‍යාසීති. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ කාසීසු ජනපදෙසු චාරිකං චරමානා යෙන අනාථපිණ්ඩිකස්ස ගහපතිස්ස කම්මන්තගාමො තෙනුපසඞ්කමිංසු. අද්දසා ඛො සො පුරිසො තෙ භික්ඛූ දූරතොව ආගච්ඡන්තෙ, දිස්වාන යෙන තෙ භික්ඛූ තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා තෙ භික්ඛූ අභිවාදෙත්වා එතදවොච. අධිවාසෙන්තු භන්තෙ අය්‍යා ස්වාතනාය ගහපතිනො භත්තන්ති. අධිවාසෙසුං ඛො තෙ භික්ඛූ තුණ්හීභාවෙන. අථ ඛො සො පුරිසො තස්සා රත්තියා අච්චයෙන පණීතං ඛාදනීයං භොජනීයං පටියාදපෙත්වා කාලං ආරොචාපෙත්වා අඞ්ගුලිමුද්දිකං ඔමුඤ්චිත්වා තෙ භික්ඛූ භත්තෙන පරිවිසිත්වා අය්‍යා භුඤ්ජිත්වා ගච්ඡන්තු, අහම්පි කම්මන්තං ගමිස්සාමීති අඞ්ගුලිමුද්දිකං විස්සරිත්වා අගමාසි. භික්ඛූ පස්සිත්වා සචෙ මයං ගමිස්සාම නස්සිස්සතායං අඞ්ගුලිමුද්දිකාති තත්ථෙව අච්ඡිංසු. අථ ඛො සො පුරිසො කම්මන්තා ආගච්ඡන්තො තෙ භික්ඛූ පස්සිත්වා එතදවොච: "කිස්ස භන්තෙ අය්‍යා ඉධෙව අච්ඡන්ති"ති. අථ ඛො තෙ භික්ඛූ තස්ස පුරිසස්ස එතමත්ථං ආරොචෙත්වා සාවත්ථිං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

6. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. "අනුජානාමි භික්ඛවෙ රතනං වා රතනසම්මතං වා අජ්ඣාරාමෙ වා අජ්ඣාවසථෙ වා උග්ගහෙත්වා වා උග්ගහාපෙත්වා වා නික්ඛිපිතුං යස්ස භවිස්සති සො හරිස්සතී"ති. එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**යො පන භික්ඛු රතනං වා රතනසම්මතං වා අඤ්ඤත්‍ර අජ්ඣාරාමා වා අජ්ඣාවසථා වා උග්ගණ්හෙය්‍ය වා උග්ගණ්හාපෙය්‍ය වා පාචිත්තියං, රතනං වා පන භික්ඛුනා රතනසම්මතං වා අජ්ඣාරාමෙ වා අජ්ඣාවසථෙ වා උග්ගහෙත්වා වා උග්ගහාපෙත්වා[1] වා නික්ඛිපිතබ්බං, යස්ස භවිස්සති සො හරිස්සතීති. අයං තත්ථ සාමීචීති.**

---

1. උග්ගණ්හාපෙත්වා - සිමු.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණෙහි ලා මෙ අවසර යෙහි ලා දැහැමි කථා කොට මහණුන් ඇමැතුසේකැ. "මහණෙනි රත්නයක් හෝ රත්නසම්මතයක් හෝ ඇතුළු අරමෙහි හෝ ඇතුළු අවසෙහි හෝ රැගෙනැ හෝ ගන්වා ගෙනැ හෝ 'මේ යමක්හුගේ වන්නේ නම් හේ ගෙනැයන්නේ යැ යි නඟා තැබීමට අනුදනිමි." මෙසේ ද මහණෙනි මේ සිකපදය උදෙසවු:

**යම් මහණෙක් රත්නයක් හෝ රත්නසම්මතයක් හෝ ඇතුළු අරම හෝ අවස හෝ තබා ගන්නේ නම් හෝ ගන්වන්නේ නම් හෝ පචිති වේ යැයි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් භික්ෂූන්හට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

5. එසමයෙහි වනාහි කාසී ජනපදයෙහි අනේපිඩු ගැහැවිහුගේ කර්මාන්ත ග්‍රාමයෙක් වෙයි. ඒ ගැහැවි විසිනුදු අතැවැසි අණවන ලද්දේ වෙයි, ඉදින් හිමිවරු පැමිණෙත් නම් බත් (පිළියෙළ) කරන්නෙහි ය යි, එසමයෙහි වනාහි බොහෝ භික්ෂුහු කාසි ජනපදයෙහි සැරිසරනුවෝ අනේපිඩු ගැහැවිහුගේ කමත්ගමට එළැඹියහ. ඒ පුරුෂ තෙමේ දුර දී මැ එන්නා වූ ඒ මහණුන් දිට. දැකැ ඒ මහණුන් වෙතැ එළැඹියේ යැ. එළැඹැ ඒ මහණුන් සකසා වැඳ මෙය කී යැ. ස්වාමීනි, ආයසීයෝ සෙට දවස පිණිස ගැහැවිහුගේ බත ඉවසත්වයි. ඒ භික්ෂූහු තුෂ්ණිම්භාවයෙන් ඉවසූහ. එකල්හි ඒ පුරුෂ තෙමේ එරය ඇවෑමෙන් කෑ යුතු බුදිය යුතු පිණි දය පිළියෙළ කරවා කල් දන්වා ඇඟිලිමුදුව මුදපියා ඒ මහණුන් බතින් වළඳවා ආයසීයෝ වළඳා නිමවා යෙත්වා මම ද කමතට යන්නෙමි යි ඇඟිලිමුදුව නො සිහි කොට ගියේ යැ. භික්ෂූහු දැකැ ඉදින් ඇපි යන්නෙමු නම් මේ ඇඟිලිමුදුව නැසෙන්නේ යැ යි එහි මැ හුන්හු. ඉක්බිති ඒ පුරුෂ තෙමේ කමතින් එන්නේ ඒ මහණුන් දැකැ මෙය කී යැ. කුමකට ස්වාමීනි" ආයසීයෝ මෙහි මැ හිඳිද්දූ යි. එකල්හි ඒ භික්ෂූහු ඒ පුරුෂයහට තෙල කරුණ සැල කොට සැවැතට ගොස් මහණුන්හට තෙල කරුණ දැන්වූහු. භික්ෂූහු භාග්‍යවතුන්හට තෙල කරුණ දැන්වූහු.

6. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණෙහි ලා මෙ අවසරයෙහි ලා දැහැමි කථා කොට මහණුන් ඇමතූ සේකැ. "මහණෙනි, ඇතුළු අරමෙහි හෝ ඇතුළුගෙහි හෝ රත්නයක් හෝ රත්න සම්මතයක් හෝ රැගෙනැ හෝ ගන්වාගෙනැ හෝ මේ යමක්හුගේ වන්නේ නම් හේ රැගෙන යන්නේ යැ යි නඟා තැබීමට අනුදනිමි" මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**යම් මහණෙක් ඇතුළු අරම හෝ ඇතුළුගෙය හෝ හැර රත්නයක් හෝ රත්නසම්මතයක් හෝ ගන්නේ නම් හෝ ගන්වන්නේ නම් හෝ පචිති වේ. මහණහු විසින් ඇතුළු අරමෙහි හෝ ඇතුළුගෙයි හෝ රත්නයක් හෝ රත්නසම්මතයක් හෝ රැගෙන හෝ ගන්වා ගෙනැ හෝ යමක්හුගේ වන්නේ නම් හේ ගෙනැයන්නේ යැ යි නඟා තැබිය යුතු යි මේ එහි අනුධර්මතා යි.**

7. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**රතනං** නාම: මුත්තා මණි වෙළුරියො සඞ්ඛො සිලා පවාළං රජතං ජාතරූපං ලොහිතඞ්කො මසාරගල්ලං.

**රතනසම්මතං** නාම: යං මනුස්සානං උපභොගපරිභොගං එතං රතනසම්මතං නාම.

**අඤ්ඤත්‍ර අජ්ඣාරාමා වා අජ්ඣාවසථා වාති:** ඨපෙත්වා අජ්ඣාරාමං අජ්ඣාවසථං.

**අජ්ඣාරාමො** නාම: පරික්ඛිත්තස්ස ආරාමස්ස අන්තො ආරාමො. අපරික්ඛිත්තස්ස උපචාරො.

**අජ්ඣාවසථො** නාම: පරික්ඛිත්තස්ස ආවසථස්ස අන්තො ආවසථො. අපරික්ඛිත්තස්ස උපචාරො.

**උග්ගණ්හෙය්‍යාති:** සයං ගණ්හාති, ආපත්ති පාචිත්තියස්ස.

**උග්ගණ්හාපෙය්‍යාති:** අඤ්ඤං ගණ්හාපෙති ආපත්ති පාචිත්තියස්ස.

8. රතනං වා පන භික්ඛුනා රතනසම්මතං වා අජ්ඣාරාමෙ වා අජ්ඣාවසථෙ වා උග්ගහෙත්වා වා උග්ගහාපෙත්වා වා **නික්ඛිපිතබ්බන්ති,** රූපෙන වා නිමිත්තෙන වා සඤ්ඤාණං කත්වා නික්ඛිපිත්වා ආචික්ඛිතබ්බං යස්ස භණ්ඩං නට්ඨං සො ආගච්ඡතූති. සචෙ තත්ථ ආගච්ඡති, සො වත්තබ්බොආවුසො කීදිසං තෙ භණ්ඩන්ති. සචෙ රූපෙන වා නිමිත්තෙන වා සම්පාදෙති දාතබ්බං. නො චෙ සම්පාදෙති විචිනාහි ආවුසොති වත්තබ්බො. තම්හා ආවාසා පක්කමන්තෙන යෙ තත්ථ හොන්ති භික්ඛූ පතිරූපා තෙසං හත්ථෙ නික්ඛිපිත්වා පක්කමිතබ්බං. නො චෙ හොන්ති භික්ඛූ පතිරූපා, යෙ තත්ථ හොන්ති ගහපතිකා පතිරූපා තෙසං හත්ථෙ නික්ඛිපිත්වා පක්කමිතබ්බං, අයං තත්ථ සාමීචීති අයං තත්ථ අනුධම්මතා.

**අයං තත්ථ සාමීචීති අයං තත්ථ අනුධම්මතා.**

**අනාපත්ති:** රතනං වා රතනසම්මතං වා අජ්ඣාරාමෙ වා අජ්ඣාවසථෙ වා උග්ගහෙත්වා වා උග්ගහාපෙත්වා වා නික්ඛිපති යස්ස භවිස්සති සො හරිස්සතීති. රතනසම්මතං විස්සාසං ගණ්හාති, තාවකාලිකං ගණ්හාති, පංසුකූලසඤ්ඤිස්ස, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**රතනසික්ඛාපදං දුතියං.**

7. **යො පන**: යම්, යම්බඳු...භික්ඛු...මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**රතන** නම්: මුතු යැ මිණි යැ වෙරළුමිණි යැ සක් යැ මුංවන්සල යැ පබළු යැ රිදී යැ රන් යැ පියුම්රාමිණි යැ මැසිරිගල් යැ.

**රතනසම්මත** නම්: යම් වතෙක් මිනිසුන්ගේ උපභොග පරිභොග නම් තෙලෙ රතනසම්මත නම් වේ.

**අඤ්ඤත්‍ර අජ්ඣාරාමා වා අජ්ඣාවසථා වා**: අධ්‍යාරාමය අධ්‍යාවසථය තබා; අධ්‍යාරාමය නම් පරික්ෂිප්ත ආරාමයාගේ ඇතුළු අරම යැ, අපරික්ෂිප්තයාගේ උපචාරය යි. අධ්‍යාවසථය නම්: පරික්ෂිප්ත ආවසථයාගේ ඇතුළු ආවාස යැ අපරික්ෂිප්තයාගේ උපචාරය යි.

**උග්ගණ්හෙය්‍ය**; තෙමේ ගනී නම් පචිති ඇවැත් වේ.

**උග්ගණ්හාපෙය්‍ය**; මෙරමා ලවා ගන්වා නම් පචිති ඇවැත් වේ.

**රතනං වා පන භික්ඛුනා රතනසම්මතං වා අජ්ඣාරාමෙ වා අජ්ඣාවසථෙ වා උග්ගහෙත්වා වා උග්ගහාපෙත්වා වා නික්ඛිපිතබ්බං;**

රූපයෙන් හෝ නිමිත්තෙන් හෝ සලකුණු කොට නහා තබා කිය යුතු යි: යමක්හුගේ බඩුවෙක් නටුයේ නම් හේ පැමිණේව යි. ඉදින් එහි පැමිණේ නම් ඇවැත්නි, තොපගේ බඩුව කෙබඳු දැ යි හේ කියයුත්තේ යි. ඉදින් රූපයෙන් හෝ නිමිත්තෙන් හෝ සම කොට කියා නම් දිය යුතු යි. ඉදින් සම කොට නො කියා නම් "ඇවැත්නි" සොය යි කිය යුත්තේ යි. ඒ අවසින් ඉවත් වැ යන්නහු විසින් එහි යම් සුදුසු මහණ කෙනෙක් වෙත් නම් ඔවුන්ගේ අතෙහි නහා තබා ඉවත් වැ යා යුතු යි. ඉදින් සුදුසු මහණ කෙනෙක් නො වෙත් නම් එහි සුදුසු යම් ගැහැවි කෙනෙක් වෙත් නම් ඔවුන්ගේ අතෙහි නහා තබා ඉවත් වැ යා යුතු යි.

**අයං තත්ථ සාමීචි**: මේ එහි අනුධම්තා යි.

ඇතුළු අරමෙහි හෝ ඇතුළුගෙයි හෝ රත්නයක් හෝ රත්න සම්මතයක් හෝ රැගෙනැ හෝ ගන්වාගෙනැ හෝ යමක්හුගේ වන්නේ නම් හේ රැගෙන යන්නේ යැයි නහා තබා නම්, රත්න සම්මතයක් විස්වස් වැ ගනී නම් තවුකැලි වැ ගනී නම් ඇවැත් නැති, පංසුකූල සඤ්ඤියහට උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**දෙවැනි රතන ශික්ෂාපද යි**

## 6. 9. 3

## විකාලෙ ගාමප්පවෙසනසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ විකාලෙ ගාමං පවිසිත්වා සභායං නිසීදිත්වා අනෙකවිහිතං තිරච්ඡානකථං කථෙන්ති, සෙය්‍යථීදං? රාජකථං චොරකථං මහාමත්තකථං සෙනාකථං භයකථං යුද්ධකථං අන්නකථං පානකථං වත්ථකථං සයනකථං මාලාකථං ගන්ධකථං ඤාතිකථං යානකථං ගාමකථං නිගමකථං නගරකථං ජනපදකථං ඉත්ථිකථං පුරිසකථං සූරකථං[1] විසිඛාකථං කුම්භට්ඨානකථං පුබ්බපෙතකථං නානත්තකථං ලොකක්ඛායිකං සමුද්දක්ඛායිකං ඉතිභවාභවකථං ඉති වා. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, "කථං හි නාම සමණා සක්‍යපුත්තියා විකාලෙ ගාමං පවිසිත්වා සභායං නිසීදිත්වා අනෙකවිහිතං තිරච්ඡානකථං කථෙස්සන්ති සෙය්‍යථීදං රාජකථං චොරකථං -පෙ- ඉතිභවාභවකථං ඉති වා. සෙය්‍යථාපි ගිහී කාමභොගිනො"ති.

2. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ විකාලෙ ගාමං පවිසිත්වා සභායං නිසීදිත්වා අනෙකවිහිතං තිරච්ඡානකථං කථෙස්සන්ති, සෙය්‍යථීදං රාජකථං චොරකථං -පෙ- ඉතිභවාභවකථං ඉතිවාති. -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ විකාලෙ ගාමං පවිසිත්වා සභායං නිසීදිත්වා අනෙකවිහිතං තිරච්ඡානකථං කථෙථ, සෙය්‍යථීදං රාජකථං චොරකථං -පෙ- ඉතිභවාභවකථං ඉති වාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා විකාලෙ ගාමං පවිසිත්වා සභායං නිසීදිත්වා අනෙකවිහිතං තිරච්ඡානකථං කථෙස්සථ, සෙය්‍යථීදං රාජකථං චොරකථං -පෙ- ඉතිභවාභවකථං ඉති වා. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**යො පන භික්ඛු විකාලෙ ගාමං පවිසෙය්‍ය පාචිත්තියන්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

---

1. සුරාකථං - සිමු i සිමු ii

## 6. 9. 3

## විකාලෙ ගාමප්පවෙසන ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්නුවර ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරමහි වැඩැවෙසෙති. එසමයෙහි ඡනාහි සවග මහණහු විකාලයෙහි ගමට පිවිස සභායෙහි හිඳ නානා ප්‍රකාර වූ තිරශ්චීනකථා කියති. හේ මෙසේ යැ: රාජකථා යැ චොරකථා යැ මහාමාත්‍රකථා යැ සේනාකථා යැ භයකථා යැ යුද්ධකථා යැ අන්නකථා යැ පානකථා යැ වස්ත්‍රකථා යැ ශයනකථා යැ මාලාකථා යැ ගන්ධකථා යැ ඥාතිකථා යැ යානකථා යැ ග්‍රාමකථා යැ නිගමකථා යැ නගරකථා යැ ජනපදකථා යැ ස්ත්‍රීකථා යැ පුරුෂකථා යැ සූරකථා යැ විශිඛාකථා යැ කුම්භස්ථානකථා යැ පූර්වප්‍රෙතකථා යැ නානාත්වකථා යැ ලොකාඛ්‍යායිකා යැ සමුද්‍රාඛ්‍යායිකා යැ ඉතිභවාභවකථා යනාදී හු යැ. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවති: ''කෙසේ නම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රියයෝ විකාලයෙහි ගමට පිවිස සභායෙහි හිඳ කාමභොගී ගිහියන් මෙන් නානාප්‍රකාර වූ තිරශ්චීනකථා කීහු ද? ඔහු මෙසේ යැ; රාජකථා යැ චොරකථා යැ...ඉතිභාවාභවකථා යැ යනාදීහු යි.

2. භික්ෂූහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්:'' කෙසේ නම් සවග මහණෝ විකාලයෙහි ගමට පිවිස සභායෙහි හිඳ නානා ප්‍රකාර වූ තිරශ්චීනකථා කීහු ද? හෙ මෙසේ යැ. රාජකථා යැ චොරකථා යැ ...ඉතිභවාභවකථා යැ යනාදීහු යැ. සැබෑ ද මහණෙනි. තෙපි විකාල-යෙහි ගමට පිවිස සභායෙහි හිඳ නානාප්‍රකාර වූ තිරශ්චීනකථා කියවු ද? හෙ මෙසේ යැ. රාජකථා යැ චොරකථා යැ...ඉතිභවාභවකථා යැ යනාදීහු යැ. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ...කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි විකාලයෙහි ගමට පිවිස සභායෙහි හිඳ නානා ප්‍රකාර වූ තිරශ්චීන කථා කීවාහු ද? ඔහු මෙසේ යැ රාජකථා යැ චොරකථා යැ...ඉතිභවාභවකථා යැ යනාදීහු යැ. හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්න-යන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වේ යි......මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**යම් මහණෙක් විකාලයෙහි ගම් වදනේ නම් පචිති වේ ය යි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් භික්ෂූන්හට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

3. තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛූ කොසලෙසු ජනපදෙසු සාවත්ථිං ගච්ඡන්තා සායං අඤ්ඤතරං ගාමං උපගච්ඡිංසු මනුස්සා තෙ භික්ඛූ පස්සිත්වා එතදවොචුං: "පවිසථ භන්තෙ"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතා පටික්ඛිත්තං විකාලෙ ගාමං පවිසිතුන්ති කුක්කුච්චායන්තා න පාවිසිං. චොරා තෙ භික්ඛූ අච්ඡින්දිංසු. අථ ඛො තෙ භික්ඛූ සාවත්ථිං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. "අනුජානාමි භික්ඛවෙ ආපුච්ඡා විකාලෙ ගාමං පවිසිතුං" එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**යො පන භික්ඛු අනාපුච්ඡා විකාලෙ ගාමං පවිසෙය්‍ය පාචිත්තියන්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

4. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු කොසලෙසු ජනපදෙසු සාවත්ථිං ගච්ඡන්තො සායං අඤ්ඤතරං ගාමං උපගඤ්ඡි. මනුස්සා තං භික්ඛුං පස්සිත්වා එතදවොචුං: "පවිසථ භන්තෙ"ති. අථ ඛො සො භික්ඛු භගවතා පටික්ඛිත්තං අනාපුච්ඡා විකාලෙ ගාමං පවිසිතුන්ති කුක්කුච්චායන්තො න පාවිසි. චොරා තං භික්ඛුං අච්ඡින්දිංසු. අථ ඛො සො භික්ඛු සාවත්ථිං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. "අනුජානාමි භික්ඛවෙ සන්තං භික්ඛුං ආපුච්ඡා විකාලෙ ගාමං පවිසිතුං" එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**යො පන භික්ඛු සන්තං භික්ඛුං අනාපුච්ඡා විකාලෙ ගාමං පවිසෙය්‍ය පාචිත්තියන්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

5. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු අහිනා දට්ඨො හොති. අඤ්ඤතරො භික්ඛු අග්ගිං ආහරිස්සාමීති ගාමං ගච්ඡති. අථ ඛො සො භික්ඛු භගවතා පටික්ඛිත්තං සන්තං භික්ඛුං අනාපුච්ඡා විකාලෙ ගාමං පවිසිතුන්ති කුක්කුච්චායන්තො න පාවිසි. භගවතො එතමත්ථං ආරොචෙසුං අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි, "අනුජානාමි භික්ඛවෙ තථාරූපෙ අච්චායිකෙ කරණීයෙ සන්තං භික්ඛුං අනාපුච්ඡා විකාලෙ ගාමං පවිසිතුං" එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ.

**යො පන භික්ඛු සන්තං භික්ඛුං අනාපුච්ඡා විකාලෙ ගාමං පවිසෙය්‍ය අඤ්ඤත්‍ර තථාරූපා අච්චායිකා කරණීයා පාචිත්තියන්ති.**

3. එසමයෙහි වනාහි බොහෝ භික්ෂූහු කොසොල් දනව්වෙහි සිට සැවැතට යන්නාහු සවසැ එක්තරා ගමක් වෙත පැමිණියහ. මිනිස්සු ඒ මහණුන් දැකැ තෙල කීහු: ''වහන්ස, පිවිසෙනු මැනැවැ''යි. එකල්හි ඒ භික්ෂූහු විකාලයෙහි ගම් වදනට භාග්‍යවතුන් විසින් ප්‍රතික්ෂෙප කරන ලද යි කුකුසනුවෝ නො පිවිසියහ. සොරු ඒ මහණුන් අසිදගත්හ. එකල්හි ඒ භික්ෂූහු සැවැතට ගොස් මහණුන්හට තෙල කරුණු දන්වූහු. භික්ෂූහු භාග්‍යවතුන්හට තෙල කරුණ දන්වූහු. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණෙහි ලා මෙ අවසරයෙහි ලා දහැම් කථා කොට මහණුන් ඇමතූසේකැ. ''මහණෙනි, පිළිවිසැ විකාලයෙහි ගම් වදනට අනුදනිමි'' මෙසේ ද මහණෙනි මේ සිකපදය උදෙසවු:

**යම් මහණෙක් නො පිළිවිසැ විකාලයෙහි ගම් වදනේ නම් පචිති වේ යයි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් භික්ෂූන්හට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

4. එසමයෙහි වනාහි එක්තරා මහණෙක් කොසොල් දනව්වෙහි සිට සැවැතට යන්නේ සවසැ එක්තරා ගමකට පැමිණියේ යැ. මිනිස්සු එමහණ දැක තෙල කීහු: ''වහන්ස පිවිසෙන්නැ''යි එකල්හි ඒ මහණ නො පිළිවිසැ විකාලයෙහි ගම් වදනට භාග්‍යවතුන් විසින් ප්‍රතික්ෂෙප කරන ලදයි කුකුසනුයේ නො පිවිසියේ යැ. සොරු එ මහණහු අසිදගත්හ. එකල්හි ඒ මහණ සැවැතට ගොස් මහණුන්හට තෙල කරුණ දන්වී යැ. භික්ෂූහු භාග්‍යවතුන්හට තෙල කරුණ දන්වූහු. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණෙහිලා මෙ අවසරයෙහිලා දහැමි කථා කොට මහණුන් ඇමැතුසේකැ. ''මහණෙනි ඇති මහණක්හු පිළිවිසැ විකාලයෙහි ගම් වදින්නට අනුදනිමි'' මෙසේ ද මහණෙනි මේ සිකපදය උදෙසවු:

**යම් මහණෙක් ඇති මහණක්හු නො පිළිවිසැ විකාලයෙහි ගම් වදනේ නම් පචිති වේ යයි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් භික්ෂූන්හට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

5. එසමයෙහි වනාහි එක්තරා මහණෙක් සර්පයකු විසින් දෂ්ට කරන ලද්දේ වෙයි. එක්තරා මහණෙක් ගිනි ගෙනැ එන්නෙමැ යි ගමට යෙයි. එකල්හි ඒ මහණ ඇති මහණක්හු නො පිළිවිසැ විකාලයෙහි ගමට පිවිසෙන්නට භාග්‍යවතුන් විසින් ප්‍රතික්ෂෙප කරන ලද යි කුකුසනුයේ නො පිවිසියේ යැ. භාග්‍යවතුන්හට තෙල කරුණ දන්වූහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණෙහි ලා මෙ අවසරයෙහි ලා දහැම් කථා කොට මහණුන් ඇමැතුසේකැ. ''මහණෙනි, එබඳු අත්‍යායික කාර්‍ය්‍යයක් ඇති කල්හි ඇති මහණක්හු නො පිළිවිසැ විකාලයෙහි ගම් වදනට අනුදනිමි'' මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු

**යම් මහණෙක් එබඳු අත්‍යායික කාර්‍ය්‍යයක් තබා ඇති මහණක්හු නො පිළි විසැ විකාලයෙහි ගම් වදනේ නම් පචිති වේ යයි.**

6. යො පනාති: යො යාදිසො -පෙ- භික්ඛූති -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

සන්තො නාම භික්ඛු: සක්කා හොති ආපුච්ඡා පවිසිතුං.

අසන්තො නාම භික්ඛු: න සක්කා හොති ආපුච්ඡා පවිසිතුං.

විකාලො නාම මජ්ඣන්හිකෙ වීතිවත්තෙ යාව අරුණුග්ගමනා.

ගාමං පවිසෙය්‍යාති: පරික්ඛිත්තස්ස ගාමස්ස පරික්ඛෙපං අතික්කමන්තස්ස ආපත්ති පාචිත්තියස්ස. අපරික්ඛිත්තස්ස ගාමස්ස උපචාරං ඔක්කමන්තස්ස ආපත්ති පාචිත්තියස්ස.

අඤ්ඤත්‍ර තථාරූපා අච්චායිකා කරණීයාති: ඨපෙත්වා තථාරූපං අච්චායිකං කරණීයං.

විකාලෙ විකාලසඤ්ඤී සන්තං භික්ඛුං අනාපුච්ඡා ගාමං පවිසති අඤ්ඤත්‍ර තථාරූපා අච්චායිකා කරණීයා ආපත්ති පාචිත්තියස්ස. විකාලෙ වෙමතිකො සන්තං භික්ඛුං අනාපුච්ඡා ගාමං පවිසති අඤ්ඤත්‍ර තථාරූපා අච්චායිකා කරණීයා ආපත්ති පාචිත්තියස්ස. විකාලෙ කාලසඤ්ඤී සන්තං භික්ඛුං අනාපුච්ඡා ගාමං පවිසති අඤ්ඤත්‍ර තථාරූපා අච්චායිකා කරණීයා ආපත්ති පාචිත්තියස්ස.

කාලෙ විකාලසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. කාලෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. කාලෙ කාලසඤ්ඤී අනාපත්ති.

අනාපත්ති: තථාරූපෙ අච්චායිකෙ කරණීයෙ සන්තං භික්ඛුං ආපුච්ඡා පවිසති, අසන්තං භික්ඛුං අනාපුච්ඡා පවිසති, අන්තරාරාමං ගච්ඡති, භික්ඛුනුපස්සයං ගච්ඡති, තිත්ථියසෙය්‍යං ගච්ඡති, පටික්කමනං ගච්ඡති; ගාමෙන මග්ගො හොති, ආපදාසු, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

විකාලෙ[1]ගාමප්පවෙසනසික්ඛාපදං තතියං

1. විකාල - මජසං.

6. **යො පන**: යම්, යම්බඳු...භික්ඛු...මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**සන්තභික්ඛු** නම්: පිළිවිසැ පිවිසෙන්නට සමර්ථ වෙයි;

**අසන්ත භික්ඛු** නම්: පිළිවිසැ පිවිසෙන්නට අසමර්ථ වෙයි;

**විකාල** නම්: මද්දහන ඉක්මුණු කල්හි අරුණ නැඟීම දක්වා;

**ගාමං පවිසෙය්‍ය**; පරික්ෂිප්ත ග්‍රාමයාගේ පරික්ෂෙපය ඉක්මවන්නාහට පචිති ඇවැත් වෙයි. අපරික්ෂිප්ත ග්‍රාමයාගේ උපචාරයට බස්නාහට පචිති ඇවැත් වෙ.

**අඤ්ඤත්‍ර තථාරූපා අච්චායිකා කරණීයා**: එබඳු අත්‍යායික කාර්‍ය්‍යයක් තබා;

විකල්හි විකල්සන් ඇතියේ එබඳු ඉක්මන් කටයුත්තක් තබා විද්‍යමාන මහණක්හු නො පිළිවිසැ ගම් වදී නම් පචිති ඇවැත් වෙයි. විකල්හි විමති ඇතියේ එබඳු ඉක්මන් කටයුත්තක් තබා ඇති මහණක්හු නො පිළිවිසැ ගම් වදී නම් පචිති ඇවැත් වෙයි. විකල්හි කල්සන් ඇතියේ එබඳු ඉක්මන් කටයුත්තක් තබා ඇති මහණක්හු නො පිළිවිසැ ගම් වදී නම් පචිති ඇවැත් වෙ.

කල්හි විකල්සන් ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි, කල්හි විමති ඇතියේ නම් දුකුළා ඇවැත් වෙයි. කල්හි කල්සන් ඇතියේ නම් ඇවැත් නැති.

එබඳු ඉක්මන් කටයුත්තක් ඇති කල්හි නම්, විද්‍යමාන මහණක්හු පිළිවිසැ පිවිසේ නම්, නැති මහණක්හු නො පිළිවිසැ පිවිසේ නම්, අන් අරම කට යේ නම්, මෙහෙණවරට යේ නම්, අන් තොටු සෙනසුනකට යේ නම්, දන් වළඳන තැනට යේ නම්, ගමින් මඟ වේ නම් ඇවැත් නැති. ආපදවෙහි, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**තුන්වැනි විකාලෙ ගාමප්පවෙසන ශික්ෂාපද යි**

## 6. 9. 4

## සූචිඝරසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරෙන දන්තකාරෙන භික්ඛූ පවාරිතා හොන්ති යෙසං අය්‍යානං සූචිඝරෙන අත්ථො අහං සූචිඝරෙනාති, තෙන ඛො පන සමයෙන භික්ඛූ බහූ සූචිඝරෙ විඤ්ඤාපෙන්ති. යෙසං ඛුද්දකා සූචිඝරා තෙ මහන්තෙ සූචිඝරෙ විඤ්ඤාපෙන්ති, යෙසං මහන්තා සූචිඝරා තෙ ඛුද්දකෙ සූචිඝරෙ විඤ්ඤාපෙන්ති, අථ ඛො සො දන්තකාරො භික්ඛූනං බහූ සූචිඝරෙ කරොන්තො න සක්කොති අඤ්ඤං වික්කායිකං භණ්ඩං කාතුං, අත්තනාපි න යාපෙති, පුත්තදාරාපිස්ස[1] කිලමන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, "කථං හි නාම සමණා සක්‍යපුත්තියා න මත්තං ජානිත්වා බහූ සූචිඝරෙ විඤ්ඤාපෙස්සන්ති. අයං ඉමෙසං බහූ සූචිඝරෙ කරොන්තො න සක්කොති අඤ්ඤං වික්කායිකං භණ්ඩං කාතුං අත්තනාපි න යාපෙති පුත්තදාරාපිස්ස කිලමන්තීති.

2. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. "කථං හි නාම භික්ඛූ න මත්තං ජානිත්වා බහූ සූචිඝරෙ විඤ්ඤාපෙස්සන්ති"ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛූ න මත්තං ජානිත්වා බහූ සූචිඝරෙ විඤ්ඤාපෙන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා න මත්තං ජානිත්වා බහූ සූචිඝරෙ විඤ්ඤාපෙස්සන්ති, නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**යො පන භික්ඛු අට්ඨිමයං වා දන්තමයං වා විසාණමයං වා සූචිඝරං කාරාපෙය්‍ය භෙදනකං පාචිත්තියන්ති.**

3. යො පනාති; යො යාදිසො -පෙ- භික්ඛූති; -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**අට්ඨි** නාම: යං කිඤ්චි අට්ඨි.

**දන්තො** නාම: හත්ථිදන්තො වුච්චති.

**විසාණං** නාම: යං කිඤ්චි විසාණං.

**කාරාපෙය්‍යාති:** කරොති වා කාරාපෙති වා පයොගෙ දුක්කටං පටිලාභෙන භින්දිත්වා පාචිත්තියං දෙසෙතබ්බං.

1. පුත්තදාරොපිස්ස කිලමති - සී, මජ්ඣං.

# 6. 9. 4

## සූචිඝර ශික්ෂාපදය

1 එසමයෙහි භාග්‍යවත් බුදුහු ශාක්‍ය ජනපදයෙහි කිඹුල්වත්පුර නුගඅරම්හි වැඩ වෙසෙති. එසමයෙහි වනාහි එක්තරා දළකම්කරුවකු විසින් භික්ෂූහු පවරන ලද්දහු වෙති. යම් හිමි කෙනකුන්හට හිදිගුළායෙන් ප්‍රයෝජනයෙක් වේ නම් හිදිගුළායෙන් මම පවරමැ යි. එසමයෙහි වනාහි භික්ෂූහු බොහෝ හිදිගුළා විනවති. යම් කෙනකුන්හට කුඩා හිදිගුළා වෙත් නම් ඔහු මහත් හිදිගුළා විනවති. යම් කෙනකුන්හට මහත් හිදිගුළා වෙත් නම් ඔහු කුඩා හිදිගුළා විනවත්. එකල්හි ඒ දළකම්කරු තෙමේ මහණුන් හට බොහෝ හිදිගුළා කරනුයේ අන් විකිණිය යුතු බඩුවක් කරන්නට නො හැකි වෙයි. තෙමේත් නො යැපෙයි. ඔහුගේ අඹුදරුවෝත් මිරිකෙත්. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ පමණ නො දැනැ බොහෝ හිදිගුළා විනවූහු''ද ? මෙතෙමේ මොවුනට බොහෝ හිදිගුළා කරනුයේ අන් විකිණිය යුතු බඩුවක් කරන්නට නො හැකි වෙයි. තෙමේත් නො යැපෙයි. මොහුගේ අඹුදරුවෝත් මිරිකෙත්''යයි.

2. භික්ෂූහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ...ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්'' කෙසේ නම් භික්ෂූහු පමණ නො දැනැ බොහෝ හිදිගුළා විනවූහු ද යි...සැබෑ ද මහණෙනි භික්ෂූහු පමණ නො දැනැ බොහෝ හිදිගුළා විනවද්ද යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ....කෙසේ නම් මහණෙනි, ඒ හිස් පුරුෂයෝ පමණ නො දැනැ බොහෝ හිදිගුළා විනවූහු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**යම් මහණෙක් ඇටමුවා හෝ දළමුවා හෝ අංමුවා හෝ හිදිගුළාවක් කරවා නම් භෙදනක පචිති ඇවැත් වෙ යයි.**

3. **යො පන:** යම්, යම්බඳු...භික්ඛු...මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**අට්ඨි නම:** යම් කිසි ඇටයෙක්;

**දන්ත නම:** ඇත්දතැයි කියනු ලැබෙ.

**විසාණ නම:** යම් කිසි හඟෙක්;

**කාරාපෙය්‍ය:** කෙරේ නම් හෝ කරවා නම් හෝ පියෝහි දුකුළා වෙයි. ලැබීමෙන් බිඳ පියා පචිති ඇවැත් දෙසිය යුතු.

අත්තනා විප්පකතං අත්තනා පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස. අත්තනා විප්පකතං පරෙහි පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස පරෙහි විප්පකතං අත්තනා පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස. පරෙහි විප්පකතං පරෙහි පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස.

අඤ්ඤස්සත්ථාය කරොති වා කාරාපෙති වා ආපත්ති දුක්කටස්ස. අඤ්ඤෙන කතං පටිලභිත්වා පරිභුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති** ගණ්ඨිකාය[1] අරණිකෙ, විධෙ[2], අඤ්ජනියා, අඤ්ජනිසලාකාය, වාසිජටෙ, උදකපුඤ්ජනියා, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**සූචිඝරසික්ඛාපදං චතුත්ථං.**

## 6. 9. 5

## මඤ්චසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ** අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා **උපනන්දො** සක්‍යපුත්තො උච්චෙ මඤ්චෙ සයති. අථ ඛො භගවා සම්බහුලෙහි භික්ඛූහි සද්ධිං සෙනාසනචාරිකං ආහිණ්ඩන්තො යෙනායස්මතො උපනන්දස්ස සක්‍යපුත්තස්ස විහාරො තෙනුපසඞ්කමි. අද්දසා ඛො ආයස්මා උපනන්දො සක්‍යපුත්තො භගවන්තං දූරතොව ආගච්ඡන්තං, දිස්වාන භගවන්තං එතදවොච: ආගච්ඡතු මෙ භන්තෙ භගවා සයනං පස්සතූති. අථ ඛො භගවා තතො ව පටිනිවත්තිත්වා භික්ඛූ ආමන්තෙසි, ආසයතො භික්ඛවෙ මොඝපුරිසො වෙදිතබ්බොති, අථ ඛො භගවා ආයස්මන්තං උපනන්දං සක්‍යපුත්තං අනෙකපරියායෙන විගරහිත්වා දුබ්භරතාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**නවං පන භික්ඛුනා මඤ්චං වා පීඨං වා කාරයමානෙන අට්ඨඞ්ගුලපාදකං කාරෙතබ්බං සුගතඞ්ගුලෙන අඤ්ඤත්‍ර හෙට්ඨිමාය අටනියා. තං අතික්කාමයතො ඡෙදනකං පාචිත්තියන්ති.**

---

1. ගණ්ඨිකාය--සත්‍යා.
2. විධෙ--මජසං, විධෙ, සත්‍යා.

තමා විසින් නිමාම් නො කරන ලද්ද තෙමේ නිමාම් කෙරේ නම් පචිති ඇවැත් වෙයි. තමා විසින් නිමාම් නො කරන ලද්ද මෙරමා ලවා නිමාම් කරවා නම් පචිති ඇවැත් වෙයි. මෙරමා විසින් නිමාම් නො කරන ලද්ද තෙමේ නිමාම් කෙරේ නම් පචිති ඇවැත් වෙයි. මෙරමා විසින් නිමාම් නො කරන ලද්ද මෙරමා ලවා නිමාම් කරවා නම් පචිති ඇවැත් වේ.

මෙරමා සඳහා කෙරේ නම් හෝ කරවා නම් හෝ දුකුළා ඇවැත් වෙයි. මෙරමා විසින් කරන ලද්ද ලැබ පරිභොග කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

ගණ්ඨියෙහි අරණියෙහි (ගිහිගානාදඬුයෙහි) කාබාන් විටුයෙහි අඳුන් නලයෙහි, අඳුන් ලහයෙහි, වැදඩියෙහි, දියපිස්නෙහි ඇවැත් නැති. උම්මත්තකයාහට ආදිකම්මිකයාහට ඇවැත් නැති

**සතරවැනි සූචිඝර ශික්ෂාපද යි.**

## 6. 9. 5

## මඤ්ච ශික්ෂාපදය

1 එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජෙතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍ර උස් හැඳෙකැ හොවී. එකල්හි භාග්‍යවතුන් වහන්සේ බොහෝ මහණුන් සමඟ සෙනාසන චාරිකායෙහි ඇවිදිනා සේක් ආයුෂ්මත් උපනන්ද ශාක්‍යපුත්‍රගේ වෙහෙර වෙතැ එළැඹිසේකි. ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය පුත්‍ර දුර දී මැ වඩනා වූ භාග්‍යවතුන් දුටුවේ යි. දැකැ භාග්‍යවතුන්හට මෙය කී යැ. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ වඩනා සේක්වා මාගේ යහන බලන සේක්ව යි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එතැනින් මැ පෙරළා වැඩ මහණුන් ඇමැතූ සේකැ. මහණෙනි ආශ්‍රයස්ථානයෙන් හිස් පුරුෂයා දත යුත්තේ යි. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් උපනන්ද ශාක්‍ය-පුත්‍රයහට නොයෙක් කරුණෙන් ගරහා දුබරබැව් පිණිස ...මෙසේ ද මහණෙනි මේ සිකපදය උදෙසවු,

**"අළුත් හැඳක් හෝ පුටුවක් හෝ කරවන මහණහු විසින් හැඳවණතී යටැ කොටස තබා සුගත් අඟුලෙන් අටඟුල් පා ඇති සේ කැරවිය යුතු යි. එය ඉක්මවන්නාහට ඡේදනක පචිති ඇවැත් වේ"යයි.**

2. **නවං** නාම: කරණං උපාදය වුච්චති.

**මඤ්චො** නාම: චත්තාරො මඤ්චා මසාරකො බුන්දිකාබද්ධො කුළීරපාදකො ආහච්චපාදකො.

**පීඨං** නාම: චත්තාරි පීඨානි මසාරකං බුන්දිකාබද්ධං කුළීරපාදකං ආහච්චපාදකං.

**කාරයමානෙනාති:** කරොන්තො වා කාරාපෙන්තො වා.

**අට්ඨඞ්ගුලපාදකං කාරෙතබ්බං සුගතඞ්ගුලෙන අඤ්ඤත්‍ර හෙට්ඨිමාය අටනියාති** ඨපෙත්වා හෙට්ඨිමං අටනිං, තං අතික්කාමෙත්වා කරොති වා කාරාපෙති වා, පයොගෙ දුක්කටං. **පටිලාභෙන ඡින්දිත්වා පාචිත්තියං** දෙසෙතබ්බං.

අත්තනා විප්පකතං අත්තනා පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස. අත්තනා විප්පකතං පරෙහි පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස. පරෙහි විප්පකතං අත්තනා පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස. පරෙහි විප්පකතං පරෙහි පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස.

අඤ්ඤස්සත්ථාය කරොති වා කාරාපෙති වා ආපත්ති දුක්කටස්ස. අඤ්ඤෙන කතං පටිලභිත්වා පරිභුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** පමාණිකං කරොති, ඌනකං කරොති, අඤ්ඤෙන කතං පමාණාතික්කන්තං පටිලභිත්වා ඡින්දිත්වා පරිභුඤ්ජති, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**මඤ්චසික්ඛාපදං පඤ්චමං**[1]

## 6. 9. 6

## තූලොනද්ධසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති ජෙතවනෙ **අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ තෙන ඛො පන සමයෙන **ඡබ්බග්ගියා භික්ඛූ** මඤ්චම්පි පීඨම්පි තූලොනද්ධං කාරාපෙන්ති. මනුස්සා විහාරචාරිකං ආහිණ්ඩන්තා පස්සිත්වා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම සමණා සක්‍යපුත්තියා මඤ්චම්පි පීඨම්පි තූලොනද්ධං කාරාපෙස්සන්ති, සෙය්‍යථාපි ගිහී කාමභොගිනොති.

1. මඤ්චපීඨසික්ඛාපදං - මජසං.

2 **නව** නම්: කිරීම නිසා කියනු ලැබේ

**මඤ්චූ** නම්: මසාරක යැ බුන්දිකාබද්ධ යැ කුළීරපාදක යැ ආහච්ච පාදක යැ යි සතර හැඳෙකි

**පීඨ** නම්: මසාරක යැ බුන්දිකාබද්ධ යැ කුළීරපාදක යැ ආහච්චපාදක යැ යි සතර පුටුවෙකි.

**කාරයමානෙන;** කරන්නේ හෝ කරවන්නේ හෝ;

**අට්ඨඞ්ගුලපාදකං කාරෙතබ්බං සුගතඞ්ගුලෙන අඤ්ඤත්‍ර හෙට්ඨිමාය අටනියා:** යට හැදවත තබා; එය ඉක්මවා කෙරේ නම් හෝ කරවා නම් හෝ පියෝති දුකුළා වේ. ලැබීමෙන් සිඳැ පචිති ඇවැත් දෙසිය යුතු

තමා විසින් නිමාම් නොකරන ලද්ද තෙමේ නිමාම් කෙරේ නම් පචිති ඇවැත් වෙයි. තමා විසින් නිමාම් නො කරන ලද්ද මෙරමා ලවා නිමාම් කරවා නම් පචිති ඇවැත් වෙයි. මෙරමා විසින් නිමාම් නො කරන ලද්ද තෙමේ නිමාම් කෙරේ නම් පචිති ඇවැත් වෙයි. මෙරමා විසින් නිමාම් නොකරන ලද්ද මෙරමා ලවා නිමාම් කරවා නම් පචිති ඇවැත් වේ.

මෙරමා සඳහා කෙරේ නම් හෝ කරවා නම් හෝ දුකුළා ඇවැත් වෙයි. මෙරමා විසින් කරන ලද්දක් ලැබ පිරිබෝ කෙරේ නම් දුකුළා ඇවැත් වේ

පම ණින් යුතු කොට කෙරේ නම්, උනු කොට කෙරේ නම්, මෙරමා විසින් කරන ලද පමණ ඉක්මවූවක් ලැබ සිඳ පිරිබෝ කෙරේ නම්, ඇවැත් නැති. උම්මත්තකයහට, ආදිකම්මිකයහට ඇවැත් නැති.

**පස්වැනි මඤ්චූ ශික්ෂාපද යි.**

## 6. 9. 6

## තූලෝනද්ධ ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි ඡව්හි සවග මහණහු හැඳ ද පුටුව ද පුළුන් බහා වළඳනා ලද්දක් කොට කරවති. මිනිස්සු විහාරචාරිකායෙහි ඇවිදිනාහු දැකැ ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ කාමභොගී ගිහියන් මෙන් හැඳ ද පුටුව ද පුළුන් බහා වළඳනා ලද්දක් කොට කැරැවූහු දැ යි.

2. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ මඤ්චම්පි පීඨම්පි තූලොනද්ධං කාරාපෙස්සන්තීති -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ මඤ්චම්පි පීඨම්පි තූලොනද්ධං කාරාපෙථාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා මඤ්චම්පි පීඨම්පි තූලොනද්ධං කාරාපෙස්සථ, නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**යො පන භික්ඛු මඤ්චං වා පීඨං වා තූලොනද්ධං කාරාපෙය්‍ය උද්දාලනකං පාචිත්තියන්ති.**

3. **යො පනාති:** යො යාදිසො -පෙ- **භික්ඛූති:** -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

**මඤ්චො** නාම: චත්තාරො මඤ්චා මසාරකො බුන්දිකාබද්ධො කුළීරපාදකො ආහච්චපාදකො.

**පීඨං** නාම: චත්තාරි පීඨානි මසාරකං බුන්දිකාබද්ධං කුළීරපාදකං ආහච්චපාදකං.

**තූලං** නාම: තීණි තූලානි රුක්ඛතූලං ලතාතූලං පොටකිතූලං. **කාරාපෙය්‍යාති** කරොති වා කාරාපෙති වා පයොගෙ දුක්කටං. පටිලාභෙන උද්දාලෙත්වා පාචිත්තියං දෙසෙතබ්බං.

අත්තනා විප්පකතං අත්තනා පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස, අත්තනා විප්පකතං පරෙහි පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස. පරෙහි විප්පකතං අත්තනා පරියොසාපෙති, ආපත්ති පාචිත්තියස්ස. පරෙහි විප්පකතං පරෙහි පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස.

අඤ්ඤස්සත්ථාය කරොති වා කාරාපෙති වා ආපත්ති දුක්කටස්ස, අඤ්ඤෙන කතං පටිලභිත්වා පරිභුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** ආයොගෙ කායබන්ධනෙ අංසවට්ටකෙ[1] පත්තත්ථවිකාය පරිස්සාවනෙ බිම්බොහනං[2] කරොති, අඤ්ඤෙන කතං පටිලභිත්වා උද්දාලෙත්වා පරිභුඤ්ජති, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**තූලොනද්ධසික්ඛාපදං ඡට්ඨං.**

1 අංසබද්ධකෙ - මජසං
2 බිබ්බොහනං - මජසං

2. භික්ෂූහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ත්ති ශබ්දය) ඇසූහු. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ... ඔහු ලමු කොට සිතති. නුගුණ පවසති. දෙස් පතුරුවත්: "කෙසේ නම් සවග මහණහු හැඳ ද පුටුව ද පුළුන් බහා වළඳනා ලද්දක් කොට කැරවූහු දැ යි... සැබෑ ද මහණෙනි, තෙපි හැඳ ද පුටුව ද පුළුන් බහා වළඳනා ලද්දක් කොට කරවවු දැ යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු නොයෙක් අයුරින් ගැරහූ ... කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි හැඳ ද පුටුව ද පුළුන් බහා වළඳනා ලද්දක් කොට කැරවූහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**යම් මහණෙක් හැඳක් හෝ පුටුවක් හෝ පුළුන් බහා වළඳනා ලද්දක් කොට කරවන්නේ නම් විදෑහීම් ඇති පචිති වේ යයි.**

3. **යො පන**: යම්, යම්බඳු ... **භිකබු** ... මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**මඤ්ච** නම්: මසාරක යැ බුන්දිකාබද්ධ යැ කුළීරපාදක යැ ආහච්ච පාදක යැ යි සතර හැඳෙකි.

**පීඨ** නම්: මසාරක යැ බුන්දිකාබද්ධ යැ කුළීරපාදක යැ ආහච්ච පාදක යැ යි සතර පුටුවෙකි.

**තූල** නම්: රුක් පුළුනැ ලියපුළුනැ තණපුළුනැ යි තුන් පුළුනෙකි.

**කාරාපෙය්‍ය**: කෙරේ නම් හෝ කරවා නම් හෝ පියෝගි දුකුළා වේ. ලැබීමෙන් විදෑ හෙළා පචිති දෙසිය යුතු යි.

තමා විසින් නිමාම් නො කරන ලද්ද තෙමේ නිමාම් කෙරේ නම් පචිති ඇවැත් වෙයි. තමා විසින් නිමාම් නො කරන ලද්ද මෙරමා ලවා නිමාම් කරවා නම් පචිති ඇවැත් වෙයි. මෙරමා විසින් නිමාම් නො කරන ලද්ද තෙමේ නිමාම් කෙරේ නම් පචිති ඇවැත් වෙයි. මෙරමා විසින් නිමාම් නො කරන ලද්ද මෙරමා ලවා නිමාම් කරවා නම් පචිති ඇවැත් වේ.

මෙරමා සඳහා කෙරේ නම් හෝ කරවා නම් හෝ දුකුළා ඇවැත් වෙයි. මෙරමා විසින් කරන ලද්දක් ලැබ පිරිබෝ කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

ආයොගපට්ටයෙහි, කාබානෙහි, අංසවට්ටකයෙහි, පාත්‍රථවිකායෙහි, පෙරහණෙහි, මාවුලාවක් කෙරේ නම්, මෙරමා විසින් කරන ලද්දක් ලැබැ විදෑ හෙළා පිරිබෝ කෙරේ නම් ඇවැත් නැත, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**සවැනි තූලොනද්ධ ශික්ෂාපද යි.**

## නිසීදනසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන භගවතා භික්ඛූනං නිසීදනං අනුඤ්ඤාතං හොති. ඡබ්බග්ගියා භික්ඛූ භගවතා නිසීදනං අනුඤ්ඤාතන්ති අප්පමාණිකානි නිසීදනානි ධාරෙන්ති මඤ්චස්සපි පීඨස්සපි පුරතොපි පච්ඡතොපි ඔලම්බෙන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ අප්පමාණිකානි නිසීදනානි ධාරෙස්සන්ති -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ අප්පමාණිකානි නිසීදනානි ධාරෙථාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා අප්පමාණිකානි නිසීදනානි ධාරෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**නිසීදනං පන භික්ඛුනා කාරයමානෙන පමාණිකං කාරෙතබ්බං තත්‍රිදං පමාණං දීඝසො ද්වෙ විදත්ථියො සුගතවිදත්ථියා තිරියං දියඩ්ඪං. තං අතික්කාමයතො ඡෙදනකං පාචිත්තියන්ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

2. තෙන ඛො පන සමයෙන ආයස්මා උදායි මහාකායො හොති. සො භගවතො පුරතො නිසීදනං පඤ්ඤපෙත්වා සමන්තතො සමඤ්ඡමානො නිසීදි[1]. අථ ඛො භගවා ආයස්මන්තං උදායිං එතදවොච: කිස්ස ත්වං උදායි නිසීදනං පඤ්ඤපෙත්වා සමන්තතො සමඤ්ඡසි සෙය්‍යථාපි පුරාණාසිකොට්ඨොති. තථා හි පන භන්තෙ භගවතා භික්ඛූනං අතිඛුද්දකං නිසීදනං අනුඤ්ඤාතන්ති. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි "අනුජානාමි භික්ඛවෙ නිසීදනස්ස දසං[2] විදත්ථිං" එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**නිසීදනං පන භික්ඛුනා කාරයමානෙන පමාණිකං කාරෙතබ්බං තත්‍රිදං පමාණං, දීඝසො ද්වෙ විදත්ථියො සුගතවිදත්ථියා. තිරියං දියඩ්ඪං, දසා විදත්ථි, තං අතික්කාමයතො ඡෙදනකං පාචිත්තියන්ති.**

---

1. නිසීදති - මජසං
2. දසා - සී i සීමු ii

## 6. 9. 7

## නිසීදන ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි භාග්‍යවතුන් විසින් මහණුන්හට නිසීදනයෙක් අනුදන්නා ලද්දේ වෙයි. සවග මහණහු භාග්‍යවතුන් විසින් නිසීදනය අනුදන්නා ලද යි පමණ ඉක්මවූ නිසීදනයන් ධරත්. හැංදෙහි ද පුටුවෙහි ද ඉදිරියෙනුදු පස්සෙනුදු එල්බෙත්. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් සවග මහණහු පමණ ඉක්මවූ නිසීදනයන් ධැරුහු ද යි ... සැබෑ ද මහණෙනි, තෙපි පමණ ඉක්මවූ නිසීදනයන් ධරවූ ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ. ... කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි පමණ ඉක්මවූ නිසීදනයන් දරුවහු ද? හිස් පුරුෂයෙනි මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**නිසීදනයක් කරවනු කැමැති මහණහු විසින් පමණින් යුතු කොට කැරැවිය යුතු යි. එහි මේ පමණ යැ: දිගින් සුගත් වියතින් දෙවියතෙකැ සරසින් යෙළවියතෙකි. එය ඉක්මවන්නාහට ඡේදනක පාචිත්තිය ඇවැත් වේ යයි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් භික්ෂූන්හට මෙ සිකපදය පනවන ලද්දේ වෙයි.

2. එසමයෙහි වනාහි ආයුෂ්මත් උදයී මහත් සිරිරි ඇතියේ වෙයි. හේ භාග්‍යවතුන් පෙරටුයෙහි නිසීදනය පනවා හාත්පසින් අදිමින් හුන්නේ යැ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් උදයිහට මෙය වදළ සේකැ. කුමකට තෙපි උදයි, නිසීදනය පනවා පැරැණි සොම්මරකු මෙන් හාත්පසින් අදනෙහි දැ?යි. ස්වාමීනි, භාග්‍යවතුන් විසින් මහණුන්හට එබඳු ඉතා කුඩා නිසීදනයෙක් අනුදන්නා ලද්දේ මැ නු? ඉක්බිති භාග්‍ය-වතුන් වහන්සේ මෙකරුණෙහි ලා මෙඅවසරයෙහි ලා දැහැමි කථා කොට මහණුන් ඇමැතූ සේකැ. "මහණෙනි, නිසීදනයාගේ දහවලු වියතක් අනුදනිමි." මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**නිසීදනයක් කරවනු කැමැති මහණහු විසින් පමණින් යුතු කොට කැරැවිය යුතු යි. එහි මේ පමණ යැ දිගින් සුගත් වියතින් දෙවියතෙකැ සරසින් යෙළ වියතෙකැ, දහවලුව වියතෙකි. එය ඉක්මවන්නාහට ඡේදනක පචිති වේ යයි.**

3. **නිසීදනං** නාම: සදසං වුච්චති.

**කාරයමානස්සාති:** කරොන්තස්ස වා කාරාපෙන්තස්ස වා. පමාණිකං කාරෙතබ්බං. තත්‍රිදං පමාණං දීඝසො ද්වෙ විදත්ථියො සුගතවිදත්ථියා තිරියං දියඩ්ඪං, දසා විදත්ථි තං අතික්කාමෙත්වා කරොති වා කාරාපෙති වා පයොගෙ දුක්කටං. පටිලාභෙන ඡින්දිත්වා පාචිත්තියං දෙසෙතබ්බං.

අත්තනා විප්පකතං අත්තනා පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස අත්තනා විප්පකතං පරෙහි පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස, පරෙහි විප්පකතං අත්තනා පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස, පරෙහි විප්පකතං පරෙහි පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස.

අඤ්ඤස්සත්ථාය කරොති වා කාරාපෙති වා ආපත්ති දුක්කටස්ස. අඤ්ඤෙන කතං පටිලභිත්වා පරිභුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** පමාණිකං කරොති, ඌනකං කරොති, අඤ්ඤෙන කතං පමාණාතික්කන්තං පටිලභිත්වා ඡින්දිත්වා පරිභුඤ්ජති, විතානං වා භූමත්ථරණං වා සාණිපාකාරං වා භිසිං වා බිම්බොහනං වා කරොති, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**නිසීදනසික්ඛාපදං සත්තමං.**

## 6. 9. 8

## කණ්ඩුපටිච්ඡාදිසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන භගවතා භික්ඛූනං කණ්ඩුපටිච්ඡාදි අනුඤ්ඤාතා හොති. ඡබ්බග්ගියා භික්ඛූ භගවතා කණ්ඩුපටිච්ඡාදි අනුඤ්ඤාතාති අප්පමාණිකායො කණ්ඩුපටිච්ඡාදියො ධාරෙන්ති, පුරතොපි පච්ඡතොපි ආකඩ්ඪන්තා ආහිණ්ඩන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛියන්ති විපාචෙන්ති.

3. **නිසීදන** නම්: දහවලු සහිතය කියනු ලැබේ.

**කාරයමානෙන:** කරන්නේ හෝ කරවන්නේ හෝ, පමණින් යුතු කොට කැරවිය යුතු යි. එහි මේ පමණ යැ. දිගින් සුගත් වියතින් දෙවියතෙකැ, සරසින් යෙළ විය තෙකැ, දහවලුව වියතෙකි. එය ඉක්මවා කෙරේ නම් හෝ කරවා නම් හෝ පියෝගි දුකුළා වේ. ලැබීමෙන් සිදලා පචිති දෙසිය යුතු යි.

තමා විසින් නිමාම නො කරන ලද්ද තෙමේ නිමාම් කෙරේ නම් පචිති ඇවැත් වෙයි. තමා විසින් නිමාම් නො කරන ලද්ද මෙරමා ලවා නිමාම් කරවා නම් පචිති ඇවැත් වෙයි. මෙරමා විසින් නිමාම් නො කරන ලද්ද තෙමේ නිමාම් කෙරේ නම් පචිති ඇවැත් වෙයි. මෙරමා විසින් නිමාම් නො කරන ලද්ද මෙරමා ලවා නිමාම් කරවා නම් පචිති ඇවැත් වේ.

මෙරමා සඳහා කෙරේ නම් හෝ කරවා නම් හෝ දුකුළා ඇවැත් වෙයි. මෙරමා විසින් කරන ලද්දක් ලැබ පිරිබෝ කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

පමණින් යුතු කොට කෙරේ නම් උනු කොට කෙරේ නම් මෙරමා විසින් කරන ලද පමණ ඉක්මවූවක් ලැබ සිදලා පිරිබෝ කෙරේ නම්, වියනක් හෝ බුමුතුරුණක් හෝ කඩතුරාවක් හෝ බිස්සක් හෝ මාවුලාවක් හෝ කෙරේ නම්, ඇවැත් නැත. උම්මත්තකයහට ආදි කම්මිකයහට ඇවැත් නැති.

**සත්වැනි නිසීදන ශික්ෂාපද යි.**

## 6. 9. 8

## කණ්ඩුපටිච්ඡාදි ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජෙතවන නම් අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි භාග්‍යවතුන් විසින් මහණුන්හට කස්පිළිසනෙක් අනුදන්නා ලද්දේ වෙයි. සවග මහණහු භාග්‍යවතුන් විසින් කස්පිළිසනෙක් අනුදන්නා ලද යි පමණ ඉක්මවූ කස් පිළිසන් දරති. ඉදිරියෙනුදු පස්සෙනුදු අදිමින් ඇවිදිත්. යම් ඒ භික්ෂූ කෙනෙක් අපිස් වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්:

"කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ අප්පමාණිකායො කණ්ඩුපටිච්ඡාදියො ධාරෙස්සන්තීති" -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ අප්පමාණිකායො කණ්ඩුපටිච්ඡාදියො ධාරෙථාති. සච්චං භගවා, විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා අප්පමාණිකායො කණ්ඩුපටිච්ඡාදියො ධාරෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**කණ්ඩුපටිච්ඡාදිං පන භික්ඛුනා කාරයමානෙන පමාණිකා කාරෙතබ්බා තත්‍රිදං පමාණං, දීඝසො චතස්සො විදත්ථියො සුගතවිදත්ථියා තිරියං ද්වෙ විදත්ථියො තං අතික්කාමයතො ඡෙදනකං පාචිත්තියන්ති.**

2. **කණ්ඩුපටිච්ඡාදි** නාම: යස්ස අධොනාභි උබ්භජාණුමණ්ඩලං කණ්ඩු වා පිළකා[1] වා අස්සාවො[2] වා ථුල්ලකච්ඡු වා ආබාධො තස්ස පටිච්ඡාදනත්ථාය.

**කාරයමානෙනාති**: කරොන්තො වා කාරාපෙන්තො වා. පමාණිකා කාරෙතබ්බා: තත්‍රිදං පමාණං දීඝසො චතස්සො විදත්ථියො සුගත විදත්ථියා තිරියං ද්වෙ විදත්ථියො, තං අතික්කාමෙත්වා කරොති වා කාරාපෙති වා පයොගෙ දුක්කටං, පටිලාභෙන ඡින්දිත්වා පාචිත්තියං දෙසෙතබ්බං.

අත්තනා විප්පකතං අත්තනා පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස. අත්තනා විප්පකතං පරෙහි පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස. පරෙහි විප්පකතං අත්තනා පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස. පරෙහි විප්පකතං පරෙහි පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස.

අඤ්ඤස්සත්ථාය කරොති වා කාරාපෙති වා ආපත්ති දුක්කටස්ස. අඤ්ඤෙන කතං පටිලභිත්වා පරිභුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති**: පමාණිකං කරොති, ඌනකං කරොති, අඤ්ඤෙන කතං පමාණාතික්කන්තං පටිලභිත්වා ඡින්දිත්වා පරිභුඤ්ජති, විතානං වා භූම්මත්ථරණං වා සාණිපාකාරං වා භිසිං වා බිබ්බොහනං වා කරොති, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**කණ්ඩුපටිච්ඡාදිසික්ඛාපදං අට්ඨමං**

---

1. පිලකා - මජසං
2. අස්සාවො - සී

"කෙසේ නම් සවග මහණහු පමණ ඉක්මවූ කස් පිළිසන් දරුහු ද යි ...සැබෑද මහණෙනි, තෙපි පමණ ඉක්මවූ කස් පිළිසන් දරවූ ද යි. සැබෑවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු නොයෙක් අයුරින් ගැරහූහ. ...කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි පමණ ඉක්මවූ කස් පිළිසන් දරුවහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි...මෙසේ ද මහණෙනි මේ සිකපදය උදෙසවූ:

**කස්පිළිසනක් කරවනු කැමැති මහණහු විසින් පමණින් යුතු කොට කැරැවිය යුතු යැ. එහි මේ පමණ යැ දිගින් සුගත වියතින් සිවු වියතෙකැ. සරසින් දෙවියතෙකි. එය ඉක්මවන්නාහට ඡේදනක පචිතිවේ යයි.**

2. **කණ්ඩුපටිච්ඡාදි** නම්: යමක්හුගේ නැබෙන් යට දණමඩලෙන් උඩ කැසිල්ලෙක් හෝ පොළෙක් හෝ මලවැහිමෙක් හෝ මහත් කස් ආබාධයෙක් හෝ වේ නම් ඒ ආබාධයාගේ වැසීම පිණිස.

**කාරයමානෙන**: කරන්නේ හෝ කරවන්නේ හෝ; පමණින් යුතු කොට කැරැවිය යුතු යි. එහි මේ පමණ යැ දිගින් සුගත් වියතින් සිවු වියතෙකැ. සරසින් දෙවියතෙකි. එය ඉක්මවා කෙරේ නම් හෝ කරවා නම් හෝ පියෝහි දුකුළා වේ. ලැබීමෙන් සිඳලා පචිති දෙසිය යුතු යි.

තමා විසින් නිමාම් නො කරන ලද්ද තෙමේ නිමාම් කෙරේ නම් පචිති ඇවැත් වෙයි. තමා විසින් නිමාම් නො කරන ලද්ද මෙරමා ලවා නිමාම් කරවා නම් පචිති ඇවැත් වෙයි. මෙරමා විසින් නිමාම් නො කරන ලද්ද තෙමේ නිමාම් කෙරේ නම් පචිති ඇවැත් වෙයි. මෙරමා විසින් නිමාම් නො කරන ලද්ද මෙරමා ලවා නිමාම් කරවා නම් පචිති ඇවැත් වේ.

මෙරමා සඳහා කෙරේ නම් හෝ කරවා නම් හෝ දුකුළා ඇවැත් වෙයි. මෙරමා විසින් කරන ලද්දක් ලැබ පරිභොග කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

පමණින් යුතු කොට කෙරේ නම් උනු කොට කෙරේ නම් මෙරමා විසින් කරන ලද පමණ ඉක්මවූවක් ලැබ සිඳලා පරිභොග කෙරේ නම් වියනක් හෝ බුමුතුරුණක් හෝ කඩතුරාවක් හෝ බිස්සක් හෝ මාවුලාවක් හෝ කෙරේ නම් ඇවැත් නැති. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**අටවැනි කණ්ඩුපටිච්ඡාදි ශික්ෂාපද යි.**

## වස්සිකසාටිකසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන භගවතා භික්ඛූනං වස්සිකසාටිකා අනුඤ්ඤාතා හොති. ඡබ්බග්ගියා භික්ඛූ භගවතා වස්සිකසාටිකා අනුඤ්ඤාතාති අප්පමාණිකායො වස්සිකසාටිකායො ධාරෙන්ති පුරතොපි පච්ඡතොපි ආකඩ්ඪන්තා ආකිණ්ණන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ අප්පමාණිකායො වස්සිකසාටිකායො ධාරෙස්සන්ති"ති -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ අප්පමාණිකායො වස්සිකසාටිකායො ධාරෙථාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා අප්පමාණිකායො වස්සිකසාටිකායො ධාරෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**වස්සිකසාටිකං පන භික්ඛුනා කාරයමානෙන පමාණිකා කාරෙතබ්බා. තත්‍රිදං පමාණං දීඝසො ඡ විදත්ථියො සුගතවිදත්ථියා තිරියං අඩ්ඪතෙය්‍යා තං අතික්කාමයතො ඡෙදනකං පාචිත්තියන්ති.**

2. **වස්සිකසාටිකා** නාම: වස්සානස්ස චාතුමාසත්ථාය.

**කාරයමානෙනාති**: කරොන්තෙන වා කාරාපෙන්තෙන වා. පමාණිකා කාරෙතබ්බා. තත්‍රිදං පමාණං දීඝසො ඡ විදත්ථියො සුගතවිදත්ථියා. තිරියං අඩ්ඪතෙය්‍යා. තං අතික්කාමෙත්වා කරොති වා කාරාපෙති වා, පයොගෙ දුක්කටං. පටිලාභෙන ඡින්දිත්වා පාචිත්තියං දෙසෙතබ්බං.

අත්තනා විප්පකතං අත්තනා පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස. අත්තනා විප්පකතං පරෙහි පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස පරෙහි විප්පකතං අත්තනා පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස. පරෙහි විප්පකතං පරෙහි පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස.

අඤ්ඤස්සත්ථාය කරොති වා කාරාපෙති වා ආපත්ති දුක්කටස්ස. අඤ්ඤෙන කතං පටිලභිත්වා පරිභුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

# 6. 9. 9

## වස්සිකසාටික ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජෙතවන නම් අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි භාග්‍යවතුන් විසින් මහණුන්හට වැසිසළු අනුදන්නා ලද වෙයි. සවග මහණහු භාග්‍යවතුන් විසින් වැසිසළු අනුදන්නා ලද යි පමණ ඉක්මවූ වැසිසළු දරති. ඉදිරියෙනුදු පස්සෙනුදු අදිමින් ඇවිදිත්, යම් ඒ භික්ෂූ කෙනෙක් අපිස්වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවති: "කෙසේ නම් සවග මහණහු පමණ ඉක්මවූ වැසිසළු දරුහු ද යි... සැබෑ ද මහණෙනි, තෙපි පමණ ඉක්මවූ වැසිසළු දරවු දු යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ... කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි පමණ ඉක්මවූ වැසිසළු දරුවහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි.... මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු;

**වැසිසළුවක් කරවනු කැමැති මහණහු විසින් පමණින් යුතු කොට කැරැවිය යුතු යි. එහි මේ පමණ යැ, දිගින් සුගත්වියතින් සවියතෙකැ, සරසින් යෙළ තුන්වියතෙකි. එය ඉක්මවන්නාහට සිඳැලීම් ඇති පචිති වේ යයි.**

2. **වස්සිකසාටිකා** නම්: වසන්හි සිවුමස පිරිබෝ පිණිස යැ,

**කාරයමානෙන:** කරන්නේ හෝ කරවන්නේ හෝ; පමණින් යුතු කොට කැරැවිය යුතු යි. එහි මේ පමණ යැ: දිගින් සුගත්වියතින් සවියතෙකැ, සරසින් යෙළ තුන්වියතෙකි. එය ඉක්මවා කෙරේ නම් හෝ කරවා නම් හෝ පියෝහි දුකුළා වේ. ලැබීමෙන් සිඳැලා පචිති දෙසිය යුතු යි.

තමා විසින් නිමාම් නො කරන ලද්ද තෙමේ නිමාම් කෙරේ නම් පචිති ඇවැත් වෙයි. තමා විසින් නිමාම් නො කරන ලද්ද මෙරමා ලවා නිමාම් කරවා නම් පචිති ඇවැත් වෙයි, මෙරමා විසින් නිමාම් නොකරන ලද්ද තෙමේ නිමාම් කෙරේ නම් පචිති ඇවැත් වෙයි, මෙරමා විසින් නිමාම් නො කරන ලද්ද මෙරමා ලවා නිමාම් කරවා නම් පචිති ඇවැත් වේ.

මෙරමා සඳහා කෙරේ නම් හෝ කරවා නම් හෝ දුකුළා ඇවැත් වෙයි. මෙරමා විසින් කරන ලද්දක් ලැබ පිරිබෝ කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

**අනාපත්ති:** පමාණිකං කරොති, ඌනකං කරොති අඤ්ඤෙන කතං පමාණාතික්කන්තං පටිලභිත්වා ඡින්දිත්වා පරිභුඤ්ජති, විතානං වා භූමත්ථරණං වා සාණිපාකාරං වා භිසිං වා බිම්බොහනං වා කරොති, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**වස්සිකසාටිකසික්ඛාපදං නවමං**

## 6. 9. 10

## නන්දත්ථෙරසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආයස්මා නන්දො භගවතො මාතුච්ඡාපුත්තො අභිරූපො හොති දස්සනීයො පාසාදිකො චතුරඞ්ගුලොමකො භගවතො.[1] සො සුගතචීවරප්පමාණං චීවරං ධාරෙති: අද්දසංසු ඛො ථෙරා භික්ඛූ ආයස්මන්තං නන්දං දූරතොව ආගච්ඡන්තං. දිස්වා භගවා ආගච්ඡතීති ආසනා උට්ඨහිත්වා[2] තෙ උපගතෙ සඤ්ජානිත්වා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. "කථං හි නාම ආයස්මා නන්දො සුගතචීවරප්පමාණං චීවරං ධාරෙස්සතී"ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා ආයස්මන්තං නන්දං පටිපුච්ඡි, සච්චං කිර ත්වං නන්ද සුගතචීවරප්පමාණං චීවරං ධාරෙසීති, සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම ත්වං නන්ද සුගතචීවරප්පමාණං චීවරං ධාරෙස්සසි නෙතං නන්ද අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**යො පන භික්ඛු සුගතචීවරප්පමාණං චීවරං කාරාපෙය්‍ය අතිරෙකං වා ඡෙදනකං පාචිත්තියං. තත්‍රිදං සුගතස්ස සුගතචීවරප්පමාණං, දීඝසො නවවිදත්ථියො සුගතවිදත්ථියා තිරියං ඡවිදත්ථියො ඉදං සුගතස්ස සුගතචීවරප්පමාණන්ති.**

2. යො පනාති: යො යාදිසො -පෙ- භික්ඛූති -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

සුගතචීවරං[3] නාම: දීඝසො නව විදත්ථියො සුගතවිදත්ථියා තිරියං ඡවිදත්ථියො. කාරාපෙය්‍යාති: කරොති වා කාරාපෙති වා පයොගෙ දුක්කටං පටිලාභෙන ඡින්දිත්වා පාචිත්තියං දෙසෙතබ්බං.

---

1. භගවතා - මජ්ඣං,
2. උට්ඨාහන්ති - මජ්ඣං
3. සුගතචීවරප්පමාණං - මජ්ඣං

පමණින් යුතු කොට කෙරේ නම්, ඌනු කොට කෙරේ නම්, මෙරමා විසින් කරන ලද පමණ ඉක්මවූවක් ලැබ සිඳැලා පිරිබෝ කෙරේ නම්, වියනක් හෝ බුමුතුරුණක් හෝ කඩතුරාවක් හෝ බිස්සක් හෝ මාවුලාවක් හෝ කෙරේ නම් ඇවැත් නැති, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**නවවැනි වස්සිකසාටික ශික්ෂාපද යි**

## 6. 9. 10

## නන්දත්ථෙර ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්නුවර ජේතවන නම් අනේපිඩු සිටුහුගේ අරමෙහි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි භාග්‍යවතුන්ගේ සුළුමවගේ පුත්‍ර වූ ආයුෂ්මත් නන්දස්ථවිර තෙමේ විශිෂ්ටරූප ඇතියේ දකුම්කලු වූයේ පැහැදුම් එළවනුයේ භාග්‍යවතුන්හට සතරඟුලෙකින් මිටි වූයේ වෙයි. හේ සුගත්සිවුරුපමණ සිවුරක් දරයි. ස්ථවිර භික්ෂූහු දුර දී මැ එන්නා වූ ආයුෂ්මත් නන්දතෙරහු දුටුහු දැකැ භාග්‍යවතුන් වහන්සේ වඩනාසේකැ යි හුනස්නෙන් නැඟිට ඔහු-වෙතැ එළැඹි කල්හි හැඳිනැ ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ආයුෂ්මත් නන්දස්ථවිර තෙමේ සුගත්-සිවුරුපමණ සිවුරක් දරී ද යි. භාග්‍යවතුන්හට තෙල කරුණ දැන්වූහු. එකල්හි භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් නන්දතෙරහු පුළුවුත් සේකැ. සැබෑ ද නන්දයෙනි, තෙපි සුගත්සිවුරුපමණ සිවුරක් දරවු ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරැහූහ.... කෙසේ නම් නන්දයෙනි, තෙපි සුගත්සිවුරුපමණ සිවුරක් දරුවහු ද? නන්දයෙනි මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි.... මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවූ:

**යම් මහණෙක් සුගත්සිවුරුපමණ හෝ අයිරා කොට හෝ සිවුරක් කරවන්නේ නම් ඡේදනක පචිති ඇවැත් වෙයි. එහි මේ සුගත්හුගේ සුගත්සිවුරෙහි පමණ යැ, දිගින් සුගත්වියතින් නවවිය-තෙකැ, සරසින් සවියතෙකි. මේ සුගතයන්ගේ සුගත්සිවුරෙහි පමණ යි.**

2. **යො පන:** යම්, යම්බඳු... **භික්ඛු:** මෙතෙමේ මේ අර්ථයෙහි ලා අදහස් කරන ලද භික්ෂු යි.

**සුගතචීවර** නම්: දිගින් සුගත්වියතින් නවවියතෙකැ, සරසින් සවියතෙකි.

**කාරාපෙය්‍ය:** කෙරේ නම් හෝ කරවා නම් හෝ පියෝගී දුකුළා වේ. ලැබීමෙන් සිඳැලා පචිති දෙසිය යුතු යි.

අත්තනා විප්පකතං අත්තනා පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස. අත්තනා විප්පකතං පරෙහි පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස. පරෙහි විප්පකතං අත්තනා පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස. පරෙහි විප්පකතං පරෙහි පරියොසාපෙති ආපත්ති පාචිත්තියස්ස.

අඤ්ඤස්සත්ථාය කරොති වා කාරාපෙති වා ආපත්ති දුක්කටස්ස. අඤ්ඤෙන කතං පටිලභිත්වා පරිභුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

අනාපත්ති: ඌනකං කරොති. අඤ්ඤෙන කතං පටිලභිත්වා ඡින්දිත්වා පරිභුඤ්ජති, විතානං වා භූමත්ථරණං වා සාණිපාකාරං වා භිසිං වා බිම්බොහනං වා කරොති, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

නන්දත්ථෙරසික්ඛාපදං දසමං.

රාජවග්ගො[1] නවමො.

තස්සුද්දානං:

රඤ්ඤො ච රතනං සන්තං සූචිං මඤ්චඤ්ච තූලිකං
නිසීදනඤ්ච කණ්ඩු ච වස්සිකං සුගතෙන චාති.

වග්ගුද්දානං :

මුසා භූතඤ්ච ඔවාදෙ භොජනං චෙලකෙන ච
සුරා සප්පාණකා ධම්මා රාජවග්ගෙන තෙ නව

උද්දිට්ඨා ඛො ආයස්මන්තො ද්වෙනවුති පාචිත්තියා ධම්මා, තත්ථායස්මන්තෙ පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා, දුතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා, තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා. පරිසුද්ධෙත්ථායස්මන්තො තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමීති.

ඛුද්දකං සමත්තං.

---
1. රතනවග්ගො - මජසං,
2. පාචිත්තිය කණ්ඩං නිට්ඨිතං - මජසං

තමා විසින් නිමාම නො කරන ලද්ද තෙමේ නිමාම කෙරේ නම් පචිති ඇවැත් වෙයි. තමා විසින් නිමාම නො කරන ලද්ද මෙරමා ලවා නිමාම කරවා නම් පචිති ඇවැත් වෙයි. මෙරමා විසින් නිමාම නො කරන ලද්ද තෙමේ නිමාම කෙරේ නම් පචිති ඇවැත් වෙයි. මෙරමා විසින් නිමාම නො කරන ලද්ද මෙරමා ලවා නිමාම කරවා නම් පචිති ඇවැත් වේ.

මෙරමා සඳහා කෙරේ නම් හෝ කරවා නම් හෝ දුකුළා ඇවැත් වෙයි. මෙරමා විසින් කරන ලද්දක් ලැබ පිරිබෝ කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

උතු කොට කෙරේ නම්, මෙරමා විසින් කරන ලද්දක් ලැබ සිඳැලා පිරිබෝ කෙරේ නම්, වියනක් හෝ බුමුතුරුණක් හෝ කඩතුරාවක් හෝ බිස්සක් හෝ මාවුලාවක් හෝ කෙරේ නම් ඇවැත් නැති, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

දස වැනි නහුතෝරශික්ෂාපද යි.

## නවවන රාජවර්ගය යි.

**එහි උද්දානය :**

රාජනෙතපුර යැ රතන යැ (සන්ත) විකාලෙ ගාමප්පවෙසන යැ සූචිඝර යැ මඤ්ච යැ තුලොනද්ධ යැ නිසීදන යැ කණ්ඩුපටිච්ඡාදි යැ වස්සිකසාටික යැ [සුගතචීවරය නිසා පැන වූ] නහුතෝර-සිඛයෙන් දු යි. වර්ගය වේ.

**වර්ගොද්දනය :**

මුසාවාද යැ භූතගාම යැ භික්ඛුනොවාද යැ භොජන යැ අචෙ-ලකය සමඟ සුරාපාන යැ සප්පාණක යැ සහධම්මික යැ රාජවර්ගය සමඟ ඒ වර්ග නවයෙකි.

ආයුෂ්මත්නි, දෙඅනූ පාචිත්තියධම්යෝ උදෙසනලදහු මැ යි. එහි ලා ආයුෂ්මතුන් පුළුවුස්මි, කිම පිරිසුදුවහු ද? දෙවනාවට දු පුළුවුස්මි, කිම පිරිසුදුවහු ද? තෙවනාවට දු පුළුවුස්මි. කිම පිරිසුදුවහු ද? මෙහි ලා ආයුෂ්මත්හු පිරිසුදුහ. එහෙයින් නිහඬයහ. මෙසේ මෙය දරමි.

## ඛුද්දකය සමාප්ත යි.

# 7

## පාටිදෙසනීයකණ්ඩො

ඉමෙ ඛො පනායස්මන්තො චත්තාරො පාටිදෙසනීයා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.

## 7. 1

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරා භික්ඛුනී සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පටික්කමනකාලෙ අඤ්ඤතරං භික්ඛුං පස්සිත්වා එතදවොච හන්දය්‍ය භික්ඛං පතිගණ්හාහීති[1]. සුට්ඨු භගිනීති සබ්බෙව අග්ගහෙසි. සා උපකට්ඨෙ කාලෙ නාසක්ඛි පිණ්ඩාය චරිතුං ඡින්නභත්තා අහොසි. අථ ඛො සා භික්ඛුනී දුතියම්පි දිවසං -පෙ- තතියම්පි දිවසං සාවත්ථියං පිණ්ඩාය චරිත්වා පටික්කමනකාලෙ තං භික්ඛුං පස්සිත්වා එතදවොච හන්දය්‍ය භික්ඛං පතිගණ්හාහීති. සුට්ඨු භගිනීති සබ්බෙව අග්ගහෙසි. සා උපකට්ඨෙ කාලෙ නාසක්ඛි පිණ්ඩාය චරිතුං ඡින්නභත්තා අහොසි.

2. අථ ඛො සා භික්ඛුනී චතුත්ථෙ දිවසෙ රථිකාය පවෙධෙන්තී ගච්ඡති. සෙට්ඨි ගහපති රථෙන පටිපථං ආගච්ඡන්තො තං භික්ඛුනිං එතදවොච අපෙහය්‍යෙති. සා ඔක්කමන්තී[2] තත්ථෙව පරිපති. සෙට්ඨි ගහපති තං භික්ඛුනිං ඛමාපෙසි ඛමාහය්‍යෙ මයා නිපාතිතාති.[3] නාහං ගහපති තයා නිපාතිතා අපි ච අහමෙව දුබ්බලාති. කිස්ස පන ත්වං අය්‍යෙ දුබ්බලාති. අථ ඛො සා භික්ඛුනී සෙට්ඨිස්ස ගහපතිස්ස එතමත්ථං ආරොචෙසි. සෙට්ඨි ගහපති තං භික්ඛුනිං ඝරං නෙත්වා භොජෙත්වා උජ්ඣායති ඛීයති විපාචෙති "කථං හි නාම භදන්තා භික්ඛුනියා හත්ථතො ආමිසං පටිග්ගහෙස්සන්ති කිච්ඡලාභො මාතුගාමොති."

3. අස්සොසුං ඛො භික්ඛූ තස්ස සෙට්ඨිස්ස ගහපතිස්ස උජ්ඣායන්තස්ස ඛීයන්තස්ස විපාචෙන්තස්ස. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම භික්ඛු භික්ඛුනියා හත්ථතො ආමිසං පටිග්ගහෙස්සතී"ති -පෙ- සච්චං කිර ත්වං භික්ඛු භික්ඛුනියා හත්ථතො ආමිසං පටිග්ගහෙසීති. සච්චං භගවා. ඤාතිකා තෙ භික්ඛු අඤ්ඤාතිකාති. අඤ්ඤාතිකා භගවාති. අඤ්ඤාතකො මොඝපුරිස අඤ්ඤාතිකාය න ජානාති පතිරූපං වා අප්පතිරූපං වා සන්තං වා අසන්තං වා. කථං හි නාම ත්වං මොඝපුරිස අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථතො ආමිසං පටිග්ගහෙස්සසි නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

---

1. පටිග්ගණ්හාහි – මජ්සං.
2. වොක්කමන්තී – මජ්සං
3. මයාසි පාතිතාති – මජ්සං

# 7

## පාටිදෙසනීය කාණ්ඩය

ආයුෂ්මත්නි, මේ සතර පාටිදෙසනීය ධර්මයෝ උදෙසීමට පැමිණෙත්.

## 7.1

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත්නුවර 'ජේතවන' නම්වූ අනේපිඩුසිටුහුගේ ආරාමයෙහි වැඩ වෙසෙති. එසමයෙහි එක්තරා මෙහෙණක් සැවැත්නුවර පිඩුසිඟා ඇවිද පෙරළා එන කල්හි එක්තරා මහණක්හු දැක මෙසේ කිව. "ආර්යයෙනි, භික්ෂාව පිළිගනු මැනැවැ"යි "මැනැවැ නැඟණියති" යි සියල්ල මැ ගත්තේ යැ. ඕ වේලා ආසන්න කල්හි පිඩුසිඟා යන්නට නො හැකි වූ, එහෙයින් මැ සුන්බත් වූ යැ. එකල්හි ඒ මෙහෙණ දෙවන දවස්හි දු තුන්වන දවස්හි දු සැවැත්නුවර පිඩුසිඟා ඇවිද පෙරළා එන කල්හි ඒ මහණහු දැක තෙල කිව: "ආර්යයෙනි භික්ෂාව පිළිගනුමැනැවැ"යි "මැනැවැ නැඟණියති" යි සියල්ල මැ පිළිගත. ඕ වේලා ආසන්න කල්හි පිඩුසිඟා යන්නට නොහැකි වූවා සුන්බත් වූ යැ.

2. එසඳ ඒ මෙහෙණ සතරවන දවස්හි වීථියෙහි වෙවුලමින් යෙයි. සිටුගැහැවියෙක් රථයෙකින් පෙරමඟට එන්නේ ඒ මෙහෙණට මෙය කී: "පහව යා ආර්යාවෙනි"යි. ඕ බැහැරවන්නී එහි මැ ඇදවැටුණා යැ. සිටුගැහැවි ඒ මෙහෙණ ක්ෂමා කරවී: "කමන්නැ ආර්යාවෙනි, මා විසින් හෙළනලදු යැ"යි "ගැහැවියෙනි, මම තොප විසින් නො හෙළන ලදුමු. වැළිත් මම් මැ දුබලයමු"යි. "ආර්යාවෙනි, තෙපි කවර හෙයින් දුර්වල වූ දැ"යි. එකල්හි ඒ මෙහෙණ සිටු ගැහැවියහට තෙල කරුණ දැන්වූ. සිටුගැහැවි ඒ මෙහෙණ ගෙට පමුණුවා වළඳවා "කෙසේ නම් වහන්දැවරු මෙහෙණ අතින් ආමිෂ පිළිගන්නාහු ද, මාගම දුකසේ ආමිෂ ලබන්නී යැ"යි අවමන් කරයි. අගුණ කියයි, නුගුණ පතුරු-වයි.

3. භික්ෂූහු අවමන් කරන අගුණ කියන නුගුණ පතුරුවන ඒ ගැහැවි සිටුහුගේ බස් ඇසූහ. යම් අල්පෙච්ඡ.,.භික්ෂු කෙනෙක් ඇද්ද ඔහු "කෙසේ නම් මහණ මෙහෙණක අතින් ආමිෂ පිළිගත්තේ දැ" යි අවමන් කෙරෙති අයුණු කියති නුගුණ පතුරුවති. සැබෑව ද මහණ, තෙපි මෙහෙණක අතින් ආමිෂ පිළිගත්තෙත් දැ' යි. සැබෑව භාග්‍යවතුන් වහන්සැ'යි. "මහණ, තොපගේ නෑ මෙහෙණක්ද? නොනෑමෙහෙණක් ද ?යි "නොනෑමෙහෙණක භාග්‍යවතුන් වහන්සැ"යි. තුච්ඡ පුරුෂය, නොනෑ මහණෙක් නොනෑමෙහෙණකගේ තිසි බව හෝ නොතිසි බව හෝ ඇති බව හෝ නැති බව හෝ නො දනියි. තුච්ඡපුරුෂය, කෙසේ නම් තෙපි නොනෑ මෙහෙණක අතින් ආමිෂ පිළිගත්තහු ද? තුච්ඡ පුරුෂය, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ .. නො වෙයි. මහණෙනි, මෙසේත් මේ ශික්ෂාපදය උදෙසවූ:

"යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා අන්තරඝරං පවිට්ඨාය හත්ථතො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පටිදෙසෙතබ්බං තෙන භික්ඛුනා, ගාරය්හං ආවුසො ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමී"ති.

4. යො පනාති: යො යාදිසො -පෙ- භික්ඛූති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

අඤ්ඤාතිකා නාම: මාතිතො වා පිතිතො වා යාව සත්තමා පිතාමහයුගා අසම්බද්ධා.

භික්ඛුනී නාම: උභතො සඞ්ඝෙ උපසම්පන්නා.

අන්තරඝරං නාම: රථිකා බ්‍යූහං සිංඝාටකං ඝරං.

ඛාදනීයං නාම: පඤ්ච භොජනානි යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං ඨපෙත්වා අවසෙසං ඛාදනීයං නාම.

භොජනීයං නාම: පඤ්චභොජනානි ඔදනො කුම්මාසො සත්තු මච්ඡො මංසං, ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පතිගණ්හාති ආපත්ති දුක්කටස්ස, අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාටිදෙසනීයස්ස.

අඤ්ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී අන්තරඝරං පවිට්ඨාය හත්ථතො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදති වා භුඤ්ජති වා ආපත්ති පාටිදෙසනීයස්ස. අඤ්ඤාතිකාය වෙමතිකො අන්තරඝරං පවිට්ඨාය හත්ථතො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදති වා භුඤ්ජති වා ආපත්ති පාටිදෙසනීයස්ස. අඤ්ඤාතිකාය ඤාතිකසඤ්ඤී අන්තරඝරං පවිට්ඨාය හත්ථතො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදති වා භුඤ්ජති වා ආපත්ති පාටිදෙසනීයස්ස.

යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං ආහාරත්ථාය පතිගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති දුක්කටස්ස එකතො උපසම්පන්නාය හත්ථතො ඛාදනීයං වා භොජනීයං වා ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පතිගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති දුක්කටස්ස.

''යම් මහණෙක් ඇතුළුගමට පිවිසි නොනෑමෙහෙණක අතින් බාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ සියතින් පිළිගෙන කන්නේ නම් හෝ බුදින්නේ නම් හෝ ඒ මහණහු විසින්: ඇවැත්නි, අසත්ප්‍රාය වූ පාටිදෙසනීය වූ ගර්හනීය වූ ඇවැතකට පැමිණියෙමි. එය පෙරළා දෙසමි''යි පෙරළා දෙසියයුතු,'

4. **යො පන** යනු: යමෙක්, යම් බඳුයෙක් ... **භික්ඛු** යනු: ... මේ තෙම මේ අර්ථයෙහි 'භික්ෂු'යි අභිප්‍රෙත යි.

**අඤ්ඤාතිකා** නම්: මව්පසින් හෝ පියපසින් හෝ සත්මුතු යුගය තෙක් අසම්බද්ධ වූවා යි.

**භික්ඛුනී** නම්: උභතොසඞ්ඝයා කෙරෙහි උපසපන් වූවා ය.

**අන්තරඝර** නාම: වීථි යැ විනිවිද නොගිය වීථි යැ සතරමංසන්ධි යැ කුලගේ යි.

**බාදනීය** නම්: පස්බොජුන: යාමකාලික යැ සත්තාහකාලික යැ යාවජීවික යැ යන මේ හැර සෙස්ස ඛාදනීය නම.

**භොජනීය** නම්: පස්බොජුන; ඔදන යැ කොමු යැ අත්සුණු යැ දියමස් යැ, ගොඩමස් යැ. 'කමි' යි 'බුදිමි'යි පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරහලායෙහි පරහලායෙහි පිළිදෙස්නී ඇවැත් වේ.

නොනෑමෙහෙණක යන සංඥා ඇති වැ ඇතුළුගමට වත් නොනෑමෙහෙණක අතින් බාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ සියතින් පිළිගෙන කා නම් හෝ බුදී නම් හෝ 'පාටිදෙසනීය' ඇවැත් වෙයි. විමති ඇති වැ ඇතුළුගමට වත් නොනෑමෙහෙණ අතින් කැයුතු හෝ බිදියයුතු දයක් සියතින් පිළිගෙන කා නම් හෝ බුදී නම් 'පාටිදෙසනීය' ඇවැත් වෙයි. නෑමෙහෙණක යන සංඥා ඇති වැ ඇතුළුගමට වත් නොනෑමෙහෙණක අතින් බාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ සියතින් පිළිගෙන කා නම් හෝ බුදී නම් හෝ 'පාටිදෙසනීය' ඇවැත් වේ.

යාමකාලිකය සත්තාහකාලිකය යාවජීවිකය ආහාර පිණිස පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරහලායෙහි පරහලායෙහි දුකුළා ඇවැත් වෙයි. භික්ෂුණීන් කෙරෙහි උපසපන්මෙහෙණක අතින් බාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ 'කමි' යි 'බුදිමි' යි පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරහලායෙහි පරහලායෙහි දුකුළා ඇවැත් වෙයි.

ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. ඤාතිකාය වෙමතිකො ආපත්ති දුක්කටස්ස. ඤාතිකාය ඤාතිකසඤ්ඤී අනාපත්ති.

අනාපත්ති: ඤාතිකාය, දාපෙති න දෙති, උපනික්ඛිපිත්වා දෙති, අන්තරාරාමෙ, භික්ඛුනුපස්සයෙ, තිත්ථියසෙය්‍යාය, පටික්කමනෙ, ගාමතො නීහරිත්වා දෙති, යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං සති පච්චයෙ පරිභුඤ්ජාති දෙති, සික්ඛමානාය, සාමණෙරාය උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

පඨමපාටිදෙසනීය සික්ඛාපදං.

## 7. 2

## දුතියපාටිදෙසනීය සික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දකනිවාපෙ. තෙන ඛො පන සමයෙන භික්ඛූ කුලෙසු නිමන්තිතා භුඤ්ජන්ති. ඡබ්බග්ගියා භික්ඛුනියො ඡබ්බග්ගියානං භික්ඛූනං වොසාසන්තියො ඨිතා හොන්ති. ඉධ සූපං දෙථ ඉධ ඔදනං දෙථාති ඡබ්බග්ගියා භික්ඛූ යාවදත්ථං භුඤ්ජන්ති. අඤ්ඤෙ භික්ඛූ න චිත්තරූපං ලභන්ති යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ භික්ඛුනියො වොසාසන්තියො න නිවාරෙස්සන්ති"ති -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ භික්ඛුනියො වොසාසන්තියො න නිවාරෙථාති සච්චං භගවා විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා භික්ඛුනියො වොසාසන්තියො න නිවාරෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

"භික්ඛූ පනෙව කුලෙසු නිමන්තිතා භුඤ්ජන්ති තත්‍ර චෙ සා භික්ඛුනී වොසාසමානරූපා ඨිතා හොති "ඉධ සූපං දෙථ ඉධ ඔදනං දෙථා"ති. තෙහි භික්ඛූහි සා භික්ඛුනී අපසාදෙතබ්බා. අපසක්ක තාව භගිනි, යාව භික්ඛූ භුඤ්ජන්ති. එකස්සපි චෙ[1] භික්ඛුනො නප්පටිභාසෙය්‍ය තං භික්ඛුනිං අපසාදෙතුං - අපසක්ක තාව භගිනි, යාව භික්ඛූ භුඤ්ජන්ති'ති. පටිදෙසෙතබ්බං තෙහි භික්ඛූහි ගාරය්හං ආවුසො ධම්මං ආපජ්ජිම්හා අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමාති.

1. එකස්ස චෙපි - මජ්ඣං.

නැමෙෙහෙණක අතින් නොනැමෙෙහෙණක යන සංඥා ඇති වැ පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. නැමෙෙහෙණක අතින් විමති ඇත්තේ දුකුළා ඇවැත් වෙයි. නැමෙෙහෙණක අතින් නැමෙෙහෙණක යන සංඥා ඇත්තේ අනාපත්ති වේ.

**අනාපත්ති**: නැමෙෙහෙණක අතින් නම්, අනෙකකු ලවා දෙවවා නම් (තොමෝ) නොදේ නම්, සමීපයෙහි තබා දේ නම්, ආරාමය තුළදී, මෙහෙණවරෙහි, තීර්ථක අරමෙහි, පෙරළා ඊමෙහි, ගමින් බැහැර කොට දේ නම්, යාමකාලිකය සත්තාහකාලිකය යාවජීවිකය ප්‍රත්‍යය ඇති කල්හි වළඳා යයි දේ නම් සික්ඛමානාවක හෙරණක අතින් ගනී නම් ඇවැත් නො වෙයි. උමතුවහට ආදිකාර්මිකහට ඇවැත් නැති.

පළමුවන පාටිදෙසනීය යි.

## 7. 2

## දෙවන පාටිදෙසනීය ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු රජගහනුවර කලන්දකනිවාප නම් වූ වෙළුවන විහාරයෙහි වැඩවෙසෙති. එසමයෙහි භික්ෂූහු කුලයෙහි නිමන්ත්‍රණ කරන ලද්දහු වළඳති. සවග මෙහෙණහු මෙහි සූප දෙව මෙහි බත් දෙව යි සවග මහණුනට වොසාසන (විධාන) කම් කරමින් සිටියාහු වෙති. සවග මහණහු ඇති තාක් වළඳති. අන්මහණහු සිත්සේ නො ලැබෙති. යම් අල්පෙච්ඡ භික්ෂු කෙනෙක් ... ඔහු අවමන් කෙරෙති, නුගුණ කියති, නුගුණ පතුරුවති: ''කෙසේ නම් සවගමහණහු වොසාසන කම් කරන මෙහෙණන් නො වළහන්නාහු''ද යි. ... සැබෑද මහණෙනි, තෙපි වොසාසන කම් කරන මෙහෙණන් නො වළහවු ලැ''යි සැබැව භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූහ. ... කෙසේ නම් මොසපුරුෂයෙනි, තෙපි වොසාසන කම් කරන මෙහෙණන් නො වළහවු ද? හිස්පුරුෂයෙනි, තෙල අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මහණෙනි මෙසේත් මේ ශික්ෂාපදය උදෙසවු:

''මහණහු කුලයෙහි නිමන්ත්‍රණ කරනලද්දහු වළඳත් ද? ඉදින් එහි ඒ මෙහෙණ ''මෙහි සූප දෙව මෙහි බත් දෙව''යි වොසාසන (විධාන) කම් කරන පියවින් සිටියා වේ ද, ඒ මහණුන් විසින් ඒ මෙහෙණ ''නැහණියනි, භික්ෂූන් වළඳනා තාක් පහව යා''යි පහකළයුත්තී යැ. ඉදින් එක් මහණක්හට ද ''නැගණියනි, භික්ෂූන් වළඳනා තාක් පහව යා''යි ඒ මෙහෙණ පහකරන්නට නො වැටහේ නම් ඒ මහණුන් විසින් ''ඇවැත්ති, ගැරැහියයුතු අසත්ප්‍රාය වූ පාටිදෙසනීය ඇවැතකට පැමිණියම්හ. එය යළි දෙසම්හ''යි පිළිදෙසියයුතු''

2. **භික්ඛූ පනෙව කුලෙසු නිමන්තිතා භුඤ්ජන්තීති:**[1] කුලං නාම චත්තාරි කුලානි ඛත්තියකුලං බ්‍රාහ්මණකුලං වෙස්සකුලං සුද්දකුලං.

**නිමන්තිතා භුඤ්ජන්තීති;** පඤ්චන්නං භොජනානං අඤ්ඤතරෙන භොජනෙන නිමන්තිතා භුඤ්ජන්ති.

**භික්ඛුනී** නාම: උභතො සඞ්ඝෙ උපසම්පන්නා.

**වොසාසන්තී** නාම: යථාමිත්තතා යථාසන්දිට්ඨතා යථාසම්භත්තතා යථා සමානුපජ්ඣායකතා යථාසමානාචරියකතා "ඉධ සූපං දෙථ ඉධ ඔදනං දෙථා"ති එසා වොසාසන්තී නාම.

**තෙහි භික්ඛූහීති:** භුඤ්ජමානෙහි භික්ඛූහි.

**සා භික්ඛුනීති:** යා සා වොසාසන්තී භික්ඛුනී. තෙහි භික්ඛූහි සා භික්ඛුනී අපසාදෙතබ්බා. 'අපසක්ක තාව භගිනි යාව භික්ඛූ භුඤ්ජන්තී'ති එකස්සපි චෙ[2] භික්ඛුනො අනපසාදිතෙ[3] බාදිස්සාමි භුඤ්ජිස්සාමීති පතිගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාටිදෙසනීයස්ස.

උපසම්පන්නාය උපසම්පන්නසඤ්ඤී වොසාසන්තියා න නිවාරෙති ආපත්ති පාටිදෙසනීයස්ස. උපසම්පන්නාය වෙමතිකො වොසාසන්තියා න නිවාරෙති ආපත්ති පාටිදෙසනීයස්ස. උපසම්පන්නාය අනුපසම්පන්නසඤ්ඤී වොසාසන්තියා න නිවාරෙති ආපත්ති පාටිදෙසනීයස්ස.

එකතො උපසම්පන්නාය වොසාසන්තියා න නිවාරෙති ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය උපසම්පන්නසඤ්ඤී ආපත්ති දුක්කටස්ස අනුපසම්පන්නාය වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අනුපසම්පන්නාය අනුපසම්පන්නසඤ්ඤී අනාපත්ති.

**අනාපත්ති:** අත්තනො භත්තං දාපෙති න දෙති, අඤ්ඤෙසං[4] භත්තං දෙති න දාපෙති, යං න දින්නං තං දාපෙති, යත්ථ න දින්නං තත්ථ දාපෙති, සබ්බෙසං සමකං දාපෙති, සික්ඛමානාය[5] වොසාසති, සාමණෙරාය[6] වොසාසති, පඤ්ච භොජනානි ඨපෙත්වා සබ්බත්ථ අනාපත්ති උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

දුතිය පාටිදෙසනීය සික්ඛාපදං.

1. භුඤ්ජන්ති සීමු. මජසං
2. එකස්ස වෙපි-මජසං
3. අනපසාදිතො-මජසං,
4. අඤ්ඤස්ස-මජසං
5. සික්ඛමානා-මජසං
6. සාමණෙරී-මජසං

2 **භික්ඛූ පනෙව කුලෙසු නිමන්තිතා භුඤ්ජන්ති** යනු: කුල නම් සතර කුලයෝ යි: ක්ෂත්‍රියකුල යැ බ්‍රාහ්මණකුල යැ වෛශ්‍යකුල යැ ශූද්‍රකුල යි.

**නිමන්තිතා භුඤ්ජන්ති** යනු: පස් බොජුන් අතුරෙන් එක්තරා බොජුනෙකින් නිමන්ත්‍රණ කරනලද්දහු වළඳති.

**භික්ඛුනී** නම්: උභතොසඞ්ඝයා කෙරෙහි උපසපන් වූවා යි.

**වොසාසන්තී** නම: මිතුරු බව ඇති සේ දුටුමිතුරුබව ඇති සේ දැඩි මිතුරුබව ඇති සේ සමානොපාධ්‍යායතා ඇති සේ සමානාචාර්‍ය්‍යතා ඇති සේ "මෙතන්හි සූප දෙව මෙතන්හි බත් දෙව" යි මෝ වොසාසන්තී නම.

**තෙහි භික්ඛූහි** යනු: වළඳනා භික්ෂූන් විසින්.

**සා භික්ඛුනී** යනු: ඒ වොසාසන කම් කරන මෙහෙණ යි. ඒ මහණුන් විසින් ඒ මෙහෙණ අපසාදන කළයුත්තී යැ: "නැඟැණියනි භික්ෂූන් වළඳනා තාක් පහව යා" යි ඉදින් එකද මහණක්හු අපසාදනා නො කළ කල්හි 'කම්' 'බුදිම්' පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරභලායෙහි පරභලායෙහි පිළිදෙස්නී ඇවැත් වේ.

'උපසපනක' යන සංඥා ඇත්තේ උපසපන් මෙහෙණ විධාන කරන කල්හි නො වළහා නම් පාටිදෙසනීය ඇවැත් වෙයි. විමති ඇත්තේ උපසපන් මෙහෙණ විධාන කරන කල්හි නො වළහා නම් පාටිදෙසනීය ඇවැත් වෙයි. 'අනුපසපනක' යන සංඥා ඇත්තේ උපසපන් මෙහෙණ විධාන කරන කල්හි නො වළහා නම් පාටිදෙසනීය ඇවැත් වේ.

භික්ෂුණීසංඝයා කෙරෙහි උපසපන් මෙහෙණ විධාන කරන කල්හි නො වළහා නම් දුකුළා ඇවැත් වෙයි. අනුපසපන 'උපසපනක' යන සංඥා ඇත්තේ දුකුළා ඇවැත් වෙයි. අනුපසපන (විධාන කරන කල්හි) විමති ඇත්තේ දුකුළා ඇවැත් වෙයි. අනුපසපන (විධාන කරන කල්හි) 'අනුපසපනක' යන සංඥා ඇත්තේ ඇවැත් නැති.

**අනාපත්ති**: තමාගේ බත දෙවවා ද නො දේ ද, මෙරමාගේ බත දේ ද නො දෙවා ද, යමක් නො දෙනලද නම් එය දෙවවා ද, යම් තැනක නො දෙන ලද නම් එහි දෙවවා ද, හැමට සම වැ දෙවවා ද, සික්ඛමානාවට විධාන කෙරේ ද, හෙරණියට විධාන කෙරේ ද, පස්බොජුන් තබා හැමතන්හි ඇවැත් නැති. උමතුවූවහුට ආදිකාර්මිකයාට ඇවැත් නැති.

දෙවැනි පාටිදෙස්නීය යි.

## 7. 3

# තතිය පාටිදෙසනීය සික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන සාවත්ථියං අඤ්ඤතරං කුලං උභතො පසන්නං හොති සද්ධාය වඩ්ඪති භොගෙන හායති. යං තස්මිං කුලෙ උප්පජ්ජති පුරෙභත්තං ඛාදනීයං වා භොජනීයං වා තං සබ්බං භික්ඛූනං විස්සජ්ජෙත්වා අප්පෙකදා අනසිතා අච්ඡන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. "කථං හි නාම සමණා සක්‍යපුත්තියා න මත්තං ජානිත්වා පටිග්ගහෙස්සන්ති ඉමෙසං දත්වා අප්පෙකදා අනසිතා අච්ඡන්ති"ති අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

2. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි "අනුජානාමි භික්ඛවෙ යං තං කුලං[1] සද්ධාය වඩ්ඪති භොගෙන හායති, එවරූපස්ස කුලස්ස ඤත්තිදුතියෙන කම්මෙන සෙඛසම්මුතිං දාතුං" එවඤ්ච පන භික්ඛවෙ දාතබ්බා. ව්‍යත්තෙන භික්ඛුනා පටිබලෙන සඞ්ඝො ඤාපෙතබ්බො.

3. සුණාතු මෙ භන්තෙ සඞ්ඝො ඉත්ථන්නාමං කුලං සද්ධාය වඩ්ඪති භොගෙන හායති. යදි සඞ්ඝස්ස පත්තකල්ලං සඞ්ඝො ඉත්ථන්නාමස්ස කුලස්ස සෙඛසම්මුතිං දදෙය්‍ය, එසා ඤත්ති.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො ඉත්ථන්නාමං කුලං සද්ධාය වඩ්ඪති භොගෙන හායති. සඞ්ඝො ඉත්ථන්නාමස්ස කුලස්ස සෙඛසම්මුතිං දෙති. යස්සායස්මතො ඛමති ඉත්ථන්නාමස්ස කුලස්ස සෙඛසම්මුතියා දානං, සො තුණ්හස්ස, යස්ස නක්ඛමති සො භාසෙය්‍ය.

දින්නා සඞ්ඝෙන ඉත්ථන්නාමස්ස කුලස්ස සෙඛසම්මුති. ඛමති සඞ්ඝස්ස, තස්මා තුණ්හී එවමෙතං ධාරයාමීති.

එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

---

1. යං කුලං, මජසං

# 7. 3

## තුන්වැනි පාටිදෙසනීය ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර අනේපිඬුසිටුහු කරවා දුන් දෙව්රම්වෙහෙරෙහි වැඩවෙසෙති. එසමයෙහි සැවැත් නුවර එක්තරා කුලයක් උවසු උවැසි දෙපසින් පහන් වූයේ වෙයි. සැදැහැයෙන් වැඩෙයි, භොගයෙන් පිරිහෙයි. ඒ කුලයෙහි පෙරබත් වේලෙහි යම් ඛාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ උපදී ද එ හැම භික්ෂූනට විසදා (බෙදා දී) ඇතැම් දවසෙක නිරාහාර වැ ද හිඳිති. මිනිස්සු අවමන් කෙරෙති, නුගුණ කියති, නුගුණ පතුරුවති: "කෙසේ නම් ශ්‍රමණශාක්‍යපුත්‍රයෝ පමණ නො දනැ පිළිගන්නාහු ද මොවුනට දී ඇතැම් දවසෙක නිරාහාර වැ ද හිඳිති" යි. භික්ෂූහු අවමන් කරන නුගුණ කියන නුගුණ පතුරුවන ඒ මිනිසුන්ගේ බස් ඇසූහ. එසඳ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ දන්වූහ.

2. එකල්හි භාග්‍යවතුන් වහන්සේ තෙල නිදානයෙහි තෙල කරුණෙහි දැහැමි කථා වදරා භික්ෂූන් ඇමතූ සේක: "මහණෙනි, යම් කුලයක් සැදැහැයෙන් වැඩේ ද භොගයෙන් පිරිහේ ද මෙබඳු කුලයට ඤත්තිද්වතිය කර්මයෙන් 'ශෛක්ෂසම්මුති' දෙන්නට අනුදනිමි" මහණෙනි මෙසේ දියයුතු යැ, ප්‍රතිබල සම්පන්න ව්‍යක්ත මහණක්හු විසින් සඞ්ඝයා ඥාපන කළ (දන්විය) යුත්තේ යැ.

3. "වහන්ස සඞ්ඝයා මාගේ වචන අසාවා. මෙ නම් කුලය සැදැහැයෙන් වැඩෙයි, භොගයෙන් පිරිහෙයි. ඉදින් සඞ්ඝයාට ප්‍රාප්තකාල වී නම් සඞ්ඝයා මෙ නම් කුලයට 'සෛක්ෂසම්මුති' දෙන්නේ යැ. මේ ඥප්ති යි.

වහන්ස, සඞ්ඝයා මාගේ වචන අසාවා. මෙ නම් කුලය සැදැහැයෙන් වැඩෙයි. භොගයෙන් පිරිහෙයි. සඞ්ඝයා මේ නම් කුලයට 'සෛක්ෂසම්මුති' දෙයි. යම් ආයුෂ්මත් කෙනකුන්ට මෙ නම් කුලයට 'සෛක්ෂසම්මුති' දීම රිසියෙයි නම්, ඒ ආයුෂ්මත් තුෂ්ණීම්භූත වේවා. යමක්හට නො රිසි යෙයි නම් හේ කියන්නේ යැ.

සඞ්ඝයා විසින් මෙ නම් කුලයට 'සෛක්ෂසම්මුති' දෙන ලදී. සඞ්ඝයාට රිසියෙයි. එහෙයින් තුෂ්ණීම්භූත වී. තෙල මෙසේ ධරමි" යි

මහණෙනි, මේ ශික්ෂාපදය මෙසේ උදෙසවූ:

**"යානි ඛො පන තානි සෙඛසම්මතානි කුලානි යො පන භික්ඛු තථාරූපෙසු සෙඛසම්මතෙසු කුලෙසු ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පටිදෙසෙතබ්බං තෙන භික්ඛුනා: ගාරය්හං ආවුසො ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමී"ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

4. තෙන ඛො පන සමයෙන සාවත්ථියං උස්සවො හොති. මනුස්සා භික්ඛූ නිමන්තෙත්වා භොජෙන්ති. තම්පි ඛො කුලං භික්ඛූ නිමන්තෙසි. භික්ඛූ කුක්කුච්චායන්තා නාධිවාසෙන්ති. "පටික්ඛිත්තං භගවතා සෙඛසම්මතෙසු කුලෙසු ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදිතුං භුඤ්ජිතු"න්ති. තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කින්නුඛො නාම අම්හාකං ජීවිතෙන යං අය්‍යා අම්හාකං න පතිගණ්හන්තී"ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

5. අථඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. "අනුජානාමි භික්ඛවෙ නිමන්තිතෙන සෙඛසම්මතෙසු කුලෙසු ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදිතුං භුඤ්ජිතුං" එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**"යානි ඛො පන තානි සෙඛසම්මතානි කුලානි. යො පන භික්ඛු තථාරූපෙසු සෙඛසම්මතෙසු කුලෙසු පුබ්බෙ අනිමන්තිතො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පටිදෙසෙතබ්බං තෙන භික්ඛුනා ගාරය්හං ආවුසො ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමී"ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

6. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු තස්ස කුලස්ස කුලූපගො හොති. අථ ඛො සො භික්ඛු පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරං ආදාය යෙන තං කුලං තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි තෙන ඛො පන සමයෙන සො භික්ඛු ගිලානො හොති. අථ ඛො තෙ මනුස්සා තං භික්ඛුං එතදවොචුං භුඤ්ජථ භන්තෙති. අථ ඛො සො භික්ඛු භගවතා "පටික්ඛිත්තං අනිමන්තිතෙන සෙඛසම්මතෙසු කුලෙසු ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදිතුං භුඤ්ජිතු"න්ති. කුක්කුච්චායන්තො න පටිග්ගණ්හෙසි. නාසක්ඛි පිණ්ඩාය චරිතුං ඡින්නභත්තො අහොසි. අථ ඛො සො භික්ඛු ආරාමං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

''යම් 'සෙඛසම්මත' කුල කෙනෙක් ඇද්ද, යම් මහණෙක් එබඳු සෙඛසම්මත කුලයෙහි ඛාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ සියතින් පිළිගෙන, කන්නේ නම් හෝ බුදින්නේ නම් හෝ ඒ මහණහු විසින් ඇවැත්නි, නොසරුප් වූ පිළිදෙස්නී වූ ගැරැහිය යුතු ඇවැතකට අවන්මි. එය පිළිදෙසම්'යි පිළිදෙසියැ යුතු''

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේත් මේ සිකපදය පනවන ලදී.

4. එසමයෙහි සැවැත්නුවර උත්සවයෙක් වෙයි. මිනිස්සු භික්ෂූන් නිමන්ත්‍රණ කොට වළඳවති. ඒ (සෙඛසම්මත) කුලය ද භික්ෂූන් නිමන්ත්‍රණ කෙළේ යැ. භික්ෂූහු කුකුස් කරන්නාහු ''භාග්‍යවතුන් විසින් සෙඛසම්මත කුලයෙහි ඛාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ සියතින් පිළිගෙන කන්නට බුදින්නට ප්‍රතික්ෂෙප කරන ලද්ද''යි නො ඉවසති ඔහු අවමන් කෙරෙති, නුගුණ කියති, නුගුණ පතුරුවති: ''යම් හෙයෙකින් ආර්‍ය්‍යයෝ අපගේ නිමන්ත්‍රණ නො පිළිගනිත් නම් අපගේ ජීවිතයෙන් කවර අර්ථයෙක් ද''යි. භික්ෂූහු ඒ මිනිසුන් අවමන් කරනුවන් නුගුණ කියනුවන්, නුගුණ පතුරනුවන්ගේ බස් ඇසූහ. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැලකළහ.

5. එසඳ භාග්‍යවතුන් වහන්සේ තෙල නිදනයෙහි තෙල කරුණෙහි ලා දැහැමි කථා කොට භික්ෂූන් ඇමැතූසේක: ''මහණෙනි, නිමන්ත්‍රණ කරන ලදුවහු විසින් සෙඛසම්මත කුලයෙහි ඛාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ සියතින් පිළිගෙන කන්නට බුදින්නට අනුදනිමි'' මහණෙනි මෙසේත් මේ ශික්ෂාපදය උදෙසවු:

**''යම් ඒ සෙඛසම්මත කුල කෙනෙක් ඇද්ද යම් මහණෙක් එබඳු සෙඛසම්මත කුලයෙහි පෙර නිමන්ත්‍රණ නො කරන ලද්දේ ඛාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ සියතින් පිළිගෙන කා නම් හෝ බුදී නම් හෝ ඒ මහණහු විසින්;'' ඇවැත්නි, ගැරැහියැයුතු අසත්ප්‍රාය වූ පාටිදෙසනීය ඇවැතකට පැමිණියෙමි. එය වෙන් කොට දෙසමි''යි. පාටිදෙසනා කළ යුතු.**

6. එසමයෙහි එක්තරා මහණෙක් ඒ කුලයට කුලූපග වෙයි. එසඳ ඒ මහණ පෙරවරුයෙහි හැඳැපෙරෙවැ පාසිවුරු ගෙන ඒ කුලය කරා එළැඹියේ යැ, එළැඹැ පැනවූ අස්නෙහි හින. එසමයෙහි ඒ මහණ ගිලන් වෙයි. එසඳ ඒ මිනිස්සු ඒ මහණහට තෙල කීහ: ''වහන්ස 'වළඳව'යි එසඳ ඒ මහණ භාග්‍යවතුන් විසින් ''නිමන්ත්‍රණ නො කරන ලදහු විසින් සෙඛසම්මත කුලයෙහි ඛාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ සියතින් පිළිගෙන කනු බුදිනු ප්‍රතික්ෂිප්ත යැ''යි කුකුස් කරනුයේ නො පිළිගත. පිඩුසිඟා යන්නට නො හැකි වී. සුන්බත් වී. ඉක්බිති ඒ මහණ අරමට ගොස් භික්ෂූනට තෙල කරුණ දැන්වී. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැලකළහ.

7. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. "අනුජානාමි භික්ඛවෙ ගිලානෙන භික්ඛුනා සෙඛසම්මතෙසු කුලෙසු ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදිතුං භුඤ්ජිතුං."

එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

"යානි ඛො පන තානි සෙඛසම්මතානි කුලානි, යො පන භික්ඛු තථාරූපෙසු සෙඛසම්මතෙසු කුලෙසු පුබ්බෙ අනිමන්තිතො අගිලානො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පටිදෙසෙතබ්බං තෙන භික්ඛුනා: ගාරය්හං ආවුසො ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමී"ති.

8. යානි ඛො පන තානි සෙඛසම්මතානි කුලානීති: සෙඛසම්මතං නාම කුලං යං කුලං සද්ධාය වඩ්ඪති භොගෙන හායති එවරූපස්ස කුසලස්ස ඤත්තිදුතියෙන කම්මෙන සෙඛසම්මුති දින්නා හොති.

යො පනාති: යො යාදිසො -පෙ- භික්ඛූති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

තථාරූපෙසු සෙඛසම්මතෙසු කුලෙසූති: එවරූපෙසු සෙඛසම්මතෙසු කුලෙසු.

අනිමන්තිතො නාම: අජ්ජතනාය වා ස්වාතනාය වා අනිමන්තිතො ඝරූපචාරං ඔක්කමන්තෙ නිමන්තෙති[1] එසො අනිමන්තිතො නාම.

නිමන්තිතො නාම: අජ්ජතනාය වා ස්වාතනාය වා නිමන්තිතො ඝරූපචාරං අනොක්කමන්තෙ නිමන්තෙති, එසො නිමන්තිතො නාම.

අගිලානො නාම: සක්කොති පිණ්ඩාය චරිතුං.

ගිලානො නාම: න සක්කොති පිණ්ඩාය චරිතුං.

1. ඔක්කමන්තෙන නිමන්තෙති - සීමු. මජසං

7. එසඳ භාග්‍යවතුන් වහන්සේ තෙල නිදානයෙහි තෙල කරුණෙහි දහැම් කථා කොට මහණුන් ඇමැතූසේක: "මහණෙනි, ගිලන් මහණහු විසින් සෙඛසම්මත කුලයෙහි ඛාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ සියතින් පිළිගෙන කන්නට බුදින්නට අනුදනිමි."
මහණෙනි, මෙසේත් මේ ශික්ෂාපදය උදෙසවු:

**"යම් ඒ සෙඛසම්මත කුල කෙනෙක් ඇද්ද, යම් මහණෙක් එබඳු සෙඛසම්මත කුලයෙහි පෙර නිමන්ත්‍රණ නො කරන ලද්දේ නො ගිලන් වූයේ ඛාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ සියතින් පිළිගෙන කා නම් හෝ බුදී නම් හෝ ඒ මහණහු විසින් 'ඇවැත්නි, ගැරැහියැයුතු අසත්-ප්‍රාය වූ පාටිදෙසනීය ඇවැතකට පැමිණියෙමි. එය වෙන් කොට දෙසමි"යි පටිදෙසනා කළයුතු.**

8. **යානි ඛො පන සෙඛසම්මතානි කුලානි** යනු: සෙඛසම්මත කුල නම්: යම් කුලයක් ශ්‍රද්ධායෙන් වැඩෙ ද, භොගයෙන් පිරිහේ ද, එබඳු කුලයට 'ඤත්තිදුතිය' කර්මයෙන් සෙඛසම්මුති දෙන ලද වෙයි.

**'යො පන'** යනු: යමෙක් යම් බඳුයෙක් ... **'භික්ඛු'** යනු: ... මේ තෙම මේ අර්ථයෙහි 'භික්ඛු' යයි අදහස් කරනලද්දේ යැ.

**තථාරූපෙසු සෙඛසම්මතෙසු කුලෙසු** යනු: මෙබඳු වූ සෙඛසම්මත කුලයෙහි.

**අනිමන්තිත** නම්: අද දවසට හෝ සෙට දවසට නිමන්ත්‍රණ නො කරන ලද්දේ යැ. ගෘහොපචාරයට බස්නා කල්හි නිමන්ත්‍රණ කෙරෙද්ද තෙල තැනැත්තේ අනිමන්තිත නම් වෙයි.

**නිමන්තිත** නම්: අද දවසට හෝ සෙට දවසට හෝ නිමන්ත්‍රණ කරන ලද්දේ යැ. ගෘහොපචාරයට නො පැමිණි කල්හි නිමන්ත්‍රණ කෙරෙද්ද තෙල තැනැත්තේ නිමන්තිත නම් වේ.

**අගිලාන** නම්: පිඬුසිඟා යන්නට හැකි වූයේ වෙයි.

**ගිලාන** නම්: පිඬු සිඟා යන්නට නො හැකි වූයේ ය.

ඛාදනීයං නාම: පඤ්ච භොජනානි යාමකාලිකං සත්තාහ කාලිකං යාවජීවිකං ඨපෙත්වා අවසෙසං ඛාදනීයං නාම.

භොජනීයං නාම: පඤ්ච භොජනානි ඔදනො කුම්මාසො සත්තු මච්ඡො මංසං. අනිමන්තිතො අගිලානො ඛාදනීයං වා භොජනීයං වා ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පතිගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාටිදෙසනීයස්ස-

සෙඛසම්මතෙ සෙඛසම්මතසඤ්ඤී අනිමන්තිතො අගිලානො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදති වා භුඤ්ජති වා ආපත්ති පාටිදෙසනීයස්ස. සෙඛසම්මතෙ වෙමතිකො අනිමන්තිතො අගිලානො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදති වා භුඤ්ජති වා ආපත්ති පාටිදෙසනීයස්ස. සෙඛසම්මතෙ අසෙඛසම්මතසඤ්ඤී අනිමන්තිතො අගිලානො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදති වා භුඤ්ජති වා ආපත්ති පාටිදෙසනීයස්ස.

යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං ආහාරත්ථාය පතිගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති දුක්කටස්ස.

අසෙඛසම්මතෙ සෙඛසම්මතසඤ්ඤී ආපත්ති දුක්කටස්ස. අසෙඛසම්මතෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස. අසෙඛසම්මතෙ අසෙඛසම්මතසඤ්ඤී අනාපත්ති.

අනාපත්ති: නිමන්තිතස්ස, ගිලානස්ස, නිමන්තිතස්ස වා ගිලානස්ස වා, සෙසකං භුඤ්ජති. අඤ්ඤෙසං භික්ඛා තත්ථ පඤ්ඤත්තා හොති, ඝරතො නීහරිත්වා දෙන්ති, නිච්චභත්තෙ, සලාකභත්තෙ, පක්ඛිකෙ, උපොසථිකෙ, පාටිපදිකෙ, යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං සති පච්චයෙ පරිභුඤ්ජති දෙති, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

තතිය පාටිදෙසනීයං.

**ඛාදනීය නම්:** පඤ්චභොජනයෝ යි. යාමකාලිකය සත්තාහකාලිකය යාවජ්ජීවිකය තබා සෙස්ස ඛාදනීය නම.

**භොජනීය නම්;** පඤ්චභොජනයෝ යැ. බත් යැ, කොමු යැ. අත්සුණු යැ. දියමස් යැ. ගොඩමස් යැ. නිමන්ත්‍රණ නො කරන ලද්දේ නො ගිලන් වූයේ ඛාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ 'කමි'යි 'බුදිමි'යි පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරහලායෙහි පරහලායෙහි පාටිදෙසනීය ඇවැත් වේ.

සෙඛසම්මත කුලයෙහි සෙඛසම්මත යැ යන සංඥා ඇතියේ නිමන්ත්‍රණ නො කරන ලදු වැ නො ගිලන් වැ ඛාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ සියතින් පිළිගෙන කන්නේ නම් හෝ බුදින්නේ නම් හෝ පාටිදෙසනීය ඇවැත් වෙයි. සෙඛසම්මතයෙහි විමති ඇතියේ නිමන්ත්‍රණ නො කරන ලදු වැ නො ගිලන් වැ ඛාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ සියතින් පිළිගෙන කන්නේ නම් හෝ බුදින්නේ නම් හෝ පාටිදෙසනීය ඇවැත් වෙයි. සෙඛසම්මතයෙහි සෙඛසම්මතසංඥා නැතියේ නිමන්ත්‍රණ නො කරන ලදු වැ නො ගිලන් වැ ඛාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ සියතින් පිළිගෙන කන්නේ නම් හෝ බුදින්නේ නම් හෝ පාටිදෙසනීය ඇවැත් වේ.

යාමකාලිකය සත්තාහකාලිකය යාවජ්ජීවිකය ආහාර පිණිස පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරහලායෙහි පරහලායෙහි දුකුළා ඇවැත් වේ.

අසෙඛසම්මතයෙහි සෙඛසම්මතසංඥා ඇතියේ දුකුළා ඇවැත් වෙයි. අසෙඛසම්මතයෙහි විමති ඇතියේ දුකුළා ඇවැත් වෙයි. අසෙඛසම්මත යෙහි අසෙඛසම්මතසංඥා ඇතියේ ඇවැත් නැති.

**අනාපත්ති:** නිමන්ත්‍රිතයාහට, ගිලනාහට, නිමන්ත්‍රිතයාගේ හෝ ගිලනාගේ හෝ ශෙෂය වළඳනුයේ නම් ඔහුට, එහි අන්‍යයන්ට භික්ෂා පනවන ලද වේ ද, ගෘහයෙන් බැහැර කොට දෙත් ද එහි නිතිබත්හි, ලහබත්හි, පක්ෂයට වරක් දෙන බත්හි, පොහෝබත්හි, පැළවියදවස් දෙන බත්හි, යාමකාලිකය සත්තාහකාලිකය යාවජ්ජීවිකය ප්‍රත්‍යය ඇති කල්හි වළඳා නම් දේ නම් ඔහුට; උමතුවූවහුට ආදි කාර්මිකයාට ඇවැත් නැති.

**තුන්වැනි පාටිදෙසනීය යි.**

# 7 . 4

## චතුත්ථපාටිදෙසනීයසික්ඛාපදං

1. තෙන සමයෙන බුද්ධො භගවා සක්කෙසු විහරති කපිලවත්ථුස්මිං නිග්‍රොධාරාමෙ තෙන ඛො පන සමයෙන සාකියදසකා අවරුද්ධා හොන්ති. සාකියානියො ඉච්ඡන්ති ආරඤ්ඤකෙසු සෙනාසනෙසු භත්තං කාතුං. අස්සොසුං ඛො සාකියදසකා සාකියානියො කිර ආරඤ්ඤකෙසු සෙනාසනෙසු භත්තං කාතුකාමාති. තෙ මග්ගෙ පරියුට්ඨිංසු. සාකියානියො පණීතං ඛාදනීයං භොජනීයං ආදය ආරඤ්ඤකං සෙනාසනං අගමංසු. සාකියදසකා නික්ඛමිත්වා සාකියානියො අච්ඡින්දිංසු ච දූසෙසුං ච. සාකියා නික්ඛමිත්වා තෙ චොරෙ සභණ්ඩෙ[1] ගහෙත්වා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම භදන්තා ආරාමෙ චොරෙ පටිවසන්තෙ නාරොචෙස්සන්තී"ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං[2] සාකියානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං -පෙ- අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

2. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. තෙන හි භික්ඛවෙ භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤපෙස්සාමි දස අත්ථවසෙ පටිච්ච සඞ්ඝසුට්ඨුතාය -පෙ- සද්ධම්මට්ඨිතියා විනයානුග්ගහාය. එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

> "යානි ඛො පන තානි ආරඤ්ඤකානි සෙනාසනානි සාසඞ්කසම්මතානි සප්පටිභයානි. යො පන භික්ඛු තථාරූපෙසු සෙනාසනෙසු විහරන්තො පුබ්බෙ අප්පටිසංවිදිතං ඛාදනීයං වා භොජනීයං වා අජ්ඣාරාමෙ සහත්ථා පටිග්ගහෙත්වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පටිදෙසෙතබ්බං තෙන භික්ඛුනා ගාරය්හං ආවුසො ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමී"ති.

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

3. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු ආරඤ්ඤකෙසු සෙනාසනෙසු ගිලානො හොති. මනුස්සා ඛාදනීයං භොජනීයං ආදය ආරඤ්ඤකං සෙනාසනං අගමංසු. අථ ඛො තෙ මනුස්සා තං භික්ඛුං එතදවොචුං භුඤ්ජථ භන්තෙති. අථ ඛො සො භික්ඛු භගවතා පටික්ඛිත්තං ආරඤ්ඤකෙසු සෙනාසනෙසු ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදිතුං භුඤ්ජිතු''න්ති කුක්කුච්චායන්තො න පටිග්ගහෙසි නාසක්ඛි පිණ්ඩාය චරිතුං ඡින්නභත්තො අහොසි. අථ ඛො සො භික්ඛු භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං.

---

1. සහ භණ්ඩෙන - මඡසං
2. තෙසන්ති පදං මරම්මඡට්ඨසංගීතිපිටකෙ න දිස්සතෙ,

## 7.4

## සතරවැනි පාටිදෙසනීය ශික්ෂාපදය

1. එසමයෙහි භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ශාක්‍යජනපදයෙහි කිඹුල්වත්පුර නිග්‍රොධාරාමයෙහි වැඩවසන සේක. එසමයෙහි ශාක්‍යදසයෝ විරුද්ධ වූවාහු වෙති. සැහැකුල කාන්තාවෝ වනසෙනසුන්හි දනක් දෙන්නට රිසි වෙති. "සැහැකුල කාන්තාවෝ වනසෙනසුන්හි දන් දෙනු රිසිවූහ ල'යි ශාක්‍යදසයෝ ඇසූහ. ඔහු මඟ අවුරාසිටියහ. සැහැකුල කාන්තාවෝ ප්‍රණීත වූ ඛාද්‍ය භොජ්‍ය ගෙනැ වනසෙනසුනට ගියහ. සැහැකුල මෙහෙකරුවෝ නික්ම සැහැකුල කාන්තාවන් පැහැර ගත්හ. දූෂණ ද කළහ. ශාක්‍යයෝ නික්ම ඒ බඩු සහිත හොරුන් අල්වාගෙනැ අවමන් කෙරෙති, නුගුණ කියති, නුගුණ පතුරුවති: "කිසේ නම් වහන්දෑවරු ආරමයෙහි සොරකු වසනා කල්හි ආරොචන නො කෙරෙත් දැ"යි. භික්ෂූහු ඒ අවමන් කරන නුගුණ කියන නුගුණ පතුරුවන ශාක්‍යයන්ගේ බස් ඇසූහ. ... එසඳ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැලකළහ.

2. එසඳ භාග්‍යවතුන් වහන්සේ තෙල නිදනයෙහි තෙල කරුණෙහි දැහැමි කථා වදරා භික්ෂූන් ඇමතූ සේක. එකරුණින් මහණෙනි, දසඅර්ථ විශෙෂයන් පිණිස භික්ෂූන්ට ශික්ෂාපද පනවන්නෙමි. සඞ්ඝයාගේ මනාබව පිණිස යැ ... සද්ධර්මස්ථිතිය පිණිස යැ විනයට උපස්ථම්භ පිණිස යි. මහණෙනි, මෙසේත් මේ ශික්ෂාපදය උදෙසවු:

**"යම් ඒ සැක සහිත යැ යි සම්මත වූ ප්‍රතිභය සහිත වූ වන සෙනසුන් කෙනෙක් ඇද්ද, යම් මහණෙක් එබඳු සෙනසුන්හි වාස කරන්නේ පළමු නොදන්වා ගෙනෙන ලද ඛාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ ඇතුළුඅරම්හි දී සියතින් පිළිගෙන කා නම් හෝ බුදී නම් හෝ ඒ මහණහු විසින්: ඇවැත්නි ගැරැහියැයුතු අසත්ප්‍රාය වූ පාටිදෙසනීය ඇවැතකට පැමිණියෙමි. එය වෙන් කොට දෙසමි" යි**

භාග්‍යවතුන් වහන්සේ විසින් මෙසේත් මේ ශික්ෂාපදය පනවන ලද වේ.

3. එසමයෙහි එක්තරා මහණෙක් වනසෙනසුන්හි ගිලන් වූයේ වෙයි. මිනිස්සු ඛාද්‍ය භොජ්‍ය ගෙන වනසෙනසුනට ගියහ. එසඳ ඒ මිනිස්සු ඒ මහණහට තෙල කරුණ කීහ; "වහන්ස, වළඳව'යි. එසඳ ඒ මහණ භාග්‍යවතුන් විසින් වනසෙනසුන්හි දී ඛාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ සියතින් පිළිගෙන කනු බුදිනු ප්‍රතික්ෂෙප කරන ලද'යි කුකුස් කරන්නේ නොපිළිගත. පිඩුසිඟායන්නට නොහැකි විය. සුන්බත් වී. ඉක්බිති ඒ මහණ, තෙල කරුණ මහණුන්ට ආරොචන කළේ. භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට තෙල කරුණ සැලකළහ.

4. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. "අනුජානාමි භික්ඛවෙ ගිලානෙන භික්ඛුනා ආරඤ්ඤකෙසු සෙනාසනෙසු[1] ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදිතුං භුඤ්ජිතුං" එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

"යානි ඛො පන තානි ආරඤ්ඤකානි සෙනාසනානි සාසංකසම්මතානි සප්පටිභයානි, යො පන භික්ඛු තථාරූපෙසු සෙනාසනෙසු විහරන්තො පුබ්බෙ අප්පටිසංවිදිතං ඛාදනීයං වා භොජනීයං වා අජ්ඣාරාමෙ සහත්ථා පටිග්ගහෙත්වා අගිලානො ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පටිදෙසෙතබ්බං තෙන භික්ඛුනා: ගාරය්හං ආවුසො ධම්මං ආපජ්ජිං අසප්පායං පාටිදෙසනීයං තං පටිදෙසෙමී"ති.

5. යානි ඛො පන තානි ආරඤ්ඤකානි සෙනාසනානීති: ආරඤ්ඤකං නාම: සෙනාසනං පඤ්චධනුසතිකං පච්ඡිමං.

සාසඞ්කං නාම: ආරාමෙ වා[2] ආරාමූපචාරෙ වා චොරානං නිවිට්ඨොකාසො දිස්සති භුත්තොකාසො දිස්සති ඨිතොකාසො දිස්සති නිසින්නොකාසො දිස්සති නිපන්නොකාසො දිස්සති.

සප්පටිභයං නාම: ආරාමෙ වා ආරාමූපචාරෙ වා චොරෙහි මනුස්සා හතා දිස්සන්ති විලුත්තා දිස්සන්ති ආකොටිතා දිස්සන්ති.

යො පනාති; යො යාදිසො -පෙ- භික්ඛූති: -පෙ- අයං ඉමස්මිං අත්ථෙ අධිප්පෙතො භික්ඛූති.

තථාරූපෙසු සෙනාසනෙසූති: එවරූපෙසු සෙනාසනෙසු

අප්පටිසංවිදිතං නාම: පඤ්චන්නං පටිසංවිදිතං එතං අප්පටිසංවිදිතං නාම. ආරාමං ආරාමූපචාරං ඨපෙත්වා පටිසංවිදිතං එතම්පි[3] අප්පටිසංවිදිතං නාම.

---

1. පුබ්බෙ අප්පටිසංවිදිතං - මජසං,
2. වාති පදං මරම්මඡට්ඨසඞ්ගීතිපිටකෙ න දිස්සතෙ. 3. එතං - මජසං,

4. එසඳ භාග්‍යවතුන් වහන්සේ තෙල නිදනයෙහි තෙල කාරණයෙහි දැහැමි කථා වදරා මහණුන් ඇමතූ සේක. "මහණෙනි, ගිලන් මහණහු විසින් වනසෙනසුන්හි දී කැයුතු දයක් හෝ බිදියයුතු දයක් හෝ සියතින් පිළිගෙන කනු බොනු අනුදනිමි" මහණෙනි මෙසේත් මේ ශික්ෂාපදය උදෙසවු:

**"යම් ඒ සැක සහිත යැ යි සම්මත වූ ප්‍රතිභය සහිත වූ වන සෙනසුන් කෙනෙක් ඇද්ද, යම් මහණෙක් එබඳු සෙනසුන්හි වාස කරන්නේ නො ගිලන් වැ පළමු නො දන්වා ගෙනෙන ලද කැයුතු දයක් හෝ බිදියැයුතු දයක් හෝ ඇතුළුඅරම්හි දී සියතින් පිළිගෙන කා නම් හෝ බුදී නම් හෝ ඒ මහණහු විසින් ඇවැත්නි, ගැරැහිය යුතු අසත්ප්‍රාය පාටිදෙසනීය ඇවැතකට පැමිණියෙමි. එය වෙන් කොට දෙසමි'යි පටිදෙසනා කළයුතු" යි.**

5. **යානි බො පන තානි ආරඤ්ඤකානි සෙනාසනානි** යනු: **ආරණ්‍යක සෙනාසන** නම්: පශ්චිමය දුනු පන්සියයක් දුර වූයේ යි.

**සාසඞ්ක** නම්: ආරාමයෙහි හෝ ආරාමොපචාරයෙහි හෝ සොරුන් පිවිසි තැන් පැනෙයි. බත් බිදිතැන් පැනෙයි. සිටි තැන් පැනෙයි හුන්තැන් පැනෙයි. වැදහොත් තැන් පැනේ.

**සප්පටිභය** නම්: ආරාමයෙහි හෝ ආරාමොපචාරයෙහි හෝ සොරුන් විසින් මිනිස්සු නසනලද්දහු පැනෙති. වොලොගන්නා ලද්දහු පැනෙති, පහර දෙන ලද්දහු පැනෙත්.

**යොපන** යනු: යමෙක් යම් බඳුයෙක් ... **භික්ඛු** යනු: ... මේ තෙම මේ අර්ථයෙහි 'භික්ඛු' යයි අදහස් කරන ලද්දේ යි.

**තථාරූපෙසු සෙනාසනෙසු** යනු: මෙබඳු සෙනසුන්හි.

**අප්පටිසංවිදිත** නම්: පස් සහඳමින් අතුරෙන් කිසිවකු යවා දන්වනලද්දේ යැ. තෙල අප්පටිසංවිදිත නම. ආරාමය ආරාමොපචාරය තබා (හැරපියා) (අතරමග දුටු හෝ ගමට පැමිණි මහණහට) දන්වන ලද්දේ යැ. තෙල දැන්වීම ද අප්පටිසංවිදිත නම.

**පටිසංවිදිතං** නාම: යො කොචි ඉත්ථී වා පුරිසො වා ආරාමං ආරාමූපචාරං ආගන්ත්වා ආරොචෙති ඉත්ථන්නාමස්ස කුලස්ස[1] භන්තෙ ඛාදනීයං වා භොජනීයං වා ආහරියිස්සතීති[2]. සචෙ සාසඞ්කං හොති සාසඞ්කන්ති ආචික්ඛිතබ්බං. සචෙ සප්පටිභයං හොති සප්පටිභයන්ති ආචික්ඛිතබ්බං සචෙ හොතු භන්තෙ ආහරියිස්සතීති භණති. චොරා වත්තබ්බා මනුස්සා ඉධූපචරන්ති අපසක්කථාති. යාගුයා පටිසංවිදිතෙ තස්සා පරිවාරො ආහරියති එතං පටිසංවිදිතං නාම. භත්තෙන පටිසංවිදිතෙ තස්ස පරිවාරො ආහරියති එතං පටිසංවිදිතං නාම. ඛාදනීයෙන පටිසංවිදිතෙ තස්ස පරිවාරො ආහරියති එතං පටිසංවිදිතං නාම. කුලෙන පටිසංවිදිතෙ යො තස්මිං කුලෙ මනුස්සො ඛාදනීයං වා භොජනීයං වා ආහරති එතං පටිසංවිදිතං නාම. ගාමෙන පටිසංවිදිතෙ යො තස්මිං ගාමෙ මනුස්සො ඛාදනීයං වා භොජනීයං වා ආහරති එතං පටිසංවිදිතං නාම. පූගෙන පටිසංවිදිතෙ යො තස්මිං පූගෙ මනුස්සො ඛාදනීයං වා භොජනීයං වා ආහරති එතං පටිසංවිදිතං නාම.

7. **ඛාදනීයං** නාම; පඤ්ච භොජනානි යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං ඨපෙත්වා අවසෙසං ඛාදනීයං නාම.

**භොජනීයං** නාම; පඤ්ච භොජනානි ඔදනො කුම්මාසො සත්තු මච්ඡො මංසං.

**අජ්ඣාරාමො** නාම: පරික්ඛිත්තස්ස ආරාමස්ස අන්තො ආරාමො අපරික්ඛිත්තස්ස උපචාරො.

**අගිලානො** නාම: සක්කොති පිණ්ඩාය චරිතුං.

**ගිලානො** නාම: න සක්කොති පිණ්ඩාය චරිතුං.

අප්පටිසංවිදිතං අගිලානො ඛාදිස්සාමි භුඤ්ජිස්සාමීති පටිග්ගණ්හාති ආපත්ති දුක්කටස්ස අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති පාටිදෙසනීයස්ස.

අප්පටිසංවිදිතෙ අප්පටිසංවිදිතසඤ්ඤී ඛාදනීයං වා භොජනීයං වා අජ්ඣාරාමෙ සහත්ථා පටිග්ගහෙත්වා අගිලානො ඛාදති වා භුඤ්ජති වා ආපත්ති පාටිදෙසනීයස්ස, අප්පටිසංවිදිතෙ වෙමතිකො ඛාදනීයං වා භොජනීයං වා අජ්ඣාරාමෙ සහත්ථා පටිග්ගහෙත්වා අගිලානො ඛාදති වා භුඤ්ජති වා ආපත්ති පාටිදෙසනීයස්ස. අප්පටිසංවිදිතෙ පටිසංවිදිතසඤ්ඤී ඛාදනීයං වා භොජනීයං වා අජ්ඣාරාමෙ සහත්ථා පටිග්ගහෙත්වා අගිලානො ඛාදති වා භුඤ්ජති වා ආපත්ති පාටිදෙසනීයස්ස.

1. කුලස්සාති ජං. මරම්මඡට්ඨසඞ්ගීතිපිටකෙ නත්ථියෙව,
2. ආහරියිස්සතීති - මජසං

**පටිසංවිදික** නම්: යමෙකිසි ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ආරාමයට ආරාමොපචාරයට අවුත් වහන්ස, මෙනම් කුලයෙන් ඛාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ ගෙන එන්නේ යයි ආරොචන කෙරේ ද ඉදින් [ආරාමය] සැක සහිත වේ නම් 'සැක සහිත යැ' කිවයුතු යැ. ඉදින් ප්‍රතිභය සහිත වේ නම් 'ප්‍රතිභය සහිත යැ' යි කිව යුතු යැ. ඉදින් වහන්ස වේවා, 'ගෙනෙන්නෙ' යැ යි කියා ද 'මිනිස්සු මෙහි අසල හැසිරෙති 'පහව යව' යි සොරුනට කිවයුතු යැ. කැදින් ආරොචන කළ කල්හි එහි පරිවාර (කැවුම් බත් ආදිය) ගෙන එනු ලැබෙ ද, තෙල පටිසංවිදිත නම. ඛාද්‍යයෙන් ආරොචන කළ කල්හි එහි පිරිවර ගෙන එනු ලැබෙ ද, තෙල පටිසංවිදිත නම. කුලයක් විසින් ආරොචන කළ කල්හි එකුලයෙහි යම් මනුෂ්‍යයෙක් ඛාද්‍යයක් හෝ භොජ්‍ය යක් හෝ ගෙන ඒ ද, තෙල පටිසංවිදිත නම. ගමෙකින් ප්‍රතිසංවෙදන කළ කල්හි එගම යම් මිනිසෙක් ඛාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ ගෙන ඒ ද, තෙල පටිසංවිදිත නම. සමාගමෙකින් ප්‍රතිසංවිදිත කල්හි එ සමාගමයෙහි යම් මිනිසෙක් ඛාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ ගෙන ඒ ද තෙල පටිසංවිදිත නම් වේ.

7. **ඛාදනීය** නම්: පඤ්ච භොජනයෝ යි. යාවකාලිකය සත්තාහකාලිකය යාවජීවිකය තබා (හැර) සෙස්ස ඛාදනීය නම.

**භොජනීය** නම්: පඤ්චභොජනයෝ යි. බත් යැ කොමු යැ අත්සු ණු යැ දියමස් යැ ගොඩමසි.

**අජ්ඣාරාම** නම්: පිරිකෙව් කරන ලද ආරාමයෙහි ඇතුළු අරමි. පිරිකෙව් නො කරනලද්දෙහි උපචාරය යි.

**අගිලාන** නම්: පිඩුසිඟා යන්නට හැකි වූයේ ය.

**ගිලාන** නම්: පිඩුසිඟායන්නට නො හැකියේ ය.

නො ගිලන් වැ අප්පටිසංවිදිතය කමි බුදිමි පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරහලායෙහි පරහලායෙහි පාටිදෙසනීය ඇවැත් වේ.

අප්පටිසංවිදිතයෙහි අප්පටිසංවිදිතසංඥා ඇති වැ ඛාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ ආරාමය තුළ දී සියතින් පිළිගෙන නො ගිලන් වැ කා නම් හෝ බුදී නම් හෝ පාටිදෙසනීය ඇවැත් වෙයි. අප්පටිසංවිදිතයෙහි විමති ඇති වැ ඛාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ ආරාමය තුළ දී සියතින් පිළිගෙන නො ගිලන් වැ කා නම් හෝ බුදී නම් හෝ පාටිදෙසනීය ඇවැත් වෙයි. අප්පටිසංවිදිතයෙහි පටිසංවිදිතසංඥා ඇති වැ ඛාද්‍යයක් හෝ භොජ්‍යයක් හෝ ආරාමය තුළ දී සියතින් පිළිගෙන නොගිලන් වැ කා නම් හෝ බුදී නම් හෝ පාටිදෙසනීය ඇවැත් වේ.

යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං ආහාරත්ථාය පතිගණ්හාති ආපත්ති දුක්කටස්ස. අජ්ඣොහාරෙ අජ්ඣොහාරෙ ආපත්ති දුක්කටස්ස.

පටිසංවිදිතෙ අප්පටිසංවිදිතසඤ්ඤී ආපත්ති දුක්කටස්ස පටිසංවිදිතෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස පටිසංවිදිතෙ පටිසංවිදිතසඤ්ඤී අනාපත්ති.

අනාපත්ති: පටිසංවිදිතෙ, ගිලානස්ස පටිසංවිදිතෙ වා ගිලානස්ස වා සෙසකං භුඤ්ජති, බහාරාමෙ පටිග්ගහෙත්වා අන්තො ආරාමෙ පරිභුඤ්ජති, තත්ථ ජාතකං මූලං වා තචං වා පත්තං වා පුප්පං වා ඵලං වා පරිභුඤ්ජති, යාමකාලිකං සත්තාහකාලිකං යාවජීවිකං සති පච්චයෙ පරිභුඤ්ජති උම්මත්තකස්ස අදිකම්මිකස්සාති.

චතුත්ථපාටිදෙසනීයං.

තස්සුද්දානං;

අඤ්ඤාතිකාය වොසාසං – සෙඛ ආරඤ්ඤකෙන ච,
පාටිදෙසනීයා චත්තාරො – සම්බුද්ධෙන පකාසිතා,

උද්දිට්ඨා ඛො ආයස්මන්තො චත්තාරො පාටිදෙසනීයා ධම්මා. තත්ථායස්මන්තෙ පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා දුතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා පරිසුද්ධෙත්ථායස්මන්තො තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමීති.

පාටිදෙසනීයා නිට්ඨිතා[1].

1. පාටිදෙසනීයකණ්ඩං නිට්ඨිතං - මජසං,

යාමකාලිකය සත්තාහකාලිකය යාවජීවිකය ආහාර පිණිස පිළිගනී නම් දුකුළා ඇවැත් වෙයි. පරහලායෙහි පරහලායෙහි දුකුළා ඇවැත් වේ.

පටිසංවිදිතයෙහි අප්පටිසංවිදිතසංඥා ඇත්තේ දුකුළා ඇවැත් වෙයි. පටිසංවිදිතයෙහි විමති ඇතියේ දුකුළා ඇවැත් වෙයි. පටිසංවිදිතයෙහි පටිසංවිදිතසංඥා ඇතියේ ඇවැත් නැති.

**අනාපත්ති:** පටිසංවිදිතයෙහි, ගිලනාට පටිසංවිදිතයෙහි හෝ ගිලනාගේ හෝ අවශෙෂය වළඳා නම් අරමින් පිටත්හි පිළිගෙන ඇතුළු අරමෙහි දී වළඳා නම්, ඒ අරමෙහි උපන් මුල් හෝ පොතු හෝ පත් හෝ මල් හෝ පල හෝ වළඳා නම්, ප්‍රත්‍යය ඇති කල්හි යාමකාලිකය, සත්තාහකාලිකය යාවජීවිකය වළඳා නම් (ඔවුනට) උම්මත්තකයාට ආදිකාර්මිකහට ඇවැත් නැති.

**සතරවැනි පාටිදෙසනීය යි.**

**එහි උද්දනය:**

නො නෑ මෙහෙණක අතින් ඇතුළුගම දී සියතින් බොජුන් පිළිගැනීමෙන් වූ ඇවැත යෑ ඇතුළුගම මෙහෙණක මෙහෙයවද්දී වැළඳීමෙන් වූ ඇවැත යෑ. සෙඛසම්මතකුලයෙහි සියතින් බොජුන් පිළිගෙන වැළඳීමෙන් වූ ඇවැත යෑ. සාසඞ්ක සෙනසුන්හි සියතින් බොජුන් පිළිගෙන වැළඳීමෙන් වූ ඇවැත යෑ යන මේ සතර පාටිදෙසනීය ශික්ෂාවෝ සම්බුදුරදුන් විසින් වදාරන ලදහ.

ඇවැත්නි, සතර පාටිදෙසනීයධර්මයෝ උදෙසන ලදහ. එහි ලා ආයුෂ්මතුන් පුළුවුස්මි, කිම පිරිසුදු වවු ද? දෙවනවට ද පුළුවුස්මි කිම පිරිසුදු වවු ද? තෙවන වට ද පුළුවුස්මි. කිම පිරිසුදු වවු ද? මෙහි ලා ආයුෂ්මත්හු පරිශුද්ධයහ. එහෙයින් තුෂ්ණීම්භූත වවු, මෙසේ කරුණ මෙසේ ධරමි'යි.

**පාටිදෙසනීය ශික්ෂා නිමි.**

# 8

## සෙඛියකණ්ඩො

ඉමෙ ඛො පනායස්මන්තො සෙඛියා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.

### 8.1.1

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ පුරතොපි පච්ඡතොපි ඔලම්බෙන්තා නිවාසෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. "කථං හි නාම සමණා සක්‍යපුත්තියා පුරතොපි පච්ඡතොපි ඔලම්බෙන්තා නිවාසෙස්සන්ති සෙය්‍යථාපි ගිහීකාමභොගිනො"ති.

2. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ පුරතොපි පච්ඡතොපි ඔලම්බෙන්තා නිවාසෙස්සන්ති"ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා[1] භික්ඛුසඞ්ඝං සන්නිපාතෙත්වා ඡබ්බග්ගියෙ භික්ඛූ පටිපුච්ඡි. සච්චං කිර තුම්හෙ භික්ඛවෙ පුරතොපි පච්ඡතොපි ඔලම්බෙන්තා නිවාසෙථාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා පුරතොපි පච්ඡතොපි ඔලම්බෙන්තා නිවාසෙස්සථ, නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ;

**"පරිමණ්ඩලං නිවාසෙස්සාමීති සික්ඛා කරණීයා"ති.**

3. පරිමණ්ඩලං නිවාසෙතබ්බං නාභිමණ්ඩලං ජාණුමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන. යො අනාදරියං පටිච්ච පුරතො වා පච්ඡතො වා ඔලම්බෙන්තො නිවාසෙති, ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**පඨමසික්ඛාපදං.**

---

1. ධම්මිං කථං කත්වා, පාඨොයං මරම්මඡට්ඨසඞ්ගීතිපිටකෙ න දිස්සතෙ

## 8

## සෙඛිය කාණ්ඩය

ආයුෂ්මත්නි, මේ සෙඛියධර්මයෝ උදෙසීමට පැමිණෙත්.

### 8. 1. 1

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු **සැවැත් නුවර ජේතවන** නම් වූ **අනේපිඩුසිටුහුගේ** අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි සවග මහණහු ඉදිරිපසිනුදු පසුපසිනුදු එල්වමින් හදිත්. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: කෙසේ නම් ශ්‍රමණශාක්‍යපුත්‍රීයයෝ කාමභොගී ගිහියන් මෙන් ඉදිරිපසිනුදු පසුපසිනිදු එල්වමින් හැන්දාහු''ද යි.

2. භික්ෂූහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්තිශබ්දය) ඇසූහු, යම් ඒ භික්ෂු කෙනෙත් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: ''කෙසේ නම් සවග මහණහු ඉදිරිපසිනුදු පසුපසිනුදු එල්වනුවන් වැ හඳනාහු''ද යි, එකල්හි ඒ භික්ෂූහු භාග්‍යවතුන්හට තෙල කරුණ දන්වූහු. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙහි ලා මෙඅවසරයෙහි ලා දැහැමි කථා කොට භික්ෂුසඞ්ඝයා රැස් කරවා සවග මහණුන් පිළිවිසූසේකැ'' සැබෑ ද මහණෙනි, තෙපි ඉදිරිපසිනුදු පසුපසිනුදු එල්වනුවන් වැ හඳිවු ද''යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහු ... හිස් පුරුෂයෙනි, කෙසේ නම් තෙපි ඉදිරි පසිනුදු පසුපසිනුදු එල්වනුවන් වැ හැන්දහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මහණෙනි මෙසේ මේ සිකපදය උදෙසවු:

**''පිරිමඩුලු කොට හඳින්නෙමි යි හික්මියැ යුතු'' යි.**

3. නැබමඬල දණමඬල වසන්නහු විසින් පිරිමඩුලු කොට හැන්දයුතු යි, යමෙක් අනාදරීය පිණිස ඉදිරිපසින් හෝ පසුපසින් හෝ එල්වමින් හඳී නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට, නො සිහියෙන් කරන්නහුට, නො දන්නහුට, ගිලනහුට, ආපදයෙහි, උම්මත්තකයහට ආදිකම්මිකය හට ඇවැත් නැති.

**ප්‍රථම ශික්ෂාපද යි.**

## 8. 1. 2

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ පුරතොපි පච්ඡතොපි ඔලම්බෙන්තා පාරුපන්ති –පෙ–

**"පරිමණ්ඩලං පාරුපිස්සාමීති සික්ඛා කරණීයා"ති.**

2. පරිමණ්ඩලං පාරුපිතබ්බං උභො කණ්ණෙ සමං කත්වා පාරුපන්තෙන[1] යො අනාදරියං පටිච්ච පුරතො වා පච්ඡතො වා ඔලම්බෙන්තො පාරුපති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච අසතියා අජානන්තස්ස. ගිලානස්ස, ආපදාසු, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**දුතියසික්ඛාපදං.**

## 8. 1. 3

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ කායං විවරිත්වා අන්තරඝරෙ ගච්ඡන්ති –පෙ–

**"සුපටිච්ඡන්නො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා"ති.**

2. සුපටිච්ඡන්නෙන අන්තරඝරෙ ගන්තබ්බං. යො අනාදරියං පටිච්ච කායං විවරිත්වා අන්තරඝරෙ ගච්ඡති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, ආපදාසු, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**තතියසික්ඛාපදං.**

## 8. 1. 4

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ කායං විවරිත්වා අන්තරඝරෙ නිසීදන්ති –පෙ–

**"සුපටිච්ඡන්නො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා"ති.**

2. සුපටිච්ඡන්නෙන අන්තරඝරෙ නිසීදිතබ්බං. යො අනාදරියං පටිච්ච කායං විවරිත්වා අන්තරඝරෙ නිසීදති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, වාසූපගතස්ස, ආපදාසු, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**චතුත්ථසික්ඛාපදං.**

---

1. පාරුපන්තෙනාතිපදං මරම්මඡට්ඨසඞ්ගීතිපිටකෙ න දිස්සති.

## 8. 1. 2

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර අනේපිඬුසිටුහුගේ ජේතවන නම් අරමෙහි වැඩැවෙසෙති, එසමයෙහි සවග මහණහු ඉදිරිපසිනුදු පසුපසිනුදු එල්වමින් පොරවත්...

**"පිරිමඬුලු කොට පොරවන්නෙමි යි හික්මියැ යුතු"යි.**

2. පොරවන්නහු විසින් දෙකොන සම කොට පිරිමඬුලු කොට පෙරැවිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස ඉදිරිපසින් හෝ පසුපසින් හෝ එල්වමින් පොරවා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට, නො සිහියෙන් කරන්නහුට. නො දන්නහුට. ගිලනහුට, ආපදයෙහි, උම්මත්තකහට, ආදිකම්මිකහට ඇවැත් නැති.

**ද්විතීය ශික්ෂාපද යි.**

## 8. 1. 3

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩවෙසෙති, එසමයෙහි සවග මහණහු කය විවර කොට ඇතුළුගමෙහි යෙත් ...

**"සුපිළිසන් වැ ඇතුළුගමෙහි යන්නෙමි යි හික්මියැයුතු"යි.**

2. සුපිළිසන් වූවහු විසින් ඇතුළුගමෙහි යායුතු යි. යමෙක් අනාදරිය පිණිස කය විවර කොට ඇතුළුගමෙහි යේ නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට, නො සිහියෙන් කරන්නහුට, නො දන්නහුට, ගිලනහුට, ආපදයෙහි, උම්මත්තකයහට, ආදිකම්මිකයහට ඇවැත් නැති.

**තෘතීය ශික්ෂාපද යි.**

## 8. 1. 4

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩැවෙසෙති. එසමයෙහි සවග මහණහු කය විවර කොට ඇතුළුගමෙහි හිඳිත් ...

**"සුපිළිසන් වැ ඇතුළුගමෙහි හිඳින්නෙමි යි හික්මියැ යුතු"යි.**

2. සුපිළිසන් වූවහු විසින් ඇතුළුගමෙහි හිඳියැ යුතු. යමෙක් අනදර නිසා කය විවර කොට ගෙනැ අතුරුගෙයෙහි හිඳී නම් දුකුළා වේ.

නො සිතා කරන්නහුට, නො සිහියෙන් කරන්නහුට, නො දන්නහුට, ගිලනහුට, වාසූපගතයහට, ආපදයෙහි, උම්මත්තකහට, ආදිකම්මිකහට ඇවැත් නැති.

**චතුර්ථ ශික්ෂාපද යි.**

## 8. 1. 5

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති ජෙතවනෙ **අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ හත්ථම්පි පාදම්පි කීළාපෙන්තා අන්තරඝරෙ ගච්ඡන්ති -පෙ-

**"සුසංවුතො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා"ති.**

2. සුසංවුතෙන අන්තරඝරෙ ගන්තබ්බං. යො අනාදරියං පටිච්ච හත්ථං වා පාදං වා කීළාපෙන්තො අන්තරඝරෙ ගච්ඡති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**පඤ්චම සික්ඛාපදං.**

## 8. 1. 6

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති ජෙතවනෙ **අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ හත්ථම්පි පාදම්පි කීළාපෙන්තා අන්තරඝරෙ නිසීදන්ති -පෙ-

**"සුසංවුතො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා"ති.**

2. සුසංවුතෙන අන්තරඝරෙ නිසීදිතබ්බං. යො අනාදරියං පටිච්ච හත්ථං වා පාදං වා කීළාපෙන්තො අන්තරඝරෙ නිසීදති ආපත්ති දුක්කටස්ස.

3. **අනාපත්ති:** අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**ඡට්ඨ සික්ඛාපදං.**

## 8. 1. 7

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති ජෙතවනෙ **අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ තහං තහං ඔලොකෙන්තා අන්තරඝරෙ ගච්ඡන්ති -පෙ-

**"ඔක්ඛිත්තචක්ඛු අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා"ති.**

2. ඔක්ඛිත්තචක්ඛුනා අන්තරඝරෙ ගන්තබ්බං යුගමත්තං පෙක්ඛන්තෙන. යො අනාදරියං පටිච්ච තහං තහං ඔලොකෙන්තො අන්තරඝරෙ ගච්ඡති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, ආපදාසු, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**සත්තම සික්ඛාපදං.**

## 8. 1. 5

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර **ජේතවන** නම් වූ **අනේපිඩු** සිටුහුගේ අරමහි වැඩැවෙසෙති. එසමයෙහි සවග මහණහු අත ද පා ද කෙළවමින් ඇතුළුගමෙහි යෙත් ...

**"මොනවට සංවර වැ ඇතුළුගමෙහි යන්නෙමි යි හික්මියැ යුතු"යි.**

2. මොනවට සංවර වූවහු විසින් ඇතුළුගමෙහි යායුතු යි. යමෙක් අනාදරිය පිණිස අත හෝ පා හෝ කෙළවමින් ඇතුළුගමෙහි යේ නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට, නො සිහියෙන් කරන්නහුට, නො දන්නහුට, ගිලනහුට, උම්මත්තකයහට, ආදිකම්මිකයාට ඇවැත් නැති.

**පඤ්චම ශික්ෂාපද යි.**

## 8. 1. 6

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර **ජේතවන** නම් වූ **අනේපිඩුසිටුහුගේ** අරමහි වැඩැවෙසෙති. එසමයෙහි සවග මහණහු අත ද පා ද කෙළවමින් ඇතුළුගමහි හිඳිත් ...

**"මොනවට සංවර වැ ඇතුළුගමෙහි හිඳින්නෙමි යි හික්මියැ යුතු"යි.**

2. මොනවට සංවර වූවහු විසින් ඇතුළුගමෙහි හිඳිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස අත හෝ පා හෝ කෙළවමින් ඇතුළු-ගමෙහි හිඳී නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට, නො සිහියෙන් කරන්නහුට, නො දන්නහුට, ගිලනහුට, උම්මත්තකහට, ආදිකම්මිකහට ඇවැත් නැති.

**ෂෂ්ඨ ශික්ෂාපද යි.**

## 8. 1. 7

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර **ජේතවන** නම් වූ **අනේපිඩුසිටුහුගේ** අරමහි වැඩැවෙසෙති. එසමයෙහි සවග මහණහු තැනැ තැනැ බලමින් ඇතුළුගමෙහි යෙත් ...

**"යටැ හෙළු ඇස් ඇති වැ ඇතුළුගමෙහි යන්නෙමි යි හික්මියැයුතු"යි.**

2. වියදඬු පමණ බලන්නහු විසින් යටැ හෙළූ ඇස් ඇති වැ ඇතුළුගමෙහි යා යුතු යි. යමෙක් අනාදරිය පිණිස තැනැ තැනැ බලමින් ඇතුළුගමෙහි යේ නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට, නො සිහියෙන් කරන්නහුට, නො දන්නහුට ගිලනහුට, ආපදයෙහි, උම්මත්තකහට, ආදිකම්මිකහට ඇවැත් නැති.

**සප්තම ශික්ෂාපද යි.**

## 8. 1. 8

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ තහං තහං ඔලොකෙන්තා අන්තරඝරෙ නිසීදන්ති -පෙ-

"ඔක්ඛිත්තචක්ඛු අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා"ති.

2. ඔක්ඛිත්තචක්ඛුනා අන්තරඝරෙ නිසීදිතබ්බං යුගමත්තං පෙක්ඛන්තෙන, යො අනාදරියං පටිච්ච තහං තහං ඔලොකෙන්තො අන්තරඝරෙ නිසීදති ආපත්ති දුක්කටස්ස.

3. අනාපත්ති: අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස. ගිලානස්ස. ආපදාසු, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

අට්ඨමසික්ඛාපදං.

## 8. 1. 9

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උක්ඛිත්තකාය අන්තරඝරෙ ගච්ඡන්ති -පෙ-

"න උක්ඛිත්තකාය අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා"ති.

2. න උක්ඛිත්තකාය අන්තරඝරෙ ගන්තබ්බං. යො අනාදරියං පටිච්ච එකතො වා උභතො වා උක්ඛිපිත්වා අන්තරඝරෙ ගච්ඡති ආපත්ති දුක්කටස්ස.

අනාපත්ති: අසඤ්චිච්ච. අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, ආපදාසු, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

නවමසික්ඛාපදං.

## 8. 1. 10

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උක්ඛිත්තකාය අන්තරඝරෙ නිසීදන්ති. -පෙ-

"න උක්ඛිත්තකාය අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා"ති.

2. න උක්ඛිත්තකාය අන්තරඝරෙ නිසීදිතබ්බං. යො අනාදරියං පටිච්ච එකතො වා උභතො වා උක්ඛිපිත්වා අන්තරඝරෙ නිසීදති ආපත්ති දුක්කටස්ස.

අනාපත්ති: අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, වාසූපගතස්ස, ආපදාසු, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

දසමසික්ඛාපදං.

පරිමණ්ඩලවග්ගො පඨමො.

## 8. 1. 8

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඬුසිටුහුගේ අරමෙහි වැඩවෙසෙති. එසමයෙහි සවග මහණහු තැනැ තැනැ බලමින් ඇතුළුගමෙහි හිදිත් ...

**"යට හෙළ ඇස් ඇති වැ ඇතුළුගමෙහි හිඳින්නෙමි යි හික්මියැ යුතු"යි.**

2. වියදඬු පමණ බලන්නහු විසින් යටැ හෙළ ඇස් ඇති වැ ඇතුළුගමෙහි හිඳිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස තැනැ තැනැ බලමින් ඇතුළුගමෙහි හිඳී නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට, නො සිහියෙන් කරන්නහුට, නො දන්නහුට, ගිලනහුට, ආපදයෙහි, උම්මත්තකහට, ආදිකම්මිකහට ඇවැත් නැති.

**අෂ්ටම ශික්ෂාපද යි.**

## 8. 1. 9

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩැවෙසෙති. එසමයෙහි සවග මහණහු ඔසවන ලද සිවුරින් යුතු වැ ඇතුළුගමෙහි යෙත් ...

**"ඔසවන ලද සිවුරෙන් යුතු වැ ඇතුළුගමෙහි නො යන්නෙමි යි හික්මිය යුතු"යි.**

2. ඔසවනලද සිවුරෙන් යුතු වැ ඇතුළුගමෙහි නො යා යුතු යි. යමෙක් අනාදරිය පිණිස එක්පසින් හෝ දෙපසින් හෝ (සිවුර) ඔසවා ඇතුළුගමෙහි යේ නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට, නො සිහියෙන් කරන්නහුට, නො දන්න හුට, ගිලනහුට, ආපදවෙහි, උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

**නවම ශික්ෂාපද යි.**

## 8. 1. 10

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරමෙහි වැඩැවෙසෙති. එසමයෙහි සවග මහණහු ඔසවන ලද සිවුරෙන් යුතු වැ ඇතුළුගමෙහි හිදිත්...

**"ඔසවනලද සිවුරෙන් යුතු වැ ඇතුළුගමෙහි නො හිඳින්නෙමි යි හික්මියයුතු"යි.**

2. ඔසවන ලද සිවුරෙන් යුතු වැ ඇතුළුගමෙහි නො හිඳිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස එක්පසින් හෝ දෙපසින් හෝ (සිවුර) ඔසවා ඇතුළුගමෙහි හිඳී නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට, නො දන්නහුට, ගිලනහුට, වාසූ-පගතයහට, ආපදවෙහි, ඇවැත් නැත. උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

**දශම ශික්ෂාපද යි.**

**පළමුවන පරිමණ්ඩල වර්ග යි.**

## 8. 2. 1

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ මහාහසිතං හසන්තා අන්තරඝරෙ ගච්ඡන්ති -පෙ-

**"න උජ්ජග්ඝිකාය අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා"ති.**

2. න උජ්ජග්ඝිකාය අන්තරඝරෙ ගන්තබ්බං. යො අනාදරියං පටිච්ච මහාහසිතං හසන්තො අන්තරඝරෙ ගච්ඡති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, හසනීයස්මිං වත්ථුස්මිං මිහිතමත්තං කරොති, ආපදාසු, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**පඨම සික්ඛාපදං.**

## 8. 2. 2

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ මහාහසිතං හසන්තා අන්තරඝරෙ නිසීදන්ති -පෙ-

**"න උජ්ජග්ඝිකාය අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා"ති.**

2. න උජ්ජග්ඝිකාය අන්තරඝරෙ නිසීදිතබ්බං. යො අනාදරියං පටිච්ච මහාහසිතං හසන්තො අන්තරඝරෙ නිසීදති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, හසනීයස්මිං වත්ථුස්මිං මිහිතමත්තං කරොති, ආපදාසු, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**දුතිය සික්ඛාපදං.**

## 8. 2. 3

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උච්චාසද්දං මහාසද්දං කරොන්තා අන්තරඝරෙ ගච්ඡන්ති -පෙ-

**"අප්පසද්දො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා"ති.**

2. අප්පසද්දෙන අන්තරඝරෙ ගන්තබ්බං. යො අනාදරියං පටිච්ච උච්චාසද්දං මහාසද්දං කරොන්තො අන්තරඝරෙ ගච්ඡති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, ආපදාසු, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**තතිය සික්ඛාපදං.**

## 8. 2. 1

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර ජේතවන නම් වූ අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි සවග මහණහු මහසිනා සෙමින් ඇතුළුගමෙහි යෙත් ...

**"මහසිනායෙන් යුතු වැ ඇතුළුගමෙහි නො යන්නෙමි යි හික්මියැ යුතු"යි.**

2. මහසිනායෙන් යුතු වැ ඇතුළුගමෙහි නො යායුතු යි. යමෙක් අනාදරිය පිණිස මහසිනා සෙමින් ඇතුළුගමෙහි යේ නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට, නො සිහියෙන් කරන්නහුට, නො දන්නහුට, ගිලනහුට සිනාසිය යුතු වස්තුවෙහි මඳසිනා පමණක් කරන්නහුට, ආපදවෙහි, උම්මත්තකහට, ආදිකම්මිකහට ඇවැත් නැති.

**ප්‍රථම ශික්ෂාපද යි.**

## 8. 2. 2

1. ශ්‍රාවස්තිනිදාන යි– එසමයෙහි සවග මහණහු මහසිනා සෙමින් ඇතුළුගමෙහි හිඳිත් ...

**"මහසිනායෙන් යුතු වැ ඇතුළුගමෙහි නො හිඳින්නෙමි යි හික්මියැ යුතු යැ"යි.**

2. මහසිනායෙන් යුතු වැ ඇතුළුගමෙහි නො හිඳියයුතු යි. යමෙක් අනාදරිය පිණිස මහසිනා සෙමින් ඇතුළුගමෙහි හිඳී නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට, නො සිහියෙන් කරන්නහුට, නො දන්නහුට, ගිලනහුට, සිනාසිය යුතු වස්තුවෙහි මඳසිනා පමණක් කරන්නහුට, ආපදවෙහි, උම්මත්තකහට, ආදිකම්මිකහට ඇවැත් නැති.

**ද්විතීය ශික්ෂාපද යි.**

## 8. 2. 3

1. ශ්‍රාවස්තිනිදාන යි. එසමයෙහි සවග මහණහු උස්හඬ මහහඬ කෙරෙමින් ඇතුළුගමෙහි යෙත් ...

**"අල්පශබ්ද ඇතියෙම ඇතුළුගමෙහි යන්නෙමි යි හික්මියැ යුතු"යි.**

2. අල්පශබ්දයෙන් යුතු වැ ඇතුළුගමෙහි යායුතු යි. යමෙක් අනාදරිය පිණිස උස්හඬ මහහඬ කෙරෙමින් ඇතුළුගමෙහි යේ නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට, නො සිහියෙන් කරන්නහුට, නො දන්නහුට, ගිලනහුට, ආපදවෙහි, උම්මත්තකහට, ආදිකම්මිකහට ඇවැත් නැති.

**තෘතීය ශික්ෂාපද යි.**

## 8. 2. 4

සාවත්ථිනිදානං — තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උච්චාසද්දං මහාසද්දං කරොන්තා අන්තරඝරෙ නිසීදන්ති. –පෙ–

**අප්පසද්දො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා'ති**

අප්පසද්දෙන අන්තරඝරෙ නිසීදිතබ්බං, යො අනාදරියං පටිච්ච උච්චාසද්දං මහාසද්දං කරොන්තො අන්තරඝරෙ නිසීදති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච –පෙ– ආදිකම්මිකස්සාති

**චතුත්ථ සික්ඛාපදං.**

## 8. 2. 5

සාවත්ථිනිදානං — තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ කායප්පචාලකං අන්තරඝරෙ ගච්ඡන්ති කායං ඔලම්බෙන්තා –පෙ–

**න කායප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා'ති**

න කායප්පචාලකං අන්තරඝරෙ ගන්තබ්බං. කායං පග්ගහෙත්වා ගන්තබ්බං. යො අනාදරියං පටිච්ච කායප්පචාලකං අන්තරඝරෙ ගච්ඡති කායං ඔලම්බෙන්තො ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච –පෙ– ආදිකම්මිකස්සාති.

**පඤ්චම සික්ඛාපදං.**

## 8. 2. 6

1. සාවත්ථිනිදානං.—තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ කායප්පචාලකං අන්තරඝරෙ නිසීදන්ති කායං ඔලම්බෙන්තා –පෙ–

**න කායප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා'ති**

න කායප්පචාලකං අන්තරඝරෙ නිසීදිතබ්බං. කායං පග්ගහෙත්වා නිසීදිතබ්බං. යො අනාදරියං පටිච්ච කායප්පචාලකං අන්තරඝරෙ නිසීදති කායං ඔලම්බෙන්තො ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච අසතියා අජානන්තස්ස ගිලානස්ස වාසූපගතස්ස ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**ඡට්ඨ සික්ඛාපදං.**

## 8. 2. 4

ශ්‍රාවස්තිනිදන යි.— එසමයෙහි සවග මහණහු උස්හඬ මහහඬ කෙරෙමින් ඇතුළුගමෙහි හිඳිත් ...

**අල්පශබ්ද ඇතියෙම ඇතුළුගමෙහි හිඳින්නෙමි යි හික්මියැ යුතු'යි.**

අල්පශබ්දයෙන් යුතු වැ ඇතුළුගමෙහි හිඳියයුතු යි. යමෙක් අනාදරිය පිණිස උස්හඬ මහහඬ කෙරෙමින් ඇතුළුගමෙහි හිඳී නම දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට ... ආදිකම්මිකහට ඇවැත් නැති.

**චතුර්ථ ශික්ෂාපද යි.**

## 8. 2. 5

ශ්‍රාවස්තිනිදන යි — එසමයෙහි සවග මහණහු කය එල්වමින් කය සල සලා ඇතුළුගමෙහි යෙත් ...

**කය සලමින් ඇතුළුගමෙහි නො යන්නෙමි යි හික්මියැ යුතු'යි.**

කය සලමින් ඇතුළුගමෙහි නො යා යුතු යි. කය නිසල කොට සෘජු වැ තබා යායුතු යි. යමෙක් අනාදරිය පිණිස කය එල්වමින් කය සල සලා ඇතුළුගමෙහි යේ නම දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට ... ආදිකම්මිකහට ඇවැත් නැති.

**පඤ්චම ශික්ෂාපද යි.**

## 8. 2. 6

ශ්‍රාවස්තිනිදන යි.— එසමයෙහි සවග මහණහු කය එල්වමින් කය සල සලා ඇතුළුගමෙහි හිඳිත් ...

**කය සල සලා ඇතුළුගමෙහි නො හිඳින්නෙමි යි හික්මියැ යුතු'යි.**

කය සලමින් ඇතුළුගමෙහි නො හිඳියයුතු යි. කය නිසල කොට සෘජු වැ තබා හිඳියයුතු යි. යමෙක් අනාදරීය පිණිස කය එල්වමින් කය සොලවමින් ඇතුළුගමෙහි හිඳී නම දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට, නො සිහියෙන් කරන්නහුට, නො දන්නහුට, ගිලනහුට, වාසූපගතයහට, ආපදවෙහි, උම්මත්තකහට, ආදිකම්මිකහට ඇවැත් නැති.

**ෂෂ්ඨ ශික්ෂාපද යි.**

## 8. 2. 7

සාවත්ථිනිදානං—තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ බාහුප්පචාලකං අන්තරඝරෙ ගච්ඡන්ති, බාහුං ඔලම්බෙන්තා -පෙ-

**න බාහුප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා'ති**

න බාහුප්පචාලකං අන්තරඝරෙ ගන්තබ්බං. බාහුං පග්ගහෙත්වා ගන්තබ්බං. යො අනාදරියං පටිච්ච බාහුප්පචාලකං අන්තරඝරෙ ගච්ඡති බාහුං ඔලම්බෙන්තො ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති**: අසඤ්චිච්ච -පෙ- ආදිකම්මිකස්සාති.

**සත්තමසික්ඛාපදං.**

## 8. 2. 8

සාවත්ථිනිදානං—තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ බාහුප්පචාලකං අන්තරඝරෙ නිසීදන්ති බාහුං ඔලම්බෙන්තා -පෙ-

**න බාහුප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා'ති**

න බාහුප්පචාලකං අන්තරඝරෙ නිසීදිතබ්බං. බාහුං පග්ගහෙත්වා නිසීදිතබ්බං. යො අනාදරියං පටිච්ච බාහුප්පචාලකං අන්තරඝරෙ නිසීදති බාහුං ඔලම්බෙන්තො ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති**: අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, වාසූපගතස්ස, ආපදාසු, උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**අට්ඨමසික්ඛාපදං.**

## 8. 2. 9

1. සාවත්ථිනිදානං—තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සීසප්පචාලකං අන්තරඝරෙ ගච්ඡන්ති සීසං ඔලම්බෙන්තා -පෙ-

**න සීසප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා'ති**

2. න සීසප්පචාලකං අන්තරඝරෙ ගන්තබ්බං. සීසං පග්ගහෙත්වා ගන්තබ්බං. යො අනාදරියං පටිච්ච සීසප්පචාලකං අන්තරඝරෙ ගච්ඡති සීසං ඔලම්බෙන්තො ආපත්ති දුක්කටස්ස.

3. **අනාපත්ති**: අසඤ්චිච්ච -පෙ- ආදිකම්මිකස්සාති.

**නවමසික්ඛාපදං.**

## 8. 2. 7

ශ්‍රාවස්තිනිදාන යි—එසමයෙහි සවග මහණහු බාහුව එල්වමින් බාහුව සල සලා ඇතුළුගමෙහි යෙත් ...

**අත් සල සලා ඇතුළුගමෙහි නො යන්නෙමි යි හික්මියැ යුතු'යි.**

බාහුව සලමින් ඇතුළුගමෙහි නො යායුතු යි. බාහුව නිසල කොට තබා යා යුතු යි. යමෙක් අනාදරිය පිණිස බාහුව එල්වමින් බාහුව සලමින් ඇතුළුගමෙහි යේ නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට ...ආදිකම්මිකහට ඇවැත් නැති.

**සප්තම ශික්ෂාපද යි.**

## 8. 2. 8

ශ්‍රාවස්තිනිදාන යි— එසමයෙහි වනාහි සවග මහණහු අත් එල්වමින් ඇතුළුගමෙහි හිඳිත් ...

**අත් සල සලා ඇතුළුගමෙහි නො හිඳින්නෙමි යි හික්මියැ යුතු'යි.**

බාහුව සල සලා ඇතුළුගමෙහි නො හිඳියයුතු යි. බාහුව නිසල කොට තබා හිඳියයුතු යි. යමෙක් අනාදරිය පිණිස බාහුව එල්වමින් බාහුව සලමින් ඇතුළුගමෙහි හිඳී නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට, නො සිහියෙන් කරන්නහුට, නො දන්නහුට, ගිලනහුට, වායුපගතහට, ආපදාවෙහි, උම්මත්තකහට, ආදිකම්මිකහට ඇවැත් නැති.

**අෂ්ටම ශික්ෂාපද යි.**

## 8. 2. 9

ශ්‍රාවස්තිනිදාන යි—එසමයෙහි වනාහි සවග මහණහු හිස එල්වමින් හිස සල සලා ඇතුළුගමෙහි යෙත් ...

**හිස සල සලා ඇතුළුගමෙහි නො යන්නෙමි යි හික්මියැ යුතු.**

හිස සලමින් ඇතුළුගමෙහි නො යායුතු යි. හිස නිසල කොට සෘජු වැ තබා යායුතු යි. යමෙක් අනාදරිය පිණිස හිස එල්වමින් හිස සලමින් ඇතුළුගමෙහි යේ නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට ... ආදිකම්මිකහට ඇවැත් නැති.

**නවම ශික්ෂාපද යි.**

## 8. 2. 10

සාවත්ථියං— තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සීසප්පචාලකං අන්තරඝරෙ නිසීදන්ති සීසං ඔලම්බෙන්තා -පෙ-

**න සීසප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

න සීසප්පචාලකං අන්තරඝරෙ නිසීදිතබ්බං. සීසං පග්ගහෙත්වා නිසීදිතබ්බං. යො අනාදරියං පටිච්ච සීසප්පචාලකං අන්තරඝරෙ නිසීදති සීසං ඔලම්බෙන්තො ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති** : අසඤ්චිච්ච අසතියා අජානන්තස්ස ගිලානස්ස වාසූපගතස්ස ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

දසම සික්ඛාපදං.

උජ්ජග්ඝිකවග්ගො දුතියො.

## 8. 2. 10

ශ්‍රාවස්තිනිදාන යි— එසමයෙහි ෂඩ්වර්ගීය භික්ෂූහු හිස එල්වමින් හිස සල සලා ඇතුළුගමෙහි හිඳිත් ...

**හිස සල සලා ඇතුළුගමෙහි නො හිඳින්නෙමි යි හික්මියැ යුතු’යි.**

හිස සල සලා ඇතුළුගමෙහි නො හිඳියයුතු යි. හිස නිසල කොට සෘජු වැ තබා හිඳියයුතු යි. යමෙක් අනාදරිය පිණිස හිස එල්වමින් හිස සලමින් ඇතුළුගමෙහි හිඳී නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට, නො සිහියෙන් කරන්නහුට, නො දන්නහුට, ගිලනහුට, ව්‍යාපදාගතහට, ආපදාවෙහි, උම්මත්තකහට, ආදිකම්මිකහට ඇවැත් නැති.

දශම ශික්ෂාපද යි.

දෙවන උජ්ජග්ඝික වර්ග යි.

## 8. 3. 1

තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා **භික්ඛූ** ඛම්භකතා අන්තරඝරෙ ගච්ඡන්ති -පෙ-

**න ඛම්භකතො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

න ඛම්භකතෙන අන්තරඝරෙ ගන්තබ්බං. යො අනාදරියං පටිච්ච එකතො වා උභතො වා ඛම්භං කත්වා අන්තරඝරෙ ගච්ඡති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති** - අසඤ්චිච්ච -පෙ- ආදිකම්මිකස්සාති

### පඨමසික්ඛාපදං.

## 8. 3. 2

සාවත්ථිනිදානං— තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ඛම්භකතා අන්තරඝරෙ නිසීදන්ති -පෙ-

**න ඛම්භකතො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

න ඛම්භකතෙන අන්තරඝරෙ නිසීදිතබ්බං. යො අනාදරියං පටිච්ච එකතො වා උභතො වා ඛම්භං කත්වා අන්තරඝරෙ නිසීදති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති**: අසඤ්චිච්ච අසතියා අජානන්තස්ස ගිලානස්ස වාසූ-පගතස්ස ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

### දුතියසික්ඛාපදං.

## 8. 3. 3

සාවත්ථිනිදානං— තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සසීසං පාරුපිත්වා අන්තරඝරෙ ගච්ඡන්ති -පෙ-

**න ඔගුණ්ඨිතො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

න ඔගුණ්ඨිතෙන අන්තරඝරෙ ගන්තබ්බං. යො අනාදරියං පටිච්ච සසීසං පාරුපිත්වා අන්තරඝරෙ ගච්ඡති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති**: අසඤ්චිච්ච -පෙ- ආදිකම්මිකස්සාති

### තතියසික්ඛාපදං.

## 8. 3. 1

එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැත් නුවර **ජේතවන** නම් වූ, **අනේපිඬු** සිටුහුගේ අරමෙහි වැඩැ වෙසෙති. එසමයෙහි සවග මහණහු උකුළෙහි තැබූ අත් ඇති වැ ඇතුළුගමෙහි යෙත් ...

**උකුළෙහි තැබූ අත් ඇතියෙම් ඇතුළුගමෙහි නො යන්නෙම් යි හික්මියැ යුතු'යි.**

උකුළෙහි තැබූ අතින් යුතු වැ ඇතුළුගමෙහි නො යායුතු යි. යමෙක් අනාදරිය පිණිස එක් පසින් හෝ දෙපසින් හෝ උකුළෙහි අත් තබා ඇතුළුගමෙහි යේ නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට ... උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

**ප්‍රථම ශික්ෂාපද යි.**

## 8. 3. 2

ශ්‍රාවස්තිනිදාන යි — එසමයෙහි සවග මහණහු උකුළෙහි තැබූ අත් ඇති වැ ඇතුළුගමෙහි හිඳිත්......

**උකුළෙහි තැබූ අත් ඇතියෙම් ඇතුළුගමෙහි නො හිඳින්නෙම් යි හික්මියැ යුතු'යි.**

උකුළෙහි තැබූ අත් ඇති වැ ඇතුළුගමෙහි නො හිඳියයුතු යි. යමෙක් අනාදරිය පිණිස එක් පසින් හෝ දෙ පසින් හෝ උකුළෙහි අත් තබා ඇතුළුගමෙහි හිඳී නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට ගිලනහුට වාසූපගතහට ආපදුවෙහි, උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

**ද්විතීය ශික්ෂාපද යි.**

## 8. 3. 3

ශ්‍රාවස්තිනිදාන යි — එසමයෙහි සවග මහණහු හිස සහිත වැ පෙරෙව ඇතුළුගමෙහි යෙත්...

**හිස වසා පෙරෙවැ ඇතුළුගමෙහි නො යන්නෙම් යි හික්මියැ යුතු'යි.**

හිස වසා පෙරෙවැ ඇතුළුගමෙහි නො යායුතු යි. යමෙක් අනාදරිය පිණිස හිස වසා පෙරෙවැ ඇතුළුගමෙහි යේ නම් දුකුළා ඇවැත් වේ.

නොසිතා කරන්නහුට ... ආදිකම්මිකහට ඇවැත් නැති.

**තෘතීය ශික්ෂාපද යි.**

## 8. 3. 4

සාවත්ථිනිදානං—තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සසීසං පාරුපිත්වා අන්තරඝරෙ නිසීදන්ති -පෙ-

**"න ඔගුණ්ඨිතො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා"ති.**

න ඔගුණ්ඨිතෙන අන්තරඝරෙ නිසීදිතබ්බං. යො අනාදරියං පටිච්ච සසීසං පාරුපිත්වා අන්තරඝරෙ නිසීදති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච අසතියා අජානන්තස්ස ගිලානස්ස වාසූපගතස්ස ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**චතුත්ථ සික්ඛාපදං.**

## 8. 3. 5

සාවත්ථිනිදානං—තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උක්කුටිකාය අන්තරඝරෙ ගච්ඡන්ති -පෙ-

**"න උක්කුටිකාය අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා"ති.**

න උක්කුටිකාය අන්තරඝරෙ ගන්තබ්බං. යො අනාදරියං පටිච්ච උක්කුටිකාය අන්තරඝරෙ ගච්ඡති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච -පෙ- ආදිකම්මිකස්ස.

**පඤ්චම සික්ඛාපදං.**

## 8. 3. 6

සාවත්ථිනිදානං—තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ පල්ලත්ථිකාය අන්තරඝරෙ නිසීදන්ති -පෙ-

**"න පල්ලත්ථිකාය අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා"ති.**

න පල්ලත්ථිකාය අන්තරඝරෙ නිසීදිතබ්බං. යො අනාදරියං පටිච්ච හත්ථපල්ලත්ථිකාය වා දුස්සපල්ලත්ථිකාය වා අන්තරඝරෙ නිසීදති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච අසතියා අජානන්තස්ස ගිලානස්ස වාසූපගතස්ස ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**ඡට්ඨ සික්ඛාපදං.**

## 8. 3. 4

ශ්‍රාවස්තිනිදාන යි— එසමයෙහි ෂඩ්වර්ග මහණහු හිස සහිත වැ පෙරෙ වැ ඇතුළුගමෙහි හිඳිත්...

**හිස වසා පෙරෙවැ ඇතුළුගමෙහි නො හිඳින්නෙමි යි හික්මියැ යුතු''යි.**

හිස වසා පෙරෙවැ ඇතුළුගමෙහි නො හිඳිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස හිස වසා පෙරෙවැ ඇතුළුගමෙහි හිඳී නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට ගිලනහුට වාසූපගතහට ආපදයෙහි උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

**චතුර්ථ ශික්ෂාපද යි.**

## 8. 3. 5

ශ්‍රාවස්තිනිදාන යි— එසමයෙහි ෂඩ්වර්ග මහණහු උළුලුයෙන් ඇතුළු ගමෙහි යෙත්...

**''ඇතුළුගමෙහි උළුලුයෙන් නො යන්නෙමි යි හික්මියැ යුතු''යි.**

උළුලුයෙන් ඇතුළුගමෙහි නො යායුතු යි. යමෙක් අනාදරිය පිණිස ඇතුළුගමෙහි උළුලුයෙන් යේ නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට...ආදිකම්මිකහට ඇවැත් නැති.

**පඤ්චම ශික්ෂාපද යි.**

## 8. 3. 6

ශ්‍රාවස්තිනිදාන යි — එසමයෙහි ෂඩ්වර්ග මහණහු අකවටු ඇවිළීමෙන් ඇතුළුගමෙහි...

**''අකවටු ඇවිළීමෙන් ඇතුළුගමෙහි නො හිඳින්නෙමි යි හික්මියැ යුතු''යි.**

අකවටු ඇවිළීමෙන් ඇතුළුගමෙහි නො හිඳිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස අතින් අකවටු ඇවිළීමෙන් හෝ පිළියෙන් අකවටු ඇවිළීමෙන් හෝ ඇතුළුගමෙහි හිඳී නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට ගිලනහුට වාසූපගතහට ආපදයෙහි උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

**ෂෂ්ඨ ශික්ෂාපද යි.**

## 8. 3. 7

සාවත්ථිනිදානං- තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ අසක්කච්චං පිණ්ඩපාතං පටිගණ්හන්ති ඡඩ්ඩෙතුකාමා විය -පෙ-

**"සක්කච්චං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා"ති.**

සක්කච්චං පිණ්ඩපාතො පටිග්ගහෙතබ්බො. යො අනාදරියං පටිච්ච අසක්කච්චං පිණ්ඩපාතං පටිගණ්හාති ඡඩ්ඩෙතුකාමො විය ආපත්ති දුක්කටස්ස

**අනාපත්ති:** අසඤ්චිච්ච -පෙ- ආදිකම්මිකස්සාති.

**සත්තමසික්ඛාපදං.**

## 8. 3. 8

සාවත්ථිනිදානං- තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ තහං තහං ඔලොකෙන්තා පිණ්ඩපාතං පටිගණ්හන්ති ආකිරන්තෙපි අතික්කමන්තෙපි[1] න ජානන්ති -පෙ-

**"පත්තසඤ්ඤී පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා"ති.**

පත්තසඤ්ඤිනා පිණ්ඩපාතො පටිග්ගහෙතබ්බො. යො අනාදරියං පටිච්ච තහං තහං ඔලොකෙන්තො පිණ්ඩපාතං පටිගණ්හාති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච -පෙ- ආදිකම්මිකස්සාති

**අට්ඨමසික්ඛාපදං.**

## 8. 3. 9

සාවත්ථිනිදානං- තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ පිණ්ඩපාතං පටිගණ්හන්තා සූපඤ්ඤෙව බහුං පටිගණ්හන්ති -පෙ-

**"සමසූපකං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා"ති.**

**සූපො** නාම: ද්වෙ සූපා මුග්ගසූපො මාසසූපො හත්ථහාරියො. සමසූපකො පිණ්ඩපාතො පටිග්ගහෙතබ්බො. යො අනාදරියං පටිච්ච සූපඤ්ඤෙව බහුං පටිගණ්හාති ආපත්ති දුක්කටස්ස.

3. **අනාපත්ති:** අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, රසරසෙ. ඤාතකානං, පවාරිතානං, අඤ්ඤස්සත්ථාය, අත්තනො ධනෙන, ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**නවමසික්ඛාපදං.**

1. අතික්කමන්තෙපි-මජ්ඣං

## 8. 3. 7

ශ්‍රාවස්තිනිදාන යි — එසමයෙහි සවග මහණහු බැහැර දමනු කැමැතියන් මෙන් නො සකසා (සිහි නො එළවා) පිඩුවා පිළිගනිත්...

**"සිහි එළවා පිඩුවා පිළිගන්නෙමි යි හික්මියැ යුතු"යි.**

සකසා පිඩුවා පිළිගතයුතු යි. යමෙක් අනාදරිය පිණිස බැහැර දමනු කැමැතියකු මෙන් නො සකසා පිඩුවා පිළිගනී නම් දුකුළා ඇවැත් වේ.

නොසිතා කරන්නහුට... ආදිකම්මිකහට ඇවැත් නැති.

**සප්තම ශික්ෂාපද යි.**

## 8. 3. 8

ශ්‍රාවස්තිනිදාන යි—එසමයෙහි සවග මහණහු තැනැ තැනැ බලමින් පිඩුවා පිළිගනිත්. (පිඩුවා) දෙන කල්හි දු පිඩුවා දී ඉක්ම යන කල්හි දු නො දනිත්...

**"පාත්‍රගත සංඥී වැ පිඩුවා පිළිගන්නෙමි යි හික්මියැ යුතු"යි.**

පාත්‍රගත සංඥා ඇතියහු විසින් පිඩුවා පිළිගත යුතු යි. යමෙක් අනාදරිය පිණිස තැනැ තැනැ බලමින් පිඩුවා පිළිගනී නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට... ආදිකකම්මිහට ඇවැත් නැති.

**අෂ්ටම ශික්ෂාපද යි.**

## 8. 3. 9

ශ්‍රාවස්තිනිදාන යි—එසමයෙහි සවග මහණහු පිඩුවා පිළිගන්නෝ සූප මැ බොහෝ කොට පිළිගනිත්...

**"බත සතරවන කොටසින් නො වැඩි සූප ඇති වැ පිණ්ඩපාතය පිළිගන්නෙමි යි හික්මියැ යුතු"යි.**

**සූප** නම්: අතින් ගෙන යා හැකි මුඟුසූප යැ මාසසූප යැ යි සූප දෙකෙකි. සමසූපක පිණ්ඩපාතය පිළිගත යුතු යි. යමෙක් අනාදරිය පිණිස සූප මැ බොහෝ කොට පිළිගනී නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට ගිලනහුට, රසරසයෙහි නම්, නෑයන්ගෙන් නම්, පැවැරියන් ගෙන් නම්. අනෙකක්හු සඳහා නම්, තමසතු ධනයෙන් නම්, ආපදයෙහි උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

**නවම ශික්ෂාපද යි.**

## 8. 3. 10

සාවත්ථිනිදානං — තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛු ථූපීකතං පිණ්ඩපාතං පටිගණ්හන්ති -පෙ-

**"සමතිත්තිකං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා"ති**

සමතිත්තිකො පිණ්ඩපාතො පටිග්ගහෙතබ්බො. යො අනාදරියං පටිච්ච ථූපීකතං පිණ්ඩපාතං පටිගණ්හාති ආපත්ති දුක්කටස්ස.

අනාපත්ති: අසඤ්චිච්ච අසතියා අජානන්තස්ස ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

දසම සික්ඛාපදං.

ඛම්භකතවග්ගො තතියො.

## 8. 3. 10

ශ්‍රාවස්තිනිදාන යි — එසමයෙහි සවග මහණහු තුඹක් මෙන් කොට පිඩුවා පිළිගනිත්...

**"සමසේ පිරිගිය පිඩුවා පිළිගන්නෙමි යි හික්මියැ යුතු"යි.**

පයෙහි ඇතුළු මෝව්ට සමසේ පිරිගිය පිඩුවා පිළිගත යුතු යි. යමෙක් අනාදරීය පිණිස තුඹක් මෙන් කොට පිඩුවා පිළිගනී නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට ආපදයෙහි උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

**දශම ශික්ෂාපද යි.**

**කෙවන ඛමහකන වර්ග යි.**

## 8. 4. 1

තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ **අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ අසක්කච්චං පිණ්ඩපාතං භුඤ්ජන්ති අභුඤ්ජිතුකාමා විය -පෙ-

**සක්කච්චං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

සක්කච්චං පිණ්ඩපාතො භුඤ්ජිතබ්බො. යො අනාදරියං පටිච්ච අසක්කච්චං පිණ්ඩපාතං භුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති**: අසඤ්චිච්ච අසතියා අජානන්තස්ස ගිලානස්ස ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**පඨමසික්ඛාපදං.**

## 8. 4. 2

සාවත්ථිනිදානං- තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ තහං තහං ඔලොකෙන්තා පිණ්ඩපාතං භුඤ්ජන්ති ආකිරන්තෙපි අතික්කමන්තෙපි න ජානන්ති -පෙ-

**පත්තසඤ්ඤී පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

පත්තසඤ්ඤිනා පිණ්ඩපාතො භුඤ්ජිතබ්බො. යො අනාදරියං පටිච්ච තහං තහං ඔලොකෙන්තො පිණ්ඩපාතං භුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති** අසඤ්චිච්ච -පෙ- ආදිකම්මිකස්සාති.

**දුතියසික්ඛාපදං.**

## 8. 4. 3

සාවත්ථිනිදානං- තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ තහං තහං ඔමසිත්වා පිණ්ඩපාතං භුඤ්ජන්ති -පෙ-

**සපදානං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

සපදානං පිණ්ඩපාතො භුඤ්ජිතබ්බො. යො අනාදරියං පටිච්ච තහං තහං ඔමසිත්වා පිණ්ඩපාතං භුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති**: අසඤ්චිච්ච අසතියා අජානන්තස්ස ගිලානස්ස අඤ්ඤෙසං දෙන්තො ඔමසති, අඤ්ඤස්ස භාජනෙ[1] ආකිරන්තො ඔමසති, උත්තරිභඞ්ගෙ, ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**තතියසික්ඛාපදං.**

2. අඤ්ඤස්ස භාජනෙ- මජසං

## 8. 4. 1

එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජේතවන නම් වූ අනේපිඩු සිටුහුගේ අරමහි වැඩැ වෙසෙති. එසමයෙහි සවග මහණහු නො වළඳනු කැමැත්තවුන් මෙන් නො සකස් කොට වළඳත්...

**සකසා පිඩුවා වළඳන්නෙමි යි හික්මියැ යුතු'යි.**

සිහි එළවා පිඩුවා වැළඳියයුතු යි. යමෙක් අනාදරිය පිණිස නො සකසා පිඩුවා වළඳා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට ගිලනහුට ආපදවෙහි උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

**ප්‍රථම ශික්ෂාපද යි.**

## 8. 4. 2

ශ්‍රාවස්තිනිදන යි- එසමයෙහි සවග මහණහු තැනැ තැනැ බලමින් පිඩුවා වළඳත්. (පිඩුවා) දෙන කල්හි දු (පිඩුවා දී) ඉක්ම යන කල්හි දු නො දනිත්...

**පාත්‍රගත සංඥී වැ පිඩුවා වළඳන්නෙමි යි හික්මියැ යුතු'යි.**

පාත්‍රසංඥීහු විසින් පිඩුවා වැළඳිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස තැන තැනැ බලමින් පිඩුවා වළඳා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට... ආදිකම්මිකහට ඇවැත් නැති.

**ද්විතීය ශික්ෂාපද යි.**

## 8. 4. 3

ශ්‍රාවස්තිනිදන යි—එසමයෙහි සවග මහණහු තැනැ තැනැ පහසා පිඩුවා වළඳත්...

**තමා දෙස පටන් පිළිවෙළින් පිඩුවා වළඳන්නෙමි යි හික්මියැ යුතු'යි.**

අනුපිළිවෙළින් පිඩුවා වැළඳිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස තැනැ තැනැ පහසා පිඩුවා වළඳා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නොදන්න හුට ගිලනහුට අනෙකක්හට දෙනුයේ පහසා නම්, අන්බඳුනෙක්හි ලන්නේ පහසා නම්, අවුළුපත් ගැනීමෙහි නම්, ඇවැත් නැත. ආපදවෙහි උම්මත්තකහට ආදිකම්මිකහට ඇවැත් නැති.

**තෘතීය ශික්ෂාපද යි.**

## 8. 4. 4

සාවත්ථිනිදානං -- තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ පිණ්ඩපාතං භුඤ්ජන්තා සූපඤ්ඤෙව බහුං භුඤ්ජන්ති -පෙ-

**සමසූපකං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

සූපො නාම: ද්වෙ සූපා මුග්ගසූපො මාසසූපො හත්ථහාරියො. සමසූපකො පිණ්ඩපාතො භුඤ්ජිතබ්බො. යො අනාදරියං පටිච්ච සූපඤ්ඤෙව බහුං භුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච අසතියා අජානන්තස්ස ගිලානස්ස රසරසෙ ඤාතකානං පවාරිතානං අත්තනො ධනෙන ආපදසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**චතුත්ථසික්ඛාපදං.**

## 8. 4. 5

සාවත්ථිනිදානං — තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ථූපතො[1] ඔමද්දිත්වා පිණ්ඩපාතං භුඤ්ජන්ති -පෙ-

**න ථූපතො ඔමද්දිත්වා පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

න ථූපතො ඔමද්දිත්වා පිණ්ඩපාතො භුඤ්ජිතබ්බො. යො අනාදරියං පටිච්ච ථූපතො ඔමද්දිත්වා පිණ්ඩපාතං භුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච අසතියා අජානන්තස්ස ගිලානස්ස පරිත්තකෙ සෙසෙ එකතො සංකඩ්ඪිත්වා ඔමද්දිත්වා භුඤ්ජති, ආපදසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**පඤ්චමසික්ඛාපදං.**

## 8. 4. 6

සාවත්ථිනිදානං — තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සූපම්පි බ්‍යඤ්ජනම්පි ඔදනෙන පටිච්ඡාදෙන්ති භිය්‍යොකම්‍යතං උපාදය -පෙ-

**න සූපං වා බ්‍යඤ්ජනං වා ඔදනෙන පටිච්ඡාදෙස්සාමි භිය්‍යොකම්‍යතං උපාදයාති සික්ඛා කරණීයා'ති.**

න සූපං වා බ්‍යඤ්ජනං වා ඔදනෙන පටිච්ඡාදෙතබ්බං භිය්‍යොකම්‍යතං උපාදය. යො අනාදරියං පටිච්ච සූපං වා බ්‍යඤ්ජනං වා ඔදනෙන පටිච්ඡාදෙති භිය්‍යොකම්‍යතං උපාදය ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච අසතියා අජානන්තස්ස සාමිකා පටිච්ඡාදෙත්වා දෙන්ති. න භිය්‍යොකම්‍යතං උපාදය, ආපදසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**ඡට්ඨසික්ඛාපදං.**

---

1. ථූපකතො - මජසං.

## 8. 4. 4.

ශ්‍රාවස්තිනිදාන යි—එසමයෙහි සවග මහණහු පිඩුවා වළඳන්නාහු සූප මැ බොහෝ කොට වළඳත්...

**සමසූපක පිඩුවා වළඳන්නෙමි යි හික්මියැ යුතු'යි.**

**සූප** නම්; අතින් ගෙන යා හැකි මුද්ගසූප යැ මාසසූපයැ යි සූප දෙකෙකි. සමසූපක පිඩුවා වැළඳිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස සූප මැ බොහෝ කොට වළඳා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්න හුට ගිලනහුට රසරසයෙහි නම්, නෑයන්ගෙන් නම්, පැවරූවන්ගෙන් නම්, තම සතු ධනයෙන් නම්, ඇවැත් නැත. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**චතුර්ථ ශික්ෂාපද යි.**

## 8. 4. 5.

ශ්‍රාවස්තිනිදාන යි—එසමයෙහි සවග මහණහු බත මැදතුරෙන් හනා පිඩුවා වළඳත්...

**බත මැදතුරෙන් හනා පිඩුවා නො වළඳන්නෙමි යි හික්මියැ යුතු'යි.**

මැදතුරෙන් . හනා පිඩුවා නො වැළඳියයුතු යි. යමෙක් අනාදරිය පිණිස මැදතුරෙන් හනා පිඩුවා වළඳා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට ගිලනහුට ඉතිරි මඳ දයෙහි නම්, එකට ඇද හනා වළඳා නම්, ඇවැත් නැත. ආපදවෙහි උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**පඤ්චම ශික්ෂාපද යි.**

## 8. 4. 6.

ශ්‍රාවස්තිනිදාන යි—එසමයෙහි සවග මහණහු වැඩියෙන් ලබනු කැමැත්ත නිසා සූප ද ව්‍යඤ්ජන ද බතින් පිළිසන් කෙරෙත්...

**වැඩියක් ලබනු කැමැත්ත නිසා සූප හෝ ව්‍යඤ්ජන හෝ බතින් පිළිසන් නොකරන්නෙමි යි හික්මියැ යුතු'යි.**

වැඩියක් ලබනු කැමැත්ත නිසා සූප හෝ ව්‍යඤ්ජන හෝ බතින් පිළිසන් නො කළ යුතු යි. යමෙක් අනාදරිය පිණිස වැඩියක් ලබනු කැමැත්ත නිසා සූප හෝ ව්‍යඤ්ජන හෝ බතින් පිළිසන් කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නොසිහියෙන් කරන්නහුට නො දන්නහුට හිමියෝ පිළිසන් කොට දෙත් නම්, වැඩියක් ලබනු කැමැත්ත නැති කල්හි නම්, ඇවැත් නැත. ආපදවෙහි, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**ෂෂ්ඨ ශික්ෂාපදයි.**

## 8. 4. 7

1. සාවත්ථීනිදානං— තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සූපම්පි ඔදනම්පි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති ''කථං හි නාම සමණා සක්‍යපුත්තියා සූපම්පි ඔදනම්පි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සන්ති කස්ස සම්පන්නං න මනාපං කස්ස සාදුං න රුච්චතී'ති.

2. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං. විපාචෙන්තානං යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති: ''කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ සූපම්පි ඔදනම්පි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සන්තී''ති -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ සූපම්පි ඔදනම්පි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජථාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා සූපම්පි ඔදනම්පි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**''න සූපං වා ඔදනං වා අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා''ති**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති..

3. තෙන ඛො පන සමයෙන භික්ඛූ ගිලානා හොන්ති. ගිලානපුච්ඡකා භික්ඛූ ගිලානෙ[1] එතදවොචුං; ''කච්චාවුසො ඛමනීයං කච්චි යාපනීය''න්ති. පුබ්බෙ මයං ආවුසො සූපම්පි ඔදනම්පි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජාම. තෙන නො ඵාසු හොති. ඉදානි පන භගවතා පටික්ඛිත්තන්ති කුක්කුච්චායන්තා න විඤ්ඤාපෙම තෙන නො න ඵාසු හොතීති. භික්ඛූ[2] භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි ''අනුජානාමි භික්ඛවෙ ගිලානෙන භික්ඛුනා සූපම්පි ඔදනම්පි අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජිතුං'' එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ;

**''න සූපං වා ඔදනං වා අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා''ති**

---

1. ගිලානෙ භික්ඛූ - මජසං,
2. භික්ඛූති පදං - මජසං න දිස්සති.

## 8. 4. 7

1. ශ්‍රාවස්තිනිදාන යි — එසමයෙහි ෂඩ්වර්ගික මහණහු සූප ද බත් ද තමා පිණිස විචාරා ගෙනැ වළඳත්. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ශ්‍රමණශාක්‍යපුත්‍රයෝ සූප ද බත් ද තමා පිණිස විචාරාගෙනැ වැළඳූහු ද? කවරක්හට මිහිරි නො මැනැවි ද? කවරක්හට රසය නො රුස්නේ දැ" යි.

2. භික්ෂූහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ [අකීර්තිශබ්දය] ඇසූහු. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස්වූවෝ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ෂඩ්වර්ගික මහණහු සූප ද බත් ද තමා පිණිස විචාරාගෙනැ වැළඳූහු දැ" යි.... සැබෑ ද මහණෙනි, තෙපි සූප ද බත් ද තමා පිණිස විචාරාගෙනැ වළඳවූ දැ යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ.... හිස් පුරුෂයෙනි, කෙසේ නම් තෙපි සූප ද බත් ද තමා පිණිස විචාරාගෙනැ වැළඳූහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි.... මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**"සූප හෝ බත් හෝ තමා පිණිස විචාරාගෙනැ නො වළඳන්නෙමැයි හික්මියැ යුතු"යි.**

මෙසේ භාග්‍යවතුන් විසින් භික්ෂූන්හට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

3. එසමයෙහි භික්ෂූහු ගිලන්වූවෝ වෙති. ගිලනුන් පුළුවුස්නා මහණහු ගිලනුන්ට මෙය කීහු. ඇවැත්නි, කිම ඉවසිය හැකි ද? කිම යැපිය හැකි ද? ඇවැත්නි, ඇපි පෙර සූප ද බත් ද තමා පිණිස විචාරාගෙනැ වළඳම්හ. එහෙයින් අපට පහසු වෙයි. දැන් වූකලි භාග්‍යවතුන් විසින් පිළිකෙව් කරන ලදැ යි කුකුසන්නමෝ නො විචාරම්හ. එහෙයින් අපට පහසු නො වෙයි. භික්ෂූහු භාග්‍යවතුන්හට තෙල කරුණ දැන්වූහු. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙහි ලා මෙ අවසරයෙහි ලා දැහැමි කථා කොට භික්ෂූන් ඇමැතූසේක. "මහණෙනි; ගිලන් මහණහු විසින් සූප ද බත් ද තමා පිණිස විචාරා ගෙනැ වළඳන්නට අනුදනිමි." මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**"නො ගිලන් වැ සූප හෝ බත් හෝ තමා පිණිස විචාරා ගෙනැ නො වළඳන්නෙමි යි හික්මියැ යුතු"යි.**

න සූපං වා ඔදනං වා අගිලානෙන අත්තනො අත්ථාය **විඤ්ඤාපෙත්වා** භුඤ්ජිතබ්බං. යො අනාදරියං පටිච්ච සූපං වා ඔදනං වා අගිලානො අත්තනො අත්ථාය **විඤ්ඤාපෙත්වා** භුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති**: අසඤ්චිච්ච අසතියා අජානන්තස්ස ගිලානස්ස ඤාතකානං පවාරිතානං අඤ්ඤස්සත්ථාය අත්තනො ධනෙන ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**සත්තමසික්ඛාපදං.**

## 8. 4. 8

සාවත්ථිනිදානං— තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උජ්ඣානසඤ්ඤී පරෙසං පත්තං ඔලොකෙන්ති -පෙ-

**න උජ්ඣානසඤ්ඤී පරෙසං පත්තං ඔලොකෙස්සාමීති සික්ඛා කරණීයා'ති.**

න උජ්ඣානසඤ්ඤිනා පරෙසං පත්තො ඔලොකෙතබ්බො. යො අනාදරියං පටිච්ච උජ්ඣානසඤ්ඤී පරෙසං පත්තං ඔලොකෙති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති**: අසඤ්චිච්ච අසතියා අජානන්තස්ස දස්සාමීති වා දාපෙස්සාමීති වා ඔලොකෙති න උජ්ඣානසඤ්ඤිස්ස ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**අට්ඨමසික්ඛාපදං.**

## 8. 4. 9

සාවත්ථිනිදානං— තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ මහන්තං කබළං කරොන්ති -පෙ-

**නාතිමහන්තං කබළං කරිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

නාතිමහන්තො කබළො කාතබ්බො. යො අනාදරියං පටිච්ච මහන්තං කබළං කරොති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති**: අසඤ්චිච්ච අසතියා අජානන්තස්ස අගිලානස්ස ඛජ්ජකෙ ඵලාඵලෙ උත්තරිභඞ්ගෙ ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**නවමසික්ඛාපදං.**

නො ගිලන් වැ සූප හෝ බත් හෝ තමා පිණිස විනවා ගෙනැ නො වැළඳියයුතු යි. යමෙක් අනාදරිය පිණිස සූප හෝ බත් හෝ නො ගිලන් වැ තමා පිණිස විනවාගෙනැ වළඳා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට ගිලනහුට, නෑයන්ගෙන් නම්, පැවැරියන්ගෙන් නම්, අනෙකක්හු සඳහා නම්, තමසතු ධනයෙන් නම්, ඇවැත්, නැත ආපදයෙහි, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**සප්තම ශික්ෂාපද යි.**

## 8. 4. 8

1. ශ්‍රාවස්තිනිදාන යි — එසමයෙහි සවග මහණහු ලමු කොට සිතන සත් ඇති වැ අනුන්ගේ පාත්‍රය බලත්...

**"කිපිසිත් ඇති වැ අනුන් වළඳන පාත්‍රය නො බලන්නෙමි යි හික්මියැ යුතු"යි.**

2. කිපිසිත් ඇති වැ අනුන් වළඳන පාත්‍රය නො බැලිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස ලමු කොට සිතන සත් ඇතියේ අනුන්ගේ පාත්‍රය බලා නම් දුකුළා ඇවැත් වේ.

3. නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට දෙන්නෙමි යි හෝ දෙවන්නෙමි යි හෝ බලා නම්, ලමු කොට සිතන සත් නැත්තහුට ආපදවෙහි ඇවැත් නැත, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**අෂ්ටම ශික්ෂාපද යි.**

## 8. 4. 9

ශ්‍රාවස්තිනිදාන යි - එසමයෙහි සවග මහණහු මහත් කොට බත්පිඩු කෙරෙත්...

**ඉමහත් කොට බත් පිඩු නො කරන්නෙමි යි හික්මියැ යුතු'යි.**

ඉමහත් කොට බත්පිඩු නො කළ යුතු යි. යමෙක් අනාදරිය පිණිස මහත් කොට බත්පිඩු කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට, නො සිහියෙන් කරන්නහුට, නො දන්නහුට, ගිලනහුට, කැවිලියෙහි, පලවැළයෙහි, අවුළුපත්හි; ආපදවෙහි ඇවැත් නැති. උම්මත්තකයහට, ආදිකම්මිකයහට ඇවැත් නැති.

**නවම ශික්ෂාපද යි.**

## 8. 4. 10

සාවත්ථිනිදානං—තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ දීඝං ආලොපං කරොන්ති -පෙ-

**පරිමණ්ඩලං ආලොපං කරිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

පරිමණ්ඩලො ආලොපො කාතබ්බො. යො අනාදරියං පටිච්ච දීඝං ආලොපං කරොති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති :** අසඤ්චිච්ච අසතියා අජානන්තස්ස ගිලානස්ස ඛජ්ජකෙ ඵලාඵලෙ උත්තරිභඞ්ගෙ ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**දසමසික්ඛාපදං.**

**සක්කච්චවග්ගො චතුත්ථො**

## 8. 4. 10

1. ශ්‍රාවස්තිනිදාන යි – එසමයෙහි සවග මහණහු දිගැටි කොට බත්පිඩු කෙරෙත්....

**පිරිමඩුලු කොට බත්පිඩු කරන්නෙමි යි හික්මියැ යුතු'යි.**

2. පිරිමඩුලු කොට බත්පිඩු කළයුතු යි. යමෙක් අනාදරිය පිණිස දිගැටි කොට බත්පිඩු කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

3. නො සිතා කරන්නහුට, නො සිහියෙන් කරන්නහුට, නො දන්නහුට, ගිලනහුට, කැවිලියෙහි, පලවැළයෙහි, අවුළුපත්හි ආපදයෙහි ඇවැත් නැති. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**දශම ශික්ෂාපද යි.**

**සතරවන සක්කච්ච වර්ග යි.**

## 8. 5. 1

තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන **ඡබ්බග්ගියා** භික්ඛු අනාහටෙ කබළෙ මුඛද්වාරං විවරන්ති -පෙ-

**න අනාහටෙ කබළෙ මුඛද්වාරං විවරිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

න අනාහටෙ කබළෙ මුඛද්වාරං විවරිතබ්බං. යො අනාදරියං පටිච්ච අනාහටෙ කබළෙ මුඛද්වාරං විවරති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච -පෙ- ආදිකම්මිකස්සාති.

**පඨමසික්ඛාපදං.**

## 8. 5. 2

සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛු භුඤ්ජමානා සබ්බං හත්ථං මුඛෙ පක්ඛිපන්ති -පෙ-

**න භුඤ්ජමානො සබ්බං හත්ථං මුඛෙ පක්ඛිපිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

න භුඤ්ජමානෙන සබ්බො හත්ථො මුඛෙ පක්ඛිපිතබ්බො. යො අනාදරියං පටිච්ච භුඤ්ජමානො සබ්බං හත්ථං මුඛෙ පක්ඛිපති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච -පෙ- ආදිකම්මිකස්සාති.

**දුතියසික්ඛාපදං.**

## 8. 5. 3

සාවත්ථිනිදානං — තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛු සකබළෙන මුඛෙන බ්‍යාහරන්ති -පෙ-

**න සකබළෙන මුඛෙන බ්‍යාහරිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

න සකබළෙන මුඛෙන බ්‍යාහරිතබ්බං. යො අනාදරියං පටිච්ච සකබළෙන මුඛෙන බ්‍යාහරති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච -පෙ- ආදිකම්මිකස්සාති

**තතියසික්ඛාපදං.**

## 8. 5. 1

එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩැ වෙසෙති. එසමයෙහි සවග මහණහු ආලෝපය නො එළවූ කල්හි මුවදෙර විවෘත කෙරෙත්....

**ආලෝපය නො එළවූ කල්හි මුවදෙර විවෘත නො කරන්නෙමි යි හික්මියැ යුතු'යි.**

ආලෝපය නො එළවූ කල්හි මුවදෙර විවෘත නො කළ යුතු යි. යමෙක් අනාදරිය පිණිය ආලෝපය නො එළවූ කල්හි මුවදෙර විවෘත කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට... ආදිකම්මිකයහට ඇවැත් නැති.

**ප්‍රථම ශික්ෂාපද යි.**

## 8. 5. 2

ශ්‍රාවස්තිනිදන යි – එසමයෙහි වනාහි සවග මහණෝ වළඳමින් මුළු අත මුවෙහි බහාලත්....

**වළඳමින් මුළු අත මුවෙහි නො බහාලන්නෙමි යි හික්මියැ යුතු'යි.**

වළඳන්නහු විසින් මුළු අත මුවෙහි නො බහා ලිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස වළඳමින් මුළු අත මුවෙහි බහා ලා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට.... ආදිකම්මිකයහට ඇවැත් නැති.

**ද්විතීය ශික්ෂාපද යි.**

## 8. 5. 3

ශ්‍රාවස්තිනිදන යි – එසමයෙහි සවග මහණහු ආලෝපය සහිත මුවින් බෙණෙත්....

**ආලෝපය සහිත මුවින් නො බණන්නෙමි යි හික්මියැ යුතු'යි.**

ආලෝපය සහිත මුවින් නො බිණිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස ආලෝපය සහිත මුවින් බෙණේ නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට.... ආදිකම්මිකයහට ඇවැත් නැති.

**තෘතීය ශික්ෂාපද යි.**

## 8. 5. 4

සාවත්ථිනිදානං— තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ පිණ්ඩුක්ඛෙපකං භුඤ්ජන්ති -පෙ-

**න පිණ්ඩුක්ඛෙපකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.**

න පිණ්ඩුක්ඛෙපකං භුඤ්ජිතබ්බං. යො අනාදරියං පටිච්ච පිණ්ඩුක්ඛෙපකං භුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච අසතියා අජානන්තස්ස ගිලානස්ස ඛජ්ජකෙ ඵලාඵලෙ ආපදාසු උම්මත්තකස්ස ආදිකම්මිකස්සාති.

**චතුත්ථසික්ඛාපදං.**

## 8. 5. 5

සාවත්ථිනිදානං— තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ කබළාවච්ඡෙදකං භුඤ්ජන්ති -පෙ-

**න කබළාවච්ඡෙදකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.**

න කබළාවච්ඡෙදකං භුඤ්ජිතබ්බං. යො අනාදරියං පටිච්ච කබළාවච්ඡෙදකං භුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, ඛජ්ජකෙ, ඵලාඵලෙ, උත්තරිභඞ්ගෙ, ආපදාසු, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**පඤ්චම සික්ඛාපදං.**

## 8. 5. 6

සාවත්ථිනිදානං— තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ අවගණ්ඩකාරකං භුඤ්ජන්ති -පෙ-

**න අවගණ්ඩකාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.**

න අවගණ්ඩකාරකං භුඤ්ජිතබ්බං. යො අනාදරියං පටිච්ච එකතො වා උභතො වා ගණ්ඩං කත්වා භුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, ඛජ්ජකෙ[1], ඵලාඵලෙ, ආපදාසු, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**ඡට්ඨසික්ඛාපදං.**

1. ඛජ්ජකෙති පදං -මජසං න දිස්සති.

## 8. 5. 4

ශ්‍රාවස්තිනිදාන යි – එසමයෙහි සවග මහණහු (මුවතුළට) පිඩු දමා ගසමින් වළඳත්....

**පිඩු මියෙහි දමා ගසමින් නො වළඳන්නෙමි යි හික්මියැ යුතු'යි.**

පිඩු දමා ගසමින් නො වැළඳිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස පිඩු දමා ගසමින් වළඳා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට ගිලනහුට කැවිලියෙහි පලවැළෙහි ආපදයෙහි ඇවැත් නැති. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**චතුර්ථ ශික්ෂාපද යි.**

## 8. 5. 5

ශ්‍රාවස්තිනිදාන යි – එසමයෙහි සවග මහණහු ආලොපය සිඳ සිඳ වළඳත්....

**ආලොපය කඩ කඩා නො වළඳන්නෙමි යි හික්මියැ යුතු'යි.**

ආලොපය සිඳ සිඳ නො වැළඳිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස ආලොපය සිඳ සිඳ වළඳා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට ගිලනහුට කැවිලියෙහි, පලවැළෙහි, අවුළුපත්හි, ආපදයෙහි, ඇවැත් නැති උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**පඤ්චම ශික්ෂාපද යි.**

## 8. 5. 6

ශ්‍රාවස්තිනිදාන යි – එසමයෙහි සවග මහණහු හකුපුරා ගෙනැ වළඳත්....

**පිඩු කොපුලැ රැස්කොට නො වළඳන්නෙමි යි හික්මියැ යුතු'යි.**

හකු පුරා ගෙනැ නො වැළඳිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස එක්පසින් හෝ දෙපසින් හෝ හකු පුරා ගෙනැ වළඳා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට ගිලනහුට කැවිලියෙහි පලවැළෙහි ආපදයෙහි ඇවැත් නැති. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**ෂෂ්ඨ ශික්ෂාපද යි.**

## 8. 5. 7

සාවත්ථිනිදානං—තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ හත්ථනිද්ධුනකං භුඤ්ජන්ති -පෙ-

**න හත්ථනිද්ධුනකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

න හත්ථනිද්ධුනකං භුඤ්ජිතබ්බං. යො අනාදරියං පටිච්ච හත්ථනිද්ධුනකං භුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, කචවරං ඡඩ්ඩෙන්තො හත්ථං නිද්ධුනාති, ආපදාසු, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**සත්තමසික්ඛාපදං.**

## 8. 5. 8

සාවත්ථිනිදානං—තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සිත්ථාවකාරකං භුඤ්ජන්ති -පෙ-

**න සිත්ථාවකාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

න සිත්ථාවකාරකං භුඤ්ජිතබ්බං. යො අනාදරියං පටිච්ච සිත්ථාවකාරකං භුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස: කචවරං ඡඩ්ඩෙන්තො සිත්ථං ඡඩ්ඩියති,[1] ආපදාසු, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**අට්ඨමසික්ඛාපදං.**

## 8. 5. 9

සාවත්ථිනිදානං—තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ජිව්හානිච්ඡාරකං භුඤ්ජන්ති -පෙ-

**න ජිව්හානිච්ඡාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

න ජිව්හානිච්ඡාරකං භුඤ්ජිතබ්බං. යො අනාදරියං පටිච්ච ජිව්හානිච්ඡාරකං භුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස. ආපදාසු, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**නවමසික්ඛාපදං.**

---

1. ඡඩ්ඩියාති - මජ්ඣං

## 8. 5. 7

ශ්‍රාවස්තිනිදාන යි — එසමයෙහි සවග මහණහු අත් සල සලා වළඳත්....

**අත් සලසලා නො වළඳන්නෙමි යි හික්මියැ යුතු'යි.**

අත් සලසලා නො වැළඳිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස අත් සලසලා වළඳා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට ගිලනහුට කසළ ඉවත ලමින් අත ගසාදමා නම්, ආපදයෙහි ඇවැත් නැති. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**සප්තම ශික්ෂාපද යි.**

## 8. 5. 8

ශ්‍රාවස්තිනිදාන යි — එසමයෙහි සවග මහණහු බත්හුළු විසුරුවමින් වළඳත්.

**බත්හුළු ඉසැ ඉසැ නො වළඳන්නෙමි යි හික්මියැ යුතු'යි.**

බත්හුළු විසුරුවමින් නො වැළඳිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස බත්හුළු විසුරුවමින් වළඳා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට ගිලනහුට කසළ ඉවතලමින් බත්හුළු ඉවත ලනු ලැබේ නම්, ආපදයෙහි ඇවැත් නැති. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**අෂ්ටම ශික්ෂාපද යි.**

## 8. 5. 9

ශ්‍රාවස්තිනිදාන යි — එසමයෙහි සවග මහණහු දිව නෙරනෙරා වළඳත් ...

**දිව නෙරනෙරා නො වළඳන්නෙමියි හික්මියැ යුතු'යි.**

දිව නෙර නෙරා නො වැළඳිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස දිව නෙර නෙරා වළඳා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට ගිලනහුට ආපදයෙහි ඇවැත් නැති. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**නවම ශික්ෂාපද යි.**

## 8. 5. 10

1. සාවත්ථිනිදානං- තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ චපුචපුකාරකං භුඤ්ජන්ති -පෙ-

**න චපුචපුකාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

2. න චපුචපුකාරකං භුඤ්ජිතබ්බං. යො අනාදරියං පටිච්ච චපුචපුකාරකං භුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

3. **අනාපත්ති:** අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, ආපදාසු, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**දසමසික්ඛාපදං.**

**කබළවග්ගො පඤ්චමො.**

## 8. 5. 10

1. ශ්‍රාවස්තිනිදාන යි — එසමයෙහි සවග මහණහු චපුචපු හඬ කෙරෙමින් වළඳති.

**චපුචපු හඬ කෙරෙමින් නො වළඳන්නෙමි යි හික්මියැ යුතු'යි.**

2. චපුචපු හඬ කෙරෙමින් නො වැළඳිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස චපු චපු හඬ කෙරෙමින් වළඳා නම් දුකුළා ඇවැත් වේ.

3. නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට ගිලනහුට ආපදයෙහි ඇවැත් නැති. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**දශම ශික්ෂාපද යි.**

**පස්වන කබළ වර්ග යි.**

## 8. 6. 1

1. තෙන සමයෙන බුද්ධො භගවා කොසම්බියං විහරති ඝොසිතාරාමෙ. තෙන ඛො පන සමයෙන අඤ්ඤතරෙන බ්‍රාහ්මණෙන සඞ්ඝස්ස පයොපානං පටියත්තං හොති. භික්ඛූ සුරුසුරුකාරකං ඛීරං පිවන්ති. අඤ්ඤතරො නටපුබ්බකො භික්ඛු එවමාහ. "සබ්බායං[1] මඤ්ඤෙ සඞ්ඝො සීතීකතො"ති[2]. යෙ තෙ භික්ඛු අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති "කථං හි නාම භික්ඛු සඞ්ඝං ආරබ්භ දවං කරිස්සතී"ති -පෙ- සච්චං කිර ත්වං භික්ඛු සඞ්ඝං ආරබ්භ දවං අකාසීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම ත්වං මොඝපුරිස සඞ්ඝං ආරබ්භ දවං කරිස්සසි. නෙතං මොඝපුරිස අප්පසන්නානං වා පසාදය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. "න භික්ඛවෙ බුද්ධං වා ධම්මං වා සඞ්ඝං වා ආරබ්භ දවො කාතබ්බො. යො කරෙය්‍ය ආපත්ති දුක්කටස්සා"ති, අථ ඛො භගවා තං භික්ඛුං අනෙකපරියායෙන විගරහිත්වා දුභරතාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**න සුරුසුරුකාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා'ති**

2. න සුරුසුරුකාරකං භුඤ්ජිතබ්බං. යො අනාදරියං පටිච්ච සුරුසුරුකාරකං භුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච -පෙ- ආදිකම්මිකස්සාති.

**පඨමසික්ඛාපදං.**

## 8. 6. 2

1. සාවත්ථිනිදානං. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ හත්ථනිල්ලෙහකං භුඤ්ජන්ති. -පෙ-

**න හත්ථනිල්ලෙහකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා'ති**

2. න හත්ථනිල්ලෙහකං භුඤ්ජිතබ්බං. යො අනාදරියං පටිච්ච හත්ථනිල්ලෙහකං භුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, ආපදාසු, උම්මත්තකස්ස. ආදිකම්මිකස්සාති.

**දුතියසික්ඛාපදං.**

---

1. සබ්බොයං - මජසං
2. සීතකතොති - සිමු

## 8. 6. 1

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු කොසඹෑ නුවර ඝොෂිතාරාමයෙහි වැඩැ වෙසෙති. එසමයෙහි එක්තරා බමුණෙක්හු විසින් සඟනට කිරිපැනෙක් පිළියෙළ කරන ලද්දේ වෙයි. භික්ෂූහු සුරුසුරු හඬ කෙරෙමින් කිරි බොත්. එක්තරා නළුවිරු මහණෙක් මෙසේ කී යැ: මේ සියලු සඞ්ඝ තෙමේ ශීතයෙන් වෙවුළන ලද්දේ යැ යි හඟිමි යි. යම් ඒ භික්ෂූ කෙනෙක් අපිස් වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත් "කෙසේ නම් මහණ තෙමේ සඟහු ඇරැබැ කෙළිකවට කම් කෙළේ"ද යි ... සැබෑ ද මහණ තෝ සඟහු ඇරැබැ කෙළිකවට කම් කෙළෙහි ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් හිස් පුරුෂය තෝ සඟහු ඇරැබැ කෙළිකවටකම් කෙළෙහි ද? හිස් පුරුෂය මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... ගරහා දැහැමි කථා කොට මහණුන් ඇමැතූහු. "මහණෙනි, බුදුන් හෝ ධර්මය හෝ සඞ්ඝයා හෝ ඇරැබැ කෙළිකවටකම් නො කළයුතු යි. යමෙක් කරන්නේ නම් දුකුළා ඇවැත් වේ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එමහණහට නොයෙක් කරුණෙන් ගරහා දුබරබැව් පිණිස... මෙසේ ද වනාහි මහණෙනි මේ සිකපදය උදෙසවු:

**සුරුසුරු හඬ කෙරෙමින් නො වළඳන්නෙමියි හික්මියැ යුතු'යි**

2. සුරුසුරු හඬ කෙරෙමින් නො වැළඳිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස සුරුසුරු හඬ කෙරෙමින් වළඳා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට ... ආදිකම්මිකයහට ඇවැත් නැති.

**ප්‍රථම ශික්ෂාපදයි.**

## 8. 6. 2

1. ශ්‍රාවස්තිනිදන යි– එසමයෙහි වනාහි සවග මහණෝ අත ලොවමින් වළඳත් ...

**අත ලොවමින් නො වළඳන්නෙමියි හික්මියයුතු යැ'යි**

2. අත ලොවමින් නො වැළඳිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස අත ලොවමින් වළඳා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට ... ආදිකම්මිකයහට ඇවැත් නැති.

**ද්විතීය ශික්ෂාපදයි.**

## 8. 6. 3

1. සාවත්ථිනිදානං — තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ පත්තනිල්ලෙහකං භුඤ්ජන්ති -පෙ-

න පත්තනිල්ලෙහකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා'ති.

2. න පත්තනිල්ලෙහකං භුඤ්ජිතබ්බං. යො අනාදරියං පටිච්ච පත්තනිල්ලෙහකං භුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

අනාපත්ති: අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, පරිත්තකෙ සෙසෙ එකතො සංකඩ්ඪිත්වා නිල්ලෙහිත්වා භුඤ්ජති, ආපදාසු, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සා'ති.

තතියසික්ඛාපදං.

## 8. 6. 4

1. සාවත්ථිනිදානං — තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ඔට්ඨනිල්ලෙහකං භුඤ්ජන්ති.-පෙ-

න ඔට්ඨනිල්ලෙහකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා'ති.

2. න ඔට්ඨනිල්ලෙහකං භුඤ්ජිතබ්බං. යො අනාදරියං පටිච්ච ඔට්ඨනිල්ලෙහකං භුඤ්ජති ආපත්ති දුක්කටස්ස.

අනාපත්ති: අසඤ්චිච්ච -පෙ- ආදිකම්මිකස්සා'ති.

චතුත්ථසික්ඛාපදං.

## 8. 6. 3

1. ශ්‍රාවස්තිනිදාන යි- එසමයෙහි ෂඩ්වර්ගික මහණෝ පාත්‍රය ලොවමින් වළඳත් ...

**පාත්‍රය ලොවමින් නො වළඳන්නෙමියි හික්මියැ යුතු'යි.**

2. පාත්‍රය ලොවමින් නො වැළඳිය යුතු යි. යමෙක් අනාදරීය පිණිස පාත්‍රය ලොවමින් වළඳා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට ගිලනහුට මද දූයෙහි, ඉතිරීයෙහි එක් කොට ඇද ලෙවැ වළඳා නම්, ඇවැත් නැති. ආපදායෙහි, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**තෘතීය ශික්ෂාපදයි.**

## 8. 6. 4

1. ශ්‍රාවස්තිනිදාන යි - එසමයෙහි ෂඩ්වර්ගික මහණෝ තොල් ලොවමින් වළඳත් ...

**තොල් ලොවමින් නො වළඳන්නෙමියි හික්මියැ යුතු'යි.**

2. තොල් ලොවමින් නො වැළඳිය යුතු යි. යමෙක් අනාදරීය පිණිස තොල් ලොවමින් වළඳා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට ... ආදිකම්මිකයහට ඇවැත් නැති.

**චතුර්ථ ශික්ෂාපදයි.**

## 8. 6. 5

1. තෙන සමයෙන බුද්ධො භගවා භග්ගෙසු විහරති සුංසුමාරගිරෙ භෙසකලාවනෙ මිගදායෙ. තෙන ඛො පන සමයෙන භික්ඛූ කොකනදෙ[1] පාසාදෙ සාමිසෙන හත්ථෙන පානීයථාලකං පටිගණ්හන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති ''කථං හි නාම සමණා සක්‍යපුත්තියා සාමිසෙන හත්ථෙන පානීයථාලකං පටිග්ගහෙස්සන්ති සෙය්‍යථාපි ගිහී කාමභොගිනො''ති.

2. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති ''කථං හි නාම භික්ඛූ සාමිසෙන හත්ථෙන පානීයථාලකං පටිග්ගහෙස්සන්තී''ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛූ සාමිසෙන හත්ථෙන පානීයථාලකං පටිගණ්හන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා සාමිසෙන හත්ථෙන පානීයථාලකං පටිග්ගහෙස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**න සාමිසෙන හත්ථෙන පානීයථාලකං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා'ති.**

3. න සාමිසෙන හත්ථෙන පානීයථාලකො පටිග්ගහෙතබ්බො. යො අනාදරියං පටිච්ච සාමිසෙන හත්ථෙන පානීයථාලකං පටිගණ්හාති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, ධොවිස්සාමීති වා ධොවාපෙස්සාමීති වා පටිගණ්හාති, ආපදාසු, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**පඤ්චමසික්ඛාපදං.**

## 8. 6. 6

1. තෙන සමයෙන බුද්ධො භගවා භග්ගෙසු විහරති සුංසුමාරගිරෙ භෙසකලාවනෙ මිගදායෙ. තෙන ඛො පන සමයෙන භික්ඛූ කොකනදෙ පාසාදෙ සසිත්ථකං පත්තධොවනං අන්තරඝරෙ ඡඩ්ඩෙන්ති. මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. ''කථං හි නාම සමණා සක්‍යපුත්තියා සසිත්ථකං පත්තධොවනං අන්තරඝරෙ ඡඩ්ඩෙස්සන්ති සෙය්‍යථාපි ගිහී කාමභොගිනො''ති.

---

1. කොකනුදෙ සබ්බත්ථ

## 8. 6. 5

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු භග්ග ජනපදයෙහි සුංසුමාර ගිරියෙහි භෙසකලාවන නම් මුව වෙනෙහි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි භික්ෂූහු කොකනද පහයෙහි ඉඳුල් සහිත අතින් පැන්මලාව පිළිගනිත්. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස්පතුරුවත්: කෙසේ නම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ කාමභොගී ගිහියන් මෙන් ඉඳුල් සහිත අතින් පැන්මලාව පිළිගත්තු ද යි.

2. භික්ෂූහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්තිශබ්දය) ඇසූහු මැ යි. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස්වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත් "කෙසේ නම් භික්ෂූහු ඉඳුල් සහිත අතින් පැන්මලාව පිළිගත්තු"දයි ... සැබෑද මහණෙනි භික්ෂූහු ඉඳුල් සහිත අතින් පැන්මලාව පිළිගනිද්දයි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි, ඒ හිස් පුරුෂයෝ ඉඳුල් සහිත අතින් පැන්මලාව පිළිගත්තු ද? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි... මෙසේ ද වනාහි මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**ඉඳුල් සහිත අතින් පැන්මලාව නො පිළිගන්නෙමි යි හික්මියැ යුතු'යි.**

3. ඉඳුල් සහිත අතින් පැන්මලාව නො පිළිගත යුතු යි. යමෙක් අනාදරිය පිණිස ඉඳුල් සහිත අතින් පැන්මලාව පිළිගනී නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට ගිලනහුට දෙවන්නෙමි යි හෝ දෙවවන්නෙමි යි හෝ පිළිගනී නම් ඇවැත් නැති. ආපදයෙහි, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**පඤ්චම ශික්ෂාපදයි.**

## 8. 6. 6

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු භග්ග ජනපදයෙහි සුංසුමාරගිරියෙහි භෙසකලාවන නම් මුවවෙනෙහි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි භික්ෂූහු කොකනද පහයෙහි බත්හුළු සහිත පාදෙවූ දිය ඇතුළුගෙහි දමත්. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත් "කෙසේ නම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රීයයෝ කාමභොගී ගිහියන් මෙන් බත්හුළු සහිත පාදෙවූ දිය ඇතුළුගෙහි දමූහු"ද යි.

2. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. "කථං හි නාම භික්ඛූ සසිත්ථකං පත්තධොවනං අන්තරඝරෙ ඡඩ්ඩෙස්සන්ති ති -පෙ- සච්චං කිර භික්ඛවෙ භික්ඛූ සසිත්ථකං පත්තධොවනං අන්තරඝරෙ ඡඩ්ඩෙන්තීති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තෙ භික්ඛවෙ මොඝපුරිසා සසිත්ථකං පත්තධොවනං අන්තරඝරෙ ඡඩ්ඩෙස්සන්ති. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ :

**න සසිත්ථකං පත්තධොවනං අන්තරඝරෙ ඡඩ්ඩෙස්සාමීති සික්ඛා කරණීයා'ති.**

3. න සසිත්ථකං පත්තධොවනං අන්තරඝරෙ ඡඩ්ඩෙතබ්බං. යො අනාදරියං පටිච්ච සසිත්ථකං පත්තධොවනං අන්තරඝරෙ ඡඩ්ඩෙති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, උද්ධරිත්වා වා භින්දිත්වා වා පටිග්ගහෙ වා[1] නීහරිත්වා වා ඡඩ්ඩෙති ආපදාසු, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**ඡට්ඨසික්ඛාපදං.**

## 8. 6. 7

1. සාවත්ථිනිදානං- තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ඡත්තපාණිස්ස ධම්මං දෙසෙන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ ඡත්තපාණිස්ස ධම්මං දෙසෙස්සන්ති"ති -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ ඡත්තපාණිස්ස ධම්මං දෙසෙථාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා ඡත්තපාණිස්ස ධම්මං දෙසෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ :

**න ඡත්තපාණිස්ස ධම්මං දෙසෙස්සාමීති සික්ඛා කරණීයා'ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති,

1. පටිග්ගහෙත්වා - සිමු, සී

2. භික්ෂූහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ත්තිශබ්දය) ඇසූහු මැ යි. යම් ඒ භික්ෂූ කෙනෙක් අපිස්වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවති, "කෙසේ නම් භික්ෂූහු බත්හුළු සහිත පා දෙවූ දිය අතුරුගෙහි දැමූහු දැ යි ... සැබෑ ද මහණෙනි භික්ෂූහු බත්හුළු සහිත පා දෙවූ දිය ඇතුළුගෙහි දමද්දැ යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් මහණෙනි ඒ හිස් පුරුෂයෝ බත්හුළු සහිත පා දෙවූ දිය ඇතුළුගෙහි දැමූහු ද? මහණෙනි මෙය අප්‍රසන්න යන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවූ :

**බත්හුළු සහිත පා දෙවූ දිය ඇතුළුගෙහි නො දමන්නෙමි යි හික්මියැ යුතු'යි.**

3. බත්හුළු සහිත පා දෙවූ දිය ඇතුළුගෙහි නො දැමිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස බත්හුළු සහිත පා දෙවූ දිය ඇතුළුගෙහි දමාපියා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට ගිලනහුට උදුරා හෝ බිඳ හෝ පඩික්කමෙහි හෝ බැහැර කොට හෝ දමාපියා නම් ඇවැත් නැති. ආපදයෙහි, උම්මත්තකයහට ආදිකම්මිකය හට ඇවැත් නැති.

**ෂෂ්ඨ ශික්ෂාපදයි.**

## 8. 6. 7

1. ශ්‍රාවස්තිනිදාන යි – එසමයෙහි වනාහි සවග මහණෝ සත්ගත් අත් ඇත්තාහට දහම් දෙසත්. යම් ඒ භික්ෂූ කෙනෙක් අපිස්වූවෝ ... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් සවග මහණෝ සත්ගත් අත් ඇත්තාහට දහම් දෙසූහු"දැ යි ... සැබෑ ද මහණෙනි, තෙපි සත්ගත් අත් ඇත්තාහට දහම් දෙසවු දැ යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස. භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි සත්ගත් අත් ඇත්තාහට දහම් දෙසුවහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්න-යන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි ... මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවූ:

**සත්ගත් අත් ඇත්තාහට දහම් නො දෙසන්නෙමියි හික්මියැ යුතු'යි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් භික්ෂූන්හට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

2. තෙන ඛො පන සමයෙන භික්ඛූ ඡත්තපාණිස්ස ගිලානස්ස ධම්මං දෙසෙතුං කුක්කුච්චායන්තා න දෙසෙන්ති.[1] මනුස්සා උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. "කථං හි නාම සමණා සක්‍යපුත්තියා ඡත්තපාණිස්ස ගිලානස්ස ධම්මං න දෙසෙස්සන්ති"ති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි "අනුජානාමි භික්ඛවෙ ඡත්තපාණිස්ස ගිලානස්ස ධම්මං දෙසෙතුං". එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**න ඡත්තපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

3. **ඡත්තං** නාම: තීණි ඡත්තානි සෙතච්ඡත්තං කිලඤ්ජච්ඡත්තං පණ්ණච්ඡත්තං මණ්ඩලබද්ධං සලාකබද්ධං.

**ධම්මො** නාම: බුද්ධභාසිතො සාවකභාසිතො ඉසිභාසිතො දෙවභාසිතො අත්ථූපසංහිතො ධම්මූපසංහිතො.

**දෙසෙය්‍යාති:** පදෙන දෙසෙති පදෙ පදෙ ආපත්ති දුක්කටස්ස. අක්ඛරාය දෙසෙති අක්ඛරක්ඛරාය ආපත්ති දුක්කටස්ස.

න ඡත්තපාණිස්ස අගිලානස්ස ධම්මො දෙසෙතබ්බො. යො අනාදරියං පටිච්ච ඡත්තපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසෙති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, ආපදාසු, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**සත්තමසික්ඛාපදං.**

## 8. 6. 8

1. **සාවත්ථිනිදානං**– තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ දණ්ඩපාණිස්ස ධම්මං දෙසෙන්ති –පෙ–

**න දණ්ඩපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

2. **දණ්ඩො** නාම: මජ්ඣිමස්ස පුරිසස්ස චතුහත්ථො දණ්ඩො. තතො උක්කට්ඨො අදණ්ඩො, ඔමකො අදණ්ඩො.

න දණ්ඩපාණිස්ස අගිලානස්ස ධම්මො දෙසෙතබ්බො. යො අනාදරියං පටිච්ච දණ්ඩපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසෙති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච –පෙ– ආදිකම්මිකස්සාති.

**අට්ඨමසික්ඛාපදං.**

---

1. කුක්කුච්චායන්ති – මජ්ඣං.

2. එසමයෙහි වනාහි භික්ෂූහු සත්ගත් අත් ඇති ගිලන්හට දහම් දෙසන්නට කුකුසනුවෝ නො දෙසත්. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රියයෝ සත්ගත් අත් ඇති ගිලන්හට දහම් නො දෙසූහු"දැ යි. භික්ෂූහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්ත්තිශබ්දය) ඇසූහු මැයි. එකල්හි ඒ භික්ෂූහු තෙල කරුණ භාග්‍යවතුන්හට දන්වූහු. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙ කරුණෙහි ලා මෙ අවසරයෙහි ලා දැහැමි කථා කොට මහණුන් ඇමැතූසේකැ. "මහණෙනි, සත්ගත් අත් ඇති ගිලන්හට දහම් දෙසන්නට අනුදනිමි." මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**සත්ගත් අත් ඇති නො ගිලන්හට දහම් නො දෙසන්නෙමි යි හික්මියැ යුතු'යි.**

3. **ඡත්ත** නම්: මඩුලුබැඳි ලහබැඳි සේසත යැ කළාල්සත යැ පත්සතැ යි සත් තුනෙකි.

ධම්ම නම්: බුද්ධභාෂිත යැ ශ්‍රාවකභාෂිත යැ ඍෂිභාෂිත යැ දෙවභාෂිත යැ අර්ථොපසංහිත යැ ධර්මොපසංහිත යි.

දෙසෙය්‍යා: පදයෙන් දෙසා නම් පෙදෙහි පෙදෙහි දුකුළා ඇවැත් වෙයි, අක්ෂරයෙන් දෙසා නම් අකුරෙහි අකුරෙහි දුකුළා ඇවැත් වේ.

සත්ගත් අත් ඇති නො ගිලන්හට දහම් නො දෙසිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස සත්ගත් අත් ඇති නො ගිලන් හට දහම් දෙසා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට ගිලනහුට ඇවැත් නැති. ආපදයෙහි, උම්මත්තකයහට ආදිකම්මික හට ඇවැත් නැති.

**සප්තම ශික්ෂාපදයි.**

## 8. 6. 8

1. ශ්‍රාවස්තිනිදන යි – එසමයෙහි වනාහි සවග මහණෝ දඬුගත් අත් ඇත්තාහට දහම් දෙසත් ...

**දඬුගත් අත් ඇති නො ගිලන්හට දහම් නො දෙසන්නෙමි යි හික්මියැ යුතු'යි.**

2. **දණ්ඩ** නම්: බලමැදුම් පිරිමියෙකුගේ සිවුරියන් පමණ ඇති දඬු යි. ඉන් උකැටි වූයේ නො දඬ යි. ඔමු වූයේ නො දඬ යි.

දඬුගත් අත්ඇති නො ගිලන්හට දහම් නො දෙසිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස දඬුගත් අත් ඇති නො ගිලන්හට දහම් දෙසා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට ... ආදිකම්මිකයහට ඇවැත් නැති.

**අෂ්ටම ශික්ෂාපදයි.**

## 8. 6. 9

1. සාවත්ථිනිදානං – තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ සත්ථපාණිස්ස ධම්මං දෙසෙන්ති –පෙ–

**න සත්ථපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

2. **සත්ථං** නාම: එකතොධාරං උභතොධාරං පහරණං.

න සත්ථපාණිස්ස අගිලානස්ස ධම්මො දෙසෙතබ්බො. යො අනාදරියං පටිච්ච සත්ථපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසෙති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච –පෙ– ආදිකම්මිකස්සාති.

**නවමසික්ඛාපදං.**

## 8. 6. 10

සාවත්ථිනිදානං — තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ආයුධපාණිස්ස[1] ධම්මං දෙසෙන්ති –පෙ–

**න ආයුධපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

2. **ආයුධං** නාම: චාපො කොදණ්ඩො.

න ආයුධපාණිස්ස අගිලානස්ස ධම්මො දෙසෙතබ්බො. යො අනාදරියං පටිච්ච ආයුධපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසෙති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, ආපදාසු, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**දසමසික්ඛාපදං.**

**සුරුසුරුවග්ගො ඡට්ඨො**

1. ආවුධපාණිස්ස, මජසං

## 8. 6. 9

1. ශ්‍රාවස්තිනිදාන යි – එසමයෙහි වනාහි සවග මහණෝ කඩු කාල්ගත් අත් ඇත්තාහට දහම් දෙසත් ...

**කඩුකාල් ආදි ශස්ත්‍ර ගත් අත් ඇති නො ගිලන්හට දහම් නො දෙසන්නෙමි යි හික්මියැ යුතු'යි.**

2. **සත්ථ** නම්: එක් පසින් මුවාත ඇති දෙපසින් මුවාත ඇති අවි යැ.

කඩුකාල් ආදි ශස්ත්‍ර ගත් අත් ඇති නො ගිලන්හට දහම් නො දෙසිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස කඩුකාල් ආදි ශස්ත්‍ර ගත් අත් ඇති නො ගිලන්හට දහම් දෙසා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට ... ආදිකම්මිකයහට ඇවැත් නැති.

### නවම ශික්ෂාපදයි.

## 8. 6. 10

1. ශ්‍රාවස්තිනිදාන යි – එසමයෙහි වනාහි සවග මහණෝ අවිගත් අත් ඇති නො ගිලන්හට දහම් දෙසත් ...

**අවිගත් අත් ඇති නො ගිලන්හට දහම් නො දෙසන්නෙමි යි හික්මියැ යුතු'යි.**

2. **ආයුධ** නම්: දුනු යැ දුනුවෙසෙස් යැ.

අවිගත් අත් ඇති නො ගිලන්හට දහම් නො දෙසියයුතු යි. යමෙක් අනාදරිය පිණිස අවිගත් අත් ඇති නො ගිලන්හට දහම් දෙසා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට ගිලනහුට ආපදයෙහි ඇවැත් නැති. උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

### දශම ශික්ෂාපදයි.

### සවන සුරුසුරු වර්ග යි.

## 8. 7. 1

1. තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ පාදුකාරුළ්හස්ස ධම්මං දෙසෙන්ති. -පෙ-

**න පාදුකාරුළ්හස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛාකරණීයා'ති.**

2. න පාදුකාරුළ්හස්ස අගිලානස්ස ධම්මො දෙසෙතබ්බො, යො අනාදරියං පටිච්ච අක්කන්තස්ස වා පටිමුක්කස්ස වා ඔමුක්කස්ස වා අගිලානස්ස ධම්මං දෙසෙති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච -පෙ- ආදිකම්මිකස්සාති.

**පඨමසික්ඛාපදං.**

## 8. 7. 2

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උපාහනාරුළ්හස්ස ධම්මං දෙසෙන්ති. -පෙ-

**න උපාහනාරුළ්හස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

2. න උපාහනාරුළ්හස්ස අගිලානස්ස ධම්මො දෙසෙතබ්බො. යො අනාදරියං පටිච්ච අක්කන්තස්ස වා පටිමුක්කස්ස වා ඔමුක්කස්ස වා අගිලානස්ස ධම්මං දෙසෙති ආපත්ති දුක්කටස්ස.

3. **අනාපත්ති:** අසඤ්චිච්ච -පෙ- ආදිකම්මිකස්සාති.

**දුතියසික්ඛාපදං.**

## 8. 7. 3

1. සාවත්ථිනිදානං- තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ යානගතස්ස ධම්මං දෙසෙන්ති. -පෙ-

**න යානගතස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

2. **යානං** නාම: වය්හං රථො සකටං සන්දමානිකා සිවිකා පාටඞ්කී.

න යානගතස්ස අගිලානස්ස ධම්මො දෙසෙතබ්බො. යො අනාදරියං පටිච්ච යානගතස්ස අගිලානස්ස ධම්මං දෙසෙති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච -පෙ- ආදිකම්මිකස්සාති.

**තතියසික්ඛාපදං.**

## 8. 7. 1

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජේතවන නම් අනේපිඬු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි සවග මහණෝ පයැ ලූ මිරිවැඩි ඇත්තාහට දහම් දෙසති ...

**පයැ ලූ මිරිවැඩි ඇති නො ගිලන්හට දහම් නො දෙසන්නෙමි යි හික්මියැ යුතු'යි.**

2. පයැ ලූ මිරිවැඩි ඇති නො ගිලන්හට දහම් නො දෙසිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස ඇක්මවූ හෝ ලාසිටී හෝ අඩක් ලාසිටී හෝ නො ගිලන්හට දහම් දෙසා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට ... ආදිකම්මිකයහට ඇවැත් නැති.

**ප්‍රථම ශික්ෂාපදයි.**

## 8. 7. 2

1 ශ්‍රාවස්තිනිදන යි- එසමයෙහි වනාහි සවග මහණෝ පයැ ලූ වහන් ඇත්තාහට දහම් දෙසත් ...

**පයැ ලූ වහන් ඇති නො ගිලන්හට දහම් නො දෙසන්නෙමි යි හික්මියැ යුතු'යි.**

2. පයැ ලූ වහන් ඇති නො ගිලන්හට දහම් නො දෙසිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස ඇක්මවූ හෝ ලාසිටී හෝ අඩක් ලාසිටී හෝ නො ගිලන්හට දහම් දෙසා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට ... ආදිකම්මිකයහට ඇවැත් නැති.

**ද්විතීය ශික්ෂාපදයි.**

## 8. 7. 3

1. ශ්‍රාවස්තිනිදන යි- එසමයෙහි වනාහි සවග මහණෝ යානයෙහි හුන්නාහට දහම් දෙසති ...

**යානයෙහි හුන්නා වූ නො ගිලන්හට දහම් නො දෙසන්නෙමි යි හික්මියැ යුතු'යි.**

2. යාන නම්: වය්හ යැ රථ යැ ශකට යැ ස්‍යන්දමානිකා යැ සිවිකා යැ පාටඞකිය යි.

යානයෙහි හුන්නා වූ නො ගිලන්හට දහම් නො දෙසිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස යානයෙහි හුන්නා වූ නො ගිලන් හට දහම් දෙසා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට ... ආදිකම්මිකයහට ඇවැත් නැති.

**තෘතීය ශික්ෂාපදයි.**

## 8. 7. 4

1. සාවත්ථිනිදානං – තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛු සයනගතස්ස ධම්මං දෙසෙන්ති –පෙ–

**න සයනගතස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

2. න සයනගතස්ස අගිලානස්ස ධම්මො දෙසෙතබ්බො. යො අනාදරියං පටිච්ච අන්තමසො ඡමායපි නිපන්නස්ස අගිලානස්ස ධම්මං දෙසෙති ආපත්ති දුක්කටස්ස.

3. **අනාපත්ති:** අසඤ්චිච්ච –පෙ– ආදිකම්මිකස්සාති.

**චතුත්ථසික්ඛාපදං.**

## 8. 7. 5

1. සාවත්ථිනිදානං – තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛු පල්ලත්ථිකාය නිසින්නස්ස ධම්මං දෙසෙන්ති –පෙ–

**න පල්ලත්ථිකාය නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

2. න පල්ලත්ථිකාය නිසින්නස්ස අගිලානස්ස ධම්මො දෙසෙතබ්බො යො අනාදරියං පටිච්ච හත්ථපල්ලත්ථිකාය වා දුස්සපල්ලත්ථිකාය වා නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසෙති ආපත්ති දුක්කටස්ස.

3. **අනාපත්ති:** අසඤ්චිච්ච –පෙ– ආදිකම්මිකස්සාති.

**පඤ්චමසික්ඛාපදං.**

## 8. 7. 6

1. සාවත්ථිනිදානං – තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛු වෙඨිතසීසස්ස ධම්මං දෙසෙන්ති –පෙ–

**න වෙඨිතසීසස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

2. **වෙඨිතසීසො** නාම; කෙසන්තං න දස්සාපෙත්වා වෙඨිතො හොති.

න වෙඨිතසීසස්ස අගිලානස්ස ධම්මො දෙසෙතබ්බො. යො අනාදරියං පටිච්ච වෙඨිතසීසස්ස අගිලානස්ස ධම්මං දෙසෙති, ආපත්ති දුක්කටස්ස;

**අනාපත්ති:** අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, කෙසන්තං විවරාපෙත්වා දෙසෙති, ආපදාසු උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**ඡට්ඨසික්ඛාපදං.**

## 8. 7. 4

1. ශ්‍රාවස්තිනිදාන යි – එසමයෙහි ඡබ්බග්ගිය මහණෝ යහන්හි හොත්තාහට දහම් දෙසත්....

**යහන්හි හොත්තා වූ නො ගිලන්හට දහම් නො දෙසන්නෙමි යි හික්මියැ යුතු'යි.**

2. යහනෙහි හොත්තා වූ නො ගිලන්හට දහම් නො දෙසිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස යටත් පිරිසෙයින් බිමෙහි දූ හොත්තා වූ නො ගිලන්හට දහම් දෙසා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට... ආදිකම්මිකයහට ඇවැත් නැති.

**චතුර්ථ ශික්ෂාපදයි.**

## 8. 7. 5

1. ශ්‍රාවස්තිනිදාන යි – එසමයෙහි ඡබ්බග්ගිය මහණෝ අකවටු අවුළුවා හුන්නාහට දහම් දෙසත්....

**අකවටු අවුළුවා හුන්නා වූ නො ගිලන්හට දහම් නො දෙසන්නෙමියි හික්මියැ යුතු යැ'යි.**

2. අකවටු අවුළුවා හුන්නා වූ නො ගිලන්හට දහම් නො දෙසිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස අත්අකවටුවෙන් හෝ වත්අකවටුවෙන් හෝ හුන්නා වූ නොගිලන්හට දහම් දෙසා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට.... ආදිකම්මිකයහට ඇවැත් නැති.

**පඤ්චම ශික්ෂාපදයි.**

## 8. 7. 6

1. ශ්‍රාවස්තිනිදාන යි – එසමයෙහි ඡබ්බග්ගිය මහණෝ හිස වෙළා සිටියහුට දහම් දෙසත්....

**හිස වෙළා සිටි නො ගිලන්හට දහම් නො දෙසන්නෙමි යි හික්මියැ යුතු'යි.**

2. වෙඨිතසීස නම්: කෙස්කොන් නො දක්වාවෙළන ලදුයේ වෙයි.

හිස වෙළා සිටි නො ගිලන්හට දහම් නො දෙසිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස හිස වෙළා සිටි නොගිලන්හට දහම් දෙසා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට ගිලනහුට කෙස්කොන් විවරවා දෙසා නම් ඇවැත් නැති, ආපදයෙහි, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**ෂෂ්ඨ ශික්ෂාපදයි.**

## 8. 7. 7

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ඔගුණ්ඨිතසීසස්ස ධම්මං දෙසෙන්ති -පෙ-

**න ඔගුණ්ඨිතසීසස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

2. **ඔගුණ්ඨිතසීසො** නාම: සසීසං පාරුතො වුච්චති.

3. න ඔගුණ්ඨිතසීසස්ස අගිලානස්ස ධම්මො දෙසෙතබ්බො. යො අනාදරියං පටිච්ච ඔගුණ්ඨිතසීසස්ස අගිලානස්ස ධම්මං දෙසෙති ආපත්ති **දුක්කටස්ස.**

**අනාපත්ති:** අසඤ්චිච්ච. අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, සීසං විවරාපෙත්වා දෙසෙති, ආපදාසු උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**සත්තමසික්ඛාපදං.**

## 8. 7. 8

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ඡමාය නිසීදිත්වා ආසනෙ නිසින්නස්ස ධම්මං දෙසෙන්ති. -පෙ-

**න ඡමාය නිසීදිත්වා ආසනෙ නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

2. න ඡමාය නිසීදිත්වා ආසනෙ නිසින්නස්ස අගිලානස්ස ධම්මො දෙසෙතබ්බො. යො අනාදරියං පටිච්ච ඡමාය නිසීදිත්වා ආසනෙ නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසෙති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච - පෙ- ආදිකම්මිකස්සාති.

**අට්ඨමසික්ඛාපදං.**

## 8. 7. 9

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ නීචෙ ආසනෙ නිසීදිත්වා උච්චෙ ආසනෙ නිසින්නස්ස ධම්මං දෙසෙන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති. "කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ නීචෙ ආසනෙ නිසීදිත්වා උච්චෙ ආසනෙ නිසින්නස්ස ධම්මං දෙසෙස්සන්තී"ති. -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ නීචෙ ආසනෙ නිසීදිත්වා උච්චෙ ආසනෙ නිසින්නස්ස ධම්මං දෙසෙථාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා. -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා නීචෙ ආසනෙ නිසීදිත්වා උච්චෙ ආසනෙ නිසින්නස්ස ධම්මං දෙසෙස්සථ. නෙතං මොඝපුරිසා අප්පසන්නානං වා පසාදය -පෙ- විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි.

## 8. 7. 7

1. ශ්‍රාවස්තිනිදාන යි— එසමයෙහි ෂඩ්වර්ගික මහණෝ හිස වසා පෙරෙවියහට දහම් දෙසත්....

**හිස වසා පෙරෙවි නො ගිලන්හට දහම් නො දෙසන්නෙමි යි හික්මියැ යුතු'යි.**

2. ඔගුණ්ඨිතසීස නම්: හිස සහිත පෙරෙවියේ කියනු ලැබෙයි.

හිස වසා පෙරෙවි නො ගිලන්හට දහම් නො දෙසිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස හිස වසා පෙරෙවි නො ගිලන්හට දහම් දෙසා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට ගිලනහුට හිස විවර කරවා දෙසා නම්, ඇවැත් නැති. ආපදායෙහි, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**සප්තම ශික්ෂාපද යි.**

## 8. 7. 8

1. ශ්‍රාවස්තිනිදාන යි— එසමයෙහි ෂඩ්වර්ගික මහණෝ බිමෙහි හිඳ අස්නෙහි හුන්නහුට දහම් දෙසත්....

**බිමැ හිඳ අස්නෙහි හුන්නා වූ නො ගිලන්හට දහම් නො දෙසන්-නෙමි යි හික්මියැ යුතු'යි.**

2. බිමැ හිඳ අස්නෙහි හුන්නා වූ නො ගිලන්හට දහම් නො දෙසියයුතු යි. යමෙක් අනාදරිය පිණිස බිමැ හිඳ අස්නෙහි හුන්නා වූ නො ගිලන්හට දහම් දෙසා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට ... ආදිකම්මිකයහට ඇවැත් නැති.

**අෂ්ටම ශික්ෂාපද යි.**

## 8. 7. 9

1. ශ්‍රාවස්තිනිදාන යි - එසමයෙහි ෂඩ්වර්ගික මහණෝ මිටි අස්නෙහි හිඳ උස් අස්නෙහි හුන්නහුට දහම් දෙසත්, යම් ඒ භික්ෂු කෙනෙක් අපිස්වූවෝ.... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ෂඩ්වර්ගික මහණෝ මිටි අස්නෙහි හිඳ උස් අස්නෙහි හුන්නහුට දහම් දෙසුහු" ද යි. ... සැබෑ ද මහණෙනි, තෙපි මිටි අස්නෙහි හිඳ උස් අස්නෙහි හුන්නහුට දහම් දෙසවු ද යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ ... කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි මිටි අස්නෙහි හිඳ උස් අස්නෙහි හුන්නහුට දහම් දෙසවු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි. ... ගරහා දැහැමි කථා කොට මහණුන් ඇමතූහු.

2. භූතපුබ්බං භික්ඛවෙ බාරාණසියං අඤ්ඤතරස්ස ඡපකස්ස පජාපතී ගබ්භිනී අහොසි. අථ ඛො භික්ඛවෙ සා ඡපකී තං ඡපකං එතදවොච. ගබ්භිනීම්හි අය්‍යපුත්ත ඉච්ඡාමි අම්බං ඛාදිතු''න්ති. නත්ථි අම්බො[1] අකාලො අම්බස්සාති. සචාහං[2] න ලභිස්සාමි මරිස්සාමීති. තෙන ඛො පන සමයෙන රඤ්ඤො අම්බො ධුවඵලො හොති. අථ ඛො භික්ඛවෙ සො ඡපකො යෙන සො අම්බො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා තං අම්බං අභිරුහිත්වා නිලීනො අච්ඡි.

3. අථ ඛො භික්ඛවෙ රාජා පුරොහිතෙන බ්‍රාහ්මණෙන සද්ධිං යෙන සො අම්බො තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා උච්චෙ ආසනෙ නිසීදිත්වා මන්තං පරියාපුණාති. අථ ඛො භික්ඛවෙ තස්ස ඡපකස්ස එතදහොසි. යාව අධම්මිකො අයං රාජා යත්‍ර හි නාම උච්චෙ ආසනෙ නිසීදිත්වා මන්තං පරියාපුණිස්සති, අයඤ්ච බ්‍රාහ්මණො අධම්මිකො යත්‍ර හි නාම නීචෙ ආසනෙ නිසීදිත්වා උච්චෙ ආසනෙ නිසින්නස්ස මන්තං වාචෙස්සති. අහඤ්චම්හි අධම්මිකො යොහං ඉත්ථියා කාරණා රඤ්ඤො අම්බං අවහරාමි. සබ්බමිදං චමරිගතන්ති[3] තත්ථෙව පරිපති.

“උභො අත්ථං න ජානන්ති උභො ධම්මං න පස්සරෙ,
යො චායං මන්තං වාචෙති යො චාධම්මෙන'ධීයති.

සාලීනං ඔදනො භුත්තො සුචිමංසූපසෙචනො
තස්මා ධම්මෙ න වත්තාමි ධම්මො අරියෙහි වණ්ණිතො.

ධිරත්ථු තං ධනලාභං යසලාභඤ්ච බ්‍රාහ්මණ,
යා වුත්ති විනිපාතෙන අධම්මචරණෙන වා.

පරිබ්බජ මහාබ්‍රහ්මෙ පචන්තඤ්ඤෙපි පාණිනො
මා ත්වං අධම්මො ආචරිතො අස්මා කුම්භමිවාභිදු''ති.

4. තදපි මෙ භික්ඛවෙ අමනාපා නීචෙ ආසනෙ නිසීදිත්වා උච්චෙ ආසනෙ නිසින්නස්ස මන්තං වාචෙතුං. කිමඞ්ග පන එතරහි න අමනාපා භවිස්සති නීචෙ ආසනෙ නිසීදිත්වා උච්චෙ ආසනෙ නිසින්නස්ස ධම්මං දෙසෙතුං. නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**න නීචෙ ආසනෙ නිසීදිත්වා උච්චෙ ආසනෙ නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

5. න නීචෙ ආසනෙ නිසීදිත්වා උච්චෙ ආසනෙ නිසින්නස්ස අගිලානස්ස ධම්මො දෙසෙතබ්බො. යො අනාදරියං පටිච්ච නීචෙ ආසනෙ නිසීදිත්වා උච්චෙ ආසනෙ නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසෙති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච -පෙ- ආදිකම්මිකස්සාති.

**නවමසික්ඛාපදං.**

1. අම්බං - මජ්ඣං,
2. සචෙ - මජ්ඣං
3. චරිමං කතං - මජ්ඣං.

2. මහණෙනි, පෙර වූවක් කියමි: බරණැස් නුවර එක්තරා සැඩොලක්හුගේ අඹුව ගැබිනි වූ යැ. එකල්හි මහණෙනි, ඒ සැඩොලී තොමෝ ඒ සැඩොල්හට මෙය කිවු යැ. 'හිමිපුත, ගැබිනියක් වෙමි, අඹ කන්නට කැමැත්තෙමු' යි, අඹ නැති. අඹ පිළිබඳ කාලය නො වෙයි, ඉදින් මම නො ලබම් නම් මැරෙමි යි. එසමයෙහි වනාහි රජහුගේ අඹරුක නිතිපල ඇතියේ වෙයි. එකල්හි මහණෙනි, ඒ සැඩොල් තෙමේ ඒ අඹරුක වෙතැ එළඹියේ යැ. එළැඹැ ඒ අඹරුකට නැඟ සැඟවී හුන්නේ යි.

3. ඉක්බිති මහණෙනි, රජ තෙමේ පෙරෙවි බමුණා සමඟ ඒ අඹරුක වෙතැ එළැඹියේ යැ. එළැඹැ උස් අස්නෙහි හිඳ මන්ත්‍ර පිරිවහයි. එකල්හි මහණෙනි, ඒ සැඩොල්හට මෙ සිත විය. යමෙක් උස් අස්නෙහි හිඳ මන්ත්‍ර පිරිවහා නම් මේ රජ තෙමේ කැලැ මැ නො දැහැමි යැ. යමෙක් මිටි අස්නෙහි හිඳ උස් අස්නෙහි හුන්නාහට මන්ත්‍ර හදරවා නම් මේ බමුණු තෙමේත් නො දැහැමි යැ. යම්බඳු මම අඹුවගේ කරුණෙන් රජහුගේ අඹ සොරකම් කරම් නම් ඒ මමත් නො දැහැමි වෙමි, මේ මුළු ලොව මැ නො දැහැමිකමින් අවුල් වී යැ යි එහි මැ වැටුණේ යි.

යමෙකුත් මොහුට මන්ත්‍ර හදරවා ද, යමෙකුත් අධර්මයෙන් හදරා ද මේ දෙදෙන මැ අර්ථය නො දනිති, ධර්මය නො බලත්.

(මා විසින් රජහුගේ) පිරිසුදු රසමසවුළෙන් යුතු හැල්බත වළඳන ලදි. එහෙයින් (බඩවියත තකා) ධර්මයෙහි නො පවතිමි. මේ ධර්මය ආර්‍යයන් විසින් පසස්නා ලද යි (දනිමි.)

බමුණ, (මෙසේ නො දැහැමින් ලත්) තාගේ යශොලාභයට ද ධනලාභයට ද (මතු) අවාහි හෙන සේ අධර්මචරණයෙන් (දුන්) පැවැති දිවෙලට ද නිඳු වේවා.

මහබමුණ, (මෙදෙසින්) නැඟී යා, සෙසු සත්තු ද පිසති, (කති.) හැසිරෙන ලද මේ අධර්මය තෙමේ තා ගලින් කළයක් මෙන් නහමක් බිඳීවා.

4. එද දු මහණෙනි, මිටි අස්නෙහි හිඳ උස් අස්නෙහි හුන්නහුට මන්ත්‍ර හදරවනු මට මනාප නො වෙයි. මෙකල්හි වනාහි මිටි අස්නෙහි හිඳ උස් අස්නෙහි හුන්නහුට දහම් දෙසනු මනාප නො වනු කියනුම කිම? මහණෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි. ... මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**මිටි අස්නෙහි හිඳ උස් අස්නෙහි හුන්නා වූ නො ගිලන් හට දහම් නො දෙසන්නෙමියි හික්මියැ යුතු'යි.**

5. මිටි අස්නෙහි හිඳ උස් අස්නෙහි හුන්නා වූ නො ගිලන්හට දහම් නො දෙසිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස මිටි අස්නෙහි හිඳ උස් අස්නෙහි හුන්නා වූ නො ගිලන්හට දහම් දෙසා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට. ... ආදිකම්මිකයහට ඇවැත් නැති.

**නවම ශික්ෂාපදයි.**

## 8. 7. 10

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ඨිතා නිසින්නස්ස ධම්මං දෙසෙන්ති. -පෙ-

**න ඨිතො නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

2. න ඨිතෙන නිසින්නස්ස අගිලානස්ස ධම්මො දෙසෙතබ්බො. යො අනාදරියං පටිච්ච ඨිතො නිසින්නස්ස අගිලානස්ස ධම්මං දෙසෙති ආපත්ති දුක්කටස්ස.

3. **අනාපත්ති:** අසඤ්චිච්ච -පෙ- ආදිකම්මිකස්සාති.

**දසමසික්ඛාපදං.**

## 8. 7. 11

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ පච්ඡතො ගච්ඡන්තා පුරතො ගච්ඡන්තස්ස ධම්මං දෙසෙන්ති. -පෙ-

**න පච්ඡතො ගච්ඡන්තො පුරතො ගච්ඡන්තස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

2. න පච්ඡතො ගච්ඡන්තෙන පුරතො ගච්ඡන්තස්ස අගිලානස්ස ධම්මො දෙසෙතබ්බො. යො අනාදරියං පටිච්ච පච්ඡතො ගච්ඡන්තො පුරතො ගච්ඡන්තස්ස අගිලානස්ස ධම්මං දෙසෙති ආපත්ති දුක්කටස්ස.

3. **අනාපත්ති:** අසඤ්චිච්ච -පෙ- ආදිකම්මිකස්සාති.

**එකාදසමසික්ඛාපදං.**

## 8. 7. 12

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ උප්පථෙන ගච්ඡන්තා පථෙන ගච්ඡන්තස්ස ධම්මං දෙසෙන්ති. -පෙ-

**න උප්පථෙන ගච්ඡන්තො පථෙන ගච්ඡන්තස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

2. න උප්පථෙන ගච්ඡන්තෙන පථෙන ගච්ඡන්තස්ස අගිලානස්ස ධම්මො දෙසෙතබ්බො. යො අනාදරියං පටිච්ච උප්පථෙන ගච්ඡන්තො පථෙන ගච්ඡන්තස්ස අගිලානස්ස ධම්මං දෙසෙති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච -පෙ- ආදිකම්මිකස්සාති.

**ද්වාදසමසික්ඛාපදං.**

## 8. 7. 10

1. ශ්‍රාවස්තිනිදාන යි — එසමයෙහි ෂඩ්වර්ගීය භික්ෂූහු සිටියාහු හුන්නහුට දහම් දෙසත්....

**සිටියෙම හුන්නා වූ නො ගිලන්හට දහම් නො දෙසන්නෙමි යි හික්මියැ යුතු'යි.**

2. සිටියහු විසින් හුන්නා වූ නො ගිලන්හට දහම් නො දෙසිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස සිටියේ හුන්නා වූ නො ගිලන්හට දහම් දෙසා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට.... ආදිකම්මිකයහට ඇවැත් නැති.

**දශම ශික්ෂාපද යි.**

## 8. 7. 11

1. ශ්‍රාවස්තිනිදාන යි — එසමයෙහි ෂඩ්වර්ගීය භික්ෂූහු පසු වැ යන්නාහු පෙරටු වැ යන්නහුට දහම් දෙසත්....

**පසු වැ යන්නෙම පෙරටු වැ යන්නා වූ නො ගිලන්හට දහම් නො දෙසන්නෙමි යි හික්මියැ යුතු'යි.**

2. පසු වැ යන්නහු විසින් පෙරටු වැ යන්නා වූ නො ගිලන්හට දහම් නො දෙසිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස පසු වැ යන්නේ පෙරටු වැ යන්නා වූ නො ගිලන්හට දහම් දෙසා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට. ... ආදිකම්මිකයහට ඇවැත් නැති.

**එකාදශ ශික්ෂාපද යි.**

## 8. 7. 12

1. ශ්‍රාවස්තිනිදාන යි — එසමයෙහි ෂඩ්වර්ගීය භික්ෂූහු නො මඟින් යන්නාහු මඟින් යන්නහුට දහම් දෙසත්....

**නො මඟින් යන්නෙම මඟින් යන්නා වූ නො ගිලන්හට දහම් නො දෙසන්නෙමි යි හික්මියැ යුතු'යි.**

2. නො මඟින් යන්නහු විසින් මඟින් යන්නා වූ නො ගිලන්හට දහම් නො දෙසිය යුතු යි. යමෙක් අනාදරිය පිණිස නො මඟින් යන්නේ මඟින් යන්නා වූ නො ගිලන්හට දහම් දෙසා නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට.... ආදිකම්මිකයහට ඇවැත් නැති.

**ද්වාදශ ශික්ෂාපද යි.**

## 8. 7. 13

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛු යීතා උච්චාරම්පි පස්සාවම්පි කරොන්ති -පෙ-

**න ථිතො අගිලානො උච්චාරං වා පස්සාවං වා කරිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

2. න ඨිතෙන අගිලානෙන උච්චාරො වා පස්සාවො වා කාතබ්බො. යො අනාදරියං පටිච්ච ඨිතො අගිලානො උච්චාරං වා පස්සාවං වා කරොති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති**: අසඤ්චිච්ච -පෙ- ආදිකම්මිකස්සාති.

**තෙරසමසික්ඛාපදං.**

## 8. 7. 14

1. සාවත්ථිනිදානං - තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛු හරිතෙ උච්චාරම්පි පස්සාවම්පි ඛෙළම්පි කරොන්ති -පෙ-

**න හරිතෙ අගිලානො උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

2. න හරිතෙ අගිලානෙන උච්චාරො වා පස්සාවො වා ඛෙළො වා කාතබ්බො. යො අනාදරියං පටිච්ච හරිතෙ අගිලානො උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති**: අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස, අප්පහරිතෙ කතො හරිතං ඔත්ථරති, ආපදාසු, උම්මත්තකස්ස, ආදිකම්මිකස්සාති.

**චුද්දසමසික්ඛාපදං.**

## 8. 7. 15

1. තෙන සමයෙන බුද්ධො භගවා **සාවත්ථියං** විහරති **ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස** ආරාමෙ. තෙන ඛො පන සමයෙන **ඡබ්බග්ගියා** භික්ඛු උදකෙ උච්චාරම්පි පස්සාවම්පි ඛෙළම්පි කරොන්ති, මනුස්සා උජ්ඣායන්ති ඛියන්ති විපාචෙන්ති. "කථං හි නාම සමණා සක්‍යපුත්තියා උදකෙ උච්චාරම්පි පස්සාවම්පි ඛෙළම්පි කරිස්සන්ති සෙය්‍යථාපි ගිහී කාමභොගිනො''ති.

## 8. 7. 13

1. ශ්‍රාවස්තිනිදාන යි— එසමයෙහි සවග මහණෝ සිටියාහු මහවටන ද සුළුවටන ද කෙරෙත්....

**සිටියෙම නො ගිලන් වැ මහවටන් හෝ සුළුවටන් හෝ නො කරන්නෙමි යි හික්මියැ යුතු'යි.**

2. සිටියා වූ නො ගිලන්හු විසින් මහවටන් හෝ සුළුවටන් හෝ නො කළ යුතු යි. යමෙක් අනාදරිය පිණිස සිටියේ නො ගිලන් වැ මහවටන් හෝ සුළුවටන් හෝ කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට.... ආදිකම්මිකයහට ඇවැත් නැති.

**ත්‍රයොදශ ශික්ෂාපද යි.**

## 8. 7. 14

1. ශ්‍රාවස්තිනිදාන යි — එසමයෙහි වනාහි සවග මහණෝ තිල් තණ ආදියෙහි මහදියටනු ද සුළුදියටනු ද කෙළ ගැසීම ද කෙරෙත්....

**නො ගිලන් වූයෙම තිල්තණ ආදියෙහි මහදියටනු හෝ සුළුදියටනු හෝ කෙළ ගැසීම හෝ නො කරන්නෙමි යි හික්මියැ යුතු'යි.**

2. නො ගිලන්හු විසින් තිල් තණආදියෙහි මහදියටනු හෝ සුළුදියටනු හෝ කෙළ ගැසීම හෝ නො කළ යුතු යි. යමෙක් අනාදරිය පිණිස නො ගිලන් වැ තිල් තණ ආදියෙහි මහදියටනු හෝ සුළුදියටනු හෝ කෙළ ගැසීම හෝ කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

3. නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට ගිලනහුට නො තිල්තණ ආදියෙහි කරන ලද දූයෙක් තිල් තණ වතුරුවා නම්, ආපදයෙහි, උම්මත්තකයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**චතුර්දශ ශික්ෂාපද යි.**

## 8. 7. 15

1. එසමයෙහි භාග්‍යවත් බුදුහු සැවැතැ ජෙතවන නම් අනේපිඩු සිටුහුගේ අරම්හි වැඩැවෙසෙති. එසමයෙහි වනාහි සවග මහණෝ දියෙහි මහදියටනු ද සුළුදියටනු ද කෙළ ගැසීම ද කෙරෙත්. මිනිස්සු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් ශ්‍රමණ ශාක්‍යපුත්‍රියයෝ කාමභොගි ගිහියන් මෙන් දියෙහි මහදියටනු ද සුළුදියටනු ද කෙළ ගැසීම ද කොළෝ "ද යි.

2. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා -පෙ- තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති ''කථං හි නාම ඡබ්බග්ගියා භික්ඛූ උදකෙ උච්චාරම්පි පස්සාවම්පි ඛෙළම්පි කරිස්සන්තී''ති. -පෙ- සච්චං කිර තුම්හෙ භික්ඛවෙ උදකෙ උච්චාරම්පි පස්සාවම්පි ඛෙළම්පි කරොථාති. සච්චං භගවා. විගරහි බුද්ධො භගවා -පෙ- කථං හි නාම තුම්හෙ මොඝපුරිසා උදකෙ උච්චාරම්පි පස්සාවම්පි ඛෙළම්පි කරිස්සථ. නෙතං මොඝපුරිසා අප්ප-සන්නානං වා පසාදාය -පෙ- එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**න උදකෙ උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

එවඤ්චිදං භගවතා භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤත්තං හොති.

3. තෙන ඛො පන සමයෙන ගිලානා භික්ඛූ උදකෙ උච්චාරම්පි පස්සාවම්පි ඛෙළම්පි කාතුං කුක්කුච්චායන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. ''අනුජානාමි භික්ඛවෙ ගිලානෙන භික්ඛුනා උදකෙ උච්චාරම්පි පස්සාවම්පි ඛෙළම්පි කාතුං'' එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ:

**න උදකෙ අගිලානො උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරිස්සාමීති සික්ඛා කරණීයා'ති.**

4. න උදකෙ අගිලානෙන උච්චාරො වා පස්සාවො වා ඛෙළො වා කාතබ්බො. යො අනාදරියං පටිච්ච උදකෙ අගිලානො උච්චාරං වා පස්සාවං වා ඛෙළං වා කරොති ආපත්ති දුක්කටස්ස.

**අනාපත්ති:** අසඤ්චිච්ච, අසතියා, අජානන්තස්ස, ගිලානස්ස. ථලෙ කතො උදකං ඔත්ථරති, ආපදාසු, උම්මත්තකස්ස, ඛිත්තචිත්තස්ස වෙදනාට්ටස්ස, ආදිකම්මිකස්සාති.

**පණ්ණරසම සික්ඛාපදං.**

**පාදුකාවග්ගො සත්තමො**

2. භික්ෂූහු ලමු කොට සිතන නුගුණ පවසන දෙස් පතුරුවන ඒ මිනිසුන්ගේ (අකීර්තිශබ්දය) ඇසූහු. යම් ඒ භික්ෂු කෙනෙක් අපිස්වූවෝ.... ඔහු ලමු කොට සිතති, නුගුණ පවසති, දෙස් පතුරුවත්: "කෙසේ නම් සවග මහණෝ දියෙහි මහදියටනු ද සුළුදියටනු ද කෙළ ගැසීම ද කොළෝ" දූ යි. ... සැබෑ ද මහණෙනි, තෙපි දියෙහි මහදියටනු ද සුළුදියටනු ද කෙළ ගැසීම ද කරවූ දූ යි. සැබැවැ භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවත් බුදුහු ගැරහූ. ... කෙසේ නම් හිස් පුරුෂයෙනි, තෙපි දියෙහි මහදියටනු ද සුළුදියටනු ද කෙළ ගැසීම ද කළහු ද? හිස් පුරුෂයෙනි, මෙය අප්‍රසන්නයන්ගේ ප්‍රසාදය පිණිස හෝ නො වෙයි. ... මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**දියෙහි මහදියටනු හෝ සුළුදියටනු හෝ කෙළගැසීම හෝ නො කරන්නෙමි යි හික්මියැ යුතු'යි.**

මෙසේත් භාග්‍යවතුන් විසින් භික්ෂූන්හට මේ සිකපදය පනවන ලද්දේ වෙයි.

3 එසමයෙහි වනාහි ගිලන් වූ මහණෝ දියෙහි මහදියටනු ද සුළුදියටනු ද කෙළ ගැසීම ද කරන්නට කුකුසත්. භාග්‍යවතුන්හට තෙල කරුණ දන්වූහු. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෙකරුණෙහි ලා මෙඅවසරයෙහි ලා දැහැමි කථා කොට මහණුන් ඇමතූසේක. "මහණෙනි, ගිලන් මහණහු විසින් දියෙහි මහදියටනු ද සුළුදියටනු ද කෙළගැසීම ද කරන්නට අනුදනිමි" මෙසේ ද මහණෙනි, මේ සිකපදය උදෙසවු:

**නො ගිලන්වූයෙම් දියෙහි මහදියටනු හෝ සුළුදියටනු හෝ කෙළ ගැසීම හෝ නො කරන්නෙමි යි හික්මියැ යුතු'යි.**

4. නො ගිලන්හු විසින් දියෙහි මහදියටනු හෝ සුළුදියටනු හෝ කෙළ ගැසීම හෝ නො කළයුතු යි. යමෙක් අනාදරිය පිණිස නො ගිලන් වැ දියෙහි මහදියටනු හෝ සුළුදියටනු හෝ කෙළ ගැසීම හෝ කෙරේ නම් දුකුළා ඇවැත් වේ.

නො සිතා කරන්නහුට නො සිහියෙන් කරන්නහුට නො දන්නහුට ගිලනහුට ගොඩබිමැ කරන ලද දූයෙක් ජලය වතුරුවා නම්, ඇවැත් නැත. ආපදයෙහි, උම්මත්තකයහට ක්ෂිප්තචිත්තයහට වේදනාර්තයහට ආදිකම්මිකයහට ඇවැත් නැති.

**පඤ්චදශ ශික්ෂාපද යි.**

**සත්වන පාදුකාවර්ග යි.**

## උද්දානං

"පරිමණ්ඩලං පටිච්ඡන්නං සුසංවුතොක්ඛිත්තචක්ඛුනා
උක්ඛිත්තුජ්ජග්ඝිකාසද්දෙ තයො චෙව පචාලනා

ඛම්භ ඔගුණ්ඨිතා චෙව කුටිපල්ලත්ථිකාය ච,
සක්කච්චං පත්තසඤ්ඤී ච සමසූපසමතිත්තිකං.

සක්කච්චං පත්තසඤ්ඤී ච සපදාන සමසූපකං-
ථූපතො ච පටිච්ඡන්නං විඤ්ඤත්තුජ්ඣානසඤ්ඤිනා.

න මහන්තං මණ්ඩලං ද්වාරං සබ්බං හත්ථං න බ්‍යාහරෙ,
උක්ඛෙපො ඡෙදනං ගණ්ඩං ධුනං සිත්ථාවකාරකං.

ජිව්හානිච්ඡාරකං චෙව චපුසුරු සුරෙන ච,
හත්ථො පත්තො ච ඔට්ඨො ච සාමිසඤ්ච සසිත්ථකං.

ඡත්තපාණිස්ස සද්ධම්මං න දෙසෙන්ති තථාගතා,
එවමෙව දණ්ඩපාණිස්ස සත්ථආයුධපාණිනං.

පාදුකොපාහනා චෙව යාන සෙය්‍යගතස්ස ච,
පල්ලත්ථිකා නිසින්නස්ස වෙඨිතොගුණ්ඨිතස්ස ච

ඡමා නීචාසනෙ ඨානං පච්ඡතො උප්පථෙන ච.
ඨිතකෙන න කාතබ්බං හරිතෙ උදකම්හි චාති.

## තෙසං වග්ගානං උද්දානං

පරිමණ්ඩලං උජ්ජග්ඝි ඛම්භං සක්කච්චමෙව ච,
කබළ සුරු සුරු චෙව පාදුකෙන ච සත්තමාති.

පඤ්ඤත්තා අතිදෙවෙන ගොතමෙන යසස්සිනා,
සාවකෙ සික්ඛනත්ථාය පඤ්චසත්තති සෙඛියාති

උද්දිට්ඨා ඛො ආයස්මන්තො සෙඛියා ධම්මා. තත්ථායස්මන්තෙ පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා. දුතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා. තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා, පරිසුද්ධෙත්ථායස්මන්තො තස්මා තුණ්හී එවමෙතං ධාරයාමීති.

සෙඛියා

## උද්දානය

පරිමණ්ඩල යැ සුපටිච්ඡන්න යැ සුසංවුත යැ ඔක්ඛිත්තචක්ඛු-සිඛය සමඟ උක්ඛිත්තකාය යැ උජ්ජග්ඝිකාය යැ අප්පසද්ද යැ කායප්පචාලක – බාහුප්පචාලක – සීසප්පචාලක යන තිදෙන ද,

ඛම්භකත යැ ඔගුණ්ඨිත යැ උක්කුටිකාය යැ පල්ලත්ථිකාය-සිඛය සමඟ සක්කච්ච යැ පත්තසඤ්ඤී යැ සමසූපක යැ සම-තිත්තිකය ද,

සක්කච්ච යැ පත්තසඤ්ඤී යැ සපදාන යැ සමසූපක යැ ථූපතො සිඛය ද පටිච්ඡන්න යැ උජ්ඣානසඤ්ඤීසිඛය සමඟ විඤ්ඤත්තිය ද.

නාතිමහන්ත යැ පරිමණ්ඩල යැ මුඛද්වාර යැ සබ්බහත්ථ යැ බ්‍යාහරණ යැ පිණ්ඩුක්ඛේපක යැ කබළාවච්ඡේදක යැ අවගණ්ඩකාරක යැ හත්ථනිද්ධුනක යැ සිත්ථාවකාරකය ද,

ජිව්හානිච්ඡාරක යැ චපුචපුකාරක යැ සුරුසුරුකාරකය සමඟ හත්ථනිල්ලේහක යැ පත්තනිල්ලේහක යැ ඔට්ඨනිල්ලේහක යැ සාමිස යැ සසිත්ථකය ද,

තථාගතවරයෝ ඡත්තපාණියහට සදහම් නො දෙසත්, දණ්ඩ-පාණිහට ද සත්ථපාණිහට ද ආයුධපාණිහට ද මෙසෙයින් මැ නො දෙසත්,

පාදුකා – උපාහනාරූඪයහට ද යාන - සයනගතයහට ද පල්ලත්ථිකා නිසින්නයහට ද වෙඨිත - ඔගුණ්ඨිතසීසයහට ද නො දෙසත්.

බිමැ හා මිටිඅස්නෙහි හුන්නහු විසින් ද සිටියහු විසින් ද පසු වැ යන්නහු විසින් ද නො මඟින් යන්නහු විසින් ද දහම් නො දෙසිය යුතු යැ. නිල්තණ ආදියෙහි හා දියෙහි (මළ මූ ඈ) නො කළ යුතු යි.

### ඒ වර්ගයන්ගේ උද්දානය:

පරිමණ්ඩල යැ උජ්ජග්ඝික යැ ඛම්භකත යැ සක්කච්ච යැ කබළ යැ සුරුසුරු යැ සත්වන පාදුකාවර්ගයෙන් ද යි.

අතිදෙව වූ ගෞතම යශස්වීන් විසින් ශ්‍රාවකයන් හික්මවනු පිණිස පන්සැත්තෑ සෙඛිය ධම්මයෝ පනවන ලදහු යි.

ආයුෂ්මත්නි, සෙඛියා ධම්මයෝ උදෙසන ලදහු. එහි ලා ආයුෂ්මතුන් පුළුවුස්මි, කිම පිරිසුදුවහු ද? දෙවනවටදු පුළුවුස්මි, කිම පිරිසුදුවහු ද? තෙවනවටදු පුළුවුස්මි, කිම පිරිසුදුවහු ද? මෙහි ලා ආයුෂ්මත්හු පිරිසුදුහ. එහෙයින් නිහඬයහ. මෙසේ මෙය දරමි.

**සෙඛියධර්මයෝ යි.**

ඉමෙ ඛො පනායස්මන්තො සත්ත අධිකරණසමථා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.

1. උප්පන්නුප්පන්නානං අධිකරණානං සමථාය වූපසමාය සම්මුඛාවිනයො දාතබ්බො, සතිවිනයො දාතබ්බො, අමූළ්හවිනයො දාතබ්බො, පටිඤ්ඤාය කාරෙතබ්බං, යෙභුය්‍යසිකා, තස්සපාපියසිකා[1], තිණවත්ථාරකොති.

2. උද්දිට්ඨා ඛො ආයස්මන්තො සත්ත අධිකරණසමථා ධම්මා. තත්ථායස්මන්තෙ පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා. දුතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා. තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා. පරිසුද්ධෙත්ථායස්මන්තො තස්මා තුණ්හී එවමෙතං ධාරයාමීති.

### අධිකරණසමථා.

3. උද්දිට්ඨං ඛො ආයස්මන්තො නිදානං, උද්දිට්ඨා චත්තාරො පාරාජිකා ධම්මා. උද්දිට්ඨා තෙරස සඞ්ඝාදිසෙසා ධම්මා. උද්දිට්ඨා දෙව අනියතා ධම්මා. උද්දිට්ඨා තිංස නිස්සග්ගියා පාචිත්තියා ධම්මා. උද්දිට්ඨා දෙව නවුති පාචිත්තියා ධම්මා උද්දිට්ඨා චත්තාරො පාටිදෙසනීයා ධම්මා. උද්දිට්ඨා සෙඛියා ධම්මා. උද්දිට්ඨා සත්ත අධිකරණසමථා ධම්මා. එත්තකං තස්ස භගවතො සුත්තාගතං සුත්තපරියාපන්නං අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡති, තත්ථ සබ්බෙහෙව සමග්ගෙහි සම්මොදමානෙහි අවිවදමානෙහි සික්ඛිතබ්බන්ති.

### භික්ඛුවිභඞ්ගො[2] නිට්ඨිතො.

1. තස්සපාපියසිකා - මජසං.
2. මහාවිභඞ්ගො - මජසං.

ආයුෂ්මත්නි, මේ සප්ත අධිකරණශමථධර්මයෝ උදෙසීමට පැමිණෙත්.

උපනුපන් (විවාදදි) අධිකරණයන්ගේ ශමනය පිණිස ව්‍යුපශමය පිණිස සම්මුඛාවිනය දියයුත්තේ යැ, සතිවිනය දියයුත්තේ යැ, අමූළ්හවිනය දියයුත්තේ යැ, ප්‍රතිඥායෙන් කැරැවිය යුතු යැ, යෙභුය්‍යසිකා යැ, තස්සපාපියාසිකා යැ, තිණවත්ථාරක යි.

ආයුෂ්මත්නි, සප්ත අධිකරණශමථධර්මයෝ උදෙසන ලදහ. එහි ලා ආයුෂ්මතුන් පුළුවුස්මි, කිම පිරිසුදුවහු ද? දෙවනවටද පුළුවුස්මි, කිම පිරිසුදුවහු ද? තෙවනවටද පුළුවුස්මි, කිම පිරිසුදුවහු ද? මෙහි ලා ආයුෂ්මත්හු පිරිසුදුහ. එහෙයින් නිහඬයහ. මෙසේ මෙය දරමි.

අධිකරණශමථයෝ යි.

ආයුෂ්මත්නි, නිදානය උදෙසන ලදි. සතර පාරාජිකධර්මයෝ උදෙසන ලදහ, තෙළෙස් සඞ්ඝාදිසෙස ධර්මයෝ උදෙසන ලදහ. දෙ අනියත ධර්මයෝ උදෙසන ලදහ. තිස් නිස්සග්ගියපාචිත්තිය ධර්මයෝ උදෙසන ලදහ. දෙඅනූ පාචිත්තිය ධර්මයෝ උදෙසන ලදහ. සතර පාටිදෙසනීය ධර්මයෝ උදෙසන ලදහ. සෙඛිය ධර්මයෝ උදෙසන ලදහ. සප්ත අධිකරණසමථ ධර්මයෝ උදෙසන ලදහ. ඒ භාග්‍යවතුන්ගේ සූත්‍රසංඛ්‍යාත භික්ෂුවිභඞ්ගයෙහි ආවා වූ භික්ෂුවිභඞ්ගයට ඇතුළත් වූ මෙතෙක් (සිව) අඩමසක් පාසා උදෙසීමට පැමිණෙයි. සමඟ වූ සතුටු වන විවාද නො කරන හැමදෙනා විසින් මැ එහි ලා හික්මියැ යුතු යි.

භික්ෂුවිභඞ්ගය නිමියේ යි.

# ගාථාදිපාද සූචි


| | |
|---|---|
| අධිචෙතසො අප්පමජ්ජතො | 158 |
| උභො අත්ථං න ජානන්ති | 548 |
| ධිරත්ථු තං ධනලාභං | 548 |
| පරිබ්බජ මහාබ්‍රහ්මෙ | 548 |
| මනාපමෙව භාසෙය්‍ය | 16 |
| සාලීනං ඔදනො භුත්තො | 548 |

# පාචිත්තියපාළි

## සඤ්ඤානාම සූචි


පිටු අංක

අ

අග්ගාළව 56, 100, 106, 142
අචිරවතී 304, 432
අනුරුද්ධ 60, 190
අම්බතිත්ථක 300
අරිට්ඨ 300, 358
ආනන්ද 190, 218
ආලවක 100, 142
ආලවි 56, 100, 106, 142

උ

උදායි 64, 176, 194, 336
උපනන්ද 98, 328, 342
උපාලි 190
උපාලිදාරක 346

ක

කච්චානගොත්ත 18
කටමෝරතිස්ස 190
කණ්ටක 370
කපිලවත්ථු 162
කලන්දකනිවාප 316
කාණ 220
කාණමාතා 220
කාසි 434
කිරපතික 212
කූටාගාරසාලා 212
කොකනද 534
කොකාලික 190
කොසම්බි 56, 110, 138, 298, 380, 530
කොසල 60, 202

ඛ

ඛණ්ඩදෙවිපුත්ත 190

ග

ගොතමගොත්ත 18

පිටු අංක

ඝ

ඝොසිතාරාම 110, 138, 306, 380, 530

ච

චූලනන්ද 190
චූලපන්ථක 158

ඡ

ඡන්න 110, 138, 306, 380
ඡබ්බග්ගියා 14, 52, 90, 128, 132, 146, 162, 168, 180, 184, 200

ජ

ජේතවන 2, 4, 52, 60, 66, 98, 120, 128, 132, 136, 146, 158, 168, 172, 176, 180, 184, 194, 200, 220, 458, 460, 464, 472, 488, 490, 492, 494, 496, 504, 542

ත

තක්කසිලා 14
තපොද 316

ථ

ථුල්ලනන්ද 190

ද

දබ්බමල්ලපුත්ත 116, 412
දේවදත්ත 190, 204

න

නන්ද 460
නන්දිවිසාල 14
නිග්‍රොධාරාම 162, 446, 480

## සඤ්ඤානාම සූචි


පිටු අංක

**ප**

පටියාලොක 224

පසෙනදිකොසල 304

**බ**

බදරිකාරාම 56

බාරාණසී 548

බිම්බිසාර 210, 316

**භ**

භග්ග 312, 534

භෙසකලාවන 312

**ම**

මල්ලිකා 304

මහාකච්චාන 190

මහාකප්පින 190

මහාචුන්ද 190

මහාපජාපතීගොතමී 164

මහාවන 212

මාගධ 316

මිගදාය 312

මෙත්තිය භුම්මජක 116

මොග්ගල්ලාන 190

මොග්ගල්ලාන ගොත්ත 18

**ර**

රාජගහ 116, 190, 204, 224, 268, 316

රාහුල 56, 190

රෙවත 190

පිටු අංක

**ව**

වග්ගුමුදානදී 74

වජ්ජි 74

වාසෙට්ඨගොත්තං 18

විසාඛාමිගාරමාතා 432

වෙසාලි 74, 212, 248

වෙළුවන 116, 190, 204, 316, 468

**ස**

සක්ක 162, 446, 480

සත්තරසවග්ගියාභික්ඛු 124, 132

සමුද්දදත්ත 190

සාකෙත 180, 186, 324

සාගත 298

සාරිපුත්ත 190, 202

සාවත්ථි 2, 14, 52, 60, 68, 98, 120, 124, 128, 132, 136, 146, 158, 168, 172, 176, 180, 184, 194, 200, 220, 458, 460, 464, 472, 488, 490, 492, 494, 496, 504, 542, 552

සුංසුමාරගිර 312, 534

**හ**

හත්ථක සක්‍යපුත්ත 2

# පාචිත්තිය පාළි

## විශෙෂ ශබ්ද සූචි


අ

අකටානුධම්මො 366

අකතකප්පං 326

අක්කොසො 20—44

අක්ඛරක්ඛරාය 366

අකාරකො 354

අග්ගලට්ඨපනාය 140

අග්ගලෙ 326

අගිලානො 202—476—484

අඞ්ගාරකාසූපමා 358

අඞ්ගුලිපතොදකෙන 300

අඞ්ගුලිමුද්දිකා 434

අච්චයො 62

අචෙලකො 254

අජ්ඣාචාරං 344

අජ්ඣාරාමෙ 434

අජ්ඣාවසථෙ 434

අජිනචීරං 246

අජිනක්ඛිපං 246

අඤ්ඤාතියා 446

අඤ්ඤවාදකං 110

අඤ්ඤාණකෙ 388

අඤ්ඤාතිකා 174—178

අට්ඨගරුධම්මා 152

අට්ඨඞ්ගුලපාදකං 448

අට්ඨිකඞ්කලූපමා 358

අඩ්ඪතෙය්‍යමාසා 318

අත්ථවසෙ 4

අනිබද්ධං 16

අතිරෙකද්ධමාසං 32

අතිරෙකද්වත්තිපරියායෙ 140

අද්ධානගමනසමයො 210—320—322

අද්ධානමග්ගං 186

අද්ධිකා 60

අදිට්ඨං 4—6—8—10

අධිකරණසමථං 558

අධිචෙතසො 158

අන්තරඝරං 466—490

අන්තරායිකා 358

අනධිවාසනජාතිකො 345

අනභිරද්ධො 394

අනස්සාසකො 300

අනයිතා 472

අනාචාරං 306

අනාදරියං 306

අනාපුච්ඡං 120

අනික්ඛන්තරාජකෙ 428

අනිමිත්තංසමාපත්තිං 82

අනීහතං 340

අනීහතරතනකෙ 428

අනුපඛජ්ජ 128

අනුපසම්පන්නො 52—98

අනුපොසථිකං 390

අනුවාතෙ 326

අනොසාරිතෙ 366

අප්පටිනිස්සට්ඨෙන 366

අප්පටිසංවිදිතො 482

අප්පණිහිතො සමාධි 84

අප්පතිසංවිදිතං 420

අප්පමත්තකවිස්සජ්ජනං 118

අප්පමත්තකවිස්සජ්ජනස්ස 414

අපවයස්ස 4

අපවුද්ධාරකං 328

අපඤ්ඤත්තෙන 308—382

අපරණ්ණං 140

අපසක්ක 468
අබ්භක්ඛාතං 358
අබ්භුතං 14
අමනාපාතං 348
අමුතං 4—6—8—10
අමූළ්හකෙත 398
අමූළ්හවිනයො 558
අය්‍යවොසාටිකතානි 248
අයොපත්තො 332
අරණිකෙ 446
අලජ්ජිවාදෙන 404
අවකණ්ණකං 20
අවගණ්ඩකාරකං 524
අවඤ්ඤතං 16—18
අවණ්ණංකත්තුකාමො 118
අවඤ්ඤාතං 4—6—8—10
අවිඤ්ඤූපුරිසවිග්ගහං 68
අසන්නිහිතපරික්ඛාරකා 330
අසම්භින්නො 152
අසුතං 4—6—8—10
අස්සසද්දං 428

ආ

ආජීවකො 210
ආපත්තිපරියන්ත 100
ආපත්තියො 18
ආබාධා 18
ආමලකපාළිතො 300
ආමිසහෙතු 168
ආයුධං 540
ආරොචෙය්‍ය 80
ආලොකසන්ධි 140
ආලොකං 520
ආවසථාගාරං 60
ආවසථපිණ්ඩො 202
ආහච්චපාදකො 122—136—450

ඉ

ඉබ්භා 164
ඉට්ඨාගාරං 424
ඉත්ථි 52—484
ඉද්ධිපාද 80—82
ඉධො 146—158
ඉන්දඛීලා 428—430
ඉන්ද්‍රියානි 62
ඉසිහාසිතො 52—70—538

උ

උක්කුටිකාය 506
උක්ඛිත්තකාය 494
උක්ඛිත්තො 308
උක්කොටිතො 84—90
උග්ගහො 308
උග්ඝාටෙතුකාමො 114
උච්චටඨානියං 426
උච්චාරං 552
උම්මාරෙ 248
උජ්ඣග්ගිකාය 496
උජ්ඣායනකො 118
උණ්හසමයෙ 318
උත්තරත්ථරණං 124
උත්තරිභඞ්ග 518—520
උත්තරිමනුස්සධම්මො 78
උදකදන්තපොනං 250
උදකපුසිතානි 322
උද්ධරිංසු 120
උපරිගොප්ඵකෙ 304
උපස්සුතිං 404
උපාහනාරූළ්හස්ස 542
උපණ්ඩුපණ්ඩුකජාතා 76
උපවෙඨෙන 550
උපොසථිකෙ 220
උභතොසඞ්ඝෙ 154

ඌ

ඌනකද්ධමාසං 322
ඌනවීසතිවස්සා 350
ඌහදන්ති 122

එ

එකවජ්ජෙන 366
එකින්ද්‍රියං 106
එරණ්ඩකතෙලං 206
එවංව්‍යාඛො 372

ඔ

ඔක්ඛිත්තවත්ථු 492—494
ඔක්ඛිපිත්වා 62
ඔගුණ්ඨිතසීසො 546
ඔඤ්ඤාතං 16—18
ඔට්ඨනිල්ලෙහකං 532
ඔදකො 246—326
ඔදනියඝරා 300
ඔදනො 254
ඔමසවාදෙ 16
ඔමුත්තස්ස 542
ඔරකං 212
ඔරෙනද්ධමාසං 318
ඔවටො 154

ක

කතබලො 344
කඤ්ජිකං 306
කඨලාය 306
කණ්ඩුපටිච්ඡාදි 454
කණ්හසප්පො 312
කතපරියොසිතං 140
කද්දමං 324
කබළං 578—522
කබළාවච්ඡෙදකං 524
කම්මවාචාහි 366
කම්මසමයො 320
කම්මං 18
කම්මාරභ 342—408
කම්මාරො 430
කල්‍යාණමිත්තතා 348
කස්සකං 24

කා

කාපොතිකා 298
කායප්පචාලකං 498
කායබන්ධනං 324
කාලසාමං 324
කාසි 434
කාළකං 324

කි

කිණ්ණපක්ඛිත්තා 300
කිලාසිකං 26
කිලින්නගත 322
කිලෙසං 18

කු

කුක්කුච්චං 404
කුක්කුටසම්පාතෙ 188—352
කුට්ඨිකං 26
කුම්භකාරං 24
කුම්මාසො 254
කුලපරියන්තා 100
කුලං 470
කුළීරපාදකං 450
කුළීරපාදකො 122
කුලූපගො 98
කුසගෙණන 326
කුට 14

කො

කොච්ඡං 122
කොට්ඨකං 24—46
කොසියගොත්තං 18

ඛ

ඛජ්ජකං 118—414
ඛම්භකතො 504
ඛාදනීයං 478—480

ඛි

ඛිලජාතකා 394

ඛී

ඛීයනකෙ 118

ඛු

ඛුද්දානුඛුද්දකෙහි 384
ඛුංසනා 210

ග

ගණකං 24—346
ගණ්ඨිකං 26
ගද්ධබාධිපුබ්බො 358
ගරහිතො 308

ගි

ගිලානපුච්ඡකා 314
ගිලානසමයො 210—218
ගිලානා 166
ගිහීසමාරම්භා 192

ගු

ගුය්හමන්ත 426
ගුළපිණ්ඩං 304
ගුළාසවො 300

ගෙ

ගෙරුකපරිකම්මං 140

ගො

ගොඛීරං 246
ගොණකං 28

ච

චණ්ඩාලං 20
චපුචපුකාරකං 528
චම්මකාරං 24

චි

චිලිමිකං 124

චී

චීවරකාරසමයො 210—218
චීවරදානසමයො 210—218
චීවරපටිවිංසො 172
චීවරං 174—178

චෙ

චෙටකෙ 190

චො

චොරකන්තාරං 310

ඡ

ඡත්තපාණිස්ස 536
ඡපකස්ස 548
ඡප්පඤ්චවාචාහි 70

ඡි

ඡින්නභත්තො 256

ඡෙ

ඡෙකසම්මුතිං 472

ජ

ජන්තාඝරෙ 316
ජවකණ්ණකං 20

ජා

ජාති 16
ජාගරො 252

ජි

ජිව්හානිච්ඡාරකං 526

ජී

ජීවිතාවොරොපෙය්‍යං 106

ජො

ජොතිං 312

ඤා

ඤාතිකුලානි 228

ත

තක්කං 306
තට්ටිකං 124
තලසත්තිකං 394
[illegible] 494

තා

තාදිනො 158

ති

තිණවත්ථාරකො 558
තිණ්ඩුකකූපමා 358
තිපුතං 348
තිරච්ඡානකථං 438
තිරච්ඡානගතමනුස්ස
විග්ගහිත්ථියා 356
තිලතෙලං 246

තු

තූලොනද්ධ 448

තෙ

තෙලසම්පාකී 300

ථ

ථකිතෙ 316

ථූ

ථූපීකතං 510

ථෙ

ථෙය්‍යසත්ථෙන 350

ද

දණ්ඩපාණිස්ස 538
දෙණ්ඩා 538
දවා 12
දසසික්ඛාපදිකො 328
දසිකසුත්තං 414

දා

දාරකසද්ද 348

දි

දිට්ඨධම්මිකානං 4
දිට්ඨියාසුප්පටිවිද්ධා 152
දියඩ්ඪො 318
දිරත්තතිරත්තං 372

දු

දුවඞ්ගුලං 98—344
දුත්තිහතං 340
දුබ්බලචීවරො 412
දුබ්බණ්ණකරණං 324
දුභරතාය 4
දූරාගතානං 348
දුරුත්තානං 348

# විශෙෂ ශබ්ද සූචි


### දෙ

දෙඩ්ඩුභෙන 300
දෙවතා 106
දෙසෙය්‍ය 70

### දො

දොසපරිවුට්ඨිතං 28
ද්වත්තික්ඛත්තුං 388
ද්වාරකොසා 140

### ධ

ධනිට්ඨකං 16
ධම්මකථිකං 382
ධම්මා 52—538

### ධු

ධුතාය 308
ධුවචලො 548

### න

නටපුබ්බකො 530
නවකම්මං 102—320
නහාපිතං 24
නළකාරං 24

### නා

නාවං 16
නාවාභිරුහනසමයො 210
නාවාය 309
නාසිතං 376

### නි

නික්කඩ්ඪෙය්‍ය 134
නිච්චභත්ත 220
නිමන්තිතො 476
නිසීදනං 332
නිහතාධිකරණං 340

### නී

නීචට්ඨානීය 426

### නෙ

නෙසාදං 20

### ප

පක්ඛිකෙ 220
පච්ඡාසමණෙන 218
පජ්ඣායති 16
පඤ්චභොජනානි 220
පටිච්ඡිතුං 62
පටිභාණචිත්තං 176
පටිමුක්කස්ස 542
පටියාලොකං 350
පටිසන්ථාරං 420
පට්ටා 176
පට්ටිකා 332
පඨවි 104
පත්තකල්ලං 110
පත්තනිල්ලෙහකං 532
පදසො 52
පදසොධම්මං 54
පධූපෙන්තො 354
පමුට්ඨා 12
පයොපානං 530
පරම්පරභොජනං 218
පරිපති 140
පරිපාචෙති 192
පරිපුච්ඡා 308
පරිබ්බාජකො 254
පරිභණ්ඩ 326
පරිමණ්ඩලං 488-490
පරියායො 158
පරිවාසං 98, 342
පරිවෙණං 152, 322
පරිවෙසනං 252
පරිලාභසමයෙ 318
පල්ලත්ථිකාය 544

පවට්ටෙසි 16
පස්සාවං 306, 552
පහාරසමුච්ඡිතා 304

පා

පාටිදෙසනීයා 464
පාටිපදිකෙ 220
පාදුකාරුළ්හස්ස 542
පාරිවට්ටකං 174

පි

පිට්ඨසුරා 300
පිට්ඨිසඞ්ඝාටස්ස 140
පිණ්ඩපාතො 192
පිණ්ඩුක්ඛෙපකං 524
පිසාවකන්තාරං 310

පී

පීඨං 122

පු

පුක්කුසං 20
පුඤ්ජලිකෙ 124
පුණ්ණපත්තං 432
පුප්ඵඡඩ්ඩකං 24
පුප්ඵාසවො 300
පුබ්බණ්ණං 140

පූ

පූගස්ස 98, 200, 232, 416
පූවසුරා 300
පූවං 224

පෙ

පෙසකාරං 24
පෙසලා 14
පෙසුඤ්ඤං 42

පො

පොටකිතුලං 450

ඵ

ඵලභාජකං 118,414
ඵලාසවො 300

බ

බදරමිස්සෙන 214
බහුදුක්ඛා 350
බහුස්සුතං 382
බහූපායාසා 358

බා

බාහිරාලෙපං 254
බාහුප්පචාලකං 500

බි

බිම්බොහනං 456, 460,462

බු

බුන්දිකාබද්ධො 122, 450
බ්‍යාහරති 522
බ්‍රහ්මචරියං 152

භ

භණ්ඩනකතො 98
භණ්ඩිකං 432
භත්තග්ගෙ 98
භත්තපච්චාසා 216
භත්තපටිපාටියා 212
භත්තාධිප්පායො 392
භත්තුද්දෙසකස්ස 414
භද්දානි 416

භා

භාරද්වාජගොත්තං 18

භි

භික්ඛුනියො 152
භික්ඛුනුපස්සයං 166
භික්ඛුනොවාදකං 152
භිසි 122, 456, 460, 462
භිංසාපියමානා 310

භු

භුම්මත්ථරණං 124, 456

භූ

භූතගාම 108
භූතං 96

භො

භොජනීයං 478, 484

ම

මකරදන්තකං 140
මජ්ජගන්ධං 300
මජ්ජරසං 300
මජ්ජවණ්ණං 300
මණ්ඩො 122
මධුකතෙලං 446
මධුමෙහො 18
මධ්වාසවො 300
මච්ඡං 318
මත්ථං 224
මසාරකො 122, 450
මහල්ලකොවිහාරො 140
මහානාගෙ 190
මහාවිකටානි 258
මංසසම්පාකෙ 300

මා

මාතුගාමො 64
මාලාකම්මං 140
මාහිසං 246

මී

මීයනධම්මං 408

මු

මුණ්ඩගහපතිකස්ස 252
ඤීකං 246

මෙ

මෙණ්ඩං 28
මෙරයො 300

මො

මොඝපුරිස 4
මොනප්පටෙසු 158
මොහනකෙ 388
මොහපරියුට්ඨිතං 28
මොහෙතුකාමා 390

ය

යදිච්ඡකං 384
යථාධම්මං 340
යථාසන්ථතං 412

යා

යාගුභාජකං 118
යාගුභාජකස්ස 414
යාචිතකූපමා 358
යානං 542
යාමකාලිකං 232, 478
යාවකාලිකං 468
යාවජීවිකං 232, 468, 478
යාවතිච්ඡකං 384

යෙ

යෙනිච්ඡකං 384
යෙභුය්‍යසිකා 558

ර

රජතං 306
රතනසම්මතං 434
රථකාරං 20
රථසම්බද්ධං 428
රවා 12
රහො 19

රා

රාගපරියුට්ඨිතං 28
රාජභටා 324

රු

රුක්ඛවල්ලූපමා 358

රූ

රූපං 346

ල

ලතාකම්මං 140

ලි

ලිඞ්ගං 18

ලෙ

ලෙඩ්ඩං 346
ලෙඩ්ඩකා 24

ව

වචනපථානං 348
වචනපථො 154
වයෙරා 48, 16
වම්භනා 16
වම්භිතො 308
වස්සිකසාටිකා 458
වසාතෙලං 246

වා

වාණිජං 24
වාතවුට්ඨිසමයෙ 321
වාදක්ඛිත්තො 2
වාලකන්තාරං 310
වාසිජටෙ 446
වාහසා 424

වි

විකප්පනා 330
විකාලො 444
විසාසාදනං 252
විතානං 456
විනයපරියත්තියං 384
විනිච්ඡයකථාය 410
විලෙපනෙන 316
විවිත්තො 106
විසංකෙතෙන 352
විසිබ්බනාපෙක්ඛා 312
විහෙසකං 112

වී

වීථිය 446
වීතච්චිකඞ්ගාරං 316
වීතදොසං 218
වීතමොහං 28
වීතරාගං 28
වීසතිවස්සො 152

වෙ

වෙඨිතසීසො 544
වෙණුං 20
වෙමතිකො 121
වෙහාසකුටි 136
වොසාසන්තියො 468

ස

සංවිධාය 182
සඞ්ඝාණිකාය 4
සඞ්ඝභත්තං 98
සඞ්ඝභෙදෙ 344
සඞ්ඝරාජි 344
සඞ්ඝිකං 122
සඞ්ඝිකො විහාරො 126
සඤ්ඤත්තිකං 98, 342
සත්තබොජ්ඣඞ්ගා 82
සත්තරසවග්ගියං 300
සත්තාහකාලිකං 232, 468, 478

සත්තිසූලූපමා 358
සත්ථං 540
සත්ථගමනීයො 182
සත්ථුසාසනෙන 340
සතිවිනයො 558
සද්ධම්මට්ඨිතියා 4
සද්ධාදෙය්‍යං 98
සදසං 452
සන්ධිකාරකං 242
සප්පටිභයං 482
සප්පසිරූපමා 358
සප්පාණකං 338
සපදානං 512
සබ්බපංසුකූලිකො 248
සබ්බපච්චන්තිමෙසු 324
සබ්බපාසණ්ඩිකභත්තං 210
සභෙණ්ඩා 324
සම්පජානමුසා 2
සම්බාධො 128
සම්භාරසංයුත්තා 300
සම්මට්ඨං 322
සම්මතො 160
සම්මුඛාවිනයො 558
සමනුභාසියමානො 362
සමානච්ඡන්ද 348
සයනිසරා 438
සල්ලපන්තා 2
සල්ලෙඛාය 308
සලාකභත්ත 220
සලාකාවුත්තා 74
සවිට්ඨකං 16
සසිත්ථකං 536
සහජෙන 322
සහධම්මිකං 380
සහසෙය්‍යං 372

සා

සාණිපාකාරං 456, 460, 462
සාණිපාකාරපරික්ඛිත්තං 438
සාමන්තා 250
සාමිසෙන 534
සාමීචිකම්මං 154
සාසඞ්කං 182, 482
සාසපතෙලං 245

සි

සික්ඛමානා 468, 470
සික්ඛමානාය 174, 328
සික්ඛමානෙන 380
සික්ඛාපදවිවණ්ණනකෙ 384
සිඛාවහාරකං 526
සිප්පං 18

සී

සීසප්පවාලකං 500

සු

සුක්කවිසට්ඨිං 98
සුකරන්තකං 332
සුබසමාචාරා 346
සුබසීලා 346
සුගතචීවරං 460
සුගතවිදත්ථියා 458
සුඛං 350
සුත්තපරියාපන්නො 388
සුත්තාගතො 388
සුධාය 142
සුපටිච්ඡන්නො 490
සුපිනකූපමා 358
සුරුසුරුකාරකං 530
සුසංවුතො 492
සුසිරකට්ඨං 312

# විශෙෂ ශබ්ද සූචි


### සූ

සූචිඝරං 332
සූපසම්පාකෙ 300
සූපො 508, 514, 516

### සෙ

සෙදගතෙන 318
සෙනාසනපඤ්ඤපකං 414
සෙනාසනපඤ්ඤාපකස්ස 118
සෙය්‍යා 58,64
සෙය්‍යං 126

### සො

සොසිකං 26

### හ

හත්ථපාසා 140
හත්ථනිද්ධුනකං 526
හත්ථනිල්ලෙහකං 350
හඳ 176
හස්සධම්මෙ 304
හස්සාධිප්පායො 302

### හී

හීය්‍යො 200
හීලිකං 16

### හෙ

හෙමන්තිකෙ 312